(මු-) 9. **අච අරාලෙඡ් ව්‍රිඃ.** (අචඃ 6. අ අර් ආල් ඓච් 1. ව්රිඃ 1.)

අචඃ ස්ථානෙ අා අර් ආල් ඓච් එතෙ ව්රිසංඥඃ ස්‍යුඃ.*

(ස-) අචඃ ස්ථානෙ, අ ඉ උ ඍ ඎ එ ඔ ඓ ඖ යන මේ අච් ප්‍රත්‍යාහාරයාගේ ස්ථානයෙහි; ආ අර් ආල් ඓච් එතෙ, ආ-ආර්-ආල්-ඓ ඖ යන මොව්හු; ව්රිසංඥඃ ස්‍යුඃ, ව්රිසංඥ (වෘඞ්සංඥ) ඇත්තාහු වන්නාහුය.

(මු-) 10. **ප්‍රපරාපසංන්‍යවානුනිර්දුර්ව්‍යධිසූත්පරිප්‍රත්‍යභ්‍යත්‍ය ස්‍යුපාඩ් ගිඃ.** (ප්‍ර—ආඩ් 1. ගිඃ 1.)

එතෙ විංශති ඊගිසංඥඃ ස්‍යුඃ.†

දෙදෙනාගේ ගුණවීමෙහි ක්‍රමයෙන් අර් අල් යන මොහු වෙත්, සමූහයකගේ සමානත්වය නැති කල්හිද භාගයෙහිවූ සමාන ත්වය ගතයුතු බැවින් එසේ කියනලදී. වෘඞිවිධානයෙහිද එසේමැයි.

* අ ඉ උ ඍ ඎ එ ඓ ඔ ඖ—යන මේ වර්ණයන්ගේ ස්ථාන යෙහි ක්‍රමයෙන් ආදෙශකරණලද්දවූ ආ ඓ ඖ ආර් ආල්—යන වර්ණයෝ වෘඞිසංඥ ඇත්තාහ, ආදෙශවිශෙෂය වනාහි අක්‍ෂරයන් උපදනා ස්ථානයන්ගේ සමානත්වයෙන් පළමු පරිද් දෙන් දතයුතු.

† විංශතිශබ්දාදි සියලු ශබ්දයෝ සංඛ්‍යෙය සඞ්ඛ්‍යා දෙක්හි හැමතන්හි එකත්වයෙහි වෙති. මෙසේ විංශතිශබ්දාදීන්ගේ එකවචනාන්තත්වය වෙයි. මෙහි නිර් දුර් ශබ්දවය රකාරා න්තද, දන්ත්‍යසකාරාන්තද වෙත්. ක්‍රියායොගයෙහි වූ ප්‍රාදී හටම උපසර්ගසංඥයි, ද්‍රව්‍යාදිය හා යෙදුනාහට උපසර්ගසංඥ නොවන්නිය. ද්‍රව්‍යාදි යොගීහු වූකලී—ප්‍රෙජ යනාදියෙහි උපසර්ගසංඥ රහිත බැවින්, ගෙඩ්ඃ-යනාදි සූත්‍රයෙන් ගුණ නොවේ. ආදියෙහි ධාතු යෙදුනු කල පසුව ලිඞ්ගසංඥකල කල්හි උපසර්ගභාවය ඇත්තේමය.

ක්‍රියාවාචිත්වමාඛ්‍යාතුං ප්‍රසිඞො'ර්ඃ ප්‍රදර්ශිතඃ,
ප්‍රයොගතො'න්‍යෙ විඥෙයා අනෙකාර්ථා හි ධාතව, ඉති.

ක්‍රියාවාචිත්වය කියනුපිණිස ධාතුහුගේ ප්‍රකට අර්ථය දක්වන ලද්දේය. අන්‍යාර්ථයෝ ප්‍රයොගවශයෙන් දතයුත්තෝයි, එසේ

(ස.) එතෙ විංශතිඃ, ප්‍ර-පරා-අප-සං-නි-අව-අනු-නිර්දුර්-වි-අධි-සු-උත්-පරි-ප්‍රති-අභි-අති-අප-උප-ආඞ් යන මේ විස්ස; ගිසංඥාඃ, ගි-සංඥ (උපසර්ගසංඥ) ඇත්තාහු; ස්‍යුඃ, වන්නාහ.

මැයි ධාතුහු අනේකාර්ථයෝයි ධාතුපාඨයෙහි වොපදෙවහුගේ කීම බැවින් ධාතූන්ගේ අනේකාර්ථභාවය සිද්ධය, උපසර්ගයෝ ඒ ධාත්වර්ථය බබුලුවන්නෝමය වාචකයෝ නොවෙත්. උපසර්ගයා තමා ධාතුහුගේ ආලිඞ්ගණයවූ අර්ථය බබුලුවන බව ආදන සඥතාදිශෙහි සිතියයුතුයයි මාඝටීකායෙහි මල්ලිනාථතෙමේ කියයි. මෙසේද කියනලදී :—

නිපාතාශ්චාදයො ඥෙයා උපසර්ගාශ්ච ප්‍රාදයඃ,
ද්‍යොතකත්වාත් ක්‍රියායොගෙ ලොකාදවගතා ඉමෙ.

ක්‍රියායොගයෙහි ප්‍රකාශකයන් බැවින් ලොකයා කෙරෙන් අවබොධකරණලද්දාවූ චාදිවූ මේ නිපාතයෝද ප්‍රාදි උපසර්ගයෝද දතයුතුවෙත්. ප්‍රාදීහු ධාතූන්හා නොගැලපුනු අවස්ථායෙහි කිසියම් අර්ථයන්ගේ ප්‍රකාශකයෝ නොවෙත්, ක්‍රියාපදයා කෙරෙන්ද ධාතුමූලක ශබ්දයා කෙරෙන්ද පූර්ව යොදනු ලබන්නාහු බොහෝසේ ව්‍යවහාරකරණු ලැබෙත්. කිසි තැනෙක්හි උපසර්ග දෙකක්ද තුණක්ද සතරක් හෝ ගලපා ව්‍යවහාරකරණුලැබේ, මෙසේයි, විහාරඃ, ව්‍යවහාරඃ, සුව්‍යවහාරඃ, සමභිව්‍යවහාරඃ, යනුයි.

ධාත්වර්ථං බාධතෙ කශ්චිත් කශ්චිත් තමනුවර්තතෙ,
තමෙව විශිනෂ්ට්‍යන්‍යඃ උපසර්ගගතිස්ත්‍රිධා.

කිසි උපසර්ගයෙක් ධාත්වර්ථය බාධාකෙරෙයි, කිසි උපසර්ගයෙක් ඒ ධාත්වර්ථය අනුව පවතියි, අනිකෙක් ඒ ධාත්වර්ථයම ප්‍රභෙදකෙරෙයි. මෙසේ උපසර්ගයන්ගේ පැවැත්ම ත්‍රිවිධ වේ. කිසි තැනෙක්හි ප්‍රාදි උපසර්ගයෝ මූලපදයෙන් ප්‍රකාශකරණලද අර්ථයාගේ පරිවර්තනයකරන්නෝයි, ඒ මෙසේයි, ආදත්තෙ ආගච්ඡති. කිසි තැනෙක්හි ධාතුහුගේ අර්ථයෙහි වැළඳගණීත්, ඒ මෙසේයි—ප්‍රසූතෙ අවස්ථති. කිසිතැනෙක්හි මූල් පදයෙන් ප්‍රකාශිත අර්ථයෙහි විශෙෂයෙන් අන්‍යාර්ථයක් යොදත්—ප්‍රණමති අනුතාපඃ, යන මෙසේයි. තවද කවර පද විශෙෂයක්හුගේ ගැළපීමෙහි ප්‍රාදීහු ඒ අර්ථය පෙරලද්ද, ධාතූන්ගේ පදාර්ථයෙහි කවර අර්ථයක් යොදද්ද, කවර අර්ථයක් නොමයොදද්දැයි කියා හෝ ඒ සියල්ල නානාර්ථය වෙයි. පුරුෂොත්තම දෙවතෙම ප්‍රාදීන්ගේ අර්ථයන් කියයි.

ප්‍ර—යනු ගමනය-ආරම්භය-උත්කර්ෂය-සම්‍යක්ප්‍රකාරය-ප්‍රථමභාගය-ප්‍රසිද්ධය-උත්පත්තිය-ව්‍යවහාරය යන මෙහි වෙයි.

(මු-) අත්‍රාර්චායාං සවතී නාතික්‍රමෙ'තිඃ පයඃසියි ගතෞ,
අපිඃ පදාර්ථසම්භාවනෘ ගර්හානුඥා සමුච්චයෙ.*

පරා—සතුරු පිරිහීමය-අනාදරය-ආපසු හැරීමය-නිච්ඡය යන මෙහි වෙයි.

අප—අනාදරය-වැටීමය-සමූහය-විරූපභාවය-දුරුකිරීමය-තකද් යන්නහුගේ අර්ථය යන මෙහියි.

සං—උත්තමය-ආලිඞ්ගනය-හැමකල්හිය-යොග්‍යත්වය-සම්මුඛවීමය යන මෙහියි.

නි—නිශ්චය-නිෂෙධය යන මෙහියි.

අව—නිශ්චය-සමූහත්වය-අනාදරය යන මෙහියි.

අනු—පසුවය-සමානත්වය-ලක්‍ෂණය-වීප්සාය-ඉත්ථම්භාවය-කොඨාසය-හීනය-සමීපභාවය-සහාර්ථය-ආසන්නත්වය-දීඝත්වය-නැවත යන අර්ථය යන මෙහියි.

නිර්-නිස්—අතිශය-නිෂෙධය-නිශ්චය-පිටත්කිරීමය යන මෙහියි.

දුර්-දුස්—නිෂෙධය-දුකය-නින්‍දාය-ගර්හාය යන මෙහියි.

වි—විශෙෂය-විරූපභාවය-ඉත්සංඥා ඤකාරවත් නකාරාර්ථය-ගමනය-දානය යන මෙහියි.

අධි—උපරිභාවයෙහි.

සු—ප්‍රශංසාය, ශොභනය, අනායාසය, අතිශය, යන මෙහියි.

උත්—ඌර්ධ්වය, උත්තමතාවය, ප්‍රකටභාවය, සමීපභාවය යන මෙහියි.

පරි—සම්‍යක්ප්‍රකාරය, අතිශය, වීප්සාය, ඉත්ථම්භාවය, ලක්‍ෂණය, කොඨාසය, දුරුකිරීමය, නියමය යන මෙහියි.

ප්‍රති—ලක්‍ෂණය, දුරුකිරීමය, ප්‍රශංසාය, ඉත්ථම්භාවය, කොඨාසය, නැවත දීමය, සමානත්වය, විරොධය, වීප්සාය, සමාධිය යන මෙහියි.

අභි—හාත්පස්හිය, උභයාර්ථය, ලක්‍ෂණය, වීප්සාය, ඉත්ථම්භාවය, දුෂ්ටවූ ව්‍යවහාරය යන මෙහියි.

අති—අතිශය, ඉක්මීමය, ප්‍රශංසාවය, ක්‍රියාවෙහි අයොග්‍යතාවය යන මෙහියි.

අපි—ගැත්මය, අල්පත්වය, ක්‍රියාවෙහි යොග්‍යතාවය, නින්‍දාය, අනුදැනීමය, ගැළපීමය යන මෙහියි.

උප—ආශ්‍රිතය, පශ්චාත්භාවය, අනුකම්පාය, අධිකත්වය, හීනය, සම්පත්වය, ප්‍රථමත්වය යන මෙහියි.

ආඞ්—හාත්පස්හිය, ගැත්මය, ආපසු හැරීමය, සවල්පාර්ථය, සීමාය, පැතිරීමය යන මෙහියි.

* මේ අර්ථවිෂයෙහි වූ උපසර්ගයන් ගිසංඥා නොවන හෙයින්,

(ස-) අත්‍ර, මේ සූත්‍රයෙහි ; අර්චායාං, ප්‍රශංසායෙහි වූ ; සු-අති, සුසෙක්තෘති අතිසෙක්තෘති යනාදියෙහි සු-අති යන උපසර්ග දෙකද ; අතික්‍රමෙ, ඉක්මීමෙහි (එලොදයෙහිද ක්‍රියා ප්‍රවෘත්ති යෙහිද) වූ ; අතිඃ, අතිසික්ත්වති ශාලීන් යනාදියෙහි අති යන් නද ; ගතෞ, (ගමනාර්ථ ධාතූහු හා යෙදීමෙන්) ගමනාර්ථයෙහි වූ ; පය්‍යීධී, පරිසෙධති ගඞ්ගාං ජනඃ යනාදියෙහි පරි අධි යන දෙකද ; පදාර්ථ, අපිසික්ත්වති යනාදියෙහි අල්පාර්ථය ; සමභාව්‍ය, අපිසික්ත්වෙන් මූලසහස්‍රම් යනාදියෙහි ක්‍රියාවෙහි යොග්‍යතා යුක්තාවීමය ; ගර්හානුඥා, අපිසෙක්තෘති වෘෂලං බ්‍රාහ්මණකඃ, අපිසික්ත්ව යනාදියෙහි ගර්හා අනුමති දෙකය ; සමුච්චයෙ, අපිසික්ත්ව අපිස්තුහි යනාදියෙහි පදයන්ගේ ගැලපීමය යන මෙහි වූ ; අපිඃ, අපි යන උපසර්ගයද ; න, ඝිසංඥ නොවෙත්.

(මූ-) **11. භවාදිර් ධුඃ.** (භවාදිඃ 1. ධුඃ 1.)

භූසත්තායාමිත්‍යාදිගීර්ණෙ ධුසඥඃ ස්‍යාත්.*

(ස-) භූසත්තායාමිති, භූසත්තායාම් යන ; ආදිගීර්ණඃ, මේ ආදි ධාතුගණයතෙම ; ධුසඥඃ ස්‍යාත්, ධුසංඥ (ධාතුසංඥ) ඇත්තේ වන්නේය. [පාණිනිඃ 1. 3. 1.]

සුෂ්තුත්වා යනාදියෙහි, ව්‍යස්‍යග්‍යත්‍රකාර (548) යනාදියෙන් සමාසනුවූ කල්හි, ඝිකඃ යනාදියෙන් (572) ෂකාර නොවන්නේය. ක්ත්වාප්‍රත්‍යයාගේ ස්ථානයෙහි යප් ආදෙශයද ඝිසංඥ (1176) නොවන්නේය. කියනලද උපසර්ගයන්ගේ ඝිසංඥ නොවීමෙහි ප්‍රයොජනය මෙසේයි. තවද ඝිසංඥ ලද්දහුගේ නිපාතභාවය අවශ්‍යයෙන් කියයුතු වෙයි, නිපාතත්වය ඇති කල්හි අව්‍යයභාවය වෙයි, එබැවින් අතිරාජී යනු සිද්ධවිය— අව්‍යයභාවය ඇති කල්හි, ව්‍යංපූර්වම් යන මෙයින් (366) අති යන්නහුගේ පූර්වයෙහි පතනයවෙයි.

* භූසත්තායාමිත්‍යාදිගීර්ණඃ යනු භූශබ්දයාහට ධාතුසංඥව වැළැක්වීම පිණිස කීයයි. භූ යන මේ ආදි ධාතු ප්‍රකෘතිහු යම් කාලෙක්හි වීම හෝ විද්‍යමානතාදි ක්‍රියාවාචකයෝද එකල්හිම ධාතුසංඥවෝ වන්නාහුය. භවාදි ගණය මෙසේයි.

භවාද්‍යදාදී ජුහොත්‍යාදිර් දිවාදිඃ ස්වාදිරෙව ච,
තුදාදිශ්ච රුධාදිශ්ච තනක්‍ර්‍යාදිචුරාදයඃ.

(මු-) 12. **සිත්‍යාදිඃ ක්තිඃ.** (සිත්‍යාදිඃ 1. ක්තිඃ 1.)

ස්‍යාදිස්ත්‍යාදිශ්ච ක්තිසංඥඃ ස්‍යාත්.*

(ස-) ස්‍යාදිඃ, ලිඞ්ගයා කෙරෙන් පරව වියයුතුවූ ස්‍යාදි විභක්තිහුද ; ත්‍යාදිශ්ච, ධාතූහු කෙරෙන් වියයුතුවූ ත්‍යාදි විභක්තිහුද ; ක්තිසංඥඃ ස්‍යාත්, ක්තිසංඥ (විභක්තිසංඥ) ඇත්තේ වන්නේය.

(මු-) 13. **ක්වචබවාන්‍යෙකද්විබහුෂ්වෙකශඃ.**

(ක්වචබවානි 1...එකද්විබහුෂු 7...එකශඃ 1...)

ක්තෙරෙකෛකං වචනං ක්‍රමාත් ක්ව ච බව සංඥං ස්‍යාත්, තානි ච ක්‍රමාදෙකද්විබහුෂ්වර්ථෙෂු ප්‍රයුජ්‍යන්තෙ.†

(ස-) ක්තෙඃ, විභක්තිහුගේ ; එකෛකං වචනං, එක එක වචනය ; ක්‍රමාත්, පිළිවෙළින් ; ක්ව, ක්වසංඥ (එකවචනසංඥ)ද ; ච, චසංඥ (ද්විවචන සංඥ) ද ; බවසංඥං ස්‍යාත්, බවසංඥ (බහුවචන සංඥ)ද වන්නේය ; තානි ච, ඔව්හුද ; ක්‍රමාත්, පිළිවෙළින් ; එකද්විබහුෂ්වර්ථෙෂු, එකාර්ථය ද්ව්‍යර්ථය බහ්වර්ථය යන මොවුන් කෙරෙහි ; ප්‍රයුජ්‍යන්තෙ, යොදනුලැබෙත්.

(මු) 14. **ක්ත්‍යන්තාන්‍යෞ දළී.** (ක්ත්‍යන්තාන්‍යෞ 1.. දළී 1..)

---

* ද්වන්ද්වාත් පරඃ ශ්‍රූයමාණඃ ශබ්දඃ ප්‍රත්‍යෙකමභිසම්බධ්‍යතෙ, යන න්‍යාය හෙතුකොටගෙණ ස්‍යාදිස්ත්‍යාදිශ්ච යනු වෘත්තියෙහි කියයි. ශබ්දප්‍රකෘතිහු අවධිනිමිත්ත කොට යොදනුලබන්නාවූ සි-ඖ-ජස් යනාදි විභක්ති එක්විස්සද, ධාතූහු නිමිත්තකොට ගෙණ යොදනු ලබන්නාවූ-තිප්-තස් ආදි එක්සියඅසූවද ක්ති සංඥ හෙවත් විභක්තිසංඥ වන්නාහුය.

† එකාර්ථයෙහි එකවචනයද, ද්විසංඛ්‍යාවගේ අර්ථයෙහි ද්විවචනයද, එයින් වැඩියක් කියයුතුවූ අර්ථයෙහි බහුවචනයද යොදනුලැබේ. එකශබ්දයාගේ-ක-කාරයද වචන ශබ්දයාගේ-ව-කාරයද ගෙණ, ක්ව-යනු ලකුණුකරණලදී. ච-බව යනුද ඒ ක්‍රමයෙන් වෙයි. නිත්‍යයෙන් බහුවචනවූ ශබ්දයෝද වෙත්—ඒ මෙසේයි:—දාරාඃ, වර්ෂාඃ, සිකතාඃ, ජලෞකසඃ, වස්ත්‍රාන්ත වාචීවූ, දශාඃ යන්නද, බහුලාඃ, කෘත්තිකාඃ, මඝාඃ, ලාජාඃ, ගෘහාඃ, යනාදියයි. භට්ටාරකපාදාඃ, යනාදි තන්හි ගෞරවයෙහි සියලු ශබ්දයන් කෙරෙන් බහුවචනයි. විකල්පයෙහිද කිසිතැනක බහුවචනයි, සුමනසඃ සුමනාඃ, අප්සරසඃ අප්සරාඃ යනාදියයි.

ක්‍යන්තශබ්දො දසඤ්ඤා ස්‍යාත්, අන්‍යස්තු ලිසඤ්ඤඃ.*

(ස-) ක්‍යන්තශබ්දඃ, විභක්ත්‍යන්ත ශබ්දයතෙම ; දසංඥඃ ස්‍යාත්, දසංඥ (පදසංඥ) ඇත්තේ වන්නේය; අන්‍යස්තු, අන්‍යවූ විභක්ත්‍යන්තනුවූ ශබ්දය වනාහි ; ලිසංඥඃ, ලිසංඥ (ලිඞ්ග සංඥ) ඇත්තේ වන්නේය.

(මු-) **15. ලුපි න සන්ධ්‍යාද්‍යාවිධිඃ.** (ලුපි 7. න 1. සන්ධ්‍යාද්‍ය විධි 1..)

ලුබිති ලොපෙ කෘතෙ යො ලුප්තස්තදද්‍යන්තයොඃ සන්ධිර්න ස්‍යාත්, තදද්‍යස්‍ය ච යො විධිඃ ස ච න ස්‍යාත්.†

(ස-) ලුප් ඉති, ලුප් කියා ; ලොපෙ කෘතෙ, අභාවය කළ කල්හි ; යො ලුප්තඃ, යමෙක් නසනලද්ද ; තදද්‍යන්තයොඃ, ඒ ලොප්කරණලද්දහු කෙරෙන් ආදියෙහි වූ වර්ණයාගේ ස්ථාන යෙහිද අන්තයාගේ ස්ථානයෙහිද ; සන්ධිර්නස්‍යාත්, සංහිතා නොවන්නීය ; තදද්‍යස්‍ය ච, ඔහුගේ ආදියහටද ; යො විධිඃ, යම් කාර්‍ය්‍යයෙක් ඇද්ද ; ස ච න ස්‍යාත්, හෙද නොවන්නේය.

---

* ත්‍යලොපෙ ත්‍යලක්ෂණං යන න්‍යාය හෙතුකොටගෙණ ලොප්කරණලද විභක්ති ඇත්තවුන්ගේ පදත්වය වනාහි ආති දෙශික වෙයි. ඒ මෙසේයි, උමා, ගෞරී යනාදියයි.

† උදාහරණ මෙසේයි :—හර එහි, ඔහුගේ ආදියහටද කිසි යම් විධානයෙක් වේද හෙද නොවන්නේය, එහෙයින් රාජ භ්‍යාම් යන මේ ආදි තන්හි ආකාර නොවේ, දහෞ භසමීකර ණෙ යනාදිය ඥාපක බැවින් මේ විධානය වනාහි හැමතන්හි නොවේ, කිසිතැනෙක්හි ආදි අකාරයාගේ ස්ථානයෙහි විධා නය වෙයි. නඤ්ඤනිර්දිෂ්ටමනිත්‍යම් යන න්‍යායෙන් භස්මී කරණං යන මෙහි නාකාරය ලොප්කළ කල්හිද ප්‍රථම අකාර යාගේ ස්ථානයෙහි යම් කාරණයකින් වනාහි ඊකාරය වේද එහෙයිනි. මෙහි ප්‍රථමපදයෙන් සිඛ කල්හි නැවත අවර්ණ යාගේ ගැන්ම අවර්ණශ්‍රිතයාගේ වැළැක්වීම පිණිසයි, එහෙ යින් ලොප්කරණලද්දහුගේ ආදියෙහි අවර්ණයා නිමිත්තකොට පවත්නා විධානයද නොවන්නේය, මෙසේයි :—රාජභිඃ යන මෙහි එස් ආදෙශය නොවේ. අන්‍යවර්ණ ආශ්‍රිතයන් නිමිත්ත කොට වන්නේමය, මෙසේයි:—චක්‍රවර්තීෂු යනාදි තන්හි න කාරයහට ලොප්කළ කල්හිද ඉල්ප්‍රත්‍යහාරයා කෙරෙන් ෂකාරයවෙයි. මෙහි සන්ධිශබ්දයාගේ ගැන්මෙහි ප්‍රයොජ නය දමොදරඃ යන මෙහි තමාවිසින් කියනලද්දේය.

(මු-) **16. චාදිර්ගිර්ණිඃ.** (චාදිඃ 1. ගිඃ 1. නිඃ 1.)

චාදිගීණො ගිශ්ච නිසඤ්ඤඃ සත්‍යාත්.*

(ස-) චාදිගණිඃ, චකාරාදි ගණයද ; ගිශ්ච, ගිසංඥ ලද්දේද ; නිසංඥඃ සත්‍යාත්, නිසංඥ (නිපාතසංඥ) ඇත්තේ වන්නේය.

(මු) **17. ණමිතො'න්ත්‍යාචො'නෙත'න්ත්‍යස්‍යාදෞ.**

(ණම් ඉතඃ1...අන්ත්‍යාචඃ 5. අනෙත 7. අන්ත්‍යස්‍ය 6. ආදෞ 7.)

ණිත් යශෙශ්‍යාච්‍යාතෙ තස්‍යාන්ත්‍යාදචඃ පරො නිදනෙත ඛිද න්ත්‍යස්‍ය ස්ථානෙ මිදාදෞ ස්‍යාත්.†

(ස-) ණිත්, ඉත්සංඥවූ මූර්ධන්‍ය ණකාරය ; යස්‍ය, යමක්හු ගේ ස්ථානයෙහි ; උච්‍යතෙ, කියනුලැබේද ; තස්‍ය, ඔහුගේ ආගමය ; අන්ත්‍යාත්, අන්තයෙහි වූ ; අචඃ පරඃ, ස්වරයා කෙ රෙන් පරවද ; නිත්, දන්ත්‍ය නකාරයාගේ ඉත්ආගමය ; අනෙත, ස්ථානවත්හුගේ අන්තයෙහිද ; ඛිත්, ඛකාරයාගේ ඉත්ආදෙශය ; අන්ත්‍යස්‍යස්ථානෙ, ස්ථානවත්හුගේ අන්තවර්ණ යාගේ ස්ථානයෙහිද; මිත්, මකාර ඉත්සංඥය; ආදෞ, ස්ථාන වත්හුගේ ආදියෙහිද ; ස්‍යාත්, වන්නේය.

---

* චකාරාදි ගණයයි—ච, වා, හං, හා, හි, හෙ, හෛ, හො, අහ, ආහ, අහො, ආහො, අථ, අථො, චෙත්, යත්, යදි, අයෙ, අඩග, භොඃ, අමා, ඔම්, ඉති, රෙ, අරෙ, ඌරී, ඌරී, උරරි, එවං, කිල, කච්චිත්, බලු, යත්‍ර, තත්‍ර, යථා, තථා, යාවත්, තාවත්, තිර්‍යක්, නූනං, නඤ්, මා, මාඞ්, වෂට්,'වෞෂට්,'යුගපත්, භූයස්, ශශ්වත්, සචිත්, හන්ත, ස්වාහා, ස්වධා, ස්වස්ති, නමස්, සුෂ්ඨු, සම, අ, ආ, ඉ, ඊ, උ, ඌ, එ, ඓ, ඔ, ඖ, මේ ආදියයි.

ගිසංඥයෝද ප්‍ර ආදිකොට ඇති විස්සයි, මොව්හු නිපාතසංඥ වන්නාහුය. මෙහි ගි යන ශබ්දයෙන් ගිසංඥයෝම ගන්නා ලැබෙත්, එහෙයින්ම ප්‍රශංසාදියෙහි වූ සු අති ආදීන්ට ගිසංඥ නුවූ කල්හිද නිපාතසංඥ (අව්‍යයසංඥ) වෙත්.

† ණ මි-ණ න ඛ ම ඉත් යෙෂාං තෙ ණමිතඃ, අනෙත භවං අන්ත්‍යං අන්ත්‍යඤ්ච තත් අචෙචති තස්මාත් අන්ත්‍යාචඃ. යශෙශ්‍යාච්‍යාතෙ සී ෂෂ්ඨ්‍යන්තයෙන් දක්වූ බැවින් ප්‍රත්‍යයන් කෙරෙහි පැවැත්ම නොවේ, එහෙයින් ඉත්සංඥ ඛකාරවත්වූ ඛෙ ආදි විභක්තීහු ලිඟුහු කෙරෙන් පරයෝමය. එසේම මූර්ධන්‍ය ණකාර ඉත්සංඥවත්වූ ණප් ආදීහුද ධාතුහු කෙරෙන් පරයෝමය.

(මු-) 18. **පරයන්‍යඃ.** (පරඃ 1. ත්‍යඃ 1.)

ප්‍රකෘතෙඃ පරෝ යඃ ස ත්‍යසංඥඃ සත්‍යාත්.

(ස-) ප්‍රකෘතෙඃ, පදයාගේ මූලභාගයවූ ප්‍රකෘතිහු කෙරෙන්; පරෝ යඃ, පරවූ යමෙක් ඇද්ද ; සඃ, හෙතෙම ; ත්‍යසංඥඃ සත්‍යාත්, ත්‍යසංඥ (ප්‍රත්‍යයසංඥ) ඇත්තේ වන්නේය.

(මු-) 19. **අං අඃ නුවි.** (අං අඃ 1.. නුවි 1..)

අකාර උච්චාරණාර්ථඃ, බින්දුවිබින්දුමාත්‍රෞ වර්ණෞ ක්‍රමාත්නුවි සංඥෞ ස්තඃ.

(ස-) අකාරඃ, අකාරයතෙම ; උච්චාරණාර්ථඃ, උච්චාරණය ප්‍රයොජනවශයෙන් පවත්නේය ; බින්දු, බින්දුවද ; විබින්දුමාත්‍රෞ, බින්දුවය මාත්‍රවූ ; වර්ණෞ, වර්ණවය ; ක්‍රමාත්, පිළිවෙළින් ; නුවිසංඥෞ, නුසංඥ (අනුස්වාරසංඥ) ද, විසංඥ (විසර්ග සංඥ) ද යන මොව්හු ; ස්තඃ, වෙත්.

(මු-) 20. **ක + පෞ ෆ මූනෞ.** (ක + පෞ ෆ 1.. මූනෞ 1..)

වජ්‍රගජකුම්භාකෘතී වර්ණෞ ක්‍රමාත් මූනීසංඥෞ ස්තඃ*.

(ස-) වජ්‍රගජකුම්භාකෘතී, වජ්‍රායුධය හාද හස්තිකුම්භය හාද ආකාර ඇත්තාවූ ; වර්ණෞ, වර්ණවය ; ක්‍රමාත්, පිළිවෙළින් ; මූනීසංඥෞ, මූසංඥ (ජිහ්වාමූලීයසඥ) ද, නීසංඥ (උපාධ්මානීය සංඥ) ද යන දෙක ; ස්තඃ, වෙත්.

(මු-) 21. **හො ඛස්.** (හඃ 1. ඛස් 1.)

හකාරෝ ඛස් සංඥඃ ස්‍යාත්.

(ස-) හකාරඃ, හකාරයතෙම ; ඛස් සංඥඃ ස්‍යාත්, ඛස් සංඥ වන්නේය.

ඉති සංඥපාදඃ.†

සංඥපාදඃ, සංඥපාදය ; ඉති, මෙසේයි.

---

* ජිහ්වාමූලිය වර්ණය දිව මුලින් උච්චාරණය කළයුතුය, උපාධ්මානීයය ඔෂ්ඨවයෙන් උපදියි, උච්චාරණය වනාහි සඝෝෂශ්වාසයක් වැනියි.

නුවී පූර්වේණ සම්බන්ධෞ මූනෞ තු පරගාමිණෞ,
චත්වාරෝ යොගවාහාඛ්‍යාඃ ණත්වකර්මණ්‍යවො මතාඃ.
අවඃ ඛයං විරාජනෙත හසසතු පරගාමිණඃ.

† එකාර්ථය හා යුක්තවූ සූත්‍රසමූහය පාද නම්.

(මු-) **අථ සන්ධිඃ.***

(ස-) අථ, සංඥාපාදයට අනතුරුව; සන්ධිඃ, සන්ධිපාදය කියනුලැබේ.

(මු-) **22. සහ ණේ ඝිඃ.** (සහ 1. ණේ 7. ඝිඃ 1.)

ණේ පරෙ පූර්වස්‍ය ණේන සහ ඝිඃ ස්‍යාත්.†

(ස-) ණේ පරෙ, සමාන වර්ණයා පර කල්හි ; ණේන සහ, සමාන වර්ණයා හා සමග; පූර්වස්‍ය, පූර්වවර්ණයහට ; ඝිඃ ස්‍යාත්, දීර්ඝ වන්නේය.

(මු-) මුරාරිඃ, ලක්ෂ්මීශඃ, විෂ්ණූත්සවඃ, ධාතෲද්ධිඃ, සකෲදන්තඃ, හොතෲකාරඃ.

(ස-) මුර-අරිඃ යන මෙහි රකාරයෙහි සඞ්ගතවූ අකාරය වෙන්කොට රකාරය හල්කළ කල (මෙසේ සිටියි, මුර් අ අරිඃ) සමාන වර්ණයා පරකල්හි ඔහු හා සමග පූර්වවර්ණය හට මේ සූත්‍රයෙන් දීර්ඝකළ කල්හි එකම අයන්නෙක් වේ, නැවත ඒ

---

* ගැළපීම ස්වභාවකොට පවත්නා ශබ්දයන්ගේ වෙන්වීම ඇති කල්හි ඔවුන්ගේ කීම රළුවෙයි, කණට මධුර නොවෙයි, ඒ දෝෂයත් වැළැක්වීම පිණිස පූර්වශබ්දයාගේ කෙළවර අක්ෂරයාගේ හෝ අපරශබ්දයාගේ ප්‍රථමාක්ෂරයාගේ හෝ මේ දෙදෙනාගේම හෝ පෙරළීමෙන් ශබ්ද සම්බන්ධවූ දෙදෙනෙක් ගළපනු ලැබේද්ද මෙබඳුවූ සංයෝගය සන්ධියයි කියනලදී, මේ සන්ධිහුගේ සාධාරණ නියමයයි,

සන්ධිරෙකපදෙ නිත්‍යො නිත්‍යො ධාතූපසර්ගයොඃ,
සමාසෙපි ච නිත්‍යඃ ස්‍යාත් ස චාන්‍යත්‍ර විභාෂිතඃ.

† සමානවර්ණද්වය අතුරෙහි පූර්වවර්ණයාගේ හ්‍රස්වත්වය ඇති කල්හි පරවර්ණයාගේ වනාහි දීර්ඝත්වය ඇති කල්හිද, 1, පූර්වය හට දීර්ඝත්වය ඇති කල්හි පරයාහට හ්‍රස්වත්වය ඇති කල්හිද, 2, දෙදෙනාගේ හ්‍රස්වත්වය ඇති කල්හිද, 3, දීර්ඝත්වය ඇති කල් හිද, 4, පූර්වවර්ණය දීර්ඝවන්නේය. මෙසේයි, ශිව — ආඥා = ශිවාඥා, 1, උමා — අර්චා = උමාර්චා, 2, මුර — අරිඃ = මුරාරිඃ, 3, රාජා—ආගතඃ=රාජාගතඃ, 4, යනාදියයි. මේ සූත්‍රයෙහි සමාන වර්ණයා හා සමග දීර්ඝය කළ කල්හි පූර්වාපර නියමයක් නැති බැවින් හොතෲකාරඃ යන මෙහි පරවර්ණයහට දීර්ඝකළ කල්හි හොතෘකාරඃ යනු ඉෂ්ට නොවන්නේය. ඣප්ප්‍රත්‍යාහාරයාගේ සමානවර්ණත්වය ඇති කල්හිද දීර්ඝත්වයක් නොවනබැවින් අය් ප්‍රත්‍යාහාරයම දීර්ඝවන්නේය.

ආසන්න හල් රකාරයෙහි සංගතකරනු, මුරාරිඃ යනු වේ. ලක්ෂ්මී-ඊශඃ, විෂ්ණු-උත්සවඃ, ධාතෘ-ඍද්ධිඃ, ශක්ඳ-ඏදන්තඃ, හොතෘ-ඏකාරඃ යන තන්හිද මකාරාදීන්ගේ ඊකාරාදිය වෙන් කරනු, සමාන වර්ණයන් පර කල්හි ඔවුන් හා සමග පූර්ව ඊකාර-උකාර-ඍකාර-ඏකාර-ඎකාරයන්ට මෙම සූත්‍රයෙන් දීර්ඝව, ලක්ෂ්මීශඃ-විෂ්ණූත්සවඃ-ධාතෲද්ධිඃ-ශකෟදන්තඃ-හොතෲකාරඃ කියාද වෙත්.

(මූ) **23. ආද්ගුණවෘද්ධීන්‍යුපිම්.** (ආත් 5. ඉක්එචොඃ 6.. ණුච්රී 1..)

අවර්ණාත් පරයොරිගෙචොරවර්ණෙන සහ ක්‍රමාත් ණුච්රී ස්තඃ.

(ස-) අවර්ණාත් පරයොඃ, අවර්ණයා කෙරෙන් පරවූ; ඉක් එචොඃ, ඉක්ප්‍රත්‍යාහාරය (ඉ උ ඍ ඏ) හා එච්ප්‍රත්‍යාහාරය (එ ඔ ඓ ඖ) ද යන මොවුන් දෙදෙනා හට ; අවර්ණෙන සහ, අවර්ණයා හා සමග ; ක්‍රමාත්, ක්‍රමයෙන්; ණුච්රී ස්තඃ, ගුණ වෘද්ධි දෙක වෙත්.

(මූ) හෘෂීකෙශඃ.

(ස-) හෘෂීක-ඊශඃ යන තන්හි කකාර සංගතවූ අකාරය වෙන්වේ, ඒ අවර්ණය හා සමග ඊකාරය හට මෙයින් ගුණව එකාරයෙක් වේ, නැවත එකාරය කකාරය හා සංගතවේ, හෘෂීකෙශඃ යනු වේ.

(මූ-) දමොදරඃ, සන්ධිග්‍රහණාත් සන්ධිලුපෙ‍ෟව න සන්ධිඃ.*

(ස-) දමන් උදරඃ යන තන්හි නකාරයහට (118) නොලුප් යනාදියෙන් ලොප්වේ. නැවත මකාර සඞගත අකාරය වෙන්වේ, ඒ අවර්ණයා හා උකාරයහට මෙයින් ගුණඔකාරව, ඔකාරය මකාරය හා සංගතවේ, දමොදරඃ යනු වේ. සන්ධිග්‍රහණාත්, (15) සන්ධිශබ්දය පඨිත බැවින් ; සන්ධිලුපෙ‍ෟව, සන්ධිපාදයේ සූත්‍රයෙකින් ලොප්කළ කල්හිම ; න සන්ධිඃ, සන්ධිවිධානය බාධකවේ.

---

* ලුපි න සන්ධෟල්ලවිධි යන මෙහි සන්ධිශබ්දය ගැන්ම හෙතු කොටගෙණ සන්ධිපාදයේ සූත්‍රයෙකින් ලොප්කල කල්හිම සන්ධිනොවන්නේය, අන්‍යපාදයෙක්හි සූත්‍රයෙකින් ලොප්කල කල්හි වූකලී සන්ධිවන්නේය. එබැවින්, දමන්ශබ්දයාගේ නකාරයහට අන්‍ය පාදයෙක්හි සූත්‍රයෙකින් ලොප්කළ කල්හි දමොදරඃ සී සන්ධිවෙයි.

(මු-) මාධවර්ද්ධිඃ, ශිවල්කාරඃ.

(ස-) මාධව—ඍද්ධිඃ යන්නෙහි වකාරයාගේ අවර්ණයා කෙරෙන් ඍකාරය හට අවර්ණය හා සමග මෙයින් අර් සී ගුණව මාධවර්ද්ධිඃ යනු වේ. ශිව—ඏකාරඃ යන්නෙහි අවර්ණයා කෙරෙන් ඏකාරයහට මෙයින් අල් සී ගුණව, ශිවල්කාරඃ යනු වේ.

(මු-) කෘෂ්ණෛකත්වං මුකුන්දෞකඃ කෘෂ්ණෛක්‍යං භවෞෂධං.

(ස-) කෘෂ්ණ-එකත්වං යන්නෙහි අවර්ණයා කෙරෙන් එකාරයාහට මෙයින්-ඓ-සී වෘද්ධිව, කෘෂ්ණෛකත්වං. මුකුන්ද—ඔකඃ, යන්නෙහි අවර්ණයා කෙරෙන් ඔකාරයහට මෙයින්, ඖ, සී වෘද්ධිව මුකුන්දෞකඃ. කෘෂ්ණ—ඓක්‍යං, භව—ඖෂධං යන්නෙහි අවර්ණයන්ගෙන් ඓකාර ඖකාරයන්ට මෙයින් එම වර්ණයෝම වෘද්ධිසි, කෘෂ්ණෛක්‍යං, භවෞෂධං.

(මු-) **24. ගෙර්ධොරනෙධින එඞ්ඍකොඃ.** (ගෙඃ 6. ධොඃ 6. අන්-එධ්-ඉනඃ 6. එඞ්ඍකොඃ 6..)

ගෙරවර්ණාත් පරයොරෙධිනවර්ජිතස්‍ය ධොරෙඞ්ඍකොර වර්ණෙන සහ ක්‍රමාත් ඤුව්‍රී සතඃ.*

(ස-) ගෙඃ, උපසර්ගයාගේ; අවර්ණාත් පරයොඃ, අවර්ණයා කෙරෙන් පරවූ; එධිනවර්ජිතස්‍ය, එධ් ඉන් යන ධාතු රහිතවූ; ධොඃ, ලිඞ්ගසංඥ නොලද ධාතු සම්බන්ධිවූ; එඞ්ඍකොඃ, එඞ් ප්‍රත්‍යාහාර ඍක්ප්‍රත්‍යාහාර දෙදෙනාහට; අවර්ණෙන සහ, අවර්ණය හා සමග; ක්‍රමාත්, ක්‍රමයෙන්; ඤුව්‍රී සතඃ, ගුණ වෘද්ධි වෙත්.

(මු-) ප්‍රෛජතෙ පරෞබති අපාර්ජති.

(ස-) ප්‍ර—එජතෙ, පරා—ඔබති යන මෙහි අවර්ණයා

---

* උපසර්ගයන් අතුරෙහි—ප්‍ර පරා අප අව උප ආ (ඞ්) යන මොවුන් කෙරෙන් පරවූ, එධ—ඉන යන ධාතුරහිතවූ ලිඞ්ග සංඥ නොලද්දාවූ ධාතූන්ගේ එ ඔ යන මොවුන්ට ප්‍රාදීන්ගේ අවර්ණයා හා සමග ගුණ (8) වෙයි. ඍක්ප්‍රත්‍යාහාරය හට වෘද්ධි (9) වන්නීය. ලිඞ්ගසංඥ නොලද්දාහුගේ ගැන්මෙන් ලිඞ්ගසංඥ ලද ධාතූහුගේ එඞ් ඍක් යන දෙදෙනාහට ගුණ වෘද්ධි නොවෙත්, ඒ මෙසේසි, ප්‍ර—එජකඃ=ප්‍රෛජකඃ, ප්‍රෙජකඃ, සී නොවේ. ධාතූහුගේ ඏකාරය නැතිබැවින් එඞ් ඍතඃ යන මෙයිතුදු ඉෂ්ටසිද්ධිය ඇතිකල්හිද ඏකාරයාගේ ගැන්ම පරයා කෙරෙහි අනුවෘත්තිය සඳහාමය.

කෙරෙන් පරවූ එකාර ඔකාරයන්ට මෙයින් එම වර්ණ ගුණව, ප්‍රේජතෙ, පරොබති කියා වේ. අප—ඍච්ඡති යන්නෙහි අවර්ණයෙන් ඍකාරයහට මෙයින්, ආර් යි වෘද්ධිව අපාර්ච්ඡති.

(මූ-) අනෙධිනඃ කිං-උපෙධතෙ, අවෙති.

(ස-) අනෙධිනඃ කිං, සූත්‍රයෙහි අනෙධිනඃ යනු කුමටය? උපෙධතෙ, අවෙති යන මෙහි උපසර්ගයන්ගේ අවර්ණයා කෙරෙන් පරවූ ලිඞ්ගසංඥ නොලද එධ ඉන් යන ධාතූන්ගේ එකාරය හට මේ සූත්‍රයෙන් ගුණනොවීම ඇඟවීම පිණිසයි. උප—එධතෙ, අව—එති යන තන්හි (23) වෘද්ධිව, උපෙධතෙ, අවෙති.

(මූ-) **25. ලිඞ්ගධාත්වෝ.** (ලිඞ්ගධාඃ 6. වා 1.)

ලිඞ්ගධාතු පූර්වෝක්තං කාර්යං වා ස්‍යාත්.*

(ස-) ලිඞ්ගධාතු, නාමධාතුහට වනාහි; පූර්වෝක්තං කාර්යං, පළමු කියනලද්දාවූ උපසර්ගයාගේ අවර්ණයා කෙරෙන් එධ ඍක් ප්‍රත්‍යාහාරයන්ගේ ස්ථානයෙහි ගුණවෘද්ධිවිධානය; වා ස්‍යාත්, විකල්පයෙන් වන්නේය.

(මූ-) ප්‍රේකීයති ප්‍රෛකීයති, ප්‍රෝෂීයති ප්‍රෞෂීයති.

(ස-) ප්‍ර-එකීයති යන්නෙහි උපසර්ගයාගේ අවර්ණයා කෙරෙන් පරවූ එකාරයහට මෙයින් විකල්පයෙන් ගුණ එකාරයව ප්‍රේකීයති. පක්ෂයෙහි එකාරයහට ඓකාරය (23) වෘද්ධිව, ප්‍රෛකීයති. ප්‍ර-ඔෂීයති යන තන්හි ඔකාරයහට මෙයින් විකල්පයෙන් ගුණ ඔකාරයව, ප්‍රෝෂීයති. පක්ෂයෙහි ඔකාරයහට (23) වෘද්ධි ඖකාරයව, ප්‍රෞෂීයති.

(මූ-) ප්‍රාර්ෂභීයති ප්‍රර්ෂභීයති, ප්‍රාල්කාරීයති ප්‍රල්කාරීයති.

(ස-) ප්‍ර-ඍෂභීයති යන්නෙහි මෙයින් විකල්පයෙන් ආර් යි වෘද්ධි ආදෙශව, ප්‍රාර්ෂභීයති.

පක්ෂයෙහි අර් යි (23) ගුණව, ප්‍රර්ෂභීයති. ප්‍ර-ඏකාරීයති යන්නෙහි මෙයින් විකල්පයෙන් ආල් යි වෘද්ධිව, ප්‍රාල්කාරීයති. පක්ෂයෙහි අල් යි (23) ගුණව ප්‍රල්කාරීයති.

(මූ-) **26. ලොපො'පස්‍යාමාඬොඃ.** (ලොපඃ 1. අස්‍ය 6 ඔම්-ආඬොඃ 7..)

---

* ප්‍ර—ඔඩකාරීයති යන මේ ආදියෙහි, පූර්වාපරයොඃ පර විධිර්බලවාන් යන න්‍යාය හෙතුකොටගෙණ පරසූත්‍රයෙන් (26) අවර්ණයහට ලොප්කළ කල්හි, ප්‍රොඩකාරීයති යනු වේ. ප්‍රෞඩකාරීයති කියා නොවේ.

අවර්ණස්‍ය ඔමාඩොඃ පරයො ලොපඃ ස්‍යාත්.*

(ස-) ඔම් ආඩොඃ පරයොඃ, ඔම්ශබ්දයද ආදෙශකරණලද ආඩ් යන්නද පරකල්හි; අවර්ණස්‍ය, අවර්ණයහට; ලොපඃ ස්‍යාත්, ලොප්වන්නේය.

(මු-) ශිවායොනනමඃ, ශිවෙහි, බ්‍රහ්මොතං, රාජර්ෂිඃ.†

(ස-) ශිවාය-ඔම්-නමඃ (50—51) මකාරයහට අනුස්වාරව නැවත නකාරය වේ, ඔනනමඃ.

යකාරයෙහි අකාරයහට මෙයින් ලොප්වේ, ශිවායො ननමඃ. අ—ඉහි (23) ගුණයි = එහි.

ශිව—එහි වකාරයෙහි අකාරයහට මෙයින් ලොප්වේ, ශිවෙහි. අ—ඌතං (23) ගුණයි, ඔතං. බ්‍රහ්මා—ඔතං මකාරයෙහි අවර්ණයහට මෙයින් ලොප්වේ, බ්‍රහ්මොතං. ආඍෂිඃ පෙරසේම ගුණවේ, අර්ෂිඃ. රාජ—අර්ෂිඃ ජකාර යෙහි අවර්ණයහට මෙයින් ලොප්වේ, රාජර්ෂිඃ.

(මු-) ස්ථානිවද්දෙශඃ. වයොර්විභාෂයොර්මධ්‍යෙ විධිර්නිත්‍යඃ.‡

(ස-) ආදෙශඃ, ආදෙශයතෙම; ස්ථානිවත්, යම් අක්‍ෂරයක් හුගේ ස්ථානයෙහි යම් අන්‍යාක්‍ෂරයෙක් ආදෙශකරණලදද

---

* මෙහි අවර්ණයාගේ ගැන්ම සහශබ්දයාගේ නැවැත්ම පිණිසයි. ආදෙශ නොකරණලද ආඩ් යන්න පරකල්හි දීඝීකිරීමෙන්ම පදසිඩිය හෙතුකොටගෙණ අවර්ණලොපය නිරර්ථක බැවින් ආදෙශිත ආඩ් පරකල්හි අවර්ණයහට ලොප්වේ.

† මෙහි, ලොපො'ප්‍යාදෙශ උච්‍යතෙ, යන න්‍යාය හෙතු කොටගෙණ ආදෙශය ස්ථානිවත්ය යන මේ නියමයෙන් අකාරයාගේ ස්ථානිවත්වයෙන්, අයාං යෙවාඃ, යන මෙයින් (37) යකාරය ලොප්නොවේ.

‡ ස්ථානමස්‍යාස්තීති ස්ථානී, ආදිශ්‍යතෙ'සෞ ආදෙශඃ. වස්තු වශයෙන් වනාහි යම් තැනෙක්හි කැමතිනොවේද ඔවුන් කෙරෙහි ස්ථානිවත්වයෙක් නැත්තේය. එහෙයින්ම පුරාතනයෝ කැමතිවූ සිඩිය සඳහාම න්‍යාය ගණිත්, ඉෂ්ටසාධන යෙක් නැති තන්හි නොගණිත්.

පූර්වාපරසූත්‍ර දෙක්හි විකල්පවාචිවූ වාශබ්දය යුක්තකල්හි ඒ මධ්‍යයෙහි පවත්නා සූත්‍ර එකක හෝ දෙකක නොහොත් ඉන් වැඩියක වාශබ්දය පතිතනොවේ, එහෙයින් එම සූත්‍රගත විධානය විකල්පරහිතවේ, මෙසේයි, (25) ලිඩොචා, (28)

හෙතෙම ප්‍රථම වර්‍ණයවූ සථානය ඇත්තහු වැනි වෙයි. වයෝර්විභාෂයෝර්මධ්‍ය, විකල්ප දෙදෙනාගේ මධ්‍යයෙහි; විධිඃ, විධානයතෙම; නිත්‍යඃ, විකල්ප රහිතයි.

(මූ-) **27. එවෙ'නියොගෙ.** (එවෙ 7. අනියොගෙ 7.)

අවර්‍ණස්‍ය එවෙ පරෙ ලොපඃ සත්‍යත් අනියොගෙ.

(ස-) අනියොගෙ, නියමාර්ථයෙහි නුවූ; එවෙපරෙ, එව යන නිපාතය පරකල්හි; අවර්‍ණස්‍ය, අවර්‍ණයහට; ලොපඃ සත්‍යත්, ලොප්වන්නේය.

(මූ-) අද්‍යෛව. නියොගෙතු—අද්‍යෛව ගච්ඡ.

(ස-) අද්‍ය—එව යන මෙහි මෙයින් අවර්‍ණයහට ලොප්වේ, අද්‍යෙව. නියොගෙතු, නියමයෙහි වූකලී; අද්‍ය—එව ගච්ඡ (23) අවර්‍ණයා හා සමග වෘද්ධ්‍යදෙශයි, අද්‍යෛව ගච්ඡ.

(මූ-) **28. වෞෂ්ඨෞතෝඃ සෙ.** (වා 1. ඔෂ්ඨෞතෝඃ 7.. සෙ 7.)

අවර්‍ණස්‍ය ඔෂ්ඨෞතෝඃ පරයො ලොපඃ සත්‍යත් වා සෙ සති.*

වෞෂ්ඨෞතෝඃ සෙ, යන මේ සූත්‍ර දෙදෙනාගේ මධ්‍යයෙහි (26) ලොපො'සෙත්‍යමාඩොඃ, (27) එවෙ'නියොගෙ, යන මේ දෙදෙනාහට වාශබ්දය පතිතනොවේ.

යම්තැනෙක්හි වනාහි වාශබ්දය නියමය කියාද එහි වා ශබ්ද දෙදෙනාගේ මධ්‍යයෙහි පවත්නාහුගේ කැමැත්ත ඇතිවීමෙන් විකල්පරහිත බවද කැමැත්ත නැතිවීමෙන් විකල්ප බවද දතයුතු—(37) අයාං යෙවාඃ යන්නද (39) ගොර්වා යන්නද යන මේ සූත්‍රයන්ගේ මධ්‍යයෙහි (38) එඩො'තඃ, යන මොහුගේ නිත්‍යභාවය වෙයි. (66) සෙතුක බපඵෙවා, යන්නද, (71) යවාච් යන්නද මොවුන්ගේ මධ්‍ය යෙහි, (67) ශසි ශස් යන්නද (68) කඛපඵයෝ‍ර්මුනෞ‍ෂ්‍ය යන මොවුන් දෙදෙනාගේ විකල්පය වෙයි. (69) අතොඩවුඃ, යන්නද (70) අභොභගො යනාදියද යන මොවුන් දෙදෙනා ගේ නිත්‍යත්වය වෙයි.

* මෙහි වාශබ්දය නියමය කියන බැවින් සංඥ ශබ්දයක් පරකල්හි නිත්‍යයෙන් අවර්‍ණයහට ලොප්වන්නේය, එහෙයින් ප්‍රොෂ්ඨඃ, යනු වේ, වෘෂභයයි, මෙහි ප්‍ර-ඔෂ්ඨඃ මෙයින් අවර්‍ණය හට ලොප්ව, ප්‍රොෂ්ඨඃ. ප්‍රොෂ්ඨී යන්නද මෙසේමැයි, මත්ස්‍ය විශෙෂයෙකි.

(ස-) ඔෂ්ඨොත්වොඃ පරයොඃ, ඔෂ්ඨශබ්දයද ඔතුශබ්දයද මේ දෙක පරකල්හි ; සෙ සති, සමාසව සිටීමක් ඇති කල්හි ; වා, විකල්පයෙන් ; අවර්ණස්‍ය, අවර්ණයහට ; ලොපඃ ස්‍යාත්, ලොප්වන්නේය.

(මු-) විම්බොෂ්ඨඃ විම්බෞෂ්ඨඃ, ස්ථූලොතුඃ ස්ථූලෞතුඃ. සෙ කිං-තවෞෂ්ඨඃ.

(ස-) විම්බ — ඔෂ්ඨඃ යන්නෙහි අවර්ණයහට මෙයින් විකල්පයෙන් ලොප්වේ, විම්බොෂ්ඨඃ. තුබූපක්‍ෂයෙහි අවර්ණයා හා සමග ඔකාරයහට ඖ යී (23) වෘද්ධ්‍යාදෙශයයි, විම්බෞෂ්ඨඃ. ස්ථූල — ඔතුඃ යන්නෙහි අවර්ණයහට මෙයින් විකල්පයෙන් ලොප්වේ, ස්ථූලොතුඃ. පක්‍ෂයෙහි අවර්ණයා හා සමග ඔකාරයහට වෘද්ධ්‍යාදෙශයයි, ස්ථූලෞතුඃ. සෙකිං, සූත්‍රයෙහි සෙ සතු කුමටද? තව ඔෂ්ඨඃ යන තන්හි සමාසනුවූ හෙයින් මෙයින් අවර්ණයහට ලොප්නොවන පිණිසයි. අවර්ණයා හා සමග ඔකාරයහට (23) වෘද්ධ්‍යාදෙශයයි, තවෞෂ්ඨඃ.

(මු-) **29. ත්‍රීසෙ ත්වෘතො වෘං.** (ත්‍රීසෙ 7. තු 1. ඍතඃ 1. වෘං 2.)

අවර්ණාත් පරසෘතො වෘද්ධිමාප්නොති ත්‍රීසෙ සති.*

(ස-) ත්‍රීසෙ සති, තෘතීයාසමාසය වූ කල්හි; අවර්ණාත්, අවර්ණයා කෙරෙන්; පරසෘතඃ, පරවූ අව්‍යවධාන ඍතශබ්දයාගේ ඍකාරයතෙම; වෘද්ධිමාප්නොති, අවර්ණයා හා සමග වෘද්ධි ආදෙශයට පැමිණේ.

(මු-) ශීතාර්තඃ. ත්‍රීසෙ කිං පරමර්තඃ, ව්‍යවධානස්‍ය නානුවෘත්තිඃ.†

---

* අර්ථවශාත් විභක්තෙර්විපරිණාමඃ, යන න්‍යායයෙන්, ලොපො'සත්‍යමාඩොඃ, යන සූත්‍රයෙන් කියනලද්දවූ, අස්‍ය යන මේ විභක්තිය පෙරළා අවර්ණාත්යයි කියයි. වෘද්ධිවිධානය දක්නා බැවින් නියමයෙන් සහ යන්න යෙදේ.

† ශීතෙන ඍතඃ—යී තත්පුරුෂ සමාස වේ, ඍතඃ යනු පීඩිතවූ යන අර්ථයි. මෙසේම, ක්‍ෂුධයා-ඍතඃ-ක්‍ෂුධාර්තඃ, යනු වේ. පරමශ්චා සෞ ඍතශ්ච යී කර්මධාරයසමාස කළ කල්හි ඍතශබ්දයාගේ ඍකාරයහට වෘද්ධිනොවන හෙයින් ගුණයි. තුකාරය අන්තකොට ඇති පදයාගේ පරසූත්‍රයෙහි යෙදීමෙක් නැත්තේය. යන මේ ඇඟවීමෙන් ව්‍යවධානරහිත පදයාගේ පරසූත්‍රයෙහි ගැළපීම වෙයි යනු දක්වනලදී. අනිකෙක් වනාහි, ඥාපකසිද්ධමනිත්‍යම් යන න්‍යායයෙන් කිසිතැනෙක්හි නොකමැති තන්හි නොයෙදේ.

(ස-) ශීත—ඍතඃ අවර්ණයා කෙරෙන් පරවූ ඍකාරය අවර්ණයා හා සමග මෙයින් වෘද්ධ්‍යාදෙශයි, ශීතාර්ත්තඃ. තෘසෙ කිං, තෘසෙ යනු කුමටය? පරමර්ත්තඃ, යන මෙහි තෘතීයා සමාසය නොවන බැවින් මෙයින් වෘද්ධිනොවන බව ඇඟවීම පිණිසයි. පරම-ඍතඃ (23) අර් සි ගුණස්, පරමර්ත්තඃ. ඩවනතසෘ, තෘඅනන ශබ්දයාතමා; නානුවෘත්තිඃ, පරසූත්‍ර පසුපස්සේ අධිකාරවශයෙන් ගමන නොවේ.

(මු-) 30. ඍණ ප්‍ර වසන වත්සර වත්සතර දශ කම්බලස්‍ය ණඃ.. (ඍණ—කම්බලස්‍ය 6. ඍණඃ 1.)

එෂාමවර්ණාත් පරඍණෙ විරිමාපෙනාති, ඍණාර්ණං ප්‍රාර්ණං.*

(ස-) එෂාං, ඍණශබ්ද-ප්‍ර-වසන-වත්සර-වත්සතර-දශ-කම්බල යන මොවුන්ගේ; අවර්ණාත්, අවර්ණයා කෙරෙන්; පර ඍණඃ, පරවූ ඍණශබ්දයතෙම; විරිමාපෙනාති, අවර්ණයා හා සමග වෘද්ධ්‍යාදෙශයට පැමිණේ. ඍණ-ඍණං අවර්ණයා කෙරෙන් පර ඍකාරය හට මෙයින් අවර්ණයා හා සමග වෘද්ධියි, ඍණාර්ණං. ප්‍ර-ඍණං=ප්‍රාර්ණං යන්නෙහිද මෙයින්ම වෘද්ධියි.

(මු-) 31. ස්වාක්ෂයොරීරෙහිණ්‍යොඃ. (ස්ව-අක්ෂයොඃ 6.. ඊර-ඌහිණ්‍යොඃ 1..)

අනයොරවර්ණාත් පරාවෙතෞ විරිමාප්නුතඃ.

(ස-) අනයොඃ, ස්ව-අක්ෂ යන මේ දෙදෙනාගේ; අවර්ණාත් පරෞ, අවර්ණයා කෙරෙන් පරවූ; එතෞ, ඊර-ඌහිණී යන ශබ්දවය; විරිමාප්නුතඃ, වෘද්ධිආදෙශයට පැමිණෙත්.

---

* නයින් උපන් නය, ඍණාර්ණ නම්, උත්කෘෂ්ටවූ නය-ප්‍රාර්ණ නම්. වසන-ඍණං, අවර්ණයා හා සමග ඍකාරයහට මෙයින් වෘද්ධියි, වසනාර්ණං, වස්ත්‍රය සඳහා වූ නයයි. වත්සරාර්ණං යනාදීනුද මෙසේම මෙයින් වෘද්ධිව සිද්ධයෝයි, අව්රුද්දකින් දියයුතු නය වත්සරාර්ණ නම්. අව්රුද්දක් ඉක්මවා දියයුතු නය වත්සතරාර්ණ නම්. ජලදුර්ගයන් ඇත්තාවූ ප්‍රදෙශය දශාර්ණ නම්, එනම් දෙශය හා නදියයි. කම්බිලියක් සඳහා වූ නය, කම්බලාර්ණ නම්. කියනලද මේ ශබ්ද සතින් පිටත්වූ අන්‍යශබ්ද යත් හා යෙදුනු ඍණශබ්දය (23) ගුණවෙයි, ඒ මෙසේයි, අධම—ඍණඃ=අධමර්ණඃ, උත්තම—ඍණඃ=උත්තමර්ණඃ.

(මු-) සෛවරං, අක්ෂෞහිණී.*

(ස-) ස්ව-ඊරං අවර්ණයා කෙරෙන් පරවූ ඊකාරයහට අවර්ණයා හා සමග මෙසින් වෘද්ධ්‍යාදෙශයි, සෛවරං. අක්ෂ-ඌහිණී, අවර්ණයා හා සමග ඌකාරයහට මෙසින් ඖකාරය වෘද්ධ්‍යාදෙශයි, අක්ෂෞහිණී.

(මු-) 32. ප්‍රශ්‍යෙඪෛෂ්‍යාහාඃ. (ප්‍රස්‍ය 6. ඌඪ-ඌඪි-ඌහාඃ 1...)

ප්‍රස්‍යවර්ණාත් පරා ඒතෙ වීරිං යාන්ති.

(ස-) ප්‍රස්‍ය, ප්‍ර යන උපසර්ගයාගේ ; අවර්ණාත්, අවර්ණයා කෙරෙන් ; පරාඃ, පරවූ ; ඒතෙ, ඌඪ ඌඪි ඌහ යන මොවුන්ගේ ඌකාරයෝ ; වීරිං යාන්ති, අවර්ණයා හා සමග වෘද්ධ්‍යාදෙශයට යෙත්.

(මු-) ප්‍රෞඪඃ, ප්‍රෞඪිඃ, ප්‍රෞහඃ.†

(ස-) ප්‍ර-ඌඪඃ අවර්ණයා හා සමග ඌකාරයහට මෙසින් වෘද්ධියි, ප්‍රෞඪඃ. ප්‍ර-ඌඪිඃ, ප්‍ර-ඌහඃ යන මෙහිද අවර්ණයා හා සමග ඌකාරයහට මෙසින් වෘද්ධියි, ප්‍රෞඪිඃ, ප්‍රෞහඃ.

(මු-) 33. ඓවෙෂෙෂ්‍යෝ. (වා 1. ඒෂ-ඒෂ්‍යෝ 1 ..)

ප්‍රස්‍යවර්ණාත් පරාවෙතෞ වීරිං වා ප්‍රාප්නුතඃ.‡

---

* සූත්‍රයෙහි ඊර යන මොහුගේ අකාරය කීම ප්‍රයොජන කොට ඇත්තේය, එහෙයින් රකාරාන්තවූ ඊර් යන මොහුගේ ගැන්ම වෙයි, එබැවින් ඊර ඊර්න් යන මොවුන්ගේ ලාභය වෙයි. ඒ මෙසේයි, සෛවරං, සෛවරී, සෛවරිණී කියා වෙත්. අභිධාන රහිත බැවින් සෛවරා යනු මෙහි නොවන්නේය, මලාදිරහිතෙ සෛවරං ත්‍රිෂු ස්වච්ඡන්දමන්දයොඃ, කියා වෙයි. ඌහිණී යනු මූර්ධන්‍ය ණකාර නිර්දේශය හෙතුකොට ගෙණ—අක්ෂානුහිතුං ශීලමස්‍යඃ යන වාක්‍යයෙහි සංඥායෙහිම අක්ෂෞහිණී යනු වේ, සෙනාවයි, පාශකයද සත්‍රිද කියනු ලැබෙත්, අන්‍යාර්ථයෙහි වනාහි නොවේ.

† ඌඪාදී මේ ශබ්දත්‍රය ඌහධාතුහු කෙරෙන් ක්තප්‍රත්‍යයද, ක්ති ප්‍රත්‍යයද, ඝඤ් ප්‍රත්‍යයද විමෙන් සිද්ධයෝයි. වහ ධාතුහු කෙරෙන් පරව, ප්‍රාඪඃ (23), (බරයි) යනාදිය වේ.

‡ විකල්පයෙන් වෘද්ධිවිධාන බැවින් පක්ෂයෙහි නියමයෙන් ගුණවෙයි යනු දන්නාලැබේ, මෝතොමෝ වාශබ්දයාගේ නියමයයි. ප්‍රෙෂාදියෙන් ද්‍යුතනෙම කියනුලැබෙයි.

(ස-) ප්‍රස්‍ය, ප්‍ර යන්නහුගේ ; අවර්ණාත් පරෞ, අවර්ණයා කෙරෙන් පරවූ ; එතෞ, එෂ-එෂ්‍ය යන මේ දෙක ; වා, විකල්පයෙන් ; වෘද්ධිං ප්‍රාප්නුතඃ, වෘද්ධියට පැමිණෙත්.

(මූ-) ප්‍රෛෂඃ, ප්‍රෛෂ්‍යඃ. ප්‍රෙෂඃ, ප්‍රෙෂ්‍යඃ.

(ස-) ප්‍ර-එෂඃ අවර්ණයා හා එකාරයහට මෙයින් විකල්පයෙන් වෘද්ධියි, ප්‍රෛෂඃ. ප්‍ර-එෂ්‍යඃ එසේම මෙයින් විකල්පයෙන් වෘද්ධියි, ප්‍රෛෂ්‍යඃ. පක්ෂයෙහි අවර්ණයා හා එකාරයහට (23) ගුණයි, ප්‍රෙෂඃ, ප්‍රෙෂ්‍යඃ.

(මූ-) **34. මනීෂාඃ.** (මනීෂාඃ 1...)

මනීෂාද්‍යා නිපාත්‍යන්තෙ.*

(ස-) මනීෂාද්‍යාඃ, මනීෂාදීහු ; නිපාත්‍යන්තෙ, නිපාතනයෙන් සිද්ධකරණු ලැබෙත්.

(මූ-) මනීෂා, හලීෂා, ලාඞ්ගලීෂා, ශකන්ධුඃ, කුලටා, සීමන්තඃ, පතඤ්ජලිඃ, සාරඞ්ගඃ.†

(ස-) මනස්-ඊෂා අස්භාගය හට මෙහි නිපාතනයෙන් ලොපයි, මනීෂා. හල-ඊෂා, ලාඞ්ගල-ඊෂා, ශක-අන්ධුඃ, කුල-

---

* යමෙක් යමෙක් ලක්ෂණයෙන් නූපන්නේද ඒ සියල්ල නිපාතනයෙන් සිද්ධකටයුතුයයි කියයුතු. කිසිතැනෙක්හි වර්ණාගමවලින්ද, කිසිතැනෙක්හි වර්ණවිපර්‍ය්‍යාසවලින්ද, වර්ණවිකාරවලින්ද, වර්ණනාශවලින්ද, ධාත්වර්ථ විශෙෂවලින්ද, ඔහුගේ සිද්ධිය දතයුතු වන්නීය. නිපාතන භෙද පසෙකි, ඒ මෙසේයි :—

වර්ණාගමො වර්ණවිපර්‍ය්‍යයශ්ච
ද්වෞ චාපරෞ වර්ණවිකාරනාශෞ,
ධාතොස්තදර්ථාතිශයෙන යොගස්
තදුච්‍යතෙ පඤ්චවිධං නිරුක්තමිති.

† මනීෂා, බුද්ධියයි, ඊෂා, නඞ්ගලදණ්ඩයි. ශකන්ධුඃ, එනම් දෙශයේ ලිඳයි. කුලටා, වෙශ්‍යායයි. සීමන්තඃ, කියඹුවැල නම්වූ කෙශවින්‍යාසයයි. පතඤ්ජලිඃ, මුනිවිශෙෂයෙකි. සාරඞ්ගඃ, චාතක පක්ෂි ආදීහුයි. සූත්‍රයෙහි බහුවචන නිර්දෙශයෙන්ද වෘත්තියෙහි ආදි යන පදය ගත්බැවින්ද අන්‍යවූද පදයෝ නිපාතනයෙන් සිද්ධවෙත්. මේ ආදි බහුවචනාන්තයෝ ගණයාගේ ප්‍රකාශකයෝයයි පූර්වයෝ කියති. එසේමැයි, බෘහස්පතිඃ, වාචස්පතිඃ, වනස්පතිඃ, ගොෂ්පදං, ආස්පදං, තස්කරඃ, මස්කරී.

අටා යන මේ සියලුතන්හි අවර්ණයන්ට මෙම නිපාතනයෙන් ලොපයි, හලීෂා, ලාඞ්ගලීෂා, ශකන්ධුඃ, කුලටා. සීමන්-අන්තඃ අන්භාගය හට නිපාතනයෙන් ලොපයි, සීමන්තඃ. පතත්-අඤ්ජලිඃ අත්භාගය හට මෙහි නිපාතනයෙන් ලොපයි, පතඤ්ජලිඃ. සාර-අඞ්ගඃ යන්නෙහිද අවර්ණ ලොපය පෙර සේමයි, සාරඞ්ගඃ.

(මු-) 35. **යලායවායාවෝ'චීවඃ.** (යල් අය් අව් ආය් ආවඃ 1...අචි 7. ඉවඃ 6.)

ඉවඃ ස්ථානෙ ය් ව් ර් ල් අය් අව් ආය් ආව් එතෙ අචි පරෙ ක්‍රමාත් ස්‍යුඃ.*

(ස-) අචි පරෙ, අච්සංඥයා පරකල්හි ; ඉවඃ ස්ථානෙ, ඉව් සංඥයාගේ ස්ථානයෙහි ; ය් ව් ර් ල් අය් අව් ආය් ආව් එතෙ, ය් ව් ර් ල් අය් අව් ආය් ආව් යන මොව්හු ; ක්‍රමාත් ස්‍යුඃ, පිළිවෙළින් ආදෙශවෙත්.

(මු-) ත්‍ර්‍යම්බකඃ, විෂ්ණ්වීශෞ, ධාත්‍රච්‍යුතෞ, ලාකෘතිඃ, හරයෙ, සමහවෙ, නායකඃ, පාවකඃ.

(ස-) ත්‍රි-අම්බකඃ, ඉකාරයහට මෙයින්-ය්-ආදෙශයි, ත්‍ර්‍යම්බකඃ. විෂ්ණු—ඊශෞ, උකාරයහට මෙයින්-ව්-ආදෙශයි, විෂ්ණ්වීශෞ. ධාතෘ—අච්‍යුතෞ, ඍකාරය හට මෙයින්-ර්-වේ, ධාත්‍රච්‍යුතෞ. ඏ-ආකෘතිඃ, ඏකාරය හට මෙයින්-ල්-වෙයි, ලාකෘතිඃ. හරෙ-ඒ, රකාරයාගේ ඒකාරයහට මෙයින්-අය්-වේ, හරයෙ. සමෙහා-ඒ, ඔකාරයහට මෙයින්-අව්-වේ, සමහවෙ. නෛ-අකඃ, ඓකාරයහට මෙයින්-ආය්-වේ, නායකඃ. පෞ-අකඃ, ඖකාරයහට මෙයින්-ආව්-වේ, පාවකඃ.

අටවී, ආශ්වයුජං, පෘෂොදරඃ, කෙශවඃ, පරොක්ෂං, පශ්චාර්ධං, හරිශ්චන්ද්‍රඃ, භුවලෝකඃ, අන්‍යොන්‍යං, ඉතරෙතරං, පරස්පරං, පිශාචඃ, කපිත්ථඃ, නිෂ්කං, රත්නං, යන මේ ආදියයි.

* ඉ උ ඍ ඏ ඒ ඔ ඓ ඖ යන මේ වර්ණයන්ගේ ස්ථානයෙහි ක්‍රමයෙන් :—

ය් ව් ර් ල් අය් අව් ආය් ආව් යන මොව්හු අවර්ණ එච්සංඥ අසමාන ඉක් සංඥ යන මොවුන් පරකල්හි ක්‍රමයෙන් වන්නාහ. සමාන ඉක්සංඥයා පරකල්හි (22) දීර්ඝමවේ, ඒ මෙසේයි, ලක්ෂ්මීශඃ, සාමාන්‍ය විශෙෂයොර්මධ්‍ය විශෙෂවිධිර්බලවාන් යන න්‍යාය හෙතුකොටගෙණයි.

(මු-) **36. වාව ගොර්දනෙත.** (වා 1. අව 1. ගොඃ 6. දනෙත 7.)

ගොරිවඃ ස්ථානෙ අවඃ ස්‍යාවා අචි පරෙ දනෙත.*

(ස-) දනෙත, පදනතය හා යෙදුනාවූ ; අචි පරෙ, අච් සංඥයා පරකල්හි ; ගොඃ, ගොශබ්දයාගේ ; ඉවඃ ස්ථානෙ, ඉච් සංඥයාගේ ස්ථානයෙහි ; වා, විකල්පයෙන් ; අවඃ ස්‍යාත්, අව ආදෙශවන්නේය.

(මු-) ගවෙශඃ, ගවීශඃ. දනෙත කිං, ගවෙ. ගවෙන්ද්‍ර ගවාක්ෂ, නිත්‍යං.

(ස-) ගො-ඊශඃ, ගොශබ්දයාගේ ඔකාරය හට මෙයින් විකල්පයෙන් ස්වරාන්‍ත අව, ආදෙශයි, නැවත වකාරයාගේ අවර්ණයා හා (23) ඊකාරය හට ගුණයි, ගවෙශඃ. පක්ෂයෙහි ඔකාරයහට (35) අව් ආදෙශයි, ගවීශඃ. දනෙත කිං, දනෙත යනු කුමටය ? ගවෙ, ගො-එ, යන මෙහි එවිභක්තිය පදනතනුවූ බැවින් මෙයින් අව නොව පූර්වසූත්‍රයෙන් අව් වන බව ඇඟවීම පිණිසයි. ගො—ඉන්ද්‍රඃ=ගවෙන්ද්‍රඃ කියාද, ගො—අක්ෂඃ=ගවාක්ෂඃ, කියාද මෙම සූත්‍රයෙන් නිත්‍යයෙන් සිඩයි.

(මු-) **37. අයාං යෙවාර්ලුබ් වා.** (අයාං 6...යෙවාඃ 6 .. ලුප් 1. වා 1.)

දනෙත ස්ථිතානාමයාදීනාං යවයොර් ලුප් ස්‍යාවා.†

---

* ඉවඃ යනු මොහුගේ අනුවෘත්තියයි, වෘත්තියෙහි, ගොරිවඃ යනු කියනලද බැවින්, චිත්‍රා ගෞර්යස්‍ය යනාදියෙහි (330) ගවාබාදෙඃ, යනාදි සූත්‍රයෙන් ගොශබ්දයාගේ ඔකාරස්ථානයෙහි හ්‍රස්ව උකාරාදෙශකළ කල්හි, චිත්‍රගු, ආචාය්‍යීඃ—චිත්‍රගවාචාය්‍යීඃ යනාදිය සිඩයි. ගවීශ යන උදාහරණයට අනතුරුව, අයාං යෙවාඃ, කියා ලක්ෂණ කරණ බැවින් මෙහි වකාරලොපයෙක් නැත්තේය. කිසිකෙනෙක් සමාසයෙහි නොවෙත් යනු කියත්.

† අයාං යන බහුවචන නිර්දේශය ගණය පිණිසයි, පදනතයෙහි සිටියාවූ, අය් අව් ආය් ආව් යන මොවුන්ගේ යකාර වකාරයන්ට විකල්පයෙන් ලොප්වන්නේය. මෙහි වාශබ්දය ව්‍යවස්ථාවාචී බැවින් ඇතම් තැනක ලොප් නොවේ, ඇතම් තැනෙක විකල්පයෙන් ලොප්වන්නේය, ඇතම් තැනෙක නිත්‍යයෙන් ලොප්වන්නේයයි දන්නාලදී. අභිධානයෙන් උදාහරණයෝ දතයුත්තාහු වෙත්.

(ස-) දන්තෙ, පදන්තයෙහි ; සපිතානාං, සිටියාවූ ; අයාදී නාං, අයාදීන්ගේ ; යවයොඃ, යකාර වකාර දෙදෙනාහට ; වා, විකල්පයෙන් ; ලුප් ස්‍යාත්, ලොප්වන්නේය. [පාණිනිඃ 8. 3. 19.]

(මු-) හරඑහි හරයෙහි, සමහඉදං සමහාවිදං, ශ්‍රියාඑති ශ්‍රියායෙති, විෂ්ණොඋත්කඃ විෂ්ණාවුත්කඃ.

(ස-) හරෙ-එහි, රකාරයාගේ එකාරය හට (35) අය්, මෙයින්-ය්-හට විකල්පයෙන් ලොප්වේ, හරඑහි. ලොප් නොව තුබූ පක්ෂයෙහි, හරයෙහි.

සමහො-ඉදං, ඔකාරයහට (35) අව් වේ, මෙයින්, ව්හට විකල්පයෙන් ලොපයි, සමහඉදං. පක්ෂයෙහි, සමහවිදං. ශ්‍රියෛ-එති, ඓකාරයහට (35) ආය් වේ, ය්-යන්න මෙයින් විකල්පයෙන් ලොපයි, ශ්‍රියා එති, පක්ෂයෙහි, ශ්‍රියායෙති. විෂ්ණෞ-උත්කඃ, ඖකාරයහට (35) ආව් වේ, මෙයින් විකල්ප යෙන්-ව්-හට ලොපයි, විෂ්ණා උත්කඃ, පක්ෂයෙහි, විෂ්ණා වුත්කඃ.

(මු-) 38. එඞෝ'තඃ. (එඞඃ 5. අතඃ 6.)

දන්තෙ සපිතාදෙඞඃ පරස්‍යාකාරස්‍ය ලුප් ස්‍යාත්.*

(ස-) දන්තෙ, පදන්තයෙහි ; සපිතාත්, සිටියාවූ ; එඞඃ පර ස්‍ය, එඞ්සංඥයා කෙරෙන් පරවූ ; අකාරස්‍ය, අකාරයහට ; ලුප් ස්‍යාත්, ලොප් වන්නේය.

(මු-) හරෙ'ව, විෂ්ණො'ව.

(-ස) හරෙ-අව, මෙයින් අකාරයහට ලොප්වේ, හරෙ'ව. විෂ්ණො-අව, මෙයින් අකාරයහට ලොප්වේ, විෂ්ණො'ව. [පාණිනිඃ 6. 1. 109.]

(මු-) 39. ගොඃ. (ගොඃ 6. වා 1.)

ගො රති වා සන්ධිඃ†.

---

* පදන්තනුවූ තන්හි මෙසේයි, ශෙ—අනම්=(35) අය්ආදෙ ශයි, ශයනම්. භො—අනම්=(35) භවනම්.

† අර්ථවශාත් විභක්තිවිපරිණාමඃ යන න්‍යායෙන් අතඃ යන ෂෂ්ඨ්‍යන්ත පදය සප්තම්‍යන්තව සම්බන්ධය කෙරේනුයි එහෙයින් ගොරති යනු කියයි, ප්‍රකරණ වශයෙන් සන්ධි යනු ගන්නාලදී.

(ස-) අති, අකාරයා පරකල්හි; ගොඃ, ගොශබ්දයාගේ ස්ථානයෙහි; වා සන්ධිඃ, විකල්පයෙන් සන්ධිවේ. [පාණිනිඃ 6. 1. 122.]

(මූ-) ගවාග්‍රං, ගො'ග්‍රං, ගො අග්‍රං.

(ස-) ගො අග්‍රං, ඔකාරයහට (36) අව වේ; (22) දීඝීවේ, ගවාග්‍රං, ගො-අග්‍රං (38) ලොප්වේ, ගො'ග්‍රං, විකල්පයෙන් (39) ගො අග්‍රං.

(මූ-) 40. **නාඤෝඅනෙකා'නාඩි නිඃ පලුශව.** (න 1. අච් 1. ඔඅන්තඃ 1. අනාඩ් 1. නිඃ 1. පලුඃ 1. ච 1.)

අඤ්මාත්‍ර ඔකාරාන්තශ්ච නිරාඞ්වර්ජඃ සන්ධිං නාප්නොති පලුශ්ච.

(ස-) ආංවර්ජඃ, ආඩ් උපසර්ගය රහිතවූ; අඤ්මාත්‍රඃ, කෙවල ස්වරයවූ අච්සංඥමාත්‍ර අව්‍යයද; ඔකාරාන්තශ්ච නිඃ, ඔකාරාන්ත නිපාතයද; පලුශ්ච, පලුතයද යන මොවුන්ගේ අන්ත්‍යාවයව ස්වරයා හට; සන්ධිං නාප්නොති, අන්‍යශබ්දයක්හුගේ ආදිඅවයවය හා සන්ධිභාවයට නොපැමිණේ.* [පාණිනිඃ 1. 1. 14. 15.]

(මූ-) අ-අනන්ත, ඉ-ඊශ්වර, උ-උමෙශ, අහො-ඊශාන, කෘෂණ-එහි. අනාඩ් කිං.

(ස-) අ-අනන්ත, ස්වරමාත්‍ර නිපාතය මෙයින් සන්ධිනිෂෙධ විධානයි. ඉ-ඊශ්වර, උ-උමෙශ යනුද එසේම සන්ධිප්‍රතිෂෙධ විධානයි. අහො-ඊශාන, ඔකාරාන්ත නිපාත සන්ධිප්‍රතිෂෙධ කාය්‍යියි. කෘෂණ-එහි. මෙහි පලුතසන්ධි ප්‍රතිෂෙධ කාය්‍යියි. අනාඩ් කිං, සූත්‍රයෙහි අනාඩ් යනු කුමටද?

---

* අනන්ත-අ, ඊශාන-අහො යනාදියෙහි සන්ධි වන්නේ මය. ඔකාරාන්තඃයි වෙන්කිරීම හෙතුකොටගෙණ අච් යන පදයෙන් ව්‍යඤ්ජන රහිත ස්වරමාත්‍රයයි හැගේ. එසේ නොවේනම්, ව්‍රජවදරල (574) යනාදිය මෙන් අච් අන්ත කොට ඇති ව්‍යඤ්ජනයාගේම ලැබීම වන්නේය, එහෙයින්, අ ඉ උ ඍ ඏ එ ඓ ඔ ඖ යන එකඑක නිපාතයම ලැබෙයි, එසේම ඔකාරාන්තඃද නිපාතය වෙයි. නක්‍ෂත්‍රද්දිෂ්ටමන්ත්‍ර්‍යං, යන න්‍යාය හෙතුකොටගෙණ අහො'ති රම්‍යං යනාදිය සිධයි.

(මූ-) මය්‍යාද්‍යාමභිවිධෞ ක්‍රියායොගෙෂදර්ථයොඃ,
ය ආකාරඃ ස ඞිත් ප්‍රොක්තො වාක්‍යස්මරණයොරඞිත්.
ආත්මබොධාදෙකදෙශාද්‍යලොකෙත්‍යපරතෙහරිඃ,
ආ එවං තත්ත්වමය්‍යාද ආ එවං තත්කෘතං මයා.

(ස-) අනුබන්ධ රහිත ආ උපසර්ගයද ඞකාරානුබන්ධ ආ සත් නද යන දෙක්හි විශෙෂය දක්වීම පිණිසයි. මය්‍යාද්‍යාම්, අවධි රහිත සීමාව ඒ ඒ අර්ථයෙහි යෙදීමයයි කියනලද්දවූ මය්‍යාද්‍යාර්ථයෙහිද ; අභිවිධෞ, අවධි සහිතවූ සීමාව එසේම යෙදීමයයි කියනලද්දවූ අභිවිධියෙහිද ; ක්‍රියායොගෙෂදර්ථයොඃ, ක්‍රියාවාචක පදය කෙරෙන් පූර්වයෙහි යෙදීමයයි කියනලද්දවූ ක්‍රියායොගය-ස්වල්පාර්ථය යන දෙක්හි වූද ; ය ආකාරඃ, යම් ආ උපසර්ගයෙක් වේද හෙතෙම ; සඞිත් ප්‍රොක්තඃ, ඉත්සංඥ ඞකාර සහිතයයි කියනලදී. (කියනලද්දවූ අර්ථවිෂයෙහි ආ උපසර්ගය සන්ධිවෙයි) වාක්‍යස්මරණයොඃ, වාක්‍යාර්ථ ස්මරණාර්ථ දෙක්හි වූ ආ උපසර්ගයතෙම ; අඞිත්, ඉත්සංඥ ඞකාර රහිත යයි කියනලදී. (ආයන්න කියනලද්දවූ විධාර්ථයෙහි සන්ධි නොවේ.) හරිඃ, විෂ්ණුතෙම ; ආ-ආත්මබොධාත් (22) ආත්ම බොධාත් (මය්‍යාද්‍යර්ථයෙහි වූ ආයන්න සන්ධියි.) තමන් වැටහීම කෙලවරකොට ; ආ—එකදෙශාත් (23) ඓකදෙශාත්, (අභි විධ්‍යර්ථයෙහි ආයන්න සන්ධියි) කරචරණාදි එකදෙශයක් පැතිර; ආ—උපරතෙඃ (23) ඕපරතෙඃ, (ස්වල්පාර්ථයෙහි ආයන්න සන්ධියි.) මඳක් නොඇලුනවුන් විසින් ; ආ—ආලොකි = (22) ආලොකි, (ක්‍රියායොගයෙහි වූ ආයන්න සන්ධියි.) දක්නාලද් දේය ; තත්ත්වමය්‍යාද, පරමාත්මයාගේ සීමාතොමෝ ; ආ එවං, (පලමුවෙන් මෙසේ සිතුවේය) දැන් එසේයයි ; (අවබො ධයෙහි වාක්‍යයාගේ අන්පරිද්දෙකින් දක්වීමය යනු වාක්‍ය යයි.) මයා, මා විසින් ; තත් කෘතං, ඒතෙම කරණලද්දේයයි; ආඑවං, එසේ සිතන්නෙහි (යයි පරීක්ෂාවගේ අන්පරිද්දෙකින් වැටහීම ස්මරණයයි).

(මූ-) 41. වවබෙ'ර්ගෙව. (වවමෙ 7. අම්-ඊ-ඌ-එ 1.)
වෙව නිෂපනෙනා'ර්ශබෙද බෙ නිෂපනන ඊදූදෙදන්තාශව සන්ධිං නාප්නොති.*

* මෙහි ඊකාරාදීන්ගේ සන්ධිප්‍රතිෂෙධ බැවින් ඒ නිමිත්ත කොට ඇත්තහුගේද සන්ධිනිෂෙධය දතයුතු. එහෙයින්, ගඞ්ග අත්‍ර යනාදියෙහි අකාරලොපය නොවේ.

(ස-) චෙව නිෂ්පනනඃ, බහුවචනයෙහි නිෂ්පනනවූ ; අමී ශබ්දඃ, අමීශබ්දයාගේ අන්තස්වරයද ; වෙ නිෂ්පනනඃ, ද්විවචන යෙහි නිෂ්පනනවූ ; ඊත් ඌත් එත් අන්තශ්ච, අන්ත ඊකාර අන්ත ඌකාර අන්ත එකාර යන මෙයද ; සන්ධිං නාප්නොති, ගැළපීමට නොපැමිණේ. [පාණිනිඃ 1. 1. 11. 12.]

(මු-) අමී-ඊශාඃ, හරී-එතෞ, විෂ්ණූ-ඉමෞ, ගඞ්ගෙ-ඉමෙ.

(ස) අමී ඊශාඃ යනු බහුවචනයෙහි නිෂ්පනන අමීශබ්දයහට සන්ධිනිෂෙධයෙහි උදාහරණයි. හරී එතෞ යනු ද්විවචන යෙහි නිෂ්පනන ඊකාරාන්තයහටයි, විෂ්ණූ ඉමෞ යනු ද්විවච නයෙහි නිෂ්පනන ඌකාරාන්තයහටයි. ගඞ්ගෙ ඉමෙ යනු ද්විවචනයෙහි නිෂ්පනන එකාරයහටයි.

(මු-) චව වෙ කිං, අමුත්‍රයං වධ්වවීඃ.*

(ස-) චව වෙ කිං, චව වෙ යනු කුමටද ? අමී අයං, (35) අමුත්‍රයං (අමීරොගී) යනාදියෙහි එකවචනයෙහි වූ අමීශබ්දාන්ත සද, වධ්වා-අවීඃ, (319) වධූ-අවීඃ (35) වධ්වවීඃ යන තන්හි එක වචනයෙහි වූ ඌකාරයද සන්ධිප්‍රතිෂෙධ නොවන හෙයිනි.

(මු-) 42. ඔතෙනාමෙතෞ. (සෞත් 1. වා 1. ඉතෞ 7.)

සෞ ජාත ඔකාරඃ සන්ධිං වා නාප්නොති ඉතෞ පරෙ.

(ස-) ඉතෞ පරෙ, ඉතිශබ්දය පරකල්හි ; සෞජාත ඔකාරඃ, සිවිභක්තිය පරකල්හි උපන් ඔකාරයතෙම ; වා, විකල්පයෙන් ; සන්ධිං නාප්නොති, සන්ධියට නොපැමිණේ. [පාණිනිඃ 1. 1. 16.]

(මු-) විෂ්ණෝ-ඉති, විෂ්ණ-ඉති, විෂ්ණවිති.

(ස-) විෂ්ණෝ-ඉති, ඉතිශබ්දයා පරකල්හි සිවිභක්තියෙහි ජාත ඔකාරයතෙම මෙයින් විකල්පයෙන් සන්ධි නිෂෙධයි. විෂ්ණෝ-ඉති යන මෙහි ඔකාරයහට (35) අව් වේ, වකාරය හට (37) විකල්පයෙන් ලොප්වේ, විෂ්ණ ඉති, පක්ෂයෙහි විෂ්ණ විති යනු වේ. සිවිභක්තියෙහි වූ ඔකාරය උකාරාන්ත ශබ්දය හට සම්බොධනයෙහිම ලැබෙයි.

---

* මෙසේම නාසඝිඃ අවීඃ නාසඝිවීඃ යනාදියෙහි ඌකාරඊකාර දෙදෙනාගේ ද්විවචනනිෂ්පනනත්වයක් නැතිබැවින් සන්ධිවන් නේය. නඤූ නිර්දිෂ්ටමනිත්‍යං යන න්‍යායයෙන් ද්විවචනයෙහි වූ අදස් ශබ්දයාගේ එකාරයහට සන්ධිවන්නේය, එහෙයින්, අමුකෙ-ඉහ (35, 37) අමුක-ඉහ, අමුකයිහ, අමුකෙ-අත්‍ර (38)

(මූ-) 43. **උඤ් ඤිපාත් ත්වචි ව වා.** (උඤ් 1. ඤිපාත් 5. තු 1. අචි 7. ව 1. වා 1.)

උඤ් සන්ධිං වා නාප්නොති ඉතෞ පරෙ, ඤිපාත් පරස්තු චෙ වා ස්‍යාදචි.

(ස-) ඉතෞ පරෙ, ඉති යන්න පරකල්හි ; උඤ්, උ-යන නිපාතය ; වා, විකල්පයෙන් ; සන්ධිං නාප්නොති, සන්ධියට නොපැමිණේ ; අචි, අච්සංඥයා පරකල්හි ; ඤිපාත් පරඃ, ඤිප් සංඥයා කෙරෙන් පරවූ; උකාරයාගේ වස් තු, වකාරය වනාහි ; වා ස්‍යාත්, විකල්පයෙන් වන්නේය. [පාණිනිඃ 1. 1. 17., 8. 3. 33.]

(මූ-) උ-ඉති, විති. කිම්වුක්තං, කිමු-උක්තං.*

(ස-) උ-ඉති, යන තන්හි, උ-යන නිපාතය මෙයින් විකල්පයෙන් සන්ධිනිෂෙධයි, සන්ධි පක්ෂයෙහි උකාරයහට (35) වකාරයි, විති. කිමු-උක්තං, විකල්පයෙන් මෙයින් වකාරයි, කිම්වුක්තං. පක්ෂයෙහි කිමු-උක්තං.

(මූ-) 44. **වෙක් ස්වශ්වාණේ'සෙ.** (වා 1. ඉක් 1. ස්වඃ 1. ච 1. අණේ 7. අසෙ 7.)

අමූකෙ'ත්‍ර, මෙසේම මණීව යනාදීන් කෙරෙහි ද්විවචනයෙහි නිෂ්පන්නවූ ඊකාරයහටද ඉව යන්න පරකල්හි සන්ධිවන්නේය, මෙසේයි,

මණීභාර්‍ය්‍යා පතීචෛව දම්පතී ජම්පතී තථා,
රොදසී වා සසීචෛව ඉවෙ ජායාපතී තථා,
අමෛන්‍යරපීහ පඨ්‍යන්තෙ පෙචුෂිප්‍රභෘතාන්‍යපීති,

මණීවාදීහුයි. ඊකාර ඌකාරයන්ගේ දීර්ඝග්‍රහණය හෙතු කොටගෙණ, අහවාවහ්‍යාවාං යන මෙහි හ්‍රස්වයාගේ සන්ධිය වෙයි.

* ඤකාරය-න-යන නිපාතය මෙන් මොහුගේ අව්‍යය ඇඟවීම පිණිසයි. පූර්‍වයෙන් අනුවෘත්තිවූ වා යන්න කරණකොට ගෙණ උඤ් යන තැන් පටන් එක් අර්‍ථයෙක්ද ඤිපාත් යන්න පටන් තවත් අර්‍ථයෙක්දැයි දෙකෙක් වෙත්. විධානබලයෙන් සමානවර්‍ණයා පරකල්හිද උකාරය හට (35) වකාර වේ. දීර්ඝනොවේ (22). උකාරයාගේ ස්ථානිවත්වයෙන් අච්වත් බැවින් විකල්පයෙන්, දනෙත මඃ (53) යන මෙයින් මකාරය හට අනුස්වාරය නොවේ. විකල්පයෙහි (40) නාජෝ'න්තඃ, යන මෙයින් සන්ධිප්‍රතිෂෙධයි.

ඉක් සන්ධිං වා නාප්නොති ස්වශ්ච වා සමාදෙශ පරෙ, න තු සෙ, දූනෙත.*

(ස-) අචෙණ් පරෙ, අසමාන වණ්යා පරකල්හි ; ඉක්, ඉක් සංඥසතෙමෙ, වා, විකල්පයෙන් ; සන්ධිං නාප්නොති, සන්ධි සට නොපැමිණේ. වා, විකල්පයෙන් ; ස්වශ්ච සතත්, හ්‍රස්වද වන්නේය, සෙතු, සමාසවූ ඉක්සංඥය වූකලී ; දූනෙත, පදූනත යෙහි ; න, සන්ධිප්‍රතිෂෙධ නොවේ. [පාණිනිඃ 6. 1. 127.]

(මු-) ශාර්ඞ්ගි-අත්‍ර, ශාර්ඞ්ගි-අත්‍ර, ශාර්ඞ්ගෘත්‍ර.

(ස-) ශාර්ඞ්ගි-අත්‍ර, මෙහි මෙයින් විකල්පයෙන් සන්ධිප්‍රති ෂෙධයි, මෙයින් විකල්පයෙන් හ්‍රස්වද නොවේ. ශාර්ඞ්ගි අත්‍ර, මෙහි විකල්පයෙන් හ්‍රස්වයි, ශාර්ඞ්ගෘත්‍ර යනු විකල්පයෙන් (35) සන්ධිවූ තැනි.

(මු-) අසෙ කිං හර්යණ්‍ව.†

(ස) අසෙ කිං, සූත්‍රයෙහි අසෙ යනු කුමක් සඳහාද යත්? හර්යශ්ව, යනාදි තන්හි සමාසයෙහි සන්ධිනිෂෙධනොවීම ඇත වීම පිණිසයි.

(මූ-) 45. ඍකාත්. (ඍකි 7. අක් 1.)

අක් සන්ධිං වා නාප්නොති ඍකි පරෙ ස්වශ්ච වා සතත්.‡

---

* මණ්ඩූකප්ලුත්‍යනුවෘත්තියෙන් දූනෙත යන මොහුගේ අනු වෘත්තියයි. සන්ධිප්‍රතිෂෙධ සම්බන්ධ වාශබ්දයතෙම පූර්වසූත්‍ර යෙන් අනුවෘත්තිය වේමය, මෙහි නැවත වාශබ්දග්‍රහණය හ්‍රස්ව කිරීම සම්බන්ධකරණු පිණිසයි, අන්පරිද්දෙකින් වීනම් සන්ධි ප්‍රතිෂෙධ සම්බන්ධ වාශබ්දයාගේ සන්ධිප්‍රතිෂෙධයෙන්ම පැවති අර්ථවය ඇතිකල්හි හ්‍රස්වයාගේ නිත්‍යත්වය ප්‍රාප්තවන්නේය. මෙහි වාශබ්දය තමා ව්‍යවස්ථාවාචීබැවින් කිසිතැනෙක්හි අනි ත්‍යසමාසයෙහිද හ්‍රස්වවන්නේය, එහෙයින්, නද්‍යා අම්භඃ යන සමාසයෙහි, නදී-අම්භඃ, කියාද, නදි-අමභඃ කියාද, නද්‍යම්භඃ කියාද වෙත්.

† හර්යශ්ව යන මෙහි හ්‍රස්වාන්ත ප්‍රත්‍යුදාහරණයාගේ ඇතවී මෙන් හ්‍රස්වාන්තයාගේද පක්ෂයෙක්හි සන්ධිනොවෙයි යනු ප්‍රකාශිතයි, එහෙයෙන් වාරි-අත්‍ර සීද, වාර්‍යත්‍ර සීද වෙත්.

‡ මෙහි වාශබ්දවය අනුවෘත්තියි. යම්තැනෙක්හි හ්‍රස්ව යන්න යුක්තනොවේද එහිද විකල්පයෙන් සන්ධිවෙයි, එහෙ යින්, දධි-ඍච්ඡති, දධ්‍යර්ච්ඡති යනාදිය වෙයි. මෙහි, අසමාසෙ යනු අනුවෘත්ති නොවේ, එහෙයින්, මහාංශ්වාසො ඍෂිශ්ච යන

(ස-) ඍකි පරෙ, ඍක්සංඥයා පරකල්හි ; අක්, අක්සංඥය තෙමේ ; වා, විකල්පයෙන් ; සන්ධිං නාප්නොති, සන්ධියට නොපැමිණේ ; වා, විකල්පයෙන් ; ඍවශ්ච ඍකත්, හ්‍රස්වද වන්නේය. [පාණිනීඃ 6. 1. 128.]

(මූ-) බ්‍රහ්මා-ඍෂිඃ, බ්‍රහ්ම-ඍෂිඃ, බ්‍රහ්මර්ෂිඃ.

(ස-) බ්‍රහ්මා-ඍෂිඃ, යනු මෙයින් විකල්පයෙන් සන්ධිනොවීමෙහිද විකල්පයෙන් දීඝී වීමෙහිද උදාහරණයි. බ්‍රහ්මඍෂිඃ යනු මෙයින් විකල්පයෙන් හ්‍රස්වවීමෙහියි, බ්‍රහ්මර්ෂිඃ යනු විකල්පයෙන් සන්ධිවීමෙහියි. මේ අධ්‍යායෙහි යෙදෙන තන්හි එකාර දෙදෙනාගේද ඔකාර දෙදෙනාගේද ගුණවීමද, ඓකාර දෙදෙනාගේද ඖකාර දෙදෙනාගේද වෘද්ධියද ප්‍රකට වෙයි.

ඉති අච් සන්ධිපාදඃ.

හශ් සන්ධිඃ.

(මූ-) 46. සතු ශචුභිඃ ශචවශාත්. (සතු 1. ශචුභිඃ 3...ශචු 2. අශාත් 5.)

සකාරතවර්ගයෝඃ ශකාරෙණ චවර්ගේණ වා යොගෙ ශකාර චවර්ගෞ ක්‍රමාත් ප්‍රාප්නුතඃ, න තු ශාත් පරෞ.*

සමාසයෙහි, මහා ඍෂිඃ, මහඍෂිඃ, මහර්ෂිඃ යනු කිසිතැනෙක්හි කියයි. වස්තුවශයෙන් වනාහි මේ විධිය අන්‍යසමාසයෙහිම වෙයි, එහෙයින් පරාර්ච්ඡති යනාදියෙහි නොවේ.

* ශචුභිඃ යන බහුවචනය යොගක්‍රම රහිත බව ප්‍රකාශ කිරීම පිණිසයි. තෘතීයා විභක්තියෙන් ගැලපීම ප්‍රකාශ බැවින් යොගය ලැබෙයි. යොගයද මධ්‍යගතවූ අන්‍යාක්ෂරාදිය රහිතවීමයයි කියනලද අව්‍යවධානවූ පූර්වාපරයන් අතුරෙන් එක්තරා එකක්හුගේ පැවැත්මයි. එක්තැනෙක්හි දක්නාලද ශාස්ත්‍රාර්ථය අන්‍යවූ ස්ථානයෙහිද බාධකරහිත විමෙන් යෙදෙයි යන නියමයෙන් පරසූත්‍රයෙහි කියනලද "න ච දන්තාත් ටවර්ගාත් පරෞ" යන්නෙහි මෙන් මෙහිද, "න ච දන්තාත් චවර්ගාත් පරෞ" යන්න තැකිය යුතුයි. එහෙයින් අච් සන්ධිඃ යනාදියෙහි දන්ත්‍ය සකාරයහට තාලුජ ශකාරය නොවේ. අච්ශූ, නඤ්ශූ යනාදි තන්හි චවර්ගීයාගේ විභක්ත්‍යන්තභාවයක් නැතිහෙයින් පදාන්තභාවයෙක් නොමැත්තේය. ඥපතඥපිතො විධිනිලක්ෂණමනුසරති යන න්‍යාය හෙතුකොටගෙණ, නඤ්සමාසඃ, කෘඤ් ධාතුඃ යනාදිය සිඩයි.

(ස-) සකාර තවර්ගෞ, දන්ත්‍යෞ සකාර තවර්ග යන දෙක ; ශකාරෙණ, තාලුජ ශකාරය සමග හෝ ; වා, නොහොත් ; චවර්ගෙණ යොගෙ, චවර්ගය යන මේ දෙකින් එකක් හා සමග අව්‍යවධානයොගය ඇති කල්හි ; ක්‍රමාත්, පිළිවෙළින් ; ශකාර චවර්ගෞ, ශකාර චවර්ග දෙකට ; ප්‍රාප්නුතඃ, පැමිණෙත්. ශාත් පරෞ තු, තාලුජ ශකාරයා කෙරෙන් පරවූ සකාර තවර්ග දෙක වූකලී ; න, ශකාර චවර්ගාදෙශ නොවෙත්. [පාණිනීඃ 8. 4. 40. 44.]

(මූ-) සච්චිත්, ශාර්ඞ්ගිඤ්ජය. අශාත් කිං, ප්‍රශ්නඃ.

(ස-) සත්-චිත්, චකාර යොගයෙහි තකාරයට මෙයින් චකාර වේ, සච්චිත්. ශාර්ඞ්ගින්-ජය නකාරයහට මෙයින් ඤකාර වේ, ශාර්ඞ්ගිඤ්ජය. අශාත් කිං, අශාත් යනු කුමටය? ප්‍රශ්නඃ, ප්‍රශ්නඃ යන තන්හි තාලුජ ශකාරයා කෙරෙන් පරවූ නකාරයහට ඤකාරාදෙශ නොවන බව ඇඟවීම පිණිසයි.

(මූ-) 47. **ෂ්ටුභිඃ ෂ්ටවෂාදන්තමොඃ.** (ෂ්ටුභිඃ 3...ෂ්ටු 2. අෂි 7. අදන්තමොඃ 5.)

සකාරතවර්ගෞ ෂකාරෙණ ටවර්ගෙණ වා යොගෙ ෂකාර ටවර්ගෞ ක්‍රමාත් ප්‍රාප්නුතඃ, න තු ෂකාරෙ පරෙ න ච දන්තාත් ටවර්ගාත් පරෞ.*

(ස-) සකාර තවර්ගෞ, දන්ත්‍ය සකාර තවර්ග දෙක ; ෂකාරෙණ, මූර්ධන්‍ය ෂකාරය හා සමග හෝ ; වා, නොහොත් ; ටවර්ගෙණ, ටවර්ගය යන දෙකින් එකක් හා සමග ; යොගෙ, ව්‍යවධාන රහිතව යෙදෙන කල්හි ; ක්‍රමාත්, පිළිවෙළින් ; ෂකාර ටවර්ගෞ, ෂකාර ටවර්ග දෙකට ; ප්‍රාප්නුතඃ, පැමිණෙත්. ෂකාරෙ පරෙ තු, ෂකාරයා පරකල්හි වූකලී ; න, ටවර්ගය නොවේ. දන්තාත් ටවර්ගාත්, පදන්තවූ ටවර්ගයා කෙරෙන් ; පරෞ, පරවූ ෂකාර ටවර්ග දෙක ; නච, ආදෙශ නොවෙත්. [පාණිනීඃ 8. 4. 41—43.]

---

* පූර්වසූත්‍රයෙන් සතු සනු මෝහට අනුවෘත්තිය වේ. ෂ්ටුභිඃ යනු පළමු සූත්‍රය මෙනි. ෂට්-සන්තඃ යන මෙහි, න ණ ට න ඞ (57) යන මෙයින් ටකාරයාගේ ස්ථානයෙහි තන් කරණ හෙයින්ම, මේ සූත්‍රයෙන් වනාහි තකාරස්ථානයෙහි ටකාර නොවන්නේය.

(මූ-) තට්ටීකා, චක්‍රිණෝෂ්ණකසෙ. අෂි කිං? සත්-ෂෂ්ඨඃ, අදන්තතොඃ කිං? ෂට්-තෙ.

(ස-) තත්-ටීකා මෙයින් තකාරයහට ටකාරාදෙශයි, තට්ටීකා. චක්‍රින්-ෂෝෂ්ණකසෙ මෙයින් දන්ත්‍ය නකාරයහට මූර්ධන්‍ය ණකාරයි, චක්‍රිණෝෂ්ණකසෙ. අෂි කිං? සූත්‍රයෙහි අෂි යනු කුමටද? සත්-ෂෂ්ඨඃ, යනාදි තන්හි ෂකාරයා පරකල්හි තකාරයහට මෙයින් ටවර්ගාදෙශ නොවනබව ඇඟවීම පිණිසයි, අදන්ත තොඃ කිං? සූත්‍රයෙහි අදන්තතොඃ යනු කුමක් සඳහාද? ෂට්-තෙ යනාදියෙහි පදන්තවූ ටවර්ගයා කෙරෙන් පරවූ සකාර තවර්ගයන්ට ටවර්ගාදෙශ නොවනබව ඇඟවීම පිණිසයි.

(මූ-) 48. ෂණ්ණාං ෂණ්ණවති ෂණ්ණගර්යඃ. (ෂෂ්-නාං ෂෂ්-නවති-ෂට්නගර්යඃ 1...)

එතෙ නිපාත්‍යන්තෙ*

(ස-) එතෙ, ෂණ්ණාං ෂණ්ණවති ෂණ්ණගරී යන මොව්හු; නිපාත්‍යන්තෙ, නිපාතනයෙන් සිඬකරණු ලැබෙත්. ෂෂ්-නාං—ෂකාරයහට මෙයින් ණකාරව, (47) ෂණ්ණාං, ෂට්-නවතිඃ,—ටකාරයහට මෙයින් ණකාරයි, (47) ෂණ්ණවතිඃ, ෂට්-නගරී, මෙයින් ටකාරයහට ණකාරයි, ෂණ්ණගරී.

(මූ-) 49. ලෙ ලංසෙතොඃ. (ලෙ 7. ලඃ 1. තොඃ 6.)

ලෙ පරෙ තොර්ලීකාරඃ ස්‍යාත්. තල්ලයඃ, විද්වාල්ලිඛති.†

---

* අප්‍රධාන බැවින් යම් තැනෙක්හි ක්‍රම් ආගමය නොවන් නේද, එහි නිපාතනය නොමැත්තේය; එහෙයින් අතිෂාම කියාම වේ. ෂඩධිකා නවතිඃ ෂණ්ණවතිඃ. ෂණ්ණාං නගරී ෂණ්ණගරී. නගරී යන ස්ත්‍රීලිඞ්ගිකනිර්දේශය බැවින්; ෂඩ්නගරං යන මෙහි ණකාරාදෙශ නොවේ.

† අනුනාසිකය අර්ධචන්ද්‍රාකාර වර්ණයෙහි ප්‍රසිඬවෙයි, ඤම් සංඥය ස්වභාවයෙන් අනුනාසිකවෙයි, ඒ හෙතුවෙන් ඔහුගේ ස්ථානයෙහි හටගන්නාලබන යල් සංඥය සානුනාසික වෙයි —අර්ධ චන්ද්‍රාකාර වර්ණ පූර්වකම වන්නේය, කාරණ ගුණඃ කාර්‍යගුණ මාරභන්තෙ, යන න්‍යායෙන්ය යන අර්ථයි. මෙසේ අනුස්වාරයෙහි ජාතවූ සල්සංඥය සානුනාසික වෙයි. විද්වාල්ලිඛති යන මෙහි තකාරයාගේ ස්ථානයෙහි ජාතබැවින් ලකාරයහට අර්ධ චන්ද්‍රාකාර වර්ණය පූර්වවෙයි, අර්ධචන්ද්‍රාකාර වර්ණය අනුස්වාරය මෙන් පූර්වය හා සම්බන්ධවෙයි. අරඃ යනු

(ස-) ලෙ පරෙ, ලකාරයා පරකල්හි ; තොඃ, තවර්ගයහට ; ලකාරඃ ස්‍යාත්, ලකාරය වන්නේය.

තත්-ලයඃ, තකාරයහට මෙයින් ලකාරයයි, තල්ලයඃ. විද්වාන්-ලිඛති, මෙයින් නකාරයහට ලකාරයි, විද්වාල්ලිඛති [පාණිනිඃ 8. 4. 60.]

(මූ-) යලො ද්විධාරො නිරනුනාසිකඃ සානුනාසිකඃ,
ඤමොනුනාසිකස්තෙන තත්ස්ථානෙ සානුනාසිකඃ.

(ස-) අරොයලඃ, රකාරය රහිතවූ යලසංඥයතෙමේ ; නිරනුනාසිකඃ, අනුනාසිකා රහිතය; සානුනාසිකඃ, අනුනාසිකා සහිතයයි ; ද්විධා, ද්විවිධ වේ ; ඤමඃ, ඤම්සංඥයා ; අනුනාසිකඃ, අනුනාසිකවෙයි ; තෙන, එහෙයින් ; තත් ස්ථානෙ, ඔහුගේ ස්ථානයෙහි ; සානුනාසිකඃ, අනුනාසික සහිතවෙයි ; ඤම්සංඥයහට ආදෙශවූ කියනලද, යල්සානුනාසිකයි, නාසිකානුගතකොට ඒ ඒ වර්ණයන්ගේ ස්ථානයෙන් කියයුතු අක්ෂරයි.

(මූ-) **50. මනොර්නුර්ඣස්‍යපදාන්තෙ.** (මනොඃ 6.. නුඃ 1. ඣසි 7. අපදාන්තෙ 7.)

අපදාන්තෙ ස්ථිතයො ර්මනයොර්නුඃ ස්‍යාත් ඣසි පරෙ. රංස්‍යතෙ, වෘංහිතං.*

(ස-) ඣසි පරෙ, ඣස් සංඥයා පරකල්හි ; අපදාන්තෙ ස්ථිතයොඃ, පදාන්ත නුවූ තන්හි සිටියාවූ ; මනයොඃ, මකාර නකාර දෙදෙනාගේ ස්ථානයෙහි ; නුඃ ස්‍යාත්, අනුස්වාරය වන්නේය. රම්-ස්‍යතෙ මෙයින් පදාන්තනුවූ මකාරයහට අනුස්වාරය වේ,

---

කුමටය? අවාචරී යනාදියෙහි (261) ණකාරස්ථානයෙහි ජාත රකාරයද අනුනාසික නොවෙයි.

මෙහි පදාන්තයෙහි සිටියාවූ තකාර නකාර දෙදෙනාහට ලකාරාදෙශ දක්වූ උදාහරණ බලයෙන් පදාන්තෙ යනු දතයුතු වෙයි, එහෙයින් සුවන් ල් ශි (242) යන මෙහි නකාරයහට ලකාර නොවේ.

* රම්ස්‍යතෙ යනු රමධාතුහු කෙරෙන් ස්‍යතෙ විභක්තියි, පදමධ්‍යස්ථ පැමිණිබැවින් මකාරයාගේ පදාන්තභාවය නොවේ. වෘංහිධාතුහු කෙරෙන් ඉත්සංඥවූ ඉකාර යුක්තහෙයින් නුම් ආගම කලකල්හි ක්තප්‍රත්‍යයයි, එහෙයින් නකාරයාගේ පදාන්තරහිත බවයි. හො ඣස් (21) යන මෙයින් හකාරයහට ඣසත්වයයි.

රංස්‍යතෙ. වෑන්-හිතං, මෙයින් නකාරයහට අනුස්වාරයි, වෑංහිතං. [පාණිනිඃ 8. 3. 24.]

(මු-) **51. ඣපෙ ඤම් නොඃ.** (ඣපෙ 7. ඤම් 1. නොඃ 6.)

අදෘනෙත ස්ථිතස්‍ය නොර් ඣපෙ පරෙ ඤම් ස්‍යාත්. ශාන්තඃ, අඞ්කිතඃ.*

(ස-) අදෘනෙත, පදෘනත නුවූ තන්හි; ස්ථිතස්‍ය, සිටියාවූ; නොඃ, අනුස්වාරයහට; ඣපෙ පරෙ, ඣප්සංඥසා හෙවත් එක එක වර්ගාක්ෂරයක් පරකල්හි; ඤම් ස්‍යාත්, ඤම් ප්‍රත්‍යාහාරය වන්නේය.

ශාම්-තඃ (50) මකාරයහට අනුස්වාරයි, ශාංතඃ—මෙයින් අනුස්වාරයහට නකාරයි, ශාන්තඃ. අන්-කිතඃ (50) නකාරයහට අනුස්වාරයි, අංකිතඃ, මෙයින් ඞකාර වේ, අඞ්කිතඃ. [පාණිනිඃ 8. 4. 58.]

(මු-) **52. වා ත්වරයපෙ'රයං.** (වා 1. තු 1. අරයපෙ 7. අරයං 1.)

දෘනෙත අදෘනෙත වා ස්ථිතස්‍ය නො රෙඵවර්ජයපෙ පරෙ රෙඵවර්ජයම් වා ස්‍යාත්.†

---

* මෙහි පූර්වසූත්‍රයෙන් සම්බන්ධකරණු ලබන්නේද, නොඃ යී නැවත ගැන්ම සාධාරණවූ අනුස්වාරය ගැණීම පිණිසයි. අත්පරිද්දෙකින් වීනම් හුදකලා මකාර නකාරයන්ට ආදෙශිත අනුස්වාරය ගත්කල්හි, ජඞ්ඝන්‍යතෙ (827) යනාදිය සිදුනොවෙයි. ශාම්තඃ යනාදිය ශමධාතුහට හා අන්කධාතුහටද, කතයි.

† වෙන්වශයෙන් යොගය බැවින් අදෘනෙත යනු සම්බන්ධ නොවේ, එහෙයින් පදෘනතයෙහිද අපදෘනතයෙහිද මේ විධානයයි, එසේමැයි, පදෘනතයෙහි හෝ අපදෘනතයෙහි සිටියාවූ අනුස්වාරයහට, යවල-යන මොවුන් පරකල්හි විකල්පයෙන්, යවල, යන මොව්හු වන්නාහුය, පදෘනතයෙහි සිටියාහට වනාහි වර්ගාක්ෂරයා පරකල්හි තද්වර්ගාන්තයා විකල්පයෙන් වන්නේය යන අර්ථයි. පදෘනතයෙහිවූ අනුස්වාරයහට, යවල-යන මොවුන් පරකල්හි උදාහරණ මෙසේයි, ත්වය්‍යචඡ ත්වංයචඡ, සව්වෘණෝමි, සංවෘණෝමි, ත්වල්ලුබ්ධඃ ත්වං ලුබ්ධඃ. අපදෘනතයෙහි අනුස්වාරයහට, යවල-යන මොවුන් පරකල්හි මෙසේයි, ය යය්‍යම්‍යතෙ යං යම්‍යතෙ, ව් වව්ම්‍යතෙ වංවම්‍යතෙ ල ලල්ම්‍යතෙ ලංලම්‍යතෙ.

(ස-) රෙඵවජී යපෙ පරෙ, රකාරය රහිතවූ යප්සංඥයා පර කල්හි ; දූනෙත, පදූනතයෙහි හෝ ; වා, නොහොත් ; අදූනෙත, පදූනත නුවූ තන්හි ; ස්ථිතස්‍ය, සිටියාවූ ; නොඃ, අනුස්වාරයහට ; වා, විකල්පයෙන් ; රෙඵවජීයම්, රෙඵ රහිතවූ යම් සංඥයා ; ස්‍යාත්, වන්නේය. [පාණිනිඃ 8. 4. 59.]

(මූ-) යමො'නුනාසිකඃ. යँ යසම්‍යතෙ, යං යම්‍යතෙ, හරිම්හජ හරිංහජ. කම්පතෙ ඉති පූර්වේණ නිත්‍යං. අරෙ කිං රංරම්‍යතෙ.*

(ස-) යමො'නුනාසිකඃ, යම් ප්‍රත්‍යාහාරය අනුනාසික වෙයි. යං-යම්‍යතෙ මෙයින් අනුස්වාරයහට විකල්පයෙන් යකාරාදෙශයි, යँ යසම්‍යතෙ, පක්‍ෂයෙහි, යංයම්‍යතෙ. හරිං-හජ මෙයින් අනුස්වාරයහට විකල්පයෙන් මකාරයි, හරිම්හජ, පක්‍ෂයෙහි, හරිංහජ. කන්-පතෙ (50) නකාරයහට අනුස්වාරයි, කංපතෙ, (51) අනුස්වාරයහට මකාරයි, කම්පතෙ. ඉති පූර්වේණ නිත්‍යං, කම්පතෙ යනු පූර්වසූත්‍රයෙන් නිත්‍යයෙන් මකාරයි. අරෙ කිං, අරෙ යනු කුමක් සඳහාද ? රංරම්‍යතෙ, යන මෙහි ර පරකල්හි ය ආදෙශ නොවන බව ඇඟවීම පිණිසයි.

(මූ-) **53. දූනෙත මො'සම්‍රාජො හසෙ නුඃ.** (දූනෙත 7. මඃ 6. අසම්‍රාජඃ 6. හසෙ 7. නුඃ 1.)

දූනෙත ස්ථිතස්‍ය මස්‍ය හසෙ පරෙ නුඃ ස්‍යාත්, න තු සම්‍රාජඃ. ශිවං සෙත්‍යාති, අසම්‍රාජඃ කිං, සම්‍රාඩිති.†

---

* යලො'නුනාසිකඃ යන මෙහි ජයමානවූ යලසංඥයා අනුනාසික වෙයි, අනුනාසිකවාන් යනු අර්ථයි. අයී ආදි බැවින් අප්‍රත්‍යය වෙයි. යමො'නුනාසිකඃ යනු ලිපිකරුවන්ගේ ප්‍රමාද පාඨයි, එසේ කල්හි හරිම්හජ යන මෙහිද අනුනාසික පූර්වකවෙයි, ඤුම් පැමිණෙන බැවිනි. මෙහි අනුස්වාරය තමා අපදූනතයෙහි සිටි බැවින් පූර්වසූත්‍රයෙන්ම නිත්‍යයෙන් ආදෙශයි.

† ඉති ශබ්දය කරණකොටගෙණ සම්‍රාජ් ශබ්දය යම් අර්ථයෙක්හි ප්‍රසිද්ධ ඒ අර්ථය යුක්තකල්හිම මකාරයහට අනුස්වාරය නොවීමය යනු අවබොධකටයුතු. ප්‍රසිද්ධිය වනාහි :—

යෙනෙෂ්ටං රාජසූයෙන මණ්ඩලස්‍යෙශ්වරශ්ච යඃ,
ශාස්ති යශ්චාඥයා රාඥඃ ස සම්‍රාඩිත්‍යමරොකෙතඃ.

(ස-) හසෙ පරෙ, හස්සංඥයා පරකල්හි; දනොත, පදනත යෙහි; සපිතස්‍ය මස්‍ය, සිටියාවූ මකාරයහට; තුඃ සතත්, අනු ස්වාරශ වන්නේය. සම්‍රාජස්තු, සම්‍රාජ් ශබ්දයාගේ මකාරයහට වූකලී; න, අනුස්වාරය නොවේ. ශිවම්—සෙත්‍යති, මකාරය හට මෙයින් අනුස්වාරයි—ශිවං සෙත්‍යති. අසම්‍රාජඃ කිං, අස ම්‍රාජඃ යනු කුමටය, සම්—රාජ්—ඉති=සම්‍රාඩිති. මෙහි මකාර යහට අනුස්වාරය නොවේ. [පාණිනිඃ 8. 3. 25, 26.]

(මු) 54. **පුංසඃ සන් ඛප්‍යම් පරෙ'බේ‍ය.** (පුංසඃ 6. සන් 1. ඛපි 7. අම්පරෙ 7. අබේ‍ය 7.)

පුංසො මස්‍ය සන් සෘත්, අම්පරෙ ඛපි පරෙ, න තු බේ‍ය. පුංස්කොකිලඃ. අම්පරෙ කිං, පුං ක්‍ෂීරං. අබේ‍ය කිං, පුංඛ්‍යාතඃ.*

(ස-) අම් පරෙ, අම් පරකොට ඇත්තාවූ; ඛපි පරෙ, ඛප් සංඥයා පරකල්හි; පුංසො මස්‍ය, පුංස ශබ්දයාගේ මකාරය හට; සන් සෘත්, සන්ආගම වන්නේය. බේ‍යතු, බ්‍ය පරකල්හි වූකලී; න, සන් ආගම නොවන්නේය. පුම්-කොකිලඃ, මෙ යින් මකාරයාගේ ස්ථානයෙහි සන් ආගමයි, නැවත මකාරය හට (50) අනුස්වාරය වේ, පුංස්කොකිලඃ. අම්පරෙ කිං, අම්පරෙ යනු කුමටය? පුං ක්‍ෂීරං, යන තන්හි ඛප් සංඥයා අම් පරකොට නැතිහෙයින් මකාරස්ථානයෙහි සන් ආගම නොවනබව ඇඟ වීම පිණිසයි. අබේ‍ය කිං, අබේ‍ය යනු කුමක්සඳහාද? පුංඛ්‍යාතඃ, යන තන්හි බ්‍ය පරහෙයින් සන් ආගම නොවීම අඟවනු පිණි සයි. [පාණිනිඃ 8. 3. 6.]

(මු-) 55. **නො'ප්‍රශාමය්‍ජතෙ.** (නඃ 6. අප්‍රශාමඃ 6. ජතෙ 7.)

එහෙයින්, සංශොභනං රාජතෙ, යන වාක්‍යයෙහි, සංරාට් යනු වේ,—වන්‍දයයි, මෙහි අනුස්වාරය වේමය.

* අම්පරො යස්මාත් සො අම්පරඃ තස්මින්. ඛපි යන මො හුගේ විශෙෂණයයි. මකාරයතෙම පූර්වසූත්‍රයෙන් සම්බන්ධවේ. සන් යන්නහුගේ නකාරය ඉත්සංඥයි. (17) එහෙයින් මකාර යාගේ අන්තයෙහි සකාරාගම වෙයි. ලුප්ත සකාරයා තමා ආදි විධිශ බැවින් සකාරයහට විසර්ගය නොවේ. මෙසේම, පුංස්කෘ තිඃ පුංස්පානම් පුංශ්චාතකඃ යනාදියද වේ. පුමාංශ්චාසෞ කොකිලශ්චෙති පුංකොකිලඃ.

දීර්ඝාත් සම්හිතායාං නස්‍ය සත් සංහිතායාං, අමපරෙ ජතෙ පරෙ, න තු ප්‍රශාමඃ.*

න්තාවච, ඍකාරාන්ත ශබ්දයා කෙරෙන්ද ; ශෙ, බහුව්‍රීහි සමාසයෙහි ; කඃ ස්‍යාත්, කප්‍රත්‍යය වන්නේය. කල්‍යාණි පඤ්චමීකඃ යනු වේ. පක්‍ෂඃ, පක්‍ෂයයි. රාත්‍රිඃ පූරණී වාච්‍ය වෙති, කල්‍යාණී පඤ්චමා රාත්‍රයඃ යන මේ උදාහරණයෙහි රාත්‍රිය සමාසය වාච්‍යවූ පඤ්චමිය වාච්‍ය වන්නීය යන ; පූර්වත්‍ර, පූර්වඋදාහරණයෙහි ; මුඛ්‍යත්වං, පඤ්චමීශබ්දයාගේ ප්‍රධානත්වය වෙයි. [පාණිනිඃ 5. 4, 153.]

(මූ-) **333. සහඃ සො වා.** (සහඃ 6. සඃ 1. වා 1.)
සහස්‍ය ශෙ සඃ ස්‍යාද්වා.

සහ මාත්‍රා වර්තතෙ යො'සෞ සමාත්‍රකඃ සහමාත්‍රකඃ.*

(ස-) ශෙ, බහුව්‍රීහියෙහි ; සහස්‍ය, සහශබ්දයහට ; වා, විකල්පයෙන් ; සඃ ස්‍යාත්, සකාරාදෙශ වන්නේය. සහමාත්‍රා වර්තතෙ යො'සෞ යන වාක්‍යයෙහි සමාත්‍රකඃ යනු වේ. පක්‍ෂයෙහි සහමාත්‍රකඃ යනු වේ. [පාණිනිඃ 6. 3. 82.]

(මූ-) **334. සක්ථ්‍යක්‍ෂ්ණඃ ෂඃ ස්වාඞ්ගෙ.** (සක්ථ්‍යක්‍ෂ්ණඃ 5. ෂඃ 1. ස්වාඞ්ගෙ 7.)

ආභ්‍යාං ශෙ ෂඃ ස්‍යාත් ස්වාංගෙ. දීර්ඝසක්ථඃ, පුණ්ඩරීකවදක්‍ෂිණී යස්‍යාසෞ පුණ්ඩරීකාක්‍ෂඃ. ස්වාඞ්ගෙ කිං දීර්ඝසක්ථිශකටං.†

---

* සමාත්‍රකඃ යන්නෙහි (332) කප්‍රත්‍යය වන්නේය. මේ සූත්‍රයෙන් විකල්පයෙන් සහශබ්දයහට සකාර වන්නේය. කිසි කෙණෙක් වනාහි ප්‍රථමාන්ත අන්‍යපදාර්ථ බහුව්‍රීහිය නොසලකන්නාහු මාත්‍රා සහිතඃ සමාත්‍රකඃ යී තෘතීයා තත්පුරුෂයයි කියත්. මෙසේම සහසමානං උදරං යස්‍ය සඃ සොදරඃ සහොදරඃ යනාදියද වේ.

† සක්ථි ච අක්‍ෂි ච තත් සක්ථ්‍යක්‍ෂි තස්මාත්. ස්වස්‍ය ආත්මනඃ අඞ්ගං ස්වාඞ්ගං තස්මින්. ස්වාඞ්ග ලක්‍ෂණය කියන ලද්දේය (265), ස්වාඞ්ගවාචීවූ මොවුන් කෙරෙන් යන අර්ථයි. ෂප්‍රත්‍යයාගේ ෂකාරය (257) ඊප්ප්‍රත්‍යය ප්‍රයොජනකොට ඇත්තේය. අකාරය සිටී. පුණ්ඩරීකවත් යනු පුණ්ඩරීක නම් ශ්වෙතපද්මයයි, එම අක්‍ෂිය නොවේ, එබැවින් ලක්‍ෂණයෙන් ඒ සමානය යන අර්ථයි. එහෙයින්ම වාක්‍යයෙහි පුණ්ඩරීකවත් යනු කියනලදී, එසේම ව්‍යාඝ්‍රශවා යනු (358) තමා විසින් කියනුලැබෙයි. උදාහරණ දෙක්හි මෙයින් ෂප්‍රත්‍යය කළ කල්හි (258) ඉකාරලොපය වේ. ඉත්සංඥ ෂකාර බැවින් ස්ත්‍රීලිඞ්ගයෙහි දීර්ඝසක්ථී, සරොජාක්‍ෂී යනු වේ. ශකටය ප්‍රාණරහිත බැවින් දීර්ඝසක්ථි යනු වේ.

(ස-) ආසක්තං, සක්ථි අක්ෂි යන මේ දෙදෙනා කෙරෙන් ; හෙ, බහුව්‍රීහියෙහි ; ස්වාඞ්ගෙ, තමාගේ අවයවය වාච්‍ය කල්හි ; ෂඃ සතත්, ෂප්‍රත්‍යය වන්නේය. දීර්ඝසක්ථිනී (ඌරූ) යස්‍ය සඃ යන වාක්‍යයෙහි දීර්ඝසක්ථඃ යනු වේ. පුණ්ඩරීකාක්ෂඃ යනු වේ. ස්වාඞ්ගෙ කිං, ස්වාඞ්ගෙ යනු කුමටද? දීර්ඝසක්ථි ශකටං යන තන්හි ශකටය ප්‍රාණ්‍යවයව නොවන හෙයින් ෂ ප්‍රත්‍යය නොවන බව ඇඟවීම පිණිසයි. [පාණිනිඃ 5. 4. 113.]

(මූ-) 335. **දාරුණ්‍යඞ්ගුලෙඃ.** (දාරුණි 7. අඞ්ගුලෙඃ 5.) පඤ්චාඞ්ගුලං දාරු.*

(ස-) අඞ්ගුලෙඃ, අඞ්ගුලි ශබ්දයා කෙරෙන් පරව ; දාරුණි, කාෂ්ඨවාචී කල්හි බහුව්‍රීහියෙහි ෂප්‍රත්‍යය වන්නේය. පඤ්චාඞ්ගුලං, පඤ්චඅඞ්ගුලයඃ (පරිමාණං) අස්‍ය යන වාක්‍ය යෙහි පඤ්චාඞ්ගුලං යනු වේ. දාරු, කාෂ්ඨයයි. [පාණිනිඃ 5. 4. 114.]

(මූ-) 336. **ද්විත්‍රෙර්මූර්ධ්නඃ.** (ද්විත්‍රෙඃ 5. මූර්ධ්නඃ 5.)†

(ස-) ද්විත්‍රෙඃ, ද්විශබ්ද ත්‍රිශබ්ද යන මොහු දෙදෙනා කෙරෙන් පරවූ ; මූර්ධ්නඃ, මූර්ධන් ශබ්දයා කෙරෙන් බහුව්‍රීහියෙහි ෂ ප්‍රත්‍යය වන්නේය. [පාණිනිඃ 5. 4. 115.]

(මූ-) 337. **නෙවාර්ලොපොත්තො තෙ'ච්‍ය.** (නෙඃ 6 .. ලොපොත්තො 1.. තෙ 7. අච්‍ය 7.)

නස්‍ය ලොපඃ සතත් උවර්ණස්‍ය ඔත් සතදච් යෙ ච තෙ. විමූර්ධඃ.‡

---

* ස්ත්‍රීලිඞ්ගයෙහි වනාහි ඉත්සංඥ ෂකාරය බැවින් ඊප් කළ කල්හි පඤ්චාඞ්ගුලී යනු වේ, සමිත්. දාරුණි යනු කුම ටද? පඤ්චාඞ්ගුලා ශිලා යන තන්හි ෂප්‍රත්‍යය නොවන පිණි සයි. මෙහි තද්ධිතාර්ථ ද්විගුසමාස කළ කල්හි, (367) සංඛ්‍ය ව්‍යතත් යනාදියෙන් අප්‍රත්‍යය කළ කල්හි, ස්ත්‍රීලිඞ්ගයෙහි ආප්‍රත්‍යයයි.

† ද්විශ්ච ත්‍රිශ්ච තත් තසමාත්.

‡ න ච උශ්ච නු තයොඃ. ලොපශ්ච ඔත්ච ලොපොත්තො. අච්ච යශ්ච අච්‍යං තසමින්, තෙ ඉත්‍යස්‍ය විශෙෂණං. (336) ෂප්‍රත්‍යය කොට මෙයින් නකාරලොපය කළ කල්හි, (258) අකාරලොපය වේ, විමූර්ධඃ යනු වේ. ත්‍රයො මූර්ධානො යස්‍ය

(ස-) තෙ, තද්ධිතසංඥවත්වූ ; අචි, ස්වරයා පර කල්හිද ; යෙ ච, යකාරයා පර කල්හිද ; නස්‍ය, නකාරයහට ; ලොපඃ ස්‍යාත්, ලොප් වන්නේය ; උවර්ණස්‍ය, උවර්ණයහට ; ඔත් ස්‍යාත්, ඔකාර වන්නේය. ද්විමූර්ධඃ, ද්වෞ මූර්ධානෞ යස්‍ය සඃ යන වාක්‍යයෙහි ද්විමූර්ධඃ යනු වේ. [පාණිනිඃ 6. 4. 144, 146.]

(මූ-) **338. සංඛ්‍යායා ඩො'බහොඃ.** (සංඛ්‍යායාඃ 5. ඩඃ 1. අබහොඃ 5.)

බහුවර්ජායාඃ සංඛ්‍යායා ඩඃ ස්‍යාත් හෙ. පඤ්ච ෂට් පරිමාණං යෙෂාං තෙ පඤ්චෂාඃ, උපගතාඃ දශ යෙෂාං තෙ උපදශාඃ. බහොස්තු උපබහවඃ.*

(ස-) බහුවර්ජායාඃ, බහුශබ්දය රහිතවූ ; සංඛ්‍යායාඃ, සංඛ්‍යා ශබ්දයා කෙරෙන් ; හෙ, බහුව්‍රීහි සමාසයෙහි ; ඩඃ ස්‍යාත්, ඩප්‍රත්‍යය වන්නේය. පඤ්චෂාඃ යනු වේ. උපදශාඃ යනු

ස ත්‍රිමූර්ධඃ යනුද මෙසේමැයි. ස්ත්‍රීලිඞ්ගයෙහි ද්විමූර්ධී ත්‍රිමූර්ධී යනු වේ, රාක්ෂසීයයි, ද්විත්‍රෙඃ යනු කුමටද ? බහුමූර්ධා යන තන්හි ෂප්‍රත්‍යය නොවන පිණිසයි, (431) නදං තසෞ යනාදියෙන් පදාන්තත්වනිෂෙධ බැවින් (118) නොලුප් ඓ'ධෞ යන මොහු ගේ අප්‍රාප්තිය ඇතිකල්හි නකාරලොපය සඳහා මේ තෙම කියනලදී, ඔකාරාදෙශය මෙසේයි—බාහවඃ, බාභ්‍රව්‍යඃ යන මේ ආදියයි. කිසිතැනෙක නොවන්නේය, මෙසේයි :— ස්වායම්භුවං යනු වේ.

* නාස්ති බහුර්යත්‍ර සා අබහුස්තස්‍යාඃ. බහුශබ්දය (101) සංඛ්‍යාවත් යන මේ ආදියෙන් සංඛ්‍යාවද් අතිදෙශ බැවින් සංඛ්‍යාභාවය ලත්කල්හි නිෂෙධයි. පඤ්චෂාඃ යනු ඩප්‍රත්‍යය කළකල්හි (126) ටිලොපයයි. ද්විත්‍රාඃ චතුඃ පඤ්චාඃ යනාදියද මෙසේමැයි. උපගතා විංශතිර්යස්‍ය ස උපවිංශඃ, ඩප්‍රත්‍යය කළ කල්හි විංශතිශබ්දයාගේ ති යන භාගයහට ලොප් වේ (126) යයොලොපඃ යනාදියෙන් අකාරලොපයයි (258) උපගතා බහවො යෙෂාං තෙ උපබහවඃ, බහුශබ්දය හරණ බැවින් සංඛ්‍යෙයවෘත්තිය සංඛ්‍යාශබ්දයා කෙරෙන්ම ග්‍රහණයයි. එහෙයින් අෂ්ටාභිඃ සහ වර්තතෙ යා සා සාෂ්ටා පඤ්චාශත් යන මෙහි සංඛ්‍යාවෘත්ති බැවින් ග්‍රහණය නොවන්නේය. ශොභනං ප්‍රාතර්යස්‍ය තත් සුප්‍රාතං යන මෙහි ඩප්‍රත්‍යය වක්තව්‍යයි.

වේ. බහොසතු, බහුශබ්දයා කෙරෙන් වනාහි ; උපබහවඃ, ඩප්‍රත්‍යය නොවන හෙයින් උපබහවඃ යනු වේ. [පාණිනිඃ 5. 4. 73.]

(මු-) 339. **නාභෙර්නාම්නි.** (නාභෙඃ 5. නාම්නි 7.)

පද්මනාභඃ.*

(ස-) නාභෙඃ, නාභිශබ්දයා කෙරෙන් පරව ; නාම්නි, බහුව්‍රීහි සමාසයෙහි වූ සංඥයෙහි ඩප්‍රත්‍යය වන්නේය. පද්මනාභඃ, පද්මං නාභෞ යස්‍ය යන්නෙහි හෝ පද්මවත්නාභිර්යස්‍ය යන වාක්‍යයෙහි පද්මනාභඃ යනු වේ. විෂ්ණුයි.

(මු-) 340. **ලොම්නො'න්තර්බහිර්භ්‍යාං.** (ලොම්නඃ 5. අන්තර්-බහිර්භ්‍යාං 5..)

අන්තලෝමඃ බහිලෝමඃ.

(ස-) අන්තර්බහිර්භ්‍යාං, අන්තර්ශබ්ද වහිර්ශබ්දයන් කෙරෙන් පරවූ; ලොම්නඃ, ලොමන්ශබ්දයා කෙරෙන් බහුව්‍රීහියෙහි ඩප්‍රත්‍යය වන්නේය.

අන්තලෝමානි යස්‍ය සඃ අන්තලෝමඃ, බහිලෝමානි යස්‍ය සඃ බහිලෝමඃ.† [පාණිනිඃ 5. 4. 117.]

(මු-) 341. **නඤ්දුඃසොඃ සක්ථෙනා වා.** (නඤ්දුඃසොඃ 5. සක්ථ්නඃ 5. වා 1.)

අසක්ථඃ අසක්ථිඃ.‡

(ස-) නඤ්දුඃසොඃ, නකාරනිපාතසමාසය දුර්ශබ්දය සුශබ්දය යන මොවුන් කෙරෙන් පරවූ; සක්ථ්නොඃ, සක්ථිශබ්දයා

---

* වජ්‍රනාභඃ යනුද මෙසේමැයි, ඌර්ණනාභෞ යස්‍ය ස ඌර්ණනාභඃ. අන්‍යයෝ ඌර්ණනාභිඃ කියති. නාම්නි යනු කුමටය? ගම්භීරනාභිඃ යන තන්හි නාමය නොවන හෙයින් ඩප්‍රත්‍යය නොවන පිණිසයි. අරවින්දනාභිඃ යන්න වනාහි සමාසාන්ත විධානයාගේ අනිත්‍යත්වයෙන් හෝ සංඥ නොවන බැවින් හෝ වේ.

† පෘථක්යොගය බැවින් නාම්නි යනු අනුවර්තනය නොවේ. මොවුන් කෙරෙන් ඩප්‍රත්‍යය කිරීම කුමටය? දීඝලොමා යන තන්හි ඩප්‍රත්‍යය නොවන පිණිසයි.

‡ නඤ්ච දුශ්ච සුශ්චෙති තස්මාත්. මෙහි ස්වාඞ්ගනුවූයේම ග්‍රහණය වෙයි, ස්වාඞ්ගයෙහි වනාහි (334) පූර්වසූත්‍රයෙන්ම ෂප්‍රත්‍යය වෙයි.

කෙරෙන් බහුව්‍රීහි සමාසයෙහි විකල්පයෙන් ඩප්‍රත්‍යය වන්නේය.

නාස්ති සක්ථි යස්‍ය සො'සක්ථඃ විකල්පයෙන් අසක්ථිඃ. දුර්සක්ථි යස්‍ය ස දුඃසක්ථඃ වා දුඃසක්ථිඃ. ශොභනං සක්ථි යස්‍ය ස සුසක්ථඃ, වා සුසක්ථිඃ. [පාණිනිඃ 5. 4. 121.]

(මු-) **342. අස් ප්‍රජායාඃ.** (අස් 1. ප්‍රජායාඃ 5.)

අප්‍රජාඃ සුප්‍රජාඃ.*

(ස-) ප්‍රජායාඃ, නඤ්දුඃ සු යන මොවුන් කෙරෙන් පරවූ ප්‍රජාශබ්දයා කෙරෙන් ; අස්, බහුව්‍රීහියෙහි අස්ප්‍රත්‍යය වන්නේය. නාස්ති ප්‍රජා යස්‍යසෞ අප්‍රජාඃ. දුෂ්ප්‍රජාඃ සුප්‍රජාඃ යනුද මෙසේමැයි. [පාණිනිඃ 5. 4. 122.]

(මු-) **343. මන්‍දල්පාච්ච තු මෙධායාඃ.** (මන්‍දල්පාත් 5. ච 1. තු 1. මෙධායාඃ 5.)

අමෙධාඃ සුමෙධාඃ මන්‍දමෙධාඃ.†

(ස-) මන්‍දල්පාච්ච, මන්‍දශබ්ද අල්පශබ්ද යන දෙකද චකාරයෙන් නඤ්දුඃ සු යන මොවුන් කෙරෙන්ද පරවූ ; මෙධායාඃ, මෙධාශබ්දයා කෙරෙන් බහුව්‍රීහියෙහි අස්ප්‍රත්‍යය වන්නේය.

නාස්ති මෙධා යස්‍ය සඃ අමෙධාඃ, සු සුන්‍දරී මෙධා යස්‍ය සඃ සුමෙධාඃ, මන්‍ද මෙධා යස්‍ය සඃ මන්‍දමෙධාඃ. දුර්මේධාඃ යනුද මෙසේමැයි.

---

* වා යනු අනුවර්තනය නොවේ. අස්ප්‍රත්‍යය කළ කල්හි, (258) යස්‍යෙතිචඃ යනාදියෙන් අකාරලොපය වේ, (185) අත්‍යසොධාඃ යනාදියෙන් දීඝ් වේ. මෙහි නකාරාදීන්ගේ මධ්‍යගතවූ අන්‍යශබ්ද රහිතයා කෙරෙන් පරවූයේ කැමතිවන ලදී, එහෙයින් සුගුණී ප්‍රජා යනාදියෙහි ප්‍රත්‍යය නොවන්නේය.

† මන්‍දශබ්ද අල්පශබ්ද තස්මාත්. මෙයින් අස්ප්‍රත්‍යය වන්නේය, (258) ආකාරලොපය වේ. (185) දීඝ්යි. මෙහිදු නකාරාදීන්ගේ අව්‍යවහිතොත්තරත්වය කැමතිවනලදී එහෙයින් මන්‍දබහුමෙධඃ යනාදියෙහි අස්ප්‍රත්‍යය නොවන්නේය. තු යනු අනන්තබැවින් මන්‍දාදීන්ගේ පරභාගයෙහි අනුවෘත්තිය නොවේ.

(මු-) **344. ධර්මාදන්.** (ධර්මාත් 5. අන් 1.) සුධර්මා.*

(ස-) ධර්මාත්, පූර්වපදයා කෙරෙන් පරවූ ධර්මශබ්දයා කෙරෙන්; අන්, බහුව්‍රීහියෙහි අන්ප්‍රත්‍යය වන්නේය. සුධර්මා යස්‍ය ස සුධර්මා. [පාණිනිඃ 5. 4. 124.]

(මු-) **345. නඤ්සුත්‍රිව්‍යුපාච්චතුරෝ'ඃ.** (නඤ්සුත්‍රිවිඋපාත් 5. චතුරඃ 5. අඃ 1.)

එභ්‍යශ්චතුරෝ'ඃ ස්‍යාත් හෙ. අචතුරඃ සුචතුරඃ.†

(ස-) එභ්‍යඃ, න නිපාතය සුශබ්දය ත්‍රිශබ්දය විශබ්දය උපශබ්දය යන මොවුන් කෙරෙන් පරවූ ; චතුරඃ, චතුර්ශබ්දයා කෙරෙන් ; හෙ, බහුව්‍රීසමාසයෙහි ; අඃ ස්‍යාත්, අප්‍රත්‍යය වන්නේය. න සන්ති චත්වාරි යස්‍යාසෞ අචතුරඃ. සුෂ්ඨු චත්වාරි යස්‍ය සෞ සුචතුරඃ. එසේම ත්‍රීණි චත්වාරි වා පරිමාණං යෙෂාං තෙ ත්‍රිචතුරාඃ. විගතාශ්චත්වාරො යස්‍ය ස විචතුරඃ. උපගතාශ්චත්වාරො යස්‍යාඃ සා උපචතුරා යනු වේ. [පාණිනිඃ 5. 4. 77.]

(මු-) **346. භාන්නෙතුඃ.** (භාත් 5. නෙතුඃ 5.)

නක්ෂත්‍රාත් නෙතෘශබ්දාත් අඃ ස්‍යාත් හෙ. මෘගනෙත්‍රා රාත්‍රිඃ.‡

(ස-) නක්ෂත්‍රාත්, නක්ෂත්‍රවාචකවූ ; නෙතෘශබ්දාත්, නෙතෘශබ්දයා කෙරෙන් ; හෙ, බහුව්‍රීහියෙහි ; අඃ ස්‍යාත්, අප්‍රත්‍යය වන්නේය. මෘගඃ නෙතා යස්‍යාඃ සා මෘගනෙත්‍රා යනු වේ. රාත්‍රිඃ, රාත්‍රියයි.

---

* මෙයින් අන්ප්‍රත්‍යය වන්නේය, (258) අකාර ලොපයයි, (164) දීර්ඝයි. සධර්මා විධර්මා බහුධර්මා යනාදියද මෙසේමැයි. මෙහි නොකරණලද සමාස ඇති පූර්වපදයා කෙරෙන් යනු වක්තව්‍යයි එහෙයින් පරමහිතො ධර්මො යස්‍ය සඃ පරමහිතධර්මඃ යනාදියෙහි අන්ප්‍රත්‍යය නොවන්නේය.

† නඤ්ච සුශ්ච ත්‍රිශ්ච විශ්ච උපශ්චෙති තස්මාත්.

‡ මෘගඃ මෘගශිරො නක්ෂත්‍රං නෙතා ප්‍රාපකො යස්‍යාඃ සා රාත්‍රිඃ මෘගනෙත්‍රා. මෘගඃ යනු මෘගශිර නක්ෂත්‍රයයි. නෙතා යනු පමුණුවන්නෙකි. අප්‍රත්‍යය කළකල්හි (249) ආප්‍රත්‍යය වන්නේය. පුෂ්‍යනෙත්‍රා යනාදියද මෙසේමැයි. යම් නැකතක් උදාවූ කල්හි රාත්‍රිය පවත්නීද ඒ නක්ෂත්‍රයතෙම ඒ රාත්‍රියගේ නෙතෘයි.

(මු-) 347. **සඞ්ඛ්‍යාසූපමානාත් පාත් පාදෙ'හස්ත්‍යාදෙඃ.**
(සඞ්ඛ්‍යාසු උපමානාත් 5. පාත් 1. පාදඃ 1. අහස්ත්‍යාදෙඃ 5.)
එභ්‍යඃ පාදස්‍ය පාත් ස්‍යාත් හෙ, න තු හස්ත්‍යාදෙඃ.
ද්විපාත් සුපාත් ව්‍යාඝ්‍රපාත්. හස්ත්‍යාදෙස්තු හස්තිපාදඃ.*

(ස-) එභ්‍යඃ, සඞ්ඛ්‍යාශබ්ද සුශබ්ද උපමානවාචක ශබ්ද යන මොවුන් කෙරෙන් පරවූ ; පාදස්‍ය, අකාරාන්ත පාදශබ්දයහට; හෙ, බහුව්‍රීහි සමාසයෙහි ; පාත් ස්‍යාත්, පාද් යනාදෙශ වේ. හස්ත්‍යාදෙස්තු, හස්ත්‍යාදිශබ්දයන් කෙරෙන් පරව වනාහි ; න, ආදෙශ නොවන්නේය. ද්වෞ පාදෞ යස්‍ය ස ද්විපාත්. ශෝභනෞ පාදෞ යස්‍ය ස සුපාත්. ව්‍යාඝ්‍රස්‍යෙව පාදෞ යස්‍ය ස ව්‍යාඝ්‍රපාත්. හස්ත්‍යාදෙස්තු, හස්ත්‍යාදි ශබ්දයන් කෙරෙන් වනාහි ; හස්තින ඉව පාදෞ යස්‍ය ස හස්තිපාදඃ යනු වේ. [පාණිනිඃ 5. 4. 138.]

(මු-) 348. **කුම්භාදෙරීපි.** (කුම්භාදෙඃ 5. ඊපි 7.)
කුම්භාදෙඃ පරස්‍ය පාදස්‍ය පාත් ස්‍යාත් හෙ ඊපි පරෙ.
(223) පාත් පත් පෞ. කුම්භපදී ශතපදී. ඊපි කිං කුම්භපාදඃ.†

(ස-) කුම්භාදෙඃ පරස්‍ය, කුම්භාදිශබ්දයන් කෙරෙන් පරවූ ;

---

* සඞ්ඛ්‍යා ච සුශ්ච උපමානඤ්ච තස්මාත්. න හස්ත්‍යාදිරහස්ත්‍යාදිස්තස්මාත්. උපමානතායෙන් ලද කල්හි හස්ත්‍යාදීහුගේ නිෂෙධයයි. හස්ත්‍යාදීහු මෙසේයි :—

හස්තිකටොලඃ කණ්ඩාලො ගණ්ඩාලො ගණිකාමහාන්,
දාසී කුශූල ඉත්‍යෂ්ටෞ හස්ත්‍යාදෞ පරිකීර්තිතාඃ.

කටොලඃ යනු චාණ්ඩාලයි. ගණ්ඩාලඃ යනු ධාන්‍යාදි ආධාරවිශෙෂයයි.

† මෙහි ඊපි යනු විෂයසප්තමියයි, ඊප් කටයුතු කල්හි යන අර්ථයි. මෙයින් පාදශබ්දයහට පාද්ආදෙශ වන්නේය. (265) ඊප් වේ, (223) පද් ආදෙශ වේ. කුම්භාදිය මෙසේයි—

කුම්භාෂ්ටජාලාඃ ශතශූත්‍රගොධාඃ
විෂ්ණුඃ ශිතිර්ද්‍රොණකුණී ච කෘෂ්ණඃ,
නිරාර්ද්‍රසූචීසකෘදෙකදාස්‍යෙ
විඃ ශූකරො වෛකලසො'පිවෙත්.

පූර්වසූත්‍රයෙන්ම පාද්ආදෙශය සිද්ධ කල්හි මේතෙම නියමාර්ථය පිණිසයි, එහෙයින් ඊප්ප්‍රත්‍යය නුවූ පක්ෂයෙහි පාද් ආදෙශ නොවේ.

පාදස්‍ය, පාදශබ්දයහට ; ඊපි පරෙ, ඊප්ප්‍රත්‍යය පරවිෂයෙහි ; භෙ, බහුව්‍රීහියෙහි ; පාත් ස්‍යාත්, පාද් යනාදෙශ වන්නේය.

පාත් පත් පෙ෴ යන්නෙන් පද්ආදෙශ වේ. කුම්භාවිව පාදෞ යස්‍යාඃ සා කුම්භපදී. ශතං පාදා යස්‍යාඃ සා ශතපදී. ඊපි කිං, ඊප්ප්‍රත්‍යය කළ විෂයෙහි කුමටය? කුම්භපාදඃ යන තන්හි පාද්ආදෙශ නොවන පිණිසයි. [පාණිනිඃ 5. 4. 139.]

(මු-) **349. ව්‍යතීහාරෙ චිඃ පූර්ව්වා දීඝෝ'න ව්‍යා වා.** (ව්‍යතීහාරෙ 7. චිඃ 1. පූර්ඃ 1. ඝීඃ 1. අනච් 7. අ 1. වා 1.)

ව්‍යතීහාරෙ යො හස්තස්මාත් චිඃ ස්‍යාත්, පූර්ව්වස්‍ය ච ඝීඃ ස්‍යාත්, අ වා නච්චි. කෙශෙෂු කෙශෙෂු ගෘහීත්වා යද්යුද්ධං ප්‍රවෘත්තං—කෙශා කෙශි. දණ්ඩෛශ්ච දණ්ඩෛශ්ච ප්‍රහෘත්‍ය යද්යුද්ධං ප්‍රවෘත්තං—දණ්ඩා දණ්ඩි. මුෂ්ටා මුෂ්ටි මුෂ්ටී මුෂ්ටි, බාහා බාහවි බාහූ බාහවි. අචි තු අස්‍යසි.*

(ස-) ව්‍යතීහාරෙ, ව්‍යතීහාරයෙහි ; යඃ හඃ, යම් බහුව්‍රීහි සමාසයෙක් වේද ; තස්මාත්, ඒ සමාසයා කෙරෙන් ; චිඃ ස්‍යාත්, චිප්‍රත්‍යය වන්නේය. පූර්ව්වස්‍යච ඝීඃ ස්‍යාත්, පූර්ව්පදයහට දීඝීද

---

* අන්‍යොන්‍යයන් සමාන ජාතිවන් ක්‍රියාවන් කිරීම ව්‍යතීහාරයයි. ඉත්සංඥ චකාරය අව්‍යය සඳහායි (94) ඉකාරය සිව්යි. කෙශාකෙශි දණ්ඩාදණ්ඩි යන දෙතන්හි පූර්ව්පදයාගේ අකාරයහට දීඝීවේ පරපදයා කෙරෙන් චිප්‍රත්‍යය වන්නේය, (258) අකාරලොපයි, (246) විභක්තිහට ලොප්වේ. මුෂ්ට්‍යාදි දෙතන්හි පූර්ව්පදයාගේ ඉකාර උකාරයන්ට ආකාරවේ පක්‍ෂයෙහි ඉකාර උකාරයන්ට දීඝීවේ, පරපදයාගේ අනතුරෙන් චිප්‍රත්‍යයවේ, බාහුශබ්දයාගේ වනාහි විශෙෂසූත්‍රය බැවින් (337) උකාරයහට ඔකාර වේ, (35) ඔකාරයහටද අව් වේ. අස්‍යසි යන මෙහි පරපදයා කෙරෙන් චිප්‍රත්‍යයත් පූර්ව්පදයාහට වනාහි ආකාර නොවේ ස්වරපර බැවින් දීඝීද නොවේ. උදාහරණ ලූපකභාවයෙන්, එහි ගෙන ඒ කරණකොටගෙන පැහැර යුද්ධය ඇතිකල්හි ව්‍යතීහාරයෙහි යම් බහුව්‍රීහියෙක් වේද එහිම මේ විධානයයි, එහෙයින් කායඃශ්ච කායඃශ්ච ගෘහීත්වා, රථෙ ච රථෙ ච ස්ථිත්වා යනාදියෙහි චිප්‍රත්‍යයාදිය නොවන්නේය.

බහුව්‍රීහියෙහි ජායාවට ජානි කියාද ධනුෂ්ශබ්දයහට ධන්වන් කියාද, ජානුව-යට ඥ යනාදිය ප්‍රයොගානුසාරයෙන් වක්තව්‍යයි. මෙසේයි—යුවජානිඃ, අධිජ්‍යධන්වා, ප්‍රඥඃ සංඥඃ යනාදියයි.

වන්නේය. ආවා, විකල්පයෙන් ආකාර වන්නේය. න භවි, ස්වරයා පරකල්හි වනාහි පූර්වපදයහට දීර්ඝද ආකාරද නොවේ. මුෂ්ටිභිර්මුෂ්ටිභිඃ ප්‍රහෘත්‍ය යද්යුද්ධං ප්‍රවෘත්තං මුෂ්ටාමුෂ්ටි, පක්ෂයෙක්හි මුෂ්ටී මුෂ්ටි. බාහුභිර්බාහුභිඃ ප්‍රහෘත්‍ය යද්යුද්ධං ප්‍රවෘත්තං බාහාබාහවි, පක්ෂයෙක්හි බාහූබාහවි. අසිභිඃ අසිභිඃ ප්‍රහෘත්‍ය යද්යුද්ධං ප්‍රවෘත්තං අස්‍යසි. [පාණිනිඃ 5. 4. 127, 2. 2. 27, 6. 3. 137.]

ඉති භඃ.

බහුව්‍රීහිය නිමි.

(මු) කර්මධාරයසමාසඃ. (ස.)

පරමශ්චාසාවාත්මා චෙති—පරමාත්මා.

සංශ්චාසෞ චිච්චාසා—චානන්දශ්චෙති—සච්චිදානන්දඃ.*

---

* උත්තරපදද්විගුසමාස ද්වන්ද්වසමාස බහුව්‍රීහිසමාස යන මොවුන් රහිතවූ සමාසයෙක් පදයන්ගේ බහුත්වය ඇතිකල්හි නැත්තේයයි දුර්ගසිංහ ක්‍රමදීශ්වර දෙදෙන කියති. ඒ මතය අයතිනොකරන්නේ පද තුණකින්ද සච්චිදානන්දඃ යි කර්මධාරය කියයි. ආනන්දයතීති ආනන්දඃ, ආනන්දඃ යනු විශෙෂ්‍ය පදයයි, තුන්දෙනාගේ විශෙෂණත්වය ඇති කල්හි සමාසය උත්පත්ති නොවන හෙයිනි. කුබ්ජකුණ්ඨඃ පටුවිස්පෂ්ටඃ යන මේ ආදියෙහි දෙදෙනාගේ විශෙෂණත්වය ඇති කල්හිද විශෙෂ්‍ය විශෙෂණයාගේ කැමති පරිද්දෙන් වන බැවින් එකක්හුගේ විශෙෂ්‍යභාවය සලකනුලැබේ. විශෙෂණයාගේ වනාහි පූර්වසිටීමම වේ. එහෙයින් බ්‍රාහ්මණදීර්ඝඃ යනු නොවේ. ගෞරාදීහුගේ වනාහි විශෙෂණත්වයද විශෙෂ්‍යත්වයද වෙයි, එහෙයින් ගෞරවිප්‍රඃ, විප්‍රගෞරඃ යනාදිය වේ. ගෞරාදිය මෙසේයි— ගෞර කඩාර ජරඨ කපිල ගඬුල කාණ බොඩ ඛඤ්ජ කුබ්ජ කුණ්ඩ බල වෘඩ භික්ෂුක තනු යනුයි.

මයූර ව්‍යංසකාදියද, ශාකපාර්ථිවාදියද නිපාතනය කරණු ලැබෙත්. ව්‍යංසයති ඡලයතීති ව්‍යංසකොධූර්ත්තඃ, විපූර්ව අංස ධාතුහු කෙරෙන් ණකප්‍රත්‍යයයි, මයූරශ්චාසෞ ව්‍යංසකශ්චෙති මයූරව්‍යංසකඃ, උද්ධර උත්සෘජ ඉති යස්‍යාං ක්‍රියායාං සා උද්ධරොත්සෘජා, උද්ධමවිධමා, උත්පතනිපතා අශ්නීතපිවතා යනාදියද මෙසේමැයි. ශාකඃ ශකතිඃ ප්‍රධානං යස්‍ය සඃ ශාකප්‍රධානඃ, ශාකප්‍රධානඃ පාර්ථිවඃ ශාකපාර්ථිවඃ, නිපාතනයෙන් මධ්‍යපද ලොපය වෙයි. ශ්‍රීහර්ෂනාමා නෘපතිඃ ශ්‍රීහර්ෂනෘපතිඃ,

(ස-) කර්මධාරයසමාසග කියනුලැබේ.

පරමශ්වාසෞ, පරම වූයේද මේ තෙමේය ; ආත්මා ච, ආත් මන් වූයේද මේ තෙමේය යන වාක්‍යපීයෙහි පරමාත්මා යනු වේ. සංශ්වාසෞ විච්චාසෞ ආනන්දශ්ච යන වාක්‍යයෙහි සච් චිදානන්දඃ.

(මු-) **350. කොඩාදිඃ පුංවත්යජාතීයදෙශීයෙ තත්වෙ ත්ව ජාත්‍යාඛ්‍යඃ.** (කොඩාදිඃ 1. පුංවත් 1. යජාතීයදෙශීයෙ 7. තත්වෙ 7. තු 1. අජාත්‍යාඛ්‍යඃ 1.)

(මූ-) කොඩ් පූරණ්‍යාදිඃ පුංවත් ස්‍යාත් යාදෞ, තත්වයොස්තු ජාතිසංඥ වර්ජං.

පාචකස්ත්‍රී, පඤ්චමභාර්‍ය්‍යා.*

මෙරුනාමා මහීභෘත් මෙරුමහීභෘත්, මුඛයුක්තා නාසිකා මුඛ නාසිකා යනාදියද මෙසේයි. මයූරව්‍යංසකාදියද ශාකපාර්ථිවා දියද ආකෘතිගණයයි. ප්‍රයොගානුසාරයෙන් මෙසේ අවබොධ කටයුතු.

* ක උඩ් යස්‍ය ස කොඩ්, කොඩ් ආදිර් යස්‍ය ස කොඩාදිඃ. යශ්ච ජාතීයශ්ච දෙශියශ්ච තත් තස්මින්. තශ්ච ත්වශ්ච තත්වං තස්මින්. ජාතිශ්ච ආඛ්‍යා ච ජාත්‍යාඛ්‍යෙ, න විද්‍යෙතෙ ජාත්‍යාඛ්‍යෙ යත්‍ර කොඩාදෞ සො'ජාත්‍යාඛ්‍යඃ. (327) පුංවත් ස්ත්‍ර්‍යුක්තපුංස් කඃ යන මේ ආදියෙන් උක්තපුංස්කවූ ඌංසංඥ කකාරාදියට පුංවද්භාවය යෙදුනු කල්හි (328) නොප්තාකකොඩ් යන මේ ආදියෙන් නිෂෙධ වෙයි, එකල්හි, කර්මධාරයාදියෙහි නැවත මෙයින් විධානය කරණුලැබේ. ජාතීයප්‍රත්‍යයා පර කල්හි පුංවත්භාවය නොයෙදුනු කල්හිද මේ සූත්‍රයෙන් විශෙෂවිධා නය වෙයි. මෙසේයි—රසිකා චාසෞ භාර්‍ය්‍යා චෙති රසිකභා ර්‍ය්‍යා යනාදියයි, පඤ්චමීචාසෞ භාර්‍ය්‍යා චෙති පඤ්චමභාර්‍ය්‍යා. දත්තාභාර්‍ය්‍යා යනුද මෛථිලභාර්‍ය්‍යා යනුද බ්‍රාහ්මණභාර්‍ය්‍යා යනුද සුකෙශභාර්‍ය්‍යා යනුද මෙසේමැයි. (487) රසිකජාතීයා, (477) රසිකදෙශීයා, (438) රසිකතා රසිකත්වං යනුයි. කොඩාදි භින්නයහට වනාහි දීර්ඝජාතීයා යනාදීන්ගේ පුංවද්භාවය නොවේ. උක්තපුංස්කඃ යනු කුමටය? ගඞ්ගිකාභාර්‍ය්‍යා යනාදි අනුක්තපුංස්කයන්ට පුංවත් නොවීම පිණිසයි. අජාත්‍යාඛ්‍යඃ යනු කුමටය? බ්‍රාහ්මණීත්වං දත්තාත්වං යන තන්හි පුංවත් නොවන පිණිසය. කොඩාදිඃ යනාදියෙන් යම් ශබ්දයන්ගේ පුංවත්භාවය නිෂෙධකරණලද්දේද ඒශබ්දයෝ කිසිකෙණෙක් වනාහි ගන්නාලැබෙත්, එහෙයින් (329) පූරණීප්‍රියා යනාදි

(ස-) කොපධ, තද්ධිතයෙහි වූද කෘදන්ත ණකප්‍රත්‍යයෙහි වූද උපධසංඥ කකාරද ; පූරණ්‍යාදිඃ, පූරණීප්‍රත්‍යයාන්තය ආඛ්‍යස ඉම් උම් දෙකද රක්තාර්ථ විකාරාර්ථ දෙකද යන සතර රහිත තද්ධිතාන්ත ඉත්සංඥ ණකාරයද ජාතිස්වාඞ්ග දෙක්හි කරණ ලද ඊප්අන්ත පදයද ඉදින් උක්තපුංසක වන්නේද එකල්හි එකාර්ථවූ (විශෙෂ්‍යවූ) ස්ත්‍රීලිඞ්ගයා පර කල්හි ; යාදෞ, කර්මධා රයාදියෙහි ; පුංවත් ස්‍යාත්, පුංවත් වන්නේය. ජාතීය දෙශීය ප්‍රත්‍යයන් පර කල්හිද පුංවත් වන්නේය. තත්වයොස්තු, තප්‍ර ත්‍යය ත්වප්‍රත්‍යය යන මොවුන් පර කල්හි ; ජාතිසංඥාවර්ජං, ජාති සංඥා දෙක රහිතවූ උක්තපුංස්කවූ උපධසංඥ කකාරාදිය පුංවත් වන්නේය.

පාචකස්ත්‍රී, පාචිකාචාසෞ ස්ත්‍රීචෙති පාචකස්ත්‍රී. පඤ්චම භාර්‍ය්‍යා පඤ්චමී චාසෞ භාර්‍ය්‍යාචෙති පඤ්චමභාර්‍ය්‍යා. දෙතන්හිම මෙයින් පුංවත් වේ. [පාණිනීඃ 6. 3. 42.]

(මු-) **351. ද්විත්‍ර්‍යෂ්ටාධිකා වාත්‍රයො'ෂ්ටාස්ත්‍රිදශාදෞ'නන්ත්‍ය ෂට්කෙ ත්වනශීතෞ වා.** (ද්විත්‍ර්‍යෂ්ටාධිකාඃ 1...ආත්‍රයො'ෂ්ටාඃ 1...ත්‍රිදශාදෞ 7. අනන්ත්‍යෂට්කෙ 7. තු 1. අනශීතෞ 7. වා 1.)

එෂාමෙතෙ ක්‍රමාත් ස්‍යුඃ දශාදිත්‍රිකෙ, චත්වාරිංශදාදිෂට්කෙ අශීතිවර්ජෙ තු වා.

ද්ව්‍යධිකාදශ ද්වාදශ, ත්‍රයොදශ අෂ්ටාදශ. ද්වා චත්වාරිංශත් ද්වි චත්වාරිංශත්. අනශීතෞ කිං, ද්ව්‍යශීතිඃ.*

යෙහි නිෂෙධ කල්හිද කර්මධාරයෙහි පුංවත්භාවය වෙයි යනු කියත්, මෙසේයි—කල්‍යාණපඤ්චමී මහාෂ්ටමී මහානවමී කල්‍යාණප්‍රියා යනාදියයි.

කොපධාදියනම් (328) නොප්ධාතකකොපධ යන මේ ආදී සූත්‍රයෙහි යම් ප්‍රත්‍යයාදීහු කියනලද්දාහුද, පූරණ්‍යාදියනම් (329) පූරණීප්‍රියා යන මේ ආදී සූත්‍රයෙහි යම් ශබ්දයෝ කියනලද් දෝද ඔව්හු ජාතීය දෙශීය ප්‍රත්‍යයන් පර කල්හිද කර්මධාර යෙහිද පුංවත්වන්නෝය. තත්ව යනු පරකල්හි වනාහි ජාති වාචකයාහටද සංඥාවාචකයාහටද නොවන්නේය යන අර්ථයයි රාමතර්කවාගීශතෙම කියයි.

* ද්වෞච ත්‍රයශ්ච අෂ්ට ච තෙ ද්විත්‍ර්‍යෂ්ටානඃ, ද්විත්‍ර්‍යෂ්ටභිඃ සහිතා අධිකාඃ ද්විත්‍ර්‍යෂ්ටාධිකාඃ, ශාකපාර්ථිවාදි බැවින් සහිත යන පදය හට ලොප්වේ, ඔන්වයා කෙරෙන් පරවූ අධිකශබ්දය වෙන්

(ස-) දශාදිත්‍රිකෙ, දශන්ශබ්දය ආදිකොට ඇති විංශතිශබ්දය ත්‍රිංශත්ශබ්දය යන මේ ත්‍රිකය පර කල්හි ; එෂාං, ද්වි ත්‍රි අෂ්ටන් යන මොවුන් අධිකකොට ඇත්තවුන්ගේ ස්ථානයෙහි; එතෙ, ද්වා-ත්‍රයස්-අෂ්ටා යන මොවුහු ; ක්‍රමාත්, පිළිවෙළින් ; ස්‍යුඃ, වන්නාහ ; අශීති වර්ජේ, අශීතිශබ්දය රහිතවූ ; චත්වාරිංශදාදිෂට්කෙ තු, චත්වාරිංශත්ශබ්දය ආදිකොට ඇති ෂට්කය පරකල්හි වනාහි ; වා, විකල්පයෙන් ද්වා-ත්‍රයස්-අෂ්ටා යන ආදෙශයෝ කර්ම්ධාරයසමාසයෙහි වෙත්. ද්ව්‍යධිකාශ්ච තෙ දශ චෙති ද්වාදශ, ත්‍ර්‍යධිකාශ්ච තෙ දශ චෙති ත්‍රයොදශ, අෂ්ටාධිකාශ්ච තෙ දශ චෙති අෂ්ටාදශ, ද්ව්‍යධිකාචාසෞ චත්වාරිංශච්චෙති ද්වාචත්වාරිංශත්, පක්ෂයෙක්හි ද්විචත්වාරිංශත්. අනශීතෞ කිං, අනශීතෞ යනු කුමටය? ද්ව්‍යශීති, යනාදි තන්හි ද්වා යනාදි ආදෙශ නොවන බව දැක්වීම පිණිසයි. [පාණිනිඃ 6. 3. 47, 48, 49.]

(මු) 352. **වෛකොනස්‍යෛකාද්නෛකාන්නෞ සඞ්ඛ්‍යායාං.** (වා 1. එකොනස්‍ය 6. එකාද්නඑකාන්නෞ 1.. සඞ්ඛ්‍යායාං 7.)

එකාද්නවිංශතිඃ, එකාන්නවිංශතිඃ එකොනවිංශතිඃ.*

වෙන්ච සම්බන්ධ බැවින් ද්ව්‍යධික ත්‍ර්‍යධික අෂ්ටාධික යන අර්ථයි. ද්වාශ්ච ත්‍රයශ්ච අෂ්ටාශ්ච ද්වාත්‍රයො'ෂ්ටාඃ. දශ ආද්‍යා යෙෂාං තෙ දශාද්‍යාඃ, ත්‍රයාණාං දශාද්‍යානාං සමාහාරඃ ත්‍රිදශාද්‍යං තස්මින්. ෂණ්ණාං සමූහඃ ෂට්කං, අන්ත්‍යඤ්ච තත් ෂට්කඤ්චෙති තස්මින්. න අශීතිරනශීතිස්තස්‍යාං. චත්වාරිංශත් පඤ්චාශත් ෂෂ්ටි සප්තති නවති යන පස පරකල්හි විකල්පයෙන් වන්නෝය යන අර්ථයි. ශාකපාර්ථිවාදි බැවින් අධික යන පදයහට ලොප් වේ. ද්වාවිංශතිඃ ත්‍රයොවිංශතිඃ අෂ්ටාවිංශතිඃ යනුද, ද්වාත්‍රිංශත් ත්‍රයස්ත්‍රිංශත් අෂ්ටාත්‍රිංශත් යනුද මෙසේමැයි. ද්වාපඤ්චාශත් ද්විපඤ්චාශත් ද්වාෂෂ්ටිඃ ද්විෂෂ්ටිඃ, ද්වාසප්තතිඃ ද්විසප්තතිඃ, ද්වානවතිඃ ද්විනවතිඃ යන මේ ආදියද මෙසේමැයි. අශීතිශබ්දයා පර කල්හි ආදෙශ නොවේ, එහෙයින් ද්ව්‍යශීතිඃ ත්‍ර්‍යශීතිඃ අෂ්ටාශීතිඃ කියා වේ. කර්ම්ධාරයෙ යනු කුමටය? ද්ව්‍යධිකා දශ යත්‍ර සද්ව්‍යධිකදශ යනාදියෙහි ආදෙශ නොවන්නේය යනු දැක්වීම පිණිසයි.

* වාශබ්දය ව්‍යවස්ථාවාචී බැවින් මෙහි සඞ්ඛ්‍යාව විංශත්‍යාදියමය, එහෙයින් එකොනාශ්ච තෙ දශ චෙති එකොනදශ කියා වේ. යෙ යනු කුමටය? එකොනා විංශතිර් යත්‍ර ස එකොනවිංශතිඃ යන බහුව්‍රීහියෙහි ආදෙශ නොවන පිණිසයි.

(ස-) සඞ්ඛ්‍යායාං, සඞ්ඛ්‍යාවාචකවූ විංශතිශබ්දාදිය පරකල්හි; එකොනස්‍ය, එකොනශබ්දයහට ; වා, විකල්පයෙන් කර්ම්ධාරය සමාසයෙහි ; එකාද්න එකානනෞ, එකාද්න එකානන යන මොහු වෙත්. එකාද්න විංශතිඃ, එකොනා චාසෞ විංශතිශ්චෙති එකාද්නවිංශතිඃ, එකානනවිංශතිඃ, එකොනාචාසෞ විංශතිශ්චෙති එකානනවිංශතිඃ, පක්ෂයෙක්හි එකොනවිංශතිඃ යනු වේ. [පාණිනිඃ 6. 3. 76.]

(මූ-) **353. සඛ්‍යහොරාඥඃ ෂඃ ෂගෙ ච.** (සඛි-අහන්-රාඥඃ 5. ෂඃ 1. ෂගෙ 7. ච 1.)

එභ්‍යඃ ෂඃ ස්‍යාත් යෙ ෂෙ ගෙ ච. ප්‍රියසඛඃ පරමාහඃ මහාරාජඃ.*

(ස-) එභ්‍යඃ, සඛි අහන් රාජන්යන මේ ශබ්දයන් කෙරෙන්; යෙ, කර්ම්ධාරයසමාසයෙහිද ; ෂගෙ ච, තත්පුරුෂ ද්විගුසමාස දෙක්හිද ; ෂඃ ස්‍යාත්, ෂප්‍රත්‍යය වන්නේය. ප්‍රියශ්චාසෞ සඛා චෙති ප්‍රියසඛඃ මෙයින් ෂප්‍රත්‍යය වේ, (258) සඛිහුගේ ඉකාර ලොපය වේ. ඉත්සංඥ ෂකාර බැවින් ස්ත්‍රීලිඞ්ගයෙහි ඊප් වේ, (257) ප්‍රියසඛී යනු වේ. පරමශ්ච තත් අහශ්චෙති පරමාහඃ, ෂප්‍රත්‍යය කළකල්හි (337) නකාරලොපයද, (258) අකාර ලොපයද වේ. අභිධාන බැවින් අහන්අන්තය පුංලිඞ්ග වේ. මහාංශ්චාසෞ රාජා චෙති මහාරාජඃ, (326) මහත්ශබ්දයාගේ තකාරයහට ආකාර වේ, ෂප්‍රත්‍යය කළ කල්හි නලොපයද අකාරලොපයද වේ. [පාණිනිඃ 5. 4. 91.]

(මූ-) **354. සර්වෛකදෙශසඞ්ඛ්‍යාතසඞ්ඛ්‍යාව්‍යයාන්නෛකාන්නෛක්‍යෙ'හ්නො'හ්නඃ.** (සර්ව—ව්‍යයාත් 5. න 1. එකාත් 5. න 1. ඓක්‍යෙ 7. අහ්නඃ 6. අහ්නඃ 1.)

එභ්‍යඃ පරස්‍ය අහන් ඉත්‍යස්‍ය ස්ථානෙ අහ්නඃ ස්‍යාත් යාදෞ නචෛකාත් න චෛක්‍යෙ.†

---

* සඛා ච අහශ්ච රාජා චෙති තස්මාත්. කෘෂ්ණස්‍ය සඛා කෘෂ්ණසඛඃ, ත්‍රයාණං සඛීනාං සමාහාර ත්‍රිසඛං යනුද මෙසේ මැයි. යාදෞ යනු කුමටය? කෘෂ්ණඃ සඛා යස්‍ය ස කෘෂ්ණසඛිඃ යන මෙහි බහුව්‍රීහියෙහි ෂප්‍රත්‍යය නොවන පිණිසයි.

† සර්වශ්ච එකදෙශශ්ච සඞ්ඛ්‍යාතශ්ච සඞ්ඛ්‍යා ච ව්‍යයශ්ච සමාහාරෙ තස්මාත්, න එකො නෛකස්තස්මාත්, න ඓක්‍යං නෛක්‍යං තස්මින්. දිනයාගේ එකෙකභාගයෙහි පවත්නා වූ පූර්වාදිය එකදෙශයයි.

(ස-) එභ්‍යඃ පරස්‍ය, සර්වශබ්ද එකදෙශවාචී ශබ්ද සඞ්ඛ්‍යාත ශබ්ද එකශබ්ද රහිතවූ සඞ්ඛ්‍යශබ්ද ව්‍යශබ්ද යන මොවුන් කෙරෙන් පරවූ ; අහන් ඉත්‍යස්‍ය, අහන් යන මොහුගේ ; ස්ථානෙ, ස්ථානයෙහි; සාදෞ, කර්මධාරයාදියෙහි ; අහ්නඃ ස්‍යාත්, අහ්නාදෙශ වන්නේය. නපෛකාත්, එකශබ්දයා කෙරෙන් අහ්නාදෙශ නොවන්නේය. න චෛක්‍යෙ, සමාහාර ද්විගු සමාසයෙහිද අහ්නාදෙශ නොවන්නේය. [පාණිනිඃ 5. 4. 88.]

(මු-) **355. ප්‍රාග්වත් නො ණෙ‘නො‘හ්නස්‍ය.** (ප්‍රාග්වත් 1. නඃ 6. ණඃ 1. අතඃ 5. අහ්නස්‍ය 6.)

සර්වාහ්ණඃ පූර්වාහ්ණඃ, එකාතතු එකාහඃ. අත ඉති කිං, ත්‍රිශිරහොභිජාතඃ ත්‍ර්‍යහ්නඃ.*

(ස-) ප්‍රාග්වත්, පළමු මෙන් ; අතඃ, අකාරයා කෙරෙන් පරවූ ; අහ්නස්‍ය, අහ්න යන්නහුගේ ; නඃ, දන්ත්‍ය නකාරය හට ; ණඃ, මූර්ධන්‍ය ණකාර වේ. සර්වඤ්ච තත් අහශ්චෙති සර්වාහ්ණඃ, පූර්වඤ්ච තත් අහශ්චෙති පූර්වාහ්ණඃ. එකාතතු, එකශබ්දයා කෙරෙන් වනාහි ; එකාහඃ, අහ්නාදෙශ නොවන හෙයින් එකාහඃ යනු වේ. අත ඉති කිං, අතඃ යනු කුමටද ? ත්‍රිශිරහොභිජාතඃ යන වාක්‍යයෙහි ත්‍ර්‍යහ්නඃ යනු වේ. මෙහි

---

* ප්‍රාග්වත් යන මේආදියෙන් (107) ෂ්රුඃ අවකුප්වනතරෙ‘පි යනුද ප්‍රාප්තයි. එසේද—ෂකාරරෙඵ සෘවර්ණ යුක්තවූ අකාරාන්තයා කෙරෙන් පරවූ අහ්න යන අකාරාන්තවූ දන්ත්‍ය නකාරයහට මූර්ධන්‍ය ණකාර වන්නේය අව කු පු යන මොවුන් මධ්‍යවූ කල්හිද වන්නේය. ප්‍රාහ්ණඃ අපරාහ්ණඃ යනාදියද සර්වාහ්ණඃ යනු මෙනි, ෂප්‍රත්‍යයද අහ්න ආදෙශයද මූර්ධන්‍යාදෙශයද වෙත්, (353, 354, 355). එකඤ්ච තදහශ්චෙති එකාහඃ, ෂප්‍රත්‍යයද නකාරලොපයද අකාරලොපයද වෙත් (353, 337, 258). ත්‍ර්‍යහ්න යනු තද්ධිතාර්ථ ද්විගුසමාසයයි, ප්‍රත්‍යුදහරණය සඳහා මෙහි කියනලදී. අහ්න යන්න අකාරාන්තය යනු කුමටද? දීර්ඝාණි අහානි යස්‍යාං සා දීර්ඝාහ්නී යන මෙහි නොවන පිණිසයි. ශරත්. ප්‍රාග්වත් යනු කුමටද? සඞ්ඛ්‍යාතාහ්නඃ ව්‍යහ්නඃ යන මෙහි නොවන පිණිසයි. පූර්ව සූත්‍රයෙහි නෛක්‍ය යනු කුමටද? වයොරහ්නොඃ සමාහාරඃ ව්‍යහඃ යන තන්හි අහ්න ආදෙශ නොවන පිණිසයි. මොවුන්ගේ ස්ථානයෙහි අභිධාන බැවින් පුංලිඟුයි.

අකාරයා කෙරෙන් පරනුවූ බැවින් මූර්ධන්‍ය නොවන පිණිසයි. [පාණිනිඃ 8. 4. 7.]

(මූ-) **356. කෞටග්‍රාමාත් තක්ෂ්ණඃ.** (කෞටග්‍රාමාත් 5. තක්ෂ්ණඃ 5.) කෞටතක්ෂඃ.*

(ස-) කෞටග්‍රාමාත්, කෞටශබ්ද ග්‍රාමශබ්ද යන මොවුන් කෙරෙන් පරවූ ; තක්ෂ්ණඃ, තක්ෂන් ශබ්දයා කෙරෙන් පරව කර්මධාරය සමාසාදියෙහි ෂප්‍රත්‍යය වන්නේය. කෞටශ්චාසෞ තක්ෂා චෙති කෞටතක්ෂඃ. [පාණිනිඃ 5. 4. 95.]

(මූ-) **357. ජාතමහද්වෘද්ධාදුක්ෂ්ණඃ.** (ජාතමහත්වෘද්ධාත් 5. උක්ෂ්ණඃ 5.)

ජාතොක්ෂඃ මහොක්ෂඃ.†

(ස-) ජාතමහත්වෘද්ධාත්, ජාත ශබ්ද මහත්ශබ්ද වෘද්ධශබ්ද යන මොවුන්කෙරෙන් පරවූ ; උක්ෂ්ණඃ, උක්ෂන් ශබ්දයා කෙරෙන් කර්මධාරයාදියෙහි ෂප්‍රත්‍යය වන්නේය. ජාතශ්චාසෞ උක්ෂා චෙති ජාතොක්ෂඃ, මහාංශ්චාසෞ උක්ෂාචෙති මහොක්ෂඃ. [පාණිනිඃ 5. 4. 77.]

(මූ-) **358. ශුනො'ත්‍යප්‍රාණ්‍යුපමානාත්.** (ශුනඃ 5. අති-අප්‍රාණ්‍යුපමානාත් 5.)

අතෙඃ ප්‍රාණිවර්ජාදුපමානාච්ච ශුනඃ ෂඃ ස්‍යාත් යාදෞ. ආකර්ෂ ඉව ශ්වා ආකර්ෂශ්වඃ.

ප්‍රාණිනස්තු වත්‍යස්‍ර ඉව ශ්වා වත්‍යස්‍රශ්වා.‡

(ස-) අතෙඃ, අතිශබ්දයා කෙරෙන්ද ; ප්‍රාණිවර්ජාත්, ප්‍රාණිරහිතවූ ; උපමානාච්ච, උපමානවාචී ශබ්දයා කෙරෙන්ද

---

* කූටස්‍යං භවඃ කෞටඃ. ග්‍රාමස්‍ය තක්ෂා ග්‍රාමතක්ෂඃ.

† වෘද්ධොක්ෂඃ යනුද මහොක්ෂඃ යනු මෙනි, යාදෞ යනු කුමටය? මහාන් උක්ෂා යස්‍ය සමහොක්ෂා ශිවඃ.

‡ න ප්‍රාණී අප්‍රාණී, අප්‍රාණී චාසෞ උපමානඤ්චෙති අප්‍රාණ්‍යුපමානං. අතිශ්ච අප්‍රාණ්‍යුපමානඤ්චෙති තස්මාත්. ආකර්ෂ්‍යතෙ'නෙනෙති ආකර්ෂඃ. ආකර්ෂ ශබ්දයෙන් ලක්ෂණයෙන් ඇදීම සමානයෙක් කියනු ලැබේ. ඒ හැඟවීම පිණිස ඉවශබ්දය වේ. අතිශබ්දයා කෙරෙන් වනාහි ; ශ්වානමතික්‍රාන්තඃ අතිශ්වඃ යනු වේ. වත්‍යස්‍රශබ්දයෙන් ලක්ෂණයෙන් වත්‍යස්‍ර සමානයා කියනු ලැබෙයි, වත්‍යස්‍රශ්චාසෞ ශ්වාචෙති වත්‍යස්‍රශ්වා. ප්‍රාණිඋපමානයා කෙරෙන් ෂප්‍රත්‍යය නොවේ.

පරවූ ; ශුනඃ, ශ්වන්ශබ්දයා කෙරෙන් ; යාදෞ, කර්මධාරය සමාසාදියෙහි ; ෂඃ ස්‍යාත්, ෂප්‍රත්‍යය වන්නේය. ආකර්ෂ ඉව ශ්වා යන වාක්‍යයෙහි ආකර්ෂශ්වඃ යනු වේ. ප්‍රාණිනස්තු, ප්‍රාණිවත් ශබ්දයා කෙරෙන් වනාහි ; ව්‍යාඝ්‍ර ඉව ශ්වා යන වාක්‍යයෙහි ව්‍යාඝ්‍රශ්වා යනු වේ. [පාණිනිඃ 5. 4. 96, 97.]

(මූ-) **359. පූර්වෝත්තරමෘගාච්චෝපමානතෝඃ සක්ථ්නඃ.** (පූර්ව-උත්තර-මෘගාත් 5. ච 1. අනතෝඃ 5. සක්ථ්නඃ 5.)

එභ්‍යඃ පූර්වෝක්තාච්ච අතිවර්ජිතාත් සක්ථ්නඃ ෂඃ ස්‍යාත් යාදෞ. පූර්වසක්ථං.*

(ස-) එභ්‍යඃ, පූර්ව-උත්තර- මෘග යන මොවුන් කෙරෙන්ද ; අතිවර්ජිතාත්, අතිශබ්දය රහිතවූ ; පූර්වෝක්තාච්ච, පළමු කියන ලද අප්‍රාණී උපමානවාචක ශබ්දයා කෙරෙන්ද පරවූ ; සක්ථ්නඃ, සක්ථි ශබ්දයා කෙරෙන් ; යාදෞ, කර්මධාරය සමාසාදියෙහි ; ෂඃ ස්‍යාත්, ෂප්‍රත්‍යය වන්නේය. පූර්වඤ්ච තත් සක්ථි චෙති පූර්වසක්ථං. [පාණිනිඃ 5. 4. 98.]

(මූ-) **360. දෙශාත් බ්‍රහ්මණඃ කුමහද්භ්‍යාන්තු වා.** (දෙශාත් 5. බ්‍රහ්මණඃ 5. කු-මහද්භ්‍යං 5 .. තු 1. වා 1.)

කුත්සිතෝ බ්‍රහ්මා කුබ්‍රහ්මඃ කුබ්‍රහ්මා.†

(ස-) දෙශාත්, දෙශවාචක ශබ්දයා කෙරෙන් පරවූ ; බ්‍රහ්මණඃ, බ්‍රහ්මන් ශබ්දයා කෙරෙන් කර්මධාරය සමාසාදියෙහි ෂ ප්‍රත්‍යය වන්නේය. කුමහද්භ්‍යාන්තු, කුශබ්ද මහත් ශබ්ද යන මොවුන් කෙරෙන් පරව වනාහි ; වා, විකල්පයෙන් ෂ ප්‍රත්‍යය වන්නේය. කුත්සිතෝ බ්‍රහ්මා යන වාක්‍යයෙහි කුබ්‍රහ්මඃ යනු වේ. පක්ෂයෙහි කුබ්‍රහ්මා යනු වේ. [පාණිනිඃ 5. 4. 104, 105.]

---

* පූර්වශ්ච උත්තරශ්ච මෘගශ්ච තස්මාත්. නාස්ති අතිර්යත්‍ර සෝ'නතිස්තස්මාත්. උත්තරසක්ථං යනුද පූර්වසක්ථං යනු මෙති. මෘගස්‍ය සක්ථි මෘගසක්ථං, ඵලකමිවසක්ථි ඵලකසක්ථං. ප්‍රාණී උපමානයා කෙරෙන් පරව වනාහි ව්‍යාඝ්‍ර සක්ථි යනු වේ. අතිශබ්දයා කෙරෙන් වනාහි සක්ථි අතික්‍රාන්තඃ අතිසක්ථිඃ.

† අවන්තෞ බ්‍රහ්මා අවන්තිබ්‍රහ්මඃ, මහාංශ්චාසෞ බ්‍රහ්මාචෙති මහාබ්‍රහ්මඃ, විකල්පයෙන් මහාබ්‍රහ්මා. මෙහි බ්‍රහ්මන් ශබ්දය බ්‍රාහ්මණවාචී වේ.

(මූ-) 361. **සරෝ'නෝ'යෝ'ශ්මනඃ සංඥාජාත්‍යෝඃ.** (සරස් අනස් අයස් අශ්මනඃ 5. සංඥාජාත්‍යෝඃ 7..)

මහානසං උපානසං ලොහිතායසං පිණ්ඩාශ්මඃ අමෘතාශ්මඃ.*

(ස-) සරෝ'නෝ'යෝ'ශ්මනඃ, සරස්ශබ්ද අනස්ශබ්ද අයස් ශබ්ද අශ්මන්ශබ්ද යන මොවුන් කෙරෙන් ; සංඥාජාත්‍යෝඃ, සංඥායෙහිද ජාතියෙහිද යන මේ දෙක්හි කර්මධාරයාදියෙහි ෂප්‍රත්‍යය වේ. මහච්ච තත් අනශ්චෙති මහානසං, සංඥයි, උපගතං අනඃ උපානසං, ජාතියයි, ලොහිතං අයඃ ලොහිතායසං, සංඥයි, කාලායසං, ජාතියයි, පිණ්ඩ ඉව අශ්මා පිණ්ඩාශ්මඃ, සංඥයි, අමෘතං අශ්මා අමෘතාශ්මඃ, ජාතියයි. [පාණිනිඃ 5. 4. 94.]

(මූ-) 362. **සර්වෛකදෙශසංඛ්‍යාතපුණ්‍යවර්ෂාදීර්ඝාද්‍රාත්‍රෙඃ.** (සර්ව—දීර්ඝාත් 5. රාත්‍රෙඃ 5.)

රාත්‍රෙරෙකෛකදෙශෙ වර්තමානඃ පූර්වාදිරෙකදෙශඃ. පූර්වරාත්‍රඃ අපරරාත්‍රඃ.†

(ස-) සර්වෛකදෙශසංඛ්‍යාතපුණ්‍යවර්ෂාදීර්ඝාත්, සර්වශබ්දය රාත්‍ර්‍යෙකදෙශවාචි ශබ්දය සඞ්ඛ්‍යාතශබ්දය පුණ්‍යශබ්දය වර්ෂා ශබ්දය දීර්ඝශබ්දය යන මොවුන් කෙරෙන් පරවූ ; රාත්‍රෙඃ, රාත්‍රි වාචක ශබ්දයා කෙරෙන් කර්මධාරයාදියෙහි ෂප්‍රත්‍යය වන්නේය. රාත්‍රෙඃ, රාත්‍රියගේ ; එකෛකදෙශෙ, එක එක භාග යෙක්හි ; වර්තමානඃ, පවත්නාවූ ; පූර්වාදිඃ, පූර්වභාගාදිය ; එකදෙශඃ, එකදෙශ නම් වේ. පූර්වා චාසෞ රාත්‍රිශ්චෙති පූර්වරාත්‍රඃ, රාත්‍රියගේ පූර්වභාගය යන අර්ථයි. අභිධාන බැවින් රාත්‍රිඅන්තයන්ට පුංලිඞ්ග වේ. අපරරාත්‍රඃ යනුද මෙසේමැයි. [5. 4. 87.]

---

* සරස් ච අනස් ච අයස් ච අශ්මන් චෙති තස්මාත්, සංඥා ච ජාතිශ්ච සංඥාජාතී තයොඃ. ජලස්‍ය සරඃ ජලසරසං, සංඥයි. මණ්ඩූකසරසං, ජාතියයි. සංඥාජාත්‍යෝඃ යනු කුමටය? දීර්ඝ සරඃ දෘඪානඃ හ්‍රස්වායඃ හග්නාශ්මා යන මෙහි සංඥාජාති රහිත බැවින් ෂප්‍රත්‍යය නොවන බව දැක්වීම පිණිසයි.

† සර්වශ්ච එකදෙශශ්ච සඞ්ඛ්‍යාතශ්ච පුණ්‍යශ්ච වර්ෂාශ්ච දීර්ඝශ්ච තස්මාත්. සර්වා චාසෞ රාත්‍රිශ්චෙති සර්වරාත්‍රඃ. අපරා චාසෞ රාත්‍රිශ්චෙති අපරරාත්‍රඃ, මධ්‍යරාත්‍රඃ යනුද සඞ්ඛ්‍යාතරාත්‍රඃ යනුද පුණ්‍යරාත්‍රඃ යනුද වර්ෂාණං රාත්‍රිඃ වර්ෂාරාත්‍රඃ යනුද දීර්ඝරාත්‍රඃ යනුද මෙසේමැයි.

(මු-) 363. **ගොරතාෂි.** (ගොඃ 5. අතාෂි 7.)

ගොශබ්දාත් ෂඃ ස්‍යාත් යාදෞ, න තු තාෂි. පරමගවඃ.*

(ස-) ගොශබ්දාත්, ගොශබ්දයා කෙරෙන් පරව ; යාදෞ, කර්‍මධාරයාදියෙහි; ෂඃ ස්‍යාත්, ෂප්‍රත්‍යය වන්නේය. තාෂි තු, තප්‍රත්‍යයාගේ අර්ථයෙහි වනාහි ; න, ෂප්‍රත්‍යය නොවන්නේය. පරමශ්චාසෞ ගෞශ්චෙති පරමගවඃ. [පාණිනිඃ 5. 4. 92.]

(මු-) 364. **නාවො'ර්ධාත් ගෙ ච.** (නාවඃ 5. අර්ධාත් 5. ගෙ 7. ච 1.)

අර්ධාත් පරාත් නෞශබ්දාත් ෂඃ ස්‍යාත්, අතාෂි ගෙ ච. අර්ධනාවං.†

(ස-) අර්ධාත් පරාත්, අර්ධශබ්දයා කෙරෙන් පරවූ ; නෞශබ්දාත්, නෞශබ්දයා කෙරෙන් ; ෂඃ ස්‍යාත්, ෂප්‍රත්‍යය වන්නේය. අතාෂි, තප්‍රත්‍යය රහිත අර්ථයෙහිද ; ගෙච, ද්විගුසමාසයෙහිද ෂප්‍රත්‍යය වන්නේය. අර්ධඤ්ච තත් නෞශ්චෙති අර්ධනාවං, අභිධාන බැවින් නපුංසකත්වයයි. [පාණිනිඃ 5. 4. 99. 100.]

(මු) 365. **ඛාර්‍ය්‍යා වා.** (ඛාර්‍ය්‍යාඃ 5. වා 1.)

අර්ධඛාරං අර්ධඛාරී.‡

ඉති ෂඃ.

---

* රාඥො ගෞඃ රාජගවඃ. ත්‍රයාණාං ගවාං සමාහාරඃ ත්‍රිගවං. පඤ්චගාවො ධනමස්‍ය පඤ්චගවධනඃ. අතාෂි යනු කුමටය? පඤ්චභිර්ගොභිඃ ක්‍රීතඃ පඤ්චගුඃ යන තන්හි ෂප්‍රත්‍යය නොවන පිණිසයි.

† මේ සූත්‍රයෙහිද මතු සූත්‍රයෙහිද කර්‍මධාරාදිහුගේ අනුවෘත්තිය ඇති කල්හිද අභිධානවූ අර්ධශබ්දයා කෙරෙන් පරවූ නෞශබ්දයා කෙරෙන් කර්‍මධාරයෙහිම ෂප්‍රත්‍යය වන්නේය, නැවත ගෙ ච යි කියන බැවින් නෞශබ්දයා කෙරෙන් ෂප්‍රත්‍යය වන්නේය අතාෂි ගෙ ච යි අන්‍යාර්ථයෙක් අවබොධ කට යුතු. අර්ධාත් යනු කුමටය? ද්විනෞඃ, යන තන්හි ෂප්‍රත්‍යය නොවන පිණිසයි. ත්‍රිනාවං ද්විනාවධනඃ යනුද මෙසේමැයි. තාර්ථයෙහි වනාහි පඤ්චභිඃ නෞභිඃ ක්‍රීතඃ පඤ්චනෞඃ යන තන්හි ෂප්‍රත්‍යය නොවේ.

‡ තප්‍රත්‍යය රහිතවූ ද්විගුසමාසයෙහිද ෂප්‍රත්‍යය වන්නේය යනු අර්ථයි. අර්ධඤ්ච තත් ඛාරී චෙති අර්ධඛාරං. අභිධාන හෙයින් ක්ලීවත්වය වේ. පක්ෂයෙහි අර්ධඛාරී යනු වේ. ත්‍රිඛාරං ත්‍රිඛාරි, ද්විඛාරධනඃ ද්විඛාරීධනඃ. තප්‍රත්‍යයාර්ථයෙහි වනාහි ද්වාභ්‍යාං ඛාරීභ්‍යාං ක්‍රීතඃ ද්විඛාරිඃ.

(ස) ඛාර්‍ය්‍යාඃ, අර්ධශබ්දයා කෙරෙන් පරවූ ඛාරීශබ්දයා කෙරෙන් කර්මධාරය සමාසයෙහි; වා, විකල්පයෙන් ෂප්‍රත්‍යය වන්නේය. අර්ධඛාරං අර්ධඛාරී යනු වේ. [පාණිනිඃ 5. 4. 101.]

කර්මධාරයසමාසය නිමි.

(මු-) තත්පුරුෂසමාසඃ, (ෂ).

කෘෂ්ණමාශ්‍රිතඃ කෘෂ්ණාශ්‍රිතඃ.

366. ව්‍යං පූර්වං. (ව්‍යං 1. පූර්වං 1.)

පරං ව්‍යං පූර්වං ස්‍යාත් සෙ සති.

රාජානමතික්‍රාන්තා අතිරාජ්, අතිශ්වී, අන්‍යග්නඃ, අතිස්ත්‍රිඃ.*

---

* විතීයාදිවූ විභක්ත්‍යන්ත පද පූර්වකොට ඇත්තවුන්ගේ සමාසය තත්පුරුෂයයි කියනලද්දේය. (318) කෘෂ්ණමාශ්‍රිතඃ යි ක්‍රමයෙන් උදාහරණකෙරෙයි. ක්‍රියාවිශෙෂණවූ විතීයාන්තාදීන්ගේ සමාසයද මෙසේමැයි, ඒ මෙසේයි—නිත්‍යභිරුඃ මන්‍දගාමී, මාසං ව්‍යාප්‍යස්ථිතඃ මාසස්ථිතඃ යන මේ ආදියයි.

ස්‍යාදි විභක්ත්‍යන්තය හා සමග නඤ් යන අව්‍යයශබ්දයාගේ සමාසය නඤ් තත්පුරුෂයයි, ඒද ප්‍රථමාන්ත පද පූර්වකමය. මෙසේයි—න බ්‍රාහ්මණඃ අබ්‍රාහ්මණඃ. නඤ්සමාසයද පර්යුදාසය ප්‍රසජ්‍යප්‍රතිෂෙධයද්‍යයි ද්විවිධ වෙයි. කියනලද්දේය,

ප්‍රධානත්වං විධෙර්යත්‍ර—ප්‍රතිෂෙධෙ'ප්‍රධානතා,
පර්යුදාසඃ ස විඥෙයො—යත්‍රොත්තරපදෙන නඤ්.
අප්‍රාධාන්‍යං විධෙර්යත්‍ර—ප්‍රතිෂෙධෙ ප්‍රධානතා,
ප්‍රසජ්‍ය ප්‍රතිෂෙධො'සෞ—ක්‍රියයා සහ යත්‍ර නඤ්.

අබ්‍රාහ්මණඃ යනාදියෙහි පරපදාර්ථය හා සමාන අර්ථ ඇති බැවින් විධිහුගේ ප්‍රධානත්වය වෙයි, ප්‍රතිෂෙධභාගයෙහි තාත්පර්‍ය්‍යාභාවය බැවින් ප්‍රතිෂෙධයාගේ අප්‍රධානත්වය වෙයි එහෙයින්ම පර්යුදාස නඤ්හුගේ පරපදයා හා සමග අපෙක්ෂා සහිත බැවින් සමාස වේ. කිඤ්චිත් න කුර්වාණඃ යනාදියෙහි විධිභාගයෙහි තාත්පර්‍ය්‍යාභාවයෙන් විධිහුගේ අප්‍රාධාන්‍යය වෙයි ප්‍රතිෂෙධයාගේද ප්‍රධානත්වය වෙයි, එහෙයින්ම ප්‍රසජ්‍ය ප්‍රතිෂෙධ නඤ්හුගේ ක්‍රියාව හා සමග සම්බන්ධවන බැවින් ස්‍යාද්‍යන්තයා හා සමග අපෙක්ෂා සහිත බවක් නැති හෙයින් සමාස නොවේ. මෙසේ දකු—ප්‍රාදීන් හා සමග ස්‍යාද්‍යන්තයාගේ නිත්‍යසමාසය වෙයි. නිත්‍යසමාසයෙහි ස්වපදවිග්‍රහයෙක් නැත්තේය, අන්‍යපදයක් හා සමග අර්ථකථනය වෙයි. කුපුරු

(ස-) කෘෂ්ණම් ආශ්‍රිතඃ යන වාක්‍යයෙහි කෘෂ්ණශ්‍රිතඃ යනු වේ.

සෙ සති, සමාසවන කල්හි ; පරං ව්‍යං, පරවූ අව්‍යයශබ්දය ; පූර්වං ස්‍යාත්, පූර්ව වන්නේය. රාජා නමති ක්‍රාන්තා යන වාක්‍යයෙහි අතිරාජී යනු වේ. ශ්වානමති ක්‍රාන්තා අතිශ්වී, අහරති ක්‍රාන්තඃ අත්‍යහ්නඃ, ස්ත්‍රියමතික්‍රාන්තඃ අතිස්ත්‍රිඃ. [පාණිනිඃ 2. 2. 30.]

(මු-) **367. සඞ්ඛ්‍යාව්‍යයාද්‍රාත්‍ර්‍යඞ්ගුලිභ්‍යාමඃ.** (සඞ්ඛ්‍යා-ව්‍යයාත් 5. රාත්‍රි-අඞ්ගුලිභ්‍යාං 5 .. අඃ 1.)

සඞ්ඛ්‍යායා ව්‍යයාච්ච පරාභ්‍යාං රාත්‍ර්‍යඞ්ගුලිභ්‍යාමඃ ස්‍යාත් යාදෞ, න තු තාපේ. අතිරාත්‍රඃ අත්‍යඞ්ගුලඃ.*

ෂඃ කාජලං ප්‍රගතඃ දුර්ජනඃ සුජනඃ යන මේ ආදිය ශිෂ්ටප්‍රයොගානුසාරයෙන් නිත්‍යසමාසයයි දතයුතුවෙයි.

සමාසාන්තප්‍රත්‍යයන්ගේම නිමිත්තවූ යාදීහුගේ මෙහි පූර්ව නිපාතයෙහි අනුවෘත්තියෙක් නැත්තේය එහෙයින් සමාස මාත්‍රයෙහි මොහුගේ විධානය බැවින් උපකෘෂ්ණම් යන අව්‍යයී භාවයෙහිද පූර්වනිපාතය වෙයි. අතිරාජී යී (353) ෂප්‍රත්‍යය කළ කල්හි (337, 258) නකාර අකාර ලොපය කළ කල්හි (257) ෂකාර ඉත්සංඥ බැවින් ඊප්‍රත්‍යය වන්නේය. අතිශ්වී යන්නෙහිද (358) ෂප්‍රත්‍යයයි. සෙස්ස පළමු මෙනි. අත්‍යහ්නඃ යන්නෙහි (353) ෂ වේ, (354) අහ්නාදෙශ වේ. අතිස්ත්‍රිඃ යන්න පූර්වපදාර්ථ ප්‍රාධාන්‍යයෙන් (330) හ්‍රස්වයි. අතිමායඃ අතිවාමොරූඃ යනුද මෙසේමැයි. රාජානමති ක්‍රාන්තා අතිරාජී යනු උදාහරණ කරන්නහු විසින් අති ආදීන් හා සමග ද්විතීයාන්තයාගේ සමාසයයි ප්‍රකාශකරණලද්දේය. එහෙයින් වෙලාමුද්ගතඃ උද්වෙලඃ, ජ්‍යාමධිරූඪං අධිජ්‍යං, මුඛමභිගතඃ අභිමුඛඃ, යනාදිය අවබොධ කටයුතු. මෙහි ප්‍රයොගානුසාරයෙන් අව්‍යයභින්නයාගේද පූර්වනිපාතය වක්තව්‍ය වෙයි, මෙසේයි— වනස්‍යාග්‍රෙ අග්‍රෙවනං. රාත්‍රීණං ගණඃ ගණරාත්‍රං, අන්තරං ගෘහං ගෘහාන්තරං, යනාදියයි. මෙහි අනන්තර ශබ්දය අන්‍යාර්ථයි.

* සඞ්ඛ්‍යා ච ව්‍යශ්ච සඞ්ඛ්‍යාව්‍යං තස්මාත්, එකවචනය යථා සංඛ්‍යං යනු වැළැක්වීම පිණිසයි. මෙහි මණ්ඩූකප්ලුතාධිකාරය බැවින් යාදීන්ගේ අනුවෘත්තිය වේ. අතිරාත්‍රඃ යනාදී දෙතන්හි මෙයින් අප්‍රත්‍යය කළ කල්හි (258) ඉකාර ලොපයයි. ත්‍රයාණං රාත්‍රීණං සමාහාරඃ ත්‍රිරාත්‍රං, ද්වයොරඞ්ගුල්‍යොඃ සමාහාරඃ ද්‍ව්‍යඞ්ගුලං යනුද මෙසේමැයි. තාපේ යනු කුමටය? මෙ

(ස-) සඞ්ඛ්‍යායාඃ, සඞ්ඛ්‍යාවාචී ශබ්දයා කෙරෙන්ද ; ව්‍යයච, අව්‍යයශබ්දයා කෙරෙන්ද ; පරාභ්‍යං, පරවූ ; රාත්‍ර්‍යඞ්ගුලිභ්‍යං, රාත්‍රිශබ්ද අඞ්ගුලිශබ්ද දෙදෙනා කෙරෙන් ; යාදෞ, කර්මධාර යාදියෙහි ; අඃ ස්‍යාත්, අප්‍රත්‍යය වන්නේය ; තාපේ තු, තද්ධිතා පීයෙහි වනාහි ; න, අප්‍රත්‍යය නොවන්නේය. රාත්‍රිමතික්‍රා න්තා'ති රාත්‍රඃ, අඞ්ගුලිමතික්‍රාන්තා'ත්‍යඞ්ගුලඃ. [පාණිනිඃ 5. 4. 86.]

(මු-) හරිණා ත්‍රාතො හරිත්‍රාතඃ. විෂ්ණවෙ දත්තං විෂ්ණු දත්තං. අච්‍යුතාත් ජාතං අච්‍යුතජාතං. කෘෂ්ණස්‍ය සභා කෘෂ්ණ සභඃ, මහාඝාසඃ, ග්‍රාමතක්‍ෂඃ, මෘගසක්ථං, ජලසරසං, මණ්ඩූක සරසං. රාජගවඃ, වර්ෂාරාත්‍රඃ.*

(ස-) හරිත්‍රාතඃ යනු තෘතීයා තත්පුරුෂයයි. විෂ්ණුදත්තං යනු චතුර්ථී තත්පුරුෂයයි. අච්‍යුතජාතං යනු පඤ්චමීතත්පුරු ෂයයි. කෘෂ්ණසභඃ යනාදීහු ෂෂ්ඨීතත්පුරුෂයෝයි. මහතො දෙශස්‍ය මහත්‍යා භූම්‍යා වා ඝාසඃ මහාඝාසඃ. (326) මහත්ශබ් දයාගේ තකාරයහට හෝ තීකාරයහට ආකාරයයි. ග්‍රාමස්‍ය තක්‍ෂා ග්‍රාමතක්‍ෂඃ, (356) ෂප්‍රත්‍යයයි. මෘගස්‍ය සක්ථි මෘග සක්ථං (359). ජලස්‍ය සරඃ ජලසරසං, මණ්ඩූකස්‍ය සරඃ මණ්ඩූකසරසං (361). රාඥෞ ගෞඃ රාජගවඃ (363). වර්ෂාණං රාත්‍රිඃ වර්ෂාරාත්‍රඃ (362). මාසස්‍ය ජාතඃ මාසජාතඃ යනාදියද මෙසේමැයි.

අඞ්ගුලී පරිමාණමස්‍ය වඞ්ගුලි යන මෙහි අප්‍රත්‍යය නොවන බව දක්වීම පිණිසයි. ව්‍යඞ්ගුලං ක්‍ෂෙත්‍රං, ව්‍යඞ්ගුලා භූමිඃ යනාදියෙහි යවෝදරපරිමාණවූ අඞ්ගුලශබ්දය හා සමාස කල කල්හි සිඬයි.

* ඛඞ්ගච්ඡින්නඃ රථව්‍රජ්‍යා මාසපූර්වඃ මාසොනඃ වර්ෂාවරඃ ගුඩමිශ්‍රඃ යනාදියද හරිත්‍රාතඃ යනු මෙනි. දධ්නා මිශ්‍රිත ඔද නඃ දධ්‍යොදනඃ, ගුඩෙන මිශ්‍රිතා ධානාඃ ගුඩධානාඃ, හස්තිනා යුක්තො රථඃ හස්තිරථඃ අශ්වරථඃ යනුද මෙසේමැයි, මේ ආදියෙහි ශාකපාර්ථිවාදි බැවින් මධ්‍යපද ලොපය වේ. ගො භ්‍යා හිතඃ ගොහිතඃ, යූපාය දාරු යූපදාරු, අශ්වාය ඝාසඃ අශ්ව ඝාසඃ යනාදියද විෂ්ණුදත්තං යන්න මෙනි. වෘකභීතඃ, ධර්ම භීතඃ, අශ්වපතිතඃ, අර්ජුනපරාජිතඃ, සපීරක්ෂිතඃ, සටභින්නඃ යනාදියද අච්‍යුතජාතං යනු මෙනි.

(මු-) 368. **මුඛ්‍යාශ්වොරසඃ.** (මුඛ්‍යාර් උරසඃ 5.)

මුඛ්‍යාර්ථාදුරස්ශබ්දාදඃ ස්‍යාත් ස්‍යාදෞ.

අශ්වොරසං, මුඛ්‍යො'ශ්ව ඉත්‍යර්ථඃ. පුරුෂෙෂු උත්තමඃ පුරුෂොත්තමඃ, අවන්තිෂු බ්‍රහ්මා අවන්තිබ්‍රහ්මඃ.*

ඉති ෂඃ.

(ස-) මුඛ්‍යාර්ථාත්, මුඛ්‍යාර්ථවූ ; උරස්ශබ්දාත්, උරස්ශබ්දයා කෙරෙන් ; ස්‍යාදෞ, ස්‍යාදියෙහි ; අඃ ස්‍යාත්, අප්‍රත්‍යය වන්නේය. අශ්වස්‍ය උරඃ අශ්වොරසං, මෙයින් අප්‍රත්‍යයයි. මුඛ්‍යඃ අශ්වඃ ඉති, ප්‍රධාන අශ්වය යන ; අර්ථඃ, අර්ථයි. පුරුෂොත්තමඃ යනු සප්තමීතත්පුරුෂයයි. අවන්තිබ්‍රහ්මඃ යන මෙහි (360) ෂප්‍රත්‍යයයි. [පාණිනිඃ 5. 4. 93.]

තත්පුරුෂ සමාසය නිමි.

(මු-) ද්විගුසමාසඃ, (ග).

තස්‍යාවේ—විෂයෙ, වාවෙ‍්‍යා අපත්‍යාර්ථෂ්ණිකාදිකං,

ප්‍රොජ්ඣ්‍යජාදෞ, සමාහාරෙ, ගස්ත්‍රිධොත්තරදෙපරෙ.

පඤ්චභිර්ගොභිඃ ක්‍රීතඃ පඤ්චගුඃ.†

---

* මුඛ්‍යො'ර්ථො යස්‍ය තත් මුඛ්‍යාර්ථං, මුඛ්‍යාර්ථඤ්චතත් උරශ්චෙති තස්මාත්. අශ්වස්‍ය උරඃ ප්‍රධානං අශ්වොරසං. උරස්ශබ්දය හෘදයවාචකයි, මෙහි ව්‍යාඞ්ග ලක්ෂණයෙන් ප්‍රධානාර්ථයයි. මුඛ්‍යාර්ථාත් යනු කුමටය ? ව්‍යාඝස්‍ය උරඃ ව්‍යාඝොරඃ යන තන්හි අප්‍රත්‍යය නොවන පිණිසයි. ව්‍යාඝයාගේ වක්ෂය යන අර්ථයි.

විලෙශයඃ යනාදීන් කෙරෙන් විභක්තිහට ලොප්නොකිරීමද වනෙචරඃ යනාදීන් කෙරෙන් විකල්පයෙන් ලොපයද මෙහි වක්තව්‍යයි. මෙසේයි—විලෙශයඃ බලෙශයඃ, උරසිලොමා, කණ්ඨෙකාලඃ, වනෙචරඃ වනචරඃ, ඛෙචරඃ ඛචරඃ, ත්වචිසාරඃ ත්වක්සාරඃ, සරසිජං සරොජම් යන මේ ආදියයි.

† ෂ්ණිකාදිකං යනු ෂ්ණිඃ එව ෂ්ණිකඃ යනු වේ. ෂකෞ-නු කුලත්වයෙන් ස්වාර්ථයෙහි කප්‍රත්‍යය වන්නේය, ෂ්ණි මුල්කොට ඇත්තේ යන අර්ථයි. යම්තැනෙක්හි තද්ධිතාර්ථවිෂයෙහි සමාස කරණුලැබේද එහි තද්ධිතප්‍රත්‍යයාගේ උත්පත්තිය කෙරෙන් පූර්වඅවස්ථාවෙහි සමාස කල කල්හි ඔහු කෙරෙන් ප්‍රත්‍යයාගේ උත්පත්තිය වූ කල්හි ව්‍යාඝි ආදිය වේ; මෙසේයි, ෂයොර්මාත්‍රොඃ අපත්‍යං යන මෙහි ලැබිය යුතුවූ ෂ්ණප්‍රත්‍යයාගේ උත්පත්තිය

(ස-) ගඃ, ද්විගුසමාසයතෙම ; තස්‍යාපි, තද්ධිතයාගේ අර්ථයෙහිද ; සමාහාරෙ, ත්‍රිභුවනං යනාදි සමාහාරයෙහිද ; උත්තරපදෙපරෙ, උත්තරපදයා පර කල්හි පඤ්චගවධනඃ සීද වන්නේ; ත්‍රිධා, තුන්පරිච්ඡෙදකින් වෙයි.

(තද්ධිතාර්ථයෙහිද දෙපරිච්ඡෙදකින් වෙයි, මෙසේයි) තස්‍යාපි, තද්ධිතප්‍රත්‍යයමාත්‍රයාගේ අර්ථයවූ ; විෂයෙ, විෂයෙහි ද්වෛමාතුරඃ සීද; (එකෙක් වෙයි) අපත්‍යාර්ථේෂ්ණිකාදිකං, අපත්‍යාර්ථේෂ්ණිකප්‍රත්‍යයාදිය ; ප්‍රාජ්ඣ්‍ය, හැර; අජාදෙඃ, ස්වරාදිතද්ධිතයාගේ අර්ථය ; වාච්‍යෙ, කියයුතු කල්හි පඤ්චගුඃ ; (අනිකයි) කියාද වෙයි. [පාණිනිඃ 2. 1. 51.]

(මු-) 369. **ද්වෛග්‍යාදතො'පාත්‍රාදෙරීප්.** (ද්වෛග්‍යාත් 5. අතඃ 5. අපාත්‍රාදෙඃ 5. ඊප් 1.)

ද්වෛග්‍යදකාරාන්තාදීප් ස්‍යාත් න තු පාත්‍රාදෙඃ. ත්‍රයාණං ලොකානාං සමාහාරඃ ත්‍රිලොකී. පාත්‍රාදෙස්තු ද්විපාත්‍රං ත්‍රිපාත්‍රං ත්‍රිභුවනං චතුර්යුගං.*

කෙරෙන් පූර්වඅවස්ථාවෙහි ද්වයොඃ මාත්‍රොඃ යන මොවුන් දෙදෙනාගේ එකපදත්වය වූ කල්හි ද්විමාතෘ යන පදයා කෙරෙන් (415) ෂ්ණප්‍රත්‍යයද, (416) ඊ යන මෝහට වෘද්ධිද, (425) ඌර් යනුද කළ කල්හි ද්වෛමාතුරඃ යන පදය වේ. පඤ්චානාං නාපිතානාං අපත්‍යං පාඤ්චනාපිතිඃ යනාදියද මෙසේමැයි. වාච්‍ය කල්හි මෙසේයි—පඤ්චභිර්ගොභිඃ ක්‍රීතඃ පඤ්චගුඃ යනමෙහි කර්මය වාච්‍ය කල්හි කරණකාරකයා කෙරෙන් (429) ඨඤෙකාත් යනාදියෙන් ලැබියයුතු වන ප්‍රත්‍යයාගේ අර්ථය වාච්‍ය කල්හි, සමාසයා විසින්ම තද්ධිතයාගේ උක්තාර්ථත්වය ඇති කල්හි, උක්තාර්ථානාමප්‍රයොගඃ යනු න්‍යාය බැවින් තද්ධිතප්‍රත්‍යයාගේ උත්පත්තිය නැති කල්හි (330) ගවාබාදෙඃ යනාදියෙන් හ්‍රස්ව වෙයි. අජාදෙඃ යනු කුමටය ? ද්වයොර් මූර්ධ්නොර්භවඃ ද්විමූර්ධනඃ යනාදියෙහි තද්ධිතප්‍රත්‍යයා කෙරෙන් පූර්වයෙහි සමාසකළ කල්හි, ද්විමූර්ධන්ශබ්දයා කෙරෙන් (433) ෂණ්ප්‍රත්‍යයයි, මෙහි විෂයෙහිම ද්විගු වේ, වාච්‍යයෙහි නොවේ. සමාහාරයෙහි මෙසේයි—ත්‍රිභුවනං. උත්තරපදයා පර කල්හි මෙසේයි—පඤ්චගවධනඃ.

* ගස්‍ය ඓක්‍යං ද්වෛග්‍යං (සමාහාරද්විගුඃ) තස්මාත්. පාත්‍රමාදිර් යස්‍ය ස පාත්‍රාදිඃ, න පාත්‍රාදිරපාත්‍රාදිඃ තස්මාත්. සමාහාරද්විගුසමාසයන්ගේ (322) ක්ලීවත්වය ඇති කල්හිද, ඊප් ප්‍රත්‍යයාගේ විධානය හෙතුකොටගෙන නිත්‍යස්ත්‍රීත්වය ප්‍රකාශ

(ස-) අකාරාන්තාත්, අකාරාන්තවූ ; ද්වෛගකෘත්, සමාහාර ද්විගුසමාසයා කෙරෙන් ; ඊප් ස්‍යාත්, ඊප්ප්‍රත්‍යය වන්නේය ; පාත්‍රාදෙස්තු, පාත්‍රාදි ශබ්දයා කෙරෙන් වනාහි ; න, ඊප් ප්‍රත්‍යය නොවන්නේය. ත්‍රිලොකශබ්දයා කෙරෙන් ඊප්ප්‍රත්‍ය යයි. පාත්‍රාදෙස්තු, පාත්‍රාදිශබ්දයා කෙරෙන් වනාහි; ද්වයොඃ පාත්‍රයොඃ සමාහාරඃ ද්විපාත්‍රං. ත්‍රිපාත්‍රං යනාදියද මෙසේමැයි. [පාණිනිඃ 4. 1. 21.]

(මු-) **370. වානාපඃ.** (වා 1. අන්-ආපඃ 5.)

අනන්තාදාපශ්ච ඊප් ස්‍යාද්වා.

පඤ්චකර්මී පඤ්චකර්‍ම්මං ත්‍රිඛට්වී ත්‍රිඛට්වං.*

(ස-) අනන්තාත්, අන් අන්තයා කෙරෙන්ද ; ආපශ්ච, ආප් අන්තවූද සමාහාර ද්විගුසමාසයා කෙරෙන්; වා, විකල්පයෙන්; ඊප් ස්‍යාත්, ඊප්ප්‍රත්‍යය වන්නේය.

පඤ්චානාං කර්‍ම්මණාං සමාහාරඃ පඤ්චකර්මී, පක්‍ෂයෙක්හි පඤ්චකර්‍ම්මං. ත්‍රිඛට්වී ත්‍රිඛට්වං යනුද මෙසේමැයි.

(මු-) **371. තාපේමානාත්කාණ්ඩාත් ත්වක්‍ෂෙත්‍රෙ.** (තාපෙ 7. මානාත් 5. කාණ්ඩාත් 5. තු 1. අක්‍ෂෙත්‍රෙ 7.)

ත්‍රිහස්තී, ත්‍රිකාණ්ඩී රජ්ජුඃ. ක්‍ෂෙත්‍රෙ තු ත්‍රිකාණ්ඩා භූමිඃ.

(ස-) තාපෙ, තද්ධිතාපී ද්විගුසමාසයෙහි ; මානාත්, පරිමාණ වාචක ශබ්දයා කෙරෙන් ඊප්ප්‍රත්‍යය වන්නේය. කාණ්ඩාත් තු, කාණ්ඩශබ්දයා කෙරෙන් වනාහි ; අක්‍ෂෙත්‍රෙ, ක්‍ෂෙත්‍ර රූහි

කරණ ලද්දේය. ආදිශබ්දයෙන් ත්‍රිගුණං චතුර්ගුණං චතුඃශතං චතුෂ්පථං චතුර්මුඛං පඤ්චගවං පඤ්චනාවං ද්විඛාරං යනාදියද ප්‍රයොග වශයෙන් දතයුතු, අතඃ ගනු කුමටය? ත්‍රයාණාං ජගතාං සමාහාරඃ ත්‍රිජගත් යනාදියෙහි හලන්තයා කෙරෙන් ඊප්ප්‍රත්‍යය නොවන හෙයිනි.

* මෙහි වාශබ්දය සමුච්චයාර්ථයි. සමුච්චය කරණකොට ගෙන (367) සඛ්‍යාවෘත් යනාදි සූත්‍රයෙන් මණ්ඩූකගතියෙන් අනුවෘත්තනය කොට අප්‍රත්‍යයද වන්නේය යන අර්ථයි. සමුච්චයාකෘෂ්ටං නොත්තරත්‍ර යන න්‍යාය හෙයින් පරසූත්‍රයෙහි අප්‍රත්‍යය අනුවෘත්තනය නොවේ. පඤ්චකර්මී යන්නෙහි මේ සූත්‍රයෙන් ඊප් කළකල්හි (337) න ලොපයද (258) අකාර ලොපයද වී පඤ්චකර්මී යනු වේ. පක්‍ෂයෙක්හි මෙයින්ම සමුච්චයෙන් ලද අප්‍රත්‍යයයි, (322) ක්ලීවත්වයයි. ත්‍රිතක්‍ෂී ත්‍රිතක්‍ෂං යනාදියද මෙසේමැයි.

තාර්ථයෙහි ඞීප්ප්‍රත්‍යය වන්නේය. ත්‍රයඃ ආඪකාඃ පරිමාණමස්‍යඃ ත්‍ර්‍යාඪකී, ධාන්‍යරාශියයි, ද්වෞ ද්‍රෝණෞ පරිමාණමස්‍යඃ ද්විද්‍රෝණී යනාදියද මෙසේයි. ත්‍රයඃ කාණ්ඩාඃ (නලාඃ) පරිමාණමස්‍යඃ ත්‍රිකාණ්ඩී, රජ්ජුඃ, රැනයි. ක්ෂෙත්‍රෙ තු, ක්ෂෙත්‍රයෙහි වනාහි ; ත්‍රිකාණ්ඩා, ත්‍රිකාණ්ඩා යනු වේ. භූමිඃ, ක්ෂෙත්‍රෛකදෙශභූමියයි. [පාණිනිඃ 4. 1. 22, 23.]

(මූ-) **372**. **පුරුෂාද්වා.** (පුරුෂාත් 5. වා 1.)

ද්විපුරුෂී ද්විපුරුෂා. ත්‍රිසඛං ත්‍රිගවං ත්‍රිනාවං, ත්‍රිඛාරං ත්‍රිඛාරි, ත්‍ර්‍යහඃ.

(ස-) පුරුෂාත්, පරිමාණවාචක පුරුෂශබ්දයා කෙරෙන් තද්ධිතාර්ථී ද්විගුසමාසයෙහි ; වා, විකල්පයෙන් ඞීප්ප්‍රත්‍යය වන්නේය. ද්වෞ පුරුෂෞ පරිමාණමස්‍යඃ ද්විපුරුෂී, පක්ෂයෙහි ද්විපුරුෂා යනු වේ, භිත්තියයි. ත්‍රයාණං සඛීනාං සමාහාරඃ ත්‍රිසඛං (353). ත්‍රයාණං ගවාං සමාහාරඃ ත්‍රිගවං (363). ත්‍රිසෘණං නාවාං සමාහාරඃ ත්‍රිනාවං (364). ත්‍රිසෘණං ඛාරීණං සමාහාරඃ ත්‍රිඛාරං (365), පක්ෂයෙක්හි ත්‍රිඛාරි (167). ත්‍රයාණමහ්නාං සමාහාරඃ ත්‍ර්‍යහඃ (353). අභිධාන බැවින් පුංලිඟුයි. (354) සඞ්ඛ්‍යෛකදෙශ යනාදියෙහි සමාහාරය වර්ජිත බැවින් අහ්නාදෙශ නොවන්නේය. [පාණිනිඃ 4. 1. 24.]

(මූ-) **373**. **ද්විත්‍රෙර්වාඤ්ජලෙරඃ.** (ද්විත්‍රෙඃ 5. වා 1. අඤ්ජලෙඃ 5. අඃ 1.)

ද්ව්‍යඤ්ජලං ද්ව්‍යඤ්ජලි, ද්ව්‍යඞ්ගුලං, ත්‍රිරාත්‍රං.*

(ස-) ද්විත්‍රෙඃ, ද්විශබ්දය ත්‍රිශබ්දය යන මේ දෙදෙනා කෙරෙන් පරවූ ; අඤ්ජලෙඃ, අඤ්ජලිශබ්දයා කෙරෙන් තද්ධිතාර්ථී ද්විගුසමාසයෙහි ; වා, විකල්පයෙන් ; අඃ, අප්‍රත්‍යය වන්නේය.

---

* ත්‍ර්‍යඤ්ජලං ත්‍ර්‍යඤ්ජලි යනුද ද්ව්‍යඤ්ජලං යනාදිය මෙනි. ත්‍රිලොචන වනාහි තද්ධිතාර්ථ රහිතවූ ද්විගුසමාසයෙහි ද්වි ත්‍රි ශබ්ද දෙදෙනා කෙරෙන් පරවූ අඤ්ජලිශබ්දයා කෙරෙන් අප්‍රත්‍යය කෙරෙයි. ඔහුගේ මතයෙහි ද්වයොරඤ්ජල්‍යොඃ සමාහාරඃ ද්ව්‍යඤ්ජලං ද්ව්‍යඤ්ජලි කියා වේ, එසේම ද්වාවඤ්ජලීප්‍රියෞ යස්‍ය ස ද්ව්‍යඤ්ජලප්‍රියඃ ද්ව්‍යඤ්ජලිප්‍රියඃ යි සමාහාර උත්තරපද පරයන්ගේ උදහරණයි. තද්ධිතාර්ථයෙහි වනාහි ද්වාභ්‍යාමඤ්ජලිභ්‍යාං ක්‍රීතඃ ද්ව්‍යඤ්ජලිඃ කියා වේ.

ද්වාවඤ්ජලීපරිමාණමස්‍ය ද්ව්‍යඤ්ජලං, ජලයයි. පක්ෂයෙක්හි අප්‍රත්‍යය නුවූ කල්හි ජලයට විශෙෂණ බැවින් ක්ලීවත්වයයි. ද්වයොරඞ්ගුල්‍යොඃ සමාහාරඃ ද්ව්‍යඞ්ගුලං, තිසෘණාං රාත්‍රීණාං සමාහාරඃ ත්‍රිරාත්‍රං, දෙතැන්හි (367) සඞ්ඛ්‍යාවත්වාත් යනාදියෙන් අප්‍රත්‍යයයි. [පාණිනීඃ 5. 4. 102.]

(මූ-) පඤ්චගාවො ධනං යස්‍යාසෞ පඤ්චගවධනඃ ද්විනාවධනඃ ද්විභාරධනඃ ද්ව්‍යහ්නප්‍රියඃ.

ඉති ගඃ.

(ස-) පඤ්චගවධනඃ යනු උත්තරපදයා පර කල්හි උදාහරණයි, මෙහි උත්තරපදයෙහි වූ ධනශබ්දයා පරකල්හි ද්විගු සමාසයෙහි, (363) අප්‍රත්‍යයයි. ද්වෙ නාවෞ ධනමස්‍ය ද්විනාවධනඃ (364) අප්‍රත්‍යයයි. ද්වෙ භාර්යෞ ධනමස්‍ය ද්විභාරධනඃ ද්විභාරීධනඃ (365) විකල්පයෙන් අප්‍රත්‍යයයි. ද්වෙ අහනී ප්‍රියෙ යස්‍යාසෞ ද්ව්‍යහ්නප්‍රියඃ, (353, 354) අප්‍රත්‍යයද අහ්නආදෙශයද වෙත්.

ද්විගු සමාසය නිමි.

(මූ-) අව්‍යයීභාවසමාසඃ, (ව).

වඃ කසාමීප්‍යසාදෘශ්‍යසාකල්‍යානුක්‍රමර්ද්ධිෂු,
වීප්සා පර්‍ය්‍යන්ත යොග්‍යත්ව පශ්චාදර්ථානතික්‍රමෙ,
ශබ්දප්‍රාදුර්භාවාභාව යෞගපද්‍යෙෂ්වනෙකධා.

(ස-) වඃ, අව්‍යයීභාවයතෙම ; ක, කාරකය ; සාමීප්‍ය, සමීපභාවය ; සාදෘශ්‍ය, සමානත්වය ; සාකල්‍ය, නිඃශෙෂත්වය ; අනුක්‍රම, අනුක්‍රමය ; ඍද්ධිෂු, සමෘද්ධිය යන මොවුන් කෙරෙහිද ; වීප්සා, එකවිට සම්බන්ධකිරීමට කැමතිවීමද ; පර්‍ය්‍යන්ත, කෙළවරය ; යොග්‍යත්ව, යොග්‍යභාවය ; පශ්චාදර්ථ, පශ්චාත්අර්ථය ; අනතික්‍රමෙ, අනතික්‍රමය යන මෙහිද ; ශබ්දප්‍රාදුර්භාව, ශබ්දයන්ගේ උත්පත්තිය ; අභාව, අභාවය ; යෞගපද්‍ය, එක කාලත්වය යන ; එෂු, මේ තුදුස් අර්ථයන් කෙරෙහිද ; අනෙකධා, ප්‍රයොගානුසාරයෙන් අනෙකප්‍රකාරයෙන්ද වෙයි. හෙද ස්‍යාද්‍යන්තයන් හා සමග අව්‍යයශබ්දයන්ගේ නිත්‍යසමාසය වෙයි.

(මූ-) **374. වාත් කෙතෙර්මා'තො'පතඃ.** (වාත් 5. කෙතඃ 6. මඃ 1. අතඃ 5. අපතඃ 6.)

අකාරාන්තාත් වාත් පරස්‍යඃ කෙතර්මඃ ස්‍යාත් න තු පඤ්චම්‍යාඃ.*

(ස-) අකාරාන්තාත්, අකාරාන්තවූ ; වාත්, අව්‍යයීභාවසමාසයා කෙරෙන්; පරස්‍යඃ, පරවූ; කෙතඃ, විභක්තිහට; මඃ ස්‍යාත්, මකාරය වන්නේය; පඤ්චම්‍යාස්තු, පඤ්චමී විභක්තිහට වනාහි ; න, මකාර නොවන්නේය.

(මූ-) කෘෂ්ණමධිකෘත්‍ය ප්‍රවෘත්තා කථා, අධිකෘෂ්ණං. අපඤ්චම්‍යාඃ කිං, කෘෂ්ණස්‍ය සමීපාත් ගතඃ, උපකෘෂ්ණාත් ගතඃ.†

(ස-) අධිකෘෂ්ණං යනු කාරකයහට උදාහරණයි. අපඤ්චම්‍යාඃ කිං, අපඤ්චම්‍යාඃ යනු කුමටය? උපකෘෂ්ණාත් යන පඤ්චමිහුගේ ස්ථානයෙහි මකාරය නොවන බව දැක්වීම පිණිසයි. කෘෂ්ණස්‍ය සමීපං උපකෘෂ්ණං යි සමීපාර්ථයයි. උපකෘෂ්ණාත්, කෘෂ්ණ සමීපයෙන්; ගතඃ, ගියේය. [පාණිනිඃ 2. 4. 83.]

(මූ-) **375. තෘප්තම්‍යොර්වා.** (තෘප්තම්‍යොඃ 6 .. වා 1.)

උපකෘෂ්ණං උපකෘෂ්ණේන කාර්‍ය්‍යං.

උපකෘෂ්ණං උපකෘෂ්ණේ ස්ථිතඃ.‡

(ස-) තෘ ප්තම්‍යොඃ, අකාරාන්ත අව්‍යයීභාවසමාසයා කෙරෙන් පරවූ තෘතීයා සප්තමී දෙදෙනාහට ; වා, විකල්පයෙන් මකා

---

* අකාරාන්ත ශබ්දයහට අව්‍යයීභාවසමාස කළ කල්හි (319) කෙතර්ලුක්තෙව්‍යව යන්නෙන් විභක්තිහට ලොප්ද, නැවත ලිඞ්ගසංඥද කළ කල්හි, උපදිනුලබන්නාවූ විභක්තීන්ගේ ස්ථානයෙහි මකාරය වන්නේය.

† කෘෂ්ණමධිකෘත්‍ය යී, කයනු යම්හෙයකින් සාධාරණයෙන් කියනලද්දේද එතකුදු වුවත් ද්විතීයා සප්තමී දෙදෙනාගේ අර්ථ සම දතයුතු වෙයි. මෙහි කෘෂ්ණම් යී කර්මාර්ථයෙහි අධිශබ්දය කරණකොටගෙන (366) ව්‍යං පූර්වං යී අධිශබ්දයාගේ පූර්වනිපාතය වේ, (319) කෘෂ්ණම් යන ද්විතීයාවහට ලොප්කළ කල්හි අධිකෘෂ්ණ යන මෝහට නැවත ලිඞ්ගසංඥ කළ කල්හි හට ගත්තාවූ සිහුගේ ස්ථානයෙහි මෙයින් ම් වෙයි, සියලු තන්හි මෙසේමැයි. සප්තම්‍යර්ථයෙහි වනාහි ස්ත්‍රීෂ්වධිකෘත්‍යප්‍රවෘත්තා (ස්ත්‍රීය කෙරෙහි පැවති) යා කථා සා අධිස්ත්‍රි යනාදිය වේ. උපකෘෂ්ණාත් යී අපඤ්චම්‍යාඃ යන මොහුගේ උදාහරණ කිරීමෙන්ම සමීපත්වයෙහි උදාහරණය දක්වනලදී. කුම්භස්‍ය සමීපං උපකුම්භං යනාදියද මෙසේමැයි. මෙහි උපශබ්දයාගේ අර්ථය සමීපත්වය වේ.

‡ උපගඞ්ගං උපගඞ්ගේන (322, 167) යනාදියද මෙසේමැයි.

රය වන්නේය. උපකෘෂ්ණං උපකෘෂ්ණෙන, කෘෂ්ණහුගේ සමීපයෙන්; කාය්‍යීං, සම්පත්තිය කටයුතු. සප්තමියෙහි වනාහි කෘෂ්ණස්‍ය සමීපෙ ස්ථිතඃ. උපකෘෂ්ණං, විකල්පයෙන් උපකෘෂ්ණෙ යනු වේ. ස්ථිතඃ, සත්පුරුෂතෙම සිටියේය. [පාණිනිඃ 2. 4. 84.]

(මූ-) **376. ලුක් පරත්.** (ලුක් 1. පරත් 5.)

අකාරාන්තාදන්‍යස්මාත් වාත් පරස්‍යඃ කෙතර්ලුක් ස්‍යාත්.

(ස-) අකාරාන්තාත්, අකාරාන්තයා කෙරෙන් ; අන්‍යස්මාත්, අන්‍යවූ ඉවි අන්තවූද හලන්තවූද ; වාත්, අව්‍යයීභාව සමාසයා කෙරෙන් ; පරස්‍යඃ, පරවූ ; කෙතඃ, සියලු විභක්තිහට ; ලුක් ස්‍යාත්, නිත්‍යයෙන් ලොප් වන්නේය. [පාණිනිඃ 2. 4. 82.]

(මූ-) **377. සහඃ සො‘කාලෙ.** (සහඃ 6. සඃ 1. අකාලෙ 7.)

සහස්‍ය සඃ ස්‍යාත් න තු කාලෙ.

හරෙඃ සදෘශං සහරි. කාලෙ තු, සහ පූර්වාහ්ණං.

(ස-) සහස්‍ය, අව්‍යයීභාව සමාසයාගේ පූර්වයෙහි පවත්නාවූ සහශබ්දයහට ; සඃ ස්‍යාත්, සකාරාදෙශ වන්නේය. කාලෙතු, කාලවාචී ශබ්දයා පරකල්හි ; න, සකාරාදෙශ නොවන්නේය. සහරි යන මෙහි සහශබ්දයාගේ අර්ථය සදෘශය යනුයි. සහ ශබ්දයහට මෙයින් සකාරයි. ඉකාරාන්තයා කෙරෙන් පරවූ විභක්තිහට ලොප්වේ. කාලෙ තු, කාලවාචී කල්හි වනාහි ; සහ පූර්වාහ්ණං යනු වේ. ශ්ලොකයෙහි සාදෘශ්‍ය යන්නට මේ උදාහරණයි, මෙහි පූර්වාහ්ණ යන්න පරකල්හි සහශබ්දයහට සකාරාදෙශ නොවේ, පූර්වාහ්ණය සදෘශය යන අර්ථයි. [පාණිනිඃ 6. 3. 81.]

(මූ-) තෘණෙන සහ සකලමත්ති සතෘණං. ජ්‍යෙෂ්ඨමනු ක්‍රම්‍ය අනුජ්‍යෙෂ්ඨං. මද්‍රාණං සමෘද්ධිඃ සුමද්‍රං. විෂ්ණුං විෂ්ණුං ප්‍රති ප්‍රතිවිෂ්ණු. අග්නි ග්‍රන්ථ පර්‍ය්‍යන්තමධීතෙ සාග්නි. රූපස්‍ය යොග්‍යං අනුරූපං. ශිවස්‍ය පශ්චාත් අනුශිවං. ශක්තිමනති ක්‍රම්‍ය යථාශක්ති. හරෙඃ ශබ්දඃ ප්‍රාදුර්භූතඃ ඉතිහරි. පාපස්‍ය භාවඃ අපාපං. චක්‍රෙණ යුගපදෙහි සචක්‍රං. යාවන්තඃ ශ්ලොකාස්තාවන්තො‘ච්‍යුතප්‍රණාමාඃ යාවච්ඡ්ලොකං.

(ස-) සාකල්‍යාදියෙහි ක්‍රමයෙන් උදාහරණ කෙරේ, සතෘණං යනු, අදනීයවූ මඳකුදු ඇද්ද ඒ නොහරියි යන අර්ථයි, මෙහි සහශබ්දයාගේ අර්ථය සාකල්‍යයයි. සහශබ්දයහට සකා

රයි. ජ්‍යෙෂ්ඨමනුක්‍රම්‍යං යනු ජ්‍යෙෂ්ඨයාහට හීනව පවතියි යන අර්ථයි. මෙහි හීනාර්ථවූ අනු යන්න හා සෙදීමෙහි (286) ජ්‍යෙෂ්ඨං යි විතීයායි, අනුශබ්දයාගේ අර්ථය අනුක්‍රමය යනුයි, මේ අනුක්‍රමධාතුව අකර්මකයි. මද්‍රාණං මද්‍රදෙශානාං සමෘද්ධිඃ සුමද්‍රං, වර්තතෙ යන අර්ථයි, සුභික්ෂං වර්තතෙ යනුද මෙසේමැයි, මෙහි සුශබ්දයාගේ අර්ථය සමෘද්ධියයි. විෂ්ණුං විෂ්ණුං ප්‍රති යි (286) විතීයායි, ප්‍රතිවිෂ්ණු යන මෙහි සමාසයා විසින් විප්සාව තමා කීයනලද බැවින් විත්ව නොවේ, පරිවිෂ්ණු අනුවිෂ්ණු යනාදියද මෙසේමැයි. සාග්නි යන මෙහි පර්‍යන්තාර්ථයෙහි අව්‍යයීභාවය වෙයි, සහශබ්දයහට සකාරාදෙශ වේ. අග්නි ග්‍රන්ථය කෙරෙන් පරවූ කිසිවකුත් නොහදෑලේය යන අර්ථයි. යොග්‍යතාර්ථයෙහි අනුරූපං (සුදුස්සක්) දඳති යනාදියයි. අනු ශිවං යනු පශ්චාදර්ථයෙහියි, භක්ති ඇත්තෝ ශිවට අනුව සිටිත් යන අර්ථයි, අනුරථං පාදෘතාඃ යනාදියද මෙසේමැයි. යථා ශක්ති යනු අනතික්‍රමාර්ථයෙහියි, දදෘති යන අර්ථයි. යථාබලං ධාරයති යනාදියද මෙසේමැයි. මෙහිද අතිශබ්දයොගයෙහි විතීයායි (286). ඉති හරි යන මෙහි ඉතිශබ්දයාගේ අර්ථය පහලවීමයි, හරි යන ශබ්දය ලොකයෙහි ප්‍රකාශිතය යන අර්ථයි.

අපාපං යන මෙහි නඤර්ථය අභාවය වෙයි, මෙහෙද සංසර්ගා භාවයම වෙයි, භෙදය නොවේ. (325) නඤ් යන්නහුගේ ස්ථානයෙහි අකාර වෙයි. නිර්මක්ෂිකං යනාදියද මෙසේමැයි. ගෙ විෂ්ණෙ චක්‍රෙණ සහ, චක්‍රය හා සමග ; යුගපත්, එක විට ; මෙහි, ගදෑවදරව යන අර්ථයෙහි සචක්‍රං යනු වේ. සහ ශබ්දයහට සකාර වේ. ශ්ලොකයේ අනෙකධා යන මෝහට එක් උදාහරණයක් දක්වා, ශ්ලොකයන් මෙපමණ බැවින් ප්‍රණමයන් මෙතෙක් බව සලකනලද්දීය යන අර්ථයෙහි යාව ච්ඡ්ලොකං. යාවද්භොජන පාත්‍රං බ්‍රාහ්මණාන් නිමන්ත්‍රයස්ව යනාදියද මෙසේමැයි. යෙ යෙ තථා භූතාඃ යථාතථං, යෙ යෙ යථාභූතාඃ යථායථං. තිෂ්ඨන්ති වහන්ති ආයාන්ති ගාවො යස්මින් කාලෙ යන මෙහි ක්‍රමයෙන් තිෂ්ඨද්ගු වහද්ගු ආයතීගවං යන මේ ආදීහු දතයුත්තාහ. [පාණිනිඃ 2. 1. 17.]

(මූ-) 378. ශරද්විපාඩයශ්චෙතොමනො විඩුපානඩිමවද් විද්දිවනඩුද්දික්චතුර්යතතාදෙ'ඃ. (ශරද්—තද්ඃ 5. අඃ 1.)

එහෙත අඃ ස්‍යාත් වෙ. උපශරදං.*

(ස-) එභ්‍යඃ, ශරද්ශබ්ද විපාශ්ශබ්ද අයස්ශබ්ද චෙතස්ශබ්ද මනස්ශබ්ද විශ්ශබ්ද උපානහ්ශබ්ද හිමවත්ශබ්ද විද්ශබ්ද දිව් ශබ්ද අනඩුහ්ශබ්ද දිශ්ශබ්ද චතුර්ශබ්ද යද්ශබ්ද තද්ශබ්ද යන මොවුන් කෙරෙන් ; වෙ, අව්‍යයීභාවසමාසයෙහි ; අඃ ස්‍යාත්, අප්‍රත්‍යය වන්නේය, ශරදඃ සමීපං උපශරදං. එසේම, උප විපාශං, උපායසං, උපචෙතසං, උපමනසං, උපවිශං, උපොපා නහං, උපහිමවතං, උපවිදං, උපදිවං, ප්‍රත්‍යනඩුහං, ප්‍රතිදිශං, උපචතුරං, උපයදං, උපතදං, කියාද වෙත්. [පාණිනිඃ 5. 4. 107.]

(මු-) **379. ජරායා ජරස් ච**. (ජරායාඃ 6. ජරස් 1. ච 1.) උපජරසං.

(ස-) ජරයාඃ, ජරාශබ්දයහට අව්‍යයීභාවසමාසයෙහි ; ජරස් ච, ජරස්ආදෙශද අප්‍රත්‍යයද වෙත්.

ජරායාඃ සමීපං උපජරසං. මෙහින් ජරස්ආදෙශය හා අප්‍රත්‍ය යයි. [පාණිනිඃ 5. 4. 107.]

(මු-) **380. සරජසොපශුනෙ**. (සරජස-උපශුනෙ 1 ‥) නිපාත්‍යෙ.

(ස-) නිපාත්‍යෙ, සරජස-උපශුන යන දෙක නිපාතනය කරණුලැබෙත්. රජසා සහ සකලමත්ති සරජසං, මෙහි නිපාතනයෙන් අප්‍රත්‍යයයි. ශුනඃ සමීපං උපශුනං, නිපාතන යෙන් ශ්වන් ශබ්දයාගේ වකාරයහට උකාරයි, අප්‍රත්‍යයද වෙයි. [පාණිනිඃ 5. 4. 77.]

---

* ශරච්ච විපාට්ච අයශ්ච චෙතශ්ච මනශ්ච විට්ච උපානච්ච හිමවාංශ්ච විද්ච දෞශ්ච අනඩ්වාංශ්ච දික්ච චතුශ්ච යච්ච තච්ච තත් ත්‍යස්මාත්. උපවිපාශං යනුද උපායසං යනුද උප චෙතසං යනුද උපමනසං යනුද උපවිශං යනුද උපොපානහං යනුද උපහිමවතං යනුද උපවිදං යනුද උපදිවං යනුද ප්‍රත්‍ය නඩුහං යනුද ප්‍රතිදිශං යනුද උපචතුරං යනුද උපයදං යනුද උපතදං යනුද උපශරදං යනු මෙනි.

(මූ-) 381. **සමපරඃප්‍රත්‍යනුභ්‍යො'ක්ෂ්ණඃ.** (සම්පරස් ප්‍රති අනුභ්‍යඃ 5... අක්ෂ්ණඃ 5.)

සමක්ෂං.*

(ස-) සමපරඃප්‍රත්‍යනුභ්‍යඃ, සම්ශබ්ද පරස්ශබ්ද ප්‍රතිශබ්ද අනුශබ්ද යන මොවුන් කෙරෙන් පරවූ ; අක්ෂ්ණඃ, අක්ෂිශබ්දයා කෙරෙන් අව්‍යයීභාවසමාසයෙහි අප්‍රත්‍යය වන්නේය. අක්ෂ්ණඃ සමීපං සමක්ෂං. [පාණිනිඃ 5. 4. 107.]

(මූ-) 382. **අනඃ.** (අනඃ 5.)

අනන්තාත් අඃ සෘත් වෙ. අධ්‍යාත්මං.

(ස-) අනන්තාත්, අන් යන්න අන්තකොට ඇත්තහු කෙරෙන් ; වෙ, අව්‍යයීභාවසමාසයෙහි ; අඃ සෘත්, අප්‍රත්‍යය වන්නේය. වෙන්වූ යොගය බැවින් සම් ආදීහුගේ අනුවෘත්තිය නොවේ. ආත්මානමධිකෘත්‍ය අධ්‍යාත්මං, (337, 258) අධිරාජං අධිපූෂං යනාදියද මෙසේමැයි. [පාණිනිඃ 5. 4. 108.]

(මූ-) 383. **ක්ලීවාවා.** (ක්ලීවාත් 5. වා 1.)

උපචර්මං උපචර්ම.

(ස-) ක්ලීවාත්, ක්ලීවලිඞ්ගවූ අන්අන්තයා කෙරෙන්; වා, විකල්පයෙන් අව්‍යයීභාව සමාසයෙහි අප්‍රත්‍යය වන්නේය. චර්මණඃ සමීපං උපචර්මං, විකල්පයෙන් උපචර්ම යනු වේ. අහරහඃ ප්‍රති ප්‍රත්‍යහං ප්‍රත්‍යහඃ යනාදියද මෙසේමැයි. [පාණිනිඃ 5. 4. 109.]

(මූ-) 384. **ඣප්නදීපෞර්ණමාස්‍යාග්‍රහායණ්‍යාගිරෙර්වා.** (ඣප්—ගිරෙඃ 5. වා 1.)

උපසමිධං උපසමිත් උපනදං උපනදි.

ඉති වඃ.

---

* සම් ච පරශ්ච ප්‍රතිශ්ච අනුශ්ච තෙභ්‍යඃ. අක්ෂ්ණෝඃ පරඃ පරොක්ෂං, පරශබ්දයා කෙරෙන් නිපාතනයෙන් අස් කළ කල්හි පරස් යන අව්‍යයශබ්දය වේ. අක්ෂ්ණෝරභිමුඛං ප්‍රත්‍යක්ෂං, අන්වක්ෂං කියාද වේ, මොවුන් කෙරෙහි අක්ෂිශබ්දයා කෙරෙන් අප්‍රත්‍යය කළ කල්හි (258) ඉකාරලොපයයි. ප්‍රත්‍යක්ෂඃ පරොක්ෂඃ යනු වනාහි ඉන්ද්‍රියවාචිවූ අකාරාන්ත අක්ෂශබ්දයා කෙරෙන්, අක්ෂාණං ප්‍රති ප්‍රත්‍යක්ෂඃ අක්ෂාණං පරඃ පරොක්ෂඃ යී ෂෂ්ඨීසමාස කළ කල්හි (366) ව්‍යං පූර්වං යන්නෙන් පූර්වනිපාතය වේ.

(ස-) ඣප්, ඣප්ප්‍රත්‍යාහාරාන්තයා කෙරෙන්ද; නදීපෞර්ණමාස්‍යාග්‍රහායණීගිරෙඃ, නදීශබ්ද පෞර්ණමාසීශබ්ද ආග්‍රහායණීශබ්ද ගිරිශබ්ද යන මොවුන් කෙරෙන් ; වා, විකල්පයෙන් අව්‍යයීභාවසමාසයෙහි අප්‍රත්‍යය වන්නේය. සමිධඃ සමීපං උපසමිධං, අප්‍රත්‍යයයි. විකල්පයෙන් උපසමිත් යනු වේ. උපතඩිතං උපතඩිත් යනුද මෙසේමැයි. නද්‍යාඃ සමීපං උපනදං, විකල්පයෙන් උපනදී යනු වේ. උපපෞර්ණමාසං උපපෞර්ණමාසි, උපාග්‍රහායණං උපාග්‍රහායණී, උපගිරං උපගිරි යනුද මෙසේමැයි.

අප්‍රත්‍යය නුවූ පක්‍ෂයෙහි දීර්ඝාන්තයන්ට ක්ලීවෙ ස්වඃ සී හ්‍රස්වයි (167). මෙහි වාග්‍රහණය පරසූත්‍රයෙහි නිවෘත්තිය පිණිසයි. [පාණිනිඃ 5. 4. 110—112.]

අව්‍යය නිමි.

ෂට්සමාසඃ.

(මූ) **385. පථ්‍යප්පුරඃ ෂෙ.** (පථින්-අප්-පුරඃ 5. ෂෙ 7.) **එභ්‍යඃ ස්‍යත් ෂෙ සති.***

සඛිපථෞ, රම්‍යපථො දෙශඃ, මහාපථඃ, දක්‍ෂිණාපථඃ, චතුෂ්පථං, උපපථං, විමලාපංසරඃ, විෂ්ණුපුරං.

(ස-) එභ්‍යඃ, පථින්ශබ්ද අප්ශබ්ද පූර්ශබ්ද යන මේ ශබ්දයන් කෙරෙන් ; ෂෙසති, ෂට්විධවූ සමාසය ඇති කල්හි ; අඃ ස්‍යත්, අප්‍රත්‍යය වන්නේය. සඛා ච පන්ථාශ්ච සඛිපථෞ, (චඃ). රම්‍යඃ පන්ථාඃ යත්‍ර සඃ රම්‍යපථඃ දෙශඃ, දෙශයයි, (හඃ). මහාංශ්චාසෞපන්ථාශ්චෙති මහාපථඃ (යඃ). දක්‍ෂිණස්‍යාං දිශි දක්‍ෂිණෙ දෙශෙ වා පන්ථාඃ දක්‍ෂිණාපථඃ (ෂඃ). දක්‍ෂිණා සී සප්තමීහුගේ ස්ථානයෙහි (520) ආකාර වේ, තද්ධිතාදෙශය බැවින් (319) ආකාරලොපය නොවේ. උත්තරාපථඃ යනුද මෙසේමැයි. චතුර්ණාං පථාං සමාහාරඃ චතුෂ්පථං (ගඃ). පථඃ සමීපෙ උපපථං (වඃ). මේ සියලු තන්හි අප්‍රත්‍යය කළ කල්හි (337) නකාරලොපයද (258) ඉකාරලොපයද වේ. විමලා

---

* පන්ථාශ්ච ආපශ්ච පූශ්ච තත් තස්මාත්.

ආපො යස්මින් තත් විමලාපං සරඃ, විලයි. විප්ශේණඃ පුඃ විප්ශ්‍ණු පුරං අභිධාන බැවින් ක්ලීවත්වය වේ. [පාණිනිඃ 5. 4. 74.]

(මූ-) 386. ව්‍යනනගේර්යො'පො'නාත්. (වි-අනතර්-ගෙඃ 5. ඊ 1. අඃ 1. අපඃ 6. අනාත් 5.)

එභ්‍යො'නවර්ණනෙනාභ්‍යො'පො'කාර ඊඃ ස්‍යාත්. ඊපං අන්තරීපං සමීපං. අනාත් කිං ප්‍රාපං.

(ස-) එභ්‍යඃ, විශබ්ද අන්තර්ශබ්ද ගිසංඥය යන මොවුන් කෙරෙන් පරවූ ; අනවර්ණනෙනාභ්‍යඃ, අවර්ණාන්තනුවූ කියන ලද ගිසංඥයා කෙරෙන් පරවූ ; අපඃ, අප්ශබ්දයාගේ ; අකාරඃ, අකාරයතෙම ; ඊඃ ස්‍යාත්, ඊකාර වන්නේය. වයොර්දිශො රාපො යත්‍ර තත් ව්පං. අන්තගීතා ආපො යත්‍ර තත් අන්ත රීපං. සම්‍යක් ආපො යත්‍ර තත් සමීපං. අතීපං ප්‍රතීපං යනාදි යද මෙසේමැයි. අනාත් කිං, අනාත් යනු කුමටය? ප්‍රගතා ආපො යත්‍ර තත් ප්‍රාපං යන මෙහි අකාරාන්ත ගිසංඥයා කෙරෙන් ඊකාරාදෙශ නොවන පිණිසයි. [පාණිනිඃ 6. 3. 97.]*

(මූ-) 387. සමාපානූපෞ. (සමාප-අනූපෞ 1 ..)

නිපාත්‍යෞ. සමාපො දෙවයජනං, අනූපොදෙශඃ.

(ස-) නිපාත්‍යෞ, සමාප අනූප දෙක නිපාතනය කරණු ලැබෙත්. සම්විතා ආපො යත්‍ර ස සමාපඃ දෙවයජනං, දෙව් යන් පිදීමයි. අනුගතා ආපො යත්‍ර ස අනූපඃ දෙශඃ, දෙශයයි. මේ අපී දෙක්හිම නිපාතනය වේ. අන් තන්හි සමීපං අන්වීපං යනු වේ. [පාණිනිඃ 6. 3. 98.]

(මූ-) 388. සම්තුම්මනඃ-කාමෙ'වශ්‍යම් ලේ‍ය'නන්‍යලොපං, සම්-මාංසෞ තුහිත-තතෙ පාක- පවනෙ වා. (සම් 1. තුම් 1. මනඃ-කාමෙ 7. අවශ්‍යම් 1. ලේ‍ය 7. අනන්‍ය-ලොපං 2. සම්මාංසෞ 1 .. තු 1. හිතතතෙ 7. පාකපවනෙ 7. වා 1.)

සම්තුම් ච මනඃ-කාමයොඃ, අවශ්‍යම් ලේ‍ය, අනන්‍යලොපං යාති, සම්හිතතතයොඃ, මාංසඃ පාකපවනයොර්වා. සමනාඃ සකාමඃ, රන්තුමනාඃ රන්තුකාමඃ, අවශ්‍යසෙව්‍යඃ, සහිතඃ සං

---

* බෞ ච අන්තශ්ච ගිශ්ච තත් තස්මාත්. න අඃ අනස්ත ස්මාත්.

හිතඃ, සතතඃ සන්තතඃ, මාංස්පාකඃ මාංසපාකඃ, මාංස්පචනං මාංසපචනං*

(ස-) මනඃ කාමයොඃ, මනස් කාම යන මොවුන් පර කල්හි; සම්තුම් ච, සම් තුම් යන මෙ දෙකද ; ල්‍යෙ, ල්‍යපිය පර කල්හි; අවශ්‍යම්, අවශ්‍යම් යන්නද ; අන්ත්‍යලොපං, සමාසයෙහි අන්තයෙහි පිහිටි අක්ෂරලොපයට ; යාති, පැමිණේ ; හිත තතයොඃ, හිතතත දෙක පර කල්හි ; සම්, සම් යන්නද ; පාකපචනයොඃ, පාක පචන දෙක පර කල්හි ; මාංසඃ, මාංස ශබ්දයද ; වා, සමාසයෙහි විකල්පයෙන් අන්තයෙහි වූ අක්ෂර ලොපයට පැමිණේ.

සම්‍යක් මනො යස්‍ය සමනාඃ, සම්‍යක් කාමො යස්‍ය සකාමඃ, මෙහි මෙයින් මකාරලොපයි. තුම් යනු (1164) වතුම් යන්නයි. රන්තුං මනො යස්‍ය රන්තුමනාඃ, රන්තුං කාමො යස්‍ය රන්තුකාමඃ. මකාරලොපයි. ල්‍ය යනු තව්‍යාදියයි (987) අවශ්‍යම් සෙව්‍යඃ අවශ්‍යසෙව්‍යඃ, මකාරලොපයි. අවශ්‍යකරණීයඃ යනාදියද මෙසේයි. සම්‍යක් හිතං යස්‍ය සහිතඃ, මකාරලොපයි, විකල්පයෙන් සංහිතඃ. සම්‍යක් තතං යස්‍ය සතතඃ, මකාරලොපයි, විකල්පයෙන් සන්තතඃ. මාංසස්‍ය පාකඃ මාංස්පාකඃ, විකල්පයෙන් මාංසපාකඃ. මාංසස්‍ය පචනං මාංස්පචනං, දෙතැන්හි අකාරලොපයි, විකල්පයෙන් මාංසපචනං. සමාස නුවූ කල්හි වනාහි අන්ත්‍යලොපය නොවේ. ගිසංඥ ප්‍රාදුර් ආදිය මධ්‍යගතවූ කල්හිද මෙසේයි, අවශ්‍ය ප්‍රවාච්‍යඃ, අවශ්‍යාධ්‍යයි කරණීයඃ යනාදියයි.

(මූ-) **389. ධුරො'නක්ෂස්‍යඃ.** (ධුරඃ 5. අනක්ෂස්‍ය 6. අඃ 1.)

රාජධුරා. අක්ෂස්‍ය තු අක්ෂධූඃ.

(ස-) ධුරඃ, ධුර්ශබ්දයා කෙරෙන් පරව ; අඃ, සමාසයෙහි අප්‍රත්‍යය වන්නේය. අනක්ෂස්‍ය, අක්ෂසම්බන්ධිවූ ධුර්ශබ්දයාගේ ස්ථානයෙහි අප්‍රත්‍යය නොවේ. ධුර් යනු භාරයයි. රාඥෙ

---

* සම් තුම් යනු පද භෙදයයි මනඃ කාම දෙක්හි ක්‍රමය නිරාකරණය පිණිසයි. මනශ්ච කාමශ්ච තස්මින්. සම් ච මාංසශ්ච තෙෂු, හිතඤ්ච තතඤ්ච තස්මින්, පාකශ්ච පචනඤ්ච තස්මින්.

ධූඃ රාජධුරා. මහාධුරා යනාදියද මෙසේමැයි. ස්ත්‍රීත්වය බැවින් ආප්‍රත්‍යය වේ. අක්‍ෂනම් රථචක්‍රයයි. අක්‍ෂස්‍ය ධූඃ අක්‍ෂ ධූර් යන මෙහි අප්‍රත්‍යය නොවන්නේය. [පාණිනිඃ 5. 4. 74.]

(මු-) 390. **සෘචඃ.** (සෘචඃ 5.)

සෘචඃ පරෝ'ඃ සනත් සෙ. අර්ධර්චං.

(ස-) සෘචඃ පරඃ, සෘච්ශබ්දයා කෙරෙන් පරව ; සෙ, සමාසයෙහි ; අඃ සනත්, අප්‍රත්‍යය වන්නේය.

අර්ධඤ්ච තත් සෘක් චෙති අර්ධර්චං, සෘචො'ර්ධමිති වා අර්ධර්චං, අප්‍රත්‍යය වෙයි. අභිධානය බැවින් ක්ලීවත්වය වේ. සප්ත සෘචො යස්මින් ස සප්තර්චඃ යනුද මෙසේමැයි. මන්ත්‍රයයි. [පාණිනිඃ 5. 4. 74.]

(මු-) 391. **නඤ්බහොර්මාණවකචරණෙ.** (නඤ්බහොඃ 5. මාණවකචරණෙ 7.)

අනෘචො මාණවකඃ, බහ්වෘචඃ චරණඃ. අන්‍යත්‍ර අනෘක් සාම, බහ්වෘක් සූක්තං.*

(ස-) නඤ්බහොඃ, නඤ්සමාසයා කෙරෙන්ද බහුශබ්දයා කෙරෙන්ද පරවූ සෘච්ශබ්දයා කෙරෙන් ; මාණවකචරණෙ, මාණවකචරණ ශබ්දයන් වාච්‍ය කල්හි ක්‍රමයෙන් අප්‍රත්‍යය වන්නේය. නාස්ති සෘක් යස්‍ය සො'නෘචො මාණවකඃ, මාණවකයයි (ශිශුඃ.) බහ්ව්‍යඃ සෘචො යත්‍ර ස බහ්වෘචඃ චරණඃ වෙදෛකදෙශඃ. අන්‍යත්‍ර, සෙසුතන්හි; න සෘක් අනෘක් සාම, සාමවෙදයයි. බහ්වෘක් යනු පළමු මෙනි, සූක්තං, හෙද වෙද යාගේ භාගයෙකි. සාම-සූක්ත යනු වෙදාංශවිශෙෂයෝයි. [පාණිනිඃ 5. 4. 74.]

(මු-) 392. **ප්‍රත්‍යන්වවාත් සාමලොම්නඃ.** (ප්‍රති අනු අවාත් 5. සාම-ලොම්නඃ 5.)

ප්‍රති සාමං ප්‍රති ලොමං.†

(ස-) ප්‍රත්‍යන්වවාත්, ප්‍රතිශබ්ද අනුශබ්ද අවශබ්ද යන

---

* නඤ්ච බහුශ්ච තත් තස්මාත්. සූත්‍රය බැවින් පුරුෂත්වය වේ. මාණවකශ්ච චරණශ්ච තස්මින්.

† ප්‍රතිශ්ච අනුශ්ච අවශ්ච තස්මාත්.

මොවුන් කෙරෙන් පරවූ ; සාමලොම්නඃ. සාමන්ශබ්ද ලොමන්ශබ්ද යන මොවුන් කෙරෙන් සමාසයක් ඇති කල්හි අප්‍රත්‍යය වන්නේය. සාමසාමප්‍රති ප්‍රතිසාමං, ලොම ලොම ප්‍රති ප්‍රතිලොමං. වීප්සායෙහි අව්‍යයීභාවය වේ. අනුලොමං අනුසාමං යනුදු මෙසේමැයි. [පාණිනිඃ 5. 4. 75.]

(මු-) 393. **අක්ෂ්ණො'චක්ෂුෂි.** (අක්ෂ්ණඃ 5. අචක්ෂුෂි 7.)

ගවාමක්ෂීව ගවාක්ෂඃ. චක්ෂුෂිතු, විප්‍රාක්ෂි.*

(ස-) අචක්ෂුෂි, චක්ෂුස්වාච්‍ය නුවූ කල්හි ; අක්ෂ්ණඃ, අක්ෂිශබ්දයා කෙරෙන් සමාසයෙහි අප්‍රත්‍යය වන්නේය. ගවාක්ෂඃ යනු වාතායනයයි. චක්ෂුෂිතු, චක්ෂුස්හි වනාහි ; විප්‍රස්‍ය අක්ෂි විප්‍රාක්ෂි යන මෙහි අප්‍රත්‍යය නොවේ. විශාලාක්ෂඃ පද්මාක්ෂඃ සී බහුව්‍රීහි කළ කල්හි චක්ෂුර්භිනනවූ අර්ථය වාච්‍ය කල්හි අප්‍රත්‍යය වේ. [පාණිනිඃ 5. 4. 76.]

(මු-) 394. **බ්‍රහ්මහස්තිරාජපණ්‍යාත්වර්චසඃ.** (බ්‍රහ්ම-පණ්‍යාත් 5. වර්චසඃ 5.)

බ්‍රහ්මවර්චසං හස්තිවර්චසං රාජවර්චසං පණ්‍යවර්චසං.†

(ස-) බ්‍රහ්මහස්තිරාජපණ්‍යාත්, බ්‍රහ්මන්ශබ්ද හස්තින්ශබ්ද රාජන්ශබ්ද පණ්‍යශබ්ද යන මොවුන් කෙරෙන් පරවූ ; වර්චසඃ, වර්චස්ශබ්දයා කෙරෙන් සමාසයෙහි අප්‍රත්‍යය වන්නේය. බ්‍රහ්මණො වර්චඃ බ්‍රහ්මවර්චසං, හස්තිනොවර්චඃ හස්තිවර්චසං, රාඥොවර්චඃ රාජවර්චසං, පණ්‍යඤ්ච තත් වර්චශ්චෙති පණ්‍යවර්චසං. [පාණිනිඃ 5. 4. 78.]

(මු-) 395. **සමවාන්ධාත් තමසඃ.** (සම්-අව-අන්ධාත් 5. තමසඃ 5.)

සන්තමසං.

(ස-) සමවාන්ධාත්, සම්ශබ්ද අවශබ්ද අන්ධශබ්ද යන මොවුන් කෙරෙන් පරවූ ; තමසඃ, තමස්ශබ්දයා කෙරෙන් සමාසයෙහි අප්‍රත්‍යය වන්නේය. සන්තතං විස්තීර්ණං තමඃ සන්තමසං, අවක්ෂීණං තමඃ අවතමසං, අන්ධං තමඃ අන්ධතමසං. [පාණිනිඃ 5. 4. 79.]

---

* න චක්ෂුඃ අචක්ෂුස් තස්මින්.

† බ්‍රහ්මා ච හස්ති ච රාජා ච පණ්‍යඤ්ච තස්මාත්.

(මූ-) 396. **ශ්වොවසීයස-ශ්වඃශ්‍රේයස-නිඃශ්‍රේයසං.** (ශ්වොවසීයස—නිඃ ශ්‍රේයසං 1.)

එතෙ නිපාත්‍යඃ.

(ස-) එතෙ, ශ්වොවසීයස ශ්වඃශ්‍රේයස නිඃශ්‍රේයස යන මොව්හු ; නිපාත්‍යඃ, නිපාතනයෙන් සිඬකරණු ලැබෙත්. ශ්වඃ ශොභනං වසීයඃ ශ්වොවසීයසං, කල්‍යාණයයි. ශ්වඃ ශොභනං ශ්‍රේයඃ ශ්වඃශ්‍රේයසං, කල්‍යාණයයි, නිර්නිශ්චිතං ශ්‍රේයො නිඃශ්‍රේයසං. නිර්වාණයයි. අව්‍යයයන් අනෙකාර්ථ බැවිනි. [පාණිනිඃ 5. 4. 77, 80.]

(මූ-) 397. **තප්තාන්වවාද්‍රහසඃ.** (තප්ත-අනු-අවාත් 5. රහසඃ 5.)

තප්තරහසං.

(ස-) තප්තාන්වවාත්, තප්තශබ්ද අනුශබ්ද අවශබ්ද යන මොවුන් කෙරෙන් පරවූ ; රහසඃ, රහස් ශබ්දයා කෙරෙන් සමාසයෙහි අප්‍රත්‍යය වන්නේය. තපධාතුහු කෙරෙන් ක්තඃ යෙහි ක්ත කොට තප්තං යනු වේ. තප්තඤ්ච තත් රහ ශ්චෙති තප්තරහසං නොකියයුතු වචනයයි. අකථ්‍යං යත් භවෙත් වාක්‍යං තත් තප්තරහසං විදුඃ, රහොරහඃ අනුරහසං, අවගතං රහඃ අවරහසං. [පාණිනිඃ 5. 4. 81.]

(මූ-) 398. **ප්‍රත්‍යුරසානුගවෙ.** (ප්‍රත්‍යුරස-අනුගවෙ 1..)

එතෙ නිපාත්‍යෙ.

(ස-) එතෙ, ප්‍රත්‍යුරස අනුගව දෙක ; නිපාත්‍යෙ, නිපාතනයෙන් සිඬකරණු ලැබෙත්. උරසි ප්‍රතිවර්තතෙ ප්‍රත්‍යුරසං, අධිකරණාර්ථයෙහි අව්‍යයීභාවයයි. ගවාං අනු ආගතං අනුගවං ශකටයයි. සෙසු තන්හි ප්‍රතිගතමුරඃ ප්‍රත්‍යුරඃ, ගවාං පශ්චාත් අනුගු යනුයි. [පාණිනිඃ 5. 4. 82.]

(මූ-) 399. **ගෙරධ්වනඃ.** (ගොඃ 5. අධ්වනඃ 5.)

ප්‍රාධ්වො රථඃ.

(ස-) ගොඃ, ගිසංඥයා කෙරෙන් පරවූ ; අධ්වනඃ, අධ්වන් ශබ්දයා කෙරෙන් සමාසයෙහි අප්‍රත්‍යය වන්නේය. ප්‍රගතඃ අධ්වානං, සී හෝ ප්‍රගතොʻධ්වා යෙන යන වාක්‍යයෙහි ප්‍රාධ්වඃ යනු වේ. රථඃ, රථයයි. ප්‍රත්‍යධ්වං යනුද මෙසේමැයි. ශකටයයි. [පාණිනිඃ 5. 4. 85.]

(මූ-) 400. **පාණ්ඩුදක්කෘෂ්ටාත් භූමෙඃ.** (පාණ්ඩු-උදක්-කෘෂ්ටාත් 5. භූමෙඃ 5.)

පාණ්ඩුභූමො දෙශඃ.*

(ස-) පාණ්ඩුදක්කෘෂ්ටාත්, පණ්ඩුශබ්ද උදච්ශබ්ද කෘෂ්ට ශබ්ද යන මොවුන් කෙරෙන් පරවූ ; භූමෙඃ, භූමිශබ්දයා කෙරෙන් සමාසයෙහි අප්‍රත්‍යය වන්නේය. පාණ්ඩුර්භූමිර්යස්මින් ස පාණ්ඩුභූමඃ, දෙශඃ, දෙශයයි. උදීචී උද්ගතා භූමිර් යස්මින් ස උදග්භූමඃ, දෙශයයි. පුංවත්වූ බැවින් උදක් යී සිටී. කෘෂ්ටා භූමිර්යස්මින් ස කෘෂ්ටභූමඃ, දෙශයයි. කෘෂ්ට ස්ථානයෙහි කෘෂ්ණ යී කිසිකෙණෙක් කියති.

(මු-) 401. **සඞ්ඛ්‍යායා නදීගොදාවරීභ්‍යාඤ්ච.** (සඞ්ඛ්‍යායාඃ 5. නදී-ගොදාවරීභ්‍යාං 5 ච 1.)

පඤ්චනදං සප්තගොදාවරං, ද්විභූමඃ ප්‍රාසාදඃ.

(ස-) සඞ්ඛ්‍යායාඃ, සඞ්ඛ්‍යාශබ්දයා කෙරෙන් පරවූ ; නදීගොදාවරීභ්‍යාඤ්ච, නදීශබ්ද ගොදාවරී ශබ්ද යන දෙදෙනා කෙරෙන්ද චකාරය කරණකොටගෙන භූමිශබ්දයා කෙරෙන්ද සමාසයෙහි අප්‍රත්‍යය වන්නේය. පඤ්චානාං නදීනාං සමාහාරඃ පඤ්චනදං, සප්තානාං ගොදාවරීණං සමාහාරඃ සප්තගොදාවරං, ද්වෙ භූමී යත්‍ර ස ද්විභූමඃ, ප්‍රාසාදඃ, ප්‍රාසාදයයි. [පාණිනිඃ 2. 1. 20.]

(මු-) 402. **නිසඃ ශතො ඩඃ.** (නිසඃ 5. ශතඃ 5. ඩඃ 1.)

නිස්ත්‍රිංශඃ නිශ්චත්වාරිංශඃ.

(ස-) නිසඃ, නිර්ශබ්දයා කෙරෙන් පරවූ ; ශතඃ, ශත්අන්තයා කෙරෙන් ; ඩඃ, සමාසයෙහි ඩප්‍රත්‍යය වන්නේය. නිර්ගතා ත්‍රිංශත් යස්‍ය ස නිස්ත්‍රිංශඃ, නිශ්චත්වාරිංශඃ යනුද නිෂ්පඤ්චාශඃ යනුද මෙසේමැයි. නිසඃ යනු කුමටය? දුස්ත්‍රිංශත් යනාදියෙහි අප්‍රත්‍යය නොවන පිණිසයි.

(මු-) 403. **සූත් සුරභිපූතෙගන්ධාදිච්චාතූපමානාත්.** (සු උත්-සුරභිපූතෙඃ 5. ගන්ධාත් 5. ඉඃ 1. වා 1. තු 1. උපමානාත් 5.)

---

* උදක් යනු උත් පූර්වවූ අඤ්චධාතුහු කෙරෙන් කර්තෘයෙහි ක්විප් වෙයි, කෘෂ්ට යනු කෘෂධාතුහු කෙරෙන් ක්තප්‍රත්‍යය වෙයි.

සුගන්ධිඃ, පද්මගන්ධිඃ පද්මගන්ධඃ.*

(ස-) සූත් සුරභිපූතෙඃ, සුශබ්ද උත්ශබ්ද සුරභිශබ්ද පූතිශබ්ද යන මොවුන් කෙරෙන් පරවූ ; ගන්ධාත්, ගන්ධශබ්දයා කෙරෙන් ; ඉඃ, සමාසයෙහි ඉප්‍රත්‍යය වන්නේය. උපමානාත්තු, උපමානාර්ථ ශබ්දයා කෙරෙන්; වා, විකල්පයෙන් ඉප්‍රත්‍යය වන්නේය. ශොභනො ගන්ධො යස්‍ය ස සුගන්ධිඃ. උද්ගන්ධිඃ සුරභිගන්ධිඃ පූතිගන්ධිඃ යනුද මෙසේමැයි, ඉප්‍රත්‍යයයි. පද්මස්‍යෙව ගන්ධො යස්‍ය සඃ පද්මගන්ධිඃ, විකල්පයෙන් පද්මගන්ධඃ. [පාණිනිඃ 5. 4. 135, 137.]

(මූ-) 404. **නාර්චායාං ස්වතෙඃ සඛ්‍යාදෙරඃ.** (න 1. අර්චායාං 7. සු-අතෙඃ 5. සඛ්‍යාදෙඃ 5. අඃ 1.)

ස්වතිභ්‍යාං පරාත් සඛ්‍යාදෙරෙ න ස්‍යාත් පූජායාං.

ශොභනො රාජා සුරාජා, අතිශයෙන රාජා අතිරාජා. අර්චායාං කිං, ගාමතික්‍රාන්තඃ අතිගවඃ.†

(ස-) ස්වතිභ්‍යාං, සු අති යන උපසර්ගයන් කෙරෙන් ; පරාත්, පරවූ ; සඛ්‍යාදෙඃ, සඛිශබ්දාදීන් කෙරෙන් ; පූජායාං, පූජායෙහි ; අඃ න ස්‍යාත්, අප්ප්‍රත්‍යය නොවන්නේය. (353) සඛ්‍යහොරාත්‍රඃ යනාදි සූත්‍රයෙහි පටන් (399) ගෙරධ්වනඃ යන්න අන්තකොට ඇත්තවුන් කෙරෙහි යම් සූත්‍රවලින් අප්‍රත්‍යය විහිතද ඒ අප්‍රත්‍යය නොවෙයි යන අර්ථයි. සුරාජා අතිරාජා යනු අප්‍රත්‍යය නුවූ තැනී. මෙහි සු අති ශබ්ද ප්‍රශංසායෙහියි. අතිශයෙන ශවා අතිශවා යනුද, සුගෞඃ සුරාත්‍රිඃ සුපන්ථාඃ යනුද එසේමැයි. අර්චායාං කිං ? අර්චායාං යනු කුමටද ? අතිගවඃ යන මෙහි පූජාර්ථය නොවන හෙයින් අප්‍රත්‍යය අබාධිත බව දක්වීම පිණිසයි. අතිගවඃ යන මෙහි අතිශබ්දය ප්‍රශංසායෙහි නොවේ. අතිසඛඃ යනාදියද මෙසේමැයි. [පාණිනිඃ 5. 4. 69.]

---

* සුශව උචච සුරභිශව පූතිශව තඤමාත්. මෙහි සමවාය සම්බන්ධයෙන් යුක්තව පවත්නාවූ ගන්ධශබ්දයා කෙරෙන් ඉප්‍රත්‍යය වන්නේයයි සම්ප්‍රදායයි, එහෙයින් සුගන්ධො වායුඃ කියා වස්තුවශයෙන් ශිෂ්ටප්‍රයොගානුසාරයෙන්ම වේ. තවද ගුණවාචිවූ ගන්ධශබ්දයා කෙරෙන්ම ඉප්‍රත්‍යය වෙයි, එහෙයින් ශොභනානි ගන්ධද්‍රව්‍යාණි යස්‍යං සා සුගන්ධා විපණිඃ යනු වේ.

† සුශව අතිශව තඤමාත් ස්වතෙඃ.

(මූ-) 405. **කිමඃ ක්ෂෙපෙ.** (කිමඃ 5. ක්ෂෙපෙ 7.)
කිං රාජා.

(ස-) ක්ෂෙපෙ, නින්දායෙහි වූ ; කිමඃ, කිම්ශබ්දයා කෙරෙන් පරව යට කියනලද අප්‍රත්‍යය නොවේ. කුත්සිතො රාජා කිං රාජා, ප්‍රජාපාලනය නොකරන්නෙක්. මේ අප්‍රත්‍යය නුවූ තැනි. කිංගෞඃ යනුද එසේමැයි, භාරෝද්වහනය නොකරන්නෙක්. නින්දායාං යනු කුමටය? කෙෂාං රාජා කිංරාජඃ කෙෂාං ගෞඃ කිංගවඃ යන මේ ආදියෙහි අප්‍රත්‍යයාගේ අබාධිතත්වය ඇඟවීම පිණිසයි. [පාණිනිඃ 5. 4. 70, 2. 1. 64.]

(මූ-) 406. **නඤො'හචෙ.** (නඤඃ 5. අ-හ-චෙ 7.)
නඤඃ පරාත් සඛ්‍යාදෙරො න ස්‍යාත්, න තු හ-චයොඃ. අසඛා-හවෙතු—අනපං සරඃ, අධුරං.*

(ස-) න ඤඃ පරාත්, න නිපාත සමාසයා කෙරෙන් පරවූ ; සඛ්‍යාදෙඃ, සඛිශබ්දාදීන් කෙරෙන් ; අඃ න ස්‍යාත්, අප්‍රත්‍යය නොවන්නේය. හචයොස්තු, අන්‍යපදසමාස අව්‍යයසමාස යන දෙක්හි වනාහි ; න, අප්‍රත්‍යය නිෂෙධ නොවේ. න සඛා අසඛා, නකාර තත්පුරුෂයයි. මෙහි අප්‍රත්‍යය නොවේ. හචෙ තු අන්‍යපද අව්‍යයසමාස දෙක්හි ; න සන්ති ආපො යත්‍ර තත් අනපං සරඃ විලයි. (385) අප්‍රත්‍යය වේ. ධුරො'භාවඃ අධුරං, ශකටයයි. (389) අප්‍රත්‍යය වේ. [පාණිනිඃ 5. 4. 71.]

(මූ-) 407. **පථො වා.** (පථඃ 5. වා 1.)
අපථං අපන්ථාඃ. හ-චෙ තු-අපථො දෙශඃ, අපථං.

(ස-) පථඃ, හචභින්නසමාසයෙහි නකාරයා කෙරෙන් පරවූ පථින්ශබ්දයා කෙරෙන් ; වා, විකල්පයෙන් අප්‍රත්‍යය වන්නේය. න පන්ථාඃ අපථං, තත්පුරුෂයයි, විකල්පයෙන් අපන්ථාඃ යනු වේ. හචෙ තු, හ-ච-යන සමාස දෙක්හි වනාහි ; නාස්ති පන්ථා යස්මින් ඉති අපථඃ, දෙශයයි, පථො'භාවඃ ඉති අපථං, දෙතන්හි (385) අප්‍රත්‍යය නිත්‍යයි. [පාණිනිඃ 5. 4. 72.]

(මූ-) 408. **කත් ක්වච්ත්‍රිරථවදෙ,** (කත් 1. කු 1. අච්-ත්‍රි-රථ-වදෙ 7.)

---

* හයශ්ච වයශ්ච හචං, න හචං අහචං තස්මින්.

කොඃ ස්ථානෙ කත් සෘත් සෙ අජ්ජදෞ පරෙ. කදනනං කත්ත්‍රයඃ.*

(ස-) අජ්ජදෞ, අච්සංඥය ආදිකොට ඇත්තාවූද ත්‍රිශබ්දද රථශබ්දද වද යන මොවුන්; පරෙ, පරකල්හි; කොඃ ස්ථානෙ, කුශබ්දයාගේ ස්ථානයෙහි; සෙ, සමාසයෙහි; කත් සෘත්, කත් යන ආදෙශ වන්නේය. මෙහි කුශබ්දය කුත්සිතවාචි අව්‍යයයි. අව්‍යය කුමටය? කොඃ (පෘථිව්‍යාඃ) උෂ්ට්‍රඃ කූෂ්ට්‍රඃ යනාදියෙහි කදෘදෙශ නොවන්නේය යනු දක්වීම පිණිසයි. කුත්සිතමන්නං කදන්නං, අච්සංඥයයි. කදෘකාරඃ කදෞෂධං යනුද මෙසේයි. කුත්සිතාස්ත්‍රයඃ කත්ත්‍රයඃ, කද්‍රථඃ කද්වදඃ යනුද මෙසේයි. මේ සූත්‍රයාගේ කර්මධාරයමය, අභිධානබැවින් කුත්සිතො රථො යස්‍ය යනාදියෙහි කදෘදෙශ නොවේ. [පාණිනිඃ 6. 3. 101, 102.]

(මු-) 409. කාක්‍ෂෙ. (කා 1, අක්‍ෂෙ 7.

කාක්‍ෂං.

(ස-) අක්‍ෂෙ, අක්‍ෂශබ්දයා පරකල්හි සමාසයෙහි කුශබ්දය හට; කා, කා යනාදෙශ වන්නේය. කුත්සිතමක්‍ෂං (ඉන්ද්‍රියං) කාක්‍ෂං. අක්‍ෂ යි සාධාරණවශයෙන් කී බැවින් කුත්සිතෙ අක්‍ෂිණී යස්‍ය ස කාක්‍ෂො විප්‍රඃ යන මෙහි අක්‍ෂිශබ්දයා කෙරෙන් (334) ෂප්‍රත්‍යය කළ කල්හිද කාදෙශ වන්නේය. [පාණිනිඃ 6. 3. 104.]

(මු-) 410. පථිපුරුෂෙ වා. (පථි-පුරුෂෙ 7. වා 1.)

කාපථඃ කුපථඃ, කාපුරුෂඃ කුපුරුෂඃ.

(ස-) පථිපුරුෂෙ, පථින්ශබ්ද පුරුෂශබ්ද යන මොවුන් පරකල්හි කුශබ්දයහට සමාසයෙහි; වා, විකල්පයෙන් කා යන ආදෙශ වන්නේය. කුත්සිතඃ පන්ථාඃ කාපථඃ, මෙයින් කාදෙශයි. පක්‍ෂයෙහි කුපථඃ. කුත්සිතඃ පුරුෂඃ කාපුරුෂඃ, විකල්පයෙන් කුපුරුෂඃ. [පාණිනිඃ 6. 3. 106.]

(මු-) 411. කොරීෂදථෙ. (කොඃ 6. ඊෂදථෙ 7.)

ඊෂජ්ජලං කාජලං.

(ස-) ඊෂදථෙ, ඊෂදර්ථයෙහි පවත්නාවූ; කොඃ, කුශබ්දය හට සමාසයෙහි කා යන ආදෙශ වන්නේය. කුශබ්දයාගේ

---

* අච්ච ත්‍රිශබ්ද රථශබ්ද වදශබ්ද තෘෂ්මින්.

ග්‍රහණය පපින්-පුරුෂ යන දෙදෙනාගේ අනනුවර්තනය පිණි සයි. ලක්ෂ්‍යානුසාරයෙන් යම්කිසි ශබ්දයක් පරකල්හි යන අපිසි. ඊෂදන්නං කාන්නං යනාදියද මෙසේයි. [පාණිනිඃ 6. 3. 105.]

(මු-) 412. **කත්කවෙ ච වාග්නුෂ්ණෙ.** (කත්-කවෙ 1.. ච 1. අග්නි-උෂ්ණෙ. 7.]

කදග්නිඃ කවාග්නිඃ කාග්නිඃ, කදුෂ්ණං කවොෂ්ණං කොෂ්ණං.

(ස-) අග්න්‍යුෂ්ණෙ, අග්නි උෂ්ණ දෙක පරකල්හි ; කත්කවෙ ච, ඊෂදර්ථයෙහි වූ කුශබ්දයාගේ ස්ථානයෙහි කත්-කව යන ආදෙශයෝද චකාරය හෙතුකොටගෙන කා යනාදෙශ යද වෙත්.

ඊෂදග්නිඃ කදග්නිඃ, ඊෂදග්නිඃ කවාග්නිඃ මෙයින් කත්-කවාදෙශයි. ඊෂදග්නිඃ කාග්නිඃ මෙයින් කාදෙශයි. ඊෂදුෂ්ණං කදුෂ්ණං, ඊෂදුෂ්ණං කවොෂ්ණං, ඊෂදුෂ්ණං කොෂ්ණං. අග්නිඋෂ්ණ දෙක පරකල්හි කදාදියයි. [පාණිනිඃ 6. 3. 107.]

(මු-) 413. **ජ්‍යොතිර්ජනපදරාත්‍රි නාභි බන්ධු ගන්ධ පිණ්ඩ ලොහිත කුක්ෂි වෙණි බ්‍රහ්මචාරී තීර්ථ පත්නී පක්ෂෙ සමානඃ සඃ.** (ජ්‍යොතිඃ—පක්ෂෙ 7. සමානඃ 1. සඃ 1.)

සමානං ජ්‍යොතිර්යස්‍යසෞ සජ්‍යොතිඃ.

(ස-) ජ්‍යොතිර්ජනපදරාත්‍රි නාභි බන්ධු ගන්ධ පිණ්ඩ ලොහිත කුක්ෂි වෙණි බ්‍රහ්මචාරී තීර්ථ පත්නී පක්ෂෙ, ජ්‍යොතිස්ශබ්ද ජනපදශබ්ද රාත්‍රිශබ්ද නාභිශබ්ද බන්ධුශබ්ද ගන්ධශබ්ද පිණ්ඩශබ්ද ලොහිතශබ්ද කුක්ෂිශබ්ද වෙණින්ශබ්ද බ්‍රහ්මචාරින්ශබ්ද තීර්ථශබ්ද පත්නීශබ්ද පක්ෂශබ්ද යන මොවුන් පරකල්හි ; සමානඃ, සමාසයෙහි සමානශබ්දයතෙම ; සඃ, සකාරාදෙශ වන්නේය. සජනපදඃ යනුද සජ්‍යොතිඃ යනු මෙනි, ජනපදපර්‍ය්‍යාය ශබ්දග්‍රහණය බැවින් සමානො දෙශඃ සදෙශඃ කියාද වේ. සරාත්‍රිඃ සනාභිඃ සබන්ධුඃ සගන්ධඃ සපිණ්ඩඃ සලොහිතඃ සකුක්ෂිඃ සවෙණිකඃ කියාද වේ. බ්‍රහ්මචර්‍ය්‍යාදි සම්බන්ධය කරණකොටගෙන සමාන ශබ්දය ඒකාර්ථය තුල්‍යව නොවේ, සමානෙ එකස්මින් බ්‍රහ්මණි වෙදෙ චරති යන වාක්‍යයෙහි (993) ග්‍රහාදී බැවින් ණින් කළ කල්හි බ්‍රහ්මචාරින්ශබ්දය පරකල්හි සමානශබ්දය සකාර වේ, එකබ්‍රහ්ම

ව්‍රතාචාරාමිථඃ සබ්‍රහ්මචාරිණඃ-යනු අමරකොෂයි. සමානාත් ඒකස්මාත් තීර්ථාත් ගුරොඃ පඨති යන වාක්‍යයෙහි (429) ෂණ්‍ය ප්‍රත්‍යය කළ කල්හි (නොහොත් ෂණ්ප්‍රත්‍යය කළ කල්හි) තීර්ථ ශබ්දය පරකල්හි සමානශබ්දය සකාරාදෙශවේ. යකාර නූවූ පක්‍ෂයෙහි සමානං තීර්ථං යස්‍ය කියා හෝ වාක්‍යයි. තීර්ථ මෘෂි ජුෂ්ට ජලෙ ගුරෞ කියා වේ, සතීර්ථ්‍යශ්චෛක ගුරවඃ සීද අමර කොෂයි. සමාන එකඃ පතිරස්‍යාඃ යන වාක්‍යයෙහි නිපාතන යෙන් පත්‍යුශබ්දයහට පත්නආදෙශ කළ කල්හි ඊප් කොට සමානශබ්දයහට සකාරව සපත්නී කියා වේ. සමානඃ පක්‍ෂඃ (සහායඃ) සපක්‍ෂඃ යනුද මෙසේමැයි. [පාණිනිඃ 6. 3. 85, 86, 87.]

(මූ-) 414. **රූප නාම ගොත්‍ර ස්ථාන වර්ණ වයො වචන ධර්ම ජාතීයොදර්යෙෂු වා.** (රූප—උදර්යෙෂු 7. වා 1.)

සරූපඃ සමානරූපඃ.

ඉති සමාස පාදඃ.

(ස-) රූප නාම ගොත්‍ර ස්ථාන වර්ණ වයො වචන ධර්ම ජාතී යොදර්යෙෂු, රූපශබ්ද නාමන්ශබ්ද ගොත්‍රශබ්ද ස්ථානශබ්ද වර්ණශබ්ද වයස්ශබ්ද වචනශබ්ද ධර්මශබ්ද ජාතීයශබ්ද උදර්යශබ්ද යන මොවුන් පරකල්හි; වා, විකල්පයෙන් සමාසයෙහි සමානශබ්දයහට සකාරාදෙශ වේ. සමානං රූපං යස්‍ය සෞ සරූපඃ. විකල්පයෙන් සමානරූපඃ යනු වේ. සමානමෙකං නාම යස්‍ය ස සනාමා. සගොත්‍රඃ සස්ථානඃ සවර්ණඃ සවයාඃ සවචනඃ සධර්මා (344) යනුද මෙසේ මැයි. සමානස්‍ය ප්‍රකාරඃ ඉති (487) සජාතීයඃ. සමානෙ එකස්මින් උදරෙ භවති යන වාක්‍යයෙහි (429) උදරශබ්දයා කෙරෙන් ෂණ්‍යප්‍රත්‍යය කළ කල්හි සොදර්යඃ යනු වේ. මොවුන් කෙරෙහි විකල්ප පක්‍ෂයෙහි සමානශබ්දය ආදෙශ රහිතව සිටියි. [පාණිනිඃ 6. 3. 85, 88.]

සමාසපාදය නිමි.

තද්ධිතඃ.

(මු-) 415. **බාහ්වාද්‍යතො'ත්‍ර්‍යාබාදෙර්ගර්ගාදෙර්නඩාදෙඃ පිතෘෂ්වස්‍රාදෙරේවත්‍යාදෙඃ ශෙෂශිවාදෙඃ ෂ්ණි-ෂ්ණෙය-ෂ්ණ්‍ය-ෂ්ණායන-ණීය-ෂ්ණික-ෂණ අපත්‍යෙ.** (බාහ්වාද්‍යතඃ 5. අත්‍ර්‍යාබාදෙඃ 5. ගර්ගාදෙඃ 5. නඩාදෙඃ 5. පිතෘෂ්වස්‍රාදෙඃ 5. රේවත්‍යාදෙඃ 5. ශෙෂශිවාදෙඃ 5. ෂ්ණි—ෂ්ණඃ 1... අපත්‍යෙ 7.)

එභ්‍යඃ පරා එතෙ ක්‍රමාත් ස්‍යුරපත්‍යෙපි.*

(ස-) එභ්‍යඃ, බාහු ආදියද අකාරාන්ත ශබ්දාදියද අත්‍රි ආදියද ආප් ඊප් ඌප් ප්‍රත්‍යයද ගර්ගාදියද නඩාදියද පිතෘ ෂ්වසෘ ආදියද රේවත්‍යාදියද ශෙෂශබ්දද ශිවාදියද යන මේ සපත ගණයන් කෙරෙන් ; පරාඃ, පරව සිටියාවූ ; එතෙ, ෂ්ණි-ෂ්ණෙය-ෂ්ණ්‍ය-ෂ්ණායන-ණීය-ෂ්ණික-ෂණ යන මේ ප්‍රත්‍යයෝ සත ; අපත්‍යෙපි, පුත්‍රාපීයෙහි ; ක්‍රමාත් ස්‍යුඃ, ක්‍රමයෙන් වෙත්. [පාණිනිඃ 11. 1. 162.]

(මු-) 416. **ණිත්තෙ වෘද්ධිරාද්‍යචඃ සුභග-සුපඤ්චාලාදෙස්තු ව්‍යඤ්ජනාද්‍යානාං.** (ණිත්තෙ 7. වෘද්ධිඃ 1. ආද්‍යචඃ 6. සුභග-සුපඤ්චාලාදෙඃ 6 ·· තු 1. ව්‍යඤ්ජනාද්‍යානාං 6...)

---

* බාහුරාදිර්යස්‍ය සඃ, බාහ්වාදිශ්ච අච්ච තත්තස්මාත්. අත්‍රිශ්ච ආප් ච තෞ ආදී යස්‍ය සඃ අත්‍ර්‍යාබාදිස්තස්මාත්, අත්‍ර්‍යාදෙඃ ආබාදෙශ්චෙත්‍යපිඃ. ගර්ගආදිර්යස්‍ය තස්මාත්. නඩආදිර්යස්‍ය තස්මාත්. පිතෘෂ්වසා ආදිර්යස්‍ය තස්මාත්. රේවතීආදිර්යස්‍ය තස්මාත්. උක්තාදන්‍යඃ ශෙෂඃ, ශිවආදිර්යස්‍ය සඃ ශිවාදිඃ, ශෙෂශ්ච ශිවාදිශ්ච තත්තස්මාත්. සූත්‍ර බැවින් සියලු තන්හි පුරුෂලිඞ්ගත්වයයි. ෂ්ණිශ්ච ෂ්ණෙයශ්ච ෂ්ණ්‍යශ්ච ෂ්ණායනශ්ච ණීයශ්ච ෂ්ණිකශ්ච ෂණශ්ච තෙ. න පතති වංශො යෙන තදපත්‍යං, පුත්‍රය පෞත්‍රය ප්‍රපෞත්‍රාදියද කන්‍යාද කියනු ලැබෙත්. ක්‍රමය මෙසේයි, බාහු ආදීන් කෙරෙන්ද අකාරාන්තයන් කෙරෙන්ද ෂ්ණිප්‍රත්‍යයයි, අත්‍රි ආදීන් කෙරෙන්ද ආප් ආදීන් කෙරෙන්ද ෂ්ණෙයප්‍රත්‍යයයි, ගර්ගාදියෙන් ෂ්ණ්‍යයයි, නඩාදියෙන් ෂණායනයයි, පිතෘ ෂ්වසෘ ආදියෙන් ණීයයයි. රේවත්‍යාදියෙන් ෂ්ණිකයයි, ශෙෂයෙන්ද ශිවාදියෙන්ද ෂණයයි. මොවුන්ගේ ඉත්සංඥ ෂකාරය ඊප්ප්‍රත්‍යය සඳහායි, ඉත් ණකාරවෘද්ධිය අර්ථයි.

අචාං මධ්‍යෙ ආද්‍යචො වෘද්ධිඃ ස්‍යාත් ඤ්ණිති තෙ පරෙ, සුභගාදෙස්තු ද්වයොරාද්‍යයොඃ, සුපඤ්චාලාදෙස්තු අන්ත්‍යස්‍ය දස්‍ය.*

(ස-) ඤ්ණිති තෙ පරෙ, ඉත්සංඥවූ ණකාරවත් තද්ධිතප්‍රත්‍යයා පර කල්හි ; අචාං මධ්‍යෙ, ස්වරයන් අතුරෙහි ; ආද්‍යචඃ, ආදි ස්වරයහට ; වෘද්ධිඃ ස්‍යාත්, වෘද්ධි වන්නීය. සුභගාදෙස්තු, සුභගාදිහුගේ වනාහි; ද්වයොරාද්‍යයොඃ, පද දෙදෙනාගේ ආදිස්වරයහටද; සුපඤ්චාලාදෙස්තු, සුපඤ්චාලාදිහුගේ වනාහි ; අන්ත්‍යස්‍ය දස්‍ය, අන්තයෙහි වූ පදයාගේ ආදිස්වරයහටද වෘද්ධි වන්නීය.

(මු-) (337) ඤෙවාල්ලොපෙ‍්‍යතෙ‍්‍ය තෙ'චෙ‍්‍ය. බාහොරපත්‍යං බාහවිඃ, උපවින්දොරපත්‍යං ඖපවින්දවිඃ, උඩුලොම්නො'පත්‍යං ඖඩුලොමිඃ, අග්නිශර්මණො'පත්‍යං ආග්නිශර්මිඃ. කෘෂ්ණස්‍ය පත්‍යං කාර්ෂ්ණිඃ.†

---

* මූර්ධන්‍ය ණ ඉත් යස්‍ය ස ණිත්, ඤිච්චාසෞ ණිච්චෙති ඤ්ණිතඃ තස්මින්. ආදිශ්චාසෞ අච්චෙති ආද්‍යච් තස්‍ය. සුභගශ්ච සුපඤ්චාලශ්ච සුභගසුපඤ්චාලෞ, තෞ ආදී යයොස්තෞ සුභගසුපඤ්චාලාදී තයොඃ. ද්වෙ ච අන්ත්‍යශ්ච ද්ව්‍යන්ත්‍යානි, ද්ව්‍යන්ත්‍යානි ච තානි දූනි චෙති ද්ව්‍යන්ත්‍යදූනි තෙෂාං. පළමුකොට (9) ස්වරයන්ම වෘද්ධිස්ථානීන්වයෙන් දක්වීම ඇති කල්හිද නැවත මෙහි ස්වරග්‍රහණය පරසූත්‍රයෙහි ආදිස්වරයාගේ අනුවෘත්තිය පිණිසයි. සාධාරණවශයෙන් සර්වශබ්දයන්ගේ ස්වරයන් කෙරෙහි ආදිස්වරය හට වෘද්ධියි, සුභගාදීන්ගේ පද දෙදෙනාගේ ආදිස්වරයහට වෘද්ධියි, සුපඤ්චාලාදීන්ගේවනාහි එකම අන්ත්‍යපදයාගේ ආදිස්වරයහට වෘද්ධිවන්නීය. ඤ්ණිත්තද්ධිතයා පර කල්හි යන අර්ථයි. [පාණිනිඃ 7. 2. 117.]

† බාහු ආදීන් කියයි, බාහු නම් කිසිවක්හුගේ පුත්‍රය යන අර්ථයෙහි, බාහොඃ යන පදය කෙරෙන් ඤ්ණි වේ.

ඤ-ණ-දෙක ඉත්සංඥ ඇත්තෝයි, ඉකාරය සිටියි, (319, 337, 35) බාහවි යන භාගයහට නැවත ලිඞ්ගසංඥ කළ කල්හි ස්‍යාදි විභක්ති වන්නීයි, සියලු තන්හි මෙසේයි. විභක්ති වූ පරිද්දෙන් වාක්‍ය වෙයි. ඒ විභක්ත්‍යන්තයා කෙරෙන් ප්‍රත්‍යය වෙයි. ඖපවින්දවිඃ යනුද මෙසේයි. ඖඩුලොමිඃ යනමෙහි ඤ්ණි ප්‍රත්‍යය කළ කල්හි (337, 258) නකාරලොපයද අකාරලොපයද වේ. ආග්නිශර්මිඃ යනුද මෙසේමැයි. කාර්ෂ්ණිඃ යන මෙහි (258) අකාරලොපයි. බාහ්වාදි ගණය වනාහි බාහු උපබාහු උපවින්දු උඩුලොමන් අග්නිශර්මන් සුශර්මන් කෘෂ්ණ යුධිෂ්ඨිර අර්ජුන ශාම්බ ගද ප්‍රද්‍යුම්න රාම සත්‍යක යනාදියයි.

(ස-) බොලෝපෞතෞ තෙ'වෙ, යන මේ සූත්‍රයෙන් බාහු ශබ්දයාගේ උකාරයහට ඔකාර වේ. බාහොරපත්‍යං, බාහොරපත්‍යං යන වාක්‍යයෙහි ; බාහවිඃ, බාහවිඃ යනු වේ, ෂ්ණ්‍රප්‍රත්‍යයයි. උපවිඤුරපත්‍යං යන වාක්‍යයෙහි ඖපවිඤවිඃ යනු වේ, ෂ්ණ්‍රප්‍රත්‍යයයි, මෙයින් වෘඞියි. ඖඩුලොමිඃ යනාදිය වේ.

(මූ-) 417. **ය්වොර්යුම් දෘනෙන'ස්වඞ්ගව්‍යඞ්ගව්‍යඩ ව්‍යව හාර ව්‍යාශාමස්වාගත ස්වධ්වර ණිනඃ.** (ය්වොඃ 6 .. යුම් 1 .. දෘනෙත 7. අස්වඩග—ණිනඃ 6.)

ආද්‍යචඃ ස්ථානෙ ජාතයොර්දෘනෙත ස්ථිතයොර්යවයොඃ ස්ථානෙ ක්‍රමාදිමුමෞ ස්තා ණ්ඉති තෙ පරෙ, න තු ස්වඩගාදෙඃ.*

(ස-) ආද්‍යචඃ ස්ථානෙ ජාතයොඃ, ආදිස්වරයාගේ ස්ථානයෙහි ජාතවූ ; දෘනෙත ස්ථිතයොඃ, පදනතයෙහි සිටියාවූ ; යවයොඃ ස්ථානෙ, යකාර වකාර දෙදෙනාගේ ස්ථානයෙහි ; ණ්ඉතිතෙ පරෙ, ඉත්සංඥ ණකාරවත්වූ තඞිතසංඥයා පරකල්හි; ක්‍රමාත්, පඞ්ක්තීන්; ඉමුමෞ, ඉම් උම් දෙදෙන ; ස්තඃ, වෙත්. ස්වඞ්ගාදෙස්තු, ස්වඩගව්‍යඩගව්‍යඩව්‍යවහාර ව්‍යායාමස්වාගතස්වධ්වර ණින්ප්‍රත්‍යයාන්තය යන මොහට වනාහි ; න, ඉම් උම් නො වෙත්.

(මූ-) 418. **මාර ස්වර ස්වඃස්වසති ස්වාදුමෘදු ව්‍යල්කසශ්වඃ ශ්ව න්ස්ථ්‍යකෘත ස්ව ස්වාධ්‍යාය ස්වශ්‍රාමෙකාන්‍යග්‍රොධානාං ශ්වාපදන්‍යඞ්කොසතු වා නත්විති ශ්වාදෙඃ.** (වාර-න්‍යග්‍රොධානාං 6...ශ්වාපද-න්‍යඩකොඃ 6. තු 1. වා 1. න 1. තු 1. ඉති 7. ශ්වාදෙඃ 6.)

---

* යව වව ය්වෞ තයොඃ ඉශ්ච උශ්ච යු තාභ්‍යාං ම් යුම්. මෙසේ ලොප්කරණලද ප්‍රථමාවිවචනය යථාක්‍රමය පිණිසයි, ස්වඞ්ගශ්ච ව්‍යඞ්ගශ්ච ව්‍යඩශ්ච ව්‍යවහාරශ්ච ව්‍යායාමශ්ච ස්වාගතශ්ච ස්වධ්වරශ්ච ණින් ච තත්, පශ්චානනසද්යොගෙ තස්‍ය. ස්වඞ්ගාදිහු සපතශබ්දයෝයි, ණින් යනු (1141) කෘත්ප්‍රත්‍යයයි. එහෙයින් ණින්ප්‍රත්‍යයාන්තයාගේ ග්‍රහණයයි. ආද්‍යචඃ යනුද ණ්ඉතෙත යනුද අනුවර්තනය වේ. ඉත්සංඥ මකාරය බැවින් ඉම් උම් දෙක ආදියෙහි වෙත්. ණිත්තඞිතයා පර කල්හි ආදියෙහි ඉම් උම් කළ කල්හි පසුව වෘඞියි.

ද්වාරාදෙරවිතීයස්‍ය න්‍යග්‍රොධස්‍ය ච ය්වොරියුම් සඤිත්, ශ්වාපද න්‍යඞ්කොස්තු වා, න තු ශ්වාදෙරිකාරාදෞ තෙ.*

(ස-) ද්වාරාදෙඃ, ද්වාරශබ්දය ආදිකොට ඇති ස්වරශබ්ද ස්වර්ශබ්ද ස්වස්තිශබ්ද ස්වාදුමෘදු ශබ්ද ව්‍යල්කසශබ්ද ශ්වස්ශබ්ද ශ්වන්ශබ්ද ස්ඵ්‍යකෘතශබ්ද ස්වශබ්ද ස්වාධ්‍යයශබ්ද ස්වග්‍රාම්ශබ්ද යන මේ ශබ්දගණයාගේද ; අවිතීයස්‍ය න්‍යග්‍රොධස්‍ය ච, විතීය යක්හු රහිතවූ න්‍යග්‍රොධශබ්දයාගේද ; ය්වොඃ, යකාර වකාර යන දෙදෙනාහට ; ඉයුම් සඤිත්, ඉම් උම් ආගම වන්නේය. ශ්වාපදන්‍යඞ්කොස්තු, ශ්වාපදශබ්ද න්‍යඞ්කුශබ්ද යන මේ දෙදෙනාහටවනාහි ; වා, විකල්පයෙන් ඉම්උම් ආගම වන්නේය. ශ්වාදෙඃ, ශ්වන්ශබ්ද ස්ඵ්‍යකෘත-ස්ව-ස්වාධ්‍යය-ස්වග්‍රාම-න්‍යග්‍රොධ යන සදෙනාගේ ; ඉකාරාදෞතෙ තු, ඉකාරාදි තද්ධිතයා පර කල්හි වනාහි ; න, ඉම්උම් නොවේ. [පාණිනිඃ 7. 3. 4.]

(මු-) වෛයශ්විඃ සෞවශ්විඃ, ස්වඞ්ගාදෙස්තු ස්වාඞ්ගිඃ ව්‍යාඞ්ගිඃ ව්‍යාඩිඃ.

(ස-) පූර්වසූත්‍රයාගේ උදාහරණ දක්වයි—විගතො'ශ්වො යස්‍ය සඃ ව්‍යශ්වඃ ව්‍යශ්වස්‍යාපත්‍යං වෛයශ්විඃ, අකාරාන්ත බැවින් ඉඤ්ප්‍රත්‍යය කළ කල්හි ව්‍යශ්ව යන්නහුගේ වි යන මෙහි ආදෙශවූ යකාරයා කෙරෙන් පූර්වව මෙයින් ඉම් කළ කල්හි ඒ ඉකාරයහට වෘද්ධියි, එසේම—ශොභනො'ශ්වො යස්‍ය සඃ ස්වශ්වඃ ස්වශ්වස්‍යාපත්‍යං සෞවශ්විඃ, ස්වශ්වශබ්දයාගේ වකාරයා කෙරෙන් පූර්වව මෙයින් උම් කළ කල්හි ඒ උකාරයහට වෘද්ධියි.

ආද්‍යචඃ ස්ථානෙ ඤිතයොඃ යනු කුමටය? දධිප්‍රියො'ශ්වො යස්‍ය ස දධ්‍යශ්වඃ, මධුප්‍රියො'ශ්වො යස්‍ය ස මධ්වශ්වඃ, තස්‍ය

---

* එකො'විතීයශ්වාසෞ න්‍යග්‍රොධශ්චෙති එකන්‍යග්‍රොධඃ. ද්වාරඤ්ච ස්වරශ්ච ස්වරිති රෙඵාන්තමව්‍යයඤ්ච ස්වස්තීත්‍යව්‍යයඤ්ච ස්වාදුමෘදුශ්ච ව්‍යල්කසශ්ච ශ්වස් ඉති සාන්තමව්‍යයඤ්ච ශ්වා ච ස්ඵ්‍යකෘතශ්ච ස්වශ්ච ස්වාධ්‍යයශ්ච ස්වග්‍රාමශ්ච එකන්‍යග්‍රොධශ්ච තෙ තෙෂාං. ශ්වාපදශ්ච න්‍යඞ්කුශ්චෙති තස්‍ය. ශ්වා ආදිර්යස්‍ය ස ශ්වාදිස්තස්‍ය. ද්වාරශබ්දාදීන්ගේ යකාර වකාරයන් පදාන්ත නොවන බැවින්ද ආදිස්වරයාගේ ස්ථානයෙහි හටනොගත් බැවින්ද පූර්වසූත්‍රයෙන් අප්‍රාප්ත කල්හි මේ වාක්‍යය වෙයි.

ත්ස්‍ය අපත්‍යං දධ්‍යශ්විඃ මධ්වශ්විඃ යනාදියෙහි ඉම් උම් ආගම නොවන පිණිසයි. ද්‍යුතෙතා ස්‍යිතයොඃ යනු කුමටය? ඉධාතුහු කෙරෙන් ශතෘප්‍රත්‍යය කළ කල්හි යත් යන ශබ්දයයි, යතඃ ඉදං යාතං යනු වේ, එසේම වයොවිශ්‍රීයොභිවං ව්වාර්ෂිකං යනාදියෙහි ඉම් උම් නොවන්නේය.

(ස-) ස්වඞ්ගාදෙස්තු, ස්වඞ්ගාදිහට වනාහි ; ශොභනං අඞ්ගං යස්‍ය ස ස්වඞ්ගඃ ස්වඞ්ගස්‍යාපත්‍යං ස්වාඞ්ගිඃ, විගතං අඞ්ගං යස්‍ය සඃ ව්‍යඞ්ගඃ ව්‍යඞ්ගස්‍යාපත්‍යං ව්‍යාඞ්ගිඃ, ව්‍යධස්‍යාපත්‍යං ව්‍යාධිඃ යනාදියෙහි යකාර වකාර දෙදෙන පදාන්ත බැවින්ද ආදිස්වර යාගේ ස්ථානයෙහි ජතහෙයින්ද ලත් කල්හි නිෂෙධයයි. වෘද්ධියි, යයොර්ලොපඃ යනාදියෙන් අකාරලොපයයි. ණින්අන් තය හට වනාහි ව්‍යාවක්‍රොශියන්නයි. ව්‍යවක්‍රුශ ධාතු හට (1141) ණින්ප්‍රත්‍යය කළ කල්හි ව්‍යවක්‍රොශශබ්දයා කෙරෙන් ස්වාර්ථයෙහි ෂණ කළ කල්හි ඊප්ප්‍රත්‍යව ඒ සිද්ධයි.

(මූ) 419. **ව්‍යාසාදෙර්ඩක් ෂ්ණෙ.** (ව්‍යාසාදෙඃ 6. ඩක් 1. ෂ්ණෙ 7.) වෛයාසකිඃ සෞධාතකිඃ.

(ස-) ෂ්ණෙ, ෂ්ණිප්‍රත්‍යය පර කල්හි ; ව්‍යාසාදෙඃ, ව්‍යාසාදි ශබ්දගණයාගේ ස්ථානයෙහි; ඩක්, ඩක්ආදෙශ වන්නේය. ඉත්සංඥ ඩකාර බැවින් අන්ත්‍යයාගේ ස්ථානයෙහි අක් සී සිටියි.

ව්‍යාසස්‍යාපත්‍යං වෛයාසකිඃ, ව්‍යාසශබ්දයා කෙරෙන් ෂ්ණි ප්‍රත්‍යය වෙයි, යකාරයා කෙරෙන් පූර්වයෙහි (417) ඉම් වේ. (416) ඉකාරයහට වෘද්ධි ඓකාරය වේ, මෙයින් ඩක්ආදෙශ වේ. එසේම සුධාතුරපත්‍යං සෞධාතකිඃ, සුධාතෘශබ්දයා කෙරෙන් ෂ්ණිප්‍රත්‍යයයි, ආදිස්වරයහට වෘද්ධියි, ඍකාරස්ථාන යෙහි ඩක් වේ. ව්‍යාසාදිගණය වනාහි ව්‍යාස නිෂාද චණ්ඩාල විශ්ව සුධාතෘ ආදියයි.

(මූ-) ආත්‍රෙයඃ ශෞභ්‍රෙයඃ. ගාඞ්ගෙයඃ මාහෙයඃ යෞවතෙයඃ.

(ස-) අත්‍ර්‍යාදිය කියයි. අත්‍රෙරපත්‍යං ආත්‍රෙයඃ, ශුභ්‍රස්‍යාපත්‍යං ශෞභ්‍රෙයඃ. ආප්‍රත්‍යයාදිය කියයි, ගඞ්ගායා අපත්‍යං ගාඞ්ගෙයඃ, මහ්‍යා අපත්‍යං මාහෙයඃ, යුවත්‍යා අපත්‍යං යෞවතෙයඃ. සර්වස්ථානයෙහි ෂ්ණෙයප්‍රත්‍යය කළ කල්හි සුදුසු පරිද්දෙන් (258) ඉවර්ණ අවර්ණ දෙදෙනාට ලොප් වේ. අත්‍ර්‍යාදි ගණය වනාහි අත්‍රි ශුභ්‍ර පූරු මෘකණ්ඩු පාණ්ඩු කද්‍රූ බ්‍රහ්ම කුමාරිකා රොහිණී විමාතෘ විධවා රුක්මිණී ගොධා නවී යනාදියයි.

(මූ-) 420. **ඔර්ලොපො'කද්‍රූපාණ්ඩ්වොරෙයෙ.** (ඔඃ 6. ලොපඃ 1. අකද්‍රූ—පාණ්ඩ්වොඃ 6 .. එයෙ 7.)

උවර්ණස්‍ය එයෙ පරෙ ලොපඃ ස්‍යාත් නත්වනයොඃ. කාමණ්ඩලෙයඃ. තයොස්තු කාද්‍රවෙයඃ පාණ්ඩවෙයඃ.

(ස-) එයෙ පරෙ, එය යන්න පර කල්හි ; උවර්ණස්‍ය, උවර්ණයහට ; ලොපඃ ස්‍යාත්, ලොප් වන්නේය. අනයොස්තු, කද්‍රූ පාණ්ඩු යන දෙදෙනාගේ උකාරයහටවනාහි ; න, ලොප් නොවේ.

කමණ්ඩලොඃ කමණ්ඩල්වා වා අපත්‍යං කාමණ්ඩලෙයඃ. ඪ්ණෙයප්‍රත්‍යය කළ කල්හි මෙයින් උවර්ණ ලොපයයි. තයොස්තු, ඔවුන්ගේ වනාහි ; කද්‍රුවා අපත්‍යං කාද්‍රවෙයඃ, පාණ්ඩාරපත්‍යං පාණ්ඩවෙයඃ. දෙතන්හි උවර්ණ ලොපය නුවූ කල්හි (337) උවර්ණයහට ඔකාර වෙයි, ඔකාරස්ථානයෙහි (35) අව් වෙයි. කමණ්ඩලුශබ්දය චතුෂ්පාද බැවින් ජාතිවිශෙෂය වෙයි. [පාණිනිඃ 6. 4. 147.]

(මූ-) 421. **කල්‍යාණ්‍යාදි සුභගා දුර්භගා බන්ධකී රජකී බලිවර්දී ජ්‍යෙෂ්ඨා කනිෂ්ඨා මධ්‍යමා පරස්ත්‍ර්‍යනු සෘෂ්ට්‍යනු දෘෂ්ටි කුලටාභ්‍ය ඉනෙයඃ.** (කල්‍යාණී—කුලටාභ්‍යඃ 5...ඉනෙයඃ 1.)

සෞභාගිනෙයඃ දෞර්භාගිනෙයඃ.

(ස-) කල්‍යාණී-කුලටාභ්‍යඃ, කල්‍යාණී-සුභගා-දුර්භගා-බන්ධකී -රජකී-බලිවර්දී-ජ්‍යෙෂ්ඨා-කනිෂ්ඨා-මධ්‍යමා-පරස්ත්‍රී-අනුසෘෂ්ටි-අනුදෘෂ්ටි-කුලටා යන මේ ත්‍රයොදශ ශබ්දයන් කෙරෙන් පරවූ ෂෙණ්‍යප්‍රත්‍යයාගේ ස්ථානයෙහි ; ඉනෙයඃ, ඉනෙය වන්නේය.

අර්ථවශාත් විභක්තෙර්විපරිණාමඃ යන න්‍යාය හෙතුකොට ගෙන එයෙ යන සප්තම්‍යන්ත පදය ෂෂ්ඨ්‍යන්තව අනුවර්තනයයි. ස්ථානිවත් බැවින් වෘද්ධි, ස්ත්‍රීලිඞ්ගයෙහි ඊප්ද වේ. කුලටාශබ්දය මෙහි කුලය හරණලද පතිව්‍රතාව වාච්‍යයි. අසතිය වාච්‍ය කල්හි වනාහි (422) පරසූත්‍රයෙහි ප්‍රාප්ත වෙයි. කල්‍යාණ්‍යා අපත්‍යං කාල්‍යාණිනෙයඃ, ස්ත්‍රීලිඞ්ගයෙහි කාල්‍යාණිනෙයී යනාදිය වේ. සුභගායා අපත්‍යං සෞභාගිනෙයඃ, දුර්භගායා අපත්‍යං දෞර්භාගිනෙයඃ, දෙතන්හි (416) සුභගාදිබැවින් උභයපදයහට වෘද්ධියි. පරස්ත්‍රියා අපත්‍යං පාරස්ත්‍රෛණෙයඃ යන මෙහි (258) ඊවර්ණලොපය සෙදුනු කල්හි දුසුභගාදි

පාඨසාමර්ථ්‍යයෙන් (258) ඊකාරලොපය නොවේ, ඉදිරියෙහි (22) සන්ධිවූ කල්හි පසුව ඕහටම වෘද්ධියි. [පාණිනිඃ 4. 1, 126.]

(මු-) 422. **ක්‍ෂුද්‍රාගොධාභ්‍යො වෛරාරෞ.** (ක්‍ෂුද්‍ර-ගොධා භ්‍යඃ 5⋯ වා 1. ඓරාරෞ 1 ..]

නාටෙරඃ නාටෙයඃ, ගෞධෙරඃ ගොධාරඃ ගෞධෙයඃ.*

(ස-) ක්‍ෂුද්‍රාගොධාභ්‍යඃ, ක්‍ෂුද්‍රාවාචක ශබ්ද ගොධාදිගණ යන මොවුන් කෙරෙන්; වා, විකල්පයෙන්; ඓරාරෞ, ඪණ්‍ය ප්‍රත්‍යයාගේ ස්ථානයෙහි ඓර ආර යන මොව්හු වෙත්.

ක්‍ෂුද්‍රා යනු කුලශීලහීනයෝද අඞ්ගහීනයෝද වෙත්. ගොධාඃ යනු ගොධාදිගණයයි. මෙහි වාශබ්දය ව්‍යවස්ථාවාචී බැවින් ක්‍ෂුද්‍රාවාචී ශබ්දයන් කෙරෙන් පරවූ ඪණ්‍යප්‍රත්‍යයහට විකල්පයෙන් ඓර ආදෙශය වෙයි.

ගොධාදි ශබ්දයන් කෙරෙන් පරවූ ඪණ්‍යහට විකල්පයෙන් ඓර ආර දෙක වෙති. කුලශීල හීනයෝ දක්වනු ලැබෙත්, නටස්‍ය අපත්‍යං නාටෙරඃ, ඓරාදෙශනුවූ පක්‍ෂයෙහි නාටෙයඃ යනු වේ. කුලටායා අපත්‍යං කෞලටෙරඃ, විකල්පයෙන් කෞලටෙයඃ යනුද මෙසේමැයි. සතීවාච්‍යකල්හි වනාහි පූර්ව සූත්‍රයෙන් ඉනෙයාදෙශය වූ කල්හි කෞලටිනෙයඃ යනු වේ. දාස්‍යා අපත්‍යං දාසෙරඃ දාසෙයඃ යනාදියද මෙසේමැයි. අඞ්ගහීනයෝ මෙසේයි, කාණායා අපත්‍යං කාණෙරඃ කාණෙයඃ යනාදියයි. ගොධායා අපත්‍යං ගෞධෙරඃ ගෞධාරඃ යනු වේ, විකල්පයෙන් ගෞධෙයඃ යනුයි. [පාණිනිඃ 4. 1. 129, 131.]

(මු-) ගාර්ග්‍යඃ වාත්ස්‍යඃ ජාමදග්න්‍යඃ පාරාශර්‍ය්‍යඃ.

(ස-) ගර්ගාදීන් කියයි—ගර්ගස්‍යාපත්‍යං ගාර්ග්‍යඃ. වත්සස්‍යාපත්‍යං වාත්ස්‍යඃ, ජමදග්නෙරපත්‍යං ජාමදග්න්‍යඃ, පරාශරස්‍යාපත්‍යං පාරාශර්‍ය්‍යඃ. සියලුතන්හි ගර්ගාදි බැවින් ඤ්‍යප්‍රත්‍යය කළ කල්හි ආදිස්වරයහට වෘද්ධිවූ කල්හි (258) ලැබෙන පරිද්දෙන් ඉවර්ණ අවර්ණ දෙකට ලොපයි. ස්ත්‍රීලිඞ්ගයෙහි (259) යකාරලොපය කළකල්හි ගාර්ගී යනාදිය වෙයි.

(මු-) 423. **ඔදෞතො'ජ්වත් තකාද්‍ය—ක්‍යඞ්‍යඃ.** (ඔත්-ඖතඃ 5. අච්වත් 1. තකාද්‍ය-ක්‍ය-ඞ්‍යඃ 1. .)

---

* ක්‍ෂුද්‍රාශ්ච ගොධාශ්ච තාභ්‍යඃ, ඓරශ්ච ආරශ්ච ඓරාරෞ.

ඔදෞද්භ්‍යං පරස්තසංඥඃ කෘත්සංඥකශ්ච යඃ ක්‍යධ්‍යෞ ච අජ්වත් ස්‍යාත්.*

(ස-) ඔදෞද්භ්‍යං, ඔකාර ඖකාර දෙදෙනා කෙරෙන් ; පරඃ, පරවූ ; තසංඥකඃ, තද්ධිතසංඥ වූද ; කෘත්සංඥකශ්ච ; කෘත්සංඥ වූද ; යඃ, යකාරයද ; ක්‍යධ්‍යෞ ච, නාමධාතුයෙහි වූ ක්‍යප්‍රත්‍යය හා ධ්‍යප්‍රත්‍යය යන දෙක්හි යකාරයද ; අජ්වත්; අච්සංඥ ලද්දවුන් මෙන් ; ස්‍යාත්, වන්නේය.

(මු-) බාභ්‍රව්‍යඃ.

(ස-) බභ්‍රෝරපත්‍යං බාභ්‍රව්‍යඃ, මෙහි බභ්‍රුශබ්දයා කෙරෙන් ෂ්ණ්‍ය කළ කල්හි (337) උකාරයහට ඔකාරද ; මෙයින් යකාරයහට අච්වත්ද කළකල්හි (35) ඔකාරහට අව්ද වේ. නාවා තාර්‍යං නාව්‍යං යන මෙහිද (429) ෂ්ණ්‍යප්‍රත්‍යය කළ කල්හි, මෙයින් ස්වරතුල්‍යත්වයද ඖ ස්ථානයෙහි ආව් ආදෙශ වද සිඩයි. කෘත්ප්‍රත්‍යයාගේ යකාරය පරකල්හි සතව්‍යං භාව්‍යං යනාදිය සිඩයි. ගාමිච්ඡති ගව්‍යති, නාවමිච්ඡති නාව්‍යති යන මෙහි (843) ක්‍යප්‍රත්‍යය කළ කල්හි යකාරය අච්වත් වෙයි. ගෞරිවාචරති ගව්‍යතෙ, නෞරිවාචරති නාව්‍යතෙ යන දෙතන්හි (848) ධ්‍යප්‍රත්‍යය වූ කල්හි ස්වර වැනි වෙයි.

(මු-) නාඩායනඃ ගාර්ගීයණඃ දාක්ෂායණී. පෛතෘෂ්වස්‍රියඃ මාතෘෂ්වස්‍රියඃ. රෛවතිකඃ, ආශ්වපාලිකඃ. යාදවඃ ආඞ්ගිරසඃ.

(ස-) නඩාදි සතර ක්‍යයි, නඩස්‍යාපත්‍යං නාඩායනඃ, ගාර්ගී‍ස්‍යාපත්‍යං ගාර්ගීයණඃ, දක්ෂස්‍යාපත්‍යං ස්ත්‍රී දාක්ෂායණී, සියලු තන්හි නඩාදි බැවින් ෂ්ණායන ප්‍රත්‍යය වේ. නඩාදියද ප්‍රයොග වශයෙන් දතයුතු. පිතෘෂ්වසුරපත්‍යං පෛතෘෂ්වස්‍රියඃ, මාතෘෂ්වසුරපත්‍යං, මාතෘෂ්වස්‍රියඃ, දෙතන්හි පිතෘෂ්වස්‍රාදි බැවින් ෂ්ණීයප්‍රත්‍යයයි. රෙවත්‍යා අපත්‍යං රෛවතිකඃ, අශ්වපාලස්‍යාපත්‍යං ආශ්වපාලිකඃ, දෙතන්හි රෙවත්‍යාදි බැවින් ෂ්ණිකප්‍රත්‍යයයි. වාරපාලිකඃ යනාදියද මෙසේමැයි. යදෝරපත්‍යං යාදවඃ, අඞ්ගිරසො'පත්‍යං ආඞ්ගිරසඃ. රඝොරපත්‍යං රාඝවඃ යනාදියෙහිද මෙසේම ශෙෂය බැවින් ෂ්ණ ප්‍රත්‍යය වේ.

---

* ඔච්ච ඖච්ච තස්මාත්. අච් ඉව අජ්වත්, තශ්ච කෘච්ච තෞ, තයොර්යඃ තකෘද්යඃ, තකෘද්යශ්ච ක්‍යශ්ච ධ්‍යශ්ච තෙ.

(මූ-) 424. **මන්වර්ජාන්වර්මෝක්ෂස්‍යෙනෝ'ධ්වාත්මනෝ'පත්‍යෂ්ණෙ'විකාරෂ්ණභාවකර්මය ඊනෙ න න-ලොපඃ.** (මන්වර්ජ්ජාන්වර්ම්මෝක්ෂස්‍යනඃ 6. අනඃ 6. අධ්වාත්මනඃ 6. අපත්‍යෂ්ණෙ 7. අවිකාරෂ්ණභාවකර්ම්මයෙ 7. ඊනෙ 7. න 1. න-ලොපඃ 1.)

මන්වර්ජ්ජස්‍යතෙනා වර්ම්මණඃ උක්ෂ්ණඃ ස්‍යාත්—පරස්‍යෙනාශ්ච අපත්‍යාර්ථ-ෂ්ණෙ, අනෙනා විකාරාර්ථවර්ජ්ජ ෂ්ණෙ භාවකර්ම්මාර්ථ වර්ජ්ජ යෙ ච, අධ්වාත්මනොරීනෙ, න-ලොපො න ස්‍යාත්. සාජ්වනඃ භාද්‍රවර්ම්මණඃ ඖක්ෂ්ණඃ චාක්‍රිණඃ.*

(ස-) අපත්‍යාර්ථෂ්ණෙ, අපත්‍යාර්ථ ෂ්ණප්‍රත්‍යයා පරකල්හි ; මන් වර්ජ්ජස්‍ය, මන්යන්නරහිතවූ ; අනඃ, අන්යන්නහුගේද ; වර්ම්මණඃ, වර්ම්මන් ශබ්දයාගේද ; උක්ෂ්ණඃ, උක්ෂන් ශබ්දයාගේද ; ස්‍යාත් පරස්‍ය, සංයොගයා කෙරෙන් පරවූ ; ඉනශ්ච, ඉන් යන්නහුගේද; විකාරාර්ථවර්ජ්ජ ෂ්ණෙ, විකාරාර්ථය රහිතවූ ෂ්ණ ප්‍රත්‍යයා පරකල්හිද; භාවකර්ම්මාර්ථවර්ජ්ජ යෙ ච, භාවාර්ථ කර්ම්මාර්ථ

---

* මනං වර්ජයතීති මන්වර්ජඃ (1009) මන්වර්ජශ්චාසෞ අන් චෙති මන්වර්ජාන්. ස්‍යඃ සංයොගඃ, ස්‍යාදින් ස්‍යන්. මන්වර්ජාන් ච වර්ම ච උක්ෂා ච ස්‍යන් ච මන්වර්ජාන් වර්මෝක්ෂස්‍යන් තස්‍ය. අධ්වා ච ආත්මා ච තස්‍ය. අපත්‍යෙ ෂ්ණඃ අපත්‍යෂ්ණ ස්තස්මින්. න විකාරො'විකාරඃ, අවිකාරෙ ෂ්ණඃ අවිකාරෂ්ණඃ, භාවශ්ච කර්ම ච භාවකර්මණී න භාවකර්මණී අභාවකර්මණී, අභාවකර්මණොර්යඃ අභාවකර්මයඃ, අවිකාරෂ්ණශ්ච අභාවකර්මයශ්ච අවිකාරෂ්ණභාවකර්මයං තස්මින්. මෙහි විකාරාර්ථය රහිතවූ ෂ්ණප්‍රත්‍යය පර කල්හි සියලු අන්අන්තයන්ගේ නකාරලොපය නිෂෙධ කල්හි, අපත්‍යාර්ථෂ්ණප්‍රත්‍යයා පර කල්හි මන් අන්තයාගේ නකාරලොපය සඳහා මන්වර්ජාන් යනු කියයි, අපත්‍ය ෂ්ණප්‍රත්‍යයා පරකල්හි මන් යන්න රහිත වූම අන් අන්තයාගේ නලොපය නිෂෙධයි, මන් අන්තය හට වනාහි නලොපය වන්නේමය, අපත්‍යාර්ථය රහිතවූ ෂ්ණ ප්‍රත්‍යයා පරකල්හි වනාහි මන් අන්තයහටද නකාරලොපය නිෂෙධවෙයි. මන් අන්තය වර්ජිත බැවින් වර්මන්හුගේද නකාරලොපය ප්‍රාප්තකල්හි ඔහුගේ නකාරලොප නිෂෙධය සඳහා නැවත වර්මන් ශබ්දයාගේ ග්‍රහණයයි. උක්ෂන් ශබ්දයාගේ මෙහි ග්‍රහණය නියමය සඳහාමය, එහෙයින් උක්ෂන් ශබ්දයාගේ නකාරලොපනිෂෙධය අපත්‍යෂ්ණ පර කල්හිම වෙයි, අන්‍යෂ්ණ පර කල්හි නලොපය වන්නේමය.

රහිතවූ සකාරයා පරකල්හිද ; අනඃ, අන්යන්නහුගේද ; ඊනෙ, ඊනප්‍රත්‍යයා පරකල්හි ; අධ්වාත්මනඃ, අධ්වන් ආත්මන් ශබ්ද දෙදෙනාගේද ; නලොපඃ, නකාරලොපය ; න සන්, නොවන්නේය.

(මූ-) ශෛවඃ වාශිෂ්ඨඃ.

(ස-) ශිවාදීන් කියයි—ශිවස්‍යාපත්‍යං ශෛවඃ, වශිෂ්ඨස්‍ය පත්‍යං වාශිෂ්ඨඃ. ශිවාදිය වනාහි ශිව-වශිෂ්ඨ-යස්ක-කකුත්ස්ථ- ඉක්ෂ්වාකු-භූමි-සපත්නී-ඌර්ණනාභ ආදියයි.

(මූ-) 425. සඞ්ඛ්‍යාසංභද්‍රාන්මාතුරුච් ෂ්ණෙ. (සඞ්ඛ්‍යා-සං-භද්‍රාත් 5. මාතුඃ 6. උර් 1. ෂ්ණෙ 7.)

ද්වෛමාතුරඃ.*

(ස-) ෂ්ණෙ, ෂ්ණප්‍රත්‍යයා පර කල්හි ; සඞ්ඛ්‍යා සංභද්‍රාත්, සඞ්ඛ්‍යාවාචක ශබ්ද සම්සබ්ද භද්‍රශබ්ද යන මොවුන් කෙරෙන් පරවූ ; මාතුඃ, මාතෘශබ්දයහට ; උර්, උර් ආදෙශ වේ.

ඉත්සංඥ ඩකාර බැවින් අන්ත්‍යයාගේ ස්ථානයෙහි වේ. ද්වයොර්මාත්‍රොරපත්‍යං ද්වෛමාතුරඃ, මෙහි තද්ධිතාර්ථ විෂයෙහි වූ ද්විගුසමාසයෙහි වෙයි. ශෙෂය බැවින් ෂණ්ප්‍රත්‍යය කළ කල්හි එකපදයවූ බැවින් ද්විශබ්දයාගේ ඉකාරයහට (416) වෘද්ධියි. තිසෘණාං මාතෘණාමපත්‍යං ත්‍රෛමාතුරඃ, ෂණ්ණාං

යජ්වනොʻපත්‍යං යාජ්වනඃ, භද්‍රවර්මණොʻපත්‍යං භාද්‍රවර්මණඃ, දෙතන්හි ශෙෂය බැවින් ෂණ්ප්‍රත්‍යයයි, මේ සූත්‍රයෙන්නලොප නිෂෙධයයි. මන් අන්ත්‍යයහට වනාහි සුසාම්නොʻපත්‍යං සෞසාමඃ යනාදියයි. අපත්‍යෙෂණ් යනු කුමටද? චර්මණා පරිවෘතො රථඃ චාර්මණඃ. උක්ෂ්ණොʻපත්‍යං ඖක්ෂ්ණඃ. (435) උඩ්ලොපයයි, අපත්‍යාර්ථ නුවූ ෂණ් පරකල්හි වනාහි, උක්ෂ්ණ ඉදං ඖක්ෂං චර්ම. චක්‍රිණොʻපත්‍යං චාක්‍රිණඃ, ශාඞ්ගිනඃ, දාණ්ඩිනඃ යනාදියද මෙසේමැයි, සංයොගයා කෙරෙන් පරවූ ඉන්යන්න හුගේ නකාරලොපය නිෂෙධයි. අවිකාර ෂණ් පරකල්හි අන් යන්නහට උදාහරණ මෙසේයි—බ්‍රහ්ම ජානාති බ්‍රාහ්මණඃ, සාම්න ඉදං සාමනං යනාදියයි. භාවකර්මරහිතවූ ය පරකල්හි මෙසේයි, මූර්ධ්නි භවඃ මූර්ධන්‍යඃ, බ්‍රහ්මණි සාධුඃ බ්‍රහ්මණ්‍යඃ යනාදියයි.

* සඞ්ඛ්‍යා ච සම් ච භද්‍රශ්ච තස්මාත්.

මාත්‍ෘණමපත්‍යං ෂාණ්මාතුරඃ, යනුද මෙසේමැයි. සංමාතුර පත්‍යං සාංමාතුරඃ, භද්‍රමාතුරඃ යනුද මෙසේමැයි.

(මූ-) 426. නන් පුංසත්‍රියොඃ. (නන් 1. පුංසත්‍රියොඃ 6 ..)

පෞංස්නඃ ස්ත්‍රෛණඃ.

(ස-) පුංසත්‍රියොඃ, ෂණ්ප්‍රත්‍යයා පරකල්හි පුංසශබ්ද ස්ත්‍රී ශබ්ද යන මේ දෙදෙනාගේ ස්ථානයෙහි ; නන්, නන්ආගම වන්නේය. ඉත්සංඥ නකාරබැවින් අන්තයෙහි වේ, නකාරය අකාරාන්තයි. පුංසො'පත්‍යං පෞංස්නඃ, ස්ත්‍රියා අපත්‍යං ස්ත්‍රෛණඃ, දෙතන්හිම ෂණ්ප්‍රත්‍යය කළකල්හි නන්ආගමයද (416) වෘද්ධිද කොට (258) අකාරලොපය දතයුතු. ඉදං යනාදි අර්ථයෙහි ෂණ් කළකල්හිද එසේම වෙයි, මෙසේයි—පුංස ඉදං පෞංස්නං, ස්ත්‍රීණං සමූහඃ ස්ත්‍රෛණං.

(මූ-) 427. කුඤ්ජාදෙර්ණායනො'ස්ත්‍රිබෙබ'පත්‍යෙ. (කුඤ්ජාදෙඃ 5. ණායන්‍යඃ 1. අස්ත්‍රිබෙබ 7. අපත්‍යෙ 7.)

කුඤ්ජාදෙරපත්‍යඑව ණායන්‍යඃ ස්‍යාත් න තු ස්ත්‍රියාං න ච බෙව.

කෞඤ්ජායන්‍යඃ බ්‍රාධ්නායන්‍යඃ. ස්ත්‍රීබෙබ තු කෞඤ්ජායනී කෞඤ්ජායනාඃ.*

(ස-) කුඤ්ජාදෙඃ, කුඤ්ජාදිගණයා කෙරෙන් ; අපත්‍යඑව, අපත්‍යාර්ථයෙහි ; ණායන්‍යඃ ස්‍යාත්, ණායන්‍යප්‍රත්‍යය වන්නේය ; ස්ත්‍රියාං, ස්ත්‍රීලිඞ්ගයෙහිද ; ච්වෙ තු, බහුවචනයෙහිද යන මෙහි වනාහි ; න, ණායන්‍යප්‍රත්‍යය නොවේ.

කුඤ්ජාදිය නඩාදියෙහි ඇතුළත් ගණයෙකි, ණායන්‍ය ප්‍රත්‍යය විසින් ෂ්ණායන ප්‍රත්‍යය බාධාකරණු ලැබේ. කුඤ්ජ ස්‍යාපත්‍යං කෞඤ්ජායන්‍යඃ, බ්‍රධ්නස්‍යාපත්‍යං බ්‍රාධ්නායන්‍යඃ. ඉත්සංඥ ණකාර බැවින් ආදිස්වරයහට වෘද්ධියි. ස්ත්‍රීබෙබ තු, ස්ත්‍රීත්‍ව බහුවචන දෙක්හි වනාහි ; කුඤ්ජස්‍යාපත්‍යං ස්ත්‍රී කෞඤ්ජායනී, කුඤ්ජස්‍යාපත්‍යානි පුමාංසඃ කෞඤ්ජායනාඃ. මේ දෙතන්හි නඩාදි බැවින් ෂණායනප්‍රත්‍යයමය. කුඤ්ජාදිය වනාහි—කුඤ්ජ බ්‍රධ්න ශඞ්ඛ බුධ යනාදියයි.

---

* ස්ත්‍රී ච ච්වශ්ච ස්ත්‍රිච්වං, න ස්ත්‍රීච්වං අස්ත්‍රිච්වං තස්මින්.

(මු-) 428. **ගර්ගයස්කවිදාදි—භෘග්වත්‍රිකුත්සාඞ්ගිරොවශිෂ්ඨ ගොතම රූඪාත් ලුක් චෙව'ස්ත්‍රියාං.** (ගර්ග—රූඪාත් 5. ලුක් 1. චෙව 7. අස්ත්‍රියාං 7.)

දෙශතුල්‍යාඛ්‍යඃ ක්ෂත්‍රියො රූඪඃ. එභ්‍යඃ පරෙෂාමුක්තානාං ත්‍යානාං චෙව විහිතානාං ලුක් ස්‍යාත් න තු ස්ත්‍රියාං.*

(ස-) දෙශතුල්‍යාඛ්‍යඃ, දෙශතුල්‍යවූ නම් ඇති ; ක්ෂත්‍රියඃ, ක්ෂත්‍රියතෙම ; රූඪඃ, රූඪනම්. එභ්‍යඃ පරෙෂාං, ගර්ගාදි යස්කාදි විදාදි භෘගු අත්‍රි කුත්ස අඞ්ගිරස් වශිෂ්ඨ ගොතම රූඪ යන මොවුන් කෙරෙන් පරවූ ; චෙව විහිතානාං, බහ්වර්ථයෙහි කරණලද්දාවූ ; උක්තානාං ත්‍යානාං, කියනලද ප්‍රත්‍යයන්ට ; ලුක් ස්‍යාත්, ලොප් වන්නේය ; ස්ත්‍රියාං තු, ස්ත්‍රීලිඞ්ගයෙහි වනාහි ; න, ප්‍රත්‍යයන්ට ලොප් නොවේ.

වඞ්ග යනු දෙශවිශෙෂයෙකි, වඞ්ගං පාති යන වාක්‍යයෙහි (429) ෂණ්ප්‍රත්‍යය කළ කල්හි වාඞ්ගඃ යනු වේ, රාජාදියයි. උක්තානාං ත්‍යානාං යනු අපත්‍යාර්ථ ප්‍රත්‍යයන්ටය යන අර්ථයි. ලොප්කිරීම හෙතුකොටගෙන (93) ත්‍යලොපෙ ත්‍යලක්ෂණං යන න්‍යායයෙන් වෘද්ධ්‍යාදිය නොවන්නේය.

(මු-) ගර්ගාඃ වත්සාඃ යස්කාඃ ලහ්‍යාඃ, විදාඃ උර්වාඃ, භෘගවඃ අත්‍රයඃ කුත්සාඃ අඞ්ගිරසඃ වශිෂ්ඨාඃ ගොතමාඃ, අඞ්ගාඃ වඞ්ගාඃ කලිඞ්ගාඃ. ස්ත්‍රියාන්තු භාර්ග්‍යඃ.

(ස-) ගර්ගස්‍යාපත්‍යානි වත්සස්‍යාපත්‍යානි, මේ දෙතන්හි ගර්ගාදි බැවින් ෂණ්‍යප්‍රත්‍යයහට මෙයින් ලොප්වේ. යස්කස්‍යාපත්‍යානි ලහ්‍යස්‍යාපත්‍යානි යන මෙහි යස්කාදි බැවින් ෂණ්‍යහට මෙයින් ලොප්වේ, යස්කාඃ ලහ්‍යාඃ යනු වේ. විදස්‍යාපත්‍යානි උර්වස්‍යාපත්‍යානි යන මෙහි විදාදි බැවින් මෙයින් ප්‍රත්‍යයහට ලොප් වේ, විදාඃ උර්වාඃ යනු වේ. භෘගොරපත්‍යානි යන මෙහිද ප්‍රත්‍යයහට මෙයින් ලොප් වේ, භෘගවඃ යනු වේ. යස්කාදියද විදාදියද ශිවාදියෙහි ඇතුළත් ගණ දෙකෙකි. යස්කාදිය මෙසේයි, යස්ක පුෂ්කර කඤ්ක මඤ්ඡක ලහ්‍යරක්ෂා

* ගර්ගශ්ච යස්කශ්ච විදශ්ච තෙ ආදයො යෙෂාං තෙ ගර්ගයස්කවිදාදයඃ. ආදිශබ්දය එකක් පාසා සම්බන්ධ බැවින් ගර්ගාදි යස්කාදි විදාදයඃ යනු අර්ථයි. තෙ ච භෘගුශ්ච අත්‍රිශ්ච කුත්සශ්ච අඞ්ගිරාශ්ච වශිෂ්ඨශ්ච ගොතමශ්ච රූඪශ්ච තස්මාත්. දෙශෙන තුල්‍යා ආඛ්‍යා යස්‍ය සඃ දෙශතුල්‍යාඛ්‍යඃ.

මුඛ ක්‍රෞෂ්ටුපාද යනාදියයි. විදාදිය මෙසේයි, විද පුත්‍ර උර්ව කාශ්‍යප කුශික භරවාජ උපමන්‍යු ආපස්තම්බ ශරවත් රථන්තර විශ්වානර යන මොවුන් මුල්කොට ඇත්තාහුයි. අත්‍රෙරපත්‍යානි, මෙහි ෂෙණියප්‍රත්‍යයහට මෙයින් ලොප් වේ, අත්‍රයඃ යනු වේ.

කුත්සස්‍යාපත්‍යානි අඞ්ගිරසො'පත්‍යානි වශිෂ්ඨස්‍යාපත්‍යානි ගෞතමස්‍යාපත්‍යානි යන මෙහි ෂණ්ප්‍රත්‍යය හට ලොප් වේ, කුත්සාඃ අඞ්ගිරසඃ වශිෂ්ඨාඃ ගෞතමාඃ යනු වේ. අඞ්ගස්‍ය රාඥෝ'පත්‍යානි, එසේම වඞ්ගස්‍යාපත්‍යානි කලිඞ්ගස්‍යාපත්‍යානි යනාදියෙහි ෂණ්ප්‍රත්‍යයහට මෙයින් ලොප් වේ, අඞ්ගාඃ වඞ්ගාඃ කලිඞ්ගාඃ යනු වේ. කිසි තැනෙක්හි ප්‍රසිද්ධ ක්‍ෂත්‍රියද රූඪයයි කියයුතු. මෙසේයි—රඝූනාමන්වයං වක්‍ෂ්‍ය, ඉක්ෂ්වාකූණාම්දං හි කුලව්‍රතං කියාද රඝුවංශයෙහි වෙයි. නාථො යදූනාම් යී උද්භටතෙම කියයි. අස්ත්‍රියාං යනු කුමටද? භෘගොරපත්‍යානි ස්ත්‍රියඃ යන මෙහි ෂණ්ප්‍රත්‍යයහට ලොප්නුවූ කල්හි භාර්ගවීශබ්දයා කෙරෙන් ජස්විභක්ති කළ කල්හි භාර්ගව්‍යඃ කියා වන හෙයිනි. අපත්‍යාර්ථප්‍රත්‍යයානාං යනු කුමටද? භෘගොරිමෙ භාර්ගවාඃ මන්ත්‍රාඃ යනාදියෙහි අපත්‍යාර්ථය නොවන හෙයින් ෂණ්ප්‍රත්‍යයහට ලොප් නොවේ. එසේම ප්‍රියා ගාර්ගී යස්‍ය ස ප්‍රියගාර්ගීඃ යන මෙහි සමූහයාගේ එකත්වය ඇති කල්හිද ගාර්ගී ශබ්දයාගේ බහුත්වය ඇති කල්හි ප්‍රයුක්තභාවයෙන් ෂණ්‍යප්‍රත්‍යයාගේ ලොපය වේමය. එසේම ප්‍රියො ගාර්ගෝ යෙෂාං තෙ ප්‍රියගාර්ග්‍යාඃ, යන මෙහි සමූහයාගේ බහුත්වය ඇති කල්හිද ගාර්ගීශබ්දයාගේ එකත්වය ඇති කල්හි ප්‍රයුක්ත බැවින් ෂණ්‍යහට ලොප් නොවේ. ප්‍රියයස්කාඃ ප්‍රියයාස්කාඃ යනාදිහුද එසේමැයි.

(මු-) 429. **ඪසෙ කාත් ෂ්ණ්කකණ්ණ්ණෙයාශ්වානිතශ්ච.** (ඪසෙ 7. කාත් 5. ෂ්ණ්ක කණ් ණ් න ඉයාඃ 1...ච 1. අනිතඃ 1...ච 1.)

කාත් පරා එතෙ පූර්වෙ ච සෙතො'නිතශ්ච ස්‍යුඃ ඪෙ සෙ ච වාච්‍යඃ.*

---

* ඪස්ද්ව සශ්ච ඪසං තස්මින්. ෂ්ණ්කශ්ච කණ් ච ණ්නශ්ච ඉයශ්ච තෙ. නාස්ති ඉත් යෙෂාං තෙ අනිතඃ.

(ස-) කාත් පරඃ, කාරකයා කෙරෙන් පරවූ; එතෙ, ෂ්ණික-කණ්-ණීන-ඉය යන මොව්හුද ; පූර්‍වෙ ච, පළමු කියනලද සප්තප්‍රත්‍යයෝද ; සෙතඃ. ඉත්සහිතයෝද ; අනිතශ්ච, ඉත් රහිතයෝද ; ශේෂෙ ච වාච්‍යෙ, කර්‍මයද කර්‍තෘහුද වාච්‍යකල්හි; ස්‍යුඃ, වන්නෝය. ණීනෙයශ්ච යන චකාරය කරණකොට ගෙන පූර්‍වෝක්ත ෂ්ණික මුල්වූ ප්‍රත්‍යයෝ සමුච්චය කරණු ලැබෙත්. අනිතශ්ච යන චකාරය කරණකොටගෙන සෙතඃ යන අන්‍යවිශෙෂණය සමුච්චය කරණු ලැබේ. එහෙයින් ප්‍රත්‍යයඑකොළස සියලුකාරකයන් කෙරෙන් කර්‍මයද කර්‍තෘද වාච්‍ය කල්හි වෙත්, ප්‍රයොගානුසාරයෙන් කිසිතැන්හි ඉත්රහිත යෝද වන්නාහුය යන අර්‍ථයි. ඉත්රහිතාඃ යනු කියනබැවින් (416) ඉත්ණකාරවත් තද්ධිතයා පරකල්හි වෘද්ධි නොවන්නීය. අර්‍ථවිශෙෂයෙහි ප්‍රත්‍යයවිශෙෂය වනාහි අභිධානය හෙතු කොටගෙන දතයුතු.

(මු-) තර්‍කං වෙත්ති අධීතෙ වා තාර්‍කිකඃ, පදකඃ, ක්‍රමකඃ, වෛයාකරණඃ ; වාචා කෘතං වාචිකං, පාණිනීයං ; ශක්ත්‍යා යුධ්‍යතෙ'සෞ ශාක්තීකඃ, යාෂ්ටිකඃ ; තිෂ්‍යෙණ යුක්තා රාත්‍රිඃ තෛෂී, පෞෂී. ක්ෂත්‍රාය සාධුඃ ක්ෂත්‍රියඃ, යඥාය හිතං යඥියං, මථුරායා ආගතඃ මාථුරඃ ; ඉහ හවං ඓහිකං, කාදාචිත්කං, ග්‍රාමීණඃ, ග්‍රාම්‍යඃ, මූර්ධන්‍යඃ, නාදෙයඃ, ශාලීයඃ, නාගරඃ, අග්‍ර්‍යඃ.

(ස-) තර්‍කං වෙත්ති අධීතෙ වා යන වාක්‍යයෙහි තර්‍කං යන මේ කර්‍මකාරකයා කෙරෙන් කර්‍තෘ වාච්‍යකල්හි මෙයින් ෂ්ණිකප්‍රත්‍යය වේ, වෘද්ධි කළ කල්හි තාර්‍කිකඃ යනු වේ. පදං වෙත්ති අධීතෙ වා පදකඃ යනුද, ක්‍රමං වෙත්ති අධීතෙ වා ක්‍රමකඃ යනුද මෙසේයි, මේ දෙතැන්හි ඉත්රහිත කණ්ප්‍රත්‍යය වේ. ව්‍යාකරණං වෙත්ති අධීතෙ වා වෛයාකරණඃ, මෙහි ව්‍යාකරණශබ්දයා කෙරෙන් ෂණ්ප්‍රත්‍යය කළ කල්හි (417) යකාරස්ථානයෙහි ඉම් වේ, ඕහට වෘද්ධියි. වාචා කෘතං වාචිකං, මෙහි වාචා යනමේ කරණ කාරකයා කෙරෙන් කර්‍මය වාච්‍ය කල්හි ෂ්ණිකප්‍රත්‍යය වේ, (431) මෙහි තදංතසෞ යන මේ ආදියෙන් පදාන්තත්වය නිෂෙධ බැවින් (211) විරාම රහිත කල්හි කුඩ් ආදිය නොවේ. පාණිනිනා කෘතං පාණිනීයං, මෙහි පාණිනිනා යන කර්‍තෘකාරකයා කෙරෙන් කර්‍මය වාච්‍ය කල්හි ණීයප්‍රත්‍යය වෙයි. ශර්‍වවර්‍මණා කෘතං ශාර්‍වවර්‍මිකං යනාදියද මෙසේමැයි. ශාක්තීකඃ යන මෙහි කරණකාරකයා කෙරෙන් කර්‍තෘ වාච්‍ය

කල්හි ඡ්ණීක වෙයි. යෂ්ට්‍යා යුධ්‍යතෙ අසෞ යාෂ්ටීකඃ. තිෂ්‍යෙණ නක්‍ෂත්‍රෙණ යුක්තා රාත්‍රිඃ තෛෂී, පුෂ්‍යෙණ නක්‍ෂත්‍රෙණ යුක්තා රාත්‍රිඃ පෞෂී, දෙතන්හි තිෂ්‍යෙණ පුෂ්‍යෙණ යන කර්තෘ කාරකයා කෙරෙන් කර්මය වාච්‍ය කල්හි ෂණ්ප්‍රත්‍යයයි, වෘද්ධි කළ කල්හි, (260) යකාරලොපය වේ, (257) ෂිත්බැවින් ඊප් වේ. ක්‍ෂත්‍රියඃ යඥියං, යන මේ දෙතන්හි තාදර්ථ්‍යයෙහිද හිත ශබ්දයොගයෙහිද චතුර්ථ්‍යන්තවූ කාරක රහිතයා කෙරෙන්ද ඉයප්‍රත්‍යය වේ, සූත්‍රයෙහි කාරකාත් යන්න වනාහි ප්‍රධානෙන ව්‍යපදෙශා භවන්ති යන න්‍යාය හෙතුකොටගෙන කියනලද්දේය.

(308) ස්වාමීශ්වරාධිපති යන මේ ආදියෙන් සම්බන්ධ විවක්‍ෂායෙහිම ෂෂ්ඨී සප්තමී විධාන හෙයින් ක්‍ෂත්‍රාය සාධුඃ යන මෙහි නිමිත්තාර්ථයෙහි චතුර්ථියි. මාථුරඃ යන මෙහි මථුරායාඃ යන අපාදානකාරකයා කෙරෙන් කර්තෘ වාච්‍ය කල්හි ෂණ් වේ. ඉහ යන අධිකරණකාරකයා කෙරෙන් කර්තෘ වාච්‍ය කල්හි ඡ්ණීකප්‍රත්‍යයව ඓහිකං, කදාචිත් භවං කාදාචිත්කං යනුද මෙසේමැයි, මෙහි කණ්ප්‍රත්‍යයයි. ග්‍රාමෙ භවඃ ග්‍රාමීණඃ, මෙහි ණීනප්‍රත්‍යයයි. ග්‍රාමෙ භවඃ ග්‍රාම්‍යඃ, මෙහි ෂණ්‍යප්‍රත්‍යයයි; මූර්ධ්නි භවො මූර්ධන්‍යඃ, මෙහි ෂණ්‍ය කළ කල්හි (424) න ලොප නිෂෙධය වේ. නද්‍යාං භවො නාදෙයඃ, මෙහි ෂෙණයප්‍රත්‍යයයි; ශාලායාං භවඃ ශාලීයඃ, මෙහි ණීයප්‍රත්‍යයයි; නගරෙ භවො නාගරඃ, මෙහි ෂණ්ප්‍රත්‍යයයි; අග්‍රෙ භවඃ අග්‍ර්‍යඃ, මෙහි ෂණ්‍ය ප්‍රත්‍යයයි. මේ උදාහරණයන් කෙරෙහි ලැබෙන පරිද්දෙන් ඉවර්ණ අවර්ණයන්ගේ ලොපය වෙයි, ප්‍රත්‍යයෝද ඉත්යුක්ත වූවෝද ඉත්යුක්ත නුවූවෝද දතයුත්තාහ. මෙසේ ප්‍රයොගානුසාරයෙන් කාරකයා කෙරෙන් කර්තෘද කර්මයද වාච්‍ය කල්හි ප්‍රත්‍යයෝ වන්නෝය.

(මු-) 430. **ව්‍යොර්ලොපො'නාරච්ඡශ්වතො'ච්‍ය'යෞ.** (ව්‍යොඃ 6. ලොපඃ 1. අනාරාත්—ශශ්වතඃ 6. අචි—යෙ 7. අයෞ 7.) පෞනඃ පුනිකඃ, වාහ්‍යඃ වාහිකඃ.*

---

* ව්‍යස්‍ය විඃ ව්‍යවිසන්තස්‍ය. ආරාච්ච ශශ්වච්ච තත්, න තත් අනාරාච්ඡශ්වත් තස්‍ය. අච්ච යශ්ච අච්‍යං තස්මින්. නාස්ති යුර්යස්මින් අයුස්තස්මින්.

(ස-) අයෙ‍්‍ය, යුප්‍රත්‍යය රහිතවූ ; අවෙ‍්‍ය, තද්ධිතයෙහි වූ ස්වර යද යකාරයාද පර කල්හි ; අනාරාවජශ්වතඃ, ආරාත්ශබ්ද ශශ්වත්ශබ්ද රහිතවූ ; ව්‍යවෙඃ, අව්‍යයශබ්දයාගේ ටිසංඥයහට ; ලොපඃ, ලොප් වන්නේය.

පුනඃපුනගීවඃ යන වාක්‍යයෙහි (429) ෂ්ණිකප්‍රත්‍යය කොට (416) වෘද්ධි කොට මෙයින් ටිලොපය කළ කල්හි පෞනඃ පුනිකඃ යනු වේ. වහිර්හිවඃ යන වාක්‍යයෙහි ෂණ්‍ය ෂ්ණිකප්‍රත්‍ය යන් කොට වෘද්ධි කොට ටිලොපය කළ කල්හි වාහ්‍යඃ වාහිකඃ යනු වේ. සායං ප්‍රාතර්භවඃ සායම්ප්‍රාතිකඃ යනාදියද මෙසේසි. අයෙ‍්‍ය කිං, අයෙ‍්‍ය යනු කුමටය? ශංයුඃ යන තන්හිද අභංයුඃ යන තන්හිද යු පරකල්හි ටිසංඥයහට ලොප් නොවන පිණිසයි. ආරාත්-ශශ්වත් දෙදෙනාහට උදාහරණ පරසූත්‍රයෙහි දෙනලදී. මෙහි ආරාත්-ශශ්වත් දෙදෙනා වර්ජිත බැවින් අව්‍යය ලද කල්හි නැවත ව්‍ය යන්නහුගේ ග්‍රහණය කිසි තන්හි අව්‍යයයාගේ ටිලොපාභාවය ඇඟවීම පිණිසයි, එහෙයින්—සුෂ්ඨු භාවඃ සෞෂ්ඨවං, ශං විද්‍යතෙ'ස්‍ය ශංයඃ එසේම කංයඃ කියා වේ.

(මු-) 431. **න දං තසෙ‍්‍ය ත්වසත්‍යෙපි ච.** (න 1. දං 1. තසෙ‍්‍ය 1 ·· තු 1. අසත්‍යෙපි 7. ච 1.)

අයාවචි යෙ ච තෙ පූර්වං දසංඥං න ස්‍යාත් තානත-සාන්තෙ‍්‍ය තු අසත්‍යෙපි ච. ආරාතීයඃ ශාශ්වතිකඃ.*

(ස-) තෙ, තද්ධිතයෙහි වූ ; අචි, ස්වරයද ; අයෙ‍්‍ය, යුප්‍රත්‍යය රහිතවූ ; යෙ ච, යකාරයද පරකල්හි ; පූර්වං, පූර්වපදය ; දසංඥං න ස්‍යාත්, පදසංඥ නොවන්නේය. තානත සානෙත‍්‍ය තු, තානතශබ්ද සානතශබ්ද දෙක වනාහි ; අසත්‍යෙපි ච, විද්‍යමානාපීයෙහිද පදසංඥ නොවන්නේය.

තස්මින් නිර්දිෂ්ට පූර්වස්‍ය යන න්‍යායය හෙයින් පූර්වය පද සංඥ නොවන්නේය යනු කියයි.

අවෙ‍්‍ය'යෙ‍්‍ය යනු අනුවර්ත්තනයයි. (319) ප්‍රත්‍යයා පරකල්හි විභක්තිහට ලොප්ද ලොප්කරණලද විභක්ති අශ්‍රයකොට පද ත්වයද ඇති කල්හි මේ සූත්‍රයෙන් නිෂෙධ කරණු ලැබේ. ආරාතීයඃ යනු ආරාත් භවඃ යන වාක්‍යයෙහි (429) ඊයප්‍රත්‍යය

* තශ්ව සශ්ව තසෙ‍්‍ය. අසති අපෙිා යස්‍ය තස්මින්.

කළ කල්හි මේ සූත්‍රයෙන් පදත්වය නිෂෙධ හෙයින් (58) චපො'බෙජබ් යන්නෙන් ආදෙශ නොවේ. එසේම ශශ්වත් භවඃ යන වාක්‍යයෙහි ෂ්ණික ප්‍රත්‍යය කළ කල්හි ශාශ්වතිකඃ යනු වේ. යකාර පරකල්හි මෙසේයි, ත්ව ච ඉදං ත්වාච්‍යං, දිශි භවං දිශ්‍යං යනාදියෙහි මෙයින් පදාන්තත්වාභාවය බැවින් (211) විරාම පරකල්හි කුඩ්ආදෙශාදිය නොවේ. ආනඩුහ්‍යං මධුලිහ්‍යං ගොදුහ්‍යං ඖපානහම් යනාදියෙහි මෙසේම ක්‍රම යෙන් දඩ්ඝඝධඞ් නොවේ, (183, 175, 176, 237). තාන්ත සාන්ත දෙක මෙසේයි—තඩිතො භාවඃ තාඩිත්‍යං. අසත්‍යපී යෙහි තඩිත්වාන් යනාදියෙහි තකාරයහට (58) දකාර නොවේ. පයසො විකාරඃ පායස්‍යං යනුද මෙසේමැයි, ඍතාදියයි. පායසං, කිරෙන් පිසනලද බතයි.

අසත්‍යපීයෙහි පයස්වාන් පයස්වී තෙජස්වී යනාදියෙහි පදාන්තනුවූ හෙයින් සිවිභක්ත්‍යාදි හස් පරත්වයක් නැති හෙයිනැයි කිසිකෙණෙක් (102) සකාරයහට විසර්ග නොකෙරෙත්. අයෞ යනු කුමටය? ශංයුඃ අහංයුඃ යනුයි, මෙහි පදාන්තබැවින් (53) මකාරයහට අනුස්වාරය වෙයි. අචේ‍ය යනු කුමටය ? වාඞ්මයං දිඞ්මාත්‍රං යනාදියෙහි පදාන්තබැවින් (64) විරාමවිහිතකාර්‍ය්‍යය වන්නේමය. තවද නඥනිර්දිෂ්ට මනිත්‍යම් යන න්‍යාය හෙයින් භවදීයම් යනාදියෙහි පදාන්ත බැවින් (58) ජබ් ආදෙශවේ. ශංයුඃ යනාදියෙහි මකාරයහට (53) අනුස්වාරය වෙයි.

(මු-) **432. අහ්නො'හ්නො'නීනෙ.** (අහ්නඃ 6. අහ්නඃ 1. අනීනෙ 7.)

ආහ්නිකං. ඊනෙ තු ව්‍යහීනඃ. සුපාඤ්චාලකඃ අධිපාඤ්චාලකඃ.*

(ස-) තඩිතයෙහි වූ ස්වරයා පර කල්හිද යුප්‍රත්‍යය රහිතවූ යකාරයා පර කල්හිද, අහ්නඃ, අහන්ශබ්දයහට ; අහ්නඃ, අහ්නාදෙශ වන්නේය ; අනීනෙ, ඊනප්‍රත්‍යයා පර කල්හි අහ්නාදෙශ නොවන්නේය.

අහ්නි භවං ආහ්නිකං (429) ෂ්ණික ප්‍රත්‍යය වේ, මෙයින්

---

* න ඊනො'හ්නීනසත්‍යශ්ම්‍යත්. තු යනු අනන්ත බැවින් අසති අචේ යන මෝහට අනුවෘත්ති නොවේ.

අත්නාදෙශ වේ, (416) වෘඬිසි. ඡනෙ තු, ඡනප්‍රත්‍යය කළ කල්හි වනාහි, වයොරන්තොතීවඃ සී තබිතාපීවිෂයව්ගුසමාස යෙහි (429) ඡනප්‍රත්‍යය කළ කල්හි අත්නාදෙශය නිෂේධ බැවින් (337, 258) ව්‍යතීනඃ යනු වේ. (416) සුපඤ්චාලාදින් උදාහරණ කෙරෙයි—සුපඤ්චාලෙ (දෙශෙ) භවඃ, අඞ්පඤ්චාලෙ භවඃ යනු වාක්‍යයි, සුපාඤ්චාලකඃ යනු වේ, අඞ්පාඤ්චාලකඃ යනු වේ, දෙතන්හි (429) කණ් වේ, පරපදයාහට වෘද්ධිසි. සුපඤ්චාලාදිය වනාහි—සුපඤ්චාල අඞ්පඤ්චාල සර්වපඤ්චාල පූර්වපඤ්චාල දක්ෂිණපඤ්චාල උත්තරපඤ්චාල ගුරුලඝු පිතෘපිතාමහ වාතපිත්ත වාතශ්ලෙෂ්ම එකපුරුෂ පූර්වපුරුෂ පූර්වභායන අපරභායන ද්විසංවත්සර ද්විවර්ෂ ත්‍රිසප්තති ද්විනිෂ්ක ද්විසුවර්ණ ප්‍රොෂ්ඨපද භාද්‍රපද යනාදියයි.

(මූ-) දෞවාරිකඃ සෞවරං සෞවං සෞවස්තිකඃ සෞවාදුමෘදවං වෛයල්කසං ශෞවං ශෞවනං ස්වෛයක්‍රෘතං සෞවං සෞවාධ්‍යයිකං සෞවග්‍රාමිකං නෛයග්‍රොධං. එකෙතිකිං න්‍යග්‍රොධමූලිකං. ශෞවාපදං ශ්වාපදං, නෛයඞ්කවං න්‍යඞ්කවං. ශ්වාගණිකං.

(ස-) (418) ද්වාරාදින් උදාහරණ කෙරේ, ද්වාරෙ නියුක්තඃ දෞවාරිකඃ, (429) ඡණිකප්‍රත්‍යය වේ, වකාරයහට උම් ආගම වේ, ඔහට වෘද්ධිසි, ද්වාරයයි ස්වරාන්තශබ්දයාගේ ග්‍රහණය බැවින් රෙඵාන්තයාගේ ස්ථානයෙහි උම් ආගම නොවේ, එහෙයින්—ද්වාරි නියුක්තඃ ද්වාරිකඃ යනු වේ. ස්වරෙ භවං සෞවරං, ස්වරමධිකෘත්‍ය කෘතො ග්‍රන්ථඃ සෞවරඃ කියා හෝ වේ, ෂණ්ප්‍රත්‍යය වේ, වකාරයහට උම් ආගම වේ, ඔහට වෘද්ධිසි. සියලු තන්හි මෙසේයි. ස්වඃ (ස්වගේ) භවං සෞවං, මෙහි ස්වර්ශබ්දයා කෙරෙන් ෂණ වේ, (430) විසංඥයහට ලොප් වේ. ස්වස්තීති වක්ති සෞවස්තිකඃ, ස්වස්තිය යම්පරිද්දෙකින් වන්නේද එපරිද්දෙන් කියයි. ස්වස්ති වක්‍ෂ්‍යති කියා හෝ වේ, ඡණිකප්‍රත්‍යය කළ කල්හි විසංඥයාහට ලොප් වේ. ස්වාදුමෘදුනා කෘතං නොහොත් ස්වාදුමෘදුනි සංසකෘතං යන වාක්‍යයෙහි සෞවාදුම්‍රදවං යනු වේ, බතයි. ව්‍යල්කසඃ යනු අව්‍යුත්පන්නයයි, ව්‍යල්කසෙ භවං වෛයල්කසං. ඇතම් කෙනෙක් වනාහි ව්‍යල්කස ශබ්දය ද්වාරාදි ගණයෙහි නොකියත්, ඔව්හු වනාහි විගතො‘කීඃ ව්‍යකීඃ තං සෘති ව්‍යකීසඃ,

කපිලිකාදි බැවින් රකාරයහට ලකාර වේ, තත්‍ර භවඃ ශෛවල්කසඃ, මෙසේ ආදිස්වරයාගේ ස්ථානයෙහි ජාත බැවින් (417) යකාරස්ථානයෙහි ඉම් ආගමය වේ, ඕහට වෘද්ධියයි කියත්. ශ්වඃ (පරදිනෙ) භවං ශෞවං, ෂණ්ප්‍රත්‍යය කල කල්හි ටිහට ලොප් වේ. (භට්ටිකාව්‍යයෙහි) ශෞවස්තිකත්වං කියා වේ, ශ්වඃ යනු පරදිනයයි, තද්ධිතප්‍රත්‍යය කල කල්හි ගච්ඡතීති ශ්වස්තිකඃ (996) කප්‍රත්‍යය වේ. ශ්වස්තික එව ශෞවස්තිකස්තස්‍ය භාවඃ යන මෙහි ශ්වස් ශබ්දයාගේ වකාරයහට උම් ආගමය වේ. ශුනි භවං ශෞවනං, (424) අවිකාරෂණ් පරකල්හි නලොප නිෂෙධය වෙයි. (194) ශ්ව යුවමඝොනාං යන මේ ආදියෙන් තද්ධිතප්‍රත්‍යයා පරකල්හි වර්ජිත බැවින් වකාරයහට උකාර නොවේ. ස්ථ්‍ය කෘතෙ භවං ස්ථෛයකෘතං, ස්ථ්‍යඃ බාදිරඃ බඩ්ගඃ, තෙන කෘතං යී තෘතීයා තත්පුරුෂය වේ. ස්ව (ධනෙ ආත්මනි වා) භවං සෞවං. ස්වාධ්‍යායෙ වෙදෙ භවං සෞවාධ්‍යායිකං වෛදාධ්‍යයනං. ස්වග්‍රාමෙ භවං සෞවග්‍රාමිකං. ස්වශබ්දයාගේ ග්‍රහණයෙන්ම ඉෂ්ටසිද්ධිය ඇති කල්හි ස්වාධ්‍යාය ස්වග්‍රාම දෙදෙනාගේ ග්‍රහණය අන්‍යවූ ශබ්දයන්ගේ ආදියෙහි සිටියාවූ ස්ව ශබ්දයාගේ නිෂෙධයපිණිසයි, එහෙයින් ස්වශබ්දස්‍යෙදං ස්වාශබ්දං, ස්වොදරං පූරයතීති සෞදරිකඃ යනාදිය වේ. න්‍යඃග්‍රොධෙ භවං නෛයග්‍රොධං, න්‍යග්‍රොධ යනු නුගගසයි. එක යනු කුමටය? න්‍යග්‍රොධමූලෙ භවං න්‍යග්‍රොධමූලිකං යන මෙහි කෙවල න්‍යග්‍රොධශබ්දය නොවන හෙයින් ඉම්ආගම නොවන පිණිසයි. ශ්වාපදෙ භවං ශෞවාපදං, විකල්පයෙන් ශ්වාපදං යනු වේ. න්‍යඞ්කෞ (මෘගෙ) භවං නෛයඞ්කවං, විකල්පයෙන් න්‍යාඞ්කවං යනු වේ. දෙතන්හි විකල්පයෙන් වකාරයහට උම් ආගමය වේ. ශුනාං ගණඃ ශ්වගණඃ, ශ්වගණෙ භවං ශ්වාගණිකං, මෙහි (418) ශ්වාදියහට තද්ධිත ඉකාරාදිය පරකල්හි නිෂෙධබැවින් වකාරයහට උකාර නොවේ, ඉකාරෙ යනු කුමටය? ශ්වදංෂ්ට්‍රායාං භවඃ ශෞවාදංෂ්ට්‍රඃ යනාදියෙහි උම් වන්නේමය, මෙහි (34) මනීෂාදිබැවින් අකාරදීඝය වේ.

(මු-) 433. විකාරසඞ්ඝභාවෙදං කිතස්වාපීාදෞ. (විකාර—ස්වාපීාදෞ 7.)

එළ්වපීෂු ච තෙ තත්‍ර ස්‍යුඃ. හෙම්නො විකාරඃ හෛමඃ

ආප්‍යඃ ආග්නෙයඃ, භික්ෂාණං සමූහඃ භෛක්ෂං ආශ්වං ගාණි ක්‍යං රාජකං, ගුරොර්භාවඃ ගෞරවං යෞවනං සාම්‍යං වෛරූ ප්‍යං රාජ්‍යං සෞහාර්‍දං, විෂ්ණෝරිදං වෛෂ්ණවං ත්වදීයං මාස වනං ශෛවනං.*

(ස-) එජ්වපේෂු ච, විකාරය සමූහය භාවය ඉදමර්ථය හිතාර්ථය ස්වාර්ථාදිය යන මේ අර්ථයන් කෙරෙහි ; තෙභ්‍යඃ, ඒ (415) ෂ්ණ්ෂෂ්ණය ෂණ්‍ය ෂණායන ණීය ෂ්ණික ෂණ (429) ෂ්ණ්ක කණ් ණීන ඉය යන එකාදශප්‍රත්‍යයෝ ; ස්‍යුඃ, වන්නෝය.

භෛක්ෂඃ යන මෙහි මේ සූත්‍රයෙන් ෂණප්‍රත්‍යය කළ කල්හි (416) වෘද්ධි වන්නීය, (337, 258) නකාරය හටද අකාරයහටද ලොප්වේ. අපාං විකාරඃ ආප්‍යඃ යන්නද මෙසේමැයි, මෙහි ෂණ්‍යප්‍රත්‍යය වෙයි. අග්නෙර්විකාරඃ ආග්නෙයඃ, මෙහි ෂෙණ යප්‍රත්‍යයයි. භෛක්ෂං යන්නෙහි ෂණයයි. අශ්වානාං සමූහඃ ආශ්වං, මෙහි ෂණප්‍රත්‍යය කළ කල්හි (432) අශ්වාදෙශ වේ. ගණිකානාං සමූහඃ ගාණික්‍යං, මෙහි ෂණ්‍යප්‍රත්‍යයයි. රාඥං සමූහඃ රාජකං, මෙහි කණ් වේ. ගෞරවං යන මෙහි ෂණයි. යූනාං භාවඃ යෞවනං, (424) අවිකාර ෂණප්‍රත්‍යයා පරකල්හි නකාරලොපය නොවේ, (194) තද්ධිතවර්ජිත බැවින් වකාරය හට උකාර නොවේ. සමස්‍ය භාවඃ සාම්‍යං, විරූපස්‍ය භාවො වෛරූප්‍යං දෙතන්හි ෂණ්‍යප්‍රත්‍යය වෙයි. රාඥො භාවඃ රාජ්‍යං, ෂණ්‍යප්‍රත්‍යය කළ කල්හි (337, 258) නකාර අකාර දෙක ලොප්වෙත්. සුහෘදො භාවඃ සෞහාර්‍දං, ෂණප්‍රත්‍යයයි, (416) සුභගාදි බැවින් උභයපදය හට වෘද්ධියි. වෛෂ්ණවං යන මෙහි ෂණ කළ කල්හි (337) උවර්ණයහට ඔකාර වේ, (35)

---

* ස්වස්‍ය ආත්මනො'ර්ථඃ අභිධෙයඃ ස්වාර්ථඃ, ස්වාර්ථ ආදිර්යස්‍ය ස ස්වාර්ථාදිඃ. විකාරශ්ච සඞ්ඝශ්ච භාවශ්ච ඉදම් ච හිතඤ්ච ස්වාර්ථාදියශ්ච සමාහාරෙ තස්මින්. ප්‍රකෘතිහුගේ අන්‍ය අවස්ථාව කට පැමිණීම විකාරනම් වේ, සඞ්ඝ යනු සමූහයයි, භාවය නම් අසාධාරණ ධර්මයයි, ඉදම් යනු සම්බන්ධයාගේ උපලක්ෂණයයි, හිතනම් ඉෂ්ටසාධනයයි, ස්වාර්ථය නම් ප්‍රකෘති අර්ථයෙන් තොරනුවූවක්. මෙහි ක්‍යනලද ප්‍රත්‍යයෝ ඉත් සහිතයෝද රහිතයෝද වෙත්, මෙහිද යම් ශබ්දයක්හු කෙරෙන් යම් අර්ථයෙක්හි යම් ප්‍රත්‍යයෙක් ඉත් සහිතව හෝ ඉත් රහිතව වන්නේද මේ සියල්ල ලක්ෂණානුසාරයෙන්ම දතයුතුවෙයි.

අච්ආදෙශ වේ. තව ඉදං තාවදීයං, මෙහි ණීය වෙයි, (215) තාවද දෙශයි. මඝවත ඉදං මාඝවතං, (191) තුඞ්පක්‍ෂයෙහි මාඝවතං යනුයි. ශුන ඉදං ශෞවනං, දෙතන්හි ෂණ් කළ කල්හි (194) වකාරයහට උකාර නොවේ, (424) අචිකාර ෂණ් පර කල්හි නකාරලොපය නිෂෙධයි.

(මු-) 434. ඍතෝ රෙ. (ඍත් 1. රඃ 1. යෙ 7.)

පිත්‍ර්‍යං.

(ස-) යෙ, තඬිතයෙහි වූ යකාරයා පරකල්හි; ඍතඃ, ඍකාරයතෙම රකාරාදෙශ වේ.

පිතුරිදං පිත්‍ර්‍යං, ඉත් රහිත ෂණ්‍යප්‍රත්‍යය වේ. යෙ යනු කුමටය? පෛතෘකං යන මෙහි කණ් පර බැවින් රකාරාදෙශාභාවය ඇඟවීම පිණිසයි.

(මු-) 435. හන්ෂන්ධෘතරාඥාමුඞ්ලොපඃ ෂෙණ. (හන්ෂන්ධෘතරාඥං 6...උඞ්ලොපඃ 1. ෂෙණ 7.)

වාර්ත්‍රඝ්නං පෞෂ්ණං ධාර්තරාඥං. එෂාං කිං, සාමනං.*

(ස-) ෂෙණ, ෂණ්ප්‍රත්‍යය පර කල්හි; හන් ෂන් ධෘත රාඥං, හන් යන්නද ෂන්භාගාන්තයද ධෘතරාජන්ශබ්දයද යන මොවුන්ගේ; උඞ්ලොපඃ, උඞ්සංඥයහට ලොප්වේ. වෘත්‍රඝ්න ඉදං යන වාක්‍යයෙහි (433) ෂණ් කළ කල්හි වෘත්‍රහන් යන මොහුගේ උඞ්ලොපය වේ (189) හ්නස්ථානයේ ඝ්නාදෙශ වේ, (416) ආදිස්වරයහට වෘඬියි, වාර්ත්‍රඝ්නං යනු වේ. පූෂණ් ඉදං පෞෂ්ණං, ධෘතරාඥ ඉදං ධාර්තරාඥං යනුද මෙසේමැයි. උක්‍ෂන්ශබ්දයහට වනාහි අපත්‍යාර්ථයෙහි ෂණ් කළ කල්හි ඖක්ෂ්ණඃ යනු (424) පළමු උදාහරණ කරණලද්දේය. එෂාං කිං, මොවුන්ගේ ස්ථානයෙහි උඞ්ලොපය කුමක්සඳහාද යත්? සාම්න ඉදං සාමනං යන මෙහි පූර්වසූත්‍රයකින්ද (117) උඞ්

---

* හන් ච ෂන් ච ධෘතරාජන් ච තෙෂාං. ෂන් යනු ෂන්භාගාන්තයයි, එහෙයින් උක්‍ෂන් පූෂන් යන මොවුන් මුල්කොට ඇත්තවුන්ගේ ග්‍රහණයයි. (117) සඳනො'ල්ලොපඃ යන මේ ආදියෙන්ම අකාරලොපය ලද කල්හි මේ සූත්‍රය නියමය සඳහා දක්වනලදී, එහෙයින් ෂණ් පරකල්හි මොවුන්ගේම උඞ්ලොපය වන්නේය, අනිකක්හුගේ උඞ්ලොපය නොවන්නේය.

ලොපය නොවේ. සියලු තන්හි අවිකාරණ්ණ පරකල්හි න කාරලොපය නොවේ 424.

(මු-) 436. **යුෂ්මදස්මද්ත්වන්මද්‍රං යුෂ්මාකාස්මාක තවක මමකාඃ ණ්ණඛීනෙ.** (යුෂ්මද්—මද්‍රං 6...යුෂ්මාක—මමකාඃ 1...ණ්ණඛීනෙ 7.)

යෞෂ්මාකං යෞෂ්මාකීණං, ආස්මාකං අස්මාකීනං, තාවකං තාවකීනං, මාමකං මාමකීනං.

(ස-) ණ්ණඛීනෙ, ණ්ණප්‍රත්‍යය ඛීනප්‍රත්‍යය යන මොවුන් පර කල්හි; යුෂ්මදස්මද්ත්වන්මද්‍රං, යුෂ්මද්ශබ්ද අස්මද්ශබ්ද ත්වද් මද් යන මොවුන්ගේ ස්ථානයෙහි; යුෂ්මාකාස්මාක තවක මමකාඃ, යුෂ්මාකය අස්මාකය තවකය මමකය යන මේ ආදෙශයෝ ක්‍රමයෙන් වෙත්.

යුෂ්මාකමිදං යන වාක්‍යයෙහි ණ්ණප්‍රත්‍යයද ඛීනප්‍රත්‍යයද වෙත්, විභක්තිහට ලොප්වේ, යුෂ්මාකාදෙශ කළ කල්හි වෘද්ධියි, යෞෂ්මාකං යෞෂ්මාකීණං යනු වේ. අස්මාකමිදං යන වාක්‍ය යෙහි ආස්මාකං අස්මාකීනං යනුද මෙසේමැයි. තව ඉදං යන වාක්‍යයෙහි ණ්ණප්‍රත්‍යයද ඛීනප්‍රත්‍යයද වෙත්, යුෂ්මද් ශබ්දයහට එකවචන බැවින් (215) ත්වද්ආදෙශ වේ, මේ සූත්‍ර යෙන් තවකාදෙශ වේ, වෘද්ධි කළ කල්හි තාවකං තාවකීනං යනු වේ. මම ඉදං යන වාක්‍යයෙහි මාමකං යනුද මාමකීනං යනුද මෙසේමැයි.

(මු-) සූයභාග හිතං සෞරීයං ආගසතියං ආත්මනීනං.

(ස-) සෞරීයං යනාදිය හිතාර්ථයෙහි උදාහරණ කෙරෙයි, සූයභාය යන මොහු කෙරෙන් ඛීයප්‍රත්‍යය වේ, විභක්ති ලොප් වේ, (260) යකාරලොපය වේ. ආගසතියං යනුද මෙසේමැයි. ආත්මනෙ හිතං ආත්මනීනං, මෙහි ඛීනප්‍රත්‍යය කළ කල්හි (424) නකාරලොපය නිෂෙධයි.

(මු-) චොර එව චෞරඃ ත්‍රෛලොක්‍යං රාමකඃ.

(ස-) චෞරඃ යි ස්වාර්ථයෙහි උදාහරණ කෙරෙයි, ත්‍රිලොකී එව. ත්‍රෛලොක්‍යං, මෙහි ණ්‍යප්‍රත්‍යය වේ, වෘද්ධි කළ කල්හි (258) ඊකාරලොපය වේ. ස්වාර්ථප්‍රත්‍යයාන්තයෝ පූර්වලිංගයෝමය යන නියමය ඇති කල්හිද අභිධාන බැවින් මෝහට ක්ලීව ත්වය වෙයි. රාම එව රාමකඃ මෙහි කණ්ප්‍රත්‍යය වේ. කප්‍රත්‍යය අන්‍යාර්ථයෙහිද වෙයි, මෙසේයි—

අඥානෙ කුත්සිතෙ චෛව සංඥායාමනුකම්පනෙ,
තද්‍යුක්තනීතාවප්‍යල්පෙ වාචෙ‍්‍ය හ්‍රස්වෙ ච කඃ ස්මෘතඃ.

යනු පුරාතනයෝ කියත්, තද්‍යුක්තන්තෙ‍ා යනු අනුකම්පා යුක්ත නීතියෙහි යන අර්‍ථයි.

(මු-) 437. කෙ'කඃ ස්වා හෙ තු වා. (කෙ 7. අකඃ 6. ස්වඃ 1. හෙ 7. තු 1. වා 1.)

කන්‍යකා, සුකන්‍යකඃ සුකන්‍යාකඃ.

(ස-) කෙ, කණ්ප්‍රත්‍යයා පර කල්හි ; අකඃ, අක්ප්‍රත්‍යාහාර යාගේ ස්ථානයෙහි ; ස්වඃ, හ්‍රස්ව වේ, හෙ තු, බහුව්‍රීහි සමාස යෙහි වනාහි ; වා, අක්හට විකල්පයෙන් හ්‍රස්ව වේ. කන්‍යා එව යන වාක්‍යයෙහි කන්‍යකා යනු වේ, මෙහි ඉත් රහිතවූ කණ් කළ කල්හි මෙයින් හ්‍රස්ව වෙයි, ස්වාර්‍ථප්‍රත්‍යයාන් තයෝ ඒ ලිංගයෝමනුයි (249) ආප් වේ. මෘණාලිකා යනුද රාමොරුකා යනුද සෙනානීකා යනුද මෙසේමැයි. ශොභනා කන්‍යා යස්‍ය සී බහුව්‍රීහිසමාස කළ කල්හි සුකන්‍යකඃ යනු වේ, හ්‍රස්ව නුවූ පක්‍ෂයෙහි සුකන්‍යාකඃ යනු වේ. අකඃ යනු කුමටය? නෞරෙව නෞකා යන මේ ආදියෙහි අක්භින්නස්ථානයෙහි හ්‍රස්ව නොවන හෙයිනි.

හස් පර කල්හිද කිසි තැනෙක්හි හ්‍රස්වය ව්‍යක්තව්‍යයි, මෙසේයි—කාලිදාසඃ, චෛදෙහිබන්ධුඃ, කෙන කිදන්තුරිතං, නාඩින්ධම යන මේ ආදිය ප්‍රයොගානුසාරයෙන් වේ.

(මු-) ශිවො දෙවතා යස්‍යසෞ ශෛවඃ, ශාක්තයඃ.

(ස-) (433) ශෛවඃ සී ආදි යන පදයහට උදාහරණ කියසී, මෙහි ෂ්ණප්‍රත්‍යයයි. ශක්තිර්දේවතා යස්‍යසෞ ශාක්තයඃ සනුද එසේමැයි, මෙහි ෂ්ණෙයප්‍රත්‍යය වෙයි. ශාක්තඃ වෛෂ්ණවඃ ගාණපත්‍යඃ යනුද මෙසේමැයි. ප්‍රයොගානුසාරයෙන් අර්‍ථවිශෙෂයෙහි තද්ධිතප්‍රත්‍යයෝ වන්නෝයයි ආදිපදයෙන් ප්‍රකාශිතයි.

(මු-) 438. ත්වතෞ භාවෙ. (ත්ව-තෞ 1 .. භාවෙ 7.)

සාධුත්වං ජඩතා, පාචකත්වං, බ්‍රාහ්මණත්වං.

(ස-) භාවෙ, භාවාර්‍ථයෙහි ; ත්වතෞ, සම්බන්ධයා කෙරෙන් ත්වප්‍රත්‍යය තප්‍රත්‍යය යන දෙක වෙත්. අභිධාන බැවින් ත්වා න්තයාගේ ක්ලීවත්වයයි, තාන්තයාගේ ස්ත්‍රීත්වයද වන්නේය. භාවය වනාහි ප්‍රවෘත්තිනිමිත්තයි, යම් ධර්‍මයක් කරණකොට

ගෙන මේ තෙම ගොනෙකැයි වැටහීම වේද ඒ ස්වභාවය මෙතම ගොශබ්දයාගේ භාවය යන අර්ථයි. සාධොස්‍ස භාවඃ සාධුත්වං, ජඩායා භාවඃ ජඩතා, දෙතන්හි (327) පුංවද්භාවයයි. පාචිකායා භාවඃ පාචකත්වං, මෙහි (328) පුංවද්භාවය නිෂෙධකල්හිද (350) විශෙෂවිධානය හෙතුකොටගෙන පුංවද්භාවය වේ. ෂණ්ඨස්‍ය භාවඃ ෂණ්ඨත්වං යනුද; මෛථිලස්‍ය භාවඃ මෛථිලත්වං යනාදියද මෙසේමැයි. බ්‍රාහ්මණ්‍යා භාවඃ බ්‍රාහ්මණීත්වං (350) අජාත්‍යන්තඃ යී කී බැවින් පුංවද්භාවය නොවේ, දත්තාත්වං යනාදියද මෙසේමැයි. ත්ව-ත යන ප්‍රත්‍යයන් දෙදෙනාගේද භාවයෙහි කරණලද්දාවූ ෂ්‍යඤාදි ප්‍රත්‍යයාගේද සාධාරණ විශෙෂත්වයක් නැති බැවින් බාධ්‍යබාධකත්වය නැති කල්හි ජඩස්‍ය භාවඃ ජඩත්වං ජඩතා ජාඩ්‍යං, ගුරොර්භාවඃ ගුරුත්වං ගුරුතා ගෞරවම් යනාදිය වන්නේමය.

(මූ-) 439. **ලිකො'සීත් සඃ ෂ-ස්ති.** (ලි-ඉකඃ 5. අ-සීත් 5. සඃ 6. ෂඃ 1. ති 7.)

අ-සීත් ලිකඃ සඃ ෂඃ ස්‍යාත් තද්ධිතෙ තෙ. යජුෂ්ට්වං, සීත් තු ගීස්ත්වං.*

(ස-) තද්ධිතෙ තෙ, තද්ධිතයෙහි වූ තකාරයා පර කල්හි ; අසීත්, දීසියා රහිතවූ ; ලිකඃ, ලිඞ්ගයාගේ ඉක්සංඥයා කෙරෙන් පරවූ ; සඃ, සකාරයාහට ; ෂඃ ස්‍යාත්, ෂකාර වන්නේය. යජුෂො භාවඃ යජුෂ්ට්වං, හවිෂ්ට්වං යනුද මෙසේමැයි. සීත් තු, දීසියා කෙරෙන් වනාහි ; ගිරො භාවඃ ගීස්ත්වං_ධූස්ත්වං යනුද මෙසේමැයි. මේ දෙතන්හි (228) දීසී වේ, රේඵය හට (102) විසර්ගයයි (65) විසර්ගයාහට සකාර කළ කල්හි, ෂකාරත්වය ලත් කල්හි දීසියා කෙරෙන් පරබැවින් නිෂෙධයි. ලිකඃ යනු කුමටය? බහුසතරාං යන තන්හි ෂකාර නොවන හෙයිනි.

(මූ-) 440. **ච්වත් සාමෙ‍්‍යා.** (ච්වත් 1. සාමෙ‍්‍යා 7.)

උපමානාර්ථෙ ච්වත් ස්‍යාත්. කෘෂ්ණ ඉව කෘෂ්ණවත්.†

(ස-) උපමානාර්ථෙ, උපමානාර්ථයෙහි ; ච්වත් ස්‍යාත්, ස්‍යාද්‍යන්තයා කෙරෙන් ච්වත්ප්‍රත්‍යය වන්නේය. මෙහි චකාරය

---

* ලෙරික් ලික් තස්මාත්. නාසති සො යනු සො'සීස් තස්මාත්.

† සමස්‍ය භාවඃ සාම්‍යං තස්මින්.

අව්‍යය සඳහා වෙයි (94). කෘෂ්ණ ඉව කෘෂ්ණවත් යන මෙහි ශිවො භාති යනු ශෙෂයි. එසේම කෘෂ්ණමිව කෘෂ්ණවත් කියාද වේ, ශිවං මන්‍යෙ යනු ශෙෂයි. එසේම සියලු විභක්ත්‍යන්තයන් කෙරෙන් වවත්ප්‍රත්‍යය කළ කල්හි විභක්තිහට ලොප් වේ. උපමානයක්‍රියාවිශෙෂණය පිළිබඳම වෙයි. එහෙයින් පුත්‍රෙණ තුල්‍යඃ ස්ථූලඃ යනාදියෙහි ක්‍රියා රහිත සාමාන්‍ය ඇති කල්හි නොවන්නේය.

(මූ-) 441. **මතුරස්ත්‍යර්ථෙ.** (මතුඃ 1. අස්ති-අර්ථෙ 7.)

ශ්‍රීරස්ති යස්‍යසෞ ශ්‍රීමාන්, විදුෂ්මාන් දෞෂ්මාන්.*

(ස-) අස්ත්‍යර්ථෙ, අස්ති අස්‍ය අස්මින් වා යන අර්ථයෙහි; මතුඃ, ප්‍රථමාන්ත පදයා කෙරෙන් මතුප්‍රත්‍යය වන්නේය. ඉත්සංඥ උකාරයතෙම (192) නුණ්ආගමය සඳහාද, (185) දීර්ඝය සඳහාද, ස්ත්‍රීලිඞ්ගයෙහි (257) ඊප්ප්‍රත්‍යය ප්‍රයොජන කොටද වෙයි. එහෙයින්—ශ්‍රීමාන් ශ්‍රීමතී යනු වේ. ශ්‍රීරස්ති යස්මින් යන වාක්‍යයෙහිද ශ්‍රීමාන් යනු වේ. විද්වාන් අස්ති ගස්‍ය යස්මින් වා යන වාක්‍යයෙහි විදුෂ්මාන් යනු වේ, මෙහි (229) මතුප්‍රත්‍යය පර කල්හි වසුප්‍රත්‍යයාගේ වකාරයහට උකාරවිධාන සම්බන්ධයෙන්ම, (442) අකාරයාගේ උඞ්සංඥභාවයෙන් ලැබියයුතු වන වතුප්‍රත්‍යය බාධාකොට මතුප්‍රත්‍යය වන්නේය, එහෙයින් වකාරයා හට උකාරය කළ කල්හි, (431) න දං තමසෞ යන

* අස්ති අර්ථො යස්‍ය යස්මින් වා සඃ අස්ත්‍යර්ථො විද්‍යමාන සම්බන්ධස්තස්මින්. කර්මධාරයසමාසයා කෙරෙන් මතුප්‍රත්‍යයාර්ථය ජාතනොවෙයි. ඉදින් බහුව්‍රීහි වීනම් අර්ථය ලැබෙයයි පූර්වාචාරීහු කියති, එහෙයින් ශොභනා බුද්ධිඃ සී කර්මධාරය කළ කල්හි සුබුද්ධිරස්ත්‍යස්‍යෙති සුබුද්ධිමාන් ජනඃ කියා නොවන්නේය, ශොභනා බුද්ධිර් යස්‍යසෞ සුබුද්ධිඃ සී බහුව්‍රීහියෙන් ඒ අර්ථය හැඟෙන බැවිනි. දුර්ගසිංහතෙම මතුප්‍රත්‍යයාදීන්ගේ ස්ථාන කියයි,

භූම නින්දා ප්‍රශංසාසු නිත්‍යයොගෙ'තිශායනෙ,
සංසර්ගෙ'ස්තිවිවක්ෂායාමමී මත්වාදයො මතාඃ.

මෙසේයි—භූමියෙහි ගොමාන් යනු වේ. නින්දාවෙහි පාපී යනු වේ. ප්‍රශංසාවෙහි රූපවාන්. නිත්‍යයොගයෙහි ක්ෂීරිණො වෘක්ෂාඃ කියා වේ. අතිශායනයෙහි උදරවතී කන්‍යා කියා වේ. සංසර්ගයෙහි දණ්ඩී පාන්ථඃ කියා වේ.

මේ ආදියෙන් පදන්තභාවය නිෂෙධ හෙයින්, (183) දඞ්ආදෙශයාගේ ප්‍රාප්තිය නැති කල්හි (111) ෂත්වය වෙයි. දෞරස්ති යස්‍ය ස දෞෂ්මාන් සනුද මෙසේමැයි.

(මූ-) 442. මොඩ්ම-ඣපාත් වතුඃ. (ම-අ-උඩ්-ම-අ-ඣපාත් 5. වතුඃ 1.)

මකාරොඩො'වර්ණොඩො මකාරාන්තා — දවර්ණාන්තාත්, ඣපාන්තාච්ච, වතුඃ, ස්‍යාදස්ත්‍යර්ථෙ.

ලක්ෂ්මීවාන්, යශස්වාන් භාස්වාන්, කිංවාන්, ඥානවාන්, විද්‍යාවාන්, විද්‍යුත්වාන්.*

(ස-) මකාරොඩඃ, උඩ්සංඥමකාරයා කෙරෙන්ද ; අවර්ණොඩඃ, උඩ්සංඥ අවර්ණයා කෙරෙන්ද ; මකාරාන්තාත්, මකාරාන්තයාකෙරෙන්ද; අවර්ණාන්තාත්, අවර්ණාන්තයා කෙරෙන්ද; ඣපාන්තාච්ච, ඣප්ප්‍රත්‍යාහාරාන්තයා කෙරෙන්ද ; අස්ත්‍යර්ථෙ, විද්‍යමානාර්ථයෙහි ; වතුඃ ස්‍යාත්, වතුප්‍රත්‍යය වන්නේය. මෙහිද පූර්වසූත්‍රයෙහි මෙන් උකාරය ඉත්සංඥයි. ලක්ෂ්මීරස්ත්‍යස්‍ය ලක්ෂ්මීවාන්, උඩ්සංඥ මකාරයා කෙරෙන් ප්‍රත්‍යය වූ තැනි. යශො'ස්ත්‍යස්‍ය යශස්වාන්, භා අස්ත්‍යස්‍ය භාස්වාන්, උඩ්සංඥ අවර්ණයා කෙරෙන් ප්‍රත්‍යය වූ තැනි. කිම් අස්ත්‍යස්‍ය කිම්වාන්, මකාරාන්තයා කෙරෙන් වූ තැනි. ඥානමස්ත්‍යස්‍ය ඥානවාන්, විද්‍යා අස්ත්‍යස්‍ය විද්‍යාවාන්, මේ අවර්ණාන්තයා කෙරෙන්වූ තැනි. විද්‍යුත් අස්ත්‍යස්‍ය විද්‍යුත්වාන්, ඣප්ප්‍රත්‍යාහාරයා කෙරෙන් වූ තැනි. සියලු තන්හි අස්මින් කියා හෝ වාක්‍යයි. යශස්වාන් භාස්වාන් විද්‍යුත්වාන් යන මේ තන්හි (431) පදන්තත්වය නිෂෙධ බැවින් සකාරයහට විසර්ගය නොවේ, (58) තකාරස්ථානයේ දකාරද නොවේ. පදසිද්ධිය වනාහි පළමු මෙනි.

කුමුද-වෙතස-නඩාදි ශබ්දයන්ගේ අකාරලොපය නිපාතනයෙන් වේ, එහෙයින් කුමුද්වාන් වෙතස්වාන් නඩ්වාන් යනාදියයි. රාජන්වාන් යන මෙහි නකාරලොපාභාවය නිපාතනයයි. [පාණිනිඃ 8. 2. 13.]

(මූ-) 443. ස්‍රඞ්මෙධාස්මායාත් වින් වා. (ස්‍රජ්-මෙධා-අස්-මායාත් 5. වින් 1. වා 1.)

---

* ම ච අශ්ච මෞ, මෞ උඩෞ යයොසෙතෞ මොඩෞ, මොඩෞ ච ම ච අශ්ච ඣප් වෙති ත්‍යස්මාත්.

ස්‍රග්වී මෙධාවී තෙජස්වී මායාවී. පක්ෂෙ ස්‍රග්වාන් ඉත්‍යාදි.*

(ස-) ස්‍රඞ් මෙධාස් මායාත්, ස්‍රජ්ශබ්දය මෙධාශබ්දය අස්භාගාන්ත ශබ්දය මායාශබ්දය යන මොවුන් කෙරෙන් ; වා, විකල්පයෙන් ; වින්, අස්ත්‍යර්ථයෙහි වින්ප්‍රත්‍යය වන්නේය. පක්ෂයෙහි පූර්වසූත්‍රයෙන් වතුප්‍රත්‍යය වන්නේය. ස්‍රක් අස්ත්‍යස්‍ය ස්‍රග්වී, මෙහි පදාන්තත්‍වා නිෂෙධරහිත බැවින් විරාම පර කල්හි (211) කුඞ්ආදෙශයයි, නැවත (188) දීඝ වේ, (118) නකාර ලොපය වේ. මෙධා අස්ත්‍යස්‍ය මෙධාවී, තෙජෝ'ස්ත්‍යස්‍ය තෙජස්වී, මායාස්ත්‍යස්‍ය මායාවී. ආමයො'ස්ත්‍යස්‍ය ආමයාවී යී නිපාතනයෙන් අකාරයහට ආකාර වේ. පක්ෂෙ, පක්ෂයෙහි ; ස්‍රග්වාන් ඉත්‍යාදි, ස්‍රක් අස්ත්‍යස්‍ය ස්‍රග්වාන් මෙධාවාන් තෙජස්වාන් මායාවාන් යන මේ ආදිය වේ.

(මු-) 444. **නෛකාජාදින් වා.** (නෛකාජාත් 5. ඉන් 1. වා 1.)

අනෙකාචො'වර්ණාන්තාදින් වා ස්‍යාදස්ත්‍යර්ථෙ. ඥානී ශිඛී.†

(ස-) අනෙකාචඃ, අනෙකස්වරවූ ; අවර්ණාන්තාත්, අවර්ණාන්ත ශබ්දයා කෙරෙන් ; අස්ත්‍යර්ථෙ, විද්‍යමානාර්ථයෙහි ; වා, විකල්පයෙන් ; ඉන් ස්‍යාත්, ඉන්ප්‍රත්‍යය වන්නේය. ඥානං අස්ත්‍යස්‍ය ඥානී, ශිඛා අස්ත්‍යස්‍ය ශිඛී, මාලී දණ්ඩී යනාදියද මෙසේමැයි. පක්ෂයෙහි ඥානවාන් ශිඛාවාන් යනු වේ, මෙහි වතුප්‍රත්‍යයයි.

(මු-) 445. **ශං-කං-භ්‍යං ය-යු-ත-තු-ති-ව-භාඃ.** (ශං-කං-භ්‍යං 5 .. ය—භාඃ 1...)

ශංයඃ ශංයුඃ ශන්තඃ ශන්තුඃ ශන්තිඃ ශංවඃ ශංභඃ.

(ස-) ශංකංභ්‍යම්, ශම් කම් යන මේ මකාරාන්ත අව්‍යයශබ්දයන් දෙදෙනා කෙරෙන් ; යයු තතුති වභාඃ, යය-යුය-තය-තුය-තිය-වය-භය යන මේ ප්‍රත්‍යයෝ අස්ත්‍යර්ථයෙහි වෙත්. ශං කල්‍යාණං විද්‍යතෙ'ස්‍ය ශංයඃ, මෙහි විසංඥයාගේ ලොපාභාවය බීජයයි (430) දතයුතු. එසේම (431) නක්‍ෂත්‍රනිර්දිෂ්ට මනිත්‍යම් යන න්‍යාය හෙයින් දන්තත්‍වා නිෂෙධාභාවය ඇති

* ස්‍රක් ච මෙධා ච අස් ච මායාචෙති සමාහාරෙ ත්‍යස්මාත්.

† න එකො නෙකඃ, නෛකො'ච් යස්‍ය ස නෛකාච්, නෛකාච්වාසෞ, අශ්වෙති නෛකාජඃ තස්මාත්.

කල්හි (50) මකාරයහට අනුස්වාරය වේ. ශංයුඃ යනාදියද මෙසේමැයි. කං වාරිණී ච මූර්ධ්නීත්‍යමරඃ.

(මු-) 446. **ගෝ තෘණ මේධා දන්ත කාණ්ඩ දෘබල බලි පඤ්ච චූඩා ඵේන ලෝම පාම ප්‍රඥා මධු කේශ රජඃ එලෝර්ණා ශෘඞ්ගනිද්‍රාශීවාතාදේර්මින් සෙරොරෙරමොලෙහතලෙල ශනණ රවවලෙන ස්වාරකාලවකින් වා**. (ගෝ—වාතාදෙඃ 5. මින්—කින් 1. වා 1.)

එභ්‍ය එතෙ ක්‍රමාත් ස්‍යුඃ අසත්‍යපේ වා. ගෝමී.

(ස-) එභ්‍යඃ, ගෝ-තෘණ-මෙධා-දන්ත-කාණ්ඩ-දෘ-බල-බලි-පඤ්ච-චූඩා-ඵේන-ලෝම - පාම - ප්‍රඥා - මධු - කේශ - රජස්-එල - ඌර්ණා-ශෘඞ්ග-නිද්‍රා-අශීස්-වාතා යන මේ ආදි ශබ්දයන් කෙරෙන්; එතෙ, මින්-ස-ඉර-උර-ඊර-ම-ඌල-ඉභ-ත-ල-ඉල-ශ-න-ණ-ර-ව-වල-ඉන-යු-ආරක-ආලු-අ-කින් යන මේ ප්‍රත්‍යයෝ; ක්‍රමාත්, පඞ්ක්තීන්; අසත්‍යපේ, විද්‍යමානාපියෙහි; වා ස්‍යුඃ, විකල්පයෙන් වන්නෝය.

ගාවො විද්‍යන්තෙ'ස්‍ය යන වාක්‍යයෙහි මෙයින් මින් වේ, ගෝමී. පක්ෂයෙහි-ගෝමාන්යනු වේ. වාතාදෙඃ යනාදි පදය සියල්ලතන්හි යෙදියයුතු. මෙහි සාධාරණ වශයෙන් ඉදින් කියන ලද්දේද එසේද අපිවිශෙෂයෙහි දතයුතු.

(මූ-) 447. **නාම්න්‍යසත්‍යපේ'වො ඊඃ**. (නාම්නි 7. අසත්‍යපේ 7. අවඃ 6. ඊඃ 1.)

(ස-) නාම්නි, නාමයක් වාච්‍යකල්හි; අසත්‍යපේ, විද්‍යමානාපියෙහි වූ ප්‍රත්‍යයන් පරකල්හි; අවඃ, ස්වරයාගේ ස්ථානයෙහි; ඊඃ, දීර්ඝ වේ.

(මූ-) ස්වාමී, තෘණසඃ, මෙධිරඃ රථිරඃ, දන්තුරඃ, කාණ්ඩීරඃ අණ්ඩීරඃ, දෘමඃ ද්‍රුමඃ, බලූලඃ වාතූලඃ, බලිභඃ තුන්දිභඃ, පඤ්චතඃ මරුත්තඃ, චූඩාලඃ මාංසලඃ, ඵේන්ලඃ පිච්ඡිලඃ, ලෝමශඃ රෝමශඃ, පාමනඃ අඞ්ගනා, ප්‍රාඥඃ ශ්‍රාද්ධඃ, මධුරඃ කුඤ්ජරඃ, කේශවඃ මානවඃ, රජස්වලා කෘෂීවලඃ, එලිනඃ වර්හිණඃ, ඌර්ණායුඃ අහංයුඃ, ශෘඞ්ගාරකඃ වෘන්දාරකඃ, නිද්‍රාලුඃ දයාලුඃ, අශීසඃ වෛජසනතඃ, වාතකී අතිසාරකී.

(ස-) ස්වා'ස්‍යාස්තීති ස්වඃ යන මොහු කෙරෙන් මින් ප්‍රත්‍යය වේ, මෙයින් දීර්ඝ වේ, ස්වාමී යනු ඊශ්වරයි. තෘණං අස්ත්‍යස්‍ය තෘණසඃ, මෙධා අස්ත්‍යස්‍ය මෙධිරඃ යනාදි වාක්‍ය

මෙසේයි. ලැබෙන පරිද්දෙන් (258) ඉවර්ණාවර්ණයන්ගේ ලොපයයි. සියලුතන්හි අභිධාන බැවින් ස්ත්‍රී පුංලිඞ්ග නියම යයි. මොවුන් කෙරෙන් භිනනබූවෝ කියනුලැබෙත්—චූඩාදි බැවින් පාංශුලඃ ශ්‍යාමලඃ පිඞගලඃ කපිලඃ කණ්ඩූලඃ පෘථුලඃ පක්ෂ්මලඃ මඤ්ජුලඃ මෘදුලඃ වටුලඃ පෙශලඃ ශුක්ලඃ තුන්දිලඃ යන මෙ ශබ්දයෝ වෙත්. රොමාදි බැවින් කපිශඃ කර්කශඃ යන මොහුයි. පාමාදි බැවින් වාමනඃ යනුයි. ප්‍රඥාදි බැවින් වාත්තිඃ ශාර්කරඃ ශෛකතඃ යන මොහුයි. මධ්වාදි බැවින් ශුෂිරඃ ඌෂරඃ පුෂ්කරඃ මුඛරඃ නඛරඃ පාණ්ඩුරඃ බන්ධුරඃ යන මොහුයි. කෙශාදිබැවින් විෂ්‍ණුවඃ රාජීවඃ ගාණ්ඩීවඃ යන මොහුයි. රජස්ආදි බැවින් දන්තාවලඃ යනුයි. එලාදිබැවින් මලිනඃ යනුයි. නිද්‍රාදි බැවින් තන්ද්‍රාලුඃ ලජ්ජාලුඃ ශ්‍රද්ධාලුඃ කෘපාලුඃ යන මොහුයි, මේ ආදීහු ප්‍රයොගානුසාරයෙන් දතයුත්තාහු වෙත්.

(මු-) 448. වාග්මිවාචාටවාචාලාඃ. (වාග්මි—වාචාලාඃ 1...) වාචො‘ස්‍යාස්ත්‍යර්ථෙ එතෙ නිපාත්‍යන්තෙ.*

(ස-) වාචො‘ස්‍යාස්ති, වාචො අස්ති යන මේ අර්ථයෙහි; එතෙ, වාග්මි වාචාට වාචාල යන මේ ශබ්දයෝ; නිපාත්‍යන්තෙ, වාච්ශබ්දයාගේ ස්ථානයෙහි නිපාතනය කරණු ලැබෙත්.

(මු-) 449. ජන-බලාදි-ගො-රථ-වාතාත්තෙන්ත්‍රකඩ්‍යාලං සඞ්ඝෙ. (ජන-වාතාත් 5. තෙන්ත්‍රකඩ්‍යාලං 1. සඞ්ඝෙ 7.)

ජනතා බන්ධුතා, බලිනී හලිනී, ගොත්‍රා, රථකඩ්‍යා, වාතූලඃ.

(ස-) ජනබලාදි ගොරථවාතාත්, ජනාදි ශබ්ද බලාදි ශබ්ද ගොශබ්ද රථශබ්ද වාතශබ්ද යන මොවුන් කෙරෙන්; සඞ්ඝෙ, සමූහාර්ථයෙහි; තෙන්ත්‍රකඩ්‍යාලං, තප්‍රත්‍යය ඉන්ප්‍රත්‍යය ත්‍රප්‍රත්‍යය කඩ්‍යප්‍රත්‍යය ඌලප්‍රත්‍යය යන මේ ප්‍රත්‍යය ගණය වේ. ජනානාං සමූහඃ ජනතා, බන්ධුතා යනුද මෙසේමැයි. බලානාං සමූහඃ බලිනී, හලිනී යනුද මෙසේමැයි. ජනාදියද

---

* නිපාතනය වනාහි අර්ථවිශෙෂයෙහි කියනලදී, වාග්මී යනු ප්‍රශංසායෙහි වෙයි, වාචාට වාචාල දෙදෙන නින්‍දාවෙහි වෙත්, අධික කථා ඇති බැවින යන අර්ථයි.

බල්‍යාදියද ප්‍රයොගානුසාරයෙන් දතයුතු. ගවාං සමූහඃ ගොත්‍රා, රථානාං සමූහඃ රථකඩ්‍යා, වාතානාං සමූහඃ වාතූලඃ, අභිධාන බැවින් ඌලප්‍රත්‍යයාන්තයහට පුංස්ත්වයද අන්‍යයන්ට ස්ත්‍රීත්වයද වෙත්.*

(මූ-) **450. සඞ්ඛ්‍යායා ඩට් පූරණෙ.** (සඞ්ඛ්‍යායාඃ 5. ඩට් 1. පූරණෙ 7.)

එකාදශානාං පූරණඃ එකාදශඃ.

(ස-) සඞ්ඛ්‍යායාඃ, සඞ්ඛ්‍යාවාචක ශබ්දයා කෙරෙන් ; පූරණෙ, පූරණාර්ථයෙහි ; ඩට්, ඩට්ප්‍රත්‍යය වන්නේය. ඩකාර ටකාර දෙක ඉත්සංඥ ඇත්තෝයි, අකාරය සිටියි, ඉත්සංඥ ඩකාර බැවින් (126) ටිසංඥයහට ලොප් වේ, ටිත්ත්වයෙන් (257) ඞීප් වේ. පූර්‍යතෙ සම්පද්‍යතෙ අනෙනෙති පූරණඃ කරණයෙහි අනට්ප්‍රත්‍යය වේ. දශන්ශබ්දය කෙළවරකොට ඇති ශබ්ද යන් විශෙෂ ප්‍රත්‍යයෙකින් බාධිත බැවින් ඔවුන් හැර එකා දශානාං පූරණඃ එකාදශඃ යී උදාහරණ කෙරෙයි, එකාදශ සඞ්ඛ්‍යාව යම් කරණයෙකින් පිරීම වන්නේද ඒතෙම එකා දශනම් වෙයි, පුත්‍රයයි, පුත්‍රයන් දශයක් කෙරෙන් පරය යන අර්ථයි. ද්වාදශ යනාදියද මෙසේයි, ස්ත්‍රීලිඞ්ගයෙහි එකාදශී යනාදියයි.

(මූ-) **451. නො'සඞ්ඛ්‍යාදෙර්මට්.** (නඃ 5. අසඞ්ඛ්‍යාදෙඃ 5. මට් 1.)

අසඞ්ඛ්‍යාදෙර්නාන්තසඞ්ඛ්‍යායා මට් ස්‍යාත් පූරණෙ. පඤ්චමඃ.

(ස-) අසඞ්ඛ්‍යාදෙඃ, ආදියෙහි සඞ්ඛ්‍යා ශබ්ද රහිතවූ ; නාන්තසඞ්ඛ්‍යායාඃ, නකාරාන්ත සඞ්ඛ්‍යාවාචකශබ්දයා කෙරෙන් ; පූරණෙ, පූරණාර්ථයෙහි ; මට් ස්‍යාත්, මට්ප්‍රත්‍යය වන්නේය. පඤ්චානාං පූරණඃ-පඤ්චමඃ (118) නකාරයහට ලොප් වේ, ටිත්ත්වබැවින් (257) පඤ්චමී යනාදිය වේ. සප්තමඃ අෂ්ටමඃ නවමඃ දශමඃ යනුද මෙසේයි. අසඞ්ඛ්‍යාදෙඃ යනු

---

* ජනශ්ච බලශ්ච තෙ ආදී යස්‍ය ස ජනබලාදිඃ, ස ච ගොශ්ච රථශ්ච වාතශ්ච තත්තස්මාත්. තශ්ච ඉන් ච ත්‍රශ්ච කඩ්‍යශ්ච ඌලශ්ච තත්.

† සඞ්ඛ්‍යා ආදිර්යස්‍ය ස සඞ්ඛ්‍යාදිඃ, න සඞ්ඛ්‍යාදිරසඞ්ඛ්‍යාදි ස්තස්මාත්.

කුමටය? එකාදශඃ ද්වාදශඃ යනාදියෙහි සඞ්ඛ්‍යාශබ්දය ආදි යෙහි වූ කල්හිමට්ප්‍රත්‍යය නොවන හෙයිනි. මුඛ්‍යවූ මේ ශබ්ද යන්ගේම ග්‍රහණයයි, එහෙයින්—අතිපඤ්චානාං පූරණඃ යනාදියෙහි මට්ප්‍රත්‍යය නොවන්නේය.

(මූ-) 452. **තමට් ෂෂ්ට්‍යාදේඃ**. (තමට් 1. ෂෂ්ට්‍යාදේඃ 5.)

අසඞ්ඛ්‍යාදේඃ ෂෂ්ට්‍යාදේඃ පූරණෙ තමට් ස්‍යාත්. ෂෂ්ටිතමඃ සප්තතිතමඃ. සඞ්ඛ්‍යාදේස්තු එකෂෂ්ටඃ.*

(ස-) අසඞ්ඛ්‍යාදේඃ, ආදියෙහි සඞ්ඛ්‍යාශබ්දයක් රහිතවූ; ෂෂ්ට්‍යාදේඃ, ෂෂ්ටිශබ්දාදිය කෙරෙන්; පූරණෙ, පූරණාර්ථයෙහි; තමට් ස්‍යාත්, තමට්ප්‍රත්‍යය වන්නේය. ෂෂ්ටෙඃ පූරණඃ ෂෂ්ටි තමඃ, සප්තතෙඃ පූරණඃ සප්තතිතමඃ. ඌනෂෂ්ටිතමඃ යනුද අශීතිතමඃ යනාදියද මෙසේයි. සඞ්ඛ්‍යාදේස්තු, ආදියෙහි සිටි යාවූ සඞ්ඛ්‍යාවාචක ශබ්දයා හා යෙදුනාවූ ෂෂ්ටිශබ්දයා කෙ රෙන්වනාහි; එකෂෂ්ටඃ, (450) ඩට්ප්‍රත්‍යයව එකෂෂ්ටඃයනු වේ.

(මූ-) 453. **ශතාදි-මාස-සංවත්සරාත්**. (සතාදි—සංවත්ස රාත් 5.)

එභ්‍යස්තමට් ස්‍යාත් පූරණෙ. ශතතමඃ එකශතතමඃ, මාස තමඃ සංවත්සරතමඃ.†

(ස-) එභ්‍යඃ, ශත ශබ්දාදිය මාසශබ්දය සංවත්සරශබ්දය යන මේ ශබ්දයන් කෙරෙන්; පූරණෙ, පූරණාර්ථයෙහි; තමට් ස්‍යාත්, තමට්ප්‍රත්‍යය වන්නේය. වෙන්වූ යොගය බැවින් අසඞ්ඛ්‍යා දේඃ යනු අනුවෘත්තිය නොවේ, එහෙයින් සඞ්ඛ්‍යාදි වූද අසඞ් ඛ්‍යාදි වූද මේ ශබ්දයන් කෙරෙන් යනු අර්ථයි. ශතස්‍ය පූරණඃ ශතතමඃ එකශතස්‍ය පූරණඃ එකශතතමඃ. මාසස්‍ය පූරණඃ මාස තමඃ, සංවත්සරස්‍ය පූරණඃ සංවත්සරතමඃ. එකමාසතමඃ එකවත්සරතමඃ යනාදියද මෙසේමැයි.

(මූ-) 454. **විංශත්‍යාදේර්වා**. (විංශත්‍යාදේඃ 5. වා 1.)

විංශතිතමඃ විංශඃ, ත්‍රිංශත්තමඃ ත්‍රිංශඃ.‡

(ස-) විංශත්‍යාදේඃ, ආදියෙහි සඞ්ඛ්‍යාශබ්ද යුක්තවූ හෝ ආදි යෙහි සඞ්ඛ්‍යාශබ්ද රහිතවූ හෝ විංශතිශබ්දාදීන් කෙරෙන්;

---

* ෂෂ්ටිරාදිර්යස්‍ය ස ෂෂ්ට්‍යාදිස්තස්මාත්.

† ශතාදිශ්ච මාසශ්ච සංවත්සරශ්ච තත්තස්මාත්.

‡ විංශතිරාදිර්යස්‍ය ස තස්මාත්.

වා, පූරණාර්ථයෙහි විකල්පයෙන් තමට්ප්‍රත්‍යය වන්නේය. විංශතෙඃ පූරණඃ විංශතිතමඃ, පක්ෂයෙහි (450) ඩට් වේ, (126) තිහට ලොප්වේ, (258) අකාරලොපය වේ, විංශඃ යනු වේ.

ත්‍රිංශතෙඃ පූරණඃ ත්‍රිංශත්තමඃ, යනුද ත්‍රිංශඃ යනුද මෙසේමැයි. සඞ්ඛ්‍යාදි ශබ්දයා කෙරෙන් වනාහි; එකවිංශතිතමඃ එකවිංශඃ යන මෙ ආදියයි. පූර්ව සූත්‍රයෙන් (452) සඞ්ඛ්‍යාදි ශබ්ද වර්ජිත කල්හිද මේ සූත්‍රයෙන් සඞ්ඛ්‍යාදිවූ ෂෂ්ට්‍යාදි ශබ්දයන් කෙරෙන් පූරණාර්ථයෙහි තමට් ප්‍රත්‍යය විකල්පයෙන් වක්තව්‍යයි, එහෙයින් එකෂෂ්ටිතමඃ එකෂෂ්ටඃ යනාදිය වේ. ආදි යන පදයෙන් නවතිශබ්දය කෙළවරකොට නියමකරණු ලැබේ.

(මූ-) 455. **චතුඃ-ෂඩ්-ඩති-කතිපයාත් ථට්.** (චතුඃ—කතිපයාත් 5. ථට් 1.) චතුර්ථඃ ෂෂ්ඨඃ කතිථඃ කතිපයථඃ.*

(ස-) චතුඃ ෂඩ් ඩති කතිපයාත්, චතුර්ශබ්ද ෂෂ්ශබ්ද ඩති ප්‍රත්‍යයාන්තශබ්ද කතිපයශබ්ද යන මොවුන් කෙරෙන්; ථට්, පූරණාර්ථයෙහි ථට්ප්‍රත්‍යය වන්නේය. ඩති යනු ප්‍රත්‍යයයි (508), එහෙයින් ඩතිප්‍රත්‍යයාන්තවූ කති යති තති යන මොවුන්ගේ ග්‍රහණයයි. චතුර්ණාං පූරණඃ චතුර්ථඃ, ෂෂ්ඨඃ යනාදියද මෙසේමැයි. විද්‍යමාන විභක්ති ඇත්තවුන්ගේ පදත්වය ස්වභාවයෙන් පවත්යි, ලුප්ත විභක්තිකයන්ගේ පදත්වය වනාහි ආතිදෙශිකමය, එහෙයින්ද—ආතිදෙශිකමනිත්‍යම් යන න්‍යාය හෙයින් චතුර්ථඃ ෂෂ්ඨඃ යන දෙතන්හි පදත්වයක් නැති බැවින් විරාමයක් නැත්තේනුයි (102) රකාරය හට විසර්ගය නොවේ, (155) ෂකාරයහටද ඩකාර නොවේ.

(මූ-) 456. **බහු-ගණ-පූග-සඞ්ඝාතොඃ තිථට් තලොපශ්ච.** (බහු-අතොඃ 5. තිථට් 1. තලොපඃ 1. ච 1.)

බහුතිථඃ යාවතිථඃ.†

(ස-) බහුගණපූගසඞ්ඝාතොඃ, බහුශබ්ද ගණශබ්ද පූගශබ්ද සඞ්ඝශබ්ද අතුප්‍රත්‍යයාන්තශබ්ද යන මොවුන් කෙරෙන්; තිථට්, පූරණාර්ථයෙහි තිථට් ප්‍රත්‍යය වේ; තලොපශ්ච, තිථට් පරකල්හි තකාරලොපයද වේ.

---

* චතුර් ච ෂෂ් ච ඩතිශ්ච කතිපයශ්ච තත්‍යාසමාත්.

† බහුශ්ච ගණශ්ච පූගශ්ච සඞ්ඝශ්ච අතුශ්ච තත්‍යාසමාත්.

අතු යනු ප්‍රත්‍යයයි (508), එහෙයින් යාවත් තාවත් එතාවත් කියත් ඉයත් යන මොවුන්ගේ ග්‍රහණයයි. තිථ්ප්‍රත්‍යයා පර කල්හි මධ්‍යගතවූ අන්‍යවර්ණයක් රහිතවූ පූර්වයෙහි සිටි තකාරයහට ලොප්වේ, බහූනාං පූරණඃ බහුතිථඃ, යාවතාං පූරණඃ යාවතිථඃ, තාවතිථඃ එතාවතිථඃ කියතිථඃ ඉයතිථඃ කියාද වේ.

(මු-) 457. **ද්විතීය තෘතීය තුර්‍ය්‍ය තුරීයාඃ.** (1...)

එතෙ නිපාත්‍යන්තෙ.

(ස-) එතෙ, ද්විතීය තෘතීය තුර්‍ය්‍ය තුරීය යන මේ ශබ්දයෝ; නිපාත්‍යන්තෙ, නිපාතනයෝයි. ද්වයොඃ පූරණඃ ත්‍රයාණාං පූරණඃ චතුර්ණාං පූරණඃ කියා ක්‍රමයෙන් වාක්‍යයෝයි, තුර්‍ය්‍ය යන මෙහි (228) තද්ධිත යකාරය හරණලද බැවින් දීර්ඝ නොවේ.

(මු-) 458. **සඞ්ඛ්‍යායා ධාච් ප්‍රකාරෙ.** (සඞ්ඛ්‍යායාඃ 5. ධාච් 1. ප්‍රකාරෙ 7.) චතුඃ ප්‍රකාරං චතුර්ධා.

(ස-) සඞ්ඛ්‍යායාඃ, සඞ්ඛ්‍යාවාචක ශබ්දයා කෙරෙන්; ප්‍රකාරෙ, ප්‍රකාරාර්ථයෙහි ; ධාච්, ධාච්ප්‍රත්‍යය වන්නේය.

සඞ්ඛ්‍යායාඃ යන මෙයින් (101) සඞ්ඛ්‍යාතුල්‍යයන්ගේද ග්‍රහණයයි, එහෙයින් සඞ්ඛ්‍යාවාචකවූ ඩති-අතු-බහුශබ්ද ගණ ශබ්දයන් කෙරෙන්ද ප්‍රකාරාර්ථයෙහි ධාච්ප්‍රත්‍යය වන්නේය. ධාච් යන්නෙහි චකාරය ඒ ප්‍රත්‍යයාන්තයාගේ අව්‍යයත්වය දක්වනු පිණිසයි. ප්‍රකාරො භෙදසාදෘශ්‍යෙ යනු අමරකොෂයි. චතුඃ ප්‍රකාරං යනු චත්වාරඃ ප්‍රකාරා යස්‍ය තත් යි විග්‍රහයි. කතිධා යනාදියද මෙසේමැයි. මේ ප්‍රත්‍යයතෙම සියලු විභක්ත්‍යර්ථයෙහිම වෙයි. එහෙයින්—චතුඃ ප්‍රකාරාන් භුඞ්ක්තෙ, චතුඃ ප්‍රකාරෛඃ භුඞ්ක්තෙ යනාදියෙහි චතුර්ධා භුඞ්ක්තෙ කියා වෙයි. කිසි කෙනෙක් වාරාර්ථයෙහිද ධාච් වෙයි යනු කියති.

(මු-) 459. **ද්වෛධං ද්වෙධා, ත්‍රෛධං ත්‍රෙධා ෂොඪෛකධ්‍යං වා.** (ද්වෛධං—එකධ්‍යං 1... වා 1.)

එතෙ නිපාත්‍යන්තෙ වා ප්‍රකාරෙ. පක්ෂේ ද්විධා ත්‍රිධා ෂඩ්ධා එකධා.

(ස-) එතෙ, ද්වෛධං-ද්වෙධා-ත්‍රෛධං-ත්‍රෙධා-ෂොඪා-එකධ්‍යං යන මොව්හු ; ප්‍රකාරෙ, ප්‍රකාරාර්ථයෙහි ; වා, විකල්පයෙන් ; නිපාත්‍යන්තෙ, නිපාතනයෙන් සිද්ධකරණු ලැබෙත්. ද්විප්‍රකාරං යන වාක්‍යයෙහි ද්වෛධං කියාද ද්වෙධා කියාද වෙත්. ත්‍රිප්‍රකාරං ත්‍රෛධං—ත්‍රෙධා යනුයි. ෂට්ප්‍රකාරං ෂොඪා, එකප්‍රකාරං එකධ්‍යං.

පක්ෂෙ, පක්ෂයෙහි ; ද්විධා, පළමු සූත්‍රයෙන් ධාච්ප්‍රත්‍යයට ද්විප්‍රකාරං ද්විධා යනු වේ. ත්‍රිප්‍රකාරං ත්‍රිධා, ෂට්ප්‍රකාරං ෂඩ්ධා, ඒකප්‍රකාරං ඒකධා. ෂඩ්ධා යන මෙහි (155) ඩප්‍රත්‍යය කළ කල්හි, පදාන්තවූ ටවර්ගීය පර බැවින් (47) ධකාරයහට ඪකාර නොවේ.

(මූ-) 460. **සඞ්ඛ්‍යායා අවයවෙ තයට්**. (සඞ්ඛ්‍යායාඃ 5. අවයවෙ 7. තයට් 1.)

චතුරවයවං චතුෂ්ටයං.

(ස-) සඞ්ඛ්‍යායාඃ, සඞ්ඛ්‍යාවාචක ශබ්දයා කෙරෙන් ; අවයවෙ, අවයවයෙහි ; තයට්, තයට්ප්‍රත්‍යය වන්නේය. ටකාරය ඉත්සංඥයි. නැවත සඞ්ඛ්‍යාග්‍රහණය ඩති අතු බහුගණ යන්ගේ අප්‍රාප්තිය පිණිසයි. විකල්ප දෙදෙනකුගේ මධ්‍යයෙහි විධිනිත්‍යයි. චත්වාරෝ'වයවා යස්‍ය තත් (කුලං) චතුරවයවං යන වාක්‍යයෙහි චතුෂ්ටයං යනු වේ, (102, 65, 439, 47). ස්ත්‍රීලිඞ්ගයෙහි චතුෂ්ටයී යනු වේ.

(මූ-) 461. **ද්විත්‍රෙර්වායට්**. (ද්විත්‍රෙඃ 5. වා 1. අයට් 1.)

ද්වයං ද්විතයං, ත්‍රයං ත්‍රිතයං.*

(ස-) ද්විත්‍රෙඃ, ද්විශබ්ද ත්‍රිශබ්ද යන මොවුන් කෙරෙන් ; වා, විකල්පයෙන්; අයට්, අවයවයෙහි අයට්ප්‍රත්‍යය වෙයි. ද්ව්‍යවයවං ද්වයං, ද්ව්‍යවයවං ද්විතයං. ත්‍ර්‍යවයවං ත්‍රයං, ත්‍ර්‍යවයවං ත්‍රිතයං. ද්විශබ්ද ත්‍රිශබ්ද දෙකින් පරව මෙයින් අයට්ප්‍රත්‍යය වේ, (258) ඉකාරලොපය වේ, ද්වයං ත්‍රයං යනු වේ. පක්ෂයෙක්හි පූර්වසූත්‍රයෙන් තයට්ප්‍රත්‍යය වේ, ද්විතයං ත්‍රිතයං යනු වේ. ස්ත්‍රීලිඞ්ගයෙහි ද්වයී ත්‍රයී යනු වේ.

(මූ-) 462. **තරතමෞ ද්විබහූනාමෙකොත්කර්ෂෙ**. (තර—තමෞ 1.. ද්විබහූනාං 6...එකොත්කර්ෂෙ 7.)

ද්වයොරෙකස්‍යාතිශයෙ තරො බහූනාං තමඃ ස්‍යාත්. අයමනයොරතිශයෙන විද්වාන් විද්වත්තරඃ, අයමෙෂාමතිශයෙන විද්වාන් විද්වත්තමඃ. ශුභ්‍රතරා ශුභ්‍රතමා.†

(ස-) ද්වයොඃ, දෙදෙනා අතුරෙන් ; එකස්‍ය, එකක්හුගේ ;

* ද්වෛ ච ත්‍රයශ්ච තත් තයමාත් ද්විත්‍රෙඃ.

† තරශ්ච තමශ්ච තෞ. ද්වෞ ච බහවශ්ච ද්විබහවස්තෙෂාං.

අතිශයෙ, උත්කර්ෂයෙහි ; තරඃ, තරප්‍රත්‍යය වන්නේය ; බහූනාං, බොහෝදෙනා අතුරෙන් එකක්හුගේ උත්කර්ෂයෙහි ; තමඃ ස්‍යාත්, තමප්‍රත්‍යය වන්නේය. ව්බහූනාං යනු (313) නිර්ධාරණයෙහි ෂෂ්ඨියි. ව්බහූනාං යී බහුවචනාන්තත්වය ඇතිකල්හිද ශබ්දසාම්‍යය හෙතුකොටගෙන තර තම දෙදෙනා කෙරෙන් ක්‍රමය දතයුතු වෙයි. උත්කර්ෂය අතිශයයි. මෙසේ උත්කර්ෂාර්ථවත් ප්‍රත්‍යයාන්තයෝ පූර්වලිඞ්ගයෝමය. විවත්තරඃ විවත්තමඃ යන දෙතන්හි විද්‍වගේ උත්කර්ෂය හැඟෙයි, (183) දඩ් ආදෙශ වෙයි, (64) දකාරයහට තකාර වෙයි. ඉයමනයොරතිශයෙන ශුභ්‍රා ශුභ්‍රතරා, ආසාමතිශයෙන ශුභ්‍රා ශුභ්‍රතමා, (327) පුංවද්භාවය වේ. අතිශයෙන සාධ්වී සාධුතරා යනාදියද මෙසේමැයි.

(මු-) 463. **රූපකල්පෙ චෙබ්ජු ඣං වා ව්‍රින්තු පුංවච්ච.** (රූපකල්පෙ 7. ච 1. ඊප්–ඌප් 1. ඣං 1. වා 1. ව්රිත් 1. තු 1. පුංවත් 1. ච 1.)

චකාරාත් තර-තම-රූප-කල්පෙෂු ඊබන්තමූබන්තඤ්ච ඣං ස්‍යාද්වා උදෘදිතනු පුංවච්ච. ස්ත්‍රිතරා ස්ත්‍රීතරා, වාමොරුතරා වාමොරූතරා. විදුෂිතරා විදුෂීතරා විවත්තරා, සතිතරා සතීතරා සත්තරා.*

(ස-) චකාරාත්, සූත්‍රයෙහි චකාරය හෙතුකොටගෙන ; තර තම රූප කල්පෙෂු, තර-තම-රූප-කල්ප යන මොවුන් පර කල්හි ; ඊබන්තං, ඊප් අන්තයද ; ඌබන්තඤ්ච, ඌප්ප්‍රත්‍යයාන්තයද ; වා, විකල්පයෙන් ; ඣං ස්‍යාත්, හ්‍රස්ව වන්නේය. උදෘදිත්තු, ඉත්සංඥවූ උකාර ඍකාර දෙක වනාහි ; පුංවච්ච, විකල්පයෙන් පුංවද්භාවයද වන්නේය. (327) පුංවත් ස්ත්‍ර්‍යූක්ත යන මේ ආදියෙන් නිත්‍යයෙන් පුංවද්භාවය පැමිණි කල්හි මේ සූත්‍රයෙන් විකල්පවිධානයයි. ඉයමනයොරතිශයෙන ස්ත්‍රී ස්ත්‍රිතරා, පක්ෂයෙහි ස්ත්‍රීතරා යනු වේ. ඉයමනයොරතිශයෙන වාමොරූඃ වාමොරුතරා, පක්ෂයෙහි වාමොරූතරා යනු වේ, දෙතන්හි ස්ත්‍රියගේ සෞන්දර්‍ය්‍යගතවූ උත්කර්ෂය හැඟේ. මේ සූත්‍රයෙන් විකල්පයෙන් හ්‍රස්වයි. විදධාතුහු

---

* රූපශ්ච කල්පශ්ච රූපකල්පං තස්මින්. ඊප් ච ඌප් ච ඊබූප්. උශ්ච ඍශ්ච ඌ, ඌ ඉත් යස්‍ය ව්රිත්.

කෙරෙන් ශතෘප්‍රත්‍යයයි (1103) ඔහුගේ ස්ථානයෙහි ක්වසු ප්‍රත්‍යයයි, (257) නැවත ඊප්ප්‍රත්‍යයයි, (229) වකාරයහට උකාර වේ, විදුෂී යනු වේ, නැවත ඉයමනයොරතිශයෙන විදුෂී විදුෂිතරා, පක්‍ෂයෙහි විදුෂීතරා. පුංවත්පක්‍ෂයෙහි විද්වත්තරා යනු වේ. එසේම අසධාතුහු කෙරෙන් (1100) ශතෘප්‍රත්‍යය වේ, ඊප් කළ කල්හි සතී යනු වේ; නැවත ඉයමනයොරතිශයෙන සතී යන වාක්‍යයෙහි තරප්‍රත්‍යය කළ කල්හි මේ සූත්‍රයෙන් විකල්පයෙන් හ්‍රස්ව වේ, පක්‍ෂයෙහි පුංවත්ද වේ.

(මූ-) 464. **ත්‍යාදෙශ්ච රූපඃ.** (ත්‍යාදෙඃ 5. ච 1. රූපඃ 1.)

ලෙස්ත්‍යාදෙශ්චොත්කර්ෂෙ රූපඃ ස්‍යාත්. පටුරූපඃ, පචතිරූපං.

(ස-) ලෙඃ, ලිඟුහු කෙරෙන්ද; ත්‍යාදෙශ්ච, තිවිභක්ත්‍යාදි අන්තයා කෙරෙන්ද; උත්කර්ෂෙ, අතිශයාර්ථයෙහි; රූපඃ ස්‍යාත්, රූපප්‍රත්‍යය වන්නේය. යෙන විධිස්තදන්තස්‍ය යන න්‍යාය හෙතුකොටගෙන ත්‍යාද්‍යන්තයා කෙරෙන්ද චකාරය හෙතු කොටගෙන ලිඞ්ගයා කෙරෙන්ද රූපප්‍රත්‍යය වන්නේය. මෙහි එකම ප්‍රත්‍යයහට අර්ථයක් හා සමග ක්‍රමසම්බන්ධයක් නොවන බැවින් එකම උත්කර්ෂයෙහි කියාම සම්බන්ධයයි. අතිශයෙන පටුඃ පටුරූපඃ, අතිශයෙන පට්වී පටුරූපා (327) පුංවද්භාවය වේ. අතිශයෙන පචති පචතිරූපං, මෙහි ක්‍රියාවගේ උත්කර්ෂයයි. අතිශයෙන පචන්ති පචන්තිරූපං යනුද මෙසේමැයි. මේ ආදීන් කෙරෙහි කර්තෘහුගේ වචනානුසාරයෙන් තිප් ආදීහු යොදනු ලැබෙත්. අන්‍යය වනාහි ක්‍රියාව තමා පුංස්ත්වාදීන්ගේ අභාවයෙන් රූපාන්තවූ ක්‍රියාපදයහට ලිඞ්ගනියමයක් නැතිකල්හි සාධාරණත්වය හෙතුකොටගෙන නපුංසකත්වය වේ, එසේම ක්‍රියාවගේ සඞ්ඛ්‍යාභාවයෙන්ද පළමු එළවනලද්දාවූ එකවචනයම වෙයි.

(මූ-) 465. **කිමෙත්‍යාච්චාද්‍රව්‍යෙ චතරාං-චතමාං.** (කිම්-එ-ත්‍යාත් 5. ච 1. අද්‍රව්‍යෙ 7. චතරාං-චතමාං 1..)

කිම එදන්තාත් ත්‍යාත් ත්‍යාද්‍යන්තාච්ච විබහූත්වමෙකොත්කර්ෂෙ චතරාං චතමාං ස්තඃ න තු ද්‍රව්‍යෙ. කිංතරාං ප්‍රාහ්ණෙ

තරං උච්චෛස්තරං, පචතිතරං. එවං චතමාං. ද්‍රව්‍යෙ තු උච්චෛස්තරඃ.*

(ස-) කිමඃ, කිම්ශබ්දයා කෙරෙන්ද ; එදන්තාත්, එකාරාන්තයා කෙරෙන්ද ; ච්‍යාත්, අව්‍යයශබ්දයා කෙරෙන්ද ; තාඤන්තාච්ච, තාඤන්තයා කෙරෙන්ද; ද්විබහූනාං, දෙදෙනකු අතුරෙන් හෝ බොහෝදෙනකු අතුරෙන් ; එකොත්කර්ෂේ, එකක්හුගේ උත්කෘෂ්ටභාවයක් කියන කල්හි ; චතරං චතමාං, චතරං යන්නද චතමාං යන්නද යන මේ දෙදෙන ; ස්තඃ, වෙත්. න තු ද්‍රව්‍යෙ, ද්‍රව්‍යයෙහි වනාහි නොවේ.

මණ්ඩූකගතියෙන් ද්විබහූනාං එකොත්කර්ෂේ යනු සම්බන්ධවේ. සූත්‍රයෙහි චකාරය හෙතුකොටගෙන තාඤන්තයා කෙරෙන්ද චතරං චතමාං ප්‍රත්‍යයෝ වෙත්. එසේද, වාතුකෘෂ්ටං නොතාඤන්ත සී කීහෙයින් තාඤන්තයාගේ පසුව අනුවෘත්තිය නොවේ. ද්‍රව්‍යයෝ මෙසේයි, ක්ෂිත්‍යප් තෙජෝ මරුද්ව්‍යොම— කාල දිග් දෙහිනො මනඃ යන මේ නවයයි, දෙදෙනකු අතුරෙන් එකක්හුගේ උත්කෘෂ්ටයක් කියන කල්හි චතරංප්‍රත්‍යයයි, බොහෝදෙනකු අතුරෙන් එකක්හුගේ උත්කෘෂ්ටයක් කියන කල්හි චතමාංප්‍රත්‍යය යනු ක්‍රමයයි. ඉත්සංඥ චකාරය අව්‍යය පිණිසයි. මෙහි කිම් ආදීන් අතුරෙහි යම් ශබ්දයෝ ගුණාදිය කියද්ද ද්‍රව්‍යයද කියද්ද ඔවුන් කෙරෙන් ගුණාදිය වාච්‍ය කල්හි මේ ප්‍රත්‍යයෝ වෙත්. ද්‍රව්‍ය වාච්‍යකල්හි නොවෙත්. ඉදමනයොරතිශයෙන කිම් කිංතරාං, මෙහි කිම්ශබ්දය කුත්සිතාර්ථයි. වයොරතිශයෙන ප්‍රාග්ණෙ ප්‍රාහ්ණෙතරාං, එකාරාන්තයා කෙරෙන් ප්‍රත්‍යයවිධාන සම්බන්ධයෙන් සප්තමී විභක්තිහට ලොප් නොවේ. අයමනයොරතිශයෙන උච්චෛඃ උච්චෛස්තරාං, (ශබ්දයයි) නීචෛස්තරාං යනුද සුතරාං නිතරාං යනාදියද මෙසේයි, ඉදමනයොරතිශයෙන පචති පචතිතරාං, මෙහි පචනක්‍රියාවගේ උත්කර්ෂයයි. එවං චතමාං, චතමාං යනුද මෙසේයි. ද්‍රව්‍යෙ තු, ද්‍රව්‍යයෙහි වනාහි ; උච්චෛස්තරඃ තරුඃ, ගසයි. මෙහි කිසිසේත් ද්‍රව්‍යයෙහි උත්කෘෂ්ටභාවය නොවෙයි එසේද යම් කලෙක්හි ගුණ

* කිම් ච එඦ ච්‍යඤ්ච කිමෙච්‍යං තස්මාත්. න ද්‍රව්‍යමද්‍රව්‍යං තස්මින්. චතරං ච චතමාං ච තෞ.

ක්‍රියා ප්‍රකර්ෂය ද්‍රව්‍යයෙහි ආරොපණය කරණුලැබේද එකල්හිම මේ ප්‍රතිෂෙධය වෙයි, පූර්වසූත්‍රයෙන් (462) තර තම දෙක වෙත්. [පාණිනිඃ 5. 4. 11.]

(මූ-) 466. **ගුණාද්වෙෂ්ඨෙයසූ.** (ගුණාත් 5. වා 1. ඉෂ්ඨ-ඊයසූ 1..)

ගුණවාචිනො විබහූනාමෙකොත්කර්ෂෙ ක්‍රමාදිෂ්ඨෙයසූ ඊයස්විෂ්ඨෞ වා සතඃ.

(ස-) ගුණවාචිනඃ, ගුණවත් වාචීහු කෙරෙන්; විබහූනාං, දෙදෙනකු හෝ බොහෝදෙනකු අතුරෙන්; එකොත්කර්ෂෙ, එකක්හුගේ උත්කෘෂ්ටත්වයක් කියන කල්හි; ක්‍රමාත්, පඩකත්හින්; ඉෂ්ඨෙයසූ, ඉෂ්ඨ-ඊයසු (ඊයස්) ප්‍රත්‍යය දෙකද; ඊයස්විෂ්ඨෞ, ඊයසු-ඉෂ්ඨ දෙකද; වා, විකල්පයෙන්; සතඃ, වන්නෝය. ගුණවාචිනඃ යනු ගුණවත් වාචීහුගේම ග්‍රහණය වෙයි, ගුණය පමණක් කියන්නාහුගේ නොවෙයි, එහෙයින් ශුක්ලියාන් පටඃ කියා වන්නේය. පටස්‍ය ශුක්ලියාන් කියා නොවන්නේය. විබහූනාමෙකොත්කර්ෂෙ යනු සම්බන්ධ වේ.

ඉදින් වනාහි අන්‍යවත්‍රකරණවල විබහූනාං යන මේ කරණ කොට ගෙන ඊයසු-ඉෂ්ඨ දෙදෙනාගේ ක්‍රමයෙක් දක්නා ලැබේද, එසේද, වොපදෙවාචාරීහු විසින් ක්‍රමවිපරීතවූ ප්‍රයොගය දක්නාබැවින් ඉෂ්ඨෙයසූ ඊයස්විෂ්ඨෞ වා සතඃ යි කියන ලදී.

(මූ-) 467. **ණිදිමංශ්ච ඩිතෙනකාචඃ.** (ණි-ඉමත් 1. ච 1. ඩිත් 1. නෙකාචඃ 5.)

ණිර්මන් ඉෂ්ඨ ඊයසුශ්ච අනෙකාචො ලෙඃ පරෝ ඩිත් ස්‍යාත්. ලඝිෂ්ඨඃ, ලඝීයාන්.*

(ස-) අනෙකාචඃ, අනෙකස්වරවූ; ලෙඃ පරඃ, ලිගුහු කෙරෙන් පරවූ; ණිඃ, ණිප්‍රත්‍යය; ඉමන්, ඉමන්ප්‍රත්‍යය; ඉෂ්ඨඊයසුශ්ච, ඉෂ්ඨය-ඊයසුය යන ප්‍රත්‍යයෝද; ඩිත් ස්‍යාත්, ඩිත්සංඥ වන්නේය. චකාරය කරණකොටගෙන ඉෂ්ඨ-ඊයසුප්‍රත්‍යයෝයි. ඉමන්ප්‍රත්‍යයාගේ සාහචර්‍ය්‍යයෙන් මෙහි ණිප්‍රත්‍යය ලිගුහු කෙරෙන් පරවූයේම වෙයි. එහෙයින් ජාගරයති යනාදියෙහි

---

* ණිශ්ච ඉමන් ච තත් ණිදිමන්. නාස්ති එකො'ච් යස්‍ය ස නෙකාච් තස්මාත්.

නොයෙදෙයි. අයමනයොරෙෂාං වා අතිශයෙන ලඝුඃ ලඝිෂ්ඨඃ, ඉෂ්ඨප්‍රත්‍යය වේ, මේ සූත්‍රයෙන් ඔහට ඩිත්වත් වේ, (126) ටිලොපය වේ. ඊයසුප්‍රත්‍යයට ටිසංඥයහට ලොප්ව ලඝීයස් යන්නහු කෙරෙන් සිලොපද ව්‍රිදචඃ යනාදියෙන් නුණ්ද නසම්මහතනඃ යනාදියෙන් දීඝීද සකාරලොපයද කළ කල්හි ලඝීයාන් යනු වේ. පක්‍ෂයෙහි ලඝුතරඃ යනුද ලඝුතමඃ යනුද වෙත්.

(මු-) 468. **ලුඞ්මද්වද්විනාං.** (ලුක් 1. මත්-වත්-විනාං 6...) මතිෂ්ඨඃ. මෙධිෂ්ඨඃ.*

(ස) ඣිප්‍රත්‍යය ඉමන්ප්‍රත්‍යය ඉෂ්ඨප්‍රත්‍යය ඊයසුප්‍රත්‍යය යන මොවුන් පරකල්හි, මද්වද්විනාං, මත්-වත්-වින් යනමොවුන්ට; ලුක්, ලොප් වේ. අතිශයෙන මතිමාන් මතිෂ්ඨඃ, මේ සූත්‍රයෙන් මතුප්‍රත්‍යයහට ලොප් වේ, ඩකාරවත් බැවින් ටිලොපය වේ. අතිශයෙන මෙධාවාන් අතිශයෙන මෙධාවී කියා හෝ යන මේ වයෙහි ඉෂ්ඨප්‍රත්‍යය වූ කල්හි වතු-වින් යන මොවුන්ට ලොප්වේ, ඉත්සංඥ ඩකාර බැවින් ටිලොපය කළ කල්හි මෙධිෂ්ඨඃ. මතීයසී මෙධීයසී යනාදියද මෙසේමැයි. [පාණිනීඃ 5. 3. 65.]

(මු-) 469. **තෘන් ලොප්‍යඃ.** (තෘන් 1. ලොප්‍යඃ 1.) කරිෂ්ඨඃ.

(ස-) ඣි-ඉමන්-ඉෂ්ඨ-ඊයසුප්‍රත්‍යයන් පරකල්හි ; තෘන්ලොප්‍යඃ, තෘන්යන්නහට ලොප් වේ. අතිශයෙන කර්තෘ කරිෂ්ඨඃ, මෙහි තෘන්ප්‍රත්‍යයහට ලොප් වේ, ත්‍යලොපෙ ත්‍යලක්‍ෂණම් යන න්‍යායයෙන්, (542) ගුණකළ කල්හි එකස්වර වූ බැවින් ඩිද්වද්භාවය නොවේ. කරීයාන් යනුද මෙසේමැයි. කර්තුභාවඃ කරිමා. කර්තාරමාචෂ්ටෙ කාරයති, මෙහි තෘන්හට ලොප් කළ කල්හි එහි වියයුතු ගුණය වැළකෙයි, ඣි පර කල්හි නැවත (577) වෘද්ධියි.

(මු-) 470. **වාඪාන්තික ස්ථූල දූර යුව ක්‍ෂිප්‍ර ක්‍ෂුද්‍ර ප්‍රිය ස්ථිර ස්ඵිරොරු ගුරු බහුල තෘප්‍ර දීර්ඝ හ්‍රස්ව වෘද්ධ වෘන්දාරකාඃ—සාධ නෙද ස්ථව දව යව ක්‍ෂප ක්‍ෂොද ප්‍රස්ථ ස්ඵ වර ගර වංහ ත්‍රප ද්‍රාඝ හ්‍රස වර්ෂ වෘන්දාඃ.** (වාඪ—වෘන්දාරකාඃ 1...සාධ—වෘන්දාඃ 1...)

---

* මතුව වතුව වින් ච තෙෂාං.

එෂාං ස්ථානෙ ක්‍රමාදෙතෙ ස්‍යුඃ ඉෂ්ඨාදිෂු.

සාධිෂ්ඨඃ නෙදිෂ්ඨඃ ස්ථවිෂ්ඨඃ දවිෂ්ඨඃ යවිෂ්ඨඃ ක්ෂෙපිෂ්ඨඃ ක්ෂොදිෂ්ඨඃ ප්‍රෙෂ්ඨඃ ස්ථෙෂ්ඨඃ ස්ඵෙෂ්ඨඃ වරිෂ්ඨඃ ගරිෂ්ඨඃ වංහිෂ්ඨඃ ත්‍රපිෂ්ඨඃ ද්‍රාඝිෂ්ඨඃ හ්‍රසිෂ්ඨඃ වර්ෂිෂ්ඨඃ වෘන්දිෂ්ඨඃ.*

(ස-) එෂාං ස්ථානෙ, වාඪ අන්තිකාදි මොවුන්ගේ ස්ථානයෙහි ; එතෙ, සාධ නෙදාදි මේ ආදෙශයෝ ; ඉෂ්ඨාදිෂු, ඉෂ්ඨප්‍රත්‍යයාදිය පර කල්හි ; ක්‍රමාත් ස්‍යුඃ, ක්‍රමයෙන් වන්නෝය.

ස්ඵිරඃ යනු ප්‍රචුරාර්ථයි, උරුඃ යනු මහත්වූ යන අර්ථයි, තෘප් නොතීති තෘපඃ, ඖණාදික රෙඵයයි, වෘන්දාරකඃ යනු දෙවියෙක් නොහොත් මුඛ්‍යයෙක්. ක්‍රමය මෙසේයි—

වාඪ අන්තික ස්ථූල දූර යුවන් ක්ෂිප්‍ර ක්ෂුද්‍ර ප්‍රිය ස්ථිර
සාධ නෙද ස්ථව දව යව ක්ෂෙප ක්ෂොද-ප්‍ර ස්ථ
ස්ඵිර උරු ගුරු බහුල තෘප්‍ර දීර්ඝ හ්‍රස්ව වෘද්ධ වෘන්දාරක
ස්ඵ වර ගර වංහ ත්‍රප ද්‍රාඝ හ්‍රස වර්ෂ වෘන්ද.

මොවුන් අතුරෙහි යම් ශබ්දයෝ ගුණවාචක නොවෙද්ද ඔවුන් කෙරෙන්ද ඉෂ්ඨාදීන් පර කල්හි ආදෙශවිධානසම්බන්ධය හෙතුකොටගෙන ඉෂ්ඨාදීහු වෙත්. අයමනයොරෙෂාං වා අතිශයෙන වාඪඃ යන වාක්‍යයෙහි සාධිෂ්ඨඃ, මෙසේ සියලු තන්හි ප්‍රථමාන්තයෙන් වාක්‍යය වෙයි. ඉෂ්ඨප්‍රත්‍යය කළ කල්හි මේ සූත්‍රයෙන් සාධාදි ආදෙශයෝ වෙත්, (467) ඩිත්ත්ව කළ කල්හි (126) ටිලොපය වේ. නෙදිෂ්ඨඃ යනාදියෙහිද වාක්‍ය හා සිද්ධියද මෙසේම දතයුතු. ප්‍රෙෂ්ඨඃ ස්ථෙෂ්ඨඃ ස්ඵෙෂ්ඨඃ යන මොවුන් කෙරෙහි එකස්වර බැවින් ඩිත්ත්ව නොවේ. එකස්වර ශබ්දයන් වර්ජිතකිරීම් සම්බන්ධයෙන්ම (258) යයොලොපඃ යන මේ ආදියෙන් අකාරලොපය නොවේ. රාම තකීවාගීශතෙම වනාහි ප්‍ර ස්ථ ස්ඵ යන මොවුන් හැර සියල්ලෝ හසන්ත ආදෙශයෝ වෙත්, එකස්වර බැවින් ඉෂ්ඨාදීන්ට ඩිත්ත්වය නොවෙයි යනු කියයි. [පාණිනිඃ 5. 3. 63, 6. 4. 156, 157.]

(මූ-) **471. ප්‍රශස්‍යඃ ශ්‍රඃ.** (ප්‍රශස්‍යඃ 1. ශ්‍රඃ 1.) ශ්‍රෙෂ්ඨඃ.

(ස-) ප්‍රශස්‍යඃ, ප්‍රශස්‍යශබ්දයතෙම ; ශ්‍රඃ, ඉෂ්ඨාදීන් පරකල්හි

* වාඪශ්ච අන්තිකශ්ච ඉත්‍යාදි, සාධශ්ච නෙදශ්චෙත්‍යාදි ච වන්වඃ.

ශ්‍රආදෙශ වන්නේය. අයමනයොරෙෂාං වා අතිශයෙන ප්‍රශස්‍යඃ, ඉෂ්ඨප්‍රත්‍යය පරකල්හි මේ ශබ්දයහට ශ්‍රආදෙශද ගුණද වෙත්, ශ්‍රෙෂ්ඨඃ. ශ්‍රෙයාන් යනුද මෙසේමැයි. ප්‍රශස්‍යස්‍ය භාවඃ ශ්‍රෙමා. [පාණිනිඃ 5. 3. 60.]

(මු-) 472. **ජ්‍යෙ වෘද්ධශ්චෙයස්වොඃ.** (ජ්‍යඃ 1. වෘද්ධඃ 1. ච 1. ඊයස්වී 1. ආඃ 1.]

වෘද්ධඃ ප්‍රශස්‍යශ්ච ඤ්‍යාදෞ ජ්‍යඃ ස්‍යාත්, තස්මාච්චෙයසොරී ආඃ ස්‍යාත්. ජ්‍යෙෂ්ඨඃ ජ්‍යායාන්.

(ස-) ඤ්‍යාදෞ, ඤිප්‍රත්‍යයාදිය පරකල්හි ; වෘද්ධඃ, වෘද්ධශබ්දයද ; ප්‍රශස්‍යශ්ච, ප්‍රශස්‍යශබ්දයද ; ජ්‍යඃ ස්‍යාත්, ජ්‍යාදෙශ වන්නේය ; තස්මාච්ච, ඔහු කෙරෙන් පරවූද ; ඊයසොඃ, ඊයසු ප්‍රත්‍යයාගේ; ඊඃ, ඊකාරයතෙම ; ආඃ ස්‍යාත්, ආකාරවන්නේය. ඊයසොඃ ඊ ඊයස්වී කියා ලුප්තප්‍රථමෛකවචනයයි. අයමනයොරෙෂාං වා අතිශයෙන වෘද්ධඃ ප්‍රශස්‍යො වා ජ්‍යෙෂ්ඨඃ, මෙහි ජ්‍යාදෙශවූ කල්හි ගුණයි. ජ්‍යායාන් යනුද මෙසේමැයි, මෙහි ජ්‍යාදෙශයා කෙරෙන් පරවූ ඊයසුප්‍රත්‍යයාගේ ඊකාරයහට ආකාරවේ. පූර්වසූත්‍රයෙන් (470) වර්ෂිෂ්ඨඃ වර්ෂීයාන් කියාද වෙයි. [පාණිනිඃ 5. 3. 61, 62.]

(මු-) 473. **පෘථු මෘදු කෘශ භෘශ දෘඪ පරිවෘඪස්‍යර්ඤුඃ.** (පෘථු —පරිවෘඪස්‍ය 6. ඍත් 1. රඃ 1.)

එෂාමෘකාරස්‍ය ඤ්‍යාදෞ රඃ ස්‍යාත්. ප්‍රථිෂ්ඨඃ.*

(ස-) එෂාං, පෘථු මෘදු කෘශ භෘශ දෘඪ පරිවෘඪ යන මොවුන්ගේ; ඍකාරස්‍ය, ඍකාරයහට ; ඤ්‍යාදෞ, ඤිප්‍රත්‍යයාදිය පර කල්හි ; රඃ ස්‍යාත්, රකාර වන්නේය. අයමනයොරෙෂාං වා අතිශයෙන පෘථුඃ ප්‍රථිෂ්ඨඃ, ඩිත්වත් බැවින් ටිසංඥයහට ලොප්වේ. ම්‍රදිෂ්ඨඃ ක්‍රශිෂ්ඨඃ භ්‍රශිෂ්ඨඃ ද්‍රඪිෂ්ඨඃ පරිව්‍රඪිෂ්ඨඃ යනුද මෙසේමැයි. ප්‍රථීයාන් ප්‍රථිමා යනාදියද වේ.

(මු-) 474. **යුවාල්පෞ කන් වා.** (යුවාල්පෞ 1.. කන් 1. වා 1.)

කනිෂ්ඨඃ, යවිෂ්ඨඃ අල්පිෂ්ඨඃ. එවමීයසුඃ.

(ස-) ඤිප්‍රත්‍යයාදිය පර කල්හි, යුවාල්පෞ, යුවන්ශබ්ද අල්පශබ්ද දෙක ; වා, විකල්පයෙන් ; කන්, කන්ආදෙශ වන්

---

* පෘථුශ්ච මෘදුශ්චෙත්‍යාදි වත්වෙ තස්‍ය.

යේය. අයමනයොරෙෂාං වා අතිශයෙන යුවා අල්පො වා කනිෂ්ඨඃ, ඉෂ්ඨප්‍රත්‍යයයි, යුවන් අල්ප දෙදෙනාහට උදාහරණ වාක්‍යය මෙසේයි, පක්‍ෂයෙක්හි යුවන්ශබ්දයහට (470) යවිෂ්ඨඃ. අල්පශබ්දයහට අල්පිෂ්ඨඃ. එවමීයසුඃ, ඊයසුප්‍රත්‍යය පර කල්හිද මෙසේමැයි. කනීයාන් යනුද මෙසේයි. පක්‍ෂයෙක්හි යවීයාන් අල්පීයාන් කියාද වෙත්.´ [පාණිනිඃ 5. 3. 64.]

(මූ-) 475. **ගුණාදිමන් භාවෙ.** (ගුණාත් 5. ඉමන් 1. භාවෙ 7.)

ගුණවාචින ඉමන් සෑහත් භාවෙ. ලඝිමා.

(ස-) ගුණවාචිනඃ, ගුණවද්වාචී ශබ්දයා කෙරෙන් ; භාවෙ, භාවයෙහි ; ඉමන් සෑහත්, ඉමන්ප්‍රත්‍යය වන්නේය. ගුණවාචිනඃ යනු ගුණවද්වාචිනඃ යන අර්ථයි. එහෙයින් ගුණවත්නුවූ කල්හි රූපස්‍ය භාවඃ රූපත්වං, රසස්‍ය භාවඃ රසත්වං යනාදියයි, රූපිමා රසිමා යනාදියක් නොවේ. ශුක්ලිමා කාලිමා නීලිමා යනාදිය වනාහි ශුක්ලාදි ගුණවත්වූ ඝටාදිහුගේම ධර්මයයි. ලඝොර්භාවඃ, ලඝ්වත්‍භාවඃ, ලඝුනො භාවඃ යන වාක්‍ය තුණෙහි ම ලඝිමා යනු වේ, (327) පුංවද්භාවයයි, (467) ඩිත්ත්වද, (126) විලොපයද වෙත්. අභිධාන බැවින් ඉමන්ප්‍රත්‍යයාන්තය පුංලිඞගම වේ. හුදෙක් ප්‍රියස්‍ය භාවඃ ප්‍රෙමා, ප්‍රෙම යනු පුංලිඞ්ගද ක්ලිවලිඞ්ගද වේ. ප්‍රෙමා නා ප්‍රියතා හාර්දං ප්‍රෙම ස්නෙහඃ යි අමරකොෂයි. [පාණිනිඃ 5. 1. 122.]

(මූ-) 476. **භූයො භූමභූයිෂ්ඨාඃ.** (භූයස්-භූමන්-භූයිෂ්ඨාඃ 1...)

බහො-රීයස්විමන්නිෂ්ඨාන්තස්‍ය ක්‍රමාදෙතෙ නිපාත්‍යන්තෙ.

(ස-) ඊයස්විමන්නිෂ්ඨාන්තස්‍ය, ඊයසු-ඉමන්-ඉෂ්ඨ යන මොවුන් අන්තකොට ඇති ; බහොඃ, බහුශබ්දයහට ; ක්‍රමාත්, පිළිවෙළින්; එතෙ, භූයස්-භූමන්-භූයිෂ්ඨ යන මොහු ; නිපාත්‍යන්තෙ, නිපාතනය කරණුලැබෙත්. අතිශයෙන බහුඃ කියා බහුශබ්දයෙන් ඊයසුප්‍රත්‍යය කළ කල්හි මේ නිපාතනයෙන් භූයස් යනු වේ, ඉෂ්ඨප්‍රත්‍යය කළ කල්හි භූයිෂ්ඨ. බහොර්භාවඃ යි ඉමන්ප්‍රත්‍යය කළකල්හි භූමන් යනු වේ. [පාණිනිඃ 6. 4. 158, 159.]

(මූ-) 477. **ත්‍යදෙශ්චොනෙ කල්පදෙශ්‍යදෙශීයාඃ.** (ත්‍යදෙඃ 5. ච 1. ඔනෙ 7. කල්පදෙශ්‍යදෙශීයාඃ 1...)

ලෙසන්‍යදෘනතාවව ඊෂද්නෙ‍ා'පෙ එතෙ ස්‍යුඃ. ඊෂදූනො විවාන්—විවත්කල්පඃ විවද්දෙශ්‍යඃ විවද්දෙශීයඃ. තාර්කික දෙශීයා. පචතිකල්පං.*

(ස-) ලෙඃ, ලිංගයා කෙරෙන්ද; න්‍යදෘනතාවව, න්‍යදෘනතයා කෙරෙන්ද; ඊෂදූනෙ අපේ, ස්වල්පයක් ඌනය යන අර්ථයෙහි; එතෙ, කල්ප-දෙශ්‍ය-දෙශීය යන මොහු ; ස්‍යුඃ, වන්නෝය. විවත්කල්පඃ යන්නෙහි (183) විරාම පරකල්හි දඞ්ආදෙශ වේ. (64) විවද්දෙශ්‍යඃ විවද්දෙශීයඃ යනුද මේ ක්‍රමයැයි. මොවුන් ගේ පූර්වලිඞ්ගතාවයමය. ඊෂදූනා දීක්‍ෂා දීක්‍ෂාකල්පා දීක්‍ෂාදෙශ්‍යා දීක්‍ෂාදෙශීයා, මොවුන් පර කල්හි (327) ශසන්තතරාදි බැවින් පුංවද්භාවය වේ. ඊෂදූනා තාර්කිකී තාර්කිකදෙශීයා, (350) පුංවද්භාවය වේ. ඊෂදූනං යථා ස්‍යාත්තථා පචති පචතිකල්පං, පචතඃ කල්පං, පචන්ති කල්පං යනාදියද මෙසේමැයි. [පාණිනිඃ 5. 3. 67.]

(මු-) 478. **ලෙර් බහුඃ ප්‍රාක්.** (ලෙඃ 5. බහුඃ 1. ප්‍රාක් 1.) ඊෂදූනඃ පටුඃ බහුපටුඃ.

(ස-) ලෙඃ, ස්‍යදෘනතවූ ලිඞ්ගයා කෙරෙන්; බහුඃ, බහුයන්න වන්නේය ; ප්‍රාක්, පරස්ථානයෙහි වූ ඒ බහුයන්න පූර්ව වන්නේය. ලෙඃ යන්නහුගේ නැවත ගැන්ම තිවිභක්ත්‍යදීන්ගේ නැවැත්ම පිණිසයි. බහුපටුඃ යනු විභක්තිහට ලොප්කළ කල්හි පරවසිටි බහුප්‍රත්‍යය පූර්වවේ, නැවත ලිංගසංඥ කළ කල්හි විභක්ති වේ. ඊෂදූනා විදුෂී බහුවිදුෂී, මෙහි බහුප්‍රත්‍යය ශස්අන්ත තරාදිත්වය ඇති කල්හිද පරව සිටින බවක් නැති බැවින් (327) පුංවද්භාවය නොවේ. [පාණිනිඃ 5. 3. 68.]

(මු-) 479. **පාශඃ කුත්සායාං.** (පාශඃ 1. කුත්සායාං 7.) කුත්සිතො භිෂක් භිෂක්පාශඃ.

(ස-) කුත්සායාං, නින්දිතයා කෙරෙහි ; පාශඃ, ස්‍යදෘනතයා කෙරෙන් පාශප්‍රත්‍යය වන්නේය. මෙහි භිෂක්ශබ්දයා කෙරෙන් පරව කුත්සිතාර්ථයෙහි පාශප්‍රත්‍යයව භිෂක්පාශඃ යනු වේ. කුත්සිතා විදුෂී විවත්පාශා, ශසන්ත තරාදි බැවින් පුංවද් භාවය වේ. [පාණිනිඃ 5. 3. 47.]

---

* ති ආදිර්ගස්‍ය ස ත්‍යාදිස්‍යස්මාත්. අ (ඊෂත්) ඌනඃ ඔනස්‍ය සම්න්, (26) අකාරලොපඃ. කල්පශ්ච දෙශ්‍යශ්ච දෙශීයශ්ච තෙ.

(මු-) 480. **චරට් භූතපූර්‍වෙ.** (චරට් 1. භූතපූර්‍වෙ 7.)

භූතපූර්‍වෙ‘ර්ථෙ චරට් ස්‍යාත්. භූතපූර්‍ව ආඪ්‍යඃ ආඪ්‍යචරඃ.

(ස-) භූතපූර්‍වෙ‘ර්ථෙ, ප්‍රාග්භූතාර්ථයෙහි ; චරට් ස්‍යාත්, ස්‍යාද්‍ය න්තයා කෙරෙන් චරට්ප්‍රත්‍යය වන්නේය. ආඪ්‍යචරඃ. ටකාරය ඊප්ප්‍රත්‍යය ප්‍රයොජනකොට ඇත්තේය. භූතපූර්‍වඃ ආඪ්‍යඃ, (වර්‍තමානයෙහි නොවේ) භූතපූර්‍වා ආඪ්‍යා ආඪ්‍යචරී, භූතපූර්‍වා විදුෂී විවචරී, ශසනාත තරාදි බැවින් (327) පුංවද්භාවය වේ. පූර්‍වග්‍රහණය බැවින් යම්තැනෙක්හි වර්‍තමානතාවය හැගේද එහි ප්‍රත්‍යය නොවන්නේය. මෙසේසි, ඊශ්වරො භූතඃ යනුයි. [පාණිනිඃ 5. 3. 53.]

(මු-) 481. **ෂෂ්ඨ්‍යා රූප්‍යශ්ච.** (ෂෂ්ඨ්‍යාඃ 5. රූප්‍යඃ 1. ච 1.)

ෂෂ්ඨ්‍යන්තාත් රූප්‍යඃ චරට් ච ස්‍යාත් භූතපූර්‍වෙ‘ර්ථෙ. කෘෂ්ණස්‍ය භූතපූර්‍වෝ ගෞඃ—කෘෂ්ණ රූප්‍යඃ කෘෂ්ණචරඃ. ශුභ්‍රාරූප්‍යඃ ශුභ්‍රචරඃ.

(ස-) භූතපූර්‍ව අර්ථෙ, ප්‍රාග්භූතාර්ථයෙහි ; ෂෂ්ඨ්‍යන්තාත්, ෂෂ්ඨ්‍යන්ත ලිඞ්ගයා කෙරෙන් ; රූප්‍යඃ, රූප්‍යප්‍රත්‍යය වන්නේය, චරට් ච ස්‍යාත්, චරට්ප්‍රත්‍යයද වන්නේය. කෘෂ්ණරූප්‍යඃ කියාද කෘෂ්ණචරඃ කියාද වෙත්. ශුභ්‍රායාඃ (ගොඃ) භූතපූර්‍වෝ ගෞඃ ශුභ්‍රා රූප්‍යඃ, මෙහි රූප්‍යප්‍රත්‍යය (327) වර්ජිත බැවින් පුංවත් නොවේ. ශුභ්‍රචරඃ, මෙහි පුංවත් වේමය. [පාණිනිඃ 5. 3. 54.]

(මු-) 482. **බහ්වල්පාර්ථාත් කාච්ශස් වා.** (බහ්වල්පාර්ථාත් 5. කාත් 5. ශස් 1. වා 1.)

බහ්වර්ථාදල්පාර්ථාච්ච කාත් පරශ්ශස් ස්‍යාවා. බහුශො දෙහි භූරිශඃ අල්පශඃ සොකශඃ.*

(ස-) බහ්වර්ථාත්, බහ්වර්ථ වූද ; අල්පාර්ථාච්ච, අල්පාර්ථ වූද ; කාත් පරඃ, කාරකයා කෙරෙන් පරව ; ශස්, ශස්ප්‍රත්‍යය ; වා, විකල්පයෙන් ; ස්‍යාත්, වන්නේය. කාත් යන මොහුගේ විශෙෂණයයි. ඉත්සංඥ චකාරය අව්‍යය පිණිසයි. පෘථක් යොගය හෙතුකොට ගෙන භූතපූර්‍වේ යන මොහුගේද ෂෂ්ඨ්‍යාඃ යන මොහුගේද සම්බන්ධය නොවේ. බහුශඃ යන මෙහි බහුන්

---

* බහුශශ්ච අල්පශශ්ච බහ්වල්පෞ, තෞ අර්ථෞ යස්‍ය ස තස්මාත්.

බහ්වී බහූනි වා දෙති යන මේ අර්ථයෙහි කර්මකාරකයා කෙරෙන් චශස්ප්‍රත්‍යය වේ. භූරිශඃ යන මෙහි භූරි යන අව්‍යය බහ්වර්ථයි. සඞ්ඝශඃ යනුද පූගශඃ යනුද වෘන්දශඃ යනාදියද මෙසේමැයි. බහුභිර්නේතෘභිඃ පශ්‍යති, බහුභ්‍යො දෙහි, බහුෂු තිෂ්ඨේෂු සනාතඃ යනාදියෙහි බහුශඃ යනු වේ. අල්පං දෙහි අල්පශඃ, ස්තොකශඃ යනුද මෙසේමැයි. ක්‍රමශඃ යන්නද ව්‍යක්තාව්‍යයි. කාත් යනු කුමටය? බහූනාං ස්වාමී යන මෙහි කාරක නොවන හෙයින් ප්‍රත්‍යය නොවන පිණිසයි. [පාණිනිඃ 5. 4. 42.]

(මු-) 483. **සඞ්ඛ්‍යෙකාර්ථාත් වීප්සායාං.** (සඞ්ඛ්‍ය—එකාර්ථාත් 5. වීප්සායාං 7.)

කති කති කතිශඃ ගණශඃ යාවච්ඡඃ තාවච්ඡඃ, ද්විශඃ, පාදශඃ.*

(ස-) සඞ්ඛ්‍යෙකාර්ථාත්, සඞ්ඛ්‍යාවාචක කාරකයා කෙරෙන්ද එකභාගාර්ථ කාරකයා කෙරෙන්ද; වීප්සායාං, වීප්සායෙහි චශස්ප්‍රත්‍යය වන්නේය. කති කති දෙහි කතිශඃ, එසේම ගණං ගණං දෙහි ගණශඃ, යාවන්තං යාවන්තං යාවච්ඡඃ, තාවන්තං තාවන්තං තාවච්ඡඃ, (101) සඞ්ඛ්‍යාතුල්‍ය බැවින් චශස් ප්‍රත්‍යය වේ. ද්වෞ ද්වෞ ද්විශඃ, ත්‍රිශඃ යනාදියද මෙසේමැයි. එකභාගාර්ථයා කෙරෙන් වනාහි, පාදං පාදං පාදශඃ යනු වේ. පණං පණං පණශඃ යනාදියද මෙසේමැයි. ප්‍රත්‍යයා විසින් වීප්සාව ක්යනලද බැවින්, අනුක්තවීප්සායෙහි ද්විත්වය නියම හෙයින් මෙහි ද්විත්වය නොවේ. [පාණිනිඃ 5. 4. 43.]

(මු-) 484. **චකෘත්වස් වාරෙ.** (චකෘත්වස් 1. වාරෙ 7.)

කතිවාරාන් භුඞ්ක්තෙ කතිකෘත්වඃ, ගණකෘත්වඃ, පඤ්චකෘත්වඃ.

(ස-) සඞ්ඛ්‍යාවාචක ශබ්දයා කෙරෙන් පරව, වාරෙ, වාරාර්ථයෙහි; චකෘත්වස්, චකෘත්වස්ප්‍රත්‍යය වන්නේය. සඞ්ඛ්‍යා රහිතයාහට වාරාර්ථය නොලැබෙයි යනු දක්වනු පිණිස කතිවාරාන් යනු කියයි. ඉත්සංඥ චකාරය බැවින් අව්‍යයයි. ගණකෘත්වඃ යනුද මෙසේමැයි. (101) සඞ්ඛ්‍යාවත්ත්වයයි. පඤ්චවාරාන් පඤ්චකෘත්වඃ. දශකෘත්වඃ යනාදියද මෙසේමැයි. (246) විභක්තිහට ලොප්කළ කල්හි, (185) දීර්ඝ නොවේ. [පාණිනිඃ 5. 4. 17.]

---

* එකඃ එකභාගඃ, එකඃ අර්ථො යස්‍ය ස එකාර්ථඃ, සඞ්ඛ්‍ය ච එකාර්ථශ්ච සමාහාරෙ තස්මාත්.

(මු-) 485. **සුච් චතුර්ද්විත්‍රිභ්‍යඃ.** (සුච් 1. චතුර්-ද්වි-ත්‍රිභ්‍යඃ 5.)

එභ්‍යඃ සුච් ස්‍යාත් වාරෙ. චතුඃ ද්විඃ ත්‍රිඃ.*

(ස-) එභ්‍යඃ, චතුර් ද්වි ත්‍රි යනමේ ශබ්දයන්කෙරෙන්; වාරෙ, වාරාර්ථයෙහි; සුච් ස්‍යාත්, සුච්ප්‍රත්‍යය වන්නේය. සූත්‍රයබැවින් පුංස්ත්වය වේ, සුච්ප්‍රත්‍යයාවිසින් ච්ඡස්‍යස් බාධාකරණු ලැබේ. සුච් යන්නහුගේ උකාරය උච්චාරණප්‍රයොජනය පිණිසයි, චකාරය අව්‍යය පිණිසයි. චතුඃ යනු චතුරො වාරාන් යන අර්ථයෙහි සුච්ප්‍රත්‍යය වේ, (102) රකාරයහට විසර්ගය වේ, විසර්ගයහට (67) සකාර වේ, (213) ඒ සකාරයහට ලොප් වේ, නැවත සුච්ප්‍රත්‍යයාගේ සකාරයහට විසර්ගය වේ. ද්වෞ වාරෞ ද්විඃ යනුද ත්‍රීන් වාරාන් ත්‍රිඃ යනුද මෙසේමැයි. [පාණිනිඃ 5. 4. 18.]

(මු-) 486. **මයට් තද්රූපෙ.** (මයට් 1. තද්රූපෙ 7.)

තදාත්මකෙ'ර්ථෙ මයට් ස්‍යාත්. විෂ්ණ්වාත්මකං විෂ්ණුමයං. වාඞ්මයං.†

(ස-) තදාත්මකෙ අර්ථෙ, ඔහුගේ ආත්මය යන අර්ථයෙහි; මයට් ස්‍යාත්, ස්‍යාද්‍යන්තයා කෙරෙන් මයට්ප්‍රත්‍යය වන්නේය. වෙන්වූ යොගය බැවින් කිසිවක් සම්බන්ධ නොවේ. ප්‍රකරණ බලයෙන් ස්‍යාද්‍යන්තයා කෙරෙන් යනු සම්බන්ධයි. විෂ්ණ්වාත්මකං යනු විෂ්ණුරාත්මා යස්‍ය තත් විෂ්ණුමයං ජගත්, වාගාත්මකං වාඞ්මයං යනුද මෙසේමැයි, ශාස්ත්‍රං. හිරණ්‍යාත්මකං හිරණ්මයං යන මෙහි නිපාතනයෙන් යකාරලොපය වේ. ඉත්සංඥ ටකාරවත් බැවින් ඊප්ප්‍රත්‍යය කළ කල්හි තෛජෝමයී යනු වේ. ගවයාගේ පුරීෂයෙහි ඉදම්පීයෙහිද මයට්ප්‍රත්‍යය වක්තව්‍යයි. [පාණිනිඃ 5. 4. 21.]

(මු-) 487. **ප්‍රකාරෙ ජාතීයඃ.** (ප්‍රකාරෙ 7. ජාතීයඃ 1.)

තාර්කිකජාතීයා.

(ස-) ස්‍යාද්‍යන්තයා කෙරෙන්, ප්‍රකාරෙ, ප්‍රකාරාර්ථයෙහි; ජාතීයඃ, ජාතීයප්‍රත්‍යය වේ.

ප්‍රකාරශබ්දය සාදෘශ්‍යවාචී වෙයි පුංලිඞ්ගයයි, ඒ යුක්තය යන අර්ථයෙහියි. තාර්කිකාඃ ප්‍රකාරඃ තාර්කිකජාතීයා, (350)

---

* චතුශ්ච ද්විශ්ච ත්‍රිශ්ච තෙභ්‍යස්මාත්.

† තදෙව රූපං ආත්මා යස්‍ය තත් තද්රූපං තස්මින්.

පුංවද්භාවය වේ. තාර්කිකතුල්‍ය සත්‍රී යන අර්ථයි. පටුජාති යො ජනඃ යනුද මෙසේමැයි, මෘදුජාතීයං එලං. තවද විදු ෂ්‍යඃ ප්‍රකාරඃ විදුෂීජාතීයා, මෙහි ජාතීයප්‍රත්‍යය ශසනානතරාදි භිනාන බැවින් (327) පුංවත් නොවේ. [පාණිනිඃ 5. 3. 69.]

(මූ-) 488. **ඩිතෙන චුඤ්චුවණෙ‍ෟ.** (විතෙන 7. චුඤ්චු-වණෙ‍ෟ 1 ..)

විද්‍යාචුඤ්චුඃ විද්‍යාචණඃ.

(ස-) සඤ්ඥනතයා කෙරෙන්, විතෙන, ඒ කරණකොටගෙන ප්‍රසිඛය යන අර්ථයෙහි ; චුඤ්චු චණෙ‍ෟ, චුඤ්චුප්‍රත්‍යය හා චණ ප්‍රත්‍යයද වන්නෝය. විද්‍යයා ඛ්‍යාතඃ විද්‍යාචුඤ්චුඃ, විද්‍යයාඛ්‍යාතඃ විද්‍යාචණඃ යනු වේ. [පාණිනිඃ 5. 2. 26.]

(මූ-) 489. **නිර්‍වෘතෙත භාවාදිමඃ.** (නිර්‍වෘතෙත 7. භාවා ත් 5. ඉමඃ 1.)

පාකිමඃ.

(ස-) භාවාත්, භාවයෙහි කරණලද කෘදනතයා කෙරෙන් ; නිර්‍වෘතෙත, ඒ කරණකොටගෙන නිෂ්පනනය යන අර්ථයෙහි ; ඉමඃ, ඉමප්‍රත්‍යය වන්නේය. පාකෙන නිෂ්පනනඃ පාකිමඃ යනු වේ, (258) අකාරලොපය වේ. පචනං යන වාක්‍යයෙහි භාව වාච්‍ය කල්හි (1134) ඝඤ් වේ, පාකඃ යනු වේ.

(මූ-) 490. **පශුභ්‍යඃ ස්ථානවිෂට්කෙ ගොෂ්ඨගොයුගෂඩ් ගවං.** (පශුභ්‍යඃ 5...ස්ථාන-ව්-ෂට්කෙ 7. ගොෂ්ඨ-ගොයුග-ෂඩ්ගවං 1.)

ගොගොෂ්ඨං ගොගොයුගං ගොෂඩ්ගවං.*

(ස-) පශුභ්‍යඃ, පශුවාචක ශබ්දයන් කෙරෙන්; ස්ථානවිෂට් කෙ, ස්ථාන-ද්වික-ෂට්ක යන මේ අර්ථ වාච්‍ය කල්හි ; ගොෂ්ඨ-ගොයුග-ෂඩ්ගවං, ගොෂ්ඨප්‍රත්‍යය ගොයුගප්‍රත්‍යය ෂඩ්ගව ප්‍රත්‍යය යන මොහු ක්‍රමයෙන් වන්නෝය. ගවාං ස්ථානම් ගොගොෂ්ඨං, මහිෂගොෂ්ඨං යනුද මෙසේමැයි. ගොර්ද්විකං ගොගොයුගං, හරිණගොයුගං යනුද මෙසේමැයි. ගවාං ෂට්කං ගොෂඩ්ගවං, හරිණෂඩ්ගවං යනුද මෙසේමැයි. ස්වභාවයෙන් මොවුන්ගේ ක්ලීවත්වය වේ.

---

* ස්ථානඤ්ච වෙ‍ෟ ච ෂට්කඤ්ච තස්මින්. ගොෂ්ඨඤ්ච ගොයුගඤ්ච ෂඩ්ගවඤ්ච තත්.

(මූ-) 491. ගුණ්ඩාක්ෂභ්‍යෝ'පකෘෂ්ටෙ ර-෴රෞ. (ගුණ් ඩාක්ෂභ්‍යඃ 5...අපකෂේ 7. ර-෴රෞ 1..)

අපකෘෂ්ටා ගුණ්ඩා ගුණ්ඩාරඃ ශමීරඃ කුටීරඃ, උක්ෂතරී.*

(ස-) ගුණ්ඩාක්ෂභ්‍යඃ, ගුණ්ඩාදිශබ්ද උක්ෂන් ආදි ශබ්ද යන මොවුන් දෙදෙනා කෙරෙන් ; අපකෂේ, හීනාර්ථයෙහි ; ර-෴ රෞ, රප්‍රත්‍යය ෴රප්‍රත්‍යය යන දෙදෙනා වෙත් ; ගුණ්ඩාදීන් කෙරෙන් රප්‍රත්‍යයද උක්ෂන් ආදීන් කෙරෙන් ෴රද වෙත්. ගුණ්ඩා යනු මදසථානයයි. අල්පා ශමී ශමීරඃ, අල්පා කුටී කුටීරඃ යනුද මෙසේමැයි. අභිධාන බැවින් හැමතන්හි පුංසත්වය වේ. අපකෘෂ්ටා (ගත යෞවනා) උක්ෂා උක්ෂතරී, අපකෘෂ්ටා (බාලිකා) වත්සා වත්සතරී යනාදියද මෙසේමැයි. [පාණිනිඃ 5. 3. 88, 91.]

(මූ-) 492. පීලුතිලොමාකර්ණ්‍යාදෙඃ කුණතෛල කටජාහං පාකස්නෙහරජොමූලෙ. (පීලු—කර්ණ්‍යාදෙඃ 5. කුණ—ජාහං 1. පාක—මූලෙ 7.)

පීලුකුණඃ, තිලතෛලං, උමාකටඃ, කර්ණීජාහං.†

(ස-) පීලුතිලොමාකර්ණ්‍යාදෙඃ, පීල්වාදි ශබ්ද තිලාදි ශබ්ද උමාදි ශබ්ද කර්ණ්‍යාදි ශබ්ද යන මොවුන් කෙරෙන් ; පාක ස්නෙහරජොමූලෙ, පාකය ස්නෙහය රජස්ය මූලය යන මේ අර්ථයෙහි ; කුණතෛල කටජාහං, කුණප්‍රත්‍යය තෛලප්‍රත්‍යය කටප්‍රත්‍යය ජාහප්‍රත්‍යය යන මොහු ක්‍රමයෙන් වෙත්. පීලොඃ පාකඃ පීලුකුණඃ තිලස්‍ය ස්නෙහඃ තිලතෛලං, උමායා රජඃ උමාකටඃ, කර්ණ්‍යාස්‍ය මූලං කර්ණීජාහං. අභිධානබැවින් කුණකටා න්තයන්ගේ පුංසත්වය වේ, තිලජාහඅන්තයන්ට ක්ලීවත්වය වේ. [පාණිනිඃ 5. 2. 24.]

(මූ-) 493. ක්ෂෙත්‍රෙ ශාකටශාකිනෞ. (ක්ෂෙත්‍රෙ 7. ශාකට—ශාකිනෞ 1..) ඉක්ෂුශාකටං ඉක්ෂුශාකිනං.

(ස-) ක්ෂෙත්‍රෙ, ඔහුගේ ක්ෂෙත්‍රය යන අර්ථයෙහි ; ස්‍යාද්‍යන්තයා කෙරෙන් පරව, ශාකට ශාකිනෞ, ශාකට-ශාකින් යන ප්‍රත්‍ය

---

* ගුණ්ඩාශ්ච උක්ෂාණශ්ච තෙ තෙභ්‍යඃ. උභයත්‍ර බහුවචනං ගණාර්ථං. රශ්ච ෴රශ්ච තෞ.

† පීලුශ්ච තිලශ්ච උමා ච කර්ණීශ්ච තෙ ආදයො යස්‍ය තස් මාත්. කුණශ්ච තෛලශ්ච කටශ්ච ජාහශ්ච තත්. පාකශ්ච ස්නෙහශ්ච රජශ්ච මූලශ්ච තත්තස්මින්.

යෝ වෙත්. ඉක්‍ෂොඃ ක්‍ෂෙත්‍රං ඉක්‍ෂුශාකටං, ඉක්‍ෂොඃ ක්‍ෂෙත්‍රං ඉක්‍ෂුශාකිනං. යම්හෙයකින්ව නාහි සාධාරණවශයෙන් කිය නලද්දේද එසේවිතමුදු කිසිකෙනෙක් ඉක්‍ෂුහුගේමයයි කියත්, ඉක්‍ෂු මුල්කොට ඇත්තවුන් කෙරෙන්යයි අන්‍යයෝ කියත්.

(මු-) 494. **ඉතො'ස්‍ය ජාතෙ**. (ඉතඃ 1. අස්‍ය 6. ජාතෙ 7.) ඵලිතං.

(ස-) අස්‍ය ජාතෙ, මොහුගේ හටගත් කල්හි යන අර්ථයෙහි; ඉතඃ, ස්‍යාද්‍යන්තයා කෙරෙන් ඉතප්‍රත්‍යය වන්නේය. ඵලමස්‍ය ජාතං ඵලිතං වනං, ඵලිතො වෘක්‍ෂඃ, ඵලිතා ලතා. ඵලා දීන් කෙරෙන්ම මේ විධානයයි ජෞමරයෝ කියත්, ඵලාදිය වනාහි—

එල පුෂ්පාඞ්කුරපල්ලවගර්ව්වං
කණ්ටක සුන්දර ශර කල්ලෝලං,
හෂී කුතූහල කිසලය ගණ්ඩං
හස්තක කඤ්චුක සුඛ සීමන්තං.
තන්ද්‍රා තිලකං ශෛවල රොගං
කජ්ජල කුඞ්මල කොරක වෙගං,
නිද්‍රා මුද්‍රා මද ගල රොෂං
කර්ද්දම කන්දර කුසුම තරඞ්ගං.

සංඥා තාරක මූත්‍ර පුරීෂං පුලක විචාරං ව්‍රණ ශෘඞ්ගාරං,
ස්තවක පිපාසා ලජ්ජා දෝහං නිෂ්ක්‍රමණජ්වර දුඃඛ ද්‍රෝහං.
අභුදීක්‍ෂා වර්ම මූර්ජා රණ පණ්ඩා වෘෂා ක්‍ෂුධාඃ,
සෘජීෂාඞ්ගාර රොමාඤ්ච ප්‍රබාල ව්‍යාධි චන්ද්‍රකාඃ,
පිණ්ඩාත්කෂිං බුභුක්‍ෂා ච ඝවරොත්කණ්ඨෙ ච මඤ්ජරී.

අනිකුදු ගභීාදි ශබ්දයෝ විද්‍යමාන වෙත්. [පාණිනිඃ 5. 2. 36.]

(මු-) 495. **ච්විඃ කෘභ්වස්ස්වභූතතද්භාවෙ'ස්වාවිසීාවව්‍යස්‍ය**. (ච්විඃ 1. කෘ-භූ-අස්සු 7...අභූතතද්භාවෙ 7. අ-ස්වෙ 1 .. ඊසී 1 .. අව්‍යස්‍ය 6.)

අභූතතද්භාවෙ'පේ කෘභ්වස්තිෂු පරෙෂු ච්විඃ ස්‍යාත්, තස්මිං ශ්වාවර්ණස්‍ය ස්වයොරීකාර ඊ ස්‍යාඃ න තු ව්‍යස්‍ය.*

---

* කාශ්ච භුශ්ච අස්ච තෙ තෙෂු. අභූතස්‍ය අජාතස්‍ය තද් රූපෙණ භාව උත්පත්තිරභූතතද්භාවඃ.

(ස-) අභූතතද්භාවෙ'පි, පෙර නූපන්නාහුගේ ඒ රූප යෙන් ඉපදීමය යන අර්ථයෙහි ; කෘභ්වස්තිෂු පරෙෂු, කෘධාතු භූධාතු අසධාතු යන මොවුන් පර කල්හි ; ච්විඃ ස්‍යාත්, ච්වි ප්‍රත්‍යය වන්නේය ; තස්මිංශ්ච, එහිද ; අවර්ණස්‍යොඃ, ච්වි ප්‍රත්‍යයා පරකල්හි ප්‍රකෘතිහුගේ අන්තයෙහි සිටියාවූ අවර්ණ හ්‍රස්ව දෙදෙනාහට ; ඊකාර ඊකාර ශ්‍රී, ඊකාර දීර්ඝ දෙක ; ස්‍යාඃ වෙත්. න තු ව්‍යස්‍ය, අව්‍යයශබ්දයහට ඊකාරයද දීර්ඝයද නො වෙත්. කාෂ්ඨං භස්ම කරොති යන මේ වනාහි අභූතතද් භාවය නොවේ. තවද අභස්ම භස්ම කරොති යන මෙහි අභූතතද්භාවය වන්නේය. අව්‍යස්‍ය කියා ෂෂ්ඨ්‍යන්ත නිර්දේ ශය බැවින් අව්‍යයශබ්දයා කෙරෙන් වනාහි ච්විප්‍රත්‍යය වන් නේය. ච්විප්‍රත්‍යයාගේ ඉකාරය ලකුණු පිණිසයි, ඉත්සංඥ චකාරය අව්‍යය පිණිසයි. [පාණිනිඃ 5. 4. 50, 7. 4. 32.]

(මු-) 496. තෙත්‍ය වමාත්‍රො ලොප්‍යඃ. (ත්‍යඃ 1. වමාත්‍රඃ 1. ලොප්‍යඃ 1.)

වකාරමාත්‍ර ස්‍යෙත්‍ය ලොප්‍යඃ ස්‍යාත්. අකෘෂණං කෘෂණං කරොති කෘෂ්ණී කරොති, කෘෂ්ණී භවති කෘෂ්ණී ස්‍යාත්.

(ස-) වකාරමාත්‍රස්ත්‍යඃ, වකාරය පමණක් ඉතිරිවූ ප්‍රත්‍යය තෙම ; ලොප්‍යඃ ස්‍යාත්, ලොප්කටයුතු වන්නේය. එහෙයින් ච්විප්‍රත්‍යයද, (1028) විණ්ප්‍රත්‍යයද, (1030) විට්ප්‍රත්‍යයද, (1032) ච්විප්‍රත්‍යයද ක්විප්ප්‍රත්‍යයද යන පස්දෙනාගේ ලොපය වන් නේය.

අකෘෂණං කෘෂණං කරොති යන වාක්‍යයෙහි කෘෂණ ශබ්දයා කෙරෙන් ච්විප්‍රත්‍යය වේ, මේ සූත්‍රයෙන් ඉතිරි වකා රයහට ලොප් වේ, පූර්වයෙහි පවත්නා අකාරයහට ඊකාර වේ, කෘෂ්ණීකරොති යනු වේ. කෘෂ්ණීභවති කෘෂ්ණීස්‍යාත් යනුද මෙසේමැයි. මෙහි අස්ති යන පදය නොගෙන ස්‍යාත් යි කීබැවින් ධිසංඥ විභක්ත්‍යන්තවූ අසධාතුහු පරකල්හි ච්වි ප්‍රත්‍යය වන්නේය යනු දක්වනලදී. එහෙයින්ම අස යන්න හට ලිඩන්තයාගේම ප්‍රයොගයෙහි ශබ්දශක්තිස්වභාවයෙන් අභූතතද්භාවය හැඟෙයි යනු ගොයිචන්ද්‍රතෙම කියයි. කියනු ලබන සූත්‍රයන් කෙරෙහිද අස යන්නහුගේ ප්‍රයොගයෙහි මෙසේ අර්ථ සැලකියයුතු වෙයි. අමාලාං මාලාං කරොති, මාලී කරොති, ආකාරයහට ඊකාරය වන්නේය. අශාන්තිං ශාන්තිං

කරොති ශාන්තී කරොති, ඉකාරයහට දීඝී වේ. අවර්ණ හ්‍රස්ව රහිත ස්ථානයෙහි වනාහි අමහාන්තං මහාන්තං කරොති මහත් කරොති යනාදිය වේ. අකර්ම්ම කර්ම්ම කරොති කර්මී කරොති. අඥූතිනං ඥූතිනං කරොති ඥූතී කරොති, යනාදියෙහි (118) නකාරයහට ලොප්කළ කල්හි න නිපාතය අල්පාර්ථ බැවින් ඔහුගේ ආදිවිධානය නිෂෙධනුවූ කල්හි, අකාර හ්‍රස්ව දෙදෙනා හට ඊකාරදීඝීයෝ වෙත්. අව්‍යයශබ්දයහට වනාහි අව්‍යථා ව්‍යථා කෘත්වා යන වාක්‍යයෙහි ව්‍යථාකෘත්‍ය යනාදියෙහි ච්විප්‍රත්‍යයාන්තයාහට (548) සමාසකළකල්හි, (1176) ක්ත්වාච්ප්‍රත්‍යයහට යප්ආදෙශයයි. සාචීකෘත්‍ය යන්න වනාහි, නඤ් නිර්දිෂ්ටම නිත්‍යං යනු න්‍යාය හෙයින් දීඝී වේ. [පාණිනිඃ 5. 4. 50, 7. 4. 26, 32.]*

(මූ-) 497. **යඞ්ධ්‍යක්‍යෙ චර්ද්‍රී.** (යඞ්-ධ්‍ය-ක්‍යෙ 7. ච 1. ඍත් 1. රී 1.)

ඍකාරෙ රී ස්‍යාත් යඞි ධ්‍යෙ ක්‍යෙ ච්වෞ ච. මාත්‍රීකරොති.

(ස-) යඞිධ්‍යෙක්‍යෙච්වෞච, යඞ්ප්‍රත්‍යය ධ්‍යප්‍රත්‍යය ක්‍යප්‍රත්‍යය ච්විප්‍රත්‍යය යන මොවුන් පරකල්හි; ඍකාරඃ, ඍකාරයතෙම; රී ස්‍යාත්, රී යන ආදෙශ වන්නේය.

අමාතරං මාතරං කරොති මාත්‍රීකරොති, මාතෘශබ්දයා කෙරෙන් ච්විප්‍රත්‍යය කළ කල්හි ඍකාරයහට රීආදෙශ වන්නේය. යඞ්ප්‍රත්‍යය වූකල්හි—වෙක්‍රීයතෙ. ධ්‍යක්‍යප්‍රත්‍යයන් පරකල්හි (848) මාතෙවාචරති මාත්‍රීයතෙ, පිතරමිවාචරති (847) පිත්‍රීයති. [පාණිනිඃ 7. 4. 27.]

(මූ-) 498. **මනශ්චක්ෂුශ්චෙතො'රූරජො'රහො'න්තලොපශ්ච්වෞ.** (මනඃ—රහඃ 6. අන්තලොපඃ 1. ච්වෞ 7.)

මනීකරොති.†

(ස-) ච්වෞ, ච්විප්‍රත්‍යය පරකල්හි; මනශ්ච ක්ෂුශ්චෙතො'රූ රජොරහඃ, මනස්ශබ්ද චක්ෂුෂ්ශබ්ද චෙතස්ශබ්ද අරුෂ්ශබ්ද රජස්ශබ්ද රහස්ශබ්ද යන මේ ගණයාගේ; අන්තලොපඃ, අන්ත්‍යයහට ලොප් වේ. අමනො මනඃ කරොති මනීකරොති.

---

* ච චාසෞ මාත්‍රශ්චෙති චමාත්‍රඃ.

†. මනශ්ච චක්ෂුශ්ච චෙතශ්ච අරුශ්ච රජශ්ච රහශ්ච තත්තාස්‍ය.

රාවයිතුම්වඡති, පාවයිතුම්වඡති, භාවයිතුම්වඡති යනු වාක්‍යයි, රුධාතු පූධාතු භූධාතු යන තුණින් ණිච්-ප්‍රත්‍යයාදිය වේ, රකාර-පකාර-භකාර යන මොවුන් කෙරෙන් පරවූ අවර්ණයා පර කල්හි බ්සංඥ උවර්ණයහට මෙයින් ඉකාර වේ, රිරාවයිෂති, පිපාවයිෂති, බිභාවයිෂති යනු වේ. ජයල්පොඃ කිං, ජයල් පොඃ යනු කුමටය? නාවයිතුම්වඡති යන වාක්‍යයෙහි නුනාව යිෂති, යන මෙහි නකාරයා කෙරෙන් පරවූ අවර්ණයා පර කල්හි බ්සංඥයාගේ උකාරයහට ඉකාර නොවන හෙයිනි. අතඑව, එහෙයින්ම; ණෞග, නුධාතුහු කෙරෙන් ණිප්‍රත්‍යය කළ කල්හි; ද්වෙඩ, ද්විත්වකළ කල්හි; ඩිරිඃ, පසුව වෘද්ධියි, යනු පරීක්‍ෂා කටයුතු. එසේම සුෂාවයිෂති ජුහාවයිෂති යනාදි තන්හි බ්සංඥ උකාරයහට ඉකාර නොවන්නේය. ජවනතං ප්‍රෛරිරත් යනාදි වාක්‍යයෙහි අජීජවත් යනාදියෙහිදු (639) බ්සංඥයාහට සන්වත්කළ කල්හි මේ සූත්‍රයෙන් බ්සාංඥයාගේ උකාරයාහට ඉකාර වේ. [පාණිනිඃ 7. 4. 80.]

(මූ-) **817. ශ්‍රුස්‍රුස්නුද්‍රුප්‍රු ප්ලුච්‍යුඩාං වා,** (ශ්‍රු—චුඩාං 6...වා 1.) ශ්‍රිශ්‍රාවයිෂති ශුශ්‍රාවයිෂති.*

(ස-) ශ්‍රුස්‍රුස්නුද්‍රුපලුච්‍යුඩාං, සන් පරකල්හි ශ්‍රු ශ්‍රවණෙ යන ධාතුය, ස්‍රු ගතෞ යන ධාතුය, ෂ්ණු ලප්‍රස්නුතත්‍යං යන ධාතුය, ද්‍රු-ප්‍රුඩ-ප්ලුඩ-ච්‍යුඩව ගතෞ යන ගමනාර්ථ ධාතු සතරද යන මොවුන්ගේ බ්සංඥයා සම්බන්ධවූ උවර්ණයහට; වා, විකල්ප යෙන් ඉකාර වන්නේය. අව්‍යවහිත අවර්ණයක්හු නැත්බැවින් වර්ණවය ව්‍යවහිතවූ අවර්ණයා පර කල්හිය යන අර්ථයි. ශ්‍රු ධාතු මුල්වූ ධාතු ගත් බැවින් ජයල්පොඃ යන්න අනුවර්තනය නොවේ. ශ්‍රාවයිතුම්වඡති ශ්‍රු-ණිච්, සන්, ද්විත්වාදිය කළ කල්හි බ්සංඥයාගේ උකාරයහට විකල්පයෙන් ඉකාර වේ, ශ්‍රිශ්‍රාවයි ෂති. උකාරයහට ඉකාරනිෂෙධ පක්‍ෂයෙහි ශුශ්‍රාවයිෂති. එසේම ශ්‍රුන්වනතං ප්‍රෛරිරත් යන වාක්‍යයෙහි, ශ්‍රු-ණිච්, ලි-දි, අඩ්, ශ්‍රුඉ-යන්නහට ද්විත්වාදිය කළ කල්හි සන්වත්භාවය ඇති කල්හි මෙයින් බ්සංඥ උකාරයහට විකල්පයෙන් ඉකාර වේ, අශ්‍රිශ්‍රවත්. ඉකාර රහිත පක්‍ෂයෙහි, අශුශ්‍රවත් යනාදිය වේ. [පාණිනිඃ 7. 4. 81.]

---

* ශ්‍රුශ්ච ස්‍රුශ්ච ස්නුශ්ච ද්‍රුශ්ච ප්‍රුශ්ච ප්ලුශ්ච ච්‍යුඩ ච තෙෂාං.

(මු-) 818. ව්‍යුධෝ'වො හසාදෙඃ සෙමඃ ක්ත්වාච්ච කිද්වා රුදවිදමුෂස්තු නිත්‍යං. (ව්‍යුධඃ 5. අවඃ 5. හසාදෙඃ 5. සෙමඃ 5. ක්ත්වාච් 1. ච 1. කිත් 1. වා 1. රුද-විද-මුෂඃ 5. තු 1. නිත්‍යං 1.)

හසාදෙඃ සෙම උකාරොධ ඉකාරොධශ්ච වාන්තවර්ජාත් සන් ක්ත්වාච්ච කිත් වා සන්ත් රුදාදෙස්තු නිත්‍යං. රුරුවිෂතෙ රුරොවිෂතෙ, ලිලිබිෂති ලිලෙබිෂති. රුදාදෙස්තු රුරුදිෂති විවිදිෂති මුමුෂිෂති. වාන්තඃ කිං දිදෙවිෂති.*

(ස-) වාන්තවර්ජාත්, වකාරාන්ත ධාතු රහිතවූ; හසාදෙඃ, ව්‍යඤ්ජනයක් ආදියෙහි පවත්නාවූ; සෙමඃ, ඉ සහිතවූ; උකාරොධඃ, උධ්සංඥ උකාරයුක්ත ධාතුහු කෙරෙන්ද; ඉකාරොධශ්ච, උධ්සංඥ ඉකාරවත් ධාතුහු කෙරෙන්ද පරවූ; සන්, සන් ප්‍රත්‍යයද; ක්ත්වාච්ච, ක්ත්වාච්ප්‍රත්‍යයද යන දෙක; වා, විකල්පයෙන්; කිත් සන්ත්, කිත්සංඥ වන්නේය; රුදාදෙස්තු, රුද ආදිකොට ඇති විද-මුෂ යන ධාතුහු කෙරෙන් පරවූ සන් ප්‍රත්‍යය වනාහි; නිත්‍යං, නිත්‍යයෙන් කිත්සංඥ වන්නේය.

උධ්සංඥ උකාරයුක්තවූද උධ්සංඥඉකාර යුක්තවූද වර්ගයෙහි වූ බකාරාන්ත ධාතුවක් නැති බැවින් මෙහි වකාරය දන්ත්‍යමය. ක්ත්වාච්ච යන චකාරය කරණකොටගෙන ප්‍රකරණවශයෙන්, සන්ප්‍රත්‍යය අදනා ලැබේ. රොචිතුම්චඡති රුච—සන්, ඉම්, උධ්සංඥ උකාරවත් බැවින් මෙයින්, සන්හට කිත්සංඥ කළ කල්හි ගුණ නොවේ; රුච්ෂයන්න හට චිත්වාදිය වේ, රුරුචිෂතෙ. පක්ෂයෙහි ගුණකළ කල්හි, රොචිෂයන්න හට චිත්වාදිය වේ, රුරොචිෂතෙ. ලෙබිතුම්චඡති ලිබධාතු, උධ්සංඥ ඉකාරයුක්ත බැවින් මෙයින් සන්හට විකල්පයෙන් කිත්සංඥ වේ, ලිලිබිෂති. කිත්විකල්ප පක්ෂයෙහි ගුණවේ, ලිලෙබිෂති. රුදාදෙස්තු, රුදාදිධාතුහට වනාහි; රොදිතුම්චඡති රුද, සන්, ඉම්, නිත්‍යයෙන් කිත් වේ, රුරුදිෂති. වෙදිතුම්චඡති විදධාතු, නිත්‍යයෙන් කිත් වේ, විවිදිෂති. මොෂිතුම්චඡති මුෂධාතු, නිත්‍යයෙන් කිත් වේ, මුමුෂිෂති. ක්ත්වාච් පරකල්හි විකල්පයෙන් කිත් වේ, රුචිත්වා රොචිත්වා යනාදිය

---

* උශ්ච ඉශ්ච වී, තෞ උධෞ යස්‍ය ස ව්‍යුධ් තස්මාත්. නාස්ති ව (වකාරාන්තඃ) යත්‍ර සඃ අව තස්මාත්.

වේ. වාන්තඃ කිං, වාන්තඃ යනු කුමටය ? දෙවිතුමිච්ඡති යන මෙහි වකාරාන්තවූ, දිදෙවිෂති යන්න කිත් නොවන බැවිනි. එසේම, ක්ත්වාප්‍රත්‍යයා පරකල්හිද, වකාරාන්තය කිත් නොවේ, දෙවිත්වා යනු වේ. [පාණිනිඃ 1. 2. 8, 6.]

(මූ-) 819. ණිස්තෞත්‍යොඃ ඉණඃ සඃ ෂඃ ෂණ්‍යස්විත්ස්වත්සහඃ. (ණි-ස්තෞත්‍යොඃ 6.. ඉණඃ 6. සඃ 1. ෂඃ 1. ෂණි 7. අස්විද් ස්වද්සහඃ 6.)

ඉණඃ පරස්‍ය ණ්‍යන්තස්තෞත්‍යොඃ. සස්‍ය ෂත්වභූතෙ ෂණි ෂඃ ස්‍යාත් න තු ස්විද-ස්වද-සහාං. සුෂ්වාපයිෂති තුෂ්ටූෂති. ණිස්තෞත්‍යොඃ කිං සිසික්ෂති. ෂණීති කිං තිෂ්ඨාසති. ඉණඃ කිං ප්‍රතීෂිෂති.

ඉති සනන්තපාදඃ.

(ස-) ඉණඃ පරස්‍ය, ඉණ්සංඥයා කෙරෙන් පරවූ ; ණ්‍යන්තස්තෞත්‍යොඃ, ණිප්‍රත්‍යයාන්තවූ ධාතුය ස්තුධාතුය යන මොවුන්ගේ ; සස්‍ය, දන්ත්‍ය සකාරයාහට ; ෂත්වභූතෙෂණි, ෂත්වවූ ෂණ් පරකල්හි ; ෂඃ ස්‍යාත්, මූර්ධන්‍ය ෂකාර වන්නේය ; ස්විද ස්වදසහාංතු, ස්විදධාතු ස්වදධාතු සහධාතු යන මොවුන්ගේ සකාරයන්ට වනාහි ; න, ෂකාර නොවේ.

මේ නියමයතෙම ෂත්වය පැමිණිකල්හි වෙයි. ෂත්වවූ ෂණ් පරකල්හි ඉණ්සංඥයා නිමිත්තවූ මූලධාතුහට ෂත්වය ණිප්‍රත්‍යයාන්තය ස්තුධාතුය යන දෙදෙනාහටම වන්නේය අන්‍යයක්හට නොවන්නේය යන අර්ථයි. ෂත්ව නුවූ සන් පරකල්හි, එසේම ඉණ්සංඥ රහිතයා කෙරෙන් පරවූ ෂත්වවූ ෂන් පරකල්හිද, පූර්වනියමයම බලවත්වෙයි, ස්විද ස්වද සහ යන මොවුන්ගේ ස්ථානයෙහි ණ්‍යන්තයන්ගේම නිෂේධය වෙයි. ස්වාපයිතුමිච්ඡති ස්වප—ණි, සන්,ඉම්, ණි පරකල්හි වෘද්ධි, ගුණවේ, ස්වාපයිසයන්නහට ද්විත්වද, (647) ඊහට ජද, (111) සන්යන්නහුගේ සකාරයහට ෂත්වයද, මෙයින් මූලධාතුහට ෂත්වයද වෙත්. සුෂ්වාපයිෂති. ස්තොතුමිච්ඡති ස්තු—සන්, (805) දීර්ඝද, ස්තූෂ යන්නහට ද්විත්වද, මෙයින් මූලධාතුහුගේ සකාරයහට ෂත්වයද වෙත්, තුෂ්ටූෂති. ණිස්තෞත්‍යොඃ කිං, ණිස්තෞත්‍යොඃ යනු කුමටය? සෙක්තුමිච්ඡති සිච—සන්, (211) කුඞ්, සික්සයන්න හට

විධිද, (111) ප්‍රත්‍යයහට ෂත්වයද වෙත්, සිසික්‍ෂති. මෙහි ක්‍ෂී අනන්තද සතුධාතුද නොවන බැවින් මූලයහට ෂත්වය නොවන හෙයිනි. සුසූෂති යනාදිය මෙසේමැයි. ෂණ්ති කිං, ෂණ් යනු කුමටය? ස්ථාතුම්ච්ඡති ස්ථා-සන්, ස්ථාසයන්නහට ෂිත්වා දිය කළකල්හි නිමිත්තාර හිත බැවින් සන්යන්නහට ෂත්ව නුවූ කල්හි මේ සූත්‍රයෙහි නියමය නොරවූ බැවින් (111) අන්‍යවිධානයෙකින් මූලයහට ෂත්වය වේ, තිෂ්ඨාසති යන මෙහි ෂත් පරනොවන හෙයින් මෙයින් ෂත්වය නොවන බැවිනි.

බෙඃ කිං, බෙඃ යනු කුමටය? ප්‍රත්‍යේතුම්ච්ඡති ප්‍රති ඉධාතු-සන් (719) ඉකාරය නොහෙන සන්ප්‍රත්‍යයම විධිකළ කල්හි (640) බිහට ඉකාරය වේ, ප්‍රත්‍යයහට ෂත්වය වේ, මූලධාතු නිමිත්තවූ බිසංඥයහට ෂත්වය වේ, ප්‍රතීෂිෂති, මෙහි බිසංඥයා කෙරෙන් පරව සිටි මූලධාතුවක් නැති බැවින් මේ නියමය ප්‍රවෙශයට අනවකාශ බව හෙයිනි. ස්විදූදීන්ගේ වනාහි සිෂෙවදයිෂති යනාදියෙහි ෂත්වය නොවේ. [පාණිනිඃ 8. 3. 61, 62.]

සනන්තය නිමි.

යඩන්තඃ.

(මු-) 820. **මූත්‍රසූත්‍රසූචාටශත්‍යූර්ණු හසාද්‍යේකාචො'ශුහරුචො මුහුර්භෘශාර්ථෙ යඩ්.** (මූත්‍ර—ඒකාචඃ 5. අශුහරුචඃ 5. මුහුභෘශාර්ථෙ 7. යඩ් 1.)

එභ්‍යඃ ශුභරුචවර්ජෙභ්‍ය යඩ් ස්‍යාත් පෞනඃපුන්‍යෙ අතිශයෙ චාර්ථෙ.*

(ස-) ශුභරුචවර්ජෙභ්‍යඃ, ශුභ-රුච යන ධාතු රහිතවූ; එභ්‍යඃ, මූත්‍රය-සූත්‍රය-සූචය-අටය-අශය-අතීතිය-ඌර්ණුය- ව්‍යඤ්ජනයක් මුල්කොට ඇති ඒකස්වර ධාතුය යන මොවුන් කෙරෙන්; පෞනඃපුන්‍යෙ, වරින්වර යන අර්ථයෙහිද; අතිශයෙචාර්ථෙ, අතිශයාර්ථයෙහිද; යඩ් ස්‍යාත්, යඩ්ප්‍රත්‍යය වන්නේය.

---

* හසාදිශ්චාසෞ ඒකාචෙච්චති හසාද්‍යේකාච්. මූත්‍රශ්ච සූත්‍රශ්ච සූචශ්ච අට ච අශ ච අතීතිශ්ච ඌර්ණුශ්ච හසාද්‍යේකාචෙච්චති තස්මාත්. න විද්‍යේතෙ ශුභරුචෞ යත්‍ර තස්මාත්. මුහුශ්ච භෘශශ්ච මුහුභෘශෞ තයොරර්ථස්තස්මින්.

හසාදෙ‍්‍යකාචඃ යනු සාමාන්‍ය ග්‍රහණය බැවින් මූත්‍ර සූත්‍ර සූච යන මොවුන්ගේ අකාරාන්තත්වයෙන් අනෙකස්වරයන් බැවින්ද, අට-අශ-අතීති-ඌර්ණු-යන මොවුන්ගේ ස්වරාදිභාවයෙන්ද නොලත් කල්හි වෙන්වූ ධාතූන්ගේ කීමයි. යඞ්ප්‍රත්‍යයාගේ අනුබන්ධ ඞකාරය ගුණනිෂෙධයද ආත්මනෙපදයද පිණිසයි. අකාරාන්ත යකාරය සිටියි. [පාණිනිඃ 3. 1. 22.]

(මූ-) 821. **ගත්‍යර්ථාද් ගෘලුපසදචරජප ජභදන්ශදහො වක්‍රගහේ.** (ගත්‍යර්ථාත් 5. ගෘ—දහඃ 5. වක්‍රගහේ 7.)

ගත්‍යර්ථාත් වක්‍රෙ, ග්‍රාදෙගීර්හායාං, යඞ් ස්‍යාත් න තු පූර්වොක්තෙ, තද්‍යුක්තෙ තු ස්‍යාත්.*

(ස-) ගත්‍යර්ථාත්, ගමනාර්ථ ධාතූහු කෙරෙන්; වක්‍රෙ, වක්‍රාර්ථයෙහිද; ග්‍රාදෙඃ, ගෘධාතු ආදිකොට ඇති ලූපධාතු සදධාතු චරධාතු ජපධාතු ජභධාතු දන්ශධාතු දහධාතු යන මොවුන් කෙරෙන්; ගර්හායාං, නින්‍දාවෙහිද; යඞ් ස්‍යාත්, යඞ්ප්‍රත්‍යය වන්නේය; පූර්වොක්තෙ තු, පළමු කියනලද; පෞනඃ පුන්‍ය අතිශයාර්ථයෙහි වනාහි; න, වක්‍රගර්හා දෙක කෙරෙන් නොවන්නේය; තද්‍යුක්තෙ තු, පෞනඃ පුන්‍යාර්ථය හා සමග හෝ අතිශයාර්ථය හා සමග යෙදුනාවූ වක්‍ර ගර්හා දෙක්හි වනාහි; ස්‍යාත්, යඞ්ප්‍රත්‍යය වන්නේය.

ගත්‍යර්ථාත් කියාද ගෘලුපාදෙඃ කියාද පදවශයෙන් වෙන් කිරීම වක්‍ර ගර්හා දෙක හා සමග සංබන්‍ධක්‍රමය පිණිසයි. පූර්ව සූත්‍රයෙහි සාමාන්‍යයෙන් ගත්බැවින් මෙහි ගත්‍යර්ථාත් යනු ව්‍යඤ්ජනාදිවූ එකස්වර ධාතූන් කෙරෙන්මය. [පාණිනිඃ 3. 1. 23, 24.]

(මූ-) 822. **බෙර් ණුඃ.** (බෙඃ 6. ණුඃ. 1.)

යඞි පරෙ බෙර් ණුඃ ස්‍යාත්.

පුනඃ පුනරතිශයෙන වා මූත්‍රයති මොමූත්‍ර්‍යතෙ, සොසූත්‍ර්‍යතෙ සොසූච්‍යතෙ.

(ස-) යඞි පරෙ, යඞ්ප්‍රත්‍යයා පර කල්හි; බෙඃ, ඞිසංඥගහට; ණුඃ ස්‍යාත්, ගුණ වන්නේය.

පුනඃ පුනරතිශයෙන වා යන මෙහි ක්‍රියාවිශෙෂණයෙහි තෘතීයායි. පුනඃ පුනරතිශයෙන වා මූත්‍රයති යන වාක්‍යයෙහි

---

* ගෘශ්ච ලූප ච සද ච චර ච ජප ච ජභ ච දන්ශ ච දහ ච තස්මාත්. වක්‍රඤ්ච ගර්හා ච වක්‍රගර්හං තස්මින්.

මූත්‍රත්කප්‍රස්‍රාවෙ යන ධාතු, චුරාදි හෙයින් ණි, (775) අකාර ලොපයද, මූත්‍රිධාතුහු කෙරෙන් යඞ්ප්‍රත්‍යයද, (641) ණිප්‍රත්‍යය ලොප්ද, (632) මූත්‍ර්‍යයන්නහට ද්විත්වද, බිසංඥලොපයද, බිහට මෙයින් ගුණද, මොමූත්‍ර්‍යයන්නහට (631) ධාතුසංඥද වෙත්, යඞ්ප්‍රත්‍යයාගේ ඞිත්ත්වය හෙතුකොටගෙන ආත්මනෙපදය වේ, ශප්, (543) යඞයන්නහුගේ අකාරලොපය වේ, මොමූත්‍ර්‍ය තෙ යනු වේ. පුනඃ පුනරතිශයෙන වා සූත්‍රයති සූත්‍රත්ක ග්‍රන්ථනෙ වෙෂ්ටනෙ ච, සූත්‍රධාතු, යඞ්, ධාතුහුගේ අකාර ලොපයද, සූත්‍ර්‍යධාතුහට ද්විත්වාදියද වෙත්, සොසූත්‍ර්‍යතෙ. පුනඃ පුනරතිශයෙන වා සූචයති සූචත්කපෛශුන්‍යෙ, සූචධාතු, යඞ්, සොසූච්‍යතෙ.

(මු-) 823. ෙඪා'නිතඃ. (ඪඃ 1. අ-නිතඃ 6.)

අ-නකාරෙතඃ බෙඃ ඪඃ ස්‍යාත් යඞි.

අටාට්‍යතෙ අශාශ්‍යතෙ අරායඨතෙ ඌර්ණොනූයතෙ. දෙදී යතෙ මෙමීයතෙ ජෙගීයතෙ ජෙහීයතෙ පෙපීයතෙ සෙෂී යතෙ තෙෂ්ඨීයතෙ.*

(ස-) යඞි, යඞ්ප්‍රත්‍යය පර කල්හි ; අනකාරෙතඃ, ඉත්සංඥ නකාර රහිතවූ; බෙඃ, බිසංඥයහට; ඪඃ ස්‍යාත්, දීඝ වන්නේය

පුනඃ පුනරතිශයෙන වා වක්‍රං අටති (නොහොත්) වක්‍රං අටති අට ගමනෙ, අටධාතු, යඞ්, අට්‍යයන්නහුගේ (819) අකාර රහිතවූ ට්‍යයන්නහට ද්විත්වද, බිසංඥ යකාරය හට ලොප්ද, මේ සූත්‍රයෙන් අකාරයහට දීඝද වෙත්, අටාට්‍යතෙ යනු වේ. එසේම පුනඃ පුනරශ්නාති යන වාක්‍යයෙහි අශ ධාතු, යඞ්, අශ්‍යයන්නහට අකාර රහිතව ද්විත්වාදිය වේ, අශා ශ්‍යතෙ. පුනඃ පුනර්ක්‍රං ඍච්ඡති ඉයර්ති වා යන වාක්‍යයෙහි අරායඨතෙ යනු වේ, ඍ, යඞ්, (615) ගුණ වේ, අයඨයන්නහුගේ අකාරය හැර (720) අයෙ යනු කීබැවින් යඨයන්නහට ද්විත්ව කළ කල්හි බිසංඥ යකාරලොපය වේ, අරයඨ යන බිසංඥය හට මෙයින් දීඝ වේ. පුනඃ පුනරූර්ණොති ඌර්ණු, යඞ්, (590) දීඝ වේ, ඌර්ණූය යන්නහුගේ (719, 720) ඌකාර රකාර දෙක හැර, ණූය යන්නහට ද්විත්වද, බිහට ගුණද වෙත්,

---

* න ඉත් යෙෂාං තෙ නිතඃ (නීන් නුත් රීන්) න විද්‍යනෙත නිතො යස්‍ය සො'නිත් තස්‍ය.

ඌර්ණෝනූයතෙ. මෙහි රෙඵය සම්බන්ධ නොවන බැවින් මූලධාතුහුගේ නකාරයහට දන්ත්‍යත්වය වේ. ව්‍යඤ්ජනයක් ආදියෙහි පවත්නා ඒකස්වර ධාතූන්ගේ උදාහරණ කියයි, පුනඃපුනදීදෘති දෘධාතු, යඞ්, (612) ඞි, දීය යන්නහට ද්විත්වාදිය වේ, දෙදීයතෙ. පුනඃ පුනර්මාති යන වාක්‍යයෙහි මාධාතුහු කෙරෙන් මෙමීයතෙ යනු වේ. පුනඃ පුනර්ගායති යන වාක්‍යයෙහි ගෛධාතු, යඞ්, (612) ඞි, ගීයධාතුසංඥා, ද්විත්වද, ධිහට ලෝපද, ගුණාදියද වෙත්, ජේගීයතෙ. පුනඃ පුනර්ජහාති හා ධාතු, පළමු පරිච්ඡෙදෙන් සිද්ධකටයුතු. ජේජීයතෙ. පුනඃ පුනඃ පිවති පාධාතු, සිද්ධ පළමු පරිච්ඡෙදෙන් කටයුතු. පෙපීයතෙ. පුනඃ පුනඃ සාති සොධාතු, (620) ඕ ආදිය වේ, සෙෂීයතෙ, පුනඃපුනඃ තිෂ්ඨති ෂ්ඨාධාතු, යඞ්, ඞි, ස්ථීයධාතුහට ද්විත්වාදිය වේ, තෙෂ්ඨීයතෙ. [පාණිනිඃ 7. 4. 8. 3.]

(මු-) ශොශූයතෙ ශෙශ්වීයතෙ සාස්මර්යතෙ, චෙක්‍රීයතෙ සඤ්චෙෂ්ක්‍රීයතෙ, විසෙසිව්‍යතෙ, යඞන්තානාං ෂඃ. වක්‍රං ව්‍රජති වාව්‍රජ්‍යතෙ.

(ස-) පුනඃ පුනඃ ශ්වයති ශ්විධාතු, යඞ්, (669) විකල්පයෙන් ජ්‍යාදෙශද, (590) දීර්ඝද, ශූයයන්නහට ද්විත්වාදියද, ගුණද වෙත්, ශොශූයතෙ. ජි-විකල්ප පක්ෂයෙහි, ශෙශ්වීයතෙ. පුනඃ පුනඃ ස්මරති ස්මෘ, යඞ්, (615) ගුණද, ස්මර්යන්නහට ද්විත්වාදියද, මෙයින් ධිහට දීර්ඝද වෙත්, සාස්මර්යතෙ. පුනඃ පුනඃ කරොති කෘධාතු, යඞ්, (497) ඍකාරයහට රීආදෙශ වේ, ක්‍රීය යන්නහට ද්විත්වාදිය වේ, චෙක්‍රීයතෙ. පුනඃ පුනඃ සංස්කරොති සං-කෘ-යඞ්, (766) සුම් (615) ස්කුස්තුධ්‍යමෙච යන නියම යෙන් ගුණ නොවේ, සඤ්චෙෂ්ක්‍රීයතෙ. පුනඃ පුනර්විෂ්ඤ්චති විපූර්වකසිච-යඞ්, (572) ගිසංඥයා නිමිත්තකොටද ධිසංඥයා නිමිත්තකොටද ෂත්වය නොවන්නේය. දශස්ථාදෙර්වෙෂ්ච යන විධානපරිච්ඡෙදෙන් නිෂෙධයෙහිද එසේමැයි. විසෙසිව්‍යතෙ. පුනඃපුනර්වක්‍රං ව්‍රජති ව්‍රජධාතු, යඞ්, ව්‍රජ්‍යධාතුහට ද්විත්වාදියද, මෙයින් දීර්ඝද වෙත්, වාව්‍රජ්‍යතෙ යනු වේ.

(මු-) **824.** **ග්‍රෝරලඃ.** (ග්‍රුඃ 6. ර 1. ලඃ 1.)

ගිරතෙ රො ලඃ ස්‍යාත් යඞි.

ගර්හිතං ගිරති ජෙගිල්‍යතෙ, ලොලුප්‍යතෙ සාසද්‍යතෙ.

(ස-) යඞි, යඞ් පරකල්හි; ගිරතෙඃ, ගෘධාතුහුගේ; රඃ, රකාරයතෙම; ලඃ ස්‍යාත්, ලකාර වන්නේය.

ගෲනිගරණෙ, ගර්හිතං ගිරති ගෲධාතු, යඞ්, (628) ඎ හට ඉර් වේ, මෙයින් රකාරයහට ලකාර වේ, ගිල්‍යධාතුහට ද්විත්වාදියද වේ, ඛෙර් ජුඃ, ජෙගිල්‍යතෙ. වෘත්තියෙහි ගිරතෙඃ යනු කීබැවින් ගෲධාතුහට ජෙගීයතෙ යනු වේමය. ගර්හිතං ලුම්පති ලුපධාතු, සිඛ පෙර සේමැයි, ලොලුප්‍යතෙ. ගර්හිතං සීදති සදධාතු, සද්‍යයන්නහට ද්විත්වාදියද, (823) දීර්ඝද වෙත්, සාසද්‍යතෙ. [පාණිනිඃ 8. 2. 20.]

(මු-) **825. කොශ්චුර්වා.** (කොඃ 6. චුඃ 1. වා 1.)

කොඃ ඛෙ ශ්චුඃ ස්‍යාද්වා යඞි.

චොකූයතෙ කොකූයතෙ.

(ස-) යඞි, යඞ්ප්‍රත්‍යය පර කල්හි; කොඃ, කුඞ ශබ්දෙ යන ධාතුහුගේ; ඛෙඃ, ඛසංඥයහට; වා, විකල්පයෙන්; චුඃ ස්‍යාත්, චු වන්නේය.

මණ්ඩූකගතියෙන් ඛෙඃ යනු මොහුගේ අනුවෘත්තියයි. පුනඃපුනඃ කවතෙ යන වාක්‍යයෙහි කු, යඞ්, (590) දීර්ඝද, මෙයින් ඛිහට විකල්පයෙන් චුද වෙත්, චොකූයතෙ. චු රහිත පක්ෂයෙහි, කොකූයතෙ යනු වේ. [පාණිනිඃ 7. 4. 63.]

(මු-) **826. නීන් වඤ්ච ස්‍රන්සධ්වන්සභ්‍රන්ශකස පතපද ස්කන්දාං.** (නීන් 1. වඤ්ච—ස්කන්දාං 6...)

එෂාං ඛෙර් නීන් ස්‍යාත් යඞි. වනීවච්‍යතෙ.

(ස-) යඞි, යඞ් පර කල්හි; එෂාං, වඤ්චධාතු ස්‍රන්සධාතු ධ්වන්සධාතු භ්‍රන්ශධාතු කසධාතු පතධාතු පදධාතු ස්කන්ද ධාතු යන මොවුන්ගේ; ඛෙඃ, ඛසංඥයහට; නීන් ස්‍යාත්, නීන් වන්නේය.

වන්චුගත්‍යර්ථං යන ධාතුය, ස්‍රන්සුඅවභ්‍රංශෙ යන ධාතුය, ධ්වන්සුඅවගතෞ යන ධාතුය; භ්‍රන්ශුයඞ අධඃ පාතෙ යන ධාතුය, කසජගතෞ යන ධාතුය, පතඎගත්‍යර්ථං යන ධාතුය, පදමෛසථ්‍යෙ යන ධාතුය පද්‍යෘඞගතෞ යන ධාතු දෙකය, ස්කන්දිර්ගතිශොෂණෙ යන ධාතුය යන මොව්හු වෙත්. නීන් යන්නහුගේ නකාර ඉත්සංඥයි, අන්තයෙහි නී කියා වේ. මෙහි පතඎගත්‍යර්ථං යන ධාතුහුගේම ග්‍රහණයයි, පත්‍යෛශ්චර්‍ය යන මේ ධාතුහට පාපත්‍යතෙ කියාම වේ, එහෙයින් (1118) පාපතිඃ ක්‍රියා තෙමේම උදාහරණ කරන්නේය. වක්‍රං

වඤ්චති, වන්චධාතු, යඞ්, (567) නකාරලොපය වේ, වච්‍ය යන්නහට ද්විත්ව කළ කල්හි මෙයින් බ්හට නීක්, වනීවච්‍යතෙ. (823) නකාරය ඉත්සංඥ බැවින් දීර්ඝ නොවේ. සනීස්‍රස්‍යතෙ, දනීධ්වස්‍යතෙ, බනීභ්‍රශ්‍යතෙ, චනීකස්‍යතෙ, පනීපත්‍යතෙ, පනීපද්‍යතෙ, චනීස්කද්‍යතෙ යනුද මෙසේමැයි. [පාණිනිඃ 7. 4. 84.]

(මු-) 627. **ඤුමජපජභදහදන්ශභන්ජපශශපො'තොනුන් ලවයස්තු වා.** (ඤුම—ශපඃ 6. අතඃ 6. නුන් 1. ල-ව-යඃ 6. තු 1. වා 1.)

ඤුමන්තානං ජපාදීනඤ්ච අදන්තස්‍ය බෙර් නුන් ස්‍යාත් යඞි, ලවයාන්තස්‍ය තු වා.

ජඤ්ජප්‍යතෙ ජංජයතෙ.*

(ස-) යඞ්, යඞ්ප්‍රත්‍යය පර කල්හි; ඤුමන්තානං, ඤුම් අන්තවූ ධාතූන්ගේද; ජපාදීනඤ්ච, ජපධාතු ආදිවූ ජභ-දහ-දන්ශ-භන්ජ-පශ-ශපධාතු යන මොවුන්ගේද; අදන්තස්‍ය, අකාරාන්තවූ; බෙඃ, බිසංඥයහට; නුන් ස්‍යාත්, නුන්ආගම වන්නේය; ලවයාන්තස්‍ය තු, ලකාරාන්ත වකාරාන්ත යකාරාන්ත ධාතුහට වනාහි; වා, විකල්පයෙන් යඞ් පර කල්හි නුන් වන්නේය.

මෙහි නු-යන්නහුගේ කෙවලග්‍රහණයයි, නකාර ඉත්සංඥ හෙයින්, නු-යන්න අන්තයෙහි වේ, උකාර ඉත්සංඥ නොවේ, එහෙයින්, නු-යනු අනුස්වාරයයි, අන්පරිද්දෙකින් වීනම්, යංයම්‍යතෙ, රංරම්‍යතෙ යනාදියෙහි ඣස්පරත්වය නොමැති බැවින් (50) අනුස්වාරය නොවන්නේය. යෙන විධිස්තදන්තස්‍ය යන න්‍යාය හෙතුකොටගෙන, ලවය-යනු ලාන්තවාන්ත යාන්තයන්ගේය යන අර්ථයි. ල-ය-මධ්‍යයේ කීබැවින් වකාරය දන්ත්‍යමය. පුනඃ පුනර්ජායතෙ, ජන-යඞ්, (655) ආදෙශයාගේ විකල්ප පක්‍ෂයෙහි, ජන්‍ය යන මොහට ද්විත්ව වේ, මෙයින් බිසංඥයහට අනුස්වාරයද වේ, (51) අනුස්වාරයහට නිත්‍යයෙන් ඤුම්, ජෞමරයෝවනාහි අනුස්වාරයාගේ පදන්තත්වය සලකා (52) විකල්පයෙන් ඤුම් කෙරෙත්. නකාරය ඉත් බැවින් (823) බ්හට දීර්ඝ නොවේ. ජනධාතුහුගේ ස්ථානයෙහි (655)

---

* ඤුමශ්ච ජපශ්ච ජභශ්ච දහශ්ච දන්ශශ්ච භන්ජශ්ච පශශ්ච ශප ච තස්‍ය.

ඛාදෙශපක්‍ෂයෙහි-ජ්ජියතෙ යනු වේ, මේ උදාහරණය ඣම් අන්තයහටයි, මේ සූත්‍රයාගේ උදාහරණය පිණිස පළමුකොට ඛාදෙශාභාව පක්‍ෂය දක්වනලදී. [පාණිනිඃ 7. 4. 84, 86.]

(මු-) 828. හනො වා ස්නී. (හනඃ 6. වා 1. ස්නී 1.)

ජෙස්නීයතෙ ජඞ්ඝන්‍යතෙ. ජඤ්ජප්‍යතෙ. චඤ්චල්‍යතෙ චාචල්‍යතෙ, මම්මව්‍යතෙ මාමව්‍යතෙ, දන්දය්‍යතෙ දාදය්‍යතෙ.

(ස-) හනඃ, යඞ් පරකල්හි හනධාතුහට; වා, විකල්පයෙන්; ස්නී, ස්නීආදෙශ වන්නේය.

පුනඃපුනර්හන්ති, හනධාතු, යඞ්, මෙසින් ධාතුහට ස්නීද, ස්නීය-යන්නහට ද්විත්වාදියද වෙත්, ඛිසංඥ සකාරයහට ගකාරද ඔහට චවර්ගියද වෙත්, බෙර් ණුඃ සී ගුණයි, ජෙස්නීයතෙ. විකල්ප පක්‍ෂයෙහි, හන්‍ය යන මෝහට ද්විත්වකළ කල්හි පූර්ව සූත්‍රයෙන් ඛිහට නුන් වේ, (679) ඛිසංඥයා කෙරෙන් පරවූ හකාරයහට ඝකාර වේ, ජඞ්ඝන්‍යතෙ. මේ උදාහරණයද ඣම්අන්තයහටයි. ගර්හිතං ජපති, ජපධාතු, ද්විත්වාදිය කළ කල්හි පූර්වසූත්‍රයෙන් නුන් වේ, ජඤ්ජප්‍යතෙ. ජඤ්ජභ්‍යතෙ, දන්දහ්‍යතෙ, දන්දශ්‍යතෙ, බම්භජ්‍යතෙ, පම්පශ්‍යතෙ, ශංශප්‍යතෙ යනුද මෙසේම පූර්වසූත්‍රයෙන් නුන් වී සිඬයි. ජපාදි ධාතුන්ගේ උදාහරණ දක්වනලදී. වක්‍රං චලති චලධාතු, චඤ්චල්‍යතෙ, නුන්විකල්ප පක්‍ෂයෙහි චාචල්‍යතෙ. පුනඃපුනර්මවති මවධාතු, මම්මව්‍යතෙ, නුන්විකල්ප පක්‍ෂයෙහි මාමව්‍යතෙ. වක්‍රං දයති දයධාතු, දන්දය්‍යතෙ, විකල්ප පක්‍ෂයෙහි, දාදය්‍යතෙ. මේ තුන්තන්හි පූර්වසූත්‍රයෙන් විකල්පයෙන් නුන්ආගමයි. නුන් පක්‍ෂයෙහි ඛිහට දීඝී නොවේ. මේ උදාහරණ තුණ පූර්වසූත්‍රයෙහි, ලවය-යන මොවුන් අන්තවූ ධාතුන්ගේ වෙත්.

(මු-) 829. චරඵලො රුංවෙවා ඬො න ණුඃ. (චරඵලොඃ 6 .. උත් 1. ච 1. උඩඃ 6. න 1. ණුඃ 1.)

චරඵලොඃ බෙර් නුන් සත් උඩ උකාරශ්ච යඞ්, තස්‍ය ච න ණුඃ.

චඤ්චූර්‍ය්‍යතෙ පම්ඵුල්‍යතෙ.

(ස-) යඞ්, යඞ්ප්‍රත්‍යය පර කල්හි; චරඵලොඃ, චර ඵල යන ධාතුන්ගේ; බෙඃ, ඛිසංඥයහට; නුන් සත්, නුන්ආගම වන්නේය; උඩඃ, උඩ්සංඥ අකාරයහට; උකාරශ්ච, උකාරද වන්නේය; තස්‍යච, ඒ උකාරයහටද; න ණුඃ, ගුණ නොවන්නේය.

බෙර් නුක් යනු අනුවර්තනය කෙරේ, ඛිසංඥයාගේ උඞ් සංඥයක් නැති බැවින් මූලධාතුහුගේ උඞ්හට උකාරද වේ, යඞ්ප්‍රත්‍යයහට ලොප්කල කල්හි යෙදුනාවූ ගුණයාගේ නිෂෙධය පිණිස. න ඍුඃ යනු කියනලදී. චක්‍රං චරති චරධාතු. යඞ්, චයඞ්යන්නහට ද්විත්වකල කල්හි ඛිහට මෙයින් නුක්අගමද, මෙයින්ම මූලධාතුහුගේ අකාරයහට උකාරද, (228) ඕහට දීඝීද වෙත්, චඤ්චූර්‍යතෙ. පුනඃ පුනඃ ඵලති යන වාක්‍යයෙහි පම්ඵුල්‍යතෙ යනු වේ. [පාණිනිඃ 7. 4. 86, 87.]

(මූ-) **830. රීගෘවතඃ.** (රීක් 1. ඍවතඃ 6.)

ඍකාරවතො ධොඃ ඛෙඃ රීක් ස්‍යාත් යඞි. නරීනෘත්‍යතෙ.*

(ස-) යඞි, යඞ්ප්‍රත්‍යය පරකල්හි; ඍකාරවතො ධොඃ, ඍකාරයුක්ත ධාතුහුගේ; ඛෙඃ, ඛිසංඥයහට; රීක් ස්‍යාත්, රීක් ආගම වන්නේය; කකාරය ඉත්සංඥයි.

ඍකාරවතඃ යන මෙයින් යම් කලෙක්හි ඍකාරයාගේ පැවැත්ම වේද, එකල්හිම ඛිහට රීක් වෙයි යන අර්ථයි, එහෙයින් චෙක්‍රීයතෙ යනාදියෙහි (497) ඍකාරයහට, රිආදෙශ කල කල්හි, රීක්ආගම නොවේ, යඞ්ප්‍රත්‍යයහට ලොප් කල කල්හි චනාභි, චරීකර්ත්ති යනාදියෙහි වන්නේමය, එසේම ග්‍රහ ප්‍රච්ඡ ව්‍රශ්ච ආදීන්ට (661) ජ්‍යාදෙශ කල කල්හි, ඍකාර වත් බැවින්, රීක්ආගම වන්නේය, එහෙයින් ජරීගෘහ්‍යතෙ පරීපෘච්ඡ්‍යතෙ වරීවෘශ්ච්‍යතෙ යනාදිය වේ.

පුනඃ පුනර්නෘත්‍යති නෘත, යඞ්, නෘත්‍ය යන මෙ‍ෝහට ද්විත්ව කල කල්හි ඛිසංඥ ත්‍යයන්නහට ලොපයද, ඛි-ඍකාරයහට අකාරද, නැවත ඛිහට මෙයින් රීක්ද වෙත්, ක්ෂුභ්නාදි බැවින් ණත්ව නොවේ, නරීනෘත්‍යතෙ. [පාණිනිඃ 7. 4. 90.]

(මූ-) **831 වෙඤ්ස්වපස්‍යමාං ජීඃ.** (වෙඤ්ස්වපස්‍යම්ඃ 6. ජීඃ 1.)

එෂාං ජීඃ ස්‍යාත් යඞි.

වෙවීයතෙ සොෂුප්‍යතෙ සෙසිම්‍යතෙ.

(ස-) යඞි, යඞ්ප්‍රත්‍යය පර කල්හි; එෂාං, වෙඤ්තන්තුසන්තානෙ යන ධාතුය, ඤිෂ්වප්ශයෙ යන ධාතුය, ස්‍යමුශබ්දෙ යන ධාතුය යන මොවුන්ගේ ස්ථානයෙහි; ජීඃ ස්‍යාත්, ජ්‍යාදෙශ වන්නේය.

---

* ඍත් විද්‍යතෙ යස්‍ය ස ඍත්වාන් තස්‍ය.

(661) ස්වපාදෙඃ කිති ජිඃ යනාදි නියමය බැවින් එහි නොලත් කල්හි මේ විධානයයි. අනිෂ්ට බැවින් බෙඃ යනු මොහුගේ අනුවෘත්තිය නොවේ. වේ‍යධාතු, යඞ්, මෙයින් ජ්‍යදෙශද. (590) දීඝීද, වීය-යන්නහට ද්විත්වාදියද වෙත්, වෙවීයතෙ. ස්වප-යඞ්, මෙයින් ජී, සුප්‍යයන්නහට ද්විත්වාදියද, (111) ෂත්වයද වෙත්, සොෂුප්‍යතෙ. ස්‍යමධාතු, යඞ්, ජී, සිම්‍ය-යන්නහට ද්විත්වාදිය වේ, සෙසිම්‍යතෙ, තුන්තන්හිම, බෙර් ෂුඃ යන්නෙන් ගුණසි. [පාණිනිඃ 6. 1. 19.]

(මු-) 832. න වශඃ. (න 1. වශඃ 6.)

වශෙර් ජිනී සත්‍යත් යඞ්. වාවශ්‍යතෙ.

(ස-) යඞ්, යඞ් පර කල්හි; වශෙඃ, වශලකාන්තෞ යන ධාතුහට; ජිර් න සත්‍යත්, ජ්‍යදෙශ නොවන්නේය.

වශධාතුහු තමා ග්‍රහාදි බැවින් ජ්‍යදෙශය ලද කල්හි මෙයින් නිෂෙධයි. පුනඃ පුනර්භෘශං-වශ-යඞ්, මෙයින් ජ්‍යදෙශනිෂෙධයද, (823) දීඝීද වෙත්, වාවශ්‍යතෙ. [පාණිනිඃ 6. 1. 20]

(මු-) 833. චායඃ කී. (චායඃ 6. කී 1.)

චාය තඃ කී සත්‍යත් යඞ්. චෙකීයතෙ.

(ස-) යඞ්, යඞ් පරකල්හි; චායතෙඃ, චායධාතුහට; කී සත්‍යත්, කීආදෙශ වන්නේය.

පුනඃපුනරතිශයෙන වා චායති චායධාතු, යඞ්, මෙයින් කත්‍යදෙශද, කීයධාතුහට ද්විත්වාදියද, ගුණද වෙත්, චෙකීයතෙ. [පාණිනිඃ 6. 1. 21.]

(මු-) 834. ෂ්‍රාධ්මොර් ඞී. (ෂ්‍රා-ධ්මොඃ 6 .. ඞී 1.)

ජෙෂ්රීයතෙ දෙධ්මීයතෙ.

(ස-) ෂ්‍රාධ්මොඃ, යඞ්ප්‍රත්‍යය පර කල්හි ෂ්‍රාධාතු ධ්මාධාතු යන මොවුන්ගේ ස්ථානයෙහි; ඞී, ඞ්‍යදෙශ වන්නේය.

ඞී යන මොහුගේ ඩකාරය ඉත්සංඥයි. ධාත්වන්තයාගේ ස්ථානයෙහි ඊකාරය වන්නේය. පුනඃපුනර් ජිඝ්‍රති ෂ්‍රා-යඞ්, මෙයින් ඞී වේ, ජෙෂ්රීයතෙ. පුනඃපුනර්ධමති ධ්මාධාතු, යඞ්, ආකාරයහට මෙයින්, ඞී, ධ්මීයධාතුහට ද්විත්ව වේ, දෙධ්මීයතෙ. [පාණිනිඃ 7. 4. 31.]

(මු-) 835 ශිඞො ඩය් යෙ'ණෞ. (ශීඞඃ 6. ඩය් 1. යෙ 7 අණෞ 7.) ශාශය්‍යතෙ.

(ස-) අණෞ යෙ, ගුණරහිත යකාරයා පරකල්හි; ශීඞඃ, ශී ධාතුහට; ඞය්, ඞය් වන්නේය.

ඞකාරය ඉත්, ධාත්වන්තයාගේ ස්ථානයෙහි අය් කියා සිටියි. අණෞ යෙ යනු කිබැවින් කර්ම වාච්‍ය කල්හි යක් වේ, ශය්‍යතෙ යනු වේ. ක්ත්වාච්ප්‍රත්‍යයාගේ ස්ථානයෙහි යප් වේ, සංශය්‍ය යනු වේ, ක්‍යප්ප්‍රත්‍යග වේ, ශය්‍ය යනු වේ. පුනඃපුනඃ ශෙතෙ ශීධාතු, යඞ්, මෙයින් ඞය් වේ, ශය්‍ය, යන්නහට ද්විත්වාදිය වේ, ශාශය්‍යතෙ. [පාණිනිඃ 7. 4. 22.]

(මූ-) 836. **යඞො ලුග් වාපො ලුක් පං ද්විර්ණ්වාදි ච ධුක් නන්තු වා'නි තු නිත්‍යං නොතඃ.** (යඞඃ 6. ලුක් 1. වා 1. අපඃ 6. ලුක් 1. පං 1. ද්විඃ 1. ණ්වාදි 1. ච 1. ධුක්නන්තං 1. තු 1. වා 1. අනි 7. තු 1. නිත්‍යං 1. න 1. උතඃ 5.)

යඞො ලුක් ස්‍යාද්වා, ලුකි සති අපො ලුක් පං ද්විත්වං බෙර් ණුරිත්‍යාදි කාය්‍යීඤ්ච ස්‍යාත්, ධුග්‍රහණකෘතනාතු වා ස්‍යාත්, අනි තු නිත්‍යං ලුක් ස්‍යාත්, උදන්තාත් ත්වනි න ස්‍යාත්.

(ස-) යඞඃ, යඞ්ප්‍රත්‍යයහට; වා, විකල්පයෙන්; ලුක් ස්‍යාත්, ලොප් වන්නේය; ලුකි සති, ලොප්කළ කල්හි; අපඃ, ශප්ප්‍රත්‍යයාගේ අකාරයහට; ලුක්, ලොප් වේ; පං, පරස්මෛපදය වේ. ද්විත්වං, ද්විත්ව වේ; බෙර්ණුරිත්‍යාදිකාය්‍යීඤ්ච, බෙර්ණුඃ යනාදි යඞන්තයන්ගේ කාය්‍යීද; ස්‍යාත්, වන්නේය; ධුග්‍රහණකෘතනාතු, ධාතුග්‍රහණයෙන් කියනලද කාය්‍යී වනාහි; වා ස්‍යාත්, විකල්පයෙන් වන්නේය; අනි තු, අන්ප්‍රත්‍යයා පර කල්හි වනාහි; නිත්‍යං ලුක් ස්‍යාත්, යඞ්හට නිත්‍යයෙන් ලොප් වන්නේය; අනි, අන් පර කල්හි; උදන්තාත්තු, උකාරාන්ත ධාතුහු කෙරෙන් වනාහි; න ස්‍යාත්, යඞ්හට ලොප් නොවන්නේය.

යඞ්ප්‍රත්‍යයහට ලොප් කිරීම කරණකොටගෙන ප්‍රත්‍යලොපෙ ප්‍රත්‍යලක්ෂණම් යන න්‍යායක්‍රමයෙන් ලද්දාවූ කාය්‍යීයාගේ ලුකි න තත්‍ර යන්නෙන් නිෂෙධ බැවින් (497) යඞ් ඞ්‍යෙක්‍ය වර්ජ්‍ය යන්නද, (615) ස්‍යාදූර්ත්ත්වෙතො ණුඃ යනාදියද, (567) හසුඞ් නො ලොපඃ යනාදීහු නොවන්නෝය, යඞ්ප්‍රත්‍යයාගේ අන්තත්වයෙන් කරණලද කාය්‍යී වන්නේමය, එහෙයින් ධාතුසංඥද සී පරකල්හි ආම්ආගමද වන්නේය. යඞ් පර කල්හි කරණලද ගුණවීම් ආදි කාය්‍යීයාගේ ලුකි න තත්‍ර යන්නෙන් නිෂෙධ බැවින් නොලද කල්හි මේ සූත්‍රයෙන් විධාන කිරීමයි. ධුග්‍රහ

ෂේකත්‍වං යනු, යම් තැනෙක්හි කිසි සූත්‍රයෙක්හි ධාතුවිශෙෂ ග්‍රහණය මුල්කොට පවත්නා යම් කාය්‍ය්‍යයෙක් කියනලද්ද ඒ කාය්‍ය්‍ය විකල්පයෙන් වන්නේය යනු දක්වයි. අතිතු යනු (993) පචාදි බැවින් අන්ප්‍රත්‍යය කළ කල්හි ඔහු පර කල්හි නිත්‍යයෙන් යඞ්ප්‍රත්‍යයහට ලොප් වන්නේය, හ්‍රස්ව උකාරාන්ත ධාතුහු කෙරෙන් පරවූ යඞහට වන්‍යාහි අන් පර කල්හි ලොප් නොවන්නේය.

තිප්ප්‍රත්‍යයා විසින්ද ශප්ප්‍රත්‍යයා විසින්ද අනුබන්ධයා විසින්ද ගණයෙන්ද යමක් දක්වනලද්ද, යම්කිසි එකස්වරග්‍රහණ යෙක් ඇද්ද, මෙ පස යඞ්ප්‍රත්‍යයහට ලොප් කළ කල්හි නො වේ. යඞ්ප්‍රත්‍යයහට ලොප්කළ කල්හි ඉම්රහිතයන්ගේ ස්ථාන යෙහිද ඉම්සහිත බව ආචාය්‍ය්‍යයෝ රුචිවෙති, යන මේ පුරාතන වචනයද සිහිකටයුතු. තිපා ශපානුබන්ධෙන නිර්දිෂ්ටං යත් ගණෙන ච, යච්චෛකාච්ග්‍රහණං කිඤ්චිත් පඤ්චෛතාන් න යඞ් ලුකි, යනුයි. (686) වෙතෙතඃ යනාදියෙහි තිප් ප්‍රත්‍යයා විසින් කියනලද බැවින්ද, (573) ස්වර යනාදිය ශප් ප්‍රත්‍යයා විසින්ද, (710) ශීඩ යනාදිය අනුබන්ධයෙන්ද, (695) රුද්භ්‍යඃ යනාදියෙහි ගණයෙන්ද, (576) එකස්වරයා කෙරෙන් කියයුතු බැවින්ද, ඒ ඒ කාය්‍ය්‍ය නොවන්නේය යනු අර්ථයි. ඉම් රහිතයන්ගේ ඉම්සහිත බව (841) බෙභිදිතා යනාදියෙහි වේ. [පාණිනි: 2. 4. 74.]

(මු-) බොභවීති බොභොති, බොභූතඃ බොභුවති. අබොභ වීත් අබොභොත් අබොභූතාං අබොභුවන්, අබොභූත අබොභු වීත් බොභුවාඤ්චකාර.

(ස-) පුනඃපුනර්භවති යඞ් ලුකි යන වාක්‍යයට අනතුරුව භූධාතු, යඞ්, යඞහට ලොප්ද, ද්විත්වද, ද්විත්වහට ගුණද වෙත්, බොභූයන්නහට ධාතුසංඥා කළ කල්හි තිප්, ශප්, ශප්හට ලොප්ද, (722) ඊම්ද, ගුණද වෙත්, බොභවීති යනු වේ. ඊම් විකල්ප පක්ෂයෙහි දෙතන්හි ගුණ වේ, බොභොති. සියලු තන්හි මෙසේමැයි. බොභූතඃ, යන මෙහි ඞකාර ඉත්සංඥ බැවින් ගුණ නොවේ. අන්ති, (697) අන්ත්ස්ථානයෙහි අත්, (588) උව් වේ, බොභුවති. සි-දිප්, (722) විකල්පයෙන් ඊම් වේ, අබොභවීත්. ඊම්විකල්ප පක්ෂයෙහි අබොභොත්. සි-තාං, අබොභූතාං. සි-අන්, (563) භූවර්ජිත බැවින් උස්

නොවේ, (588) උවආදෙශ වේ, අබොභුවන්. වී-දී, (552) බුග්‍රහණෙකත බැවින් විකල්පයෙන් සිහට ලොප් වේ, අබොභූත්. පක්‍ෂයෙහි (84) රසංඥ නුවූ කල්හි ගුණනිෂෙධ බැවින් උවාදෙශ වේ, අබොභුවීත්. සී-ණප්, (582) ප්‍රත්‍යයානත බැවින් ආම් වේ, උවාදෙශද, (583) කෘධාතුප්‍රයොගයද වෙත්, බොභුවාඤ්චකාර.

(මු-) වන්වඤ්චීති වනීවඞකති, වනීවකතඃ වනීවචති. ජඞ්ගමීති ජඞ්ගනත්, ජඞ්ගතඃ, ජඞ්ග්මති ජඞ්ගමති, ජඞ්ගමීමි ජඞ්ගන්මි, ජඞ්ගන්වඃ, ජඞ්ගන්මඃ. ජඞ්ඝනීති ජඞ්ඝනති, ජඞ්ඝතඃ, ජඞ්ඝ්නති ජඞ්ඝනති. චඤ්චුරීති චඤ්චූර්ති. චාබාතඃ චඞ්බනතඃ, චඞ්බ්නති චඞ්බනති. ජාජතඃ ජඤ්ජනතඃ, ජඞ්ඥති ජඤ්ජනති. දෙදිවීති දෙද්‍යොති දෙදෙති, දෙද්‍යූතඃ දෙදිතඃ, දෙද්‍යූවඃ දෙදිවඃ. වෙවිච්ජීති වෙවෙෂ්ටි, වෙවිශ්වඃ වෙවිච්ජ්වඃ.

(ස-) පුනඃ පුනර්වඤ්චති යඞ් ලුකි-වඤ්චධාතු, යඞ්, ඔහට ලොප්ද, ව්‍යවාදියද වෙත්, (826) බිහට නීන්, වනී වඤ්චධාතුහට තිප්, ඊම්, වනීවඤ්චීති යනු වේ, ඊම්විකල්පපක්‍ෂයෙහි (211) කුඞ්, (50, 51) නකාරයහට අනුස්වාරයද අනුස්වාරයහට ඞකාරයද වෙත්, වනීවඞකති. පුනඃපුනර්වඤ්චතො යඞ් ලුකි යනු වාක්‍යයි, තස්විභක්ති, (567) නකාරලොපය වේ, වනීවකතඃ. අනති, (697) අන්ත්ස්ථානයෙහි අත්, නකාරලොපය වේ, වනීවචති. පුනඃපුනර්ගච්ඡති යඞ් ලුකි යනු වාක්‍යයි, ගමධාතු, යඞ්, යඞ්හට ලොප් වේ, (827) ඛිහට නුන්, ජඞ්ගමධාතු, තිප්, විකල්පයෙන් ඊම්, ජඞ්ගමීති. පක්‍ෂයෙහි මකාරයහට අනුස්වාරය කළ කල්හි ඔහට නකාර වේ, ජඞ්ගනති. පුනඃපුනර්ගච්ඡතො යඞ් ලුකි යනු වාක්‍යයි, තස්, (676) ඤම්ලොපය වේ, ජඞ්ගතඃ. පුනඃපුනර්ගච්ඡන්ති යඞ් ලුකි ගමධාතු, අනති, (230) බුග්‍රහණෙකත බැවින් විකල්පයෙන් උඞ්ලොපය වේ, අන්ත්හට අත් වේ, ජඞ්ග්මති. උඞ්ලොපවිකල්ප පක්‍ෂයෙහි ජඞ්ගමති. පුනඃ පුනර්ගච්ඡාමි යඞ් ලුක් මිප්, විකල්පයෙන් ඊම් වේ ජඞ්ගමීමි. පක්‍ෂයෙහි (202) ගමධාතුහුගේ මකාරයහට නකාරය වේ, ජඞ්ගන්මි. පුනඃපුනර්ගච්ඡාවඃ යඞ් ලුකි වස්, මකාරයහට නකාර වේ, ජඞ්ගන්වඃ. පුනඃපුනර්ගච්ඡාමඃ යඞ් ලුකි මස්, මකාරයහට නකාර වේ, ජඞ්ගන්මඃ, පුනඃපුනර්හන්ති යඞ් ලුක් හනධාතු, යඞ්, ඔහට ලොප් වේ, ගමධාතු මෙන්, අඩිකය

චනාඝි, (679) හකාරයහට ඝකාර වේ, ජඞ්ඝනීති, ජඞ්ඝනති ජඞ්ඝතඃ, ජඞ්ඝ්නති, ජඞ්ඝනති, යන මේ සියල්ල සිඬයි. පුනඃපුනශ්ක්‍රං චරති යඞ් ලුක් චරධාතු, යඞ්, ඔහට ලොප් වේ, (722) ඊම් වේ, (829) ඛිහට නුන්, ළංසංඥසහට එයින්ම උකාරද, එහෙයින්ම ගුණනිෂෙධද වෙත්, චඤ්චූරීති. ඊම්විකල්ප පක්‍ෂයෙහි (228) උකාරයහට දීඝී වේ, චඤ්චූර්ති. පුනඃපුනඃ ඛනතො යඞ් ලුකි යන වාක්‍යයෙහි ඛනධාතු, යඞ්, ලොප්වේ, තස්, (655) ධූඝනත්වභාවයෙන් විකල්පයෙන් ඩාදෙශ කළ කල්හි, ඤමඅනත නොවන බැවින් ඛිහට නුන් නොවේ, (823) දීඝී වේ, චා ඛාතඃ. පක්‍ෂයෙහි ඤමනත බැවින් ඛිහට නුන් වේ, ච ඞ්ඛනතඃ. අනති (230) විකල්පයෙන් උඞ්ලොපය වේ, අන්ත්හට අත්, ච ඞ් ඛ් න ති. උඞ්ලොප නිෂෙධ පක්‍ෂයෙහි චඞ්ඛන ති. ආගමාදෙශයොම්ධ්‍යෙ බලීයානාගමො විධිඃ යනු න්‍යාය බැවින්, තිප්-සිප් ආදීන් කෙරෙහි ආදියෙහි (722) ඊම් කළ කල්හි ඩාදෙශ නොවන කල්හි චඞ්ඛනීති චඞ්ඛනති යනාදිය වේ, ඊම්හට විකල්ප පක්‍ෂයෙහිද පකාර ඉත් පර කල්හි ඣඛස් පර විෂයෙහි නිෂෙධ බැවින් ඩාදෙශ නොවෙයි යනු අවබොධ කටයුතු. පුනඃපුනජ්ජායතෙ යන වාක්‍යයට අනතුරුව ජනධාතු, යඞ්, ලොප් වේ, ඛනධාතුහු මෙන් සිඬකටයුතු, ජජාතඃ ජඤ්ජනතඃ, ජඞ්ඥති ජඤ්ජන ති යන සතර සිඬ කරණු. පුනඃපුනර් දීව්‍යති යඞ් ලුක් දිවධාතු, යඞ්හට ලොප් වේ, දෙදිවධාතු වේ, තිප් කළ කල්හි, දෙදිවීති, (734) නිෂෙධ බැවින් ගුණ නොවේ. ඊම්හට විකල්ප පක්‍ෂයෙහි (814) වකාරයහට ඌට්, ඌකාරයහට ගුණ වේ, දෙද්‍යොති. ඌට්හට විකල්ප පක්‍ෂයෙහි (642) වකාරලොපය වේ, නැවත ගුණවේ, දෙදෙති. තස් වස් යන මේ දෙතන්හි විකල්පයෙන් ඌට්, පක්‍ෂයෙක්හි වකාරලොපයද වේ, දෙද්‍යූතඃ දෙදිතඃ, දෙද්‍යූවඃ දෙදිවඃ පුනඃපුනර්විච්ඡායති යඞ් ලුකි යන වාක්‍යයෙහි විච්ඡ ධාතු, යඞ්හට ලොප් වේ, වෙවිච්ඡධාතු, තිප්, වෙවිච්ඡීති. ඊම්හට විකල්ප පක්‍ෂයෙහි (814) ඡකාරයහට ශකාරද, ගුණද වෙත්, (154) ෂඞ්, වෙවෙෂ්ටි. වස්විභක්‍ති වේ, විකල්පයෙන් ඡකාරයහට ශකාර වේ, වෙවිශ්වඃ. ශකාර නුවූ පක්‍ෂයෙහි වෙවිච්ඡ්වඃ යනු වේ.

(මු-) 837. **හාකඃ ඛෙර් නා ඝීඃ.** (හාකඃ 6. ඛෙඃ 6. න 1. ඝීඃ 1.) ජහෙති ජහාති.

(ස-) යඞ්ප්‍රත්‍යයහට ලොප් කළ කල්හි-භාකඃ, භාකධගේ; බෙඃ, බ්සංඥයහට: න ඝඃ, දීඝ නොවේ.

(823) ඝො'නිතඃ යන්නෙන් ලත් දීඝයාගේ නිෂෙධය මෙයින් වේ. පුනඃපුනර්ජහාති යඞ් ලුකි හාධාතු, යඞහට ලොප් වේ, තිප්, ධාතුහට ද්වි වේ, බ්හට හ්‍රස්වද හකාරයහට ජකාරද වෙත්, මෙයින් (823) දීඝනිෂෙධයද, ඊම්ද වෙත්, ආකාරය හා සමග ඊකාරයහට ගුණවේ, ජහෙති. ඊම්නිෂෙධපක්‍ෂයෙහි ජහාති යනු වේ.

(මූ-) **838. දන්ශො න-ලොපො වා.** (දන්ශඃ 6. න-ලොපඃ 1. වා 1.)

දන්දශීති දන්දංශීති, දන්දෂ්ටි දන්දංෂ්ටි.

(ස-) යඞ්ප්‍රත්‍යයහට ලොප් කළ කල්හි, දන්ශඃ, දන්ශධාතුහුගේ; න-ලොපඃ, නකාරලොපය; වා, විකල්පයෙන් වන්නේය.

පුනඃපුනර්දශති යඞ් ලුකි දන්ශධාතු, යඞහට ලොප් වේ, මෙයින් නකාරයහට ලොප් වේ, දශධාතුහට ද්විත්වද, (827) බ්හට නුක්ද, ඊම්ද වෙත්, දන්දශීති. නකාරලොප විකල්ප පක්‍ෂයෙහි දන්දංශීති. ඊම්රහිත පක්‍ෂයෙහිද විකල්පයෙන් නකාරලොපය වේ, දන්දෂ්ටි, නකාරලොපවිකල්ප අනිම් පක්‍ෂයෙහි, දන්දංෂ්ටි යනු වේ, මෙහි ඊම්රහිත පක්‍ෂයෙහි (154) ෂඞ්, (47) තකාරයහට ටකාර වේ.

(මූ-) **839. ජිර් න වා.** (ජිඃ 1. න 1. වා 1.)

සාස්වපීති සොෂුපීති සාස්වප්ති සොෂොප්ති.

(ස-) යඞ්ප්‍රත්‍යයහට ලොප් කළ කල්හි, වා, විකල්පයෙන්; ජිඃ න, යඞ් නිමිත්තකොට ඇති ජ්‍යදෙශය නොවන්නේය. එහෙයින් (831) ව්‍යෙස්වපස්‍ය මො ජිඃ යන මොහුගේම නිෂෙධය වේ. ජිඃා යනු කළ කල්හි ජ්‍යදෙශයාගේම විකල්පය ලැබේ. වස්තුවශයෙන් වනාහි (661) ග්‍රහාදි ධාතුන්ගේ ස්ථානයෙහි ජ්‍යදෙශය නිත්‍යමය.

පුනඃ පුනඃ ස්වපිති යඞ් ලුකි ස්වපධාතු, යඞහට ලොප් වේ, ස්වපධාතුහු කෙරෙන් තිප්, ද්වි වේ, බ්සංඥභාගයද සංයොගාන්ත වකාරයද ලොප් වෙත්, (823) බ්හට දීඝද, ඊම්ද වෙත්, (831) ව්‍යෙස්වප යනාදියෙන් පැමිණි ජ්‍යදෙශය මේ සූත්‍රයෙන් විකල්පයෙන් නිෂෙධ වේ, සාස්වපීති. ජ්‍යදෙශ පක්‍ෂයෙහි

සොෂුපීති, මෙහි පලමුකොට ජි, පසුව ම්හ්වද, (734) ගුණනිෂෙධයද වෙත්, ඒම්විකල්පවූ ජ්‍යදෙශනිෂෙධ පක්‍ෂයෙහි සාෂ්‍වප්ති. එම ජ්‍යදෙශ පක්‍ෂයෙහි සොෂොප්ති, දෙතැන්හි (111) වෘධාතු-වාවෘති වෙවයිති, වාවෘති වෙවෙති, යනුද, සෘම ධාතු, සංසෘමීති සෙසිමීති, සංසෘනති සෙසෙනති, යනුද මෙසේමැයි.

(මු-) 840. රීගෙනා රින්රගෙනෟ වා. (රීනඃ 6. රින්-රගෙනෟ 1 .. වා 1.)

රීනඃ සථානෙ රින්රගෙනෟ වා සතඃ යඞ් ලුකි. චරිකරීති චකීරීති චරීකරීති චරිකර්ති චකර්ති චරීකර්ති.

(ස-) යඞ් ලුකි, යඞ්හට ලොප්කල කල්හි; රීනඃ සථානෙ, රීන්ආගමයාගේ සථානයෙහි; වා, විකල්පයෙන්; රින් රගෙනෟ සතඃ, රින්ආගමද-රන්ආගමද යන දෙක වෙත්.

සූත්‍රය බැවින් ණතවය නොවේ, මෙහි වාශබ්දග්‍රහණය පර සූත්‍රයෙහි නිවෘත්තිය පිණිසයි. රීනඃසථානෙ යනු රීන්ආගමයාගේඋත්පත්තිසථානයෙහි යනඅර්ථයි, අන්පරිද්දෙකින් වීනම් නකාරය ඉත්බැවින් රීන්ආගමයාගේ අන්තයෙහි රින්-රන් දෙදෙනාගේ යෙදීම වන්නේය. රන්ආගමයාගේ අකාරය උච්චාරණය පිණිසයි. පුනඃ පුනඃ කරොති යඞ් ලුකි කෘධාතු, යඞ් ලොප්කල කල්හි තිප්, කෘධාතුහට ද්විත්වාදිය වේ, රීසථාන සම්බන්ධිවූ (830) රීන් කටයුතුවූ සථානයෙහි මෙයින් රින්ආගමයද, ඒම්ද, මූලයහට ගුණද වෙත්, චරිකරීති. රන්ආගම පක්‍ෂයෙහි, චකීරීති, රීන් පක්‍ෂයෙහි, චරීකරීති. ඊම්විකල්ප පක්‍ෂයෙහි, රින්-රන්-රීන් යන තුන්තන්හිම-චරිකර්ති, චකර්ති, චරීකර්ති යන පදත්‍රය වේ.

එසේම වෘතධාතු, වරිවෘතීති වර්වෘතීති වරීවෘතීති වරිවර්ති වර්වර්ති වරීවර්ති යනාදිය වේ. ඍධාතුහු කෙරෙන් වනාහි අරියරීති අරරීති අරියර්ති අරර්ති, මෙහි (585) අසමානවර්ණයා පර කල්හි ඞ්හට ඉය වේ. [පාණිනිඃ 7. 4. 91, 92.]

(මු-) 841. යඞ්ලුක් ක්‍යලොපෙ'රෙ න ණුවී. (යඞ්ලුක්-ක්‍යලොපෙ 7. අරෙ 7. න 1. ණු-වී 1 ..)

බෙභිදිතා මර්මෘජිතා, අරෙ කිං බෙභෙර්ති මර්මාර්ෂ්ටි.*

ඉති යඞන්තපාදඃ.

---

* යඞ් ලුක් ච ක්‍යලොපශ්ච තත්‍රාස්මින්.

(ස-) අරෙ, රසංඥ රහිත ප්‍රත්‍යයන් පර කල්හි; යඩ්ලුක් ක්‍යලොපෙ, යඩ්ලොපය ක්‍යලොපයද යන මේ කළ කල්හි; ඤු වීරී, ගුණ වෘඩි දෙක; න, නොවෙත්.

පුනඃපුනරත්ශයෙන වා භෙන්නා භිදධාතු, යඩ්හට ලොප් වේ, බෙභිදධාතුහු කෙරෙන් ක්-තා, (554) ඉම්ද, මෙයින් ගුණ නිෂෙධද වෙත්. බෙභිදිතා. පුනඃපුනම්ාර්ජිතා මෘජධාතු, යඩ්හට ලොප්ද, විඩාදියද වෙත්, පූර්වසූත්‍රයෙන් ඊන් ස්ථාන යෙහි රන්, මර්මෘජධාතු, ක්-තා, ඉම්, (694) මෘජේ‍ය කඩිති යනාදියෙන් පැමිණියාවූ වෘඩි ඇති කල්හි මෙයින් නිෂෙධය වේ. මර්මෘජිතා. අරෙ කිං, අරෙ යනු කුමටය? බෙභෙත්ති මර්මාර්ෂ්ටි යන මෙහි රසංඥහිනන ප්‍රත්‍යයන් පර කල්හි ගුණ වෘඩි වන බැවිනි. ක්‍යලොපය කළ කල්හි (845) සමිධිතා යනාදිය වේ. ජේ‍යමරයෝ වනාහි ලොප්කරණලද යඩ් ඇති අනනයා කෙරෙන් ක්ප්‍රත්‍යය කළ කල්හි විකල්පයෙන් වෘඩිය කෙරෙත්. බොභාවයති බොභවයති යනාදිය වේ.

යඩන්තපාදය නිමි.

ලිඞුඃ.

(මූ-) 842. ලෙඃ කාම්‍යන් සෙවච්ඡායාං. (ලෙඃ 5. කාම්‍යන් 1. සෙවච්ඡායාං 7.)

ලෙඃ පරඃ කාම්‍යක් ස්‍යාත් ආත්මෙච්ඡායාං. ආත්මනඃ පුත්‍රමිච්ඡති පුත්‍රකාම්‍යති.

(ස-) ආත්මෙච්ඡායාං, තමාගේ ඉච්ඡාව ඇති කල්හි; ලෙඃ පරඃ, ලිඞ්ගයා කෙරෙන් පරව; කාම්‍යක් ස්‍යාත්, කාම්‍යක් ප්‍රත්‍යය වන්නේය.

තමා පිළිබඳවූ ඉච්ඡාවගේ කර්මවූ යම් ලිඞ්ගයෙක් සමාසනුවූ විශෙෂණපදයක් කෙරෙන් හෝ නොහොත් තමා කෙරෙන් තොරවූ සම්බන්ධ පදයක් කෙරෙන් හෝ පරවූයේ ඉදින් නොවන්නේද එකල්හි ඒ විතීයාන්ත ලිඞ්ගයා කෙරෙන් කාම්‍යක්ප්‍රත්‍යය වන්නේය යන අර්ථයි. එහෙයින්, මහාන්තං පුත්‍රමිච්ඡති රාඥඃ පුත්‍රමිච්ඡති යනාදි තන්හි, කාම්‍යප්‍රත්‍යය නොවන්නේය; සමාසයෙහිවනාහි, මහාපුත්‍රමිච්ඡති රාජපුත්‍රමිච්ඡති යනාදියෙහි ප්‍රත්‍යය වන්නේය යනු දතයුතු. කාම්‍යක්ප්‍රත්‍ය

යාගේ කකාරය ඉත්සංඥ බැවින්, ආත්මනො මුක්තිමිච්ඡති මුක්තිකාම්‍යති යනාදි තන්හි ගුණ නොවේ. ආත්මනඃ පුත්‍රමිච්ඡති යන වාක්‍යවින්‍යාශය හෙතුකොටගෙන විතීයාන්තවූ ලිඞ්ගයා කෙරෙන් යනු අවබොධ කටයුතු. එහෙසින් ආත්මනඃ පුත්‍ර ඉෂ්‍යතෙ යන මෙහි ප්‍රත්‍යය නොවන්නේය. ආත්මනඃ පුත්‍රමිච්ඡති යන වාක්‍යයෙහි, පුත්‍රං යන විතීයාන්තයා කෙරෙන් මෙයින්, කාම්‍යක්ප්‍රත්‍යය වේ, (319) කෘතර් ලුක්ත්‍යෙ ච යන්නෙන් ප්‍රත්‍යය පර කල්හි විභක්තිහට ලොප්වේ, පුත්‍රකාම්‍යයන්නහට (631) ධාතුසංඥ වෙයි, තිප්, ශප්, (543) අකාරලොපයද වේ, පුත්‍රකාම්‍යති යනු වේ. [පාණිනිඃ 3. 1. 9.]

(මු) 843. **ක්‍යො'ම්ව්‍යාද් යශ්ච**. (ක්‍යඃ 1. අම්ව්‍යාත් 5. ඊඃ 1. අඃ 1. ච 1.)

මාන්ත-ව්‍ය-වර්ජාත් ලෙඃ ක්‍යඃ ස්‍යාත් ස්වෙච්ඡායාං, තස්මින්න වර්ණ ඊ ස්‍යාත්.*

(ස-) ස්වෙච්ඡායාං, ආත්මෙච්ඡායෙහි; මාන්ත-ව්‍යවර්ජාත්, මකාරාන්ත ලිඞ්ගය අව්‍යය යන දෙක වර්ජිතවූ; ලෙඃ, අන්‍ය ලිඞ්ගයා කෙරෙන්; ක්‍යඃ ස්‍යාත්, ක්‍යප්‍රත්‍යය වන්නේය; තස්මින්, ඒ ක්‍යප්‍රත්‍යයා පර කල්හි; අවර්ණඃ, ශබ්දාන්තයෙහි වූ අවර්ණයතෙම; ඊ ස්‍යාත්, ඊකාර වන්නේය.

මෙහි චකාරය කරණකොටගෙන කාම්‍යක්ප්‍රත්‍යයද වන්නේයයි ප්‍රකාශිතයි, එහෙසින් සියලු ලිඟුහු කෙරෙන් ක්‍යප්‍රත්‍යයද කාම්‍යක්ප්‍රත්‍යයද වන්නේය, මකාරාන්තය අව්‍යයශබ්දය යන මේ ශබ්දයන් කෙරෙන් එකම කාම්‍යක්ප්‍රත්‍යයම වන්නේය යනු නිශ්චයයි. ක්‍යප්‍රත්‍යයාගේ කකාරය ඉත්සංඥ වෙයි,. ගුණ නොවීම පිණිසයි, යකාරය සිටියි. [පාණිනිඃ 3. 1. 8. 7. 4. 33.]

(මු-) ඥානීයති. (423) ඔදෞතො'ජ්වදිති. ගව්‍යති නාව්‍යති. (497) යඞ්ඝඃක්‍යෙ ඉති. කර්ත්‍රීයති. (259) ක්‍යඞ්‍යච්වෞ ච. ගාර්ගීයති.

(ස-) ආත්මනො ඥානමිච්ඡති යන වාක්‍යයෙහි ඥානං යන්නහු කෙරෙන් මෙයින් ක්‍යප්‍රත්‍යය වේ, ක්‍ය පරකල්හි අකාරයහට එයින්ම ඊකාර වේ, ඥානීයධාතු, තිප්‍රත්‍යයාදිය වේ,

---

* මව ව්‍යක්ෂ්ව ම්ව්‍යං, නාස්ති ම්ව්‍යං යත්‍ර සො'ම්ව්‍යස්තස්මාත්.

ඤාණීයති. පුත්තීයති යනාදියද මෙසේමැයි. ඤාණකාම්‍යති යන්නද පූර්වසූත්‍රයෙන් ප්‍රත්‍යයව සිද්ධයි. අවර්ණයහට ඊකාරාදෙශය කීබැවින් කඤ්ඤමිච්ඡති කඤ්ඤීයති යන මෙහි ආකාරයහට ඊකාර වේ. පූර්වසූත්‍රයෙන් ප්‍රත්‍යයව කඤ්ඤාකාම්‍යති යන්න සිද්ධයි. ආත්මනො ගාමිච්ඡති යන වාක්‍යයෙහි මෙයින් ක්‍ය වේ ප්‍රත්‍යය පර නිමිත්තින් විභක්තිය ලොප් කළ කල්හි ගොශබ්දය වේ, ගොශබ්දයා කෙරෙන් පරවූ යප්‍රත්‍යය (423) ඔදෞතොජ්වත් යනාදියෙන් ස්වරවත් වේ, එහෙයින් අච්සංඥයා පර කල්හි ඔකාරයහට අව් වේ, ගව්‍යධාතුහු කෙරෙන් තිප් ආදිය වේ, ගව්‍යති, මෙහි ක්‍ය පරකල්හි දෘනාත්වය අයති නොවන බැවින් (36) අකාරාන්ත අවයන්න නොවේ. ආත්මනොනාවමිච්ඡති නාව්‍යති යන මෙහිද ඖකාරයා කෙරෙන් පරවූ ක්‍යප්‍රත්‍යයාගේ යකාරයහට පළමු පරිද්දෙන් ස්වරවත් වේ, නාව්‍යති. ආත්මනඃ කර්තාරමිච්ඡති කර්තෘශබ්දය වේ, ක්‍ය, කර්තෘශබ්දයාගේ ඍකාරයහට (497) රීආදෙශ වේ, කර්ත්‍රීයති. ආත්මනො ගාර්ග්‍යමිච්ඡති ක්‍ය පරකල්හි (259) ෂණ්‍ය ප්‍රත්‍යයාගේ යකාරලොපය වේ, මෙයින්ම අකාරයහට ඊකාරද වේ, ගාර්ගීයති.

(මූ-) 844. **න ලොපඃ ක්‍යඞ්‍යොඃ**. (න-ලොපඃ 1. ක්‍ය-ඞ්‍යො 7.) රාජීයති.

(ස-) ක්‍යඞ්‍යොඃ, ක්‍යප්‍රත්‍යය-ඞ්‍යප්‍රත්‍යය යන මොවුන් පර කල්හි; න ලොපඃ, නකාරාන්ත ලිඞ්ගයාගේ නකාරයහට ලොප් වන්නේය.

(118) නොලුප් ඓ ධෞ යන මෙයින් විරාමයා පර කල්හි නකාරයහට ලොප් කළ කල්හි (15) තදුදිවිධිර් න ස්‍යාත් යනු කීබැවින් මෙයින් ලොපවිධානයයි. එසේද ක්‍යඞ්‍ය දෙක ඇති කල්හි විරාම පරකල්හි කරණලද කිසිත් කාර්‍ය්‍යයෙක් නො වන්නේය යනුද ගැළපියයුතු වෙයි. එහෙයින් විවාංසමිච්ඡති විවස්‍යති යන මෙහි (183) දඞ් නොවේ. ලිහමිච්ඡති ලිහ්‍යති යන මෙහි (175) හකාරයහට ඪකාර නොවේ. දුහමිච්ඡති දුහ්‍යති මෙහි හකාරයහට (176) ඝකාර නොවේ. වාචමිච්ඡති වාච්‍යති මෙහි (211) කුඞ් නොවේ. පුමාංසමිච්ඡති පුංස්‍යති මෙහි (193) ස්‍යන්තලොපය නොවේ. නමඃකරොති නමස්‍යති මෙහි (102) විසර්ගය නොවේ. සර්පිරිච්ඡති ධනුරිච්ඡති සර්

පිෂ්‍යති ධනුෂ්‍යති යනාදියෙහි (227) රඞ නොවේ. ගිරම්ච්ඡති ගීර්‍යති ධුරම්ච්ඡති ධූර්‍යති යනාදියෙහි ඊ නාමි විරාම්පරත්ව සක් නැතිබැවින් (228) ඉක්හට දීර්ඝ වේ. රාජානම්ච්ඡති යන වාක්‍යයෙහි පූර්වසූත්‍රයෙන් ක්‍යප්‍රත්‍යයද, මෙයින් අනන්තනකාර ලොපයද, අකාරයහට ඊකාරද වෙත්, රාජීයති.

(මු-) 845. **හසාත්තයොර්වා රෙ.** (හසාත් 5. තයොඃ 6.. වා 1. අරෙ 7.)

හසාත් පරයොඃ ක්‍යඩ්‍යයොර්ලොපඃ ස්‍යාද්වා අරෙ. සමිධිතා සමිධයිතා. අම්ව්‍යත් කිං, කිං කාම්‍යති ස්වඃ කාම්‍යති.

(ස-) අරෙ, රසංඥ රහිත ප්‍රත්‍යයත් පර කල්හි; හසාත් පරයොඃ, හස්සංඥයා කෙරෙන් පරවූ; ක්‍යඩ්‍යයොඃ, ක්‍ය ඩ්‍ය දෙදෙනාහට; වා, විකල්පයෙන්; ලොපඃ ස්‍යාත්, ලොප් වන්නේය.

විභක්තිවිපරිණාමයෙන් ක්‍ය ඩ්‍ය දෙදෙනාගේ අනුවෘත්තියයි. සමිධ මෙෂ්ටා යන වාක්‍යයෙහි ක්‍ය, සමිධ්‍යධාතු, ඊ-තා, (554) ඉම්, මෙයින් විකල්පයෙන් ක්‍යලොපය වේ, සමිධිතා. ක්‍ය ලොප විකල්ප පක්ෂයෙහි සමිධයිතා. දෘෂදමෙෂ්ටා දෘෂදිතා යනුද මෙසේමැයි. හසාත් යනු කුමටය? ඥනීයිතා යන තන්හි ව්‍යඤ්ජනයා කෙරෙන් පරනොවන බැවින් යකාර ලොපය නොවන බව ඇඟවීම පිණිසයි. අරෙ යනු කුමටය? සමිධ්‍යති යන මෙහි ර පරකල්හි යකාරලොපය නොවීම ඇඟවීම පිණිසයි.

අම්ව්‍යත් කිං, අම්ව්‍යත් යනු කුමටය? කිම් කාම්‍යති ස්වඃ කාම්‍යති යනාදියෙහි මකාරාන්තයා කෙරෙන්ද අව්‍යයශබ්දයා කෙරෙන්ද කාම්‍යක්ප්‍රත්‍යය වන බව ඇඟවීම පිණිසයි. අම්ව්‍යත් කිං යනාදිය (843) කොත‘ම්ව්‍යත් යන මෝහට ප්‍රත්‍යුදාහරණයි, කිම්ච්ඡති ස්වරිච්ඡති කියා කිංකාම්‍යති යනාදියෙහි වාක්‍යයි, දෙතන්හි කාම්‍යක්ප්‍රත්‍යය වේ, ස්වඃ කාම්‍යති යනාදියද මෙසේමැයි. [පාණිනිඃ 6. 4. 50.]

(මු-) 846. **ධනොදකාශනවෘෂාශ්වලෙර්ග්‍රහසානානනජාහාමෙෂි ඕ ධනඩ් ධාසන්සනසනෙඞ ක්‍යෙ න ෂඃ.** (ධන—ලෙඃ 6. ග්‍රහ—අමෙෂි 7. ඕ 1. ධනඩ් 1. ඕ 1. සන් 1. සන‘සනෙඞ 1.. ක්‍යෙ 7. න 1. ෂඃ 1.)

ධනස්‍ය ග්‍රහණෙ ඩා උදකස්‍ය පානෙ ඩනඞ් අශනස්‍ය අන්තෙ ඩා වෘෂාශ්වයොර්ජාහෙ සන් ලෙරෙපි කාමෙ‍්‍ය සන් අසන් ච ස්‍යාත් ක්‍යෙ සඃ ෂො න ස්‍යාත්.*

(ස-) ක්‍යෙ, ක්‍යප්‍රත්‍යයා පරකල්හි; ධනස්‍ය ග්‍රහණෙ ඩා, ධනයාගේ ග්‍රහණය කැමති කල්හි ධනශබ්දයහට-ඩාදෙශද ; උදකස්‍යපානෙ ඩනඞ්, ජලයාගේ පානය කැමත්කල්හි උදක ශබ්දයහට ඩනඩාදෙශයද; අශනස්‍ය අනනෙ ඩා, අනනයාගේ භක්‍ෂණය කැමති කල්හි අශනශබ්දයහට-ඩාදෙශයද; වෘෂා ශ්වයොර්ජාහෙ, මෛථුනය කැමති කල්හි වෘෂශබ්ද අශ්වශබ්ද දෙදෙනාහට; සන්, සන්ආගමයද; ලෙරෙපි කාමෙ‍්‍ය, ඉච්ඡාවී සෙහි මෙයින් අන්‍යවූ ලිඞ්ගයහට ; සන් අසන් ච, සන්ආග මය-අසන්ආගමයද; ස්‍යාත්, වන්නේය; සඃ, සකාරයතෙම; ෂඃ න ස්‍යාත්, මූර්ධන්‍ය ෂකාර නොවන්නේය.

ඩායන්නෙහි ඩකාරය ඉත්සංඥයි. අනනස්ථානයෙහි අ වේ, ඩනඞ් යන්නෙහි ඩ ඞ දෙක ඉත්සංඥයි, අන කියා සිටියි, සන් යන මෙහි නකාරය ඉත්සංඥයි, ක්‍යෙ පරෙ යනු සියලු තන්හි අවබොධ කටයුතු. ක්‍යෙ පරෙ යනු කියන බැවින් ඉච්ඡාව ලද කල්හි වෙයි, නැවත වෘත්තියෙහි, කාමෙ‍්‍ය යනු කියන බැවින් අතිතෘෂ්ණායාං යන අර්ථය දතයුතු වෙයි. සඃ ෂො න ස්‍යාත් යන මේතෙම සන්ආගමය හටමය, එහෙයින් ධනුෂ්‍යති සර්පිෂ්‍යති යනාදියෙහි ෂත්වය වන්නේමය. සියලු තන්හිම කර්මකාරකයා කෙරෙන්ම වන්නේය. [පාණිනිඃ 7. 4. 34, 7. 1. 51.]

(මූ-) ධනායති උදන්‍යති අශනායති වෘෂස්‍යති අශ්වස්‍යති, දධිස්‍යති දධ්‍යස්‍යති. ග්‍රහාදෞ කිං ධනීයති.

(ස-) ධනං ග්‍රහීතුමිච්ඡති යන වාක්‍යයෙහි ධනං, (843) ක්‍ය වේ, මෙයින් ධනශබ්දයාගේ අන්තයහට ඩා වේ, ධනායධාතු, තිප්, ශප්, ධනායති. ධනශබ්දයාගේ අර්සඬකාවනය ප්‍රාචී නයන්ගේ මතයි, එහෙයින් විස්ත්‍රං ධනායති යනාදි ප්‍රයොග

---

* වෘෂශ්ච අශ්වශ්ච වෘෂාශ්වං, ධනඤ්ච උදකඤ්ච අශන ඤ්ච වෘෂාශ්වඤ්ච ලිඞ්ගශ්චෙති ත්‍යාස්‍ය. ග්‍රහශ්ච පානනඤ්ච අනනඤ්ච (භක්‍ෂණං) යානශ්ච අර්ථශ්ච තත්‍රාසමින්. සන් ච අසන් ච සනසනෞ.

වෙයි. උදකං පාතුමිච්ඡති–ක්‍ය, මෙයින් උදකශබ්දයාගේ අකාරයහට ධනඞ්, අන් පර කල්හි උදක්යන් නහුගේ අක් භාගයහට (126) ලොප් වේ, උදන්‍යධාතු, තිප් ආදිය වේ, උදන්‍යති. අශනං (අනනාදි) භොක්තුමිච්ඡති ක්‍ය, මෙයින් අන්‍යාස්වරයහට ධා වේ, අශනායති. මෙහිද අර්ථසඞ්කොච යෙහි අශනායති, පායසම් කියාද ප්‍රයොග වේ. මෙහි වෘෂ යනු ශුක්‍රබහුල පුරුෂයි, වෘෂං අශ්වං වා ජබ්ධුං (සඞ්ගමයිතුං) ඉච්ඡති ක්‍ය, මෙයින් ස්වරයා කෙරෙන් සන් වේ, වෘෂස්‍යති අශ්වස්‍යති. මෙහිද අර්ථසඞ්කොචයෙන් පුරුෂං වෘෂස්‍යති කියාම ප්‍රයොග වේ. දධීච්ඡති, සන්, දධිස්‍යති. අසන්, දධ්‍යස්‍යති. දෙතන්හි ෂත්වය නොවේ. මෙහි ලිඞ්ගස්‍ය අපේකාමෙ‍ය යනු කීබැවින් අර්ථසඞ්කොචය නැත්තේමය, එහෙයින් දධ්‍යස්‍යති තක්‍රං යනු නොවන්නේය. ක්‍ෂීරස්‍යති ලවණස්‍යති යනාදියද මෙසේමැයි. ආදියෙහිද ධිශබ්දඋදාහරණය කරණකොටගෙන අකාරාන්තනුවූ ලිඞ්ගයහටයයි කිසිතන්හි වේ. අතිතෘෂ්ණායාං යනු කුමටය ? දධීයති යනාදියෙහි සන් අසන්ප්‍රත්‍යය නොවීම පිණිසයි. ග්‍රහාදෞ කිං, ග්‍රහාදිපානාශනාදිය කුමටය ? ධනීයති යනාදියෙහි කෙවලඉච්ඡාර්ථයෙහි ධා ආදිය නොවීම ඇඟවීම පිණිසයි. ධනමිච්ඡති ධනීයති. උදකීයති අශනීයති වෘෂීයති අශ්වීයති යනුද මෙසේමැයි.

(මු-) 847. **ඩ්ඩොපමානාදාචාරෙ ක්‍යඃ.** (ඩ්-ඩොපමානාත් 5. ආචාරෙ 7. ක්‍යඃ 1.)

ඩාත් ධාවෙචාපමානාත් ක්‍යඃ ස්‍යාදාචාරෙ'ර්ථෙ.

ශිවමිවාචරති ශිවීයති විෂ්ණුං, විෂ්ණාවිවාචරති විෂ්ණූයති ශිවෙ.*

(ස-) ආචාරෙ'ර්ථෙ, ආචාරාර්ථයෙහි ; උපමානාත්, උපමාන වාචකවූ ; ඩාත්, කර්මකාරකයා කෙරෙන්ද; ධාවච, අධිකරණ කාරකයා කෙරෙන්ද ; ක්‍යඃ ස්‍යාත්, ක්‍යප්‍රත්‍යය වන්නේය.

විෂ්ණුං ශිවමිව ආචරති, මෙයින් ක්‍ය, (843) අකාරයහට ඊකාර වේ, ශිවීයති. ශිවෙවිෂ්ණෞ විවාචරති, මෙයින් ක්‍ය, (590) දීඝී වේ, විෂ්ණූයති. කාම්‍යගාදි ප්‍රත්‍යයන්ගේ ස්ථාන

---

* ඩශ්ච ධශ්ච ඩධං, ඩධශ්ච තදුපමානශ්චෙති ඩධොපමානං තස්මාත්.

යෙහි කකාර ඉත්කළ බැවින් ධාතුවිහිත කාය්‍ය නාමධාතු යෙහිද වන්නේයයි අවබොධ කටයුතු. ක්‍ය පර කල්හි අධිකරණ උපමානයාගේ නකාරලොපය නොවන්නේයයි වක්තව්‍යයි, එහෙයින් රාජනි ඉවාචරති රාජන්‍යති ගුරෞ යනු වේ. රාජානමිවාචරති යන මෙහි රාජීයති කියාම වේ. ක්‍ෂීරොදීයන්ති යනාදි පදය ආත්මානං ක්‍ෂීරොදමිවාචරන්ති යනාදි වාක්‍ය යෙහි කර්‍මොපමානයා කෙරෙන් ක්‍ය පරකල්හි සිඬකටයුතු. [පාණිනිඃ 3. 1. 10.]

(මු-) 848. **ඞාත් ඩ්‍යක්වි සලොපශ්ච වා ගල්භ-ක්ලීව-හොඩාත් තු මං.** (ඞාත් 5. ඩ්‍ය-ක්වි 1 .. ස-ලොපඃ 1. ච 1. වා 1. ගල්භ-ක්ලීව-හොඩාත් 5. තු 1. මං 1.)

ඞාදුපමානාදාචාරෙ'ර්ථෙ ඩ්‍ය-ක්වී ස්තඃ, සස්‍ය ච වා ලොපඃ, ගල්භාදෙස්තු ක්වාවපිමං.

කෘෂ්ණ ඉවාචරති කෘෂ්ණයතෙ කෘෂ්ණති, ස්වායතෙ ස්වති, ස්වාමාස (582) ත්‍යනන්තත්වාදාම්. පයායතෙ පයස්‍යතෙ. ගල්භායතෙ, ගල්භතෙ.

(ස-) උපමානාත්, උපමාන වාචකවූ; ඞාත්, කර්තෘහු කෙරෙන්; ආචාරෙ'ර්ථෙ, ආචාරාර්ථයෙහි; ඩ්‍ය ක්වී ස්තඃ, ඩ්‍යප්‍රත්‍යය ක්විප්‍රත්‍යය යන මොව්හු වෙත්; සස්‍ය ච, සකාරයහටද; වා ලොපඃ, විකල්පයෙන් ලොප් වේ; ක්වාවපි, ක්විප්‍රත්‍යයා පර කල්හිද; ගල්භාදෙස්තු, ගල්භ ආදිකොට ඇති ක්ලීව-හොඩ යන මොහු කෙරෙන් වනාහි; මං, ආත්මනෙපදය වේ.

ක්වචිදෙකදෙශස්‍ය යනු න්‍යාය හෙයින් උපමානාත් යනු අනුවර්ත්තනයකොට, සම්බද්ධස්‍යසම්බෙන න නිත්‍යකාඞ්ක්‍ෂෙණ සඞ්ගතිඃ යනු න්‍යාය හෙයින් ඞාත් යන මොහු හා සමග සම්බන්ධය වේ. ඩ්‍යප්‍රත්‍යය කළ කල්හි ඩිත්ත්ව බැවින් ආත්මනෙපදය වේ, ක්විප්‍රත්‍යය කළ කල්හිද ගල්භාදීන් කෙරෙන් ආත්මනෙපදය කරණුලැබේ. කෘෂ්ණ ඉවාචරති මෙයින් ඩ්‍ය, (590) දීර්ඝ වේ, කෘෂ්ණායතෙ. හරීයතෙ යනුද විෂ්ණූයතෙ යනුද මෙසේමැයි. (497) පිත්‍රීයතෙ කියාද වේ. (423) ගව්‍යතෙ නාව්‍යතෙ යනුද සිඬකරණු. (259) ගාර්ගීයතෙ කියාද වේ. (844) රාජායතෙ දණ්ඩීයතෙ කියාද වෙත්. (327) විද්‍යුෂීවාචරති විවස්‍යතෙ, සතීවාචරති සත්‍යතෙ, සුන්දරීවාචරති සුන්දරායතෙ, ශුනීවාචරති ශ්වායතෙ කියාද වෙත්. කෘෂ්ණඃ යන

කාරකයා කෙරෙන් පරව මෙයින් ක්විප්‍රත්‍යය වේ, ඉත්සංඥ කකාරය ගුණනිෂෙධය පිණිසයි, ඉකාරය උච්චාරණය පිණිසයි. එහෙයින් වකාරමාත්‍ර ප්‍රත්‍යයහට (496) ලොප් වේ, කෘෂ්ණ යන්නහට (631) ධාතුසංඥයි, තිප්, ශප්, (543) අකාරලොපය වේ, කෘෂ්ණති. හරිරිවාචරති ක්වි, හරයති, විෂ්ණවති පිතරති යනාදියද මෙසේම සිද්ධයි. ස්ව ඉවාචරති මෙයින් ඩ්‍ය, ස්වායතෙ, මෙයින් ක්වි, ස්වති යනු වේ. ස්ව ඉවාචචාර, මෙයින් ක්වි, වකාරය ලොප්වේ, ස්වධාතුහු කෙරෙන් සී-ණප්, (582) ප්‍රත්‍යයාන්තබැවින් ආම්, අසධාතුප්‍රයොගයද, ව්ඩාදියද, දීර්ඝද වෙත්, ස්වාමාස. පය ඉවාචරති මෙයින් ඩ්‍ය, මෙයින්ම විකල්පයෙන් සකාරලොපයද වේ, පයායතෙ, සකාරලොප විකල්පපක්ෂයෙහි පයස්‍යතෙ. ඔජායතෙ අප්සරායතෙ දුර්මනායතෙ යන මොවුන් කෙරෙහි නිත්‍යයෙන් සකාරලොපය වක්තව්‍යයි. ගල්භ ඉවාචරති ඩ්‍ය, ක්විද වේ, දෙතන්හි ආත්මනෙපදයද වේ, ගල්භායතෙ ගල්භතෙ යනු වේ. එසේම ක්ලීවායතෙ ක්ලීවතෙ හොඩායතෙ හොඩතෙ ක්‍යාද වේ. ගල්භතෙමේ අහංකාරියි, ක්ලීව නම් නපුංසකයි. [පාණිනිඃ 3. 1. 11.]

(මු-) 849. **භෘශාදෙ ශ්ච්ව්‍යර්ථෙ වා ත-ස-ලොපශ්ච.**
(භෘශාදෙඃ 5. ච්ව්‍යර්ථෙ 7. වා 1. ත-ස-ලොපඃ 1. ච 1.)

භෘශාදෙ ශ්ච්ව්‍යර්ථෙ ඩ්‍ය-ක්වි වා ස්තඃ, තස්මින් ත-ස-ලොපශ්ච. භෘශායතෙ භෘශති භෘශීභවති. වෙතායතෙ ශශ්වායතෙ වෙහායතෙ.*

(ස-) භෘශාදෙඃ, භෘශාදි ශබ්දගණයා කෙරෙන්; ච්ව්‍යර්ථෙ, අභූතතද්භාවාර්ථයෙහි ; ඩ්‍ය ක්වි, ඩ්‍යප්‍රත්‍යය ක්විප්‍රත්‍යය යන දෙක; වා ස්තඃ, විකල්පයෙන් වන්නෝය ; තස්මින්, ඒ ඩ්‍ය ක්වි දෙක පරකල්හි; ත-ස ලොපශ්ච, තකාර සකාරයන්ගේ ලොපයද වේ.

වෘත්තියෙහි තස්මින් යනු ඩ්‍යප්‍රත්‍යයද ක්විප්‍රත්‍යයද පර කල්හි ත-ස ලොපය නිත්‍යය යන අර්ථයි. අභෘශා භෘශා භවති මෙයින් ඩ්‍ය, (590) දීර්ඝ වේ, භෘශාසධාතුහු කෙරෙන්

* භෘශ ආදිර්යස්‍ය ස තස්මාත්. ච්වෙර්ථඃ ශ්ච්ව්‍යර්ථඃ අභූත තද්භාවඃ තස්මින්. තශ්ච සශ්ච තෞ තයොඃ ලොපඃ ත-ස ලොපඃ.

තෙ, භෘශායතෙ. ක්වි, භෘශති. පක්‍ෂයෙහි (495) ච්විප්‍රත්‍යය වේ, භෘශීභවති. අචෙතශ්චෙතො භවති චෙතායතෙ යනු වේ, මෙහි ඩ්‍යප්‍රත්‍යයද සකාරලොපයද, (590) දීඝයද වෙත්, ක්විප්‍රත්‍යය වේ, චෙතති. පක්‍ෂයෙහි (498) සලොපය වේ. චෙතීභවති. අශශ්වත්ශශ්වද් භවති ඩ්‍ය-ක්වි දෙක වෙත්, ශශ්වායතෙ-ශශ්වති, මේ දෙතන්හි තකාරලොපය වේ, පක්‍ෂයෙහි ශශ්වද්භවති යනු වේ, එසේම අවෙහද් වෙහද් භවති වෙහායතෙ වෙහති වෙහද්භවති කියාද වෙත්, වෙහත් යනු ගැබ නසන දෙයයි. භෘශාදි ගණය මෙසේයි, භෘශ ශීඝ්‍ර චපල මෘහ දුඃඛ පණ්ඩිත ප්‍රතීප උත්සුක ශුචි වෙහත් ශශ්වත් උන්මනස් සුමනස් දුර්මනස් අභිමනස් ඔජස් තෙජස් වර්චස්, ඩාච් ප්‍රත්‍යයාන්ත ශබ්දද ලොහිත ධර්ම හරිත නීල-මන්ද්‍ර ඓන භද්‍ර මල්ලව වර්මන් නිද්‍රා කෘපා කරුණා යන තිසයි.

මෙහි නිද්‍රාදි ශබ්දය ධර්මවචන වූයේද ශබ්දශක්තිස්වභාවය හෙතුකොටගෙන ධර්මවචනමයි, එහෙයින් නිද්‍රායතෙ ජනඃ. නොනිදන්නෙක් නිදන්නෙක් වෙයි යන අර්ථයි. [පාණිනිඃ 3. 1. 12.]

(මු-) 850. ඩාජ් ලොහිතාදෙඃ ෂඤ්ච. (ඩාච්-ලොහිතාදෙඃ 5. පං 1. ච 1.)

ඩාජන්තාත් ලොහිතාදෙශ්ච ච්ව්‍යර්ථෙ ඩ්‍ය-ක්වී වා ස්තඃ ෂඤ්ච, පටපටායතෙ පටපටායති පටපටාති පටපටා ස්‍යාත්. ලොහිතායතෙ ලොහිතායති ලොහිතති ලොහිතී ස්‍යාත්, ධර්මායතෙ ධර්මායති ධර්මති ධර්මී ස්‍යාත්.

(ස-) ඩාජන්තාත්, ඩාච්ප්‍රත්‍යයාන්ත ශබ්දගණයා කෙරෙන්ද; ලොහිතාදෙශ්ච, ලොහිතාදි ශබ්දගණයා කෙරෙන්ද ; ච්ව්‍යර්ථෙ, අභූත තද්භාවාර්ථයෙහි; වා, විකල්පයෙන් ; ඩ්‍ය ක්වී ස්තඃ, ඩ්‍යප්‍රත්‍යය ක්විප්‍රත්‍යය දෙකවෙත්; ෂඤ්ච, පරස්මෛපදයදවේ.

(501) කෘ භූ අස යන මොවුන් පර කල්හි ඩාච්ප්‍රත්‍යයෙන් යුක්ත ශබ්ද ඉදින් සිඛවේද එසේද වුවත් මෙහි ඩාච්ප්‍රත්‍යයාන්ත ශබ්දයන් කෙරෙන්, ඩ්‍ය-ක්වි යන මේ ප්‍රත්‍යයන්ගේ විධාන සාමාර්ථ්‍යය හෙතුකොටගෙන, ඩ්‍යය-ක්විය යන ප්‍රත්‍යයවිෂයෙහිද, ඩාච් වන්නේය යනු කියයුතු. ෂඤ්ච යන මේ චකාරය කරණකොටගෙන, ඞිත්ත්වයෙන් ලද්දාවූ ආත්මනෙපදයද වන්නේය යනු ප්‍රකාශිතයි. අපටත් පටත් ස්‍යාත් යන වාක්‍ය

යෙහි ඩ්‍යවිෂයෙහි ඩාච්ප්‍රත්‍යයද විහිවයද (501) කළකල්හි පට පටා-යනුවේ, ඩාච්ප්‍රත්‍යයාන්තයා කෙරෙන් මෙසින් ඩ්‍යප්‍රත්‍යය වේ, ආත්මනෙපදයෙහි, පටපටායතෙ යනු වේ. පරස්මෛපද යෙහි-පටපටායති. මෙසින් ක්විප්‍රත්‍යය වේ, පටපටාති. විකල්ප පක්ෂයෙහි ච්විප්‍රත්‍යය වේ, පටපටා ස්‍යාත්. එසේම අලොහිතො ලොහිතො භවති යන වාක්‍යයෙහි-ලොහිතායතෙ ලොහිතායති ලොහිතාති ලොහිතී ස්‍යාත්, කියා වේ. අධර්මො ධර්මො භවති යන වාක්‍යයෙහි ධර්මායතෙ ධර්මායති ධර්මාති ධර්මී ස්‍යාත් කියාද වේ. ලොහිතාදි ගණයද භෘශාදි ගණන්තවූ ලොහිත ශබ්දාදියෙහි වූ දෙළසයි. [පාණිනි 3. 1. 13, 1. 3. 90.]

(මූ-) **851. ශබ්දසුඛකෂ්ටාදෙඃ කෘතිවෙදපාපෙ ඩ්‍යඃ.** (ශබ්දසුඛකෂ්ටාදෙඃ 5. කෘතිවෙදපාපෙ 7. ඩ්‍යඃ 1.)

ශබ්දාදෙඃ කෘතෞ සුඛාදෙරනුභවෙ කෂ්ටාදෙඃ පාපාර්ථෙ ප්‍රවෘත්තිරිත්‍යස්මින්නර්ථෙ ඩ්‍යඃ ස්‍යාත්.

ශබ්දං කරොති ශබ්දායතෙ, වෛරායතෙ. සුඛමනුභවති සුඛායතෙ, දුඃඛායතෙ. කෂ්ටං කර්ම කරොති කෂ්ටායතෙ.*

(ස-) ශබ්දාදෙඃ කෘතෞ, ශබ්ද යන මේ මුල්කොට පවත්න වුන් කෙරෙන් කිරීමෙහිද ; සුඛාදෙරනුභවෙ, සුඛශබ්දාදියෙන් අනුභවයෙහිද ; කෂ්ටාදෙඃ, කෂ්ටශබ්දාදියෙන් ; පාපාර්ථෙ, පාපජනක කර්මයෙහිද ; ප්‍රවෘත්තිරිත්‍යස්මින්නර්ථෙ, පැවැත්මය යන මේ අර්ථයෙහි ; ඩ්‍යඃ ස්‍යාත්, ඩ්‍යප්‍රත්‍යය වන්නේය.

වෙද යනු විදලඥනෙ යන මේ ධාතුහු කෙරෙන් ඝඤ් ප්‍රත්‍යය කළ කල්හි රූපයයි. ශබ්දං කරොති යන වාක්‍යයෙහි මෙසින් ඩ්‍යප්‍රත්‍යයද, (590) දීඝීද, ශබ්දායධාතුහු කෙරෙන් තෙද වෙත්, ශබ්දායතෙ. වෛරං කරොති වෛරායතෙ යනුද එසේමැයි. සුඛමනුභවති සුඛායතෙ. දුඃඛමනුභවති දුඃඛායතෙ. කෂ්ටං කර්ම කරොති කෂ්ටායතෙ යනුද එසේමැයි.

ශබ්දාදිය මෙසේ යි,

ශබ්ද වෛර ප්‍රතීපාභ්‍ර කණ්වනීහාර දුර්ද්දිනාඃ,
කලහඃ සුදිනං මෙඝඃ කොටා අටවා අටා තථා,
සීකා මොටා ච පොටා ච ප්ලුෂ්වා ශබ්දාදිරීරිතඃ.

---

* ශබ්දශ්ච සුඛඤ්ච කෂ්ටඤ්ච තාන් ආදිර් යස්‍ය තස්මාත්. කෘතිශ්ච වෙදශ්ච පාපඤ්ච තස්මින්.

සුඛාදියද මෙසේයි,

සුඛං දුඃඛඤ්ච තෘප්තඤ්ච කෘපණඃ කරුණස්තථා,
ප්‍රතීපාලීකසොඪාස්‍ර කෘච්ඡ්‍රාං ගාඪාඃ සුඛාදයඃ.

කණ්ඩ්වාදිය මෙසේයි,

කණ්ඩූඤ්ච මන්තු ගහනඤ්ච කක්ෂඃ,
කෘච්ඡ්‍රඤ්ච කණ්ඩ්වාදිෂු පඤ්චශබ්දාඃ.

[පාණිනිඃ 3. 1. 14, 17, 18.]

(මු-) 852. **වාෂ්පොෂ්මඵෙනධූමාදුද්වමනෙ.** (වාෂ්ප-ධූමාත් 5. උද්වමනෙ 7.)

වාෂ්පායතෙ උෂ්මායතෙ ඵෙනායතෙ ධූමායතෙ.

(ස-) වාෂ්පොෂ්ම ඵෙන ධූමාත්, වාෂ්පශබ්ද උෂ්මන්ශබ්ද ඵෙනශබ්ද ධූමශබ්ද යන මොවුන් කෙරෙන්; උද්වමනෙ, උඟුළු නිඃසාරණාර්ථයෙහි ඛ්‍යප්‍රත්‍යය වන්නේය.

වාෂ්පං උද්වමති මෙයින් ඛ්‍ය වේ, (590) දීඝීයි, වාෂ්පායතෙ යනු වේ. උෂ්ම උද්වමති උෂ්මායතෙ. ඵෙනමුද්වමති ඵෙනායතෙ. ධූමමුද්වමති ධූමායතෙ. [පාණිනිඃ 3. 1. 16.]

(මු-) 853. **රොමන්ථාච්චර්වණෙ.** (රොමන්ථාත් 5. චර්වණෙ 7.) රොමන්ථායතෙ ගෞඃ.

(ස-) රොමන්ථාත්, රොමන්ථශබ්දයා කෙරෙන් පරව; චර්වණෙ, චමාරා සපකොට විකීමය යන අර්ථයෙහි ඛ්‍යප්‍රත්‍යය වන්නේය. පූර්වසූත්‍රයෙන් උද්වමනයන්න අනුවර්තනයයි දතයුතු.

රොමන්ථාන් චර්වයති, මෙයින් ඛ්‍ය, (590) දීඝීවේ, රොමන්ථායතෙ. ගෞඃ. [පාණිනිඃ 3. 1. 15.]

(මු-) 854. **නමස්තපොවරිවඃ කණ්ඩ්වාදිභ්‍යඃ ක්‍යඃ කෘතෙ.** (නමස්—කණ්ඩ්වාදිභ්‍යඃ 5...ක්‍යඃ 1. කෘතෙ 7.)

නමස්කරෙති නමස්‍යති, තපස්‍යති වරිවස්‍යති, කණ්ඩූයති කණ්ඩූයතෙ, චිත්‍රීයතෙ, මහීයතෙ, ශ්‍රීණීයතෙ.*

(ස-) නමස්තපොවරිවඃ කණ්ඩ්වාදිභ්‍යඃ, නමශ්ශබ්ද තපශ් ශබ්ද වරිවශ්ශබ්ද කණ්ඩ්වාදි ගණයෙහි ශබ්ද යන මොවුන් කෙරෙන්; කෘතෙ, කරෙති යන අර්ථයෙහි; ක්‍යඃ, ක්‍යප්‍රත්‍යය වන්නේය.

---

* නමස් ච තපස් ච වරිවස් ච කණ්ඩ්වාදිශ්ච තෙභ්‍යඃ.

වරිවස්ශබ්දයෙන් සෙවය කියනුලැබේ. කණ්ඩ්වාදිගණය කෙරෙහි කණ්ඩූශබ්දයාගේ ඤකාරානුබන්ධය කරණකොට ගෙනද චිත්‍රි මහි හ්‍රිණී යන මේ ශබ්දයන්ගේ ඩකාරානුබන්ධය කරණකොටගෙනද ක්‍යප්‍රත්‍යය පරකල්හිද යෙදෙන පරිද් දෙන් උභයපදයද ආත්මනෙපදයද වෙත්. කණ්ඩ්වාදි ගණයමෙසේසි, කණ්ඩූඤ චිත්‍රිඩ මහිඩ හ්‍රිණීඩ අසු මසතු වල් ගු ලොට තිරස් උරස් උෂස් කුසුම මගධ මෙධා සුඛ දුඃඛ චරණ හරණ දූෂණ අධර චරම භිෂජ් ගද්ගද එලා මෙලා බෙලා උත්තම පස්පශ යනාදියයි. නමස්කරොති තපස්කරොති වරි වඃ කරොති කණ්ඩූං කරොති චිත්‍රි කරොති මහිං කරොති හ්‍රිණීං කරොති යනු වාක්‍යයි. මෙයින් ක්‍යප්‍රත්‍යයව සිධයි. [පාණි නිඃ 3. 1. 15, 19, 27.]

(මු-) 855. **ලෙඃ කෘත්‍යාඛ්‍යානෙ** ඤිඃ. (ලෙඃ 5. කෘති— ආඛ්‍යානෙ 7. ඤිඃ 1.)

ලෙඃ පරෙ ඤිඃ ස්‍යාත් කෘත්‍යා වාඛ්‍යානෙ ච. ප්‍රශ්නං කරොති ආචෂ්ටෙ වා ප්‍රශ්නයති, ඌඨයති ඖඩිඨත්. ඖජිඨදිත්‍යෙකෙ. (468) ලුඞ් මචිනාම්ති. ඊණ්මන්තමාචෂ්ටෙ ඊශයති. ස්‍රැග් වන්තමාචෂ්ටෙ ස්‍රැවයති. ස්‍රග්විනමාචෂ්ටෙ ස්‍රජයති.

(ස-) ලෙඃ පරඃ, ලිඞගයා කෙරෙන් පරව; කෘතෞ, කරොති යන අර්ථයෙහිද; ආඛ්‍යානෙ ච, කථනාර්ථයෙහිද; ඤිඃ ස්‍යාත්, ඤිප්‍රත්‍යය වන්නේය.

අනුවෘත්ත්යෙහිද කෘතෞ යන කීම ප්‍රකටකිරීම පිණිසයි. ලෙඃ යනු කියනබැවින් පදාන්තකාර්‍ය්‍යය නොවන්නේය, එහෙ යින් ඛවයති යනාදියෙහි (211) කුඞ් නොවේ. ඉත්සංඥඤකා රය උභයපදයපිණිසයි. ප්‍රශ්නං කරොති ආචෂ්ටෙවා ප්‍රශ්න, මෙයින් ඤි වේ, (467) ඩිත්ත්ව බැවින් (126) ටිහට ලොප්ද, ප්‍රශ්නි-යන්නහට (631) ධාතුසංඥද, (542) ගුණද වෙත්, ප්‍රශ් නයති. වහධාතුහු කෙරෙන් ක්ති, ඌඪි ක්‍රියා සිධවේ, ඌඪි මාචෂ්ට යන වාක්‍යයෙහි ඌඪිශබ්දයාකෙරෙන් ඤි, ඤිප්‍රත්‍යය ඩිත්ත්වබැවින් ටිසංඥාහට ලොප්කළකල්හි ඌඪිධාතුවේ, තිප්, ගුණ වේ, ඌඨයති. ඌඪිමාඛ්‍යාතවාන් ඌඪි, ට්-ද්, අම්ආගමද, (581) නැවත අම්ද, (613) අඞ්ප්‍රත්‍යයද, (719) ඌකාරවර්ජිතවූ ඪියන්නහට ද්විත්වද වෙත්, (641) ඤිහට ලොප්කළ කල්හි, ඖඩිඨත්. කිසි කෙනෙක් ඖජිඨත් යනු කියති, ඒ වාමනාදී

හුයි. ඊශධාතු, ක්විප්, ඊට්, නැවත ඊට් විද්‍යුතෙ අසෘ යන වාක්‍යයෙහි (441) මතුප්, (154) ෂඩ්, (155) ෂකාරයහට ඩකාරද, (64) ඩකාරයහට ටකාරද, (59) ටකාරයහට ණකාරද වෙත්, ඊණ්මනන මාචෂෙට, ඊණ්මන්, මෙයින් ණි, (468) මතුහට ලොප්, යා යසෘ ලිඞ්ගසෘ පූර්වාප්‍රකෘතිඃ සා තසෘ යන න්‍යාය බැවින් නැවත තාලව්‍ය ශකාරයාගේ සිටීයයි. ඊශි ධාතුයි, ගුණකළකල්හි ඊශයති. ස්‍රග්වනනමාචෂෙට ස්‍රග්වන්, මෙයින් ණි, වතුහට ලොප්කළකල්හි පූර්ව අවයවය වේ, ස්‍රැවි, ගුණ වේ, ස්‍රැවයති. ලුඞ් මද්වද්විනාං යන බහුවචන කරණ කොටගෙන අනට් කනවතු ඝඤ් අල් අනඞ් යුක්ත ඊප් යන මොවුන්ගේ ලොපය වක්තව්‍යයි. එහෙයින් ගමනමාචෂෙට ගමයති, කිියාද, ගතවනනමාචෂෙට ගමයති, කියාද, බන්ධනමාචෂෙට බන්ධයති-කියාද, වධමාචෂෙට ඝාතයති කියාද, බ්‍රහ්මාණීමාචෂෙට බ්‍රහ්මයති යනාදිය වේ. ස්‍රග්විනමාචෂෙට ස්‍රග්වින්, ණි, වින්හට ලොප් කළ කල්හි පූර්ව ජකාරය සිටියි, ස්‍රජ්, ගුණ වේ, ස්‍රජයති.

(මූ-) 856. **ශ්වෙතාශ්වාශ්වතරගාලොඩිතාහ්වරකාණා ශ්වතරෙතකලොපඃ.** (ශ්වෙතාශ්ව-ආහ්වරකසෘ 6. අශ්ව-කලොපඃ 1.)

ශ්වෙතාශ්වමාචෂෙට ශ්වෙතයති අශ්වයති, ගාලොඩයති, ආහ්වරයති.*

(ස-) ශ්වෙතාශ්වාශ්වතරගාලොඩිතාහ්වරකසෘ, ශ්වෙතාශ්වශබ්ද අශ්වතරශබ්ද ගාලොඩිතශබ්ද ආහ්වරකශබ්ද යන මොවුන්ගේ; අශ්වතරෙතක, අශ්ව-යන භාගය, තර-යන භාගය, ඉත-යන භාගය, ක-යන භාගය යන මොවුන්ට ක්‍රමයෙන්; ලොපඃ, ලොප් වන්නේය.

ශ්වෙතාශ්වමාචෂෙට ණි, අශ්වභාගයහට මෙයින් ලොප්, ණිමංශච-යනාදියෙන් ඩිත්, ටිලොපයයි, ශ්වෙති, තිප්ද ගුණද වෙත්, ශ්වෙතයති. අශ්වතර මාචෂෙට ණි, තරභාගය මෙයින් ලොප්, ඩිත් වේ, අශ්වයති. ගාලොඩිතමාචෂෙට. පූර්ව

---

* ශ්වෙතාශ්වශච අශ්වතරශච ගාලොඩිතශච ආහ්වරකශච තත් තසෘ. අශ්වශච තරශච ඉතශච කශච තෙෂාං ලොපඃ.

සූත්‍රයෙන් ණ්‍යි, මෙයින් ඉතභාගය ලොප් වේ, ගාලොඩිධාතුයි, ගාලොඩයති. ආහ්වරකමාචෂ්ටෙ ණ්‍යි, මෙයින් කකාරලොප යද, ඩිත්ද වෙත්, ආහ්වරයති. උන්මාදශීලෙ රොගාර්තෙ මූඪෙ ගාලොඩිතො මතඃ, යනු කියනලදී. ආහ්වරක යනු අස්පෂ්ට වාක්‍යයයි.

(මු-) **857. නාප් සත්‍යාර්ථවෙදෛකාජන්තඃ.** (නාප් 1. සත්‍යාර්ථවෙදෛකාජන්තඃ 6.)

සත්‍යාදෙ රෙකාචො'කාරාන්තස්‍ය ච ණෞ නාප් ස්‍යාත් න ඉත්. සත්‍යාපයති අර්ථාපයති වෙදාපයති ස්වාපයති. (470) වාඪාන්තිකෙති සාධාදයඃ, සාධයති. ප්‍රශස්‍යමාචෂ්ටෙ. ශ්‍රාපයති.*

(ස) සත්‍යාදෙඃ, සත්‍යශබ්දය ආදිවූ අර්ථශබ්දය වෙදශබ්දය යන මේ ශබ්දයන්ගේ ස්ථානයෙහිද; එකාචඃ, එකස්වරවූ; අකාරාන්තස්‍යච, අකාරාන්ත ශබ්දයහටද; ණෞ, ණ්‍යි පරකල්හි; නාප් ස්‍යාත්, නාප් වන්නේය; න ඉත්, නකාරය ඉත්සංඥයි.

සත්‍යමාචෂ්ටෙ යන වාක්‍යයෙහි (855) ණ්‍යි, මෙයින් නාප්ද, පරස්වරයහට දීර්ඝද, සත්‍යාපිධාතුහු කෙරෙන් තිප් ආදියද වෙත්, සත්‍යාපයති, සත්‍යය කියයි. අර්ථමාචෂ්ටෙ අර්ථාපයති. වෙදමාචෂ්ටෙ වෙදාපයති. ස්වමාචෂ්ටෙ ස්වාපයති. (470) වාඪාන්තික යනාදියෙන් වාඪාදීන්ගේ ස්ථානයෙහි සාධාද්‍යාදෙශ වෙත්, වාඪමාචෂ්ටෙ යන වාක්‍යයෙහි ණ්‍යිප්‍රත්‍යයව සාධයති, එසේම අන්තිකමාචෂ්ටෙ නෙදයති, ස්ථූලමාචෂ්ටෙ ස්ථවයති, දූරමාචෂ්ටෙ දවයති, යුවානමාචෂ්ටෙ යවයති, (474) කන් කළ කල්හි, කනයති, ක්ෂිප්‍රමාචෂ්ටෙ ක්ෂෙපයති, ක්ෂුද්‍රමාචෂ්ටෙ ක්ෂොදයති, ප්‍රියමාචෂ්ටෙ ප්‍රාපයති, ස්ථිරමාචෂ්ටෙ ස්ථාපයති, ස්ඵිරමාචෂ්ටෙ ස්ඵාවයති, උරුමාචෂ්ටෙ වරයති, ගුරුමාචෂ්ටෙ ගරයති, බහුලමාචෂ්ටෙ බංහයති, තෘප්‍රමාචෂ්ටෙ ත්‍රපයති, දීර්ඝමාචෂ්ටෙ ද්‍රාඝයති, හ්‍රස්වමාචෂ්ටෙ හ්‍රසයති, වෘද්ධමාචෂ්ටෙ වර්ෂයති, (472) ජ්‍ය ආදෙශකළ කල්හි ජ්‍යාපයති යනු වේ, වෘන්දාරකමාචෂ්ටෙ වෘන්දයති, කර්තාරමාචෂ්ටෙ (469) තෘන් ලොප්කළ කල්හි කාරයති, (471) ප්‍රශස්‍යස්ථානයෙහි ශ්‍රාදෙශ

---

* එකාච්චාසෞ අච්චෙති එකාජත් සත්‍යශ්ච අර්ථශ්ච වෙදශ්ච එකාජ්චච තත් තස්‍ය.

කළ කල්හි ශ්‍රාපයති, (472) ජ්‍යාපයති කියාද වේ, (473) පෘථු
මාචෂ්ටෙ ප්‍රථයති, මෘදුමාචෂ්ටෙ ම්‍රදයති, කෘශමාචෂ්ටෙ ක්‍රශ
යති, භෘශමාචෂ්ටෙ භ්‍රශයති, දෘඪමාචෂ්ටෙ ද්‍රඪයති, පරිවෘඪමා
චෂ්ටෙ පරිව්‍රඪයති. (475) අල්පමාචෂ්ටෙ කනයති අල්පයති
කියාද වේ, බහුමාචෂ්ටෙ භාවයති, වහොර්භූඃ යනු වක්තව්‍යයි.

(මූ-) **858. ණිඃ කල්‍යාදේඃ.** (ණිඃ 1. කල්‍යාදේඃ 5.)
කල්‍යාදෙරර්ථවිශෙෂෙ ණිඃ ස්‍යාත්.

කලිං ගෘහ්ණාති කලයති, අචකලත්. හලයති, අජහලත්. කෘතයති, අචීකෘතත් අචකෘතත්. වර්ණයති, ත්වචයති. තූස්තානි විනිහන්ති විතූස්තයති. වස්ත්‍රං සංඡාදයති සංවස්ත්‍රයති.*

(ස-) කල්‍යාදේඃ, කල්‍යාදි ශබ්දයන් කෙරෙන්; අර්ථවිශෙෂෙ, අර්ථවිශෙෂයෙහි; ණිඃ ස්‍යාත්, ණිප්‍රත්‍යය වන්නේය.

කලිහලීකාමධෙනු ශබ්දයන් සර්වාර්ථවාචක බැවින්යයි පූර්වාචාරීහු කියත්. කිරීමෙහිද ආඛ්‍යානයෙහිද පූර්වයෙහි ණිප්‍රත්‍යය විධානකළ හෙයින් මෙහි අර්ථවිශෙෂයෙහි වන්නේය යනු කියනලදී. කලිං ගෘහ්ණාති යනාදිවශයෙන් අර්ථයද තෙමේම වර්ණනාකෙරෙයි, කලිංගෘහ්ණාති කලිශබ්දයා කෙරෙන් ණි, (467) ඞිත්, ඊසංඥයහට ලොප් වේ, කලි යන ධාතුයි, ගුණ වේ, කලයති. (639) කලිහලිවර්ජනබැවින් සන්වත් නොවේ, කලිමග්‍රහීත් යන වාක්‍යයෙහි කලිශබ්දයා කෙරෙන් ණි, ඞිත්, කලි ධාතු, වී-දී, අම්, ණිශ්‍රි ද්‍රු ස්‍රු යනාදියෙන් අඞ්, ද්විත්වාදිය වේ, අචකලත් යනු වේ. හලිං ගෘහ්ණාති ණි, හලයති, හලිමග්‍රහීත්, ණි, ඞිත්වත් වේ, හලිධාතු, වී-දී, අම්, අඞ්, ද්විත්වාදිය වේ, අජහලත්. කෘතං ගෘහ්ණාති, ණි, කෘතයති, කෘතමග්‍රහීත්, ණි, කෘතිධාතු, වී-දී, ද්විත්වාදිය වේ, අඞ්, සන්වත් වේ, සන් පර කල්හි ඞිහට ඉකාරද, බෙඃ සන්වද් සො, දීර්ඝද, ණිහට ලොප්ද වෙත්, අචීකෘතත්. සන්වත් රහිත පක්‍ෂයෙහි, අචකෘතත්. වර්ණං ගෘහ්ණාති වර්ණයති. ත්වචං ගෘහ්ණාති ත්වචයති. තූස්තානි විනිහන්ති විපූර්ව තූස්ත යන්න වේ, ණි, විතූස්තයති, තූස්ත රහිතයක් කෙරෙයි යන අර්ථයි, තූස්තං රෙණෞ ච පාපෙ ච ජටායාඤ්ච නපුංසකම් යනු මෙදිනිකොෂයෙහියි. වස්ත්‍රං සංඡාදයති සංවස්ත්‍රයති. [පාණිනිඃ 3. 1. 21.]

---

* කලි ආදිර් යස්‍ය ස කල්‍යාදිස්තස්මාත්.

(මු-) වර්ණෛ සංනහ්‍යති සංවර්මයති. චූර්ණෛරවධ්වංසතෙ අවචූර්ණයති. හස්තිනා අතික්‍රාමති අතිහස්තයති. වීණයා උපගායති උපවීණයති. තූලෛරවකුෂ්ණාති අවතූලයති. ශ්ලොකෛරුපස්තෞති උපශ්ලොකයති. සෙනයා අභිමුඛං යාති අභිෂෙණයති. අභිෂිෂෙණයිෂති.

(ස-) වර්ණෛ (කවචයෙන්), සංනහ්‍යති (බඳියි), ඤි, සංවර්මයති. චූර්ණෛඃ, (චූර්ණද්‍රව්‍යවලින්), අවධ්වංසතෙ (විසුරුවයි), කිසිකෙනෙක් නාශයති යනු කියති, අවචූර්ණයති. හස්තිනා යනු උපලක්ෂණයි, අශ්විනා අතික්‍රාමති අත්‍යශ්වයති කියාද වේ. තූලෛඃ (මතින දඬුවලින්), අවකුෂ්ණාති (ප්‍රමාණකෙරෙයි), අවතූලයති. අභිෂෙණයති යන මෙහි, (572) ශිකඃ යනාදියෙන් ෂත්වය කළ කල්හි (107) ණත්වය වේ. අභිෂෙණයිතුමිච්ඡති යන වාක්‍යයෙහි සෙනිධාතුහට සන්, (554) ඉම්, ද්විත්වාදිය කළ කල්හි දශසථාදෙඃ යනු කීහෙයින් ද්විත්වයහට ෂත්ව වේ, අභිෂිෂෙණයිෂති

(මු-) රූපං පශ්‍යති රූපයති. ලොමාන්‍යනුමාර්ෂ්ටි අනුලොමයති. හස්තෞ නිරස්‍යති අතිහස්තයති. පුච්ඡමුත්ක්ෂිපති උත්පුච්ඡයතෙ. භාණ්ඩානි සංචිනොති සංභාණ්ඩයතෙ. චීවරං සංමාර්ජයති පරිදධාති වා සඤ්චීවරයතෙ භික්ෂුඃ.

(ස-) රූපං පශ්‍යති (බලයි) රූපයති, ලොමාන්‍යනුමාෂ්ටි (ආමර්ශනය කෙරෙයි) අනුලොමන්, ඤි, ඩිත්වත්ද, විලොපයද වෙත්, අනුලොමයති. භාණ්ඩානි (මූලධනයන්) සඤ්චිනොති (රැස්කෙරෙයි) සංභාණ්ඩයතෙ. භාණ්ඩං පාත්‍රෙ වණිග්මූලධනෙ භූෂාශ්ව භූෂයොඃ යනු මෙදිනීකොශයි. සංමාර්ජයති (ශුද්ධකෙරෙයි) පරිදධාති (වැළඳගණියි) සංවර්මයති යන මේ ආදිකොට ඇති උදාහරණ හතෙහි කරණකාරකයා කෙරෙන්ම ඤි වේ, එහෙයින්ම මේ ප්‍රයොගයෝ සකර්මකයෝයි, අන් තන්හි කර්මකාරකයා කෙරෙන් වේ, එහෙයින් බොහෝසෙයින් අකර්මකයෝයි. මේ උදාහරණයන් අතුරෙහි පුච්ඡභාණ්ඩචීවරි යන මොවුන් කෙරෙන් ආත්මනෙ පදයි, අන්‍යයන් කෙරෙන් පරස්මෛ පදයයි ප්‍රාචීනසම්මතයි. [පාණිනිඃ 3. 1. 20.]

(මු-) 859. **ලිඩො ර්යපෙෂ්ටං ඤිඃ, කණ්ඩ්වාද්‍යජාදේ‍යාස්තු තෘතීයානාදේ‍යාඃ.** (ලිඩොඃ 6. යපෙෂ්ටං 2. ඤිඃ 1. කණ්ඩ්වාදි-අජාදේ‍යාඃ 6 .. තු 1. තෘතීයානාදේ‍යාඃ 6 ..)

පුපුත්‍රීයිෂති පුතිත්‍රීයිෂති පුත්‍රීයියිෂති, පුත්‍රීයිෂිෂති, පුපුතිත්‍රී යියිෂිෂති. කණ්ඩූයියිෂති, අශිශ්වීයිෂති.*

ඉතිලිධූ පාදඃ.—චතුර්ගණධාතයඃ.

(ස-) ලිධොඃ, නාමධාතුහට ; යථෙෂ්ටං, ඉෂ්ටය නොයික්ම; ද්විඃ, ද්විත්ව වන්නේය; කණ්ඩ්වාද්‍යජාද්‍යොඃ, කණ්ඩ්වාදි ධාතුද ඝවරාදිධාතුද යන මේ දෙදෙනාහට ; තෘතීයානාද්‍යොඃ, ප්‍රථමයා සම්බන්ධිවූ තෘතීයවර්ණයහටද අන්‍යය සම්බන්ධිවූ ආදි වර්ණය රහිතවූ දෙවන තුන්වන වර්ණාදියහටද ද්විත්ව වන්නේය.

යථෙෂ්ටං යනු ක්‍රමයෙන්ද එක වරදයන අර්ථයි, කෙසේද කිසිතන්හි ප්‍රථම වර්ණයහටද කිසි තන්හි ද්විතීය වර්ණාදිය හටද කිසිතන්හි සියල්ලවුන්හටද ද්විත්ව වේ. පුත්‍රමිවාචරති ශිෂ්‍යං යන වාක්‍යයෙහි (847) ක්‍යප්‍රත්‍යයද, (843) අකාරයහට ඊකාරද වෙත්, පුත්‍රීයධාතු, නැවත පුත්‍රීයිතුමිච්ඡති, සන්, ඉම් (554) පුත්‍රීයිෂයන්නාහුගේ පු-ත්‍රී-යි-ෂ යන මොවුන්හටද සියල්ලහට එකවරද ක්‍රමයෙන් ද්විත්ව වේ, ආදිවර්ණය ද්විත්වකල තන්හි පුපුත්‍රීයිෂති. දෙවන වර්ණය ද්විත්වකලතන්හි පුතිත්‍රීයි ෂති. තුන්වන්න ද්විත්වකල තන්හි පුත්‍රීයියිෂති. සතරවන්න ද්විත්වකල තන්හි පුත්‍රීයිෂිෂති. සතරම එකවිට ද්විත්වකලතන්හි පුපුතිත්‍රීයියිෂිෂති. කණ්ඩූං කරොති යන වාක්‍යයෙහි (854) ක්‍යප්‍රත්‍යය වේ, නැවත කණ්ඩූයිතුමිච්ඡති යන වාක්‍යයෙන් සන්, ඉම්, ෂත්වය වේ, කණ්ඩූයිෂ යන මේ ධාතුහුගේ තුන් වන වර්ණයවූ, යි යනමේ වර්ණයහට ද්විත්ව වේ, කණ්ඩූයියිෂති. අශ්වමිවාචරති. ගාං යන වාක්‍යයෙහි (847) ක්‍ය වේ, නැවත අශ්වීයිතුමිච්ඡති යන වාක්‍යයෙහි සන්, අශ්වීයිෂධාතුව වූ කල්හි ද්විතීය වර්ණයහට ද්විත්ව වේ, අශිශ්වීයිෂති. තුන්වන්න හට ද්විත්වකලකල්හි අශ්වීයියිෂති. සතරවන්නහට ද්විත්වකල කල්හි අශ්වීයිෂිෂති යනු වේ.

නාමධාතු පාදය මෙසේ සමාප්තයි.

---

* ආද්‍යෞලිඃ පශ්චාත් ධූඃ ලිධූඃ නාමධාතුඃ ඉති යාවත්, ඉෂ්ට මනතික්‍රම්‍ය යථෙෂ්ටං (ක්‍රියාවිශෙෂණං) කණ්ඩූරාදියස්‍ය ස්‍ය ස කණ්ඩ්වාදිඃ, අච් ආදියස්‍ය ස්‍ය සඃ අජාදිඃ කණ්ඩවාදිශ්ච අජාදිශ්ච තයොඃ. තෘතීයශ්ච අනාදිශ්ච තයොඃ.

පං.

(මු-) **860. ඞෙ පං පරානු-කෘප්‍රත්‍යභ්‍යති-ක්‍ෂිපප්‍රවහපරිමෘෂව්‍යාපරි-රමො වා තූපරමඃ.** (ඞෙ 7. පං 1. පරානුකෘප්‍රති අභිඅති-ක්‍ෂිපප්‍රවහපරිමෘෂවිආපරිරමඃ 5. වා 1. තු 1. උප රමඃ 5.) එභ්‍යඃ පං ස්‍යාත් ඞෙ, උපරමස්තු වා. පරාකරොති අනුකරොති, ප්‍රතික්‍ෂිපති, ප්‍රවහති, පරිමෘෂ්‍යති, විරමති ආරමති පරිරමති, උපරමති උපරමතෙ විෂ්ණුඃ.*

(ස-) එභ්‍යඃ, පරා-අනු දෙදෙනා කෙරෙන් පරවූ කෘධාතුය-ප්‍රති-අභි අති යන මොවුන් කෙරෙන් පරවූ ක්‍ෂිපධාතුය-ප්‍ර උපසර්ගයා කෙරෙන් පරවූ වහධාතුය-පරිපූර්වවූ මෘෂධාතුය-වි-ආ-පරි යන මොවුන් පූර්වවූ රමධාතුය-යන මොවුන්කෙරෙන්; ඞෙ, කර්තෘයෙහි; පං ස්‍යාත්, පරස්මෛපදය වන්නේය; උප රමස්තු, උප පූර්ව රමධාතුහු කෙරෙන් වනාහි; වා, විකල්ප යෙන් උභයපදය වන්නේය.

මේ නියමය කරණකොටගෙන කෘ-ක්‍ෂිප-වහ-මෘෂ යන මේ ධාතූන් සතරදෙනාගේ ඉත්සංඥ ඤකාරත්වය ඇති කල්හිද කියනලද උපසර්ගයන් හා යෙදුනු කල්හි ආත්මනෙපදය නො වන්නේය. යම් ශබ්දයන් හා යෙදීමෙහි (286) ද්විතීයාවිභක්ති කරණලද්දීද, ඒ අනු ආදීන්ගේ ග්‍රහණය මෙහි නැත්තේය, එහෙයින්-වෘක්‍ෂමනුකුරුතෙක්‍යා ආත්මනෙපදයම වන්නේය. පරාකරොති අනුකරොති යනු පරා අනුපූර්ව කෘධාතුහුකෙරෙන් පරස්මෛපදයෙහි උදාහරණයි, කෘධාතුහු කෙරෙන් (688) ශුප් කළකල්හි ධාතුහටද ප්‍රත්‍යයාහටද ගුණව කරොති යනු වේ. ප්‍රතික්‍ෂිපති යනාදියද ඒ ඒ උපසර්ගයන් කෙරෙන් වූ ඒ ඒ ධාතූන්ගේ උදාහරණයි. උපරමති උපරමතෙ යනු උභයපදොදාහරණයි, ක්‍රීඩා කෙරෙයි යන අර්ථයි. [පාණිනිඃ 1. '3. 79, 85.]

(මු-) **861. කම්පාන්නාපෛධබුධයුධප්‍රුද්‍රුස්‍රුජනනශො' ක්‍ෂිප්‍රාණිසා-ණ්‍යාච්ච ඤෙඃ.** (කම්ප—නසඃ 5. අක්‍ෂි—ප්‍රාණිසා ණ්‍යාත් 5. ච 1. ඤෙඃ 5.)

---

* පරානුභ්‍යං කෘඃ පරානුකෘඃ, ප්‍රත්‍යභ්‍යතිභ්‍යඃ ක්‍ෂිපඃ ප්‍රත්‍යභ්‍යතික්‍ෂිපඃ, ප්‍රාවහඃ ප්‍රවහඃ, පරෙර්මෘෂඃ පරිමෘෂඃ, ව්‍යාපරිභ්‍යො රම ව්‍යාපරිරම. තතඃ, පරානුකෘශ්ච ප්‍රත්‍යභ්‍යතික්‍ෂිපශ්ච ප්‍රවහශ්ච පරිමෘෂශ්ච ව්‍යාපරිරමශ්චෙති තස්මාත්.

චලයති භොජයති අධ්‍යාපයති, බොධයති යොධයති ප්‍රාවයති ද්‍රාවයති ස්‍රාවයති ජනයති නාශයති, ශායයති කෘෂ්ණං යශොදා. අප්‍රාණිකාත් කිං, ශොෂයතෙ ශාලිං. අණ්‍යාත් කිං, හත්තිං කාරයතෙ. අණෙදෟ කිං, රූපයතෙ හරිඃ.*

ඉති පපාදඃ.

(ස-) කම්පනනාදීනං, චලනාදිධාතුය-ආහාරාදිධාතුය-ඉඩ් ධාතුය යන මොහුද; බුධ යුධ ප්‍රැ ද්‍රැ ස්‍රැ ජන නසඃ, බුධධාතුය-යුධධාතුය-ප්‍රැධාතුය-ද්‍රැධාතුය-ස්‍රැධාතුය-ජනධාතුය-නශධාතුය යන මොවුන් කෙරෙන්ද පරවූ; ණෙඃ, ණිප්‍රත්‍යයා කෙරෙන්ද; අණිප්‍රාණිකාණ්‍යාච්ච, ණිප්‍රත්‍යය රහිතවූ ප්‍රාණසහිතයක්හු කර්තෘවශයෙන් පවත්නා අකර්මකධාතුහු කෙරෙන් පරවද නැවත ණිප්‍රත්‍යය වූ කල්හිද කර්තෘයෙහි පරස්මෛපදය වන්නේය.

මෙයින් ඵලවත් කර්තෘයෙහිද ආත්මනෙපදය නොවන්නේය යනු අවබොධ කටයුතු. චලයති ජනයති යනුද ඝටාදි බැවින් හ්‍රස්ව වන්නේය. ණි රහිත ප්‍රාණිකර්තෘ අකර්මකය, කෘෂ්ණඃ ශෙතෙ කියයි, එහෙයින් ණ්‍යන්තයා කෙරෙන් පරස්මෛපදයයි. චලධාතු, (773) ණි, (775) අකාරලොපයයි, චලිධාතු, තිප්, ශප්, ගුණවේ, චලයති, කම්පාදීයෙහි පරස්මෛපදයයි. භොජයති, යනු ආහාරාදීයෙහි උදාහරණයයි. අධිපූර්ව ඉඞධාතු, ණි, (793) ඊකාරයහට ආකාරයි, (784) පත්, ආපිධාතු, තිප්, ශප්, ගුණ වේ, අධ්‍යාපයති. ප්‍රැධාතු, ණි, වෘද්ධියි, ඖකාරයහට ආව්, ප්‍රාවිධාතු, ප්‍රාවයති.

ද්‍රාවයති යනාදිය සුගමයි. ශායයති යනු ප්‍රාණවත් කර්තෘවූ අකර්මකධාතුහු කෙරෙන් ණිප්‍රත්‍යය වීමෙන් පරස්මෛපදය වූ තැනි, යශොදා යන්න සප්‍රාණි කර්තෘයි. අප්‍රාණිකාත් කිං,

---

* කම්පශ්චලනං, අශනං භොජනං, තෙ අර්ථා යෙෂාං තෙ කම්පනනාදීඃ, තෙ ච ඉඞ ච බුධශ්ච යුධශ්ච ප්‍රැශ්ච ද්‍රැශ්ච ස්‍රැශ්ච ජනශ්ච නශ ච තස්මාත්. ප්‍රාණී කො යස්‍ය ස ප්‍රාණිකඃ, නාස්ති ණිං යස්‍ය සො'ණිඃ, ප්‍රාණිකශ්චාසෞ අණිශ්චෙති ප්‍රාණිකාණිඃ අණෙදෟ ප්‍රාණිකාණිඃ අණිප්‍රාණිකාණිස්තස්මාත්.

ප්‍රාණිරහිත කර්තෘහු කෙරෙන් කුමක් වේද? ශොෂයතෙ ශාලිං යන මේ ආදියෙහි ප්‍රාණිරහිත කර්තෘයෙහි ආත්මනෙපදය වේ. අර්‍ථාත් කිං, අර්‍ථාත් යනු කුමටය? හකතිං කාරයතෙ යනාදි යෙහි සකර්මකධාතුහු කෙරෙන් ආත්මනෙපදය වන බව ඇඟ වීම පිණිසයි. අඤෙ‍්‍ය කිං, අඤෙ‍්‍ය යනු කුමටය?, රූපයතෙ හරිඃ යන මෙහි, රූපත්කතත් කෘතෞ යන නිත්‍යයෙන් චුරාදි යෙහි වූ ධාතුයි, නියමයෙන් ඤි රහිත අවස්ථාවකට නොපැමිති බැවින් මේ නියමය නොයෙදේ, එහෙයින් උභය පදයම වන බැවිනි.

පරස්මෛපදපාදය මෙසේයි.

මං.

(මු-) 862. විපරා-ජි පරිව්‍යව-ක්‍රීණි-විශානුප්‍රච්ඡා මං. (වි—ප්‍රච්ඡඃ 5. මං 1.)

එභ්‍යො මං ස්‍යාත් සෙ. විජයතෙ පරාජයතෙ, පරික්‍රීණීතෙ නිවිශතෙ, ආනුතෙ ආපෘච්ඡතෙ.*

(ස-) එභ්‍යඃ, වි-පරා යන උපසර්ග පූර්වවූ ජිධාතුය-පරි-වි-අව යන උපසර්ග පූර්වවූ ක්‍රීධාතුය-නිපූර්ව විශධාතුය-ආඞ්පූර්ව-නුධාතු-ප්‍රච්ඡධාතු දෙකය යන මොවුන් කෙරෙන්; සෙ, කර්තෘයෙහි; මං ස්‍යාත්, ආත්මනෙපදය වන්නේය. විජයතෙ යනාදි උදාහරණ සඝ ඒ ඒ උපසර්ගයන් හා ඒ ඒ ධාතුන්ගේ යෙදීමෙහි ආත්මනෙපද වීම දක්වීම පිණිසයි.

සෙ යනු පූර්ව සූත්‍රය කෙරෙන් අනුවර්තනයයි. ඩුක්‍රීඤ්‍ග ද්‍රව්‍ය විපර්‍ය්‍යයෙ යන මේ ආදි ඤකාරානුබන්ධධාතුන්ගේ ස්ථානයෙහි ආත්මනෙපදවිධානය ඵලරහිත කර්තෘයෙහිද ආත්මනෙපදප්‍රාප්තිය පිණිසයි. සකලස්ථානයෙහි මෙසේමැයි. නිවිශ යන මේ යොගය කරණකොටගෙන, ප්‍රණිවිශති යනාදියෙහි ආත්මනෙපදය නොවන්නේය. [පාණිනිඃ 1. 3. 17, 18, 19.]

---

* වි-පරාභ්‍යාං ජිඃ, පරි-ව්‍යවෙභ්‍යඃ ක්‍රිඃ, නෙර්විශඃ, ආඞො නු-ප්‍රච්ඡ්‍යෞ. තතඃ විපරාජිශ්ච පරිව්‍යවක්‍රිශ්ච නිර්විශශ්ච ආනුප්‍රච්ඡ්‍යෞ චෙති තස්මාත්.

(මු-) 863. **ආ-දාඤො'ස්වප්‍රසාරෙ.** (ආ-දාඤඃ 5. අස්වප්‍රසාරෙ 7.)

ආදත්තෙ. ස්වප්‍රසාරෙ තු ව්‍යාදදාති මුඛං කෘෂ්ණඃ.*

(ස-) ආ දා ඤඃ, ආඞ්පූර්වවූ දාඤධාතුහු කෙරෙන් කර්තෘයෙහි ආත්මනෙපදය වන්නේය; අස්වප්‍රසාරෙ, ස්වාවයව විස්තාරණ (ශරීරාවයව විවෘත) කිරීමෙහි එම ධාතුහු කෙරෙන් ආත්මනෙපදය නොවන්නේය.

ආදත්තෙ, ගණීයි. ස්වප්‍රසාරෙ තු, ස්වාවයවයන්ගේ විවෘත කිරීමෙහි වනාහි ; ව්‍යාදදාති මුඛං කෘෂ්ණඃ, කෘෂ්ණතෙම ස්ව මුඛය විවෘතකෙරෙයි යන අර්ථයි. [පාණිනිඃ 1. 3, 20.]

(මු-) 864. **ආ-ගමෙඃ ක්‍ෂාන්තෞ.** (ආගමෙඃ 5. ක්‍ෂාන්තෞ 7.) ආගමයතෙ කාලං.

(ස-) ආගමෙඃ, ආඞ් පූර්වවූ ණිප්‍රත්‍යයාන්ත ගම්ධාතුහු කෙරෙන්; ක්‍ෂාන්තෞ, ප්‍රතීක්‍ෂණාර්ථයෙහි කර්තෘයෙහි ආත්මනෙපදය වන්නේය.

ආගමයතෙ කාලං, කාලයක් ඉවසයි යන අර්ථයි. ආනයනාද්‍යර්ථයෙහි (පැමිණවීම) පරස්මෛපදයම වේ.

(මු-) 865. **පර්‍යන්වවාඞඃ ක්‍රීඩඃ.** (පරි-අනු-අව-ආඞඃ 5. ක්‍රීඩඃ 5.)

පරික්‍රීඩතෙ අනුක්‍රීඩතෙ අවක්‍රීඩතෙ ආක්‍රීඩතෙ.†

(ස-) පර්‍යන්වවාඞඃ, පරි-අනු-අව-ආඞ් යන මේ උපසර්ගයන් කෙරෙන් පරවූ ; ක්‍රීඩඃ, ක්‍රීඩධාතුහු කෙරෙන් කර්තෘයෙහි ආත්මනෙපදය වන්නේය. පරි යනාදි උපසර්ගයන්ගෙන් පරවූ ක්‍රීඩති යන්නහු කෙරෙන් ආත්මනෙපදය විමෙහි පරික්‍රීඩතෙ යනාදීන් ක්‍රමයෙන් උදාහරණයි. සහාර්ථයෙහිවූ අනු පූර්වවූ ක්‍රීඩධාතුහු කෙරෙන් ආත්මනෙපදය නොවේ, එහෙයින් බාලකමනුක්‍රීඩති යන මෙහි ආත්මනෙපදය නොවේ. [පාණිනිඃ 1, 3. 21.]

(මු-) 866. **සමො'කූජනෙ.** (සමඃ 5. අකූජනෙ 7.)

සංක්‍රීඩතෙ. කූජනෙ තු සංක්‍රීඩති චක්‍රං.

---

* ස්වං ස්වාඞ්ගං, ස්වස්‍ය ප්‍රසාරො විස්තාරණං ස්වප්‍රසාරඃ, නඤ් යොගෙ තස්මින්.

† පරිශ්ච අනුශ්ච අවශ්ච ආඞ් ච තස්මාත්.

(ස-) සමඃ, සම් යන උපසර්ගයා කෙරෙන් පරවූ ක්‍රීඩති යන්නහු කෙරෙන්; අකූජනෙ, අව්‍යක්තශබ්දය රහිතවූ අර්ථයෙහි කර්තෘයෙහි ආත්මනෙපදය වන්නේය. සංක්‍රීඩතෙ, ක්‍රීඩාකෙරේ යන අර්ථයයි. සංක්‍රීඩති චක්‍රං, යනු චක්‍රය අව්‍යක්ත ශබ්ද කෙරෙයි යන අර්ථයි. අව්‍යක්තශබ්දයෙහි පරස්මෛ පදයි.

(මු-) 867. **ක්‍රො'පාඩ්ඪානනවාසෙච්ඡ චතුෂ්පාද්වෙ සුම් ච.** (කෘඃ 5. අපාත් 5. හර්ෂානනවාසෙච්ඡෙ 7. චතුෂ් පාද්වෙ 7. සුම් 1. ච.)

අපස්කිරතෙ මත්තඃ කුක්කුටඃ ශ්වා වා. අන්‍යත්‍ර මල්ලො 'පකිරති, ගජො'පකිරත්‍යම්භඃ.*

(ස-) හර්ෂානනවාසෙච්ඡෙ, සන්තොෂයට කාරණවූ භක්ෂණයට කැමැත්ත ඇති කල්හිද සන්තොෂය හෙතුකොටගෙන විසීමට ඉච්ඡාව ඇති කල්හිද; චතුෂ්පාද්වෙ, පශුවාචී ශබ්ද පක්ෂිවාචී ශබ්ද යන මොවුන් කර්තෘවාචිව සිටි කල්හි; අපාත්, අප උපසර්ගයා කෙරෙන් පරවූ; කෘඃ, කෘධාතුහු කෙරෙන් පරව ආත්මනෙපදය වන්නේය; සුම් ච, සුම්ආගමයද වන්නේය.

මත්තඃ කුක්කුටඃ, සතුටුවූ කුක්කුටතෙම; අපස්කිරතෙ, භක්ෂණය කැමැත්තේ පොළොව නියයෙන් ඉරිගසයි; වා, නොහොත්; ශ්වා, බල්ලුතෙමේ; අපස්කිරතෙ, විසීම කැමැත්තේ සතුටින් භූමිය නියගායි. මෙහි කෘධාතුව ආලිඛනාර්ථයෙහිම දතයුතු. අන්‍යත්‍ර, පශුපක්ෂිවාචී නුවූ අන්‍යාර්ථයෙහි; මල්ලො 'පකිරති, ධූලි නන්වන පිණිස භූමිය ආලිඛනය කෙරෙයි, යන මෙහි ආත්මනෙපදය නොවෙයි. ගජො'පකිරත්‍යම්භඃ, හස්තිතෙම ජලය උඩුකුරුව නගයි යන අර්ථයි. මේ අර්ථයෙහිද ආත්මනෙපදය නොවේ. මෙහි, තුල්‍යයොගනිර්දිෂ්ටානාං සහ වා ප්‍රවෘත්තිඃ සහ වා නිවෘත්තිඃ යන න්‍යාය කරණකොට ගෙන ආත්මනෙපදාභාව පක්ෂයෙහි සුම්ආගමයද නොවන්නේය. [පාණිනිඃ 6. 1. 142.]

---

* අන්නාද්‍යච වාසශ්ච තෞ, තයොරිච්ඡා අන්නවාසෙච්ඡා, හර්ෂේණ අන්නවාසෙච්ඡා යස්‍ය ස හර්ෂානනවාසෙච්ඡස්තස්මින්. චතුෂ්පාච්ච විශ්ච තත්තස්මින්.

(මූ-) 868. **ශපථාශීර්ගීත්‍යනුකාරෙ ශප-නාථ-හෘඤඃ.** (ශපථ-ආශීර්ගීත්‍යනුකාරෙ 7. ශප-නාථ-හෘඤඃ 5.)

කෘෂ්ණය ශපතෙ ගොපී. මොක්ෂාය නාථතෙ මුනිඃ. පෛතෘකමනුහරතෙ අශ්වඃ.

(ස-) ශපථාශීර්ගීත්‍යනුකාරෙ, දිවිරීමය ඉෂ්ටාශීයක් පහලකිරීමය ගමන් සමානකිරීමය යන මෙහි ; ශපනාථ හෘඤඃ, ශපධාතුය නාථධාතුය හෘඤධාතුය යන මොවුන් කෙරෙන් කර්තෘයෙහි ආත්මනෙපදය වන්නේය.

ශපෙ ආක්‍රොශෙ යන මේ ධාතුහු කෙරෙන් ශපථයෙහිද, නාථෘ ඛතාපාශිෂොපෛශ්වර්‍ය'ශීෂු යන මොහු කෙරෙන් ආශීර්වාදයෙහිද, හෘඤ හරණෙ යන මේ ධාතුහු කෙරෙන් ගමන් සමානකිරීමෙහිද වේ. ශපථ නම් පුත්‍රාදීන්ගේ ශරීරස්පර්ශාදියෙන් මිථ්‍යානිරාකරණයයි.

ගොපී, ගොපාල භාර්‍යාතොමෝ; කෘෂ්ණාය ශපතෙ, කිසිවක්හුගේ ශරීරය ස්පර්ශකොට මාවිසින් මේතෙම නොකරණලදැයි දිවිරීමෙන් විෂ්ණුහු සතුටුකිරීමට කැමැත්තීය යන අර්ථයි. ශපථය කෙරෙන් අන්තන්හි අනියම බැවින් උභයපදයමය. මොක්ෂාය නාථතෙ මුනිඃ, මුනිතෙම මොක්ෂය මට වන්නේයයි ආශංසනයකෙරෙයි යන අර්ථයි. දෙතන්හි (294) චතුර්ථියි. නාථධාතුහට ආත්මනෙපදිත්වය ඇති කල්හිද ආශීර්වාදය හැර අනික්තන්හි පරස්මෛපදයම වේ. අශ්වඃ, අශ්වතෙම, පෛතෘකං, පිතෘසම්බන්ධවූ ගමන; අනුහරතෙ, අනුව කෙරෙයි, පියහු මෙන් යෙයි යන අර්ථයි. ගතිග්‍රහණය හෙතුකොට ගෙන රූපාදි අනුකාරයෙහි නොවන්නේය යනුයි.

(මූ-) 869. **ප්‍රතිඥා-නිර්ණය-ප්‍රකාශෙ සංප්‍රව්‍යවාච්ච ස්ථඃ.** (ප්‍රතිඥා-නිර්ණයප්‍රකාශෙ 7. සංප්‍රවිඅවාත් 5. ච 1. ස්ථඃ 5.)

නිත්‍යං ශබ්දමාතිෂ්ඨතෙ. ත්වයි තිෂ්ඨතෙ විවාදඃ. රාමාය තිෂ්ඨතෙ සීතා. සන්තිෂ්ඨතෙ ප්‍රතිෂ්ඨතෙ විතිෂ්ඨතෙ අවතිෂ්ඨතෙ. සමස්ථිත.

(ස-) ප්‍රතිඥා නිර්ණය ප්‍රකාශෙ, ප්‍රතිඥාව නිර්ණයාව ප්‍රකාශව යන මෙහි; සංප්‍රව්‍යවාච්ච, සං උපසර්ග ප්‍ර-වි-අව යන මේ උපසර්ගයන් කෙරෙන්ද පරවූ; ස්ථඃ, ස්ථාධාතුහු කෙරෙන් කර්තෘයෙහි ආත්මනෙපදය වන්නේය.

චකාරය හෙතුකොටගෙන අර්ථයෙක් වේ. ප්‍රතිඥනම් අඞ්ගීකාරයයි, (අයතිකිරීම), නිර්ණය නම් නිශ්චයයි, ප්‍රකාශ නම් ස්වකීයාභිප්‍රාය ප්‍රකටකිරීමයි. නිත්‍යං ශබ්දමාතිෂ්ඨතෙ, යන මෙහි නිත්‍යං යනු ශබ්දයාගේ විශෙෂණයයි. මීමාංසකතෙම ශබ්දය නිත්‍යය යන ප්‍රතිඥව කෙරෙයි යනඅර්ථයි. මීමාංසකඃ යනු ශෙෂයයි. ත්වයි විවාදස්තිෂ්ඨතෙ යනු නිර්ණයයි. සීතා රාමාය තිෂ්ඨතෙ යනු රාමහට තමාගේ අභිප්‍රාය ප්‍රකාශකෙරෙයි යන අර්ථයි. (294) මෙහි චතුර්ථියි. සන්තිෂ්ඨතෙ යනාදිය උපසර්ගයන් කෙරෙන්වූ එම ධාතුහට උදාහරණයි. සමස්ථිත යන මෙහි (736) ථිආදෙශ වේ. (පාණිනිඃ 1. 3. 22, 23.]

(මූ-) **870. උදෙ'නූර්ධ්වෙ ඊහෙ.** (උදඃ 5. අනූර්ධ්වෙ ඊහෙ 7.)

මුක්තාවුත්තිෂ්ඨතෙ. අන්‍යත්‍ර ආසනාදුත්තිෂ්ඨති, ග්‍රාමාච්ඡත මුත්තිෂ්ඨති.*

(ස-) උදඃ, උත්යන්න පූර්වවූ ස්ථාධාතුහු කෙරෙන් කර්තෘයෙහි ආත්මනෙපදය වන්නේය; අනූර්ධ්වෙ ඊහෙ, ඌර්ධ්වගතවූ ශරීරය පිළිබඳ යත්නයක් ඇති කල්හි ආත්මනෙපදය නොවන්නේය.

මුක්තාවුත්තිෂ්ඨතෙ යනු මුක්ත්‍යෙ, මුක්තිවිෂයෙහි (නිර්වාණය කෙරෙහි) කායිකවූ යත්නය කෙරෙයි යන අර්ථයි. අන්‍යත්‍ර, ශරීරය ඌර්ධ්වගත කිරීමෙහි උත්සාහ ඇති තන්හි ආසනාදුත්තිෂ්ඨති, කියා පරස්මෛපදය වේ, කර්තෘ තමන් ශරීරය නඟා සිටීමට උත්සාහවත් බැවින් ආත්මනෙපදය නොවේ, ග්‍රාමාච්ඡතමුත්තිෂ්ඨති, යන මෙහි ගමින් සියයෙක් උපදියි යන අර්ථයි, ඉපදීමට කර්තෘවූ සියය තමා කර්තෘහුගේ කය පිළිබඳ උත් සාහ රහිත බැවින් ආත්මනෙපදය නොවේ. [පාණිනිඃ 1. 3. 24.]

(මූ-) **871. මන්ත්‍රණෙපාත්.** (මන්ත්‍රණෙ 3. උපාත් 5.)

ගායත්‍ර්‍යා උපතිෂ්ඨතෙ අර්කං.

(ස-) මන්ත්‍රණෙ, මන්ත්‍ර කිරීමෙන් යුක්තවූ; උපාත්, උප යන උපසර්ගයා කෙරෙන් පරවූ ස්ථාධාතුහු කෙරෙන් කර්තෘයෙහි ආත්මනෙපදය වන්නේය.

---

* න ඌර්ධ්වං අනූර්ධ්වං, අනූර්ධ්වෙ ඊහා (චෙෂ්ටා) යස්‍ය සඃ අනූර්ධ්වෙ හස්තස්මින්.

ගායත්‍රෘ, මන්‍ත්‍රයෙන් යුක්තව; උපතිෂ්ඨතෙ, ඉරුට ලන්ව හිඳිසි යන අර්ථයි. මනෙත්‍රණ යනු කුමටය? සුවතිර් යෞව නෙන භර්තාරමුපතිෂ්ඨති යන මෙහි මන්‍ත්‍රයෙන් යුක්තවීම් රහිත හෙයින් ආත්මනෙ පදය නුවූ බැවිනි. [පාණිනිඃ 1. 3. 25.]

(මූ-) 872. මෛත්‍ර්‍යධ්වසඞ්ගාරාධෙ. (මෛත්‍රී-අධ්ව-සඞ්ග-ආරාධෙ 7.)

සන්තමුපතිෂ්ඨතෙ සාධුඃ. ගඞ්ගාමුපතිෂ්ඨතෙ පන්ථාඃ. පතිමුපතිෂ්ඨතෙ නාරී. විෂ්ණුමුපතිෂ්ඨතෙ වෛෂ්ණවඃ.

(ස-) මෛත්‍ර්‍යධ්වසඞ්ගාරාධෙ, මිත්‍රභාවය මාර්ගය සඞ්ගමය සතුටුකිරීමය යන මේ අර්ථයන් කෙරෙහි උප පූර්ව ස්ථාධාතුහු කෙරෙන් කර්තෘයෙහි ආත්මනෙපදය වන්නේය.

මිත්‍රස්‍ය භාවො මෛත්‍රී, අධ්වා යනු මාර්ගයයි, සඞ්ගනම් සඞ්ගමයයි, ආරාධ නම් සතුටුකිරීමයි. සාධුඃ, සත්පුරුෂතෙම; සන්තං, සත්පුරුෂයා; උපතිෂ්ඨතෙ, මිත්‍රකෙරෙයි යන අර්ථයි. පන්ථාඃ, මාර්ගයතෙම; ගඞ්ගාමුපතිෂ්ඨතෙ, ගඞ්ගාවට යෙයි යන අර්ථයි. මාර්ගය කර්තෘ වූ කල්හි ආත්මනෙපදයයි. මාර්ගය කර්තෘ වූ කල්හි කුමක් වේද? පන්ථානමුපතිෂ්ඨති යන මෙහි මාර්ගය කර්තෘ නුවූ බැවින් පරස්මෛපදය වන්නේය. පතිමුපතිෂ්ඨතෙ නාරී, ස්වාමියා හා සමග භාර්‍යාතොමෝ ඇඳිම කරන්නීය යන අර්ථයි. විෂ්ණුමුපතිෂ්ඨතෙ, විෂ්ණුහු සතුටු කෙරෙයි යන අර්ථයි.

(මූ-) 873. ලිප්සායාං වා. (ලිප්සායාං 7. වා 1.)

භික්ෂුර්ධාර්මිකමුපතිෂ්ඨතෙ උපතිෂ්ඨති වා.

(ස-) ලිප්සායාං, ලැබීමට කැමතිය යන අර්ථයෙහි; වා, උප පූර්ව ස්ථාධාතුහු කෙරෙන් කර්තෘයෙහි විකල්පයෙන් ආත්මනෙ පදය වන්නේය.

ලබ්ධුමිච්ඡා ලිප්සා. ධාර්මිකමුපතිෂ්ඨතෙ, ධාර්මිකයා කෙරෙන් ලැබීමට කැමතිවෙයි යන අර්ථයි. මෙහි උභයපදෝදාහරණයි.

(මූ-) 874. අස්ථාත්. (අස්ථාත් 5.)

ඥානමුපතිෂ්ඨතෙ.

(ස-) අස්ථාත්, උප පූර්ව අකර්මක ස්ථාධාතුහු කෙරෙන් පරව කර්තෘයෙහි ආත්මනෙපදය වන්නේය.

විකල්පවයක්හුගේ මධ්‍යයෙහි පැවතිබැවින් නිත්‍යයි. ඥානමුපතිෂ්ඨතෙ යනු ඥානය එළඹ සිටියේ වෙයි යන අර්ථයි. [පාණිනිඃ 1. 3. 26.]

(මු-) **875. සමොගමෘච්ඡ ප්‍රච්ඡස්වෘශ්‍රුවෙත්ත්‍යර්තිදෘශඃ** (සමඃ 5. ගම-දෘශඃ 5.)

සඞ්ගච්ඡතෙ, සමගත සමගංසත, සඞ්ගසීෂ්ට සඞ්ගංසීෂ්ට. සමෘච්ඡතෙ, සංපෘච්ඡතෙ, සංස්වරතෙ, සංශෘණුතෙ, සංවිද්‍රතෙ සංවිදතෙ, සමියෘතෙ සම්පශ්‍යතෙ. අඬාත් කිං, ගඞ්ගාං සඞ්ගච්ඡති.

(ස-) සමඃ, සම්උපසර්ගයා කෙරෙන් පරවූ; ගමෘච්ඡ් ප්‍රච්ඡස්වෘශ්‍රුවෙත්ත්‍යර්තිදෘශඃ, ගමධාතුය ඍච්ඡධාතුය ප්‍රච්ඡධාතුය ස්වෘධාතුය ශ්‍රුධාතුය විදධාතුය ඍධාතුය දෘශධාතුය යන අකර්මකවූ මොවුන් කෙරෙන් කර්තෘවාච්‍ය කල්හි ආත්මනෙපදය වන්නේය.

මොව්හු සකර්මක වූවාහුද විවක්ෂා වශයෙන් අකර්මකයෝයි. සම් පූර්ව ගම-කී-තෙ, ශප්, (597) ගච්ඡආදේශ වේ, සඞ්ගච්ඡතෙ. සම්-ගම, ටී-තන්, අම්, සි, (659) සිහට කිත්සංඥ වෙයි, (676) ඥම් ලොපයි, (562) සිහට ලොප් වේ, සමගත. කිත්සංඥඅභාව පක්ෂයෙහි (50) මකාරයහට අනුස්වාරයයි, සමගංසත. සම්-ගම-ඊ-සීෂ්ට, ඥම් ලොප්වේ, සඞ්ගසීෂ්ට. පක්ෂයෙහි මකාරයහට අනුස්වාරය වේ, සඞ්ගංසීෂ්ට. සම්-ඍ-තෙ, (597) ඍච්ඡ්ආදෙශ වේ, සමෘච්ඡතෙ. සම්-ප්‍රච්ඡ-තෙ, තුදාදිබැවින් ශප්‍රත්‍යයද, (661) ප්‍රච්ඡධාතුහට ජ්‍යාදෙශද වෙත්, සංපෘච්ඡතෙ. සම්-ස්වෘ-තෙ, ගුණ වේ, සංස්වරතෙ. සම්-ශ්‍රු-තෙ, (621) ශ්නුප්‍රත්‍යයද, ජ්‍යාදෙශයද වෙත්, සංශෘණුතෙ. සම්-විද. අනෙත, (555) අන්තස්ථානයෙහි අත්ද, (722) විකල්පයෙන් රම්ද වෙත්, සංවිද්‍රතෙ. රම්ආගමවිකල්ප පක්ෂයෙහි සංවිදතෙ. සම්-ඍර්ලිඞ්ගත්‍යං, තෙ, (726) ඊත්වද, (729) ඩ්සංඥයහට ඩිද, (585) ඉකාරයහට ඉය්ආදෙශද වෙත්, සමියෘතෙ. සම්-දෘශ-තෙ, (597) පශ්‍ය යන ආදෙශය වේ, සම්පශ්‍යතෙ. අඬාත් කිං, අඬාත් යනු කුමටද? ගඞ්ගාං සඞ්ගච්ඡති යන මෙහි සකර්මකවූ කල්හි ආත්මනෙපදය නොවන බැවිනි. අර්ථග්‍රහණය කරණකොට ගෙන භ්වාදි ගණයෙහිද ආත්මනෙපදය වන්නේය, එහෙයින් සමෘච්ඡතෙ ක්‍රියාද වේ. [පාණිනිඃ 1. 3. 29, 1. 2. 13, 7. 1. 7.]

(මු-) 876. **ගෙර්වාස්‍යූහො ණෙ ච.** (ගෙඃ 5. වා 1. අස්‍යූහඃ 5. ණෙ 7. ච 1.)

නිරස්‍යතෙ නිරස්‍යති. සමූහතෙ සමූහති.

(ස-) ගෙඃ, ගිසංඥයා කෙරෙන් පරවූ; අස්‍යූහඃ, අසධාතු ඌහධාතු යන මොවුන් කෙරෙන්; ණෙ ච, කර්මය විද්‍යමාන කල්හිද; වා, විකල්පයෙන් කර්තෘයෙහි ආතමනෙපදය වන්නේය. චකාරය හෙතුකොටගෙන කර්මරහිත කල්හිද ආත්මනෙපදය වන්නේය.

නිර් පූර්ව අස-තෙ, (738) ශ්‍යන්, නිරස්‍යතෙ. නිරස්‍යති. සම්පූර්ව ඌහධාතු, සමූහතෙ, සමූහති.

(මු-) 877. **ගෙරූහඃ ස්වො යෙ'ණෞ.** (ගෙඃ 5. ඌහඃ 6. ස්වඃ 1. යෙ 7. අණෞ 7.)

බ්‍රහ්ම සමුහ්‍යාත්.

(ස-) අණෞ යෙ, ගුණිතුවූ යකාරයා පරකල්හි ; ගෙරූහඃ, ගිසංඥයා කෙරෙන් පරවූ ඌහ ධාතුහට; ස්වඃ, හ්‍රස්ව වන්නේය.

සම්-ඌහ-සී-යාත්, මෙයින් හ්‍රස්ව වේ, සමුහ්‍යාත්. බ්‍රහ්ම, පරමේශ්වරයා; සමුහ්‍යාත්, බ්‍රහ්මවිෂයෙහි විතර්කය කරන්නේය යන අර්ථයි. පූර්වසූත්‍රයෙන් ආත්මනෙපද විකල්පපක්ෂයෙහි පරස්මෛපදයයි. [පාණිනිඃ 7. 4. 23.]

(මු-) 878. **ආත්මාඞ්ගඛ්‍යා-දඛ්‍යාච්චා-හනයමඃ.** (ආත්මාඞ්ගඛ්‍යාත් 5. අඛ්‍යාත් 5. ච 1. ආ-හන-යමඃ 5.)

උරආහතෙ පාදමායච්ඡතෙ, ආහතෙ ආයච්ඡතෙ. අන්‍යත්‍ර ශත්‍රුමාහන්ති පරශිර ආයච්ඡති.

(ස-) ආත්මාඞ්ගඛ්‍යාත්, ආත්මාවයවකර්ම වූද ; අඛ්‍යාච්ච, ආත්මාවයවකර්ම රහිතවූද; ආහනයමඃ, ආඞ් පූර්ව හනධාතු යමධාතු යන දෙදෙනා කෙරෙන් කර්තෘ වාච්‍ය කල්හි ආත්මනෙපදය වන්නේය. මණ්ඩූකගතියෙන් ණෙ යනුද මං යනුද අනුවර්තනයයි. ස්වාඞ්ගඛ්‍යාත් සී නොකියා ආත්මාඞ්ගඛ්‍යාත් යනු කීම, (265) පාරිභාෂිකස්වාඞ්ගයාගේ නිරාකරණය පිණිසයි. එහෙයින්ම පරශිරආයච්ඡති යන මෙහි ආත්මනෙපදය නොවේ. උර ආහන්තෙ, ළයට තාඩනය කෙරෙයි යන අර්ථයි, පාදමායච්ඡතෙ, පාදය දීර්ඝ කෙරෙයි යන අර්ථයි, මේ දෙතන්හි ස්වකීය ශරීරාවයවයන්ගේ කර්මත්වයෙන් ආත්මනෙපදය ප්‍රකටයි. කර්මයක්

කිරීම නොකැමති තන්හි, ආහතෙ, ආයච්ඡතෙ, අන්‍යත්‍ර, ස්වාඞ්ගය කර්ම නුවූ තන්හි, ශත්‍රුං ආහන්ති, පරශිර ආයච්ඡති යී අන්‍යයන් පිළිබඳ ශරීරයාගේ කර්මත්වයෙන් පරස්මෛපදය ස්ඵුටයි. [පාණිනිඃ 1. 3. 28.]

(මු-) 879. **හනඃ කිත් සිඃ.** (හනඃ 5. කිත් 1. සිඃ 1.)

හනඃ පරඃ සිඃ කිත් ස්‍යාත්.

ආහත ආවධිෂ්ට, ආහසාතාං ආවධිෂාතාං.

(ස-) හනඃ පරඃ, හනධාතුහු කෙරෙන් පරවූ ; සිඃ, සිආගමය ; කිත් ස්‍යාත්, කිත්සංඥ වන්නේය.

ආඞ් පූර්ව හන, පළමු සූත්‍රයෙන් ආත්මනෙපදය වූ කල්හි, ථීතන්, වධාදෙශවිකල්පපක්ෂයෙහි මෙයින් සිහට කිත් බැවින් (676) ඤම්ලොපයද (562) නැවත සිලොපයද වෙත්, ආහත. වධාදෙශපක්ෂයෙහි (554) ඉම්, ආවධිෂ්ට. ආඞ්-හන, ආතාං, වධාදෙශ නුවූ පක්ෂයෙහි, ආහසාතාං, වධාදෙශපක්ෂයෙහි, ආවධිෂාතාං. [පාණිනිඃ 1. 2. 18, 2. 4. 44.]

(මු-) 880. **යමඃ සූචනෙ වා ත්වුවාහෙ.** (යමඃ 5. සූචනෙ 7. වා 1. තු 1. උවාහෙ 7.)

ආයත. රාමඃ සීතාමුපායත උපායංස්ත.

(ස-) යමඃ, යමධාතුහු කෙරෙන් ; සූචනෙ, ඉඞ්ගිතාදියෙන් ඇඟවීමෙහි සි ආගමය ආත්මනෙපදයෙහි කිත් වන්නේය ; උවාහෙතු, විවාහාර්ථයෙහි වනාහි ; වා, විකල්පයෙන් ආත්මනෙපදයෙහි සිප්‍රත්‍යය කිත්සංඥ වන්නේය.

ආ-යම ථී-තන්, සි, මෙයින් සිහට කිත්, ඖකාරය ඉත් බැවින් ඉම් නොවේ, (676) ඤම්ලොපය වේ, ආයත. (909) උපයමඃ යී කියනුලබන සූත්‍රයෙන් ආත්මනෙපදය වූ කල්හි මෙයින් විකල්පයෙන් සිහට කිත්ත්වය වේ, උපායත. විවාහාර්ථයෙහි විකල්පයෙන් සිහට කිත් නුවූ පක්ෂයෙහි මකාරයහට අනුස්වාරයද සිලොපනිෂෙධයද වෙත්, උපායංස්ත. [පාණිනිඃ 1. 2. 15, 16.]

(මු-) 881. **ව්‍යුත්තපඃ.** (වි-උත්-තපඃ 5.)

විතපතෙ උත්තපතෙ පාණිං ජනඃ.

ආත්මාඞ්ගඪාදඪාච්ච කිං මඡ්ං විතපත්‍යකීඃ.

(ස-) ව්‍යුත්තපඃ, විඋපසර්ග උත්උපසර්ග යන මොවුන් කෙරෙන් පරවූ ආත්මාවයව කර්ම වූද ආත්මාවයව කර්ම නූවූද තප ධාතුහුකෙරෙන් කර්තෘ වාච්‍යකල්හි ආත්මනෙපදය වන්නේය. මණ්ඩූකප්ලුතියෙන් සෙ යනුද මං යනුද අනුවර්ත්තනයයි. ජනඃපාණිං උත්තපතෙ, ජනතෙම හස්තය උත්තපත කෙරෙයි යනඅර්ථයි. විතපතෙ ක්‍රියාද වේ. එසේම ජනතෙම උත්තප් තොහවති කියා වේ, ආත්මාවයව කර්මරහිතයා කෙරෙන්ද විත පතෙ උත්තපතෙ කියා ආත්මනෙපදයම වේ, ආත්මාඞ්ගඝ්ඨාද ඝ්ඨාච්ච කිං, ආත්මාඞ්ගඝ්ඨාත් යනුද අඝ්ඨාත් යනුද කුමටද? මහීං විතපත්‍යර්කඃ, යන මෙහි ආත්මාවයව කර්මයද අකර්මකයද නූවූ බැවින් පරස්මෛපදය ඇඟවීමපිණිසයි. [පාණිනිඃ 1. 3. 27.]

(මූ-) 882. **තපො ඝ්ඨාද් යක් ච රෙ.** (තපොඃඝ්ඨාත් 5. යක් 1. ච 1. රෙ 7.)

තප්‍යතෙ තපස්තාපසඃ. රෙ කිං අතප්ත.*

(ස-) තපො ඝ්ඨාත්, තපස කර්මවශයෙන් පවත්නාවූ තපධාතුහු කෙරෙන් කර්තෘ වාච්‍ය කල්හි ආත්මනෙපදය වන්නේය; රෙ, රසංඥයා පර කල්හි; යක් ච, යක්ප්‍රත්‍යයද වන්නේය යන අර්ථයි.

වෙන්වූ විධානය බැවින් ව්‍යුත් යනු අනුවර්ත්තනය නොවේ. තපො ඝ්ඨාත් යන මෙයින් ආත්මාඞ්ග ඝ්ඨාදඝ්ඨාත් යනුද නිරස්ත කරණලදී. මෙහි යක්ප්‍රත්‍යයතෙම ශප්ප්‍රත්‍යයාගේ වැළැක්ම කෙරෙයි. තපස්තප්‍යතෙ, තපස් කෙරෙයි යන අර්ථයි. එසේම තපේ‍යත තප්‍යතාං අතප්‍යත කියාද වේ. ඊ-තන්, අතප්ත යනු වේ, මෙහි නිමිත්තගත විශෙෂය බැවින් සත්‍යගමයි, යක් නොවේ, ඖෟකාරය ඉත් බැවින් ඉම් නොවේ, (562) සිලොපය වේ. රෙ කිං, රෙ යනු කුමටද? අතපත යන මෙහි රසංඥ රහිතවූ බැවින් යක් නොවන බව ඇඟවීම පිණිසයි.

(මූ-) 883. **සෘජඃ ශ්‍රාඞ්ඝාත් තනිණ්** ච. (සෘජඃ 5. ශ්‍රාඞ්ඝාත් 5. තනි 7. ඉණ් 1. ච 1.)

සෘජ්‍යතෙ ස්‍රජං භක්තඃ. අසර්ජි. ශ්‍රාඞ්ඝාත් කිං, සෘජති ස්‍රජං මාලිකඃ.†

---

* තපඃ ඝ්ඨං (කර්ම) යස්‍ය ස තපොඝ්ඨස්තස්මාත්.

† ශ්‍රාඞ්ඃ ඝඃ යස්‍ය සඃ ශ්‍රාඞ්ඝස්තස්මාත්.

(ස-) ශ්‍රාඬ්‍ාත්, ශ්‍රද්ධා ඇත්තාක්හු කර්තෘවශයෙන් පවත්නාවූ; සෘජඃ, සෘජ්ධාතුහු කෙරෙන් පරව කර්තෘ වාච්‍ය කල්හි ආත්මනෙපදය වන්නේය; තති, තත්විභක්ති පර කල්හි; ඉණ්, ඉණ්ප්‍රත්‍යයද වන්නේය. චකාරය හෙතුකොටගෙන රසංඥයා පර කල්හි යක්ප්‍රත්‍යයද වන්නේය.

භක්තඃ, ශ්‍රද්ධාවන්ත ජනතෙම; ස්‍රජං, මාලාව; සෘජ්‍යතෙ, කෙරෙයි; මෙහි ශ්‍රද්ධාවන්තයාගේ කර්තෘත්වයයි. සෘජධාතුහු කෙරෙන් මෙයින් ආත්මනෙපදයද යක්ප්‍රත්‍යයද වූ තැනි. සෘජ-තන්, මෙයින් ඉණ්, සි බාධකයි, අම්, ගුණ වේ, (644) තන්විභක්තිහට ලොපයි, අසර්ජි. ශ්‍රාඬ්‍ාත් කිං, කුමටද? සෘජති ස්‍රජං මාලිකඃ, යන මෙහි කර්තෘවූ මල්කරුතෙමේ ශ්‍රද්ධාවෙන් යුක්තයක්හු නොවන බැවින් පරස්මෛපදභාවය ඇඟවීම පිණිසයි. ශ්‍රත් යන අව්‍යයශබ්දය පූර්වවූ ධාධාතුහු කෙරෙන් ඩප්‍රත්‍යය වන්නේය, (1157) ශ්‍රද්ධා යනු වේ, ශ්‍රද්ධා විද්‍යතෙ'ස්‍ය යන වාක්‍යයෙහි (446) ප්‍රඥාදි බැවින් ණප්‍රත්‍යය වන්නේය, ශ්‍රාද්ධ යනු වේ. රසංඥයා පර කල්හි යක්ප්‍රත්‍යය කුමටද ? සසර්ජ, යන මෙහි රසංඥය නොවන හෙයින් යක් නොවීම පිණිසයි.

(මූ-) 884. නිසං ව්‍යුපහ්වඃ. (නි-සං-වි-උප-හ්වඃ 5.)

නිහ්වයතෙ සංහ්වයතෙ විහ්වයතෙ උපහ්වයතෙ.

(ස-) නිසංව්‍යුපහ්වඃ, නි උපසර්ග සං-වි-උප යන මෙ උපසර්ගයන් කෙරෙන්ද පරවූ හ්වෙඤ්ධාතුහු කෙරෙන් කර්තෘ වාච්‍ය කල්හි ආත්මනෙපදය වන්නේය.

අනිෂ්ට බැවින් යක්ප්‍රත්‍යය ඉණ්ප්‍රත්‍යය දෙක අනුවෘත්ති නොවේ. නි-හ්වෙ-තෙ, ශප්, නිහ්වයතෙ. ක්‍රමයෙන් උදාහරණයි. [පාණිනිඃ 1. 3. 30.]

(මූ-) 885. ස්පර්ධායා-මාඞඃ. (ස්පර්ධායාං 7. ආඞඃ 5.)

කෘෂ්ණ ශ්චාණූරමාහ්වයතෙ.

(ස-) ස්පර්ධායං, පරාභිභවෙච්ඡාවක් හැඟෙණකල්හි; ආඞඃ, ආඞ්උපසර්ගයා කෙරෙන් පරවූ හ්වෙඤ්ධාතුහු කෙරෙන් කර්තෘයෙහි ආත්මනෙපදය වන්නේය.

කෘෂ්ණඃ, කෘෂ්ණතෙම; චාණූරං, එනම් අසුරයා ; ආහ්වයතෙ, අභිභවකෙරෙ. ස්පර්ධායාං යනු කුමටද? පිතා පුත්‍රමාහ්ව

යති යනාදියෙහි අභිභවෙච්ඡාරහිත බැවි පරස්මෛපදය විමයි. [පාණිනිඃ 1. 3. 31.

(මු-) 886. **සුචනාවක්ෂෙපණ සෙවාසාහසප්‍රතියත්න කථොපයොගෙ කෘඤඃ.** (සුචන—උපයොගෙ 7. කෘඤඃ 5.)

අපකුරුතෙ, ශ්‍යෙනො වර්තිකාමුපකුරුතෙ, විෂ්ණුං ප්‍රකුරුතෙ, පරදාරාන් ප්‍රකුරුතෙ, එධොදකස්‍යොපස්කුරුතෙ, ගීතාඃ ප්‍රකුරුතෙ, ශතංප්‍රකුරුතෙ.

(ස-) සූචනාවක්ෂෙපණ සෙවාසාහස ප්‍රතියත්නකථොපයොගෙ, සූචනය අවක්ෂෙපණය සෙවාය සාහසය ප්‍රතියත්නය කථාය උපයොගය යන මෙ අර්ථයන් කෙරෙහි; කෘඤඃ, කෘඤ ධාතුහුකෙරෙන් කර්තෘ වාච්‍යකල්හි ආත්මනෙපදය වන්නේය.

සූචනය නම්, අනුන්ගේ දොෂාදිය පහලකිරීමයි. අවක්ෂෙපණය නම්, නින්‍දාකිරීමයි. සෙවා නම්, අනුව පැවැත්මයි. සාහස නම්, පසුව වන දොෂය නොසලකා හිංසා සොරකම් පරදාරගමනාදිය කිරීමයි. ප්‍රතියත්න නම්, අන්‍ය ගුණයකට පැමිණීමයි. කථා නම්, කථාකිරීමයි. උපයොග නම්, සුචරිතාදිය පිණිස ද්‍රව්‍ය වියදමයි. අපකුරුතෙ, කිසිවක්හුගේ දොෂය පහලකෙරේය යන අර්ථයි. ශ්‍යෙනො වර්තිකාමුපකුරුතෙ, උකුසුතෙම වටුවාට නින්‍දාකෙරෙයි. විෂ්ණුං ප්‍රකුරුතෙ, විෂ්ණුහු සෙවනයකෙරේ. පරදාරාන් ප්‍රකුරුතෙ, බලාත්කාරයෙන් පරදාරාවන් කෙරෙහි ද්‍රෝහව පවතියි. එධොදකස්‍ය, කාෂ්ඨරසයාගේ; උපස්කුරුතෙ, අග්නිසංයොගයෙන් අන්‍යගුණයකට පැමිණීම කෙරෙයි, ප්‍රතියත්නාර්ථයෙහි (766) සුම් වේ. ගීතාඃ ප්‍රකුරුතෙ, ගීකියයි. ශතං ප්‍රකුරුතෙ, ද්‍රව්‍ය සියයක් නියොග කෙරෙයි. [පාණිනිඃ 1. 3. 32.]

(මු-) 887. **අධෙඃ ශක්තෞ.** (අධෙඃ 5. ශක්තෞ 7.)

දෛත්‍යානධිකුරුතෙ කෘෂ්ණඃ.

(ස-) ශක්තෞ, අභිභවයෙහි; අධෙඃ, අධිපූර්වවූ කෘඤ ධාතුහු කෙරෙන් කර්තෘ වාච්‍ය කල්හි ආත්මනෙපදය වන්නේය. කෘෂ්ණඃ, කෘෂ්ණතෙම; දෛත්‍යාන්, අසුරයන්; අධිකුරුතෙ, අභිභවනය කෙරෙයි. [පාණිනිඃ 1. 3. 33.]

(මු-) 888. **ශබ්දකර්මණොවෙඃ.** (ශබ්දකර්මණ 5. වෙඃ 5.)

ස්වරාන් විකුරුතෙ, වායුර්විකුරුතෙ. අන්‍යත්‍ර චිත්තං විකරොති කාමඃ*.

(ස-) වෙඃ, විඋපසර්ගයා කෙරෙන් පරවූ ; ශබ්දාඵාඵාත්, ශබ්දය කර්මවූද කර්මරහිතවූද කෘඤ්ධාතුහුකෙරෙන් කර්තෘවාච්‍ය කල්හි ආත්මනෙපදය වන්නේය.

ස්වරාන්, ශබ්දයන් ; විකුරුතෙ, විශෙෂයෙන කෙරෙයි. මෙහි ශබ්දය කර්මයි, වායුර්විකුරුතෙ, වාතයතොම විකාරවූයේ වෙයි. මෙහි ධාතුව කර්මරහිතයි. අන්‍යත්‍ර, අන්‍යාර්ථයෙහි; චිත්තං විකරොති කාමඃ යන මේ අද්‍යර්ථයෙහි විපූර්ව කෘධාතුව ශබ්දය කර්මවත් නොවනහෙයින්ද අකර්මක නොවනහෙයින්ද පරස්මෛපදය වේ. [පාණිනිඃ 1. 3. 34, 35.]

(මු-) 889. **ඥනාර්චොත්ක්ෂෙපොපනයන භෘතිවිගණනව්‍යයෙෂු නීඤඃ.** (ඥන—ව්‍යයෙෂු 7...නීඤඃ5.)

ශාස්ත්‍ර නයතෙ, විෂ්ණුංනයතෙ, දණ්ඩමුන්නයතෙ, පුත්‍රමුපනයතෙ, භෘත්‍යමුපනයතෙ, ඍණං විනයතෙ, ද්‍රව්‍යං විනයතෙ.

(ස-) ඥන, ප්‍රමාණකටයුත්තාහුගේ නිශ්චය ; අර්ච, පූජාය, උත්ක්ෂෙප, එසවීම හෝ නැගීමය; උපනයන, යඥසූත්‍රදාන සංස්කාරය; භෘති, වැටුප්ය; විගණන, නයගෙවීමය ; ව්‍යයෙෂු, මේ තෙම වනාහි මේ ද්‍රව්‍ය කරණකොටගෙන කටයුතුයයි නියොගය යනමේ අර්ථයන් කෙරෙහි පවත්නාකල්හි ; නීඤඃ, නීඤධාතුහුකෙරෙන් කර්තෘයෙහි ආත්මනෙපදය වන්නේය.

ශාස්ත්‍ර නයතෙ, ප්‍රමෙය නිශ්චයකෙරේ ; විෂ්ණුං නයතෙ, විෂ්ණුට පුදයි ; දණ්ඩමුන්නයතෙ, දණ්ඩ ඔසවා ; පුත්‍රමුපනයතෙ, පුත්‍රයා යඥසූත්‍රදානයෙන් සංස්කාරකෙරෙයි ; භෘත්‍යමුපනයතෙ, මෙහෙකරුහට වැටුප්දෙයි ; ඍණං විනයතෙ, නය ශුධකෙරේ ; ද්‍රව්‍යං විනයතෙ, මේ කරණකොටගෙන කටයුතුයයි ද්‍රව්‍ය නියොග කෙරේ. [පාණිනිඃ 1. 3. 36.]

---

* ශබ්දෙ ඵං යස්‍ය සඃ, නාස්ති ඵං යස්‍ය සො'ඵඃ, ශබ්දඵශ්ච අඵශ්ච තත්තස්මාත්.

(මු-) 890. **සස්ථාමූර්තිකාත්.** (සස්ථාමූර්තිකාත් 5.)

ක්‍රොධං විනයතෙ. සස්ථං කිං, ගුරොඃ ක්‍රොධං විනයති. අමූර්තිං කිං, ගණ්ඩං විනයති.*

(ස-) සස්ථාමූර්තිකාත්, කර්තෘයෙහි සිටි අශරීරික හෝ ආකාර රහිත කර්මයා කෙරෙන් පරවූ නීඤ ධාතුහු කෙරෙන් කර්තෘ වාච්‍ය කල්හි ආත්මනෙපදය වන්නේය.

ක්‍රොධං විනයතෙ, ක්‍රොධය සමනය කෙරෙයි. මෙහි ක්‍රොධය කර්තෘකෙරෙහි පිහිටි ආකාරරහිත අශරීරික කර්මයයි. සස්ථං කිං, සස්ථං යනු කුමටය? ගුරොඃ ක්‍රොධං විනයති යනාදියෙහි ක්‍රොධය කර්තෘ කෙරෙහි නොපිහිටි බැවින් පරස්මෛපදයි. අමූර්තිං කිං, අමූර්තිං යනු කුමටය? ගණ්ඩං විනයති යනාදියෙහි ගණ්ඩය ආකාරවත් බැවින් පරස්මෛපදයි. [පාණිනිඃ 1. 3. 37.]

(මු-) 891. **වෘත්ත්‍යුත්සාහතායනෙ ක්‍රමඃ පරොපක්‍රමඃ.** (වෘත්ති-උත්සාහ-තායනෙ 7. ක්‍රමඃ 5. පරා-උප-ක්‍රමඃ 5.)

සෘක්ෂු ක්‍රමතෙ බුද්ධිඃ. ධර්මාය ක්‍රමතෙ සාධුඃ. ශතාං ශ්‍රීඃ ක්‍රමතෙ. පරාක්‍රමතෙ උපක්‍රමතෙ.

(ස-) වෘත්ත්‍යුත්සාහතායනෙ, අප්‍රතිබන්ධය උත්සාහය වැඩිය යන මේ අර්ථයන් කෙරෙහි; ක්‍රමඃ, ක්‍රමධාතුහු කෙරෙන් පරවද; පරොපක්‍රමඃ, පරා උප යන උපසර්ගයන් කෙරෙන් පරවූ ක්‍රමධාතුහු කෙරෙන්ද කර්තෘයෙහි ආත්මනෙපදය වන්නේය.

බුද්ධිඃ, බුද්ධිතොමෝ; සෘක්ෂු, වෙදවිෂයෙහි; ක්‍රමතෙ, නොනස්නාලද්දී වන්නීය. ධර්මාය ක්‍රමතෙ, ධර්මය පිණිස යත්න කෙරේ. ශ්‍රීඃ ක්‍රමතෙ, ශ්‍රීතොමෝ වැඩෙන්නීය. [පාණිනිඃ 1. 3. 38, 49.]

(මු-) 892. **ආඞො හොද්ගමෙ.** (ආඞඃ 5. හොද්ගමෙ 7.)

ආක්‍රමතෙ අර්කඃ. හොද්ගමෙ කිං, ආක්‍රාමති ධූමඃ, ඛං ව්‍යාප්නොතීත්‍යර්ථඃ.†

---

* සෙ කර්ත්තරි තිෂ්ඨතීති සස්ථං, සස්ථං අමූර්තිං ඪං යස්‍ය ස තස්මාත්.

† හා ජ්‍යොතී රස්‍යාස්තීති හඃ අර්කආදිත්‍යාදඃ.

(ස-) හොද්ගමෙ, චන්ද්‍රසූය්‍ය්‍යාදීන්ගේ උදයෙහි ; ආඞඃ, ආඞ් උපසග්ගයා කෙරෙන් පරවූ ක්‍රමධාතුහු කෙරෙන් කත්තෘ වාච්‍ය කල්හි ආත්මනෙපදය වන්නේය.

ආක්‍රමතෙ අක්‍ක:, ඡිරු නැගෙයි ; හොද්ගමෙ කිං, හොද්ගමෙ යනු කුමටය ? ආක්‍රාමති ධූම:, යනාදියෙහි ධූමය අහස්හි පැතිරෙයි යන අර්‍ථාදියෙහි පරස්මෛපදයි. [පාණිනිඃ 1. 3. 40.]

(මු-) 893. වෙඃ පද්භිඃ. (වෙඃ 5. පද්භිඃ 3...)

සාධු වික්‍රමතෙ වාජී. පද්භිඃ කිං, වාජිනා වික්‍රාමති රාජා.

(ස-) පද්භිඃ, පාදයන් කරණකොට ගෙන ධාත්වර්‍ථය නිෂ්පනන කල්හි ; වෙඃ, වි උපසග්ගයා කෙරෙන් පරවූ ක්‍රමධාතුහු කෙරෙන් කත්තෘයෙහි ආත්මනෙපදය වන්නේය.

සාධු වික්‍රමතෙ වාජී, අසුපාදයන් කරණකොටගෙන මනාව යෙයි. පද්භිඃ කිං, පද්භිඃ යනු කුමටද ? වාජිනා ගච්ඡති රාජා යනාදියෙහි පරස්මෛපදයි. [පාණිනිඃ 1. 3. 41.]

(මු-) 894. ප්‍රෝපාදාරම්භෙ. (ප්‍ර-උපාත් 5. ආරම්භෙ 7.)

භොක්තුං ප්‍රක්‍රමතෙ උපක්‍රමතෙ.

(ස-) ආරම්භෙ, ආරම්භය කියනකල්හි ; ප්‍රෝපාත්, ප්‍ර-උප යන දෙදෙනා කෙරෙන් පරවූ ක්‍රමධාතුහු කෙරෙන් කත්තෘ වාච්‍ය කල්හි ආත්මනෙපදය වන්නේය.

භොක්තුං ප්‍රක්‍රමතෙ, අනුභවය පිණිස ආරම්භකෙරේ. උපක්‍රමතෙ. [පාණිනිඃ 1. 3. 42.]

(මු-) 895. වා'ගෙඃ. (වා 1. අගෙඃ 5.)

ක්‍රමතෙ ක්‍රාමති.*

(ස-) අගෙඃ, ගිසංඥයා රහිතවූ ක්‍රමධාතුහු කෙරෙන් ; වා, විකල්පයෙන් කත්තෘයෙහි ආත්මනෙපදය වන්නේය.

උපසග්ග රහිතවූ ක්‍රමධාතුහු කෙරෙන් උභයපදය වෙයි යන අර්‍ථයි. ක්‍රමතෙ ක්‍රාමති. [පාණිනිඃ 1. 3. 43.]

(මු-) 896. නිහ්නවෙ ඥඃ. (නිහ්නවෙ 7. ඥඃ 5.)

ශතමපජානීතෙ.

---

* නාසති ශ්‍රී සසමින් සොංගිසනසමාත්.

(ස-) නිහ්නවෙ, විද්‍යමාන දෙය අවිද්‍යමාන වශයෙන් සඟවා කියන කල්හි ; ඥඃ, ඥධාතුහු කෙරෙන් පරව කර්තෘයෙහි ආත්මනෙපදය වන්නේය. ශතමපජානීතෙ, සියවරක් සඟවා කියයි. [පාණිනිඃ 1. 3. 44.]

(මු-) 897. අකර්මකාත්. (අකර්මකාත් 5.)

සර්පිෂො ජානීතෙ.

(ස-) අකර්මකාත්, කර්මරහිතවූ ඥධාතුහු කෙරෙන් කර්තෘ වාච්‍ය කල්හි ආත්මනෙපදය වන්නේය.

සර්පිෂො ජානීතෙ, ගිතෙල් කරණකොටගෙන පවත් යන අර්ථයි. (303) ඥො'විදර්ථස්‍ය කරණෙ යන මෙයින් කරණයෙහි ෂෂ්ඨී යයි. [පාණිනිඃ 1. 3. 45.]

(මු-) 898. සංප්‍රතිභ්‍යාමනාධ්‍යානෙ. (සංප්‍රතිඃ 5. අනාධ්‍යානෙ 7.)

සංජානීතෙ ප්‍රතිජානීතෙ. අනාධ්‍යානෙ කිං, පුත්‍රං සංජානාති.

(ස-) අනාධ්‍යානෙ, සිහිකිරීම් රහිතවූ අර්ථයෙහි ; සංප්‍රතිඃ, සං ප්‍රති යන උපසර්ගයන් කෙරෙන් පරවූ ඥධාතුහු කෙරෙන් කර්තෘයෙහි ආත්මනෙපදය වන්නේය.

සංජානීතෙ ප්‍රතිජානීතෙ යනු අයත්කෙරෙයි යන අර්ථයි. අනාධ්‍යානෙ කිං, අනාධ්‍යානෙ යනු කුමටද? පුත්‍රං සංජානාති යනාදියෙහි සිහිකිරීම් අර්ථයෙහි පරස්මෛපදයයි. [පාණිනිඃ 1. 3. 46.]

(මු-) 899. සනෝ'නෝ'සනශ්ච ස. (සනඃ 5 ණෙ 7. අසනශ්ච 7. ස 7.)

දර්ශයතෙ භවො භක්තාන්. අසනශ්ච යත් ඩං නාවෙවත්. ස ඉති කිං-දර්ශයති ශම්භුං භක්තාන් භක්තිඃ. සමෘතෙශ්ච තු සමාරයති භක්තාන් හරිඃ.

(ස-) අසනශ්ච, සන්ප්‍රත්‍යය නැතිකල්හි ; ණෙ, කර්මයෙහි ; සෙ, සන්ප්‍රත්‍යයාන්ත තන්හි ඒ කර්මය කර්තෘත්වයෙන් සිටිකල්හි ; සනඃ, සන්ප්‍රත්‍යයාන්ත ධාතුහු කෙරෙන් කර්තෘයෙහි ආත්මනෙපදය වන්නේය ; සමෘත්‍යර්ථයෙහි ආත්මනෙපදය නොවන්නේය.

භක්තාඃ භවං පශ්‍යන්ති යනු සන්ප්‍රත්‍යය රහිත කල්හි පරස්මෛපදයෙහි යෙදීමයි. දර්ශයතෙ භවො භක්තාන් යනු සන්ප්‍රත්‍යයාන්තවූ කල්හි යෙදීමයි, සන් රහිතකල්හි වූ භවං

යන කර්මය ණිඞ් යෙදූ කල්හි භවඃ යි ආත්මනෙපදයෙහි කර්තෘත්වයෙන් සිටියි. ආත්මානං යන කර්මය ශෙෂයයි.

අණෞ යත් කර්ම ණෞ චෙත් ස ඉති කිං, සෙ යනු කුමටය? දර්ශයති ශම්භුං භක්තාන් භක්තිඃ යන මෙහි භක්තිය කර්තෘවූ බැවින් ආත්මනෙපදය නොවිමයි. භක්තාඃ ශම්භුං පශ්‍යන්ති යන මෙහි ණිඞ් රහිත කල්හි ශම්භුං යි කර්මයෙන් සිටි පදය ණිඞ් යොජිත කල්හි කර්තෘ නොව භක්තිඃ යන්න කර්තෘත්වයෙන් සිටිහෙයින් පරස්මෛපදය විමයි. සමෘතෙ ත්‍ය, සමෘතියෙහි වනාහි ණිඞ්ප්‍රත්‍යයාන්ත නුවූ කල්හි කර්මවූ හරිශබ්දය ණිඞ්ප්‍රත්‍යයාන්තවූ කල්හි කර්තෘත්වය ඇතිකල්හිද සමරණීය බැවින් ආත්මනෙපදය නොවෙ. [පාණිනිඃ 1. 3. 67.]

(මූ-) 900. **ඥානයත්න ප්‍රලොභෙ වදඃ.** (ඥාන-යත්න-ප්‍රලොභෙ 7. වදඃ 5.)

පාණිනිර්වදතෙ, ක්ෂෙත්‍රෙ වදතෙ, ශිෂ්‍යමුපවදතෙ.

(ස-) ඥානයත්න ප්‍රලොභෙ, ඥානය-යත්නය-ප්‍රලොභය යන මේ අර්ථයන් කෙරෙහි ; වදඃ, වදෛ වාචි යන ධාතුහු කෙරෙන් කර්තෘ වාච්‍ය කල්හි ආත්මනෙපදය වන්නේය.

පාණිනිර්වදතෙ, පාණිනිතෙම කීම දනී යන අර්ථයි. ක්ෂෙත්‍රෙ වදතෙ, ක්ෂෙත්‍රයෙහි යත්න කෙරෙයි යන අර්ථයි, ශිෂ්‍යමුපවදතෙ, ශිෂ්‍යයාට ලොභ උපදවයි යන අර්ථයි. [පාණිනිඃ 1. 3. 47.]

(මූ-) 901. **අනොරකර්මකාත්.** (අනොඃ 5. අකර්මකාත් 5.)

අනුවදතෙ.

(ස-) අනොඃ, අනුපූර්වවූ ; අකර්මකාත්, අකර්මකවූ වදධාතුහු කෙරෙන් කර්තෘයෙහි ආත්මනෙපදය වන්නේය.

අනුවදතෙ, රාමතෙම යම්සේ කියාද කෘෂ්ණද එසේ කියයි යන අර්ථයි. අකර්මකාත් යනු කුමටය? පූර්වොක්තං අනුවදති, යන තන්හි කර්මවත් කල්හි පරස්මෛපදය විමයි. [පාණිනිඃ 1. 3. 49.]

(මූ-) 902. **විමති-ව්‍යක්තසහොක්ත්‍යාඃ.** (විමති-ව්‍යක්ත සහොක්ත්‍යාඃ 7..)

විවදන්තෙ ශිෂ්‍යාඃ. ව්‍යක්තං කිං, සංප්‍රවදන්ති ඛගාඃ.*

---

* විවිධාමතිර් විමතිඃ, ව්‍යක්තා වාචො සහොක්තිශ්චෙති ව්‍යක්තසහොක්තිඃ, විමතිශ්ච ව්‍යක්තසහොක්තිශ්ච තෙ තාභ්‍යාඃ.

(ස-) විමති, විවිධවූ මතිඇත්තේය ; ව්‍යක්තසංභොක්තාඃ, ව්‍යක්තවූ කථාව අන්‍යයන් හා සමග කෙරේ යන මේ අර්ථයද යන දෙක්හි පවත්නාවූ වදධාතුහු කෙරෙන් කර්තෘයෙහි ආත් මනෙපදය වන්නේය.

විවදන්තෙ ශිෂ්‍යාඃ යනු අර්ථයෙහි උදාහරණයි, ශිෂ්‍යයෝ විවිධවූ ඥානය මුල්කොට පවත්නා කථාව කෙරෙත් යනු එක උදාහරණාර්ථයයි. ව්‍යක්තව අන්‍යයන් හා සමග කියත් යනු අන්‍යාර්ථයයි. ව්‍යක්තං කිං, ව්‍යක්තං යනු කුමටය? සංප්‍රවදන්ති ඛගාඃ යන්නෙහි විවිධඥාන රහිතවූ අව්‍යක්තශබ්දයෙහි පව ත්නා වදධාතුවෙහි ආත්මනෙපදය නොවීමයි. [පාණිනිඃ 1. 3. 48.]

(මු-) 903. තද්‍යොගෙ වා. (තද්‍යොගෙ 7. වා 1.)

විප්‍රවදන්තෙ විප්‍රවදන්ති වෛද්‍යාඃ.

(ස-) තද්‍යොගෙ, ඒ විමතිය ව්‍යක්තවූ සංභොක්තිය යන මොවුන්ගේ යොගයෙහි වදධාතුහු කෙරෙන් ; වා, විකල්ප යෙන් කර්තෘයෙහි ආත්මනෙපදය වන්නේය.

විප්‍රවදන්තෙ වෛද්‍යාඃ, වෛද්‍යයෝ විවිධඥාන පූර්වකවූ කථාව කියත් ක්‍යාද, ව්‍යක්තවූ කථාව අන්‍යයන් සමග කෙරෙත් කියාද අර්ථයි. උභයපදයම වේ. [පාණිනිඃ 1. 3. 50.]

(මු-) 904. අවාද් ගිරඃ. (අවාත් 5. ගිරඃ 5.)

අවගිරතෙ.

(ස-) අවාත් ගිරඃ, අවපූර්වවූ ගිරධාතුහු කෙරෙන් කර්තෘ යෙහි ආත්මනෙපදය වන්නේය. අවගිරතෙ, යනු ඊට උදා හරණයි. [පාණිනිඃ 1. 3. 51.]

(මු-) 905. සමඃ ප්‍රතිඥායාං. (සමඃ 5. ප්‍රතිඥායාං 7.)

ශතං සංගිරතෙ.

(ස-) සමඃ ප්‍රතිඥායාං, සම් උපසර්ගයා කෙරෙන් පරවූ ගිර ධාතුහු කෙරෙන් ප්‍රතිඥාර්ථයෙහි කර්තෘ වාච්‍ය කල්හි ආත්මනෙ පදය වන්නේය.

ශතං සංගිරතෙ, සියයක් ප්‍රතිඥා කෙරෙයි යන අර්ථයි. [පාණිනිඃ 1. 3. 52.]

(මු-) 906. උච්චරඃ සඃකාත්. (උත්චරඃ 5. සඃකාත් 5.)

ධර්මමුච්චරතෙ-සඃකාත් කිං, ධූම උච්චරති.

(ස-) උච්චරඃ සඪාත්, සකර්මකවූ උත් පූර්ව චරධාතුහු කෙරෙන් කර්තෘයෙහි ආත්මනෙපදය වන්නේය.

ධර්මමුච්චරතෙ, ධර්මය උත්ක්‍රමණය හෝ උල්ලඞ්ඝනය කෙරෙයි. සඪාක් කිං, සඪාත් යනු කුමටය? ධූමඋච්චරති යන්නෙහි චරධාතුව කර්ම රහිත කල්හි ආත්මනෙපදය නොවීමයි. ධූමය ඌර්ධ්වභාගයට නඟියි. [පාණිනි 1. 3. 53.]

(මු-) **907. සමස්තෘතා.** (සමඃ 5. තෘතා 3.)

අශ්වෙන සඤ්චරතෙ.

(ස-) තෘතා, කරණ තෘතීයාන්තයා සමග යෙදුනු කල්හි; සමඃ, සම් උපසර්ගයා කෙරෙන් පරවූ චරධාතුහු කෙරෙන් කර්තෘයෙහි ආත්මනෙපදය වන්නේය.

අශ්වෙන සඤ්චරතෙ, අශ්වයා කරණකොටගෙන සඤ්චාරණය කෙරේ. හෙතුයෙහිද සහාර්ථයෙහිද තෘතීයාව හා සමග ආත්මනෙපදය නොවන්නේය, එහෙයින් පූර්ණෙන සඤ්චරති පුත්‍රෙණ සඤ්චරති යන හෙත්වර්ථ සහාර්ථ දෙක්හි ආත්මනෙපදය නොවේ. [පාණිනිඃ 1. 3. 54.]

(මු-) **908. දානඃ සා චෙච්චථ්‍යර්ථෙ.** (දානඃ 5. සා 1. චෙත් 1. චථ්‍යර්ථෙ 7.)

දාස්‍යා සංයච්ඡතෙ කාමී. චථ්‍යර්ථෙ කිං, දාස්‍යා සංයච්ඡති භික්ෂාං භික්ෂවෙ.

(ස-) සා, ඒ තෘතීයාතොමෝ ; චෙත්, ඉදින් ; චථ්‍යර්ථෙ, චතුර්ථ්‍යර්ථයෙහි වන්නීද එකල්හි ඒ තෘතීයාන්තයා හා සමග සංපූර්වවූ; දානඃ, දානධාතුහු කෙරෙන් ආත්මනෙපදය වන්නේය.

කාමීජනතෙමේ; දාස්‍යා සංයච්ඡතෙ, දාසියට වස්ත්‍රාදිය දෙයි යන අර්ථයි. චථ්‍යර්ථෙ කිං, චථ්‍යර්ථෙ යනු කුමටය? දාස්‍යා, දාසිය කරණකොටගෙන; භික්ෂාං සංයච්ඡති යන මෙහි කරණාර්ථයෙහි දානධාතුහු කෙරෙන් ආත්මනෙපදය නොවෙයි. ආත්මනෙපදෝදාහරණයෙහි දාස්‍යා යන්න (293) අධර්මසම්ප්‍රදානයෙහි තෘතීයායි. [පාණිනිඃ 1. 3. 55.]

(මු-) **909. උප-යමො විවාහෙ.** (උපයමඃ 5. විවාහෙ 7.)

රාමඃ සීතාමුපායත උපායංස්ත.

(ස-) උපයමඃ, උප පූර්වවූ යමධාතුහු කෙරෙන්; විවාහෙ, විවාහාර්ථයෙහි කර්තෘ වාච්‍ය කල්හි ආත්මනෙපදය වන්නේය.

විවාහාපීයෙන් ස්වීකාරාර්ථය වක්තව්‍යයයි දුර්ගාදසතෙමේ කීයයි, එහෙයින් විශ්වාමිත්‍රාදසත්‍රමුපයෙමෙ යනාදිය වේ. උප-යම-ටී-තන්, සි, (880) සිහට විකල්පයෙන් කිත්සංඥ බැවින් (676) ඤම්ලොපය කල කල්හි (562) සිහට ලොප්වේ, උපායත. රාමතෙම සීතාව විවාහ කෙළේය. කිත්ත්ව විකල්ප පක්‍ෂයෙහි (50) මකාරයහට අනුස්වාරය වේ, උපායංස්ත. [පාණිනිඃ 1. 3. 56.]

(මු-) 910. **භුජො'ශනෙ.** (භුජඃ 5. අශනෙ 7.)

ශාලීන් භුඞ්ක්තෙ ගෞඃ. අනශනෙ තු පෘථ්වීං භුනක්ති රාජා.

(ස-) අශනෙ, භොජනාපීයෙහිවූ; භුජඃ, භුජධාතුහුකෙරෙන්; කර්තෘයෙහි ආත්මනෙපදය වන්නේය. ගෞඃ, ගවතෙම; ශාලීන්, ධාන්‍යයන්; භුඞ්ක්තෙ, කයි; අනශනෙ තු, භොජන භිනනාපීයෙහි වනාහි; පෘථිවීං භුනක්ති රාජා, රජතෙම පෘථිවිය පාලනය කෙරෙයි. උපභොගාපීයෙහිද කිසිතැන්හි මහා කවිප්‍රයොගාදියෙහි ආත්මනෙපදය වන්නේය යනු වක්තව්‍යයයි. ඒ මෙසේයි, බුභුජෙ පෘථිවීපාලඃ පෘථිවීමෙව කෙවලාම්, යනාදියෙහියි. [පාණිනිඃ 1. 3. 66.]

(මු-) 911. **සංක්ෂ්ණුඃ.** (සංක්ෂ්ණුඃ 5.)

ශස්ත්‍රං සංක්ෂ්ණුතෙ.

(ස-) සංක්ෂ්ණුඃ, සංපූර්වවූ ක්ෂ්ණුධාතුහුකෙරෙන් කර්තෘයෙහි ආත්මනෙපදය වන්නේය. සංක්ෂ්ණුතෙ, තියුණු කෙරේ. [පාණිනිඃ 1. 3. 65.]

(මු-) 912. **යුජිර උද්ගාව්‍යවො'යඥපාත්‍රෙ.** (යුජිරඃ 5. උද්ගාව්‍යවඃ 5. අයඥපාත්‍රෙ 7.)

උද්යුඞ්ක්තෙ ප්‍රයුඞ්ක්තෙ. යඥපාත්‍රෙ තු ප්‍රයුනක්ති සෘවං.*

(ස-) උද්ගාව්‍යවඃ, උත්හු කෙරෙන්ද ගිසංඥයාගේ ස්වරයා කෙරෙන්ද පරවූ; යුජිරඃ, යුජිරේ යොගේ යන ධාතුහු කෙරෙන් පරව කර්තෘයෙහි ආත්මනෙපදය වන්නේය; අයඥපාත්‍රෙ, යඥපාත්‍රය යොදනුලබන කල්හි ආත්මනෙපදය නො වන්නේය.

උද්යුඞ්ක්තෙ යනු උත්පූර්ව යුජිරධාතුයි, ප්‍රයුඞ්ක්තෙ යනු

---

* උත් ව, ගෙරවව තනනස්මාත්.

ප්‍රපුච්ඡි. යඥපාත්‍රෙ තු ප්‍රයුනක්ති ස්‍රැවං, නුගපතක ආකාරවූ උගුරුස්ස දණ්ඩෙන් කරණලද ස්‍රැච් නම් යාගපාත්‍රය යාග යෙහි නියොගකෙරෙයි යන අර්ථයි. මෙහි පරස්මෛපදයයි. [පාණිනිඃ 1. 3. 64.]

(මු-) 913. **ප්‍රතාරෙ වඤ්චි-ගර්ධ්ඃ.** (ප්‍රතාරෙ 7. වඤ්චි-ගර්ධ්ඃ 5.)

වටුං වඤ්චයතෙ ගර්ධයතෙ. ප්‍රතාරෙ කිං, ශ්‍යෙනො'හිං වඤ්චයති.

(ස-) වඤ්චිගර්ධ්ඃ, වඤ්චුගත්‍යාං, ගෘධිර්ශුලිප්සෙ යන ධාතු දෙකින් ප්‍රෙරණය ඤ්‍යන්තය යන දෙදෙනා කෙරෙන් පරව; ප්‍රතාරෙ, වඤ්චාකිරීමෙහි කර්තෘයෙහි ආත්මනෙපදය වන් නේය.

විසංවාදනයයි දුර්ගසිංහතෙමේ කියයි. වටුං, බ්‍රාහ්මණකුමා රයා; වඤ්චයතෙ ගර්ධයතෙ, වඤ්චාකරවයි යන අර්ථයි. ප්‍රතා රෙ කිං, ප්‍රතාරෙ යනු කුමටය? ශ්‍යෙනො අහිං වඤ්චයති, පක්‍ෂිතෙම සර්පයා ගමන් කරවයි යන මෙහි වඤ්චා රහිත බැවින් ආත්මනෙපදය නොවේ. [පාණිනිඃ 1. 3. 69.]

(මු-) 914. **පූජාභිභවෙ ච ලාපෙඃ.** (පූජාභිභවෙ 7. ච 1. ලාපෙඃ 5.)

ජටාභිර්ලාපයතෙ. ශ්‍යෙනො වර්තිකාමුල්ලාපයතෙ. පුත්‍ර මුල්ලාපයතෙ. එෂු කිං, ඝෘතං විලාපයති.

(ස-) පූජාභිභවෙ ච, පූජාවෙහිද අභිභවයෙහිද චකාරය හෙතුකොටගෙන ප්‍රතාරණයෙහිද; ලාපෙඃ, ලාපි යන්නහු කෙරෙන් කර්තෘයෙහි ආත්මනෙපදය වන්නේය.

ලීධාතුහු කෙරෙන් ඤිප්‍රත්‍යය වන්නේය, (745) ඕා, පක්‍ෂ යෙහි ලාධාතුහු කෙරෙන් ඤිප්‍රත්‍යය වේ, ධාතුවය ආකා රාන්ත බැවින් (784) පණ්. ලාපි යන රූපයයි. ජටාභිඃ, ජටිලකෙශවලින් නොහොත් පුෂ්ප ජටාවලින්; ලාපයතෙ, පූජාකරවයි. ශ්‍යෙනඃ, උකුසුතෙම; වර්තිකාමුල්ලාපයතෙ, වර්තිකා (වටු) ධෙනුව අභිභවය කරවයි. පුත්‍රමුල්ලාපයතෙ, පුත්‍රයා වඤ්චාකරවයි. එෂු කිං, මේ කියනලද්දවුන් කෙ රෙහි ආත්මනෙපදය කුමටය? ඝෘතං විලාපයති, යන මෙහි ද්‍රවීකරණාර්ථයෙහිවූ, ලාධාතුහු කෙරෙන් පරස්මෛපදය විමයි.

(මූ-) **915. මිථ්‍යා කාරෙ රභ්‍යාසෙ.** (මිථ්‍යා 5. කාරෙඃ 5. අභ්‍යාසෙ 7.) පදං මිථ්‍යාකාරයතෙ.

මිථ්‍යා කිං, සාධු පදං කාරයති. අභ්‍යාසෙ කිං, සකෘත් පදං මිථ්‍යා කාරයති.

(ස-) මිථ්‍යා, මිථ්‍යාශබ්දයා කෙරෙන් පරවූ ; කාරෙඃ, කාරි යන්නාහු කෙරෙන් අභ්‍යාසෙ, පෞනඃපුන්‍යයෙහි කර්තෘ වාච්‍ය කල්හි ආත්මනෙපදය වන්නේය.

පදං මිථ්‍යා කාරයතෙ, ස්වරාදියෙන් දූෂ්‍යවූ පදය නැවත නැවත උච්චාරණය කරවයි. මිථ්‍යා කිං, මිථ්‍යා යනු කුමටය? සාධු පදං කාරයති, දූෂ්‍යනුවූ පදය නැවත නැවත උච්චාරණය කරවයි, යන අර්ථයෙහි පරස්මෛපදය වීමයි. අභ්‍යාසෙ කිං, අභ්‍යාසෙ යනු කුමටද? සකෘත් පදං මිථ්‍යා කාරයති, ස්වරාදියෙන් දූෂ්‍යවූ පදය එක්වරක් උච්චාරණය කරවයි යන මේ අර්ථයෙහි පරස්මෛපදය වීමයි. [පාණිනිඃ 1. 3. 71.]

(මූ-) **916. ව්‍යතීහාරෙ ගතිහිංසාශබ්දාර්ථ-හසාන්‍ය හෘවහො'නන්‍යොන්‍යාර්ථෙ.** (ව්‍යතීහාරෙ 7. ගති—වහඃ 5. අනන්‍යොන්‍යාර්ථෙ 7.)

ව්‍යති භවතෙ අර්කමින්දූඃ, ව්‍යති හරතෙ ව්‍යති වහතෙ. ව්‍යති ජක්ෂිෂ්ව ව්‍යතිජක්ෂිධ්වං.*

(ස-) ගති හිංසා ශබ්දාර්ථ හසාන්‍ය, ගමනාර්ථධාතු හිංසාර්ථ ධාතු ශබ්දාර්ථධාතු හසධාතු යන මේ ධාතූන් කෙරෙන් අන්‍යවූ ධාතූන් කෙරෙන්ද ; හෘ වහඃ, හෘධාතු වහධාතු යන මොවුන් කෙරෙන්ද ; ව්‍යතීහාරෙ, ව්‍යතීහාරයෙහි කර්තෘයෙහි ආත්මනෙපදය වන්නේය ; අනන්‍යොන්‍යාර්ථෙ, අන්‍යොන්‍යාර්ථශබ්ද ප්‍රයොගකරණුලබන කල්හි නොවන්නේය.

ව්‍යතිභවතෙ අර්කමින්දූඃ, හිරු චන්ද්‍රයා අස්තයට ගිය කල්හි යම්සේ උදයවේද චන්ද්‍රතෙමේද හිරු අස්තගතවූකල්හි එසේම උදයවෙයි යනු ව්‍යතීහාරයයි, එහෙයින් චන්ද්‍රතෙම හිරු මෙන්

---

* ගතිශ්ච හිංසා ච ශබ්දශ්ච ගතිහිංසාශබ්දාඃ, තෙ අර්ථා යෙෂාං තෙ ගතිහිංසාශබ්දාර්ථාඃ. තෙ ච හසශ්ච තෙ ගතිහිංසාශබ්දාර්ථහසාඃ, තෙභ්‍යො'න්‍යඃ ගතිහිංසාශබ්දාර්ථ හසාන්‍යඃ, ගතිහිංසාශබ්දාර්ථහසාන්‍යශ්ච හෘශ්ච වහශ්චෙති තස්මාත්. අන්‍යොන්‍යස්‍ය අර්ථ ඉව අර්ථො යස්‍ය සො'න්‍යොන්‍යාර්ථඃ න අන්‍යොන්‍යාර්ථො'නන්‍යොන්‍යාර්ථස්තස්මින්.

අසනාවෙයි යන අර්ථයි. අන්‍යොන්‍යයන් ඒකජාතීය ක්‍රියාකරණය ව්‍යතීහාරයයි. හෘ-වහ ධාතුවය ගමනාර්ථ බැවින් වෙනම ගැන්මයි. ව්‍යති හරතෙ ව්‍යති වහතෙ කාෂණ්ං බාලකඃ. එසේම ව්‍යතිහරණෙන ධාන්‍යං චෞරඃ, ව්‍යති වහමානා භාරං කාෂකාඃ යනාදිය වේ. ව්‍යති ජඥිෂ්ව, ඛිං යනු ශෙෂයයි. ව්‍යති ජඥිධ්වං, යූයං යනුද ශෙෂයයි. මෙහි ජනමලිජ් නෞ, (726) විඩද, (708) ඉම්ද, (230) ළුඞ්ලොපයද වෙත්. [පාණිනිඃ 1. 3. 14, 15, 16.]

(මු-) 917. හො'සෙනා රෙනි. (හඃ 1. අසෙතඃ 6. එනි 7.) අසෙතාභිඃ සන්‍යදෙකාරෙ පරෙ. ව්‍යතිහෙ.

(ස-) එකාරෙ පරෙ, එකාරයා පරකල්හි; අසෙතඃ, අසධාතුහට ; හඃ සන්‍යත්, හකාර වන්නේය. ව්‍යති අසධාතු, කී—එ, මෙයින් ධාතුහට හකාර වේ, ව්‍යතිහෙ.

(මු-) ගත්‍යර්ථාදෙසතු, ව්‍යතිසර්පන්ති ව්‍යතිස්නන්ති ව්‍යති ජල්පන්ති ව්‍යතිහසන්ති අන්‍යොන්‍යාර්ථෙ තු පරස්පරං ව්‍යතිලුනන්ති.

(ස-) ගත්‍යර්ථාදෙසතු, ගත්‍යර්ථාදීහු කෙරෙන් වනාහි; ව්‍යති සර්පන්ති යන මෙහි ගමනාර්ථයෙහිද ව්‍යතිස්නන්ති යන මෙහි හිංසාර්ථයෙහිද ව්‍යතිජල්පන්ති යී ශබ්දාර්ථයෙහිද ව්‍යති හසන්ති යී හසධාතුහු කෙරෙන්ද පරස්මෛපදයි. අන්‍යොන්‍යාර්ථෙ තු, අන්‍යොන්‍යාර්ථයෙහි වනාහි; පරස්පරං ව්‍යති ලුනන්ති යී පරස්පරශබ්දයෙන්ම ව්‍යතිහාරය කියනලද බැවින් ආත්මනෙපදය නොවේ. සම්‍යග්විනිමයෙනො භෞ දධතුර් භුවනවයම් යී රඝුවංශයෙහි විනිමය ශබ්දයද අන්‍යොන්‍යාර්ථ බැවින් ආත්මනෙපදය නොවේ.

(මු-) 918. සම්‍ය දෘශ'නානුඥනාප්‍රතිශ්‍රොඃ සනඃ. (ස්ම්‍ය—ශ්‍රොඃ 5. සනඃ 5.)

එභ්‍යඃ සනන්තෙභ්‍යො මං සන්‍යත්. සුස්මූෂතෙ දිදෘක්ෂතෙ ජිඥසතෙ ශුශ්‍රෑෂතෙ. අන්‍යත්‍ර අනුජිඥසති ආශුශ්‍රෑෂති ප්‍රතිශුශ්‍රෑෂති.*

---

* නාසති අනුර් යස්මින් සො'නනුඃ, සවාසෞ ඥශෙචති අනනුඥඃ. න විද්‍යෙතෙ ආප්‍රතී යස්මින් සො'නාප්‍රතිඃ, සවාසෞ ශ්‍රෑශෙචති අනාප්‍රති ශ්‍රෑඃ. ස්ම්‍යචච දෘශ්ච අනනුඥශ්ච අනාප්‍රතිශ්‍රෑශෙචති තස්මාත්.

(ස-) සනන්තෙභ්‍යඃ, සන්ප්‍රත්‍යයාන්තවූ ; එභ්‍යඃ, ස්මෘධාතු දෘශධාතු දෙකද අනුපූර්ව ඥාධාතුද ආ ප්‍රති වය පූර්වවූ ශ්‍රුධාතුද යන මේ දෙක රහිතවූවන් කෙරෙන්ද ; මං සෘත්, කර්තෘයෙහි ආත්මනෙපදය වන්නේය.

සුස්මූර්ෂතෙ, යනාදි පද සතර කියනලද ධාතු සතරදෙනා හට උදාහරණයි. අන්‍යත්‍ර, අනුපූර්ව ඥාධාතු ආදි නිෂෙධවිෂයෙහි; අනුජිඥාෂයති යනු අනුපූර්ව ඥාධාතුහු කෙරෙන් පරස්මෛපද යෙහි වීමයි. ඉතිරි පද දෙක ආ ප්‍රති පූර්ව ශ්‍රුධාතුහු කෙරෙන් පරස්මෛපදයි. [පාණිනිඃ 1. 3. 57, 58, 59.]

(මූ-) 919. **ඤිඞ් ඤ්‍යන්ත-පිවධෙනෘවදවසද මරුචාද පරි මුහායමයසො'ගිඥපවද ග්‍රන්ථොත් සමාසමඃ එලිනි.** (ඤිත් —යසඃ 5. අගිඥ-සමඃ 5. එලිනි 7.)

ඤිතො - ඤ්‍යන්තපිවාදෙ - රගිජ්ඥාතෙ-රපවදෙ'ග්‍රන්ථො දෘදිපූර්වයමශ්ච එලවති සෙ මං සෘත්.*

(ස-) ඤිතඃ, ඉත්සංඥ ඤකාරයා කෙරෙන්ද ; ඤ්‍යන්තපිවාදෙඃ, ඤිප්‍රත්‍යයාන්තවූ පිවධාතු ආදිකොට ඇති ධෙ-නෘත-වද-වස-දම-රුච-අද-පරිපූර්ව මුහ-ආපූර්ව යම-යස ධාතු දෙකද යන මොවුන් කෙරෙන්ද ; අගිජ්ඥාතෙඃ, ගිසංඥයා රහිතවූ ඥාධාතුහු කෙරෙන්ද; අපවදඃ, අපපූර්වවූ වදධාතුහු කෙරෙන්ද; අග්‍රන්ථොදෘදි පූර්වසමශ්ච, ග්‍රන්ථභින්නාර්ථයෙහි වූ උත්ද සම් ආ දෙකද පූර්වවූ යමධාතුහුකෙරෙන්ද; එලවති සෙ,එලයෙන් යුක්තවූ කර්තෘහු ඇති කල්හි ; මං සෘත්, ආත්මනෙපදය වන්නේය.

මෙහි ඤිත් පදයෙන් ගණපාඨයෙහි ඤානුබන්ධ ධාතුහුද ඤි ප්‍රත්‍යයාන්ත ධාතුහුද ගන්නාලැබෙත්. ඒ ඤිත්ත්වයෙන්ම

---

* පරෙරර් මුහඃ පරිමුහඃ, ආඞො යම-යසෞ ආයමයසෞ, පිවශ්ච ධෙශ්ච නෘත්ව වදශ්ච වසශ්ච දම ච රුචශ්ච අදශ්ච පරිමුහශ්ච ආයමයසෞ චෙති තත්. ඤ්‍යන්තාශ්චාසෞ පිවධෙනෘවදවසදමරුචාද පරිමුහායමයස්චෙති තත්. ඤිච්ච ඤ්‍යන්ත පිවාදි—යස් චෙති තස්මාත්. නාස්ති ගිර් යස්මින් සො'ගිඃ, අගිශ්චාසෞ ඥශ්චෙති අගිඥඃ. අපාත් වදඃ අපවදඃ. උද්ච සම්ච ආශ්ච උත්සමාඃ, තෙභ්‍යඃ යම් උත්සමායම්, න ග්‍රන්ථො'ග්‍රන්ථඃ, අග්‍රන්ථෙ උත්සමායම් අග්‍රන්ථොත්සමායම් තතඃ අගිඥශ්ච අපවදශ්ච අග්‍රන්ථොත් සමායම් චෙති තස්මාත්.

ණිප්‍රත්‍යයාන්තය ලද කල්හි ණ්‍යන්ත පිවාදීහුගේ ගැන්ම (861) කම්පානනාපේ ඩ යනාදියෙන් කරණලද පරස්මෛ පදයාගේ වැළැක්ම පිණිසයි. අන්පරිද්දෙකින් වීනම් පිව-ධෙ-අද යන මේ ධාතූන් ආහාරාර්ථී බැවින් අන්‍යවූ ධාතූන් ණි ප්‍රත්‍යය රහිත කල්හි ප්‍රාණවත් කර්තෘවූ අකර්ම බැවින් පරස්මෛ පදප්‍රාප්තිය වන්නීය, එහෙයින්ද කම්පානනාපේ ඩ යනාදි විශෙෂවිධානය කෙරෙන් පිටත්වූ සියලු ණ්‍යන්ත ධාතූන් කෙරෙන් ඵලවත් කර්තෘහු ඇතිකල්හි ආත්මනෙපදය සිඩයි. තවද, ස්‍යම්ණ්‍යක්විතකේ යනාදි චුරාදිගණයෙහි වූ ණ්‍යනුබන්ධයා කෙරෙන් චුරාදි ධාතූන් කෙරෙහි වූ ණිප්‍රත්‍යයාගේ ණකාරය කරණකොටගෙන ණකාරානුබන්ධිත්වයක් නැතැයි ප්‍රකාශ කරණ බැවින් ගණයෙහි කියනලද ණකාරානුබන්ධයෙන් හීනනවූ චුරාදීන් කෙරෙන් මේ ව්‍යවස්ථාව නොවන්නීය. [පාණිනිඃ 1. 3. 72—77.]

(මු-) යජතෙ. පායයතෙ ධාපයතෙ නර්තයතෙ වාදයතෙ වාසයතෙ දමයතෙ රොචයතෙ ආදයතෙ පරිමොහයතෙ ආයාමයතෙ ආයාසයතෙ. ජනිතෙ අපවදතෙ උද්යච්ඡතෙ සංයච්ඡතෙ ආයච්ඡතෙ. ශ්‍රෞතේ තු වෙදමුද්යච්ඡති. ඵලිනි කිං, යජති යාජකඃ.

(ස-) යජෛ ජ්‍යෛ දෙවාර්ච්චාදෞ, යන ධාතුවෙන් යජතෙ ඊ සිඩයි, මේ ඉත්සංඥ ණකාරධාතුයි.

ණිප්‍රත්‍යයාන්තයෝ නම්, පා පානෙ, ධෙට පානෙ, නෘත්‍ය නර්තනෙ, වදෛ වාචි, වස නිවාසෙ, දමුහ්‍ය ඉර්ශමෙ, රුචඞ් ශ ප්‍රීතිප්‍රකාශයොඃ, අද ලෞ භක්‍ෂෙ, මුහ ඤුක් ශ වෛචිත්‍ය්‍ය, ඖයමුපරමෙ, ඉර්යසඤයතනෙ, යන මේ එකොළස ණ්‍යන්තයෝයි. ඤුගබොධෙ, වදෛවාචි, ඖයමුපරමෙ, යන මේ තුණ උත් සම් ආ පූර්වයි. ශ්‍රෞතේ තු, ශ්‍රත්‍යෙහි වනාහි ; වෙදමුද්ගච්ඡති, වෙදවබොධය පිණිස යත්න කෙරෙයි. ඵලිනි කිං, ඵලිනි යනු කුමටය ? යජති යාජකඃ, ධනාදිය ලැබීම පිණිස අනුන් සඳහා යාගකරණ යාජකයාහට යාග ඵලය හිමිනොවන බැවින් ඔහු ශුඩ කර්තෘවූ කල ආත්මනෙ පදය නොවේ. යාගඵලය වියදම දී යාගකරවන්නාහටයි.

ඉති මපාදඃ.

ආත්මනෙපදපාදය නිමි.

ඨභාවං.

(මු-) 920. ඨ-භාවෙ මං. (ඨ-භාවෙ 7. මං 1.)

ධොර් ඨේ භාවෙ ච මං ස්‍යාත්.

(ස-) ධොඃ, ධාතුහු කෙරෙන් පරව ; ඨේ, කර්‍මයෙහිද ; භාවෙ ච, භාවයෙහිද ; මං ස්‍යාත්, ආත්මනෙපදය වන්නේය.

භාවෙමාද්‍යං යනු කියන්නේය, එසේද මෙහි භාවග්‍රහණය පරසූත්‍රයෙහි අනුවෘත්තිය පිණිසයි. වෘත්තියෙහි ධොඃ යනු කීම ධාතුමාත්‍ර ප්‍රාප්තිය පිණිසයි, එහෙයින් පච්‍යතෙ, චිකිත්ස්‍යතෙ, කායීෂ්‍යතෙ, පිපක්‍ෂ්‍යතෙ, පාපච්‍යතෙ යනාදිය වේ. කර්‍මය වාච්‍යකල්හි ප්‍රත්‍යයෙන් කර්‍මයම කියනලද බැවින් කර්‍මපදයාගේ සඞ්ඛ්‍යානාම-යුෂ්මද් අස්මදාදි අනුසාරයෙන් ක්‍රියාපදයාගේ වචනාදිය වන්නේය. [පාණිනිඃ 1. 3. 13.]

(මු-) 921. ර-තනොර් යගිණෞ. (ර-තනොඃ 7.. යක්-ඉණෞ 1..)

ධොඃ රෙ පරෙ යක් තනි පරෙ ඉණ් ස්‍යාත් ඨේ භාවෙ ච. ස්තූයතෙ විෂ්ණුඃ, ස්තූයෙත, ස්තූයතාං, අස්තූයත. අස්තාවි.

(ස-) රෙ පරෙ, රසංඥයා පරකල්හි ; ඨේ, කර්‍මයෙහිද ; භාවෙ ච, භාවයෙහිද ; ධොඃ, ධාතුහු කෙරෙන් පරව ; යක්, යක්ප්‍රත්‍යය වන්නේය ; තනි පරෙ, තන්විභක්ති පරකල්හි ; ඉණ් ස්‍යාත්, ඉණ්ප්‍රත්‍යය වන්නේය.

(ස-) සමානරූපස්‍යත්‍යඃ, සමානරූපවූ ප්‍රත්‍යයතෙම; කෘතා, කෘත්ප්‍රත්‍යයා විසින්; බාධ්‍යතෙ, බාධාකරණුලැබේ. නත්වස රූපඃ, අසමාන රූපවූ කෘත්ප්‍රත්‍යයතෙම බාධාකරණු නොලැබේ. විශෙෂයෙන් සාධාරණයාගේ බාධාව නියමකෙරෙයි, විශෙෂයෙන් කෘත්ප්‍රත්‍යයා විසින් සාධාරණවූ කෘත්ප්‍රත්‍යය තෙම බාධාකරණුලැබෙයි යන අර්‍ථයි.

සරූපත්වය වනාහි අනුබන්ධය හැර සිටින්නාවූ භාගයා සමග සමානාවයවභාවයයි, මෙසේයි, විශෙෂයෙන් ඝ්‍යණ් ප්‍රත්‍යයා විසින් සාධාරණවූ යකාරයම බාධාකරණු ලැබෙයි, තව්‍ය අනීය දෙක බාධාකරණු නොලැබෙත්. එසේම එකාර්‍ථයෙහිම සරූපත්වය ගන්නාලැබේ, භින්නාර්‍ථත්වය ඇති කල්හි

බාධාකරණු නොලැබේ, එහෙයින්, පචාදි බැවින් කර්තෘයෙහි කරණලද අච්ප්‍රත්‍යයා හා විශෙෂයෙන් සාධාරණවූ සමාන රූප වූද ඝඤ්ප්‍රත්‍යය බාධාකරණු නොලැබේ, එහෙයින්ම, පචති යන වාක්‍යයෙහි, පචඃ යනු වේ, පචනං පාකඃ යනාදිය වන්නේමය. එසේම (1158) ක්ති ෂි යනාදියෙන් ස්ත්‍රීලිඞ්ගයෙහි කරණලද, අනප්‍රත්‍යයා විසින් අනට්ප්‍රත්‍යය බාධාකරණු නොලැබේ, එහෙයින්, කාරණා කරණම් යනාදිය වේ. අන්තන්හිද එසේමැයි. [පාණිනිඃ 3. 1. 94.]

(මූ-) **967. තව්‍යානීයයා ඊ-භාවෙ.** (තව්‍ය-අනීය-යාඃ 1... ඊ-භාවෙ 7.)

ධාරෙතෙ සෲර්ඊ-භාවේ. චෙතව්‍යං චයනීයා චෙයං පුණ්‍යං භවිතව්‍යං භවනීයං භව්‍යං ත්වයා.*

(ස-) ධොඃ, ධාතුහු කෙරෙන් පරව; ඊභාවෙ, කර්ම භාව දෙක්හි; එතෙ, තව්‍යප්‍රත්‍යය අනීයප්‍රත්‍යය යප්‍රත්‍යය යන මොව්හු; සෲඃ, වන්නාහ.

(933) භවද්භූතභවේ‍ය යන මෙහි භවේ‍ය යනු භවිෂ්‍යත්කාල වාචී ප්‍රයොගය බැවින් තව්‍යාදීහු භවිෂ්‍යත්කාලයෙහි වන්නාහයි කියත්. මෙහි විශෙෂකථනයක් නැති බැවින් අන්‍ය කාලයෙහිදු වෙත්.

(ස-) චීයතෙ යත් තත් චි, මෙයින් තව්‍ය වේ, එකස්වරඉවර්ණාන්තධාතුහු බැවින් ඉම් නොවේ, (542) ගුණයි, චෙතව්‍යශබ්දය වේ, ලිඞ්ගාපීයෙහි ප්‍රථමායි, චෙතව්‍යං, පුණ්‍යයයි, එසේම අනීයප්‍රත්‍යය කල කල්හි චයනීයං. යප්‍රත්‍යය කල කල්හි චෙයං යනු වේ. මෙහි පුණ්‍යම් යන කර්මය ක්ලීවලිඞ්ගයබැවින් ඔහට විශෙෂණවූ චෙතව්‍ය යනාදීන්ගේද ක්ලීවත්වය වේ. භූයතෙ භූ, තව්‍ය, ගුණ වේ ඉම් වේ, භවිතව්‍යං භවනීයං, (423) භව්‍යං යන මෙහි යකාරයහට ස්වරවත්ද, (35) ඔකාරයහට අව්ද වෙත්. භාවප්‍රත්‍යයාන්ත බැවින් ක්ලීවත්වයයි. එසේමැයි.

අනාම්නි කාරකෙ වාචේ‍ය වාච්‍යලිඞ්ගඃ කෘදුච්‍යතෙ,
භාවෙ ල්‍යපීබලපීානතා අනට්ාද්‍යා නපුංසකෙ.
කත්‍යල්‍යන්තාශ්ච ස්ත්‍රියාං ඥෙයාඃ, පුංස්‍යප්ඝඤ්ලෞ තථා.
අනේ‍යෂාන්තු කෘතාං ලිඞ්ගං වෙදිතව්‍යං ප්‍රයොගතඃ.
[පාණිනිඃ 3. 1. 96, 97.]

---

* තව්‍යශ්ච අනීයශ්ච යශ්ච තෙ. ඊශ්ච භාවශ්ච තත්‍රාසම්න්.

(මු-) 968. **නෝ'වෝ'න්තරදුර්ගේඃ ප්‍රාග්වර්ණෙණෝ'ඛ්‍යාභාභූ පූඤ්කමගමප්‍යායවෙපානිජාදීදිතො ක්‍ෂි-හසාදීජුඛස්තු වා.** (නඃ 6. අවඃ 5. අන්තරදුර්ගේඃ 5. ප්‍රාග්වත් 1. ණඃ 1. අඛ්‍යා-අනිජාදීදිතඃ 5. ක්‍ෂිහසාදීජුඛඃ 5. තු 1. වා 1.)

අන්තරෙර්දුර්-වර්ජ්ජෙශ්ච පරස්‍ය ණවිධිහෙතෞ සති න ස්‍යාවඃ පරස්‍ය ණඃ ස්‍යාත්, න තු ඛ්‍යාදෙඃ ඉජාදිවර්ජ්ජේදිතශ්ච, ක්‍ෂ්‍යන්තාඛ සාදීජුඛස්තු වා.*

(ස-) අන්තරඃ, අන්තර්ශබ්දයා කෙරෙන් පරවූද; දුර්වර්ජ්ජෙශ්ච, දුර් යන උපසර්ගය රහිතවූ උපසර්ගයා කෙරෙන්ද; පරස්‍ය, පරවූ; අවඃ පරස්‍ය, ස්වරයා කෙරෙන් පරවූ; නස්‍ය, දන්ත්‍ය නකාරයහට; ණවිධි හෙතෞ සති, ණකාරවිධානයට හෙතු විද්‍යමාන කල්හි; ණඃ ස්‍යාත්, මූර්ධන්‍ය ණකාර වන්නේය; ඛ්‍යාදෙඃ, ඛ්‍යාධාතු ආදිකොට ඇති භාධාතු භූධාතු පූඤ්ධාතු කමධාතු ගමධාතු ප්‍යායධාතු වෙපධාතු යන මොවුන් කෙරෙන්ද; ඉජාදිවර්ජ්, ඉච්සංඥ වර්ණයන් ආදියෙහි වූ ධාතුහු තොරවූ; ඉදිතශ්ච තු, ඉත්සංඥ ඉකාරවත් ධාතුහු කෙරෙන්ද වනාහි; න, නකාරයහට ණකාර නොවේ; ක්‍ෂ්‍යන්තාත්, ක්‍ෂිප්‍රත්‍යයාන්තයා කෙරෙන්ද; හසාදීජුඛස්තු, ව්‍යඤ්ජනයක් ආදියෙහි වූ උඛසංඥ ඉච්ප්‍රත්‍යාහාර වර්ණවත් ධාතුහු කෙරෙන්ද වනාහි; වා, විකල්පයෙන් ණකාර වන්නේය.

කෙවලවූද ක්‍ෂිප්‍රත්‍යයාන්තවූද ඛ්‍යාදීන්ගේ ණකාරනිෂෙධය වේ. [පාණිනිඃ 8. 4. 29—34.]

(මු-) අන්තර්යාණීයං ප්‍රයාණීයං, ප්‍රයාපණීයං ප්‍රයාපනීයං, ප්‍රකොපණීයං, ප්‍රකොපනීයං. ඛ්‍යාදෙස්තු-ප්‍රඛ්‍යානීයං ප්‍රඛ්‍යාපනීයං, ප්‍රභානීයං ප්‍රභාපනීයං, ප්‍රභවනීයං ප්‍රභාවනීයං, ප්‍රපවනීයං ප්‍රපාවනීයං, ප්‍රකමනීයං ප්‍රකාමනීයං, ප්‍රගමනීයං ප්‍රප්‍යායනීයං ප්‍රවෙපනීයං ප්‍රකම්පනීයං. ඉජාදෙස්තු ප්‍රෙඞ්ඛණීයං.

(ස-) අන්තර්ශබ්ද පූර්වවූ යාධාතු, භාවයෙහි අනීයප්‍රත්‍යයද,

---

* නාස්ති දුර්යත්‍ර සො'දුඃ, අදුශ්චාසෞ ගිශ්චෙත් අදුර්ගිඃ, අන්තර් ච අදුර්ගිශ්ච තාභ්‍යාස්මාත්, ඉච් ආදිර් යස්‍ය ස ඉජාදිඃ, න ඉජාදිඃ අනිජාදිඃ, අනිජාදිශ්චාසෞ ඉදිච්චෙති අනිජාදීදිත්. ඛ්‍යාශ්ච භාශ්ච භූශ්ච පූඤ්ච කමශ්ච ගමශ්ච ප්‍යායශ්ච වෙපශ්ච අනිජාදීදිච්චෙති, පශ්චානනක්ෂ්යොගෙ තස්මාත්. හසාදිශ්චාසෞ ඉජුඛ් චෙති හසාදීජුඛ්, ක්‍ෂිශ්ච හසාදීජුඛ් චෙති තස්මාත්.

මෙසින් ණකාරද වෙත්, අන්තර්යාණීයං. ප්‍රපාසිණෞ ප්‍රයාණං ප්‍රහීණඃ ප්‍රහාණීඃ යනාදියද මෙසේමැයි. ප්‍රයාණීයං යනුද මෙසේමැයි. මේ දෙතන්හිම අව්සංඥයා කෙරෙන් පර නකාරයි. විකල්පයෙන් ණකාරත්වය කියයි, ප්‍රපූර්ව යාධාතු, ණිද, (784) පණ්ද, ප්‍රයාපිධාතුහු කෙරෙන් භාවයෙහි අනීයද, ණිහට ලොප්ද වෙත්, ණිප්‍රත්‍යයෙන් පර බැවින් මෙසින් ණකාර වේ, ප්‍රයාපණීයං. විකල්පපක්ෂයෙහි ප්‍රයාපනීයං. ප්‍රපූර්ව කුප ධාතු, භාවයෙහි අනීයද, ගුණද, හසාදි ඉපුද්ධධාතු බැවින් මෙසින් ණත්වයද වෙත්, ප්‍රකොපණීයං, විකල්ප පක්ෂයෙහි ප්‍රකොපනීයං. මෙහි අව කවර්ගපවර්ග ව්‍යවධානය ඇත්තේද විකල්පයෙන් ණකාර නිෂෙධයි. ඛ්‍යාදෙසතු, ඛ්‍යාදීන් කෙරෙන් වනාහි; ඛ්‍යා කථනෙ, ප්‍රපූර්වයි, අනීය වේ, ප්‍රඛ්‍යානීයං, අවකවර්ගව්‍යවධාන වූයේද ණකාර නොවේ. ප්‍රඛ්‍යා, ණි වේ, (784) ආකාරාන්තයා කෙරෙන් පණ්ද, අනීයද වෙත්, ප්‍රඛ්‍යාපනීයං. ප්‍රපූර්ව භාධාතු ප්‍රභානීයං, ප්‍රභාපනීයං ප්‍රපූර්ව භූසත්තායාං, ප්‍රභවනීයං, ප්‍රභාවනීයං. ප්‍රපූර්ව පූඤ්ගිශොධෙ, ප්‍රපවනීයං, ප්‍රපාවනීයං, ප්‍රපූර්ව කමුධාතු ප්‍රකමනීයං, ප්‍රකාමනීයං. ප්‍රපූර්ව ගමධාතු ප්‍රගමනීයං. ප්‍රපූර්ව ප්‍යායීඞ්වෘද්ධෞ ප්‍රප්‍යායනීයං. ප්‍ර-වෙප්චලෙ ප්‍රවෙපනීයං. ඉත්සංඥ ඉකාර යුක්ත ධාතු කියනු ලැබේ. ප්‍රකපිචලනෙ ප්‍රකම්පනීයං. හුදකලා වූද ණිප්‍රත්‍යයාන්ත වූද ගමාදීන්ගේ මෙහි සමානරූපයි. ඉජාදෙසතු, ඉච් සංඥයා ආදිකොට ඇති ධාතූන් කෙරෙන් වනාහි නිත්‍යයෙන් ණකාර වේ. ප්‍රඉඛධාතු අනීය, නුන්, නකාරයහට අනුස්වාරය වේ, අනුස්වාරයහට ඞකාරයද, මෙසින් මූර්ධන්‍ය ණකාරද වෙත්, ප්‍රෙඞ්ඛණීයං.

(මූ-) 969. **ඛනාත්වෙ රෙ යෙ.** (ඛනාත්–වෙඃ 6. එ 1. යෙ 7.)

ඛන ආදන්තස්‍ය ච වෙ-රෙ ස්‍යාත් යෙ පරෙ. ඛෙයං දෙයං.*

(ස-) යෙ පරෙ, යප්‍රත්‍යය පරකල්හි; ඛන, ඛනධාතුහුගේද; ආදන්තස්‍ය ච, ආකාරාන්ත ධාතුහුගේද; වෙඃ, විසංඥයහට; එ ස්‍යාත්, එකාර වන්නේය.

ඛනධාතු, ඛන්‍යතෙ යන වාක්‍යයෙහි (971) ක්‍යණ්, මෙසින්

* ඛන ච ආච්ච ඛනාතෙ෧ ඛනාතො ෂීඃ ඛනාත්විත්‍යස්‍ය.

පිසංඥවූ අන්භාගයහට එකාර වේ, ඛෙයං. දීයතෙ යන වාක්‍යයෙහි දාධාතුහු කෙරෙන් (967) භාවයෙහි යප්‍රත්‍යයයි, පිසංඥ ස්වරයහට එකාර වේ, දෙයං, මෙහි දාස්වරූපධාතු ගතයුතු. ප්‍රකරණබලයෙන් යෙ යනු ල්‍යසංඥකවූ යකාරය පර කල්හිය යන අර්ථයි. ල්‍යසංඥ කෙ යනු කුමටය? ඛන්‍යතෙ දීයතෙ ප්‍රඛන්‍ය ප්‍රදාය යනාදියෙහි පිසංඥයහට එකාර නොවන්නේය. [පාණිනිඃ 3. 1. 111, 6. 4. 65.]

(මු-) **970. ස්‍යණ්-රාවශ්‍යකෙ.** (ස්‍යණ් 1. ඔඃ 5. ආවශ්‍යකෙ 7.)

උවර්ණාන්තාදවශ්‍යම්භාවෙ'පි ස්‍යණ් ස්‍යාත් ඒ භාවෙ· විප්‍රෙණ ශුචිනා භාව්‍යං.*

(ස-) අවශ්‍යම්භාවෙ'පි, අවශ්‍යයෙන් වීමය යන අර්ථයෙහි; ඒ භාවෙ, කර්ම්ම භාව දෙක්හි; උවර්ණාන්තාත්, උවර්ණාන්ත ධාතුහු කෙරෙන්; ස්‍යණ් ස්‍යාත්, ස්‍යණ්ප්‍රත්‍යය වන්නේය.

ක්‍රියාවගේ අවශ්‍යයෙන් වීමය යන අර්ථයි. ස්‍යණ්ප්‍රත්‍යයාගේ සකාර ණකාර දෙක ඉත් වෙත්, යකාරය සිටියි. භූධාතු භූයතෙ, භාවයෙහි මෙයින් ස්‍යණ්, (577) වෘද්ධියි, (423) යකාරයහට ස්වරවත් වේ, (35) ඔකාරයහට ආව්, භාව්‍යං, එසේම තපස්විනා විෂ්ණුඃ ස්තාව්‍යඃ යනාදිය වේ. අනාවශ්‍යකයෙහි වනාහි යප්‍රත්‍යය කළ කල්හි, භව්‍යං, ක්‍යප් කළකල්හි ස්තුත්‍යඃ යනු වේ. [පණිනිඃ 3. 1. 125.]

(මු-) **971. හසඃ ය්වාසොඃ.** (හස්-සෘයුආ-සොඃ 5.)

හසන්තාත් සෘවර්ණාන්තාත් යෞතෙ රාසුනොතෙශ්ච ස්‍යණ් ස්‍යාත් ඒ භාවෙ. වාහ්‍යං ඝාත්‍යං ජන්‍යං බධ්‍යං, කාර්‍ය්‍යං, යාව්‍යං, ආසාව්‍යං.†

(ස-) හසන්තාත්, හසන්ත ධාතුහු කෙරෙන්ද; සෘවර්ණාන්තාත්, සෘවර්ණාන්ත ධාතුහු කෙරෙන්ද; යෞතෙඃ, යුධාතුහු කෙරෙන්ද; ආසුනොතෙශ්ච, ආඞ්පූර්ව් සුධාතුහු කෙරෙන්ද; ඒ භාවෙ, කර්ම් භාව දෙක්හි; ස්‍යණ් ස්‍යාත්, ස්‍යණ්ප්‍රත්‍යය වන්නේය.

පෘථක්යොග බැවින් ආවශ්‍යකෙ යනු අනුවෘත්ති නොවේ.

---

* අවශ්‍යම්භාවඃ ආවශ්‍යං, ආවශ්‍යමෙව ආවශ්‍යකං තස්මින්.

† හස් ච සෘශ්ච යුශ්ච ආ-සුශ්ච තස්මාත්.

උහ්‍යතෙ යත් තත්, වහධාතු, ඝ්‍යණ්, (577) වෘද්ධියි, වාහ්‍යං. හන්‍යතෙ යත් තත් හනධාතු, ඝ්‍යණ්, (679) හකාරයහට ඝකාර වේ, වෘද්ධි, (801) නකාරයහට තඞ්, ඝාත්‍යං. ජායතෙ ඉති, ජන ධාතු. (965) කභාවෙ, යනු කීබැවින් කර්තෘයෙහි ඝ්‍යණ්, ජන්‍යං. බධ්‍යතෙ යත් තත්, වධධාතු, ඝ්‍යණ්, බධ්‍යං. දෙතැන්හි වෘද්ධියි, (744) ජනවධඃ යනාදියෙන් හ්‍රස්ව වේ, ක්‍රියතෙඉති, කෘඤ් කෘඥ යන්නෙන් හ්‍රස්ව දීර්ඝ දෙකින් කර්මයෙහි ඝ්‍යණ් පරකල්හි වෘද්ධි, කාර්‍ය්‍යං. යූයතෙඉති, යුධාතු, කර්මයෙහි ඝ්‍යණ්, වෘද්ධියි, යාව්‍යං. ආසූයතෙ ඉති ආඞ්පූර්ව සුධාතු, ඝ්‍යණ්, වෘද්ධි, (423) ස්වරවත්ද, ආව්ද වෙත්, ආසාව්‍යං. [පාණිනිඃ 3. 1. 124, 126.]

(මු-) **972. චජොඃ කගෞ ඝිත්‍යසෙට්ක්ත-යඥාඞ්ග-යජ-ගත්‍යර්ථවඤ්චාං.** (ච-ජොඃ 6 .. ක-ගෞ 1 .. ඝිති 7. අසෙට්ක්ත-යඥාඞ්ග-යජ-ගත්‍යර්ථවඤ්චාං 6...)

ඝිති පරෙ ච-ජොඃ ක-ගෞ ස්තො න තු සෙට්ක්තාදෙඃ.

පාක්‍යං රොග්‍යං. ගතෞ තු, වඤ්ච්‍යං. අන්‍යත්‍ර වඞ්ක්‍යං කාෂ්ඨං.*

(ස-) ඝිති පරෙ, ඉත්සංඥ ඝකාරයා පර කල්හි ; චජොඃ, චකාර ජකාර දෙදෙනාහට; කගෞ, කකාර ගකාර දෙක; ස්තඃ, වන්නාහ; සෙට්ක්තාදෙස්තු, ඉට් සහිත ක්ත ක්තවතු ප්‍රත්‍යයන් ආදිකොට ඇති යාගාවයවවූ යජධාතුය ගමනාර්ථ වඤ්චධාතුය යන මොවුන්ගේ ස්ථානයෙහි වනාහි; න, චජ යන මොවුන්ගේ ස්ථානයෙහි ක ග නොවේ. යමක්හු කෙරෙන් ක්තප්‍රත්‍යය කරණලදද ඒ ධාතුහු කෙරෙන් ඉට් වෙයි යන අර්ථයි.

පච්‍යතෙ ඉති පචධාතු, (971) කර්මයෙහි ඝ්‍යණ්, වෘද්ධියි, මෙයින් චකාරයහට කකාර වේ, පාක්‍යං. රුජ්‍යතෙ ඉති රුජ ධාතු, ඝ්‍යණ්, ගුණද, මෙයින් ජකාරයහට ගකාරද වෙත්,

---

* සෙට් ක්තො යස්මාත් ස සෙට් ක්තඃ, යඥස්‍යාඞ්ගං යඥාඞ්ගං, යඥාඞ්ගයජෞ යඥාඞ්ගයජඃ, ගත්‍යර්ථශ්චාසෞ වඤ්ච චෙති ගත්‍යර්ථවඤ්ච. සෙට් ක්තශ්ච යඥාඞ්ග යජශ්ච ගත්‍යර්ථවඤ්ච චෙති, තතො නඤ්යොගෙ තෙෂාං.

රෝග්‍යං. එසේම ඝඤ් කල කල්හි පාකඃ රෝගඃ යනු වේ. ක්ත ක්තවතුප්‍රත්‍යයන් වූකල ඉම් වන ධාතුහු කෙරෙන් වනාහි, යාච-ණ්‍යණ්, යාච්‍යඃ යනාදිය වේ, මෙහි චකාරයහට කකාර නොවේ. යාගාවයව වාච්‍යවූ යජධාතුහු කෙරෙන් වනාහි ඝඤ් කල කල්හ් ප්‍රයාජඃ අනුයාජඃ උපාංශුයාජඃ ඍතුයාජඃ, ප්‍රධාන යාගයක්හුගේ අවයවවූ මේ සතර වාච්‍ය කල්හි ජකාරයහට ගකාර නොවේ. යඥාංග යනු කුමටය? යාගඃ, ප්‍රධාන යාගවාචකවූ මොහට ගකාර වේ. ගතෞ තු, ගමනාර්‍ථයෙහි වූ වඤ්චු ගත්‍යාං යන ධාතුහු කෙරෙන් ණ්‍යණ් වේ, වඤ්ච්‍යං යනු වේ, වඤ්චෙත්‍ය ග්‍රාමඃ, ගමනාර්‍ථ බැවින් මෙහි කකාර නොවේ. අන්‍යත්‍ර, ගමනාර්‍ථයෙහි නුවූ වක්‍රිභාවාර්‍ථයෙහි වන්ච ධාතුහු කෙරෙන් ණ්‍යණ් කල කල්හි, වඞ්ක්‍යං, කාෂ්ඨං, කාෂ්ඨ යයි. [පාණිනිඃ 7. 3. 52, 62, 63.]

(මු-) 973. නාවශ්‍යකෙ ත්‍යජ-යජ-ප්‍රවචාඤ්ච ණ්‍යණ්. (න 1. ආවශ්‍යකෙ 7. ත්‍යජ-යජ-ප්‍රවචාං 6...ච 1. ණ්‍යණි 7.)

ආවශ්‍යකෙ'ර්‍ථේ ඒෂාඤ්ච චජොඃ කගෞ න ස්‍යාතාං ණ්‍යණි. අවශ්‍යං පාච්‍යං, ත්‍යාජ්‍යඃ යාජ්‍යඃ ප්‍රවාච්‍යඃ.

(ස-) ණ්‍යණි, ණ්‍යණ්ප්‍රත්‍යය පරකල්හි; ආවශ්‍යකෙ'ර්‍ථේ, ක්‍රියාවගේ නියමයෙන් විමය යන අර්‍ථයෙහි සියලු ධාතුන්ගේද; ඒෂාඤ්ච, ත්‍යජ යජ ප්‍රපූර්‍ව වචධාතු යන මොවුන්ගේද ආවශ්‍යකවූද අනාවශ්‍යකවූද අර්‍ථයෙහි; චජොඃ, චකාර ජකාර දෙදෙනාහට; කගෞ, කකාර ගකාර දෙක; න ස්‍යාඃ, නොවෙත්.

අවශ්‍යං පච්‍යතෙ ඉත් පච යන ධාතු වේ, (971) කර්‍මයෙහි ණ්‍යණ්ද, වෘද්ධිද, මෙයින් කකාර නිෂෙධයද වෙත්, අවශ්‍යං පාච්‍යං. අවශ්‍යං රොජ්‍යං යනුද මෙසේමැයි. ත්‍යාජ්‍යඃ යාජ්‍යඃ ප්‍රවාච්‍යඃ. ත්‍යජ යජ ප්‍රවචාං යන බහුවචනය කාරණකොට ගෙන මොච්‍යඃ ශොච්‍යඃ යනාදියෙහිද ප්‍රයොගානුසාරයෙන් කකාර ගකාරයන්ගේ නිෂෙධය වක්තව්‍යයි. [පාණිනිඃ 7. 3. 65, 66.]

(මු-) 974. භුජ-වච-නිප්‍රයුජො'නන්‍යාශබ්දශකෙ‍ෂු. (භුජ-වච-නිප්‍රයුජඃ 6. අනන-අශබ්ද-ශකෙෂු 7.)

භුජෙ භක්ෂ්‍ය'ර්‍ථේ, වචො'ශබ්දෙ'ර්‍ථේ, නි ප්‍ර පූර්‍වස්‍ය යුජඃ ශක්‍ය'ර්‍ථේ, චජොඃ කගෞ න ස්‍යාතාං ණ්‍යණි. භොජ්‍යං, වාච්‍යං,

නියොජ්‍යඃ, ප්‍රයොජ්‍යඃ. එෂු කිං, භොග්‍යා භූඃ, වාක්‍යං පද-සමුදයඃ, නියොක්තුමර්හතීති නියොග්‍යඃ ප්‍රභුඃ.*

(ස-) භක්ෂ්‍යෙ'පි, අනුභව කටයුතුවූ ආහාරාර්ථයෙහි; භුජඃ, භුජධාතුහුගේද; අශබ්දෙ'පි, ශබ්ද රහිතවූ කියයුතුය යන අර්ථයෙහි ; වචඃ, වචධාතුහුගේද; ශක්‍යෙ'පි, ශක්‍යාර්ථයෙහි ; නිප්‍රපූර්වස්‍ය යුජඃ, නිපූර්ව ප්‍රපූර්වවූ යුජධාතුහුගේද; චජොඃ, චකාර ජකාර දෙදෙනාහට ; කගෞ, කකාර ගකාර දෙක; ණ්‍යති, ණ්‍යත් පර කල්හි ; න ස්තඃ, නොවෙත්.

භුජ්‍යතෙ යත් තත් භුජ අභ්‍යවහරණෙ, කර්මයෙහි ණ්‍යත්ද, ගුණද වෙත්, භොජ්‍යං, අන්නාදියයි. උච්‍යතෙ ඉති වචධාතු, ණ්‍යත්, වෘද්ධියි, වාච්‍යං, කියයුතුය යන අර්ථයි. නියොක්තුං ශක්‍යතෙ'සෞ නිපූර්ව යුජධාතු, නියොජ්‍යඃ, නියොගකිරීමට හැක්වූවෙක් සෙවකයයි. ප්‍රයොක්තුං ශක්‍යතෙ'සෞ ප්‍රපූර්ව යුජ-ප්‍රයොජ්‍යඃ, සෙවකයයි. එෂු කිං, මේ අර්ථයන් කෙරෙහි කකාර ගකාර දෙක නොවීම කුමටය? භුජ්‍යතෙ යා සා ඉති භුජ පාලනෙ, ණ්‍යත්, ගුණ වේ, ජකාරයහට ගකාර වීමයි, භොග්‍යා, අනුශාසනා කටයුත්තීයයි හෝ පාලනය කටයුත්ත් යන අර්ථයි, භූඃ, පෘථිවියයි.

වචධාතු, චකාරයහට කකාර වේ, වාක්‍යං, පරස්පරාකාඞ්ක්ෂා යුක්ත පදසමූහයයි. නියොක්තුමර්හති නිපූර්ව යුජ, නියොග්‍යඃ, නියොග කිරීම පිණිස යොග්‍යයෙක් වෙයි යන අර්ථයි. මෙහි (965) කභාවෙ යනු කීබැවින් කර්තෘකාරකයෙහි ණ්‍යත් වේ. ප්‍රභුඃ, ස්වාමියි. [පාණිනිඃ 7. 3. 67—69.]

(මූ-) **975. පාය්‍ය ධාය්‍ය ප්‍රණාය්‍යානාය්‍ය කුණ්ඩපාය්‍ය සඤ්චාය්‍ය රාජසූය සාන්නාය්‍ය නිකාය්‍ය පරිචාය්‍යොපචාය්‍ය චිත්‍යාග්නිචිත්‍යා සමූහ්‍යාමාවස්‍යා-මාවාස්‍යා ශාජ්‍යාඃ.** (පාය්‍ය —යාජ්‍යාඃ 1...)

එතෙ ණ්‍යන්තා නිපාත්‍යන්තෙ. පාය්‍යං මානං. දධාත්‍යග්නිමිති ධාය්‍යා සාමිධෙනී, ධාය්‍යා ඍත්විජඃ. ප්‍රණාය්‍යො'සම්මතඃ ප්‍රියො වා. ආනාය්‍යො දක්ෂිණාග්නිඃ. කුණ්ඩෛඃ පීයතෙ අත්‍ර සොම ඉති කුණ්ඩපාය්‍යඃ ක්‍රතුඃ. සඤ්චාය්‍යඃ ක්‍රතුඃ. රාඥ

* භුජශ්ච වචශ්ච නිප්‍රාභ්‍යාං යුජ ච තස්‍ය. අන්නාච්ච අශබ්දාච්ච ශක්‍යාච්චෙත් තස්මින්.

සූයතෙ රාජසූයඃ ක්‍රතුඃ. සාන්නාය්‍යං හවිඃ. නිකාය්‍යො නිවාසඃ. පරිචාය්‍යො'ග්නිඃ, උපචාය්‍යො'ග්නිඃ, චිත්‍යො'ග්නිඃ. අග්නෙශ්චයනං අග්නිචිත්‍යා. සමූහ්‍යො'ග්නිඃ සංවාහ්‍ය ඉත්‍යීජිඃ. අමා සහ වසතො'ස්‍යාං චන්ද්‍රාර්කාවිත්‍යමාවස්‍යා අමාවාස්‍යා. යජ්‍යන්ත්‍යනයා ඉති යාජ්‍යා. නිපාත්‍යොහ්‍යර්ථවිශෙෂෙ.

(ස-) ඝ්‍යණන්තාඃ, ඝ්‍යණ්ප්‍රත්‍යයාන්තවූ; එතෙ, මේ පාය්‍ය ධාය්‍ය යනාදීහු; නිපාත්‍යන්තෙ, අර්ථවිශෙෂයෙහි නිපාතනය කරනුලැබෙත්. පා පානෙ, ඝ්‍යණ්, පාය්‍යං, මානං, පරිමාණයයි. නිපාතනයෙන් අන්‍යවූ අර්ථය, පෙයං යනු වේ, පියයුතු ද්‍රව්‍යයෙක්. ධා ධාතු, ඝ්‍යණ්, දධාත්‍යග්නිමිති ධාය්‍යා සාමධෙනී, යාගගින්න දල්වන මන්ත්‍රයයි. ධාය්‍යාඃ යනුද මෙසේමැයි, ඍත්විජඃ, යාගකරන්නෝ. නිපාතනයෙන් පිටත්හි, ධෙයං යනු වේ. ප්‍රණීයතෙ'සෞ ප්‍රණාය්‍යඃ, ප්‍රපූර්ව නීධාතු, ඝ්‍යණ්, අසම්මතඃ, සම්මත නොකරණලද්දෙක්; වා, නොහොත්; ප්‍රියඃ, ප්‍රියයෙක්. නිපාතනයෙන් පිටත් තන්හි, ප්‍රණෙයඃ යනු වේ, අයතියෙක්. ගාර්හපත්‍යාදග්නෙරානීය යඃ ප්‍රණීයතෙ ස ආනාය්‍යඃ, ආඞ්පූර්ව නීධාතු, ඝ්‍යණ්, දක්ෂිණාග්නිඃ, පිදීමට යොග්‍යවූ ගින්නයි. නිපාතනයෙන් පිටත් තන්හි, ආනෙයඃ යනු වේ. කුණ්ඩෛඃ පීයතෙ අත්‍ර සොම ඉති කුණ්ඩපාය්‍යඃ ක්‍රතුඃ, යාගයයි, පාධාතු, ඝ්‍යණ්. නිපාතනයෙන් පිටත් තන්හි, කුණ්ඩපෙයං යනු වේ, ක්ෂීරයයි, සොම යනු ලතාවිශෙෂයක්හුගේ රසයයි. සඤ්චීයතෙ'සෞ සඤ්චාය්‍යඃ, සං පූර්ව චිධාතු, ඝ්‍යණ්, ක්‍රතුඃ, යාගයයි, අන්තන්හි, සඤ්චෙයං යනු වේ, පුණ්‍යං, සුචරිතයයි. රාඥ සූයතෙ මඞ්ගලපූර්වකං ස්නායතෙ'ස්මින්නිති රාජසූයඃ, සුධාතු, ඝ්‍යණ්, ක්‍රතුඃ, යාගයයි. අන් තන්හි සව්‍යං යනු වේ. සන්නීයතෙ ඉදං සාන්නාය්‍යං, සංපූර්ව නී, ඝ්‍යණ්. හවිඃ, ගිතෙල්. අන් තන්හි සන්නෙයං. නිචීයතෙ'සෞ නිකාය්‍යඃ, නිපූර්ව චිධාතු, ඝ්‍යණ්, නිවාසඃ, ගෘහයයි. අන් තන්හි නිචෙයං යනු වේ. පරිචීයතෙ අසෞ පරිචාය්‍යඃ, පරිපූර්ව චිධාතු, ඝ්‍යණ්, අග්නිඃ, අන්‍යස්ථානයෙහි පරිචෙයං. උපචීයතෙ'සෞ උපචාය්‍යඃ, උපපූර්ව චිධාතු, අග්නිඃ, අන්‍යස්ථානයෙහි උපචෙයං. චීයතෙ'සෞ චිත්‍යඃ, අග්නිඃ, අන්‍යස්ථානයෙහි චෙයං යනු වේ. අග්නෙශ්චයනං, යන වාක්‍යයෙහි, අග්නිචිත්‍යා යනු වේ. සමූහ්‍යතෙ'සෞ සමූහ්‍යඃ, සං වහ-

ඝ්‍යණ්, නිපාතනයෙන් ජ්‍යදෙශද දීඝීද වෙත්, අග්නිඃ. අන්‍ය ස්ථානයෙහි, සංවාහ්‍යඃ, යනුයි. අමා (අව්‍යයං) චන්ද්‍රස්‍ය කලා තයා සහ වසතො'ස්‍යාං තිථෞ චන්ද්‍රාකෞ, යන අර්ථයෙහි අමා වසත්‍යඃ, අමාපූර්ව වසධාතු, ඝ්‍යණ් වේ, අමාවාස්‍යං, යන පද දෙක වෙත්. යජනාත්‍යනයා, යන වාක්‍යයෙහි යාජ්‍ය යනු වේ. ඍක් යනු වෙදකොඨාසයයි. නිපාතඃ හි, නිපාතය වනාහි; අර්ථවිශෙෂෙ, අර්ථවිශෙෂයෙහි වෙයි. [පාණිනිඃ 3. 1. 114, 122, 127—132.]

(මු-) 976. **පුශක සහ තක චත යත ශසො'චම වප රප ලප ත්‍රප දභො ශො භජ ජප යජානමස්තු වා.** (පු-ශසඃ 5. අචම-දභඃ 5. යඃ 1. භජ-ආනමඃ 5. තු 1. වා 1.)

පවර්ගාන්තාත් ශකාදෙශ්ච චමාදිවර්ජිත් යඃ ස්‍යාත් ඒභාවෙ, භජාදෙස්තු වා. රම්‍යං ශක්‍යං සහ්‍යං තක්‍යං චත්‍යං යත්‍යං ශස්‍යං භජ්‍යං භාග්‍යං, ජප්‍යං ජාප්‍යං, යජ්‍යං යාජ්‍යං, ආනම්‍යං ආනාම්‍යං. චමාදෙස්තු ආචාම්‍යං වාප්‍යං රාප්‍යං ලාප්‍යං ත්‍රාප්‍යං දාභ්‍යං-අනකාරනිර්ද්දෙශාත්.

(ස-) පවර්ගාන්තාත්, පවර්ගාන්තයා කෙරෙන්ද; ශකාදෙශ්ච, ශකධාතු ආදිකොට ඇති සහධාතු තකධාතු චතධාතු යත ධාතු ශසධාතු යන මොවුන් කෙරෙන්ද; චමාදි වර්ජිත්, චම ධාතු ආදිකොට ඇති වප-රප-ලප-ත්‍රප-දභ යන මේ ධාතු රහිතවූ ධාතූන් කෙරෙන්; ඒභාවෙ, කර්ම භාව දෙක්හි; යඃ ස්‍යාත්, යප්‍රත්‍යය වන්නේය; භජාදෙස්තු, භජ-ජප-යජ-ආඞ්පූර්ව නම ධාතු යන මේ ධාතූන් කෙරෙන්; වා, විකල්පයෙන් යප්‍රත්‍යය වන්නේය.

(971) හස් අන්තයා කෙරෙන් ලද්දාවූ ඝ්‍යණ්ප්‍රත්‍යයාගේ බාධාව පිණිස මේ ප්‍රත්‍යය වෙයි. රමතෙ යත් තත් ඉති රම්, මෙසින් පවර්ගාන්ත ධාතුහු කෙරෙන් යප්‍රත්‍යයයි, රම්‍යං. තප්‍යං ලභ්‍යං ආදීයද එසේමැයි. ශක-ය, ශක්‍යං. සහ ශහ්‍යං. තක තක්‍යං. චත චත්‍යං. යත යත්‍යං. ශස ශස්‍යං. භජ භජ්‍යං, පක්ෂයෙහි, (971) ඝ්‍යණ් ජකාරයහට ගකාර වේ, වෘද්ධියි, භාග්‍යං. ජප ජප්‍යං, පක්ෂයෙහි වෘද්ධියි, ජාප්‍යං. යජ යජ්‍යං, පක්ෂයෙහි යාජ්‍යං, මෙහි යාගාවයව යජධාතු බැවින් ජකාරයහට ගකාර නොවේ. ආඞ්පූර්ව නම ආනම්‍යං. ආනාම්‍යං. චමාදෙස්තු, චමාදි ධාතූන් කෙරෙන් වනාහි; ආඞ්පූර්ව

චම, වෑඩිසි, ආචාම්‍යං. චාප්‍යං යනාදියද එසේමැයි. ආචාම්‍යං යනාදි තන්හි ඝ්‍යණ් වේ. අනකාරනිර්ද්දෙශාත්, දන්හු නද මෙහ යන මොහුගේ නකාර රහිත පාඨය බැවින් නකාරලොපය කළකල්හි (577) වෑඩිසි.* [පාණිනිඃ 3. 1. 98. 99, 126.]

(මු-) **977. යාඞ ලභො මුණ්.** (යි 1. ආලභඃ 6. මුණ් 1.)

ආඞ්පූර්වස්‍ය ලභො මුණ් ස්‍යාත් යකාරෙ පරෙ. ආලම්භ්‍යො ගෞඃ.

(ස-) යකාරෙ පරෙ, යප්‍රත්‍යය පර කල්හි; ආඞ්පූර්වස්‍ය ලභඃ, ආඞ්පූර්ව ලභධාතුහට; මුණ් ස්‍යාත්, මුණ්ආගම වන්නේය.

ආලභ්‍යතෙ ඉති ආඞ්පූර්ව පවර්ගාන්ත ලභධාතුව ලද කල්හි (976) යප්‍රත්‍යයයි, මෙයින් මුණ්ආගම වේ, ආලම්භ්‍යො යනු වේ. ගෞඃ, ගවයයි, ආලම්භ්‍යඃ යනු මැරිය යුත්තේය යන අර්ථයි. [පාණිනිඃ 7. 1. 65.]

(මු) **978. උපාත් ස්තුතෞ.** (උපාත් 5. ස්තුතෞ 7.)

උපපූර්වස්‍ය ලභො මුණ් ස්‍යාත් යෙ පරෙ ප්‍රශංසායාං. උපලම්භ්‍යඃ සාධුඃ. ස්තුතෞ කිං උපලභ්‍යමස්මාත් කිඤ්චිත්.

(ස-) උපපූර්වස්‍ය ලභඃ, උපපූර්වවූ ලභධාතුහට; යෙ පරෙ, යප්‍රත්‍යය පර කල්හි; ප්‍රශංසායාං, ප්‍රශංසායෙහි; මුණ් ස්‍යාත්, මුණ්ආගම වන්නේය.

උපපූර්ව ලභ (976) යප්‍රත්‍යයයි, මෙයින් මුණ් වේ, උපලම්භ්‍යඃ සාධුඃ, සත්පුරුෂතෙම ස්තුති කටයුතු වෙයි. ස්තුතෞ කිං, ස්තුතෞ යනු කුමටය ? උපලභ්‍යමස්මාත් කිඤ්චිත් යන මෙහි ස්තුත්‍යර්ථය නොවන හෙයින් ලභධාතුහු කෙරෙන් මුණ් නො වේ. උපලභ්‍යං යනු ලැබියයුත්තය යන අර්ථයි. [පාණිනිඃ 7. 1. 66.]

(මු-) **979. ගද-මද-යම-චරාචරෙ'ගෙර් යඃ.** (ගද මද යම චර ආචරඃ 5. අගෙඃ 5. යඃ 1.)

අගිභ්‍ය එභ්‍යො යඃ ස්‍යාත් ඝ්‍යභාවෙ. ගද්‍යං මද්‍යං යම්‍යං චර්‍ය්‍යං ආචර්‍ය්‍යං. අගෙඃ කිං, ප්‍රගාද්‍යං අභිචාර්‍ය්‍යං.

---

* පුශ්ච ශඃතශ්ච සහශ්ච තකශ්ච චතශ්ච යතශ්ච ශස සෙති තස්මාත්. චමශ්ච වපශ්ච රපශ්ච ලපශ්ච ත්‍රපශ්ච දභ ච තෙ, න විද්‍යන්තෙ නතා තෙ යත්‍ර සො'චම-වප-රප-ලප-ත්‍රප-දභ, තස්මාත්. හජශ්ච ජපශ්ච යජශ්ච අ-නමෙවෙති තස්මාත්.

(ස-) අගිහ්‍යඃ, ගිසංඥයා රහිතවූ; එභ්‍යඃ, ගද-මද-යම-චර-ආඞ්පූර්‍ව චර යන මොවුන් කෙරෙන් පරව; ඵභාවෙ, කර්‍ම භාව දෙක්හි; යඃ සතත්, යප්‍රත්‍යය වන්නේය.

මේ ප්‍රත්‍යයද ඝ්‍යණ්ප්‍රත්‍යයහට බාධා පිණිසයි. ගද්‍යතෙ යත් තත් ගදධාතු, මෙයින් යප්‍රත්‍යය වේ, ගද්‍යං. මද්‍යං යනාදියද එසේමැයි. ආඞ්පූර්‍ව චර, ය, ආචය්‍ර්‍යං. අගෙඃ කිං, අගෙඃ යනු කුමටය? ප්‍රගාද්‍යං අභිචාය්‍ර්‍යං යනාදියෙහි ගිසංඥය පූර්‍ව බැවින් යප්‍රත්‍යය නොවන හෙයිනි. ගිසංඥය පූර්‍වවූඑම ධාතුහු කෙරෙන් ඝ්‍යණ්ප්‍රත්‍යයමැයි, වෘඞිද වෙයි. [පාණිනිඃ 3. 1. 100.]

(මු-) 980. **පණ්‍යාවද්‍යාවය්‍ර්‍යාවාය්‍ර්‍යවහ්‍යජය්‍යක්‍ෂය්‍යක්‍රය්‍යාර්‍ය්‍යොපසර්‍ය්‍යා ජය්‍ර්‍යං.** (පණ්‍ය — අජය්‍ර්‍යං 1.)

එතෙ යාන්තා නිපාත්‍යන්තෙ.

පණ්‍යං විකේ‍රයං. අවද්‍යමනිෂ්ටං. වය්‍ර්‍යා කන්‍යා, වය්‍ර්‍යං ශ්‍රෙෂ්ඨං. ආවාය්‍ර්‍යො ගුරුඃ. උහ්‍යතෙ'නෙනෙති වහ්‍යං ශකටං. ජෙතුං ශක්‍යං ජය්‍යං, එවං ක්‍ෂය්‍යං. ක්‍රය්‍යං හට්ටෙ ප්‍රසාරිතං. අය්‍ර්‍යඃ ස්වාමි වෛශ්‍යො වා. උපසිය්‍යතෙ ඉත්‍යුපසය්‍ර්‍යා ඍතුමතී. න ජීය්‍ර්‍යතීති අජය්‍ර්‍යං සඞ්ගතං.

(ස-) එතෙ, පණ්‍යවද්‍ය යන මේ ආදීවූ; යාන්තාඃ, යප්‍රත්‍යයාන්ත ශබ්දයෝ; නිපාත්‍යන්තෙ, නිපාතනය කරනුලැබෙත්.

පණව්‍යවහාරෙ සතු තෙ‍ාචපණධාතු, යප්‍රත්‍යය කළකල්හි මෙයින් සිඞයි, පණ්‍යං, විකේ‍රයං, විකිණියයුතුවූ ද්‍රව්‍යයයි. නිපාතනයෙන් පිටත් තන්හි, පාණ්‍යඃ යනු වේ, සතුති කටයුත්තෙක් යන අර්‍ථයි, විෂ්ණුයි. න උද්‍ය තෙ ඉති නඤ්පූර්‍ව වදධාතු, යප්‍රත්‍යයයි, අවද්‍යං යනු වේ, අනිෂ්ටං, අනිෂ්ටයයි, නින්‍දකටයුතුය යන අර්‍ථයි. අන්‍යස්ථානයෙහි, අවාද්‍යං යනු වේ, වාක්‍යයයි, ඝ්‍යණ් වේ. වෘධාතු, ඝ්‍යණ්, වය්‍ර්‍යා කන්‍යා, කන්‍යාවයි, කන්‍යාදානය පිණිස කටයුතුවූ ක්‍රියාභෙද ඇත්තිය. වය්‍ර්‍යං ශ්‍රෙෂ්ඨං, පිදියයුතුවූ. අන්‍යස්ථානයෙහි වාය්‍ර්‍යං යනු වේ. ඍකාරාන්තයෙන් ඝ්‍යණ් වේ. ආවාය්‍ර්‍යතෙ'නෙනෙති ආඞ්පූර්‍ව චරධාතු, ඝ්‍යණ්, ආචාය්‍ර්‍යඃ, ගුරුඃ, ගුරුයි. අන්‍යස්ථානයෙහි ආචය්‍ර්‍යං, පූර්‍වසූත්‍රයෙන් යප්‍රත්‍යය වෙයි. උහ්‍යතෙ'නෙනෙති වහධාතු, යප්‍රත්‍යයයි, වහ්‍යං ශකටං, ගැලයි. අන්‍යස්ථානයෙහි වාහ්‍යං,

හසන්තයා කෙරෙන් ඝ්‍යණ් වේ. ජේතුං, ශක්‍යං ජි, නිපාතනයෙන් සිද්ධයි, ජය්‍යං. අන්‍යස්ථානයෙහි, ජේයං යනු වේ. එවං ක්‍ෂය්‍යං, ක්‍ෂය්‍යං යනුද මෙසේමැයි. ක්‍ෂේතුං ශක්‍යං ක්‍ෂි, යප්‍රත්‍යය වේ, ක්‍ෂය්‍යං, අන්‍යස්ථානයෙහි, ක්‍ෂේයං. ක්‍රේතුං ශක්‍යං ක්‍රී, ක්‍රය්‍යං, හට්ටෙ ප්‍රසාරිතං, ක්‍රයවික්‍රයස්ථානයෙහි පිළිවෙළින් තබනලද්දවූ ද්‍රව්‍යයි, අන්‍යස්ථානයෙහි, ක්‍රේයං යනු වේ. ඍධාතු, අර්‍ය්‍යඃ, ස්වාමී, ස්වාමියයි, වෛශ්‍ය වා, නොහොත් වෛශ්‍යයෙක්. අන්‍යස්ථානයෙහි ආර්‍ය්‍යඃ, (971) මෙහි ඝ්‍යණ් වේ. උපස්‍රියතෙ ඉත්‍යුපසර්‍ය්‍යා, උපපූර්‍ව ඍධාතු, එළබියයුත්තිය; ඍතුමතී, ඔසප්ව ස්නානය කළ තැනැත්තී යන අර්‍ථයි. අන්‍යස්ථානයෙහි උපසාර්‍ය්‍යං, මෙහි ඝ්‍යණ් වේ. න ජීර්‍ය්‍යතීති න පූර්‍ව ජෘධාතු, අජර්‍ය්‍යං, සඞ්ගතං, ගළපනලද්දකී, සුදුසුය යන අර්‍ථයි. අන්‍යස්ථානයෙහි, අජාර්‍ය්‍යං, ඝ්‍යණ් ප්‍රත්‍යය වේ. [පාණිනිඃ 3. 1. 101—105.]

(මූ-) **981. දෘ හෘ ජුෂ ස්තවින්-ශාසෘදුඞ්-වෘඤෙ'කෘපචෘතසෘච පාණිසෘජ්සමවසෘජඃ ක්‍යප්.** (දෘ—වෘඤඃ 5. අකෘප—සමවසෘජඃ 5. ක්‍යප් 1.)

දෘදෙර් සෘකාරෙණෙඩො වෘඤශ්ච කෘපාදිවර්ජිත් ක්‍යප් ස්‍යාත් ඪභාවෙ.*

(ස-) කෘපාදිවර්ජිත්, කෘපධාතු ආදිකොට ඇති ෘතධාතු සෘචධාතු පාණිශබ්දයා කෙරෙන් පරවූ සෘජ්ධාතු සම් යන්නෙන් පරවූ අවපූර්ව සෘජධාතු යන මේ ධාතූන් රහිතවූ; දෘදෙඃ, දෘධාතු හෘධාතු ජුෂධාතු ස්තුධාතු ඉන්ධාතු ශාසධාතු යන මොවුන් කෙරෙන්ද; සෘකාරෙඩඃ, උඞ්සංඥ සෘකාර යුක්ත ධාතූහු කෙරෙන්ද; වෘඤශ්ච, වෘධාතූහු කෙරෙන්ද; ඪභාවෙ, කර්ම භාව දෙක්හි; ක්‍යප් ස්‍යාත්, ක්‍යප්ප්‍රත්‍යය වන්නේය. [පාණිනිඃ 3. 1. 109, 110.]

(මූ-) **982. ස්වස්‍ය තන් පිති.** (ස්වස්‍ය 6. තන් 1. පිති 7.)

---

* සෘත් උඞ් යස්‍ය ස සෘදුඞ්, දෘශ්ච හෘශ්ච ජුෂශ්ච ස්තුශ්ච ඉන් ච ශාස ච සෘදුඞ් ච වෘඤ්චෙති තස්මාත්. පාණෞ සෘජ් පාණිසෘජ්, සමො'වඃ සමවඃ, සමවාත් සෘජ් සමවසෘජ්, කෘපශ්ච ෘතශ්ච සෘචශ්ච පාණිසෘජ් ච, සමවසෘජ් ච තත්, පශ්චානන ඤ්‍යොගෙ තස්මාත්.

හ්‍රස්වාන්තස්‍ය තුක් ස්‍යාත් පිති. ආදෘත්‍යඃ භෘත්‍යඃ ජුෂ්‍යඃ ස්තුත්‍යඃ ඉත්‍යඃ ශිෂ්‍යඃ වෘධ්‍යඃ වෘත්‍යඃ. ක්‍ලෘපාදෙස්තු කල්ප්‍යං චර්ත්‍යං අර්ච්‍යං පාණිසර්ග්‍යා සමවසර්ග්‍යා රජ්ජුඃ.

(ස-) පිති, ඉත්සංඥ පකාරයුක්ත කෘත්ප්‍රත්‍යය පර කල්හි; හ්‍රස්වාන්තස්‍ය, හ්‍රස්වාන්ත ධාතුහට; තුක් ස්‍යාත්, තුක්ආගම වන්නේය.

මෙහි යම්කිසි ප්‍රකාරයෙකින් හ්‍රස්වාන්ත ධාතුහුගේ ග්‍රහණ යයි, ප්‍රකෘතියෙන් හ්‍රස්වාන්ත ධාතුහුගේ ග්‍රහණය නොගන ලදී, එහෙයින් විතත්‍ය යනාදියෙහි ඤම්ලොපය කළ කල්හි මෙයින් තුක්ආගම වේ. ක්‍යප්ප්‍රත්‍යය කිත් බැවින් ගුණ නොවේ. [පාණිනිඃ 6. 1. 71.]

(ස-) ආඞ්පූර්ව් දෘධාතු, (981) ක්‍යප් වේ, පිත් බැවින් මෙයින් තුක්ආගම වේ, කකාරය ඉත් බැවින් ගුණනිෂෙධයි. ආදෘත්‍යඃ. භෘධාතු, ක්‍යප්-තුක්, භෘත්‍යඃ. ජුෂධාතු, ජුෂ්‍යඃ. ස්තුධාතු, ස්තුත්‍යඃ. ඉණ්ධාතු, ඉත්‍යඃ. ශාසධාතු, ක්‍යප්, (705) උඞ්හට ඉකාරද, (111) ෂත්වයද වෙත්, ශිෂ්‍යඃ. වෘධධාතු, උඞ්සංඥ ඍකාර ධාතුයි. අනන්තර්භූත ණිප්‍රත්‍යයාගේ අර්ථ ඇති බැවින් සකර්මකත්වය ඇති කල්හි කර්මයෙහි ක්‍යප් වේ, වෘධ්‍යඃ, වර්ධනය කටයුත්තෙක් යන අර්ථයි. වෘඤ්ධාතු, වෘත්‍යඃ. වෘඤ්ධාතුහුගේ අනුබන්ධ ඤකාරය හෙතුකොටගෙන වෘඤ් යන මේ ධාතුහට වාර්‍ය්‍යඃ කියා වේ. ක්‍ලෘපාදෙස්තු, ක්‍ලෘපාදීය කෙරෙන් වනාහි; ක්‍ලෘප, ණ්‍යත්, (649) ක්‍ලෘප ආදෙශද, ගුණද වෙත්, කල්ප්‍යං. චෘත, (971) ණ්‍යත්, ගුණ වේ, චර්ත්‍යං. ඍච, ණ්‍යත්, ගුණ වේ, අර්ච්‍යං, සෙම්කතධාතු බැවින් චකාරයහට කකාර නොවේ. පාණෞ සෘජ්‍යතෙ'සෞ පාණිපූර්ව් සෘජ, ණ්‍යත්, (972) ජකාරයහට ගකාර වේ, පාණිසර්ග්‍යා. සමවසෘජ්‍යතෙ'සෞ යන වාක්‍යයෙහි සං යන්නහු කෙරෙන් පරවූ අවපූර්ව් සෘජධාතු, ණ්‍යත්, සමවසර්ග්‍යා, රජ්ජුඃ, රැහැණයි. [පාණිනිඃ 6. 1. 71.]

(මූ-) 983. **කෘ වෘෂ මෘජ ගුහ දුහ ශංස සංහා ප්‍රත්‍යපි ග්‍රහො වා.** (කෘ—ග්‍රහඃ 5. වා 1.)

එභ්‍යඃ ක්‍යප් ස්‍යාත් වා ණ්‍යභාවෙ. කෘත්‍යං කාර්‍ය්‍යං, වෘෂ්‍යං වර්ෂ්‍යං, මෘජ්‍යං මාර්ග්‍යං, ගුහ්‍යං ගොහ්‍යං, දුහ්‍යං දොහ්‍යං, ශස්‍යං

ශංස්‍යං, සංභෘත්‍යඃ සංභාර්‍ය්‍යඃ, ප්‍රතිගෘහ්‍යං ප්‍රතිග්‍රාහ්‍යං, අපිගෘහ්‍යං අපිග්‍රාහ්‍යං.

(ස-) එගත්‍යඃ, කෘ-වෘෂ-මෘජ-ගුහ-දුහ-ශන්ස-සම් පූර්ව භෘ-ප්‍රතියන්න කෙරෙන්ද අපියන්න කෙරෙන්ද පරවූ ග්‍රහධාතු යන මොවුන් කෙරෙන්; ඒභාවෙ, කර්ම භාව දෙක්හි; වා, විකල්පයෙන්; ක්‍යප් ස්‍යාත්, ක්‍යප්ප්‍රත්‍යය වන්නේය.

සියලු තන්හි විකල්ප පක්‍ෂයෙහි (971) ඝ්‍යණ් වේ. ක්‍රියතෙ යත් තත් ඉති කෘ, මෙයින් ක්‍යප් වේ, තන්ආගමව, කෘත්‍යං. පක්‍ෂයෙහි ඝ්‍යණ්, (577) වෘද්ධි, කාර්‍ය්‍යං. වෘෂ, ක්‍යප්, වෘෂ්‍යං, පක්‍ෂයෙහි ගුණ වේ, වර්ෂ්‍යං. මෘජ, මෘජ්‍යඃ, පක්‍ෂයෙහි (694) වෘද්ධි, (972) ජකාරයහට ගකාර වේ, මාර්ග්‍යං. ගුහ්‍යතෙ යත් තත් ඉති ගුහ, ක්‍යප්, ගුහ්‍යං, පක්‍ෂයෙහි-ඝ්‍යණ්, ගුණ වේ, (656) ගුහොණෞරූඃ යන මෙහි ස්වර පර කල්හි විධානය බැවින් ඌකාර නොවේ, ගොහ්‍යං. දුහ්‍යතෙ යත් තත් ඉති දුහ, කර්මයෙහි ක්‍යප් වේ, දුහ්‍යං, පක්‍ෂයෙහි ගුණ වේ, දොහ්‍යං. ශන්ස, කර්මයෙහි ක්‍යප් වේ, (567) නකාරලොපය වේ, ශස්‍යං, පක්‍ෂයෙහි ශංස්‍යං. සංපූර්ව භෘ, තන්ආගම වේ, සංභෘත්‍යඃ, පක්‍ෂයෙහි වෘද්ධි, සංභාර්‍ය්‍යඃ. ප්‍රතිගෘහ්‍යතෙ ඉති ප්‍රතිපූර්ව ග්‍රහ, ක්‍යප්, (661) ජ්‍යදෙශ වේ, ප්‍රතිගෘහ්‍යං, පක්‍ෂයෙහි, වෘද්ධි, ප්‍රතිග්‍රාහ්‍යං. අපිපූර්ව ග්‍රහ, අපිගෘහ්‍යං, පක්‍ෂයෙහි අපිග්‍රාහ්‍යං යනුද පෙර සේමැයි. [පාංණිනිඃ 3. 1. 112, 113, 118, 120.]

(මු-) 984. **ගෘහ්‍ය විනීය විපූය ජිත්‍යා සූර්‍ය රුච්‍ය ව්‍යථ්‍ය භිද්‍යොද්ධ්‍ය පුෂ්‍ය සිධ්‍ය තිෂ්‍යාජ්‍ය යුග්‍ය කෘෂ්ටපච්‍ය කුප්‍ය භාර්‍ය්‍යාඃ.** (ගෘහ්‍ය—භාර්‍ය්‍යාඃ 1...)

එතෙ ක්‍යබන්තා නිපාත්‍යන්තෙ. ප්‍රගෘහ්‍යං පදං, කෘෂ්ණගෘහ්‍යඃ කෘෂ්ණවර්ගීයඃ, ගෘහ්‍යා'ස්වෛරී, ග්‍රාමගෘහ්‍යා ග්‍රාමබාහ්‍යා. විනීයඃ කල්කඃ. විපූයො මුඤ්ජඃ. ජිත්‍යා හලිඃ. සරතීති සූර්‍ය්‍යඃ, එවං රුච්‍යඃ, අව්‍යථ්‍යඃ. කූලං භිනත්තීති භිද්‍යො නදඃ. වාරි උජ්ඣතීති උද්ධ්‍යො නදඃ. කාය්‍යං පුෂ්ණාතීති පුෂ්‍යො නක්‍ෂත්‍රං. කාර්‍ය්‍යං සාධයතීති සිධ්‍යඃ, ස එව තිෂ්‍යො'පි. ආජ්‍යං ඝෘතං. යුග්‍යං වාහනං. කෘෂ්ටෙ ස්වයං පච්‍යතෙ ඉති කෘෂ්ටපච්‍යා ව්‍රීහිඃ. කුප්‍යං සුවර්ණරූප්‍යභින්නමන්‍යත්. භාර්‍ය්‍යා වධූඃ ක්‍ෂත්‍රියා ච.

(ස-) ක්විබන්තාඃ, ක්විප්ප්‍රත්‍යයාන්තවූ; එතෙ, ගෘහ්‍ය විනීය යනාදී ශබ්දයෝ; නිපාත්‍යන්තෙ, නිපාතනය කරනුලැබෙත්.

පද පක්‍ෂ පරතන්ත්‍ර බහිර්භූත යන මොවුන් කෙරෙහි ගෘහ්‍ය යනු නිපාතනය කරනුලැබෙත්. ප්‍රපූර්ව ගෘහ. ක්‍යප්, ප්‍රගෘහ්‍යං, පදං, පදයයි. කෘෂ්ණගෘහ්‍යඃ, කෘෂ්ණවර්ගීයඃ යනු කෘෂ්ණ භූමෞග්පක්‍ෂයයි, පාණ්ඩවකුමාරය යන අර්ථයි. ගෘහ්‍යඃ, අසෛව්‍රී, සෛවණයෙන් නොහැසිරෙන්නෙක්, ග්‍රාමගෘහ්‍ය, ග්‍රාමවාහ්‍ය යනු ගමින් පිටත්හි වූ නදිය යන අර්ථයි. මෙසින් අන්තන්හි ග්‍රාහ්‍යං යනු වේ.

විපූර්ව ණී, ක්‍යප්, විනීයඃ, කල්කඃ, කල්කයයි. අන්තන්හි විනෙයඃ යනු වේ, භික්මියයුතුය යන අර්ථයි. විපූර්ව පූ, විපූයඃ, මුඤ්ජඃ, මුඤ්ජ යනු පිලගස්. අන්‍යත්තන්හි විපව්‍යඃ, ජි. ජිත්‍ය, හලිඃ, මහනඟුලයි. අන්තන්හි ජෙයඃ. සරතීති සෘ, සූය්‍යඃ, කතෘයෙහි ක්‍යප්, නිපාතනයෙන් සිඩයි, හිරුයි. අන් තන්හි සෘ-සාය්‍යඃ. රොචතෙ ඉති රුච්‍යඃ නවාර්ථෙ අච්‍යර්ථඃ යනුද මෙසේමැයි. කූලං භිනත්තීති භිද, භිද්‍යඃ, නදඃ, නොකරණ ලද ජලප්‍රවාහයයි. වාරි උජ්ඣතීති උජ්ඣ, ක්‍යප් වේ, නිපා තනයෙන් සිඩයි, උඩ්ඃ, නදඃ. කාය්‍යං පුෂ්ණාතීති පුෂ, පුෂ්‍යඃ නක්‍ෂත්‍රං, පුසනැකතයි. කාය්‍යං සාධයතීති සාධ, සිඩ්ඃ, එම නැකතයි, ස එව. තොෂයතීති තුෂ, තිෂ්‍යො'පි, එම නැකතයි. අජ්‍යතෙ ම්‍රක්‍ෂ්‍යතෙ'නෙනෙති අන්ජ, ආජ්‍යං ඝෘතං, ගිතෙලයි. යුජ්‍යතෙ යත් තත් යුජ, යුග්‍යං, ජකාරයහට ගකාර වේ, වාහනං. කෘෂ්ටෙ ස්වයං පච්‍යතෙ ඉති කෘෂ්ටපූර්ව පච, කර්මකතෘයෙහි ක්‍යප් වේ, කෘෂ්ටපච්‍යා ව්‍රීහිඃ. කුප්‍යතෙ යත් තත් කුප, කුප්‍යං. සුවර්ණ රූප්‍යවයෙන් අන්‍යතරයෙක්, සුවර්ණ රජත දෙදෙනාහට වනාහි, ගොප්‍යංයනු වේ. භ්‍රියතෙ'සෞ භෘ, භාය්‍යා, බධූඃ, අඹුවයි; ක්‍ෂත්‍රියා ච. [පාණිනිඃ 3. 1. 114—117, 121.]

(මු-) 985. ලෙ ර්වදඃ ක්‍යප්යෞ. (ලෙඃ 5. වදඃ 5. ක්‍යප් යෞ 1..)

ලෙඃ පරත් වදඃ ක්‍යප් යෞ සතඃ ඊභාවෙ. බ්‍රහ්මණ උද්‍යතෙ ඉති බ්‍රහ්මොද්‍යං බ්‍රහ්මවද්‍යං, කථා.

(ස-) ලෙඃ පරත්, ලිඞගයා කෙරෙන් පරවූ; වදඃ, වදධාතුහු කෙරෙන් පරව; ඊභාවෙ, කර්මභාව දෙක්හි; ක්‍යප් යෞ, ක්‍යප් ප්‍රත්‍යය යප්‍රත්‍යය දෙක; සතඃ, වන්නාහ.

ක්‍යප් යනුද ය-සනුද දෙක ක්‍යප්ප්‍රත්‍යයාගේ විකල්පය දක් වයි. බ්‍රහ්මණා, බ්‍රාහ්මණයා විසින්; උද්‍යතෙ ඉති, බ්‍රහ්මන්ශබ්ද පූර්‍ව-වද, (661) ජ්‍යදෙශද, නකාරලොපයද, (23) ගුණද වෙත්, බ්‍රහ්මොද්‍ය. යප්‍රත්‍යය වේ, බ්‍රහ්මවද්‍ය, කථා, කථාවයි. භාව යෙහි වනාහි බ්‍රහ්මොද්‍යං බ්‍රහ්මවද්‍යං; යනාදියෙහි ස්‍යාද්‍යන්තාවූ උපපදයාගේ කෘදන්තධාතුව හා සමාසය විකල්ප්‍ය වෙයි. [පාණිනිඃ 3. 1. 106.]

(මු-) 986. මෘෂොද්‍යං නිත්‍යං. (මෘෂොද්‍යං 1. නිත්‍යං 1.)

(ස-) මෘෂොද්‍යං, මෘෂොද්‍යං යනු; නිත්‍යං, නිත්‍යයි. මෘෂා උද්‍යතෙ ඉති මෘෂොද්‍යං, නිත්‍යයෙන් ක්‍යප් වේ, (661) ජ්‍යදෙශයි. නිත්‍යම් යනු කිම කරණකොටගෙන, මෘෂාවද්‍යං යනු නොවේ. [පාණිනිඃ 3. 1. 114.]

(මු-) 987. භූ-හනඃ ක්‍යප් භාවෙ න තශ්ච. (භූ-හනඃ 5. ක්‍යප් 1. භාවෙ 7. න 1. තඃ 1. ච 1.)

ලෙඃ පරාභ්‍යාමාභ්‍යාං ක්‍යප් ස්‍යාත් භාවෙ, හනොනස්‍ය තශ්ච. බ්‍රහ්මභූයං බ්‍රහ්මත්වං, බ්‍රහ්මහත්‍යා.

(ස-) ලෙඃ පරාභ්‍යාං, ලිඞ්ගයා කෙරෙන් පරවූ; ආභ්‍යාං, භූ ධාතු හනධාතු යන මේ දෙකින් පරව; භාවෙ, භාවයෙහි; ක්‍යප් ස්‍යාත්, ක්‍යප්ප්‍රත්‍යය වන්නේය; හනඃ, හනධාතුහුගේ; නස්‍ය, නකාරයහට; තශ්ච, තකාරාදෙශද වන්නේය.

බ්‍රහ්මණො භාවඃ, බ්‍රහ්මන්ශබ්ද පූර්‍ව භූ, මෙයින් ක්‍යප්ද, නකාරලොපයද වෙත්, බ්‍රහ්මභූයං; බ්‍රහ්මත්වය යන අර්‍ථයි. බ්‍රහ්මණො හනනං, බ්‍රහ්මන්ශබ්ද පූර්‍ව හන, (676) ස්‍යම්ලොප යද, (982) තන්ආගමද වෙත්, බ්‍රහ්මහත්‍යා. අභිධාන බැවින් ස්ත්‍රීලිඞ්ගතාවයයි. [පාණිනිඃ 3. 1. 107, 108.]

(මු-) 988. ධොඃ කෙලිමො ඒෂෙ. (ධොඃ 5. කෙලිමඃ 1. ඒෂෙ 7.)

ධොඃ පරඃ කෙලිමඃ ස්‍යාත් ඒෂෙ. ස්වයමෙව පච්‍යන්තෙ ඉති පචෙලිමාස්තණ්ඩුලාඃ. එවං භිදෙලිමාඃ මාෂාඃ.*

(ස-) ධොඃ පරඃ, ධාතුහු කෙරෙන් පරව; ඒෂෙ, කර්‍මකර්තෘ යෙහි; කෙලිමඃ ස්‍යාත්, කෙලිමප්‍රත්‍යය වන්නේය.

---

* ඒෂ්ව තත් ස්‍යෙවෙති ඒෂඃ තස්මින්.

ධාතුහුගේ ග්‍රහණය සියලු ධාතූන්ගේ ප්‍රාප්තිය පිණිසයි. කෙලිමප්‍රත්‍යයාගේ කකාරය ඉත්සංඥා·බැවින් ගුණ නොවේ. ස්වයමෙව පච්‍යන්තෙ ඉති පචෙලිමාඃ, පච, මෙයින් කෙලිම ප්‍රත්‍යය වේ. කාලයෙකින් පැසෙනුලබන්නාවූ සහල් තමා විසින්ම පිසනුලැබෙත් යන අර්ථයි.

එවං භිදෙලිමාඃ, ඡිදෙලිමාඃ, යනුද මෙසේමැයි, මාෂාඃ, උඳුයි. ඡිද, කෙලිමප්‍රත්‍යයයි. ඡිදෙලිමං යනුද මෙසේමැයි, කාෂ්ඨං. මෙඝෙන මුච්‍යමානං වාරි ස්වයමෙව මුච්‍යතෙ ඉති මුචෙලිමං යනාදියද වේ.

(මූ-) 989. **තෙ ල්‍යඃ, ශක්‍යාර්හ්‍යප්‍රෛෂානුඥාප්‍රාප්තකාලෙ වා.** (තෙ 1...ල්‍යඃ 1...ශක්‍ය—ප්‍රාප්තකාලෙ 7. වා 1.)

තව්‍යාදයො ල්‍ය-සංඥාඃ ස්‍යුඃ, තෙ ච ශක්‍යාද්‍යර්ථෙෂු වා ස්‍යුඃ. වොඪුං ශක්‍යො වොඪව්‍යඃ වහනීයඃ වාහ්‍යඃ. ස්තොතුමර්හඃ ස්තොතව්‍යඃ ස්තවනීයඃ ස්තුත්‍යඃ. ප්‍රෛෂිතස්ත්වං ත්වයා ගන්තව්‍යං ගමනීයං ගම්‍යං. අනුඥාතස්ත්වං ත්වයා අධ්‍යෙතව්‍යං අධ්‍යයනීයං අධ්‍යෙයං. ප්‍රාප්තඑෂ කාලඃ ත්වයා ධ්‍යාතව්‍යං ධ්‍යානීයං ධ්‍යෙයං.*

ඉති ල්‍යපාදඃ.

(ස-) තව්‍යාදයඃ, තව්‍යප්‍රත්‍යය ආදිකොට ඇති, අනීයප්‍රත්‍යය, යප්‍රත්‍යය, ඝ්‍යණ්ප්‍රත්‍යය, ක්‍යප්ප්‍රත්‍යය, කෙලිමප්‍රත්‍යය යන මේ ප්‍රත්‍යයෝ; ල්‍යසංඥාඃ, ල්‍යසංඥා ඇත්තාහු; ස්‍යුඃ, වන්නාහුය; තෙ ච, ඒ ප්‍රත්‍යයෝද; ශක්‍යාද්‍යර්ථෙෂු, ශක්‍යාර්ථය ආදිකොට ඇති අර්හ්‍යය ප්‍රෛෂ්‍යය අනුඥාය ප්‍රාප්තකාලය යන මේ අර්ථයන් කෙරෙහි; වා ස්‍යුඃ, විකල්පයෙන් වන්නාහ. වාශබ්දය සමුච්චයාර්ථයි, එහෙයින්, ශක්‍යාදිවූ අර්ථාභාවයෙහිද වන්නාහුය යන අර්ථයි. ල්‍යසංඥාදිවූ කෘදන්ත ශබ්දයන්ගේ නාමසංඥාව කියත්—

උණාද්‍යන්තං කෘදන්තඤ්ච තද්ධිතාන්තං සමාසජං,
නාමසංඥා භවෙදෙෂාං ස්‍යාද්‍යුත්පත්තිස්තතඃ පරං.

---

* ශක්‍යශ්ච අර්හ්‍යශ්ච ප්‍රෛෂ්‍යශ්ච අනුඥා ච ප්‍රාප්තකාලශ්ච තස්මින්.

අනන්‍යාර්ථයන් කෙරෙහි පූර්වෝදාහරණයෝයි, ශක්‍යාදිවූ අර්ථයන් කෙරෙහි උදාහරණයන් වොඪුං යනාදි වශයෙන් කියයි. වොඪුං ශක්‍යඃ වහ, තව්‍ය, (175) හකාරයහට ඪකාරද, (653) අකාරයහට ඔකාරද, (575) තකාරයහට ධකාරද, (47) එම ධකාරයහට ඪකාරද, (77) ඪකාරයහට ලොප්ද වෙත්, වොඪව්‍යඃ, මඳබරයි, ඤවලෙපාහාරඃ, යනු ශෙෂයයි. ශක්‍යතෙ'සෞ ශක, කර්මයෙහි යප්‍රත්‍යයයි, ශක්‍යඃ. වහනීයඃ යනු වහධාතුහු කෙරෙන් අනීය ප්‍රත්‍යයයි. වහ—(971) ඤ්‍යණ් වේ, (577) වෘද්ධියි, වාහ්‍යඃ. සෙතාතුමහර්හඃ ෂ්ටු, තව්‍ය, ස්තොතව්‍යඃ, අහර්තෙ යොග්‍යඃ ක්‍රියතෙ'සාවිති අහර්හඃ. අහ්‍යනන්තරවූ ඤ්‍යප්‍රත්‍යයාගේ අර්ථය බැවින් කර්මයෙහි යප්‍රත්‍යයයි. ස්තවනීයඃ. ස්තු—(981) ක්‍යප්, (982) තන්ආගම වේ, ස්තුත්‍යඃ. ගුරුඃ යනු ශෙෂයයි. මේ උදාහරණවය කර්මය වාච්‍ය කල්හි වෙයි. ප්‍රෙෂිතස්ත්වං ත්වයා ගන්තව්‍යං, ගම, ප්‍රෙෂිතාර්ථයෙහි තව්‍ය, (202) මකාරයහට නකාර වේ. ගමනීයං ගම්‍යං යන දෙකද වෙත්. අනුඥාතස්ත්වං ත්වයා අධ්‍යෙතව්‍යං, අධිපූර්ව ඉ, අනුඥාතාර්ථයෙහි තව්‍ය, ගුණයි. අධ්‍යයනීයං අධ්‍යෙයං, යන පදයෝද වෙත්. ප්‍රාප්තසෙත කාලඃ ත්වයා ධ්‍යාතව්‍යං, ධ්‍යෛ, ප්‍රාප්තකාලාර්ථයෙහි තව්‍ය, (608) ඓකාරයහට ආකාර වේ. ධ්‍යානීයං ධ්‍යෙයං, (611) ආකාරයහට එකාර වේ. [පාණිනිඃ 3. 3. 163, 169, 171.]

ල්‍යපාදය නිමි.

තෘණාදිඃ.

(මු-) **990. තෘණ්ණකෞ සෙ.** (තෘණ්-ණකෞ 1 ·· සෙ 7.)

ධොස්තෘ න්—ණකෞ සෙ ස්තඃ. කරොතීති—කර්තා, කාරකඃ, දරිද්‍රායකඃ.

(ස-) ධොඃ, ධාතුහු කෙරෙන් පරව; සෙ, කර්තෘර්ථයෙහි; තෘන් ණකෞ, තෘන්ප්‍රත්‍යය ණකප්‍රත්‍යය දෙක; ස්තඃ, වෙත්.

තෘන් යන මොහුගේ දන්ත්‍යනකාරයයි, ඖණාදික තෘප්‍රත්‍යයාන්තවූ පිතෘ ආදි ශබ්දයන්ගේ විශෙෂාර්ථයයි. ණකප්‍රත්‍යයාගේ ණකාරය (577) වෘද්ධිය පිණිසයි. තෘන්ප්‍රත්‍යය ශීලාද්‍යර්ථයෙහිද වන්නේයයි අවබොධ කටයුතු, එහෙයින්ම ග්‍රන්ථකර්තෘහු විසින් (305) ශීලාද්‍යර්ථතෘන් යනු කියනලදී. කරො

තීති කෘ, මෙයින් තෘන්ප්‍රත්‍යය වේ, (542) ධාතුහුගේ ඍකාරය හට ගුණයි, නම්වත්ව සිවිභක්තිව කර්තා යනු වේ. කරෝතීති කෘ—මෙයින් ණකප්‍රත්‍යය වේ, (577) ඍකාරයහට වෘද්ධියි, කාරකඃ. දරිද්‍රා, මෙයින් ණක වේ, (702) දරිද්‍ර ආලොපඃ යනාදියෙහි අකප්‍රත්‍යය තොර බැවින් ආකාරයහට ලොප් නොවේ, (924) කෘදන්තයා පර කල්හි යන් වේ, දරිද්‍රායකඃ. [පාණිනිඃ 3. 1. 133.]

(මු-) **991. ගලෙචොපක-පාදහාරකෞ ණේ.** (ගලෙචොපක-පාදහාරකෞ 1 .. ණේ 7.) එතෞ නිපාත්‍යෞ ණේ.

(ස-) ණේ, කර්ම්‍ය වාච්‍ය කල්හි; එතෞ, ගලෙචොපක පාද හාරක යන මොව්හු දෙදෙන; නිපාත්‍යෞ, ණකප්‍රත්‍යය කළ කල්හි නිපාතනය කරණුලැබෙත්.

ගලෙ චුප්‍යතෙ'සෞ ගලෙපූර්ව චුප, කර්මයෙහි ණකප්‍රත්‍යය වේ, නිපාතනයෙන් සිද්ධයි, ගලෙචොපකඃ. පාදාභ්‍යාං හ්‍රියතෙ'සෞ පාදශබ්ද පූර්ව හෘ, ණකප්‍රත්‍යයයි, වෘද්ධියි. පාදහාරකඃ.

(මු-) **992. මාභ්‍යාත් ක්‍රමො නෙම් තෘණඃ.** (මාභ්‍යාත් 5. ක්‍රමඃ 5. න 1. ඉම් 1. තෘණඃ 6.)

ප්‍රක්‍රන්තා උපක්‍රන්තා. අන්‍යත්‍ර ක්‍රමිතා අතික්‍රමිතා.

(ස-) මාභ්‍යාත්, ආත්මනෙපදය වීමට යොග්‍යවූ ප්‍ර-උප පූර්වවූ; ක්‍රමඃ, ක්‍රමධාතුහු කෙරෙන්; තෘණඃ, තෘන්ප්‍රත්‍යයාගේ ස්ථාන යෙහි; නෙම්, ඉම් නොවන්නේය.

ප්‍රක්‍රමතීති ප්‍රපූර්ව ක්‍රම, තෘන්, (50) මකාරයහට අනුස්වාරයද, (51) අනුස්වාරය හට නකාරයද වෙත්, ප්‍රක්‍රන්තා, (894) ප්‍ර-උප පූර්ව ක්‍රමධාතුහට ආත්මනෙපද යොග්‍යත්වය වේ. උපක්‍රම තීති-උපක්‍රන්තා. අන්‍යත්‍ර, ප්‍ර-උප පූර්වවීමෙන් ආත්මනෙපද යොග්‍යත්වය නුවූ කල්හි; ක්‍රමිතා අතික්‍රමිතා, ප්‍ර-උප පූර්වනුවූ කල්හි ඉම් වේ.

(මු-) **993. ග්‍රහනන්දිපචාදෙර් ණිනනාන් ශෙ.** (ග්‍රහ-නන්දි-පච-ආදෙඃ 5. ණින්-අන-අන් 1. ශෙ 7.)

ග්‍රහාදෙර් ණින්, නන්දාදෙරනඃ පචාදෙරන් ස්‍යාත් ශෙ.

ග්‍රාහී ස්ථායී ප්‍රපායිණෞ, නන්දනඃ විචක්ෂණඃ ජනාර්දනඃ මධුසූදනඃ ලවණඃ, පචඃ දෙවඃ ලෙල්‍යඃ ලොලුවඃ රෞරූයඃ.*

---

* ග්‍රහශ්ච නන්දිශ්ච පචශ්ච තෙ ආදයො යස්‍ය ස තස්මාත්. ණින් ච අනශ්ච අන් ච තත්.

(සං-) ග්‍රහාදෙඃ, ග්‍රහාදි ධාතුහු කෙරෙන්; ණින්, ණින්ප්‍රත්‍ය යද; නන්‍දනාදෙඃ, නන්‍දනාදි ධාතුහු කෙරෙන්; අනඃ, අනප්‍රත්‍ය යද; පචාදෙඃ, පචාදි ධාතුහු කෙරෙන්; අන්, අන්ප්‍රත්‍යයද; සෙ, කර්ත්‍රර්‍ථයෙහි; සන්ත්, වන්නේය.

ණින්ප්‍රත්‍යයාගේ ණකාර ඉත්සංඥය (577) වෘද්ධ්‍යර්‍ථසයි, අනප්‍රත්‍යයාගේ නකාරය අකාරාන්තයි. අන් යන මොහුගේ නකාරය ඉත්සංඥ වෙයි, අප්‍රත්‍යයා කෙරෙන් විශෙෂාර්‍ථ පිණිසයි. ගණයෝද ප්‍රයොගානුසාරයෙන් අවබොධ කට යුත්තෝයි. (305) එසෙ කෘති යනු මෙහි තමාගේ වචන බැවින් කිසිතන්හි භවිෂ්‍යත්කාලයෙහි සෘණිපියෙහිද ණින් ප්‍රත්‍යය වන්නේය. මෙසේ (660) තමාවිසින් කියනලදබැවින් ස්ණිනිප්‍රත්‍යයද වක්තව්‍යයි, මෙහි සකාරය ඉත්සංඥයි, අන්‍ත්‍ය ඉකාරයහටද ඉත්සංඥයි, ණකාරයද ඉත්සංඥයි. ඉන් යනු සිටියි.

(සං-) ගෘහ්ණතීති ග්‍රහ, ණින් වේ, ණකාර බැවින් වෘද්ධියි, ග්‍රාහී. තිෂ්ඨතීති ෂ්ඨා, ණින්ද, (924) යන්ද වෙත්, ස්ථායී. ප්‍රපිවතඃ ප්‍රපූර්‍ව පා, ණින්, (924) යන් වේ, (968) ණත්වය වෙ, ප්‍රපායිණෞ. අවපවර්‍ගීව්‍යවධානයෙන් ණත්වය දක්වීම පිණි සම ව්වචනාන්තවූ පදයයි. උත්සාහී උද්‍දාසී උද්භාසී මන්ත්‍රී සංමර්ද්දී නිරක්‍ෂී නිශ්‍රාවී නිවාසී නිවාපී ඒසායී යනාදියද දත යුතු. නන්‍දයතීති නන්‍ද, අනප්‍රත්‍යය වේ, (641) ණිහට ලොප් වේ, නන්‍දනඃ. විචෂ්ටෙ ඉති විපූර්‍ව චක්‍ෂ, අන වේ, (706) අන ප්‍රත්‍යය තොරබැවින් චක්‍ෂ යන්නහට ක්සාඤ් ඛ්‍යාඤ් ආදෙශය නොවේ, (107) ණත්වය වේ, විචක්‍ෂණඃ. ජනං අර්‍දය තීති ජනං යන්න පූර්‍ව අර්‍දි, මෙයින් අනප්‍රත්‍යය වේ, ජනා ර්‍දනඃ. මධුං සූදයතීති මධු යන්න පූර්‍ව ෂූද, අනප්‍රත්‍යය වේ, මධුසූදනඃ, දෙතන්හි ණිහට ලොප් වේ. ජන යනුද මධු යනුද අසුරවිශෙෂයෝයි. ලුනාතීති ලූ, අන ලවණඃ, ඛඩ්ග යයි, ස්වභාවයෙන් ණත්ව වේ. වාසනඃ මදනඃ දූෂණඃ සාධ නඃ වර්‍ධනඃ ශොභනඃ රොචනඃ සහනඃ තපනඃ දමනඃ ජල්පනඃ රමණඃ දර්‍පනඃ සංක්‍රන්‍දනඃ සංකර්‍ෂණඃ සංහර්‍ෂණඃ යවනඃ විභීෂණඃ යනුද දතයුතු. පචතීති පච, පචඃ, අන් වේ. දීව්‍ය තීති දිව, දෙවඃ අන්, (956) කප්‍රත්‍යයහට බාධකයි. ලෙලියතෙ ඉති ලී, (820) යඞ්, ද්විත්වද, (822) ගුණද, අන්, (836) අන් පර

කල්හි නිත්‍යයෙන් ඝඬහට ලොප්ද, (841) ගුණ නිෂෙධ කල්හි (588) ඊකාරයහට යකාරද වෙත්, ලෙලූඃ. ලොලූ යතෙ ඉති ලූ, යඞ්, ද්විත්වාදිය වේ, අන්, යඬහට ලොප්වේ, ඌකාරයහට උව් වේ, ලොලුවඃ. රොරූයතෙ ඉති රූ, යඞ් ආදියයි, අන්ද, උකාරාන්තයා කෙරෙන් අන් කල කල්හි යඬහට ලොපනිෂෙධයද වෙත්, (543) යඞ්ප්‍රත්‍යයාගේ අකාරලොපය වේ, රොරූයඃ. [පාණිනිඃ 3. 1. 134.]

(මූ-) 994. **චික්ලිද චක්නස චරාචර චලාචල පතාපත වදාවද ඝනාඝන පාටපටා වා.** (චික්ලිද—පාටපටාඃ 1... වා 1.)

එතෙ අනන්තා නිපාත්‍යන්තෙ වා. පක්‍ෂෙ, කෙලදඃ ක්නසඃ චරඃ චලඃ පතඃ වදඃ ඝනඃ පාටඃ.

(ස-) අනන්තාඃ, අන්ප්‍රත්‍යය අන්තයෙහිවූ; එතෙ, චික්ලිද-චක්නස යනාදි ශබ්දයෝ; වා, විකල්පයෙන් ; නිපාත්‍යන්තෙ, නිපාතනයෙන් කරනුලැබෙත්. ක්ලිදූ ඉර්කෙලදෙ, අන් වේ, නිපාතනයෙන් විකල්පයෙන් චික්ලිද යනු වේ. ක්නසු-ම උඩෘතෞ, අන් වේ, නිපාතනයෙන්, චක්නස යනු වේ. චරගතෞ, නිපාතනයෙන්, චරාචරඃ. චලජගතෞ, චලාචලඃ. පතඛජගත්‍යං, පතාපතඃ. වදෙදවාචි, වදාවදඃ. හනලවඬෙ ගතෞ, ඝනාඝනඃ. පටකත්විෂි, පාටපටඃ. මොව්හු පටාදිහුයි. අටතන්හි අන් වේ, පාටපටඃ යන මෙහි පාටූපටඃ යනු වාමදු යෝ කියත්. පක්‍ෂෙ, කියතලද අටතන්හි පක්‍ෂයෙහි කෙලදඃ යනාදිහු වෙත්. මෙහි පාටඃ යන්න චුරාදි බැවින් ණිඦ ප්‍රත්‍යය කල කල්හි වෘඞියි.

(මූ-) 995. **රාත්‍රෙර්මින් වා කෘති.** (රාත්‍රෙඃ 6. මන් 1. වා1. කෘති 7.)

රාත්‍රෙර්මින් සත්‍යවා කෘති. රාත්‍රිඤ්චරඃ රාත්‍රිචරඃ.

(ස-) කෘති, කෘත්ප්‍රත්‍යයාන්ත ධාතුහු පරකල්හි, රාත්‍රෙඃ, රාත්‍රිශබ්දයහට ; වා, විකල්පයෙන් ; මන් සත්‍යත්, මන්ආගම වන්නේය.

මන් යන්නහුගේ අකාර නකාර දෙක ඉත්සංඥයෝයි, නකාර ඉත්බැවින් අන්තයෙහි මකාරය සිටියි. රාත්‍රෞ චරතීති චර, පචාදිබැවින් අන් කල කල්හි මෙයින් මන් වේ,

(53) මකාරයහට අනුස්වාරාදිය වේ, රාත්‍රිඤ්චරඃ, පක්‍ෂයෙහි රාත්‍රිචරඃ. අගදඞ්කාරඃ සත්‍යඞ්කාරඃ, (1009) ෂණ්ප්‍රත්‍යයද, තිමිඞ්ගිලඃ (996) කඃ යනාදියෙහිද මන්ආගමය වක්‍තව්‍යයි. [පාණිනිඃ 6. 3. 72.]

(මු-) 996. කෲ ගෲ ඥා ප්‍රීජුඩඃ කො—දුහො ඝඩ් ච. (කෲ-ගෲ-ඥා-ප්‍රී-ඉජුඩඃ 5. කඃ 1. දුහඃ 6. ඝඩ් 1. ච 1.)

ක්‍රාදෙරිජුඩශ්ච කඃ ස්‍යාත්, තස්මිංශ්ච දුහො ඝඩ් ස්‍යාත් ශෙ. කිරඃ ගිරඃ ඥඃ ප්‍රියඃ ක්‍ෂිපඃ භූරුහඃ කාමදුඝා ගෞඃ.*

(ස-) ක්‍රාදෙඃ, කෲධාතු මුල්කොට ඇති ගෲධාතු ඥාධාතු ප්‍රීධාතු යන මොවුන් කෙරෙන්ද; ඉජුඩශ්ච, ඉච්ප්‍රත්‍යාහාරයා සම්බන්ධිවූ උඩ්සංඥවත් ධාතූහු කෙරෙන්ද; ශෙ, කර්තෘයෙහි; කඃ ස්‍යාත්, කප්‍රත්‍යය වන්නේය; තස්මිංශ්ච දුහඃ, ඒ කප්‍රත්‍යයා පර කල්හිද දුහධාතුහුගේ හකාරයහට; ඝඩ් ස්‍යාත්, ඝකාරා දෙශ වන්නේය.

දුහො ඝඤ්ච, යන මේ චකාරය හෙතුකොටගෙන උඩ්සංඥ ඉච්ප්‍රත්‍යාහාරයා කෙරෙන් කප්‍රත්‍යය කළ කල්හි යන අපිසි. පරසූත්‍රයෙන්, ඛප්‍රත්‍යයා විසින් සිඛ කල්හිද මෙහි, ඥාධාතුහුගේ ග්‍රහණය පරසූත්‍රයෙහි උපපද පූර්වවූ ධාතූහු කෙරෙන්ම, ඛප්‍රත්‍යය වන්නේය, මෙහි වනාහි කෙවලවූ, ඥාධාතූහු කෙරෙන්, කප්‍රත්‍යය වෙයි යනු හැඟවීම පිණිසයි. මෙහි ඉජුඩ් මාත්‍රය නිමිත්ත බැවින් විශෙෂයෙන් කප්‍රත්‍යයා හා සර්වධාතු නිමිත්තකභාවයෙන් වූ සාමාන්‍යයතෙම ඨාත් ෂණ් යන්නෙන් (1009) බාධාකරණලැබේ. කිරතීති කෲ, කප්‍රත්‍යයවේ, (628) ඉර්, කිරඃ. ගිරතීති ගෲ, ඉර් වේ, ගිරඃ. ජානාතීති ඥා, (610) ආකාරලොපය වේ, ඥඃ. ප්‍රීණාතීති ප්‍රී, (588) ඊකාරයාගේ ස්ථානයෙහි ඉය වේ, ප්‍රියඃ. ක්‍ෂිපතීති ක්‍ෂිප, ක්‍ෂිපඃ. භුවිරොහතීති භූශබ්දපූර්ව රුහ, භූරුහඃ. දෙතන්හි ඉජුඩ් කෙරෙන් කප්‍රත්‍යය වේ. කාමං දොග්ධීති කාමශබ්දපූර්ව දුහ, කප්‍රත්‍යය කළ කල්හි හකාරයහට මෙයින් ඝකාර වේ, (249) ආප්, කාමදුඝා, ගෞඃ, සුරභිධෙනුයි. [පාණිනිඃ 3. 1. 135, 136, 3. 2. 70.]

---

* ඉච් උඩ් යස්‍ය ස ඉජුඩ්, කෲශ්ච ගෲශ්ච ඥාශ්ච ප්‍රීශ්ච ඉජුඩ් චෙති තස්මාත්.

(මූ-) **997. හනජනාද්ගමාදෙර් ඩඃ.** (හන-ජන-ආත්-ගමාදෙඃ 5. ඩඃ 1.)

හනො ජනඅදනතාත් ගමාදෙශ්ච ඩඃ ස්‍යාත් සෙ. ශොකාපහඃ වරාහඃ සරසිජං පඞ්කජං අජඃ ගොදඃ ද්විපඃ ප්‍රහ්වඃ ආශුගඃ නගඃ ගිරිශඃ, වාරි චරතීති වාර්චො හංසඃ.*

(ස-) හනඃ, හනධාතුහු කෙරෙන්ද; ජන අදනතාත්, ජන ධාතුය අකාරාන්ත ධාතුය යන මොහු කෙරෙන්ද; ගමාදෙශ්ච, ගමාදි ධාතුහු කෙරෙන්ද; සෙ, කර්තෘයෙහි; ඩඃ ස්‍යාත්, ඩප්‍රත්‍යය වන්නේය.

උදාහරණදර්ශනය කරණකොටගෙන උපපදපූර්වවූ ධාතුහු කෙරෙන්ම ඩප්‍රත්‍යය වෙයි යන අර්ථයි. ශොකමපහන්තීති ශොක යන්න පූර්ව අප යන්නහු කෙරෙන් හන, මෙයින්—ඩප්‍රත්‍යයයි, විභක්තිලොපයද ටිසංඥයහට ලොප්ද වෙත්, ශොකාපහඃ. වරමාහන්තීති වර යන්න පූර්වවූ ආයන්න කෙරෙන් හනධාතු, වරාහඃ. සරසි ජායත ඉති සරස් පූර්ව ජන, සරසිජං. විභක්තිහට ලොප් නොවේ. පඞ්කාජ්ජායත ඉති පඞ්කජං. න ජායත ඉති අජඃ. ගාං දදාතීති ගො යන්න පූර්ව දා, ගොදඃ. ද්වාභ්‍යාං පිබතීති ද්විපූර්ව පා, ද්විපඃ. ප්‍රහ්වයතීති ප්‍රපූර්ව හ්වෙ, (608) ආකාර වේ, ප්‍රහ්වඃ. ආශුගච්ඡතීති ආශු පූර්ව ගම, ආශුගඃ. න ගච්ඡතීති නගඃ. ගිරෞ ශෙත ඉති ගිරිපූර්ව ශී, ගිරිශඃ. වාරිචරතීති වාර්පූර්ව චර, වාර්චඃ, හංසඃ. තමොපහඃ දුඃඛාපහඃ ද්විජඃ අනුජඃ සහජඃ යනාදියද මෙසේයි. [පාණිනිඃ 3. 2. 48, 49, 40.]

(මූ) **998. ධෙට-දෘශ-පා-ඝ්‍රා-ධ්මඃ ශඃ.** (ධෙට—ධ්මඃ 5. ශඃ 1.)

එභ්‍යඃ ශඃ ස්‍යාත් සෙ. උද්ධයඃ උත්පශ්‍යඃ උත්පිබඃ උජ්ජිඝ්‍රඃ උද්ධමඃ.

(ස-) එභ්‍යඃ, ධෙධාතු දෘශධාතු පාධාතු ඝ්‍රාධාතු ධ්මාධාතු යන මොවුන් කෙරෙන්; සෙ, කර්තෘයෙහි; ශඃ ස්‍යාත්, ශප්‍රත්‍යය වන්නේය.

ශප්‍රත්‍යයාගේ ශකාරය රසංඥය සඳහා ඉත් වෙයි, අකාරය

---

* හන ච ජන ච ආච්ච අගමාදිශ්ච තස්මාත්.

සිටියි. උත්ධයතීති උත් පූර්ව ධෙ, (541) ශප්ප්‍රත්‍යයවේ, එකාරයහට අය්, (543) අකාර ලොපයද, තකාරයහට දකාරද වෙත්, උද්ධයඃ. උත්පශ්‍යතීති උත් පූර්ව දෘශ, ශප්ද, පශ්‍යාදෙශද වෙත්, උත්පශ්‍යඃ. උත්පිවතීති උත් පූර්ව පා, උත්පිවඃ. උජ්ජිඝ්‍රතීති උත් පූර්ව ඝ්‍රා, උජ්ජිඝ්‍රඃ. උද්ධමතීති උත් පූර්ව ධ්මාශබ්දාග්නිසංයොගයොඃ, උද්ධමඃ. සියලු තන්හි, ර පර කල්හි, ශප්ද (597) පිවාදි ආදෙශද වෙත්, සාහචර්‍ය්‍යයෙන් මෙහි පාධාතු භ්වාදි ගණයෙහිමය. උදාහරණයන්ගෙන් හඟවන බැවින් මේ විධානය උපසර්ග සහිතමය. ව්‍යාඝ්‍රඃ යන මෙහි සංඥාව අපෙක්ෂා කරණබැවින් ඩප්‍රත්‍යයමය. [පාණිනිඃ 3. 1. 137.]

(මූ-) 999. **සාහි සාති වෙති වෙදේ‍යජි ධාරි පාරි ලිම්ප වින්දේ‍යාඃ.** (සාහි—වින්දඃ 5. අගෙඃ 5.)

අගිභ්‍යඃ එභ්‍යඃ ශඃ ස්‍යාත් ෂෙ. සාහයඃ සාතයඃ වෙතයඃ වෙදයඃ එජයඃ ධාරයඃ පාරයඃ, ලිම්පඃ වින්දඃ ගොවින්දඃ.

(ස-) අගිභ්‍යඃ, ගිසංඥයා රහිතවූ; එභ්‍යඃ, සහ-සාත-විත-විද-එජ-ධෘ-පෘ-ලිප-විදධාතු යන මොවුන් කෙරෙන්; ෂෙ, කර්තෘයෙහි; ශඃ ස්‍යාත්, ශප්‍රත්‍යය වන්නේය.

ෂහජ්ඣශකෙතෟ, සාතකසුඛෙ, චිතීසංඥානෙ, විදල්මතෞ, එජෘකම්පෙ, ධෘඤධස්ථිතෞ, පෘලිපාලනෙ, මේ ධාතුහු ණිප්‍රත්‍යයාන්තයෝයි. ෂ්ලිපෞ ශපඤලෙපනෙ, විදඣශපඤෞ ලාභෙ, යන මේ දෙදෙනාහට (741) මුචාදි බැවින් නුම් වේ, සාහයතීති සහ (777) ණි, වෘද්ධි, ධාතුසංඥා, මෙයින් ශප්‍රත්‍යයද, ශප්ද, ගුණද, අය්ද, (543) අකාරලොපයද වෙත්, සාහයඃ. සාතයතීති සාතයඃ. චෙතයතීති චෙතයඃ. වෙදයතීති වෙදයඃ. එජයතීති එජයඃ. ධාරයතීති ධාරයඃ. පාරයතීති පාරයඃ යනුද එසේම දතයුතු. ලිම්පතීති ලිප, (738) තුදාදිබැවින් ශප්‍රත්‍යයද, නුම්ද, අකාරලොපයද වෙත්, ලිම්පඃ. වින්දතීති වින්දඃ. ගාං වින්දතීති ගොවින්දඃ යනුද ලිම්පඃ යන්න මෙන් සාධ්‍යයි. උදෙජයඃ යන මෙහි වනාහි උද්ශබ්දයාගේ උපසර්ග ප්‍රතිරූපකත්වයෙන් අනුපසර්ග බැවින් ශප්‍රත්‍යය වේ. [පාණිනිඃ 3. 1. 138.]

(මූ-) 1000. **දුනී භුජ්වලාද්‍යාසුෑසංස්‍රො ර්ණො වා.** (දු—සංස්‍රොඃ 5. ණඃ 1. වා 1.)

අශ්‍යභ්‍ය එහෙත ණඃ සතත් සෙ වා. දවඃ දවඃ, නායඃ නයඃ, භාවඃ භවඃ, ජ්වාලඃ ජ්වලඃ, වාලඃ වලඃ, ආස්‍රාවඃ ආස්‍රවඃ, සංස්‍රාවඃ සංස්‍රවඃ.

(ස-) අශ්‍යභ්‍යඃ, ශ්‍රීසංඥයා රහිතවූ; එහ්‍යඃ, දුධාතු නීධාතු භූධාතු ජ්වලාදිධාතු ආඞ්පූර්ව ස්‍රුධාතු සංපූර්වක ස්‍රුධාතු යන මොවුන් කෙරෙන්; සෙ, කර්තෘ වාච්‍ය කල්හි; වා, විකල්පයෙන්; ණඃ සතත්, ණප්‍රත්‍යය වන්නේය.

ණප්‍රත්‍යයාගේ ඉත්සංඥය වෘද්ධිය පිණිසයි, අකාරය සිටියි. දුනොතීති දු, මෙයින් ණප්‍රත්‍යයද, වෘද්ධිද වෙත්, දවඃ. පක්ෂයෙහි, පචාදි බැවින් අත් වේ, දවඃ. නයතීති නී, ණප්‍රත්‍යයද වෘද්ධ්‍යාදියද පෙර මෙනි, නායඃ, පක්ෂයෙහි නයඃ. භවතීති භූ, භාවඃ, පක්ෂයෙහි, අත් කළ කල්හි භවඃ. ජ්වලතීති ජ්වල, ජ්වාලඃ, පක්ෂයෙහි, ජ්වලඃ. චලතීති චල, චාලඃ, පක්ෂයෙහි, චලඃ. ආස්‍රවතීති ආඞ්පූර්ව ස්‍රු, ආස්‍රාවඃ, පක්ෂයෙහි, ආස්‍රවඃ. සංස්‍රවතීති සංස්‍රාවඃ, පක්ෂයෙහි, සංස්‍රවඃ. ආස්‍රු සංස්‍රු යනු දන්ත්‍යාදියි. ජ්වලාදි බැවින් කොවඃ කුවඃ, ග්‍රාහඃ ග්‍රහඃ යනාදිය වේ. කප්‍රත්‍යය කළ කල්හි, ගෘහං කියාද වේ. [පාණිනිඃ 3. 1. 180—182.]

(මු-) **1001. ශ්වස ව්‍යධෙන තන දුවහාසඃ.** (ශවස—හාසඃ 5.)

එහෙත ණඃ සතත් සෙ. ශ්වාසඃ ව්‍යාධඃ ප්‍රත්‍යයඃ අවතානඃ දායඃ ධායඃ අවහාරඃ අවසායඃ.*

(ස-) එහ්‍යඃ, ශ්වසධාතු ව්‍යධධාතු ඉනධාතු තනධාතු දධාතු අවපූර්ව හෘධාතු ද-සාධාතුද යන මොවුන් කෙරෙන්; සෙ, කර්තෘවාච්‍ය කල්හි; ණඃ සතත්, ණප්‍රත්‍යය වන්නේය.

වෙන්වශයෙන් සූත්‍රයක් කිරීම නිත්‍යය පිණිසද අශෙඃ යන මොහුගේ නිවෘත්තිය පිණිසද වේ. ශ්වසිතීති ශ්වස, ණප්‍රත්‍යය වේ, වෘද්ධියි, ශ්වාසඃ. විධ්‍යතීති ව්‍යධ, ව්‍යාධඃ. ප්‍රත්‍යෙතීති ප්‍රතිපූර්ව ඉන, වෘද්ධියි, ප්‍රත්‍යයඃ. අවතනොතීති අවපූර්ව තන, අවතානඃ. දදාතීති දා, (924) යත් වේ, දායඃ. දධාතීති

---

* භෘශව සාශව භෘසෙ, අවාත් භෘසෙ අවභෘසෙ. ශවසශව ව්‍යධශව ඉන ච තන ච දාශව අවභෘසෙ වෙත් තස්මාත්.

ධා, යන් වේ, ධායඃ. දු යනු දුසංඥයි. අවහරතීති අවපූර්ව හෘ, අවහාරඃ. අවස්‍යතීති අවපූර්ව සා, (608) ආකාර වේ, යන්, අව සායඃ. [පාණිනිඃ 3. 1. 141.]

(මු-) **1002. නෘත්ඛනරන්ජඃ ෂකඃ.** (නෘත්-ඛන-රන්ජඃ 5. ෂකඃ 1.)

එභ්‍යඃ ෂකඃ ස්‍යාත් සෙ. නර්තකී ඛනකී රජකී.

(ස-) එභ්‍යඃ, නෘත්ධාතු ඛනධාතු රන්ජධාතු යන මොවුන් කෙරෙන් පරව; සෙ, කර්තෘ වාච්‍ය කල්හි; ෂකඃ ස්‍යාත්, ෂක ප්‍රත්‍යය වන්නේය.

ෂකප්‍රත්‍යයාගේ ෂකාරය (257) ඊප්ප්‍රත්‍යය පිණිසයි. අක යි සිටියි. නෘත්‍යති යා සෙති නෘත, මෙයින් ෂක, ගුණ වේ, නර්තකී. ඛනති යා සෙති ඛන, ඛනකී. රජති යා සෙති රන්ජ, (660) ෂක කල කල්හි නකාරලොපය වේ, රජකී, ස්ත්‍රී ලිඞ්ගයෙහි ඊප් වෙයි. [පාණිනිඃ 3. 1. 145.]

(මු-) **1003. ගෛ ණිනට් ථකෞ.** (ගඃ 5. ණිනට්—ථකෞ 1 ..)

ගායතෙ රෙතෞ සෙ ස්තඃ. ගායනී, ගාථකඃ.

(ස-) ගායතෙඃ, ගායති යන්නහු කෙරෙන්; සෙ, කර්තෘ වාච්‍ය කල්හි; එතෞ, ණිනට්-ථක යන මේ ප්‍රත්‍යයෝ; ස්තඃ, වන්නාහ.

ණිනට් යන්නහුගේ ණිකාරය ඉත්සංඥ බැවින් වෑඩියි, ටකාරය ඉත් බැවින් ඊප් වේ, අන යි සිටියි. ගායති යා සෙති ගෛ, ණිනට්ප්‍රත්‍යයයි, (608) ආකාරද, (924) යන්ද, (257) ඊප්ද වෙත්, යයොර්ලොපඃ, ගායනී. ථකප්‍රත්‍යය කල කල්හි ගායතීති, ගාථකඃ යනු වේ. [පාණිනිඃ 3. 1. 146, 147.]

(මු-) **1004. හායනඃ.** (හායනඃ 1.)

අයං නිපාත්‍යතෙ. හාවං ජහාතීති හායනො වර්ෂඃ, අම්බු ජහාතීති හායනො ව්‍රීහිඃ.

(ස-) අයං, හායනඃ යන මේතෙම; නිපාත්‍යතෙ, නිපාතනය කරනුලැබේ.

හාවං ජහාතීති හා, ණිනට්, යන්, නිපාතනයෙන් සිඬයි, හායනඃ, වර්ෂඃ. අම්බු ජහාතීති හායනඃ ව්‍රීහිඃ. හායන ව්‍රීහි

දෙකින් පිටත් තත්ෂි හාතඃ යනු වේ, නිපාතො භාෂිවිශෙෂඃ, යනු කීබැවිනි. [පාණිනිඃ 3. 1. 148.]

(මු-) 1005. **ප්‍රු ද්‍රු ස්‍රු සෘ ල්වො'කඃ.** (පෘ-ල්වඃ 5. අකඃ 1.)

එහෙන'කඃ සෘත් සෙ.

ප්‍රවකඃ ද්‍රවකඃ ස්‍රවකඃ සරකඃ ලවකඃ.

(ස-) එභ්‍යඃ, ප්‍රුධාතු ද්‍රුධාතු ස්‍රුධාතු සෘධාතු ලූධාතු යන මොවුන් කෙරෙන් පරව ; සෙ, සාධුකාරිවූ කර්තෘයෙහි; අකඃ සෘත්, අකප්‍රත්‍යය වන්නේය. සාධුකාරිණි කර්තරි යනු වක්තව්‍යසි. සාධුප්‍රවත ඉති ප්‍රු, අක, (5442) ගුණ වේ, ප්‍රවකඃ. සාධු ද්‍රවතීති ද්‍රු, අක වේ, ගුණසිද්‍රවකඃ. සාධු ස්‍රවතීති ස්‍රු, ස්‍රවකඃ.සාධු සරතීති සෘ, සරකඃ. සාධු ලූනාතීති ලූ, ලවකඃ. සාධුකාරිණි යනු කුමටය? ප්‍රොතා යනු වේ. [පාණිනිඃ 3. 1. 149.]

(මු-) 1006. **ආශිෂි.** (ආශිෂි 7.)

ජීවතාදිති ජීවකඃ.

(ස-) ආශිෂි, ආශිර්වාදය හැඟෙන කල්හි සියලු ධාතුහු කෙරෙන් කර්තෘයෙහි අකප්‍රත්‍යය වන්නේය.

(956) තාතඬ වේ, ජීවතාදිති ජීව්, අක වේ, ජීවකඃ. නන්දකඃ වර්ධකඃ යනාදියද එසේමැයි. ස්ත්‍රීලිඞ්ගයෙහි ජීවිකා. [පාණිනිඃ 3. 1. 150.]

(මු-) 1007. **නාම්න්‍යනෙ‍්‍යා තික් ච.** (නාම්නි 7. අනෙ‍්‍යා 1...තික් 1. ච 1.)

ධොරාශිෂි අනෙ‍්‍යා'පි කෘතඃ ස්‍යුඃ, තික් ච, සංඥායාං. දෙවරාතඃ, රන්තිඃ.

(ස-) ධොඃ, ධාතුහු කෙරෙන්; ආශිෂි, ආශිර්වාදපීයෙහිද; සංඥායාං, සංඥයෙහිද; අනෙ‍්‍යා'පි කෘතඃ, අනිකුදු කෘත්ප්‍රත්‍යයෝ කර්තෘයෙහි; ස්‍යුඃ, වනනාහ; තික් ච, තික්ප්‍රත්‍යයද වන්නේය.

දෙවාය රාසාත් දෙවශබ්ද පූර්ව කරාදුනෙ, කර්තෘයෙහි ක්ත වේ, දෙවරාතඃ. එසේම දෙවාය දෙයාත් දදුනෙ, ක්ත වේ, දද්දෙධඃ, දුහට දත් වේ, දෙවදත්තඃ. යඥය දෙයාත් යඥදත්තඃ, විරොභූයාත් වීරභූඃ, මිත්‍රං භූයාත් මිත්‍රභූඃ, යනාදියෙහි

ක්විප් වේ. රමතාං රම, තික්, රන්තිඃ, (676) තික් හොර බැවින් ඤම්ලෝපය නොවේ. [පාණිනිඃ 3. 3. 174.]

(මු-) **1008. සති-සාතී වා.** (සති-සාතී 1 .. වා 1.)

සන්තිශ්ච.*

(ස-) සතිසාතී, ෂනධාතුහු කෙරෙන් ආශීර්වාදාර්ථයෙහි තික් ප්‍රත්‍යයාහට කර්තෘයෙහි සතිසාතී යන මේ දෙක; වා, විකල්පයෙන් නිපාතනය කරනුලැබේත්.

සනුතාත් ෂන දානෙ තික්, සතිඃ, සාතිඃ. පක්‍ෂයෙහි සනුතාත්, (1033) ඉම්නිෂේධයි, (676) ඤම්ලෝපය නොවේ. සන්තිශ්ච, සන්තිඃ කියාද වේ.

(මු-) **1009. ඨාත් ෂණ්.** (ඨාත් 5. ෂණ් 1.)

ඨාත් පරාත් ධෝඃ ෂණ් සන්‍යාත් සෙ.

කුම්භකාරඃ, අසටං සටං කරොතීති සටීකාරඃ.

(ස-) ඨාත් පරාත්, කර්මකාරකයා කෙරෙන් පරවූ; ධෝඃ, ධාතුහු කෙරෙන් ; සෙ, කර්තෘයෙහි; ෂණ් සන්‍යාත්, ෂණ්ප්‍රත්‍යය වන්නේය.

ෂණ්ප්‍රත්‍යයාගේ ඉත්සංඥ ණකාරය වෘද්ධිය පිණිසයි, ඉත්සංඥ ෂකාරය ඊප්ප්‍රත්‍යය පිණිසයි, අකාරය සිටියි. ඨාත් යනු නිර්වර්ත්‍යාදි කර්මයා කෙරෙන්මය, එහෙයින් මෘදුකාරඃ, කියා නොවන්නේය.

කුම්භං කරොතීති කුම්භ යන්න පූර්ව කෘ, මෙයින් ෂණ් වේ, (577) වෘද්ධියි. කුම්භකාරඃ. නිත්‍යසමාසයෙහි වාක්‍යරචනාවෙක් යම්හෙයකින් නැත්තේද එසේද ශිෂ්‍යයන්ගේ අවබෝධය පිණිස වාක්‍යයයි සැලකියයුතු. (1183) කෘත්තද්ධිතසමාසානාමභිධානං නියාමකං, යනු කීම කරණකොටගෙන සියලු තන්හි ෂණ්ප්‍රත්‍යය නොවේ. (495) ච්විප්‍රත්‍යය වේ, අකාරය හට ඊකාරද වේ, සටීකාරඃ. [පාණිනිඃ 3. 2. 1.]

(මු-) **1010. හනවරග-ෂටක්.** (හන-වර-ගඃ 5. ටක් 1.)

ඨාත් පරෙභ්‍ය එභ්‍යඃ ටක් සන්‍යාත් සෙ. පාපඝ්නඃ කුරුචරඃ සාමගඃ.

(ස-) ඨාත් පරෙභ්‍යඃ, කර්මකාරකයා කෙරෙන් පරවූ; එභ්‍යඃ, හනධාතු වරධාතු ගෛධාතු යන මොවුන් කෙරෙන්; සෙ, කර්තෘයෙහි: ටක් සන්‍යාත්, ටක්ප්‍රත්‍යය වන්නේය.

---

* සතිශ්ච සාතිශ්ච තෙ෴

ටක්ප්‍රත්‍යයාගේ කකාරය ඉත්බැවින් ගුණ නොවේ. ටකාර ඉත්බැවින් ඊප් වේ, අකාරය සිටියි. මේතෙම ඣණ්ප්‍රත්‍යය හට බාධකයි. පාපං ඝ්නන්ති පාප යන්න පූර්ව හන, ගුණ නොවේ, (230) ධාතුහුගේ උඩ්හට ලොප් වේ, (189) ඝ්න යන්නහට ඝ්න වේ, පාපඝ්නඃ. කුරූන් චරතීති කුරුන්පූර්ව චර, ටක්, කුරුචරඃ. සාම ගායතීති සාමපූර්ව ගෛ, (608) ආකාර වේ, (610) ආකාරලොපය වේ, සාමගඃ. [පාණිනිඃ 3. 2. 8, 16, 52—54.]

(මූ-) **1011. සෘකුඤ්ටඃ.** (සෘකුඃ 5. ටඃ 1.)

ඨාත් පරාභ්‍යාමාභ්‍යාං ටඃ ස්‍යාත් සෙ. පුරඃසරී, යශස්කරී විද්‍යා. භාස්කරඃ ක්‍ෂපාකරඃ, කර්‍මකරී දාසී.

(ස-) **ඨාත් පරාභ්‍යාං**, කර්‍මයා කෙරෙන් පරවූ; ආභ්‍යාං, සෘ ධාතු කෘධාතු යන මොහු දෙදෙනා කෙරෙන් පරව; සෙ, කතෘ වාච්‍ය කල්හි; ටඃ ස්‍යාත්, ටප්‍රත්‍යය වන්නේය.

පුරෝ'ග්‍රං සරතීති පුරස් සෘ, ටප්‍රත්‍යයද, (542) ගුණද, (257) ඊප්ද වෙත්, පුරඃසරී. යශඃ කරෝතීති යශස් කෘ යශස්කරී, විද්‍යා. භාසං කරෝතීති භාස කෘ, භාස්කරඃ. ක්‍ෂපාං කරෝතීති ක්‍ෂපා කෘ ක්‍ෂපාකරඃ. කර්‍ම කරෝතීති කර්‍මකරී දාසී. (1009) කුම්භකාරඃ, යී උදාහරණ කරන්නාවූ ග්‍රන්ථකතෘහු විසින් අභිධානයා කෙරෙන් කිසිතැනෙක්හි, ඣණ් වෙයි, කිසිතැනෙක්හි ටප්‍රත්‍යයද වන්නේය යනු ප්‍රකාශ කරණලදී. [පාණිනිඃ 3. 2. 18—22.]

(මූ-) **1012. ශකෘත්-ස්තම්බාත් දෘති-නාථාත් ඵලෙ-රජො-මලාත්-දෙවවාතාත් කෘ-හෘ-ග්‍රහාප ඉඃ.** (ශකෘත්-ස්තම්බාත් 5. දෘති-නාථාත් 5. ඵලෙ-රජස්-මලාත් 5. දෙව-වාතාත් 5. කෘ-හෘ-ග්‍රහ-ආපඃ 5. ඉඃ 1.)

ඒභ්‍යඃ පරෙභ්‍යඃ ක්‍රමාදෙතෙභ්‍ය ඉඃ ස්‍යාත් සෙ. ශකෘත්කරි වත්සඃ, ස්තම්බකරිර් ව්‍රීහිඃ, දෘතිහරිඃ ශ්වා, නාථහරිඃ පශුඃ, ඵලෙග්‍රහිඃ රජෝග්‍රහිඃ මලග්‍රහිඃ, දෙවාපිඃ වාතාපිඃ.

(ස-) ඒභ්‍යඃ පරෙභ්‍යඃ, ශකෘත්ශබ්ද ස්තම්බශබ්ද දෙකින්ද දෘතිශබ්ද නාථශබ්ද දෙකින්ද ඵලශබ්දය රජස්ශබ්දය මලශබ්දය යන තුණින්ද දෙවශබ්ද වාතශබ්ද යන දෙකින්ද පරවූ; ඒතෙභ්‍යඃ, කෘඤ්ධාතු හෘඤ්ධාතු ග්‍රහධාතු ආපධාතු යන මො

වුන් කෙරෙන්; සෙ, කර්තෘ වාච්‍ය කල්හි; ක්‍රමාත්, පඞ්ක්තීන්; ඉඃ ස්‍යාත්, ඉප්‍රත්‍යය වන්නේය.

මෙන් වශයෙන් පදයන්ගේ ග්‍රහණය ක්‍රමය පිණිසයි. ශකෘත් යනු තාලව්‍යාදි අව්‍යයශබ්දයයි, මල වාචකයි. ශකෘත් කරොතීති ශකෘත්පූර්ව කෘ කරණෙ, ඉ-වේ, ගුණයි, ශකෘත්කරිඃ, වත්සඃ. ස්තම්බං (ගුච්ඡං) කරොතීති ස්තම්බකරිඃ, ව්‍රීහිඃ. දෘතිං (චර්ම) හරතීති දෘති හෘ, දෘතිහරිඃ, ශ්වා, සුනඛයි; නාථං (ප්‍රභුං) හරති වහතීති නාථ හෘ, නාථහරිඃ, පශුඃ. ඵලෙ ගෘහ්ණාතීති එකාරාන්තයාගේ ග්‍රහණය බැවින් අධිකරණවිවක්ෂාද, ලොප රහිතද වේ. ඵලෙග්‍රහිඃ, පලගන්නෙක් යන අර්ථයි. රජො ගෘහ්ණාතීති රජස් ග්‍රහ, රජොග්‍රහිඃ, ධූලි ගන්නා වාතයයි. මලං ගෘහ්ණාතීති මල ග්‍රහ, මලග්‍රහිඃ, නීච ජාතික යෙක්. දෙවං ආප්නොතීති දෙව ආප, දෙවාපිඃ, යාග කරන්නෙක්. වාතමාප්නොතීති වාත ආප, වාතාපිඃ, අසුර විශෙෂ යෙක්. [පාණිනිඃ 3. 2. 24—26.]

(මු) 1013. **කුක්ෂ්‍යාත්මොදරාත් භෘඃ ඛිඃ.** (කුක්ෂි—ආත්මන්—උදරාත් 5. භෘඃ 5. ඛිඃ 1.)

එභ්‍යඃ පරාත් භෘඤඃ ඛිඃ ස්‍යාත් සෙ.*

(ස-) එභ්‍යඃ පරාත්, කුක්ෂි ආත්මන් උදර යන මොවුන් කෙරෙන් පරවූ; භෘඤඃ, භෘධාතුහු කෙරෙන්; සෙ, කර්තෘ වාච්‍ය කල්හි; ඛිඃ ස්‍යාත්, ඛිප්‍රත්‍යය වන්නේය.

ඛිප්‍රත්‍යයාගේ ඛකාරය ඉත්සංඥ වන්නේය, ඉකාරය සිටියි.

(මු-) 1014. **ඛිත්‍යව්‍යජරුෂො මන්සෙච්‍ය වීක්වාන්තත්වං චෛකාජ්චඃ.** (ඛිති 7. අව්‍යජරුෂඃ 6. මන්-සෙච්‍ය 1 .. වීක්වාන්තත්වං 1. තු 1. එකාජ්චඃ 6.)

ව්‍යවජිස්‍ය ජනාස්‍ය රුෂශ්ච මන් ස්‍යාත් සෙචශ්ච, එකාජ්චස්‍ය වීක්වාන්තත්වං ස්‍යාත් ඛිදනෙත ධ්‍යෙ පරෙ. කුක්ෂිම්භරිඃ ආත්මම්භරිඃ උදරම්භරිඃ.†

---

* කුක්ෂිශ්ච ආත්මා ච උදරඤ්ච තත්තස්මාත්.

† නාස්ති ව්‍යං යත්‍ර සො'ව්‍යඃ, අව්‍යශ්චාසෞ අචෙචති අව්‍යච්. අව්‍යච්ච අරුස් ච තත්තස්‍ය. ඛී ඛිතීයා, තස්‍යාඃ ඛ්වං (එකවචනං) ඛිඛ්වං, වීක්වං අන්තො යස්‍ය, ස වීක්වාන්තඃ, තස්‍ය භාවඃ වීක්වාන්තත්වං. එකාච්චාසෞ ඉච් චෙති එකාජ්ච් තස්‍ය. ඉච් ඉජන්තඃ.

(ස-) බිදනෙත ඩෙ පරෙ, ඛ්ප්‍රත්‍යයාන්ත ධාතුහු පරකල්හි; ව්‍යවජිස්‍ය, අව්‍යශබ්ද රහිතවූ; අජන්තස්‍ය, ස්වරාන්තයහටද ; අරුෂශ්ච, අරුෂ්හටද ; මක් සෑත්, මන්ආගමය වන්නේය ; ස්වශ්ච, හ්‍රස්වද වන්නේය; එකාජ්වස්තු, එකස්වරවූ ඉච්සංඥ වර්ණාන්තයහට වනාහි; වික්වාඛ්‍යාවං, විතීමෙයෙකවචනාන් තත්වය්; සෑත්, වන්නේය.

මන් යන්නහුගේ නකාරය ඉත්සංඥයි, අන්තයෙහි වේ, ම් සී සිටියි, අකාරය උච්චාරණය පිණිසයි. කුක්ෂිං බිභර්තීති කුක්ෂි පූර්ව භෘ, ඛ්ප්‍රත්‍යයයි, ගුණ වේ, ස්වරාන්ත කුක්ෂිශබ්දය හට මෙයින් මන්ආගම වේ, කුක්ෂිම්භරිඃ. ආත්මානං බිභර්ති, (319) විභක්තිහට ලොප් වේ, (118) විරාම පර කල්හි නකා රයහට ලොප් වේ, (15) න ඬ නිර්දිෂ්ට මනිත්‍යම්, යනු න්‍යාය බැවින් ඔහුකෙරෙන් ආදියහට විධිනිෂෙධ අනිත්‍යත්වය ඇති කල්හි මෙයින් මන්ආගමය වේ, ආත්මම්භරිඃ. උදරං බිභර්ති යන වාක්‍යයෙහි උදරම්භරිඃ යනුද එසේමැයි.

(මු-) **1015. ඛශෙජෙඃ.** (ඛශ් 1. එජෙඃ 5.)

ණ්‍යාත් පරාත් එජයතෙඃ ඛශ් සෑත් සෙ. ජනමෙජයඃ.

(ස-) ණ්‍යාත් පරාත්, කර්‍මයා කෙරෙන් පරවූ; එජයතෙඃ, එජ් ධාතුහු කෙරෙන්; සෙ, කර්‍තෘ වාච්‍ය කල්හි; ඛශ් සෑත්, ඛශ් ප්‍රත්‍යය වන්නේය.

එජෙඃ යනු එජෘකම්පෙ යන ණිප්‍රත්‍යයාන්තයාගේ ග්‍රහණ යයි. ඛශ්ප්‍රත්‍යයාගේ ඛකාර ශකාර දෙක ඉත්, අකාරය සිටියි. ජනං එජයතීති, එජ, ඛශ්ද, (541) ශප්ද, (542) ගුණදි යද, මන්ද, (543) අකාරලොපයද වෙත්, ජනමෙජයඃ. [පා ණිනිඃ 3. 2. 28.]

(මු-) **1016. මන්‍යාත් ස්වාපෙ.** (මන්‍යාත් 5. ස්වාපෙ 7.)

ආත්මානං ගාං මන්‍යතෙ ගාංමන්‍යඃ, ශ්‍රියංමන්‍යඃ.

(ස-) මන්‍යාත්, කර්‍මයා කෙරෙන් පරවූ මනධාතුහු කෙරෙන් කර්‍තෘ වාච්‍ය කල්හි; ස්වාපෙ, ස්වාපයෙහි ඛශ්ප්‍රත්‍යය වන් නේය.

ස්වනිමිත්තක ධාත්වර්ථයෙහි යන අර්ථයි. ආත්මානං ගාංමන්‍ය තෙ ගො පූර්ව මන ඥානෙ, ඛශ් වේ, ගාංමන්‍යඃ. ගාංමන්‍යඃ යන මෙහි (738) දිවාදි බැවින් ශ්‍යන්, (543) අකාරලොපය වේ, ගාං යන මෙහි (1014) එකස්වර ඉජන්තය බැවින් විතීමෙයෙක

වචනාන්තත්වය වේ. (146) ඔකාරයහට අකාර වේ. අත්මානං ශ්‍රියං මන්‍යතෙ, යන වාක්‍යයෙහි, ශ්‍රියංමන්‍ය යනුද මෙසේමැයි, ස්ත්‍රීලිඞ්ගයෙහි අප්ප්‍රත්‍යය වේ.

(මු-) **1017. මුඤ්ජකූලාස්‍යපුෂ්පාත්-ධෙටඃ.** (මුඤ්ජ-කූල-ආස්‍ය-පුෂ්පාත් 5. ධෙටඃ 5.)

එභ්‍යඃ පරාත් ධෙටඃ ඛශ් ස්‍යාත් සෙ. මුඤ්ජන්ධයඃ කූලන්ධයඃ ආස්‍යන්ධයඃ පුෂ්පන්ධයඃ. මුඤ්ජන්ධයී, ධෙට ෂ්ට්ත්වාදීප් (257).

(ස-) එභ්‍යඃ පරාත්, මුඤ්ජ කූල ආස්‍ය පුෂ්ප යන මොවුන් කෙරෙන් පරවූ ; ධෙටඃ, ධෙධාතුහු කෙරෙන් ; සෙ, කර්ත්‍රෘවාච්‍ය කල්හි; ඛශ් ස්‍යාත්, ඛශ්ප්‍රත්‍යය වන්නේය.

මුඤ්ජං ධයතීති මුඤ්ජ පූර්‍වක ධෙ, ඛශ්, මන්, ශප්, එකාරයහට අය්ද, අකාරලොපයද වෙත්, මුඤ්ජන්ධයඃ. කූලංධයතීති කූලන්ධයඃ. ආස්‍යංධයතීති ආස්‍යන්ධයඃ. පුෂ්පංධයතීති පුෂ්පන්ධයඃ. මුඤ්ජන්ධයී, ධෙටධාතුහුගේ, ටකාරය ඉත්සංඥබැවින් ඊප්ප්‍රත්‍යය වේ (257). යම් තැනෙක්හි, ධෙටධාතුහුගේ එකාරයහට අය්ආදෙශයද එහිම, ටකාරය ඉත් බැවින් ඊප්ප්‍රත්‍යය වන්නේය, එහෙයින් ධෙටධාතුහුකෙරෙන් තව්‍යප්‍රත්‍යය කල කල්හි, ධාතව්‍ය යනාදියෙහි, ඊප්නොවේ. [පාණිනිඃ 3. 2. 29.]

(මු-) **1018. නාඩී ඝුනී ස්තන කර මුෂ්ටි පාණි නාසිකාත් ධ්මශ්ච.** (නාඩී—නාසිකාත් 5. ධ්මඃ 5. ච 1.)

එභ්‍යඃ පරාත් ධ්මො ධෙටශ්ච ඛශ් ස්‍යාත් සෙ. නාඩින්ධමඃ නාඩින්ධයඃ.

(ස-) එභ්‍යඃ පරාත්, නාඩී ඝුනී ස්තන කර මුෂ්ටි පාණි නාසිකා යන මේ ශබ්දයන් කෙරෙන් පරවූ ; ධ්මඃ, ධ්මාධාතුහු කෙරෙන්ද ; ධෙටශ්ච, ධෙධාතුහු කෙරෙන්ද ; සෙ, කර්ත්‍රෘවාච්‍ය කල්හි ; ඛශ් ස්‍යාත්, ඛශ්ප්‍රත්‍යය වන්නේය. [පාණිනිඃ 3. 2. 29, 30.]

නාඩීං ධමතීති නාඩී පූර්‍වක ධ්මා, ඛශ්ද (597) ධමාදෙශද, පූර්‍වපදයහට මන්ද, එසීන්ම හ්‍රස්වද වෙත්, නාඩින්ධමඃ. නාඩීං ධයතීති නාඩීපූර්‍වක ධෙ, ඛශ්ද, මන්ද, හ්‍රස්වද වෙත්, නාඩින්ධයඃ. ඝුනින්ධමඃ ඝුනින්ධයඃ යනුද ස්තනන්ධමඃ ස්තනන්ධය

(ස-) කරන්ධමඃ කරන්ධයඃ මුෂ්ටින්ධමඃ මුෂ්ටින්ධයඃ පාණින්ධමඃ

පාණින්ධයඃ නාසිකන්ධමඃ නාසිකන්ධයඃ, යනුද එසේමැයි. නාසිකාශබ්දයහට හ්‍රස්ව වේ.*

(මූ-) 1019. **ඝටී-ඛාරී-වාතාද්විධ්වරුස්තිලා-දසූර්‍යෝග්‍රා-ල්ලලාටා-න්මිත-නඛ-මානාන්ධ්මා-තුද-දෘශ-තප-පචඃ.** (ඝටී-ඛාරී-වාතාත් 5. විධු-අරුස්-තිලාත් 5. අසූර්‍ය-උග්‍රාත් 5. ලලාටාත් 5. මිත-නඛ-මානාත් 5. ධ්මා-තුද-දෘශ-තප-පචඃ 5.)

එභ්‍යඃ පරේභ්‍යඃ ක්‍රමාදේතේභ්‍යඃ ඛශ් ස්‍යාත් සෙ. ඝටින්ධමඃ ඛාරින්ධමඃ වාතන්ධමඃ, විධුන්තුදඃ අරුන්තුදඃ තිලන්තුදඃ, අසූර්‍යම්පශ්‍යාඃ උග්‍රම්පශ්‍යඃ, ලලාටන්තපඃ, මිතම්පචඃ නඛම්පචඃ ද්‍රෝණම්පචඃ.

(ස-) එභ්‍යඃ පරේභ්‍යඃ, ඝටී ඛාරී වාත යන මොවුන් කෙරෙන්ද විධු අරුස් තිල යන මොවුන් කෙරෙන්ද අසූර්‍ය උග්‍ර යන මොවුන් කෙරෙන්ද ලලාටයා කෙරෙන්ද මිත නඛ මාන වාචක යන මොවුන් කෙරෙන්ද පරවූ; එතේභ්‍යඃ, ධ්මාධාතු තුදධාතු දෘශධාතු තපධාතු පචධාතු යන මොවුන් කෙරෙන් පරව; සෙ, කර්තෘ වාච්‍ය කල්හි; ක්‍රමාත්, පිළිවෙළින්; ඛශ් ස්‍යාත්, ඛශ්ප්‍රත්‍යය වන්නේය.

ඝටී ඛාරී වාතාත් යනාදීන් වෙන්වශයෙන් පද යෙදීම ක්‍රමය පිණිසයි. ඝටීං ධමතීති ඝටී පූර්ව ධ්මා, ඛශ් වේ, (1014) මන් ආගමද හ්‍රස්වද වෙත්, ධමආදේශ වේ, ඝටින්ධමඃ. ඛාරීං ධමතීති ඛාරී ධ්මා ඛශ්, මන්ද හ්‍රස්වද වෙත්, ඛාරින්ධමඃ, ඛාරී යනු ප්‍රමාණයෙකි, කිසිවෙක් ඛරී, යයි කියයි, දී අලලන්නාවූ භාජනාදියයි. වාතන්ධමතීති වාතන්ධමඃ. විධුන්තුදතීති විධුන්තුදඃ, මන් වේ, විධු යනු අසුරයි. අරුන්තුදතීති අරුන්තුදඃ. අරුස් ශබ්දයහට මන් වේ, (213) සකාරලෝපය වේ. තිලන්තුදඃ. න සූර්‍යං පශ්‍යතීති අසූර්‍යම්පශ්‍යාඃ. ද්‍රෝණම්පචඃ යනු අන්ත කොට ඇති ඉතිරි පදයෝද සිද්ධකටයුතු, ආඪකම්පචඃ යනාදියද එසේමැයි, ද්‍රෝණ යනු ප්‍රමාණවිශේෂයෙක්. [පාණිනිඃ 3. 2. 33—37.]

(මූ-) 1020. **කූලාදුද්‍රුජෝද්වහඃ.** (කූලාත් 5. උද්රුජ-උද්වහඃ 5.)

---

* නාඩී ච ශුනී ච ස්තනශ්ච කරශ්ච මුෂ්ටිශ්ච පාණිශ්ච නාසිකා චෙති තස්මාත්.

කූලාත් අභ්‍යං ඛශ් ස්‍යාත් සෙ. කූලමුද්‍රුජා නදී, කූලමුවහඃ සමුද්‍රඃ.

(ස-) කූලාත්, කූලශබ්දයා කෙරෙන් පරවූ; අභ්‍යං, උද් පූර්ව රුජධාතුද උද්පූර්ව වහධාතුද යන මොවුන් කෙරෙන්; සෙ, කර්තෘ වාච්‍ය කල්හි; ඛශ් ස්‍යාත්, ඛශ්ප්‍රත්‍යය වන්නේය.

දෙතැන්හි උද් යන්නහුගේ ග්‍රහණය ප්‍රකටකිරීම පිණිසයි. කූලමුද්‍රුජතීති කූලඋද් පූර්ව රුජ, ඛශ්, මන්, කූලමුද්‍රුජා, කූල මුවහතීති කූලඋද් පූර්ව වහ, ඛශ්, මන්, චේ, කූලමුවහඃ. මෙ පද දෙකින් නදීසමුද්‍රවය වාච්‍යයි. [පාණිනිඃ 3. 2. 31.]

(මු-) **1021. ප්‍රියවශාද් භයර්තිමෙඝාත් සර්වකූලාභ්‍රකරීෂාත් වද-කෘ-කෂඃ ඛඃ.** (ප්‍රිය-වශාත් 5. භය-ඍති-මෙඝාත් 5. සර්ව-කූල-අභ්‍ර-කරීෂාත් 5. වද-කෘ-කෂඃ 5. ඛඃ 1.)

එභ්‍යඃ පරෙභ්‍යඃ ක්‍රමාදෙතෙභ්‍යඃ ඛඃ ස්‍යාත් සෙ. ප්‍රියංවදඃ වශංවදඃ, භයඞ්කරඃ ඍතිඞ්කරඃ මෙඝඞ්කරඃ, සර්වඞ්කෂඃ කූල ඞ්කෂඃ අභ්‍රඞ්කෂඃ කරීෂඞ්කෂඃ.

(ස-) එභ්‍යඃ පරෙභ්‍යඃ, ප්‍රියශබ්ද වශශබ්ද දෙකින්ද භය ශබ්ද ඍතිශබ්ද මෙඝශබ්ද යන තුණින්ද සර්වශබ්ද කූලශබ්ද අභ්‍රශබ්ද කරීෂශබ්ද යන සතරින්ද යන මොවුන් කෙරෙන් පරවූ ; එතෙභ්‍යඃ, වදධාතු කෘධාතු කෂධාතු යන මොවුන් කෙරෙන්; සෙ, කර්තෘ වාච්‍ය කල්හි; ක්‍රමාත්, පිළිවෙළින්; ඛඃ ස්‍යාත්, ඛප්‍රත්‍යය වන්නේය.

ප්‍රියවශාත් යනාදීන් පද වෙන්කිරීම වදාදි ධාතූන් කෙරෙන් ක්‍රමයෙන් යෙදීම පිණිසයි. ප්‍රියං වදතීති ප්‍රියපූර්ව වද, මෙයින් ඛප්‍රත්‍යයයි. පූර්වපදයාහට මන් චේ, ප්‍රියංවදඃ. වශංවදඃ යනාදියද කෘ, කෂ, යන ධාතූන්ද ගෙණ ඉතිරි පදද ක්‍රමයෙන් වාක්‍ය යොදා සිඬකටයුතු.

සපඤ්ඤාමපින්ඤාමශුභෙ ගමනෙ සත්‍රියාං,
කලත්‍රණිවර්ත්මනොයෙවව ඍතිරිත්‍යභිධීයතෙ.

කරීෂ යනු වියලි ගොමයි. [පාණිනිඃ 3. 2. 38, 42, 43.]

(මු-) **1022. ක්ෂෙම-ප්‍රිය-මද්‍රාත් කූර්වා.** (ක්ෂෙම-ප්‍රිය-මද්‍රාත් 5. කූඃ 5. වා 1.)

එභ්‍යඃ කෘඤඃ ඛො වා ස්‍යාත් සෙ. ක්ෂෙමඞ්කරඃ ප්‍රියඞ්කරඃ මද්‍රඞ්කරඃ. පක්ෂෙ ක්ෂෙමකාරඃ.

(ස-) එභ්‍යඃ, ක්‍ෂෙමශබ්ද ප්‍රියශබ්ද මද්‍රශබ්ද යන මොවුන් කෙරෙන් පරවූ; කෘඤඃ, කෘධාතුහු කෙරෙන්; කෙ, කර්‍තෘයෙහි; වා, විකල්පයෙන්; ඛඃ ස්‍යාත්, ඛප්‍රත්‍යය වන්නේය.

ක්‍ෂෙමං කරොතීති ක්‍ෂෙමපූර්‍ව කෘ, ඛප්‍රත්‍යයද, ගුණද, මන්ද වෙත්, ක්‍ෂෙමඞ්කරඃ. ප්‍රියඞ්කරඃ යනාදියද වාක්‍ය යොදා දත යුතු. පක්‍ෂෙ ක්‍ෂෙමකාරඃ, (1009) ඨාත් ෂණ්, වෑඩියි. [පාණිනිඃ 3. 2. 38, 42, 43.]

(මු-) **1023. භාවඛෙ ත්වාශිතාත් භුවඃ.** (භාව-ඛෙ 7. තු 1. ආශිතාත් 5. භුවඃ 5.)

ආශිතාත් භුවඃ ඛඃ ස්‍යාත් භාවෙ ඛෙ (කරණෙ) වා. ආශිතම්භවං වර්‍තතෙ, ආශිතං භවත්‍යනෙනෙති ආශිතම්භව ඔදනඃ.

(ස-) ආශිතාත්, ආශිතශබ්දයා කෙරෙන් පරවූ; භුවඃ, භූ ධාතුහු කෙරෙන්; භාවෙ, භාවයෙහි; ඛඃ ස්‍යාත්, ඛප්‍රත්‍යය වන්නේය; ඛෙ වා, කරණයෙහි හෝ ඛප්‍රත්‍යය වන්නේය.

ආශිත යනු තෘප්තියයි, ආශිතස්‍ය භවනං ආශිතපූර්‍ව භූ ඛප්‍රත්‍යයයි, ගුණද, මන්ද වෙත්, ආශිතම්භවං වර්‍තතෙ, තෘප්තියට පැමිණ සිටීමයි. ආශිතං භවත්‍යනෙන යන වාක්‍යයෙහි ඛප්‍රත්‍යයව කරණයෙහි ආශිතම්භවඃ යනු වේ. ඔදනඃ, කරණය වූ කල ආහාරයයි. [පාණිනිඃ 3. 2. 45.]

(මු-) **1024. තෲ භෘ වෘ දෲ ජිධෘ තප යම දම මද ලිහ ගම සහාජො නාම්නි.** (තෲ—අජඃ 5. නාම්නි 7.)

එභ්‍යඃ ඛඃ ස්‍යාත් සංඥායාං. රථෙන තරතීති රථන්තරඃ, විශ්වම්භරඃ, පතිංවරා, පුරන්දරඃ, ධනඤ්ජයඃ, වසුන්ධරා, ශත්‍රුන්තපඃ, පරන්තපඃ, වාචං යමඃ, අරින්දමඃ, ඉරයා මාද්‍යතීති ඉරම්මදො හස්තී, වහංලිහඃ, භුජඞ්ගමඃ (පතඞ්ගමඃ ප්ලවඞ්ගමඃ) සර්‍වංසහඃ, වාතමජඃ.

(ස-) එභ්‍යඃ, තෲධාතු භෘධාතු වෘධාතු දෲධාතු ජිධාතු ධෘ ධාතු තපධාතු යමධාතු දමධාතු මදධාතු ලිහධාතු ගමධාතු සහධාතු අජධාතු යන මොවුන් කෙරෙන් පරව; සංඥායාං, නාමයෙහි; ඛඃ ස්‍යාත්, ඛප්‍රත්‍යය වන්නේය.

තෲතරෙ, භෘලි භෘති පුෂ්ටෞඃ, වෘඤ්ගවෘතෞ, දෲභයෙයිවි දෘරෙ, ජිජයෙ, ධෘඤ්ධෘත්‍යං, තපෞ සන්තාපෙ, ඔෟ යමූ උපරමෙ, දමූභ්‍යඉර් උපශමෙ, මදීහිර්ශ්‍යඤ්ඤිභශේ, ලිහලස්වාදෙ,

ඔෟගම්‍යගතාං, සහජඩශකෙතෟ, අජගතෞ කෙෂපණෙ යන මේ ධාතූහු තුදුසයි. රථේන තරතීති රථය කරණකොට ගෙන එතර වේනුයි, රථශබ්ද පූර්‍ව ත෹ධාතු, මෙයින් ඛ වේ, ගුණයි, මන්, රථන්තරඃ. විශ්වං බිභර්ත්‍තීති විශ්වම්භරඃ. පතිං වෘණෙති යා සා පතිංවරා. පුරං දීය්‍යතීති පුරන්දරඃ. භගන්දරඃ යනුද එසේමැයි. ධනං ජයතීති ධනඤ්ජයඃ. රිපුඤ්ජයඃ යනුද එසේමැයි. වසූනි ධරතීති වසුන්ධරා. ශත්‍රුං තපතීති ශත්‍රුන්තපඃ. පරං තපතීති පරන්තපඃ. වාචං යච්ඡතීති වාචංයමඃ, මෙහි, මන්ද ආප්හට හ්‍රස්වදවෙත්. අරිං දම්‍යතීති අරින්දමඃ. ඉරා යනු ජලයයි, ඉරම්මදඃ යන මෙහි, මන්ද, හ්‍රස්වද වන්නේය. වහං ලෙඩි වහං ලිහඃ. ග්‍රන්ථ කර්‍තෘහු විසින් ත෹ භ෹ ව෹ ජිධ෹ යන මේ ගුණවීමට යොග්‍යවූ ධාතූන්ගේ මධ්‍යයෙහි ලිහධාතුහුගේ ප්‍රවෙශය නොකොට වහ ලිහ යන මෙහි ප්‍රවෙශකිරීමෙන් ගුණ නොවන්නේය යනු ප්‍රකාශකරණලදී. භුජේන ගච්ඡතීති භුජඩගමඃ. සංස්කෘතහිත ශබ්දයෙහිද, හෘදයඞගමඃ යනු වේ. සර්‍වං සහත ඉති සර්‍වං සහඃ. වාතමජතීති වාතමජඃ, වාතමෘගයයි. සංඥාව අපෙක්‍ෂා කරණ හෙයින් අජධාතුහට විආදෙශ නොවේ, (586). [පාණිනීඃ 3. 2. 39, 40, 41, 46, 47, 6, 3. 66, 39.]

(මු-) **1025. සඞ්ගං ජහොරඞගමොරගතුරග තුරඞගම විහගවිහඞගම භුජගභුජඞ්ග පතගපතඞ්ග පලවග පලවඞ්ගාඃ.** (සඞ්ගං ජහ—පලවඞගාඃ 1...) **එතෙ ඛාන්තා නිපාත්‍යන්තෙ.**

(සඞ්ගං ජහාතීති සඞ්ගංජහො මාෂඃ, උරසා ගච්ඡතීති උරඩගමඃ, උරගඃ, ත්වරසා ගච්ඡතීති තුරගඃ තුරඩගමඃ, විහායසා ගච්ඡතීති විහගඃ විහඩගමඃ, භුජේන ගච්ඡතීති භුජගඃ භුජඩගඃ, පතනෙන ගච්ඡතීති පතගඃ පතඩගඃ, පලවෙන ගච්ඡත්ති පලවගඃ පලවඩගඃ.

(ස-) ඛාන්තාඃ, ඛප්‍රත්‍යයාන්තවූ; එතෙ, සඞ්ගං ජහඋරඩගම යනාදි ශබ්දයෝ; නිපාත්‍යන්තෙ, නිපාතනය කරනුලැබෙත්.

සඞ්ගං යනු ආර්ද්‍රත්ව (වැගිරීම) යයි, නොහොත් කුත්සිත ශබ්දයයි. සඞ්ගං ජහඃ යනාදිය නිපාතන වෙත්. හා ඔකලි ත්‍යාගෙ, මෙහි මාෂඃ යනු උඳුයි. පත්‍යතෙ'නෙන යන වාක්‍ය යෙහි පතඃ යනු වේ, පක්‍ෂයයි. පලවඃ යනු මෙහි ඉල්පීමයි.

බහුවචනය හෙතුකොටගෙන අන්‍ය ශබ්දයෝද සිඩවෙත්, එහෙයින් ඛරයා ගච්ඡතීති තුරඞ්ගඃ විහාය සා ගච්ඡතීති විහඞ්ගඃ යනාදිය වේ.

(මු-) 1026. **නග්න පලිත ප්‍රියාන්ධ ස්ථූල සුභගාඪ්‍යාත් කුඃ ඛනට් ඩෙ ච්ව්‍යෙපි.** (නග්න—ආඪ්‍යාත් 5. කුඃ 5. ඛනට් 1. ඩෙ 7. ච්ව්‍යෙපි 7.)

එභ්‍යඃ පරාත් කෘඤඃ ඛනට් ස්‍යාත් ඩෙච්ව්‍යෙථෙ.

අනග්නො නග්නඃ ක්‍රියතෙ'නෙනෙති නග්නඞ්කරණං ද්‍යූතං, පලිතඞ්කරණං, පියඞ්කරණං, අන්ධඞ්කරණඃ ශොකඃ, ස්ථූලඞ්කරණං දධි, සුභගඞ්කරණං රූපං, ආඪ්‍යඞ්කරණං විත්තං.*

(ස-) එභ්‍යඃ පරාත්, නග්නශබ්ද පලිතශබ්ද ප්‍රියශබ්ද අන්ධ ශබ්ද ස්ථූලශබ්ද සුභගශබ්ද ආඪ්‍යශබ්ද යන මොවුන් කෙරෙන් පරවූ; කෘඤඃ, කෘධාතුහු කෙරෙන් ; ඩෙ, කරණකාරකයෙහි; ච්ව්‍යෙථෙ, අභූතතද්භාවාර්ථයෙහි ; ඛනට් ස්‍යාත්, ඛනට්ප්‍රත්‍යය වන්නේය.

ඛනට්ප්‍රත්‍යයාගේ ඛකාර ටකාර දෙක ඉත් වෙත්, අන සිහිසි. ච්ව්‍යර්ථය නම් (495) අභූතතද්භාවයයි. නග්නශබ්ද පූර්වක කෘධාතුද, කරණ වාච්‍ය කල්හි අභූතතද්භාවයෙහි මෙයින් ඛනට්ද, ගුණද, ණත්වයද වෙත්, (1014) පූර්වපදයහට මන් වේ, නග්නඞ්කරණං, ද්‍යූතං, ද්‍යූකෙළියයි. එසේම අපලිතං පලිතං ක්‍රියතෙ'නෙනෙති පලිතඞ්කරණං. වෘධත්වයයි. ප්‍රියඞ්කරණං, සෙවනයයි. ච්විප්‍රත්‍යයාගේ අර්ථයෙහි, "ඛනට් ප්‍රත්‍යය කිරීම විධානකළ බැවින් කරණයෙහි ච්විප්‍රත්‍යය නො වන්නේය, එහෙයින්, නග්නී කරොත්‍යනෙන යන මෙහි, ඛනට්ප්‍රත්‍යය නොවන්නේය" යි කිසිකෙනෙක් කියත්. [පාණිනිඃ 3. 2. 56.]

(මු-) 1027. **භුවො ඩෙ ඛිෂ්ණු-ඛුකඤෟ.** (භුවඃ 5. ඩෙ 7. ඛිෂ්ණු-ඛුකඤෟ 1 ‥)

නග්නාදිභ්‍යඃ පරාත් භුවශ්ච්ව්‍යෙථෙ එතෞ ඩෙ ස්‍යාතඃ. නග්නම්භවිෂ්ණුඃ, නග්නම්භාවුකඃ.

---

* නග්නශ්ච පලිතශ්ච ප්‍රියශ්ච අන්ධශ්ච ස්ථූලශ්ච සුභගශ්ච ආඪ්‍යශ්ච තත් තස්මාත්. ච්වෙරර්ථශ්චව්‍යර්ථඃ.

(ස) නග්නාදිභ්‍යඃ පරාත්, නග්නාදි ශබ්දයන් කෙරෙන් පරවූ ; භුවඃ, භූධාතුහු කෙරෙන් ; ච්ව්‍යර්ථේ, ච්විප්‍රත්‍යයාගේ අර්ථයෙහි ; සෙ, කර්තෘ වාච්‍ය කල්හි ; එතෞ ස්‍යාතඃ, ඛිෂ්ණුප්‍රත්‍යය, ඛුකඤ්ප්‍රත්‍යය යන මොව්හු වන්නාහ.

ඛිෂ්ණුප්‍රත්‍යයාගේ ඛකාරය ඉත් වෙයි, ඉෂ්ණු යී සිටියි, ඛුකඤ්ප්‍රත්‍යයාගේ ඛකාර ඤකාර දෙක ඉත්සංඥයෝයි, උක යී සිටියි. අනග්නො නග්නො භවතීති නග්නශබ්ද පූර්වක භූධාතු, මෙයින් ඉෂ්ණුද, ගුණද, ඉත්සංඥ ඛකාර බැවින් මන්ද වෙත්, නග්නම්භවිෂ්ණුඃ. නග්නම්භාවුකඃ යනුද මෙසේමැයි, වෘඩියි. පලිතම්භවිෂ්ණුඃ පලිතම්භාවුකඃ යනාදියද මෙසේමැයි. [පාණිනිඃ 3. 2. 57.]

(මු-) 1028. ඩ්‍යාත් භජ-වහ-සහො විණ්. (ඩ්‍යාත් 5. භජ-වහ-සහඃ 5. විණ් 1.)

ඩ්‍යාත් පරෙභ්‍යඃ එභ්‍යො විණ් ස්‍යාත්. සුඛභාක් ප්‍රෂ්ඨවාට් තුරාෂාට්.

(ස-) ඩ්‍යාත් පරෙභ්‍යඃ, කර්මයා කෙරෙන් පරවූ; එභ්‍යඃ, භජ ධාතු වහධාතු සහධාතු යන මොවුන් කෙරෙන්; විණ් ස්‍යාත්, විණ්ප්‍රත්‍යය වන්නේය.

විණ්ප්‍රත්‍යයාගේ ඉකාරය උච්චාරණය පිණිසයි, ණකාරයාගේ ඉත්සංඥය (577) වෘඩිය පිණිසයි. ඉතිරි වකාරයහට (496) ත්‍යවමාත්‍රඃ යනාදියෙන් ලොප් වේ, නියමයෙන් විණ් ප්‍රත්‍යයාගේ සර්වාභාවයයි. සුඛං භජතීති සුඛ පූර්ව භජ, විණ්, වෘඩියි, (211) කුඞ්, වකාරලොපය වේ, සුඛභාක්, ශෘඞ්ගාර විලාසවත් ස්ත්‍රියයි. ප්‍රෂ්ඨං අග්‍රං වහතීති ප්‍රෂ්ඨ පූර්ව වහ, (175) හකාරයහට ඪකාරද, (64) ටකාරද වකාරලොපයද වෙත්, ප්‍රෂ්ඨවාට්, අශ්වයි. තුරං වෙගං සහතෙ ඉති තුර පූර්වකං සහ විණ්, වෘඩියි. හකාරයහට, ඪකාරද ඕහට, ටකාරද පෙර සේමයි, (111) ෂත්වය වේ, තුරාෂාට්, ඉන්ද්‍රයි. [පාණිනිඃ 3. 2. 62—64.]

(මු-) 1029. අනඩු ශ්වෙත වාහාදිඃ. (1.)

එතෙ විණන්තා නිපාත්‍යන්තෙ. අනො වහතීති අනඩ්වාන් වෘෂඃ. ශ්වෙතෙ රූහ්‍යතෙ ඉති ශ්වෙතවාඃ ඉන්ද්‍රඃ. අවයජතීති අවයාඃ, උක්ථානි ශංසතීති උක්ථශාඃ යජමානඃ. පුරොඩාඃ හවිඃ, පුරොඩාශඃ.

(ස-) එතෙ, අනඩුහ්ශබ්දය ශ්වෙතවාහ්ශබ්දය අවයාජ්ශබ්දය උක්ථශාස්ශබ්දය පුරොඩාශ්ශබ්දය පුරොඩාශශබ්දය යන මේ; විණන්තාඃ, විණ්ප්‍රත්‍යයාන්ත ශබ්දයෝ; නිපාත්‍යන්තෙ, නිපාතනය කරණුලැබෙත්. අන පූර්වක වහ, විණ්ද, නිපාතනයෙන් අනඩුහ්ශබ්දයද වෙත්, (181) අනඩුහ්ශබ්දයාගේ අන්ත්‍යස්වරයා කෙරෙන් අකාරාගමයි, (182) හකාරයහට නකාර වේ, විභක්තිලොපය කළ කල්හි අනො වහතීති, ගැල උසුලානුයි, අනඩ්වාන්, වෘෂඃ, අනස් යනු ගැලයි. ශ්වෙතෛ රුහ්‍යතෙ ඉති, ශ්වෙතවර්ණවූ අසුන් විසින් උසුලනුලැබේනුයි, ශ්වෙතශබ්ද පූර්ව වහධාතු, කර්තෘහු කෙරෙන් පරව වහ යන්නහු කෙරෙන් කර්මය වාච්‍ය කල්හි විණ් වේ, නිපාතනයෙන් ශ්වෙතවාහ් යනු වේ, (184) මෙහි විභක්ති ලොප්කළ කල්හි ඪ සඬ් ආදෙශයද, ඊහට ලොප්ද, (185) අසන්තයහට දීර්ඝද, අස් යන්නහුගේ සකාරයහට විසර්ගද වෙත්, ශ්වෙතවාඃ, ඉන්ද්‍රඃ. අවපූර්ව යජ, අවයාජ්ද, විභක්තිහට ලොප්ද පෙර මෙන් ඪ සඬ් ආදෙශාදියද වෙත්, අවයාඃ. උක්ථ පූර්වක ශාස උක්ථශාස් යී නිපාතනයි, ඪ සඬ් ආදෙශව උක්ථශාඃ, යජමානඃ, යාග කරන්නෙක්. පුරඃ අග්‍රෙ දාශ්‍යතෙ දීයතෙ ඉති පුරඩ්‍ෂ.

නිපාතනයෙන් පුරොඩාශ් යනු වේ, පුරොඩාඃ හවිඃ. අකාරාන්ත පුරොඩාශශබ්දයද සිඩයි. පුරොඩාශඃ. [පාණිනිඃ 3. 2. 71, 72.]

(මූ-) 1030. **ක්‍රම ගමඛනසනජනො විට්.** (ක්‍රම-ජනඃ 5. විට් 1.)

එභ්‍යො විට් ස්‍යාත් සෙ.

(ස-) එභ්‍යඃ, ක්‍රමධාතු ගමධාතු ඛනධාතු සනධාතු ජනධාතු යන මොවුන් කෙරෙන්; සෙ, කර්තෘ වාච්‍ය කල්හි; විට් ස්‍යාත්, විට්ප්‍රත්‍යය වන්නේය.

විට් යන්නහුගේ ඉකාර ටකාර දෙක ඉත්සංඥ වෙයි, (496) වකාරමාත්‍රයහටද ලොප් වේ. [පාණිනිඃ. 3. 2. 67.]

(මූ-) 1031. **විඩ්වනොරා ඩා.** (විට්-වනොඃ 7 .. ඩා 1.)

ඩොරන්ත්‍යස්‍ය ඩා ස්‍යාත් විපි වනි ච.

උදධික්‍රාඃ, අග්‍රෙගාඃ, විසඛාඃ, ගොෂාඃ, අබ්ජාඃ.

(ස-) විපිවනි ච, විට්ප්‍රත්‍යයද වන්ප්‍රත්‍යයද පර කල්හි; ඩොඃ,

ධාතුහුගේ ; අනත්‍යස්‍ය, අන්‍ත්‍යයහට ; ඩා ස්‍යාත්, ඩාආදෙශ වන්නේය.

විට් යන්නහුගේ සාහචය්‍ය්‍යීයෙන් වන් යනු ගුණ ඇත්තේ ගතයුතුයි, එහෙයින් ක්වනිප් යන්නහුගේ ප්‍රසඞ්ගය නොවේ. ඩා යන මොහුගේ ඩකාරය ඉත් වෙයි, අනත්‍යයාගේ ස්ථාන යෙහි ආකාරය වේ. උදධිං ක්‍රාමතීති උදධිපූර්ව ක්‍රම, පූර්ව සූත්‍රයෙන් විට් වේ, මෙයින් අනත්‍යයහට ඩා වේ, වකාරලොපාදිය වේ, උදධික්‍රාඃ. අග්‍රෙ ගච්ඡතීති ගම, පළමු පරිද්දෙන් සිඩයි, අග්‍රෙගාඃ.

විසං (මෘණාලං) ඛනතීති ඛන, විසඛාඃ. ගාං සනොතී (දදාතීති) ති ෂන, ගොෂාඃ, කරණීලද සකාරය බැවින් (111) ෂත්වය වේ. අප්සු ජායතෙ ඉති ජන, අබ්ජාඃ. ආකාරාන්ත යෝයි. [පාණිනිඃ 6. 4. 41.]

(මු-) **1032. ත්‍රාසුසිස්මන් ක්වනිප් වනිප් විච් ක්විපඃ.** (1 ...)

ධොරෙතෙ ස්‍යුඃ කෙ භාවෙ ච.

නීයතෙ'නෙනෙති නෙත්‍රං දංෂ්ට්‍රා නඩ්රී යොත්‍රං, උරුච ස්‍ය චාඃ නෘචක්ෂාඃ, රජඃ, චක්‍ෂුඃ, සර්පිඃ, සුජ්ධ්‍ව දදාතීති සුදාමා ගන්මා.*

(ස-) ධොඃ, ධාතුහු කෙරෙන් ; කෙ, කාරකයෙහිද ; භාවෙච, භාවයෙහිද ; එතෙ, ත්‍රප්‍රත්‍යය අස්ප්‍රත්‍යය උස්ප්‍රත්‍යය ඉස්ප්‍රත්‍යය මන්ප්‍රත්‍යය ක්වනිප්ප්‍රත්‍යය වනිප්ප්‍රත්‍යය විච් ප්‍රත්‍යය ක්විප්ප්‍රත්‍යය යන මොව්හු ; ස්‍යුඃ, වන්නාහ.

ක්වනිප් ප්‍රත්‍යයාගේ ක-ඉ-ප යන තුණ ඉත්සංඥයෝයි. වනිප්ප්‍රත්‍යයාගේ, ඉප්, යන දෙක ඉත්සංඥයෝයි. දෙතන්හි, වන්, යී සිටියි. විච්-ක්විප් දෙක සියල්ල අභාවයෝයි.

ධොඃ යී සාමාන්‍යයෙන් කී කල්හිද ප්‍රයොගානුසාරයෙන් දතයුතු. නීයතෙ'නෙනෙති, මෙ කරණකොටගෙන පමුණු වනු ලැබේනුයි, ණී, මෙයින් කරණයෙහි ත්‍රප්‍රත්‍යයයි, ගුණ වේ, නෙත්‍රං. දංශ්‍යතෙ'නයෙති දංශ (154) ෂඩ් ආදෙශද, (47) තකාරයහට ටකාරද, ස්ත්‍රීලිඞ්ගයෙහි ආකාරද වෙත්, දංෂ්ට්‍රා, දළයයි. නහ්‍යතෙ'නයෙති නහ, කරණයෙහි ත්‍ර වේ,

---

* ත්‍රශ්ච අස්ච උස්ච ඉස්ච මන්ච ක්වනිප්ච වනිප්ච විච්ච ක්විප්ච තෙ.

(237) ඝකාරයහට ධකාරද, (575) තකාරයහට ධකාරද, (64) පූර්ව ධකාරයහට දකාරද, දෙතන්හි අභිධානබැවින් ස්ත්‍රීත්වයද, නද්‍යාදි බැවින් ඊප්ද වෙත්, නධ්‍රී, රැහැණයි. සූය තෙ'නෙනෙති සු, කරණයෙහි ත්‍රප්‍රත්‍යයයි, ගුණ වේ, සොත්‍රං. යුජ්‍යතෙ'නෙනෙති යුජ, යොක්ත්‍රං යනුද මෙසේමැයි. දාන ලූනෙ' දාත්‍රං, පාපානෙ පාත්‍රං, ෂ්ටු, ස්තොත්‍රං, මිහ, මෙඪ්‍රං, පත, පත්ත්‍රං, ශස, ශස්ත්‍රං, අස, අස්ත්‍රං, හස, හස්ත්‍රා, යනාදි යද වේ. උරුං (මහාන්තං) වචතීති ව්‍යච මෙයින් අස් වේ. (756) අස් තොර බැවින් ජ්‍යාදෙශ නොවේ, උරුව්‍යචාඃ. නරං චෂ්ටෙ චක්ෂ අස් වේ, (706) අස් තොර බැවින් ක්සා-ඛ්‍යා යන ආදෙශ නොවේ, නෘචක්ෂාඃ. රජ්‍යතෙ'නෙනෙති රන්ජ, (660) නකාර ලොපය වේ, රජඃ. විධ්‍යතීති වෙධාඃ, යනුද මෙසේමැයි. චෂ්ටෙ (පශ්‍යති) අනෙන චක්ෂුඃ, උස්ප්‍රත්‍යයයි, (706) උස් තොර බැවින් ක්සාද්‍යාදෙශ නොවේ. ධනරවෙ, ධනතීති ධනුඃ යනුද එසේමැයි. සර්පතීති සෘප, ඉස් වේ, සර්පිඃ. හූයතෙ යත් තන් හු, හවිඃ, යනුද එසේමැයි. සුපූර්ව දා දානෙ, මන් වේ, සුදාමා, මෙහි සිව්භක්තිහට ලොප්කළ කල්හි (164) මන් යන්නහට දීර්ඝද, (118) නකාර ලොපයද වෙත්. ගච්ඡතීති ගම, (202) මකාරයහට නකාරද වේ, ගන්මා. [පාණි නිඃ 7. 2. 9.]

(මූ-) **1033. භව්ත්‍රකෙර් නෙම්.** (භව්-ත්‍ර-තෙඃ 6. න 1. ඉම් 1.)

කෘතො භවස්‍ය ත්‍රස්‍ය තෙශ්ච ඉම් න ස්‍යාත්. සුශර්ම්මා, සුපීවා ප්‍රාතරිත්වා සුත්වා, භූරිදාවා වාරිජාවා, සොමපාඃ, රෙට් රොට් ක්‍රැඬ්, ශුඞ්, ප්‍රත්‍යඞ් අක්ෂද්‍යූඃ මිත්‍රශීඃ ආශීඃ ගීඃ බහුභාට් භ්‍රාත ස්පෘක් ශසන්ත් ක්‍රවන්ත්.

(ස-) කෘතඃ, කෘත් සම්බන්ධිවූ ; භවස්‍ය, භවප්‍රත්‍යාහාරය හටද ; ත්‍රස්‍ය, ත්‍රප්‍රත්‍යයහටද ; තෙශ්ච, ක්තිප්‍රත්‍යයහටද ; ඉම් න ස්‍යාත්, ඉම් නොවන්නේය.

භව යනු ශෂවකාරය කෙළවරකොට ඇති ප්‍රත්‍යාහාරයයි. සුශෘණෙතීති සුපූර්ව ශෘමන්, මෙයින් ඉම්නිෂෙධයි, ගුණ වේ, සුශර්ම්මා. සුපිවතීති සු-පාපානෙ ක්වනිප්, කිත්ත්ව බැවින් ගුණ නුවූ කල්හි (612) ඊ වේ, සුපීවා. ප්‍රාතරෙතීති ප්‍රාතර් පූර්ව ඉගතෞ, ක්වනිප්, ක්වස්‍ය තන් පිති යන්නෙන තන් වේ, ප්‍රාත

රිඩ්වා. සුනෝතීති ෂු, ඩ්වනිප්, (982) තක් වේ, සුත්වා. භූරි දදාතීති දදනෙ භූරිදවා. වාරිණි ජායතෙ වාරිජන, දෙතන්හි වනිප්, වාරිජාවා (1031) ඩා වේ. සෝමං පිවතීති පාපානෙ, විච් වේ, සෝමපාඃ, විච්ප්‍රත්‍යයාගේ වකාරයද පූර්වාවයවීමත සඳහා වෙයි, අවස්‍ය පිණ්ස නොවේ, (496) වකාර මාත්‍රය ලොප්වේ. රෙෂතීති රිෂ, විච්ප්‍රත්‍යයහට ලොප්ද, (155) ෂකාරයහට ඩකාරද, (64) ඕහට ටකාරද වෙත්, රෙට්. රොෂ තීති රුෂරොෂෙ, විච්, දෙතන්හි ගුණවේ, රොට්. ක්‍රුඤ්චතීති ක්‍රුඤ්ච විච් (211) කුඩ්, (50) ඤකාරයහට අනුස්වාරයි (51) ඕකාරයද, (193) අන්තයහට ලොප්ද වෙත්, ක්‍රුඩ්. යුනක් තීති ක්විප්හට ලොප්වේ, යුන්ජ (567) නකාර ලොපයි, යුජ් ශබ්දයයි, සිහට ලොප්, (210) නුණ්, කුඩ්, නකාරයහට අනුස්වාරව ඩකාරද, සංයොගාන්ත ලොපයද වෙත්, යුඩ් යනු වේ. ප්‍රත්‍යඤ්චතීති ක්විප් වේ, (568) පූජාර්ථයෙහි අන්ච ධාතුහුගේ නකාරලොප යනුවූකල්හි ප්‍රත්‍යඞ් යනු වේ, ගත්‍යර්ථ අන්චධාතුහට නකාරලොපයද ප්‍රත්‍යච් ශබ්දයහට (192) නුණ්ද කළකල්හි ප්‍රත්‍යඞ් යනු වේ. අශෛෂර්දීව්‍යතීති දිව, ක්විප්, (814) ඌට්, අක්ෂද්‍යූඃ. මිත්‍රං ශාස්තීති ශාසමිත්‍රශීඃ, ආශාස්තීති ආශීඃ, දෙතන්හි උඩ්සංඥයාගේ ස්ථානයෙහි (705) ඉත් වේ, (227, 228) ෂකාරයහට රඩ් ආදෙශද දීඝද වෙත්. ශෛඛ්‍ය ඛ්වා ශා ශව යනු කියනබැවින් අන්තන්හි ප්‍රශාසතීති ප්‍රශාඃ යනු වේ. ගෘණාතීති ගෘ ක්විප්, (628) ඉර් වේ, දීඝයි, ගීඃ. බහූන් භෘජ්ජතීති බහුපූර්ව භ්‍රස්ජ, (661) ජ්‍යදෙශයි, වකාර ලොපයි, (154) ෂඩ්, (155) ඩකාරයි, (64) ටකාර වේ, බහුභෘට්. ඍතං සපෘශතීති ඍතපූර්ව සපෘශ (211) කුඩ්, ඍතසපෘක්. ශස්‍යං අතතීති අදහක්‍ෂණේ ශසත්‍යත්. ක්‍රව්‍යං (මාංසං) අතතීති ක්‍රව්‍යත්, තුන්තන්හි ක්විප්. [පාණිනිඃ 6. 2. 74, 75, 76.]

(මු-) 1034. ජාදෙස්ත්‍රමන් ක්විස් ශෙ ස්වඃ. (ජාදෙඃ 6. ත්‍ර-මන්-ක්වි-ඉස්-ශෙ 7. ස්වඃ 1.)

ජාදයතෙඃ ස්වඃ ස්‍යත්, ත්‍රෙ මනි ක්වාවිසි ශෙ ච. ජත්‍රං, ජද්ම, තනුචජත්, ජදිඃ, උරශ්ජදඃ.

(ස-) ත්‍රෙ මනි ක්වාවිසි ශෙ ච, ත්‍රප්‍රත්‍යය මන්ප්‍රත්‍යය ක්විප්‍රත්‍යය ඉස්ප්‍රත්‍යය ඝප්‍රත්‍යය යන මොවුන් පර කල්හි ; ජාදයතෙඃ, ජාදයති යන්නහු කොරෙන් ; ස්වඃ ස්‍යත්, හ්‍රස්ව වන්නේය.

ඡදකි සංවරණෙ ඡාදයතෙ'නෙනෙති (1032) ත්‍රප්‍රත්‍යයයි, (1033) ඉම්නිෂෙධයි, (641) ණිහට ලොප්, මෙයින් හ්‍රස්වද, (64) දකාරයහට තකාරද වෙත්, ඡත්‍රං. ඡදධාතු, ණි වේ, වෘඩියි, ඡාදයතෙ'නෙනෙති, මන්, මෙයින් හ්‍රස්වද, ණි හට ලොප්ද වෙත්, ඡද්ම. තනුං ඡාදයතීති තනු ඡද, ක්වි, හ්‍රස්වයි, (64) දකාරයහට තකාර වේ, තනුච්ඡත්. ඡාදයතෙ'නෙ නෙති, ඉස්, හ්‍රස්ව වේ, ඡදිඃ. ඝප්‍රත්‍යය පර කල්හි හ්‍රස්ව විධානකළ බැවින් ඡාදයති යන්නහු කෙරෙන් කර්තෘභූත නාම යෙහි ඝප්‍රත්‍යය වක්තව්‍යයි, (1007) ඝ යනු ඉත්සංඥයි, අකා රය සිටියි, එහෙයින් උරශ්ඡාදයතීති උරශ්ඡදඃ. ප්‍රච්ඡදඃ, දන්තච්ඡදඃ යනාදියද මෙසේමයි. [පාණිනිඃ 6. 4. 96, 97.]

(මු-) **1035. ද ද ජජු හු වාක් ප්‍රාට්ශ්‍රීස්‍රෑ ද්‍රෑජ්වාය තස්තු කට ප්‍රෑ පරිව්‍රාට් දිද්‍යුජ්ජගත් දධෘක් ස්‍රුගුෂ්ණිහඃ.** (දදෘත්-උෂ්ණිහඃ 1...)

එතෙ ක්විබන්තා නිපාත්‍යන්තෙ. දීප්‍යතීති දදෘත්, ජුහො ත්‍යනයෙති ජුහූඃ, වක්ත්‍යනයෙති වාක්, පෘච්ඡතීති ප්‍රාට්, ශ්‍රය න්‍යෙතාං ශ්‍රීඃ, ස්‍රවතීති ස්‍රෑඃ, ද්‍රවතීති ද්‍රෑඃ, ජවතීති ජූඃ, ආයතං ස්තෞතීති ආයතස්තූඃ, කටං ප්‍රවතෙ කටප්‍රෑඃ, පරිව්‍රජතීති පරි ව්‍රාට්, ද්‍යොතතෙ ඉති දිද්‍යුත්. ගච්ඡතීති ජගත්, ධෘෂ්ණොතීති දධෘක්, සෘජ්‍යතෙ ඉති ස්‍රක්, උර්ධ්වං ස්නිහ්‍යතීති උෂ්ණික්.

(ස-) ක්විබන්තාඃ, ක්විප්ප්‍රත්‍යයාන්තවූ; එතෙ, දදෘත් යනාදි මේ ශබ්දයෝ; නිපාත්‍යන්තෙ, නිපාතනය කරණුලැබෙත්. ද්‍යුතිදීප්තෞ ක්විප්ප්‍රත්‍යයයි, (982) පිත් පර කල්හි තුන්, නිපාතනයෙන් සිඩයි, දදෘත් යනු වේ. හුලි හොමෙ, ක්විප්, නිපාතනයෙන්, ජුහූඃ. වචලෞවාචි, වාක්. ප්‍රච්ඡශෞඤ්ප් සෙ ක්විප්, ප්‍රාට්, ෂඩ් ආදෙශ වේ. ශ්‍රිඤ් සෙවනෙ, ශ්‍රීඃ. ස්‍රු ස්‍රැතෞ ගතෞ, ස්‍රෑඃ. ද්‍රැගතෞ ද්‍රෑඃ. ජු ජූඃ. ආයතපූර්ව ෂ්ටු ස්තුතෞ, ආයතස්තූඃ. කට පූර්ව ප්‍රෑ සපීණෙ, කටප්‍රෑඃ. පරි පූර්ව ව්‍රජ ගතෞ, පරිව්‍රාට්, ෂඩ් ආදෙශ වේ. ද්‍යුත ශ ඩ ද්‍යුතෞ, දිද්‍යුත්. ගම ජගත්. ධෘෂ දධෘක්, කුඩ වේ. සෘජ ස්‍රක්. උද් පූර්ව ෂ්නිහ කුඩ වේ, උෂ්ණික්. [පාණිනිඃ 3. 2. 177, 178.]

(මු-) **1036. ජි ඝෞ නන්‍යඃ.** (ජඃ 1. ඝිඃ 1. අනන්‍යඃ 1.)

අනන්‍ය ජි ඝිඃ ස්‍යාත්. මිත්‍රං හ්වයතීති මිත්‍රහූඃ.

(ස-) අනන්‍යඃ ජිඃ, ධාතුහුගේ අන්තයෙහි සිටියාවූ ජ්‍යාදෙශය; ඝිඃ ස්‍යාත්, දීඝි වන්නේය.

අනන්‍යඃ යනු කෘත්ප්‍රත්‍යයා විසින් අව්‍යවහිත පූර්වයෙහි පැවති අවයවයි. මිත්‍රපූර්ව හ්වෙ, ක්විප් වේ, (661) ජ්‍යාදෙශ වේ, මෙයින් දීර්ඝ වේ, මිත්‍රහූඃ. එසේම හූතඃ හූතවාන්, හූතිඃ, හූත්වා. ජ්‍යා-ජීනඃ. ශ්වි-ශූනඃ යනු වේ. අනන්‍යඃ යනු කුම ටය ? ඉෂ්ටඃ උෂ්ටඃ පෘෂ්ටඃ යනාදියෙහි ප්‍රථමාවයවය දීර්ඝ නො වන පිණිසයි.

(මු-) **1037. වෙධ්‍යාප්‍යාං ක්වෞ.** (වෙ-ධ්‍යා-ආප්‍යාං 6... ක්වෞ 7.)

ඌඃ ධීඃ ආපීඃ ධ්‍යාපෙත්‍යරතථව ජීඃ.

(ස-) ක්වෞ, ක්විප්ප්‍රත්‍යයා පර කල්හි; වෙධ්‍යාප්‍යාං, වෙධාතු ධ්‍යෛධාතු ආප්‍යෛධාතු යන මොවුන්ගේ ජ්‍යාදෙශයහට ; දීර්ඝ වේ.

වයතීති වෙඤෙ සන්‍ත තෞ, ක්විප් වේ, (661) ජ්‍යාදෙශ වේ, මෙයින් දීර්ඝ වේ, ඌඃ. පූර්ව සූත්‍රයෙන් සිද්ධ කල්හිද මේතෙම නියමය වෙයි. මේ ජ්‍යාදෙශයහට ක්විප්ප්‍රත්‍යය කළ කල්හිම දීර්ඝ වේ, අන්තන්කි නොවේ, එහෙයින් උතඃ උත්වා යනාදිය වේ. ධ්‍යායත්‍යනයා ධීඃ. ආප්‍යායතෙ ඉති ආපීඃ, ධ්‍යෛ ප්‍යෛ ධාතු දෙකින් ජ්‍යාදෙශය නොලත් කල්හිද ජීහට දීර්ඝවිධාන යෙන්ම ක්වි පර කල්හි ජ්‍යාදෙශය කියයුතු. අතඃඑව, එහෙයින්ම ; ධ්‍යාපෙඃ, ධ්‍යෛ ප්‍යෛ යන ධාතුන් දෙදෙනා හට ; ජීඃ, ජ්‍යාදෙශය වේ, ධ්‍යෛ චින්තනෙ, ප්‍යෛ-ඩ-වෘද්ධෞ.

(මු-) **1038. ඤුමුඩො ඣස්‍යණෞ චාතිකි.** (ඤුමුඩඃ 6. ඣසි 7. අණෞ 7. ච 1. අතිකි 7.)

ඤුමන්තස්‍ය උඩො සීඃ ස්‍යාත් අණෞ ඣසෙ ක්වෞ ච න තු තික්. ප්‍රශාන්.

(ස-) අණෞ ඣසෙ, ගුණරහිතවූ ඣස් පර කල්හිද; ක්වෞ ච, ක්විප්‍රත්‍යයා පර කල්හිද; ඤුමන්තස්‍ය, ඤුම්සංඥයා අන්ත කොට ඇති ධාතුහුගේ ; උඩඃ, උඩ්සංඥ ස්වරය හට ; සීඃ ස්‍යාත්, දීර්ඝ වන්නේය; තිකි තු, තික් ප්‍රත්‍යයා පර කල්හි වනාහි ; න, උඩ්සංඥස්වරයහට දීර්ඝ නොවේ.

ප්‍රශාම්‍යතීති ප්‍ර පූර්වක ශම ක්විප්, මෙයින් උඩ්සංඥස්වරයහට දීර්ඝයි, (202) මකාරයහට නකාර වේ, ප්‍රශාන්. ගුණනොවන් නාවූ ඣස් පරකල්හි දීර්ඝයහට උදාහරණ මෙසේයි, ශාන්තඃ ශාන්තිඃ ශාන්ත්වා යනාදියයි. හතඃ හතිඃ හත්වා යනාදීයෙහි

චනාති (676) ඤමි ලොප්කල කල්හි ඤමිසංඥයාගේ අනන්තවයක් නැතිබැවින් උඩ්සංඥයහට දීඝී නොවේ. අතිකි යනු කුමටය? රනතිඃ තනතිඃ යනාදි තන්හි තික් පරකල්හි ඤමි හුගේ උඩ්හට දීඝී නොවෙන හෙයිනි. [පාණිනි 6. 4. 25.]

(මු-) **1039. ශ්‍රිවාවමවජ්වරත්වරෙරු වූඩ්‍ඪා ඤමෙ ච.** (ශ්‍රිව-අව-මව-ජ්වර-ත්වරඃ 6. ච් 1. ඌට් 1. උඩා 3. ඤමෙ 7. ච 1.)

එෂාං ච උඩා සහ ඌට් සෳත් ක්වෞ ඣඩසි අගුණෙ ඤමෙ ච. ස්‍රූඃ ඌඃ මූඃ ජූඃ තූඃ.

(ස-) ක්වෞ, ක්විප්ප්‍රත්‍යයා පර කල්හිද ; අගුණෙ ඣඩසි, ගුණ රහිතවූ ඣඩ් පර කල්හිද ; ඤමෙ ච, ඤමිසංඥයා පර කල් හිද ; එෂාං, ශ්‍රිවධාතු අවධාතු මවධාතු ජ්වරධාතු ත්වරධාතු යන මොවුන්ගේ ; උඩාසහ, උඩ්සංඥස්වරයා හා සමග ; චඃ, චකාරයතෙම ; ඌට් සෳත්, ඌට් ආදෙශ වන්නේය, ඌට් ආදෙශයාගේ ටකාරය ඉත් වෙයි.

ශ්‍රීව්‍යතීති ශ්‍රිව්‍යුශොෂෙ ගතෞ, ශ්‍රිවධාතු, ක්විප්, මෙයින් ඉකාර සහිත වකාරයහට ඌට් වේ, ස්‍රූඃ යනු වේ. අවතීති අවරක්‍ෂා ප්‍රීණනෙ, වකාරයා හා අකාරයහට ඌට්, ඌඃ. මව තීති මවබන්ධෙ මූඃ. ප්‍රථමා ද්විවචනාදියෙහි (135) උව ආදෙශ වේ, ස්‍රුවෞ, උවෞ, මුවෞ යනාදිය වේ. ජ්වරතීති ජ්වරම රොගෙ ජූඃ. ත්වරතෙ ඉති ඤිත්වරාජ්මඩ්සම්භ්‍රමෙ (වෙගයෙහි) තූඃ. ගුණරහිත ඣඩ් පර කල්හි ඌට්ආදෙශය මෙසේයි, ස්‍රූතිඃ ඌතිඃ මූතිඃ ජූර්තිඃ තූර්තිඃ, ඤමි පර කල්හි මෙසේයි, ශ්‍රිවධාතු, මන් වේ, ස්‍රොමා, අවධාතු-මි-ඔමි යනාදිය වේ. [පාණිනි 6. 4. 20.]

(මු-) **1040. රාච්ඡ්වාර් ලොපඃ.** (රාත් 5. ච්ඡ්වාඃ 6.. ලොපඃ 1.)

රාත් පරයො ශ්ජකාර-වකාරයොර්ලොපඃ සෳත් ක්වෞ ඣසෳගුණෙ ඤමෙ ච. මූර්ච්ඡා-මූඃ, ධුර්වී-ධූඃ.

(ස-) ක්වෞ, ක්විප්ප්‍රත්‍යය පර කල්හිද ; අගුණෙ ඣඩසි, ගුණ රහිත ඣඩ් පර කල්හිද ; ඤමෙ ච, ඤමිසංඥයා පර කල්හි ද ; රාත් පරයොඃ, රකාරයා කෙරෙන් පරවූ ; ඡකාරවකාර යොඃ, ඡකාරවකාර දෙදෙනාහට ; ලොපඃ සෳත්, ලොප් වන් නේය.

මූර්ච්ඡතීති මූර්ච්ඡා මොහසමුච්ඡ්‍රයෙ, මූර්ඡ ධාතු, ක්විප්, මෙයින් ඡකාරලොපයයි, මූර්යි ශබ්දයයි, ප්‍රථමෛකවචනයෙහි (228) දීඝ වේ, මූඃ. ධූර්ව්‍යතෙ ඉති ධුර්වීහිංසෙ, ක්විප් කළ කල්හි මෙයින් වකාරලොපය වේ, ධුර් යන්නහට පෙර සේ දීඝයි, ධූඃ. ගුණරහිත ඣස් පරකල්හි මූර්ත්තඃ ධූර්ත්තඃ යනාදියෙහි දීඝ වේ. මේ සූත්‍රයෙහි රෙඵසාහචර්‍ය්‍යයෙන් වකාරය දන්ත්‍යමය, එහෙයින් ඝර්වගතෞ නර්වගතෞ යනාදියෙහි වර්ග්බකාරයෙහි නොයෙදේ. [පාණිනි 6. 4. 21.]

(මු-) **1041. ආදූඨො වෘද්ධිඃ.** (ආත් 5. ඌඨඃ 6. වෘද්ධිඃ 1.)

අවර්ණාත් පරස්‍ය ඌඨො වෘද්ධිඃ ස්‍යාත්. ජනාන් අවතීති ජනෞඃ.

(ස-) **අවර්ණාත් පරස්‍ය**, අවර්ණයා කෙරෙන් පරවූ; **ඌඨඃ**, ඌඨ් යන්නෙහි ස්වරයහට; **වෘද්ධිඃ ස්‍යාත්**, වෘද්ධි වන්නීය.

ජනාන් යන උපපදයා හා අවධාතුහුගේ සමාසය කළ කල්හි ජනාන් අවති යන වාක්‍යයෙහි ක්විප් වේ, (1039) වකාරයහට ඌඨ් වේ, ජන-ඌ යි සිටි කල්හි මෙයින් ඌ යන්නහට වෘද්ධි ඖකාරය වේ, නැවත ජන-ඖ ශබ්දවය සන්ධි වේ, ජනෞඃ යනු වේ. යම් කලෙක්හි ආදියෙහි ක්විප් වේද, නැවත සමාස වේ, එකල්හි ජනස්‍ය ඌඃ ජනොඃ කියා වේ. එසේම, තව ඌඃ තවොඃ, යනාදිය වේ. කෙවල පදයෙහි වනාහි ශවධාතුහු කෙරෙන් ක්විප් කළ කල්හි (814) වකාරයහට ඌඨ් වේ, මෙයින් වෘද්ධියි. ශෞඃ යනාදිය වේ. [පාණිනිඃ 6. 1. 89.]

(මු-) **1042. යමමනතනගමො'න්තලොපඃ ක්වෞ.** (යම-මන-තන-ගමඃ 6. අන්තලොපඃ 1. ක්වෞ 7.)

එෂාමන්තස්‍ය ලොපඃ ස්‍යාත් ක්වෞ. සංයත් පරිමත් පරීතත් සංගත්.

(ස-) **ක්වෞ**, ක්විප් ප්‍රත්‍යය කළ කල්හි; **එෂාං**, යමධාතු මනධාතු තනධාතු ගමධාතු යන මොවුන්ගේ ; **අන්තස්‍ය**, අන්තය හට ; **ලොපඃ ස්‍යාත්**, ලොප් වන්නේය.

සංයච්ඡතීති සංපූර්ව යම විරතෞ, ක්විප්, මෙයින් මකාරලොපය කළ කල්හි (982) තන් ආගම වේ, සංයත්. පරිමන්‍යතෙ ඉති පරිමනබොධෙ, ක්විප්, වකාරලොපාදිය වේ, පරිමත්. පරිතනොතීති පරිතනවිස්තෘතෞ, පරීතත්. සංගච්ඡතීති

සංගමගතාඃං, අනනලොපය වේ, සංගත්. පරිතත් සී දිඝි නිදේශය හෙතුකොටගෙන ක්විප්ප්‍රත්‍යයානත ධාතූන් පර කල්හි කිසි තන්හි උපසර්ගහට දිඝි වන්නේය යනු ප්‍රකාශ කරණලද්දේය, එහෙසින් විරොහති විරුත්, උපනහ්‍යති උපානත්, උපවර්තතෙ උපාවෘත්, ප්‍රවෂිති ප්‍රාවෘට් යන මේ ආදිය සිඩයි. [පාණිනිඃ 6. 4. 40.]

(මු) 1043. **ෂ්‍රි-විශ්වග්-දෙවස්‍ය ටෙරද්‍ය්‍යඤ්චෞ කෙචෞ.** (ෂ්‍රි-විශ්වච්-දෙවස්‍ය 6. ටෙඃ 6. අද්‍රි 1. අඤ්චෞ 7. කෙචෞ 7.)

ෂෙව්ශ්වචො දෙවස්‍ය ච ටෙ රද්‍රිඃ ස්‍යාත් ක්විබනෙත අඤ්ච තෞ. සර්වානඤ්චතීති සර්වද්‍ය්‍යඞ්, විශ්වද්‍ය්‍යඞ්, දෙවද්‍ය්‍යඞ්.*

(ස-) ක්විබනෙත, ක්විප්ප්‍රත්‍යයානතවූ ; අඤ්චතෞ, අඤ්ච ධාතුහු පර කල්හි ; ෂෙඃ, සර්වනාමයාගේද; විශ්වචඃ, විශ්වච් ශබ්දයාගේද ; දෙවස්‍ය ච, දෙවශබ්දයාගේද ; ටෙඃ, ටිසංඥය හට ; අද්‍රිඃ ස්‍යාත්, අද්‍රාදෙශ වන්නේය.

සර්ව අඤ්ච, ක්විප්, සර්වශබ්දයාගේ ටිසංඥ අකාරයහට මෙසින් අද්‍රිද, නැවත ඉකාරයහට යකාරද වෙත්, සර්වද්‍ය්‍යඞ්. විශ්වක් සමනතාත් අඤ්චතීති, අච්හට අද්‍රි වේ, විශ්වද්‍ය්‍යඞ්, අඤ්ච්හට මේ දෙතන්හි කුඞ්ද අනුස්වාරාදියද වෙත්. විශ්වක් යනු මූර්ධන්‍යමධ්‍ය චකාරානතවූ අව්‍යයයි. දෙවානඤ්චතීති දෙවද්‍ය්‍යඞ්. මොවුන් අතුරෙහි පූජාර්ථ අඤ්චධාතුහුගේ (568) නකාරලොපය නිෂෙධ කල්හි සර්වද්‍ය්‍යඤ්ච් දෙවද්‍ය්‍යඤ්චශබ්ද යෝයි, ගත්‍යර්ථ ධාතුහුගේ (567) නකාරලොපය කළ කල්හි විශ්වද්‍ය්‍යච්ශබ්දයයි, ඉන්පසු සි වේ, (192) නුණ් වේ. [පාණිනිඃ 6. 3. 32.]

(මුං) 1044. **අමුද්‍ය්‍යඞ් අමුමුඞ් අදද්‍ය්‍යඞ් අදමුයඞ්.** (1...)

අමුමඤ්චතීත්‍යර්ථෙ එතෙ නිපාත්‍යනෙත.

(ස-) අමුමඤ්චතීත්‍යර්ථෙ, අමුමඤ්චති යන මේ අර්ථයෙහි ; එතෙ, අමුද්‍ය්‍යඞ් යනාදි මේ ශබ්දයෝ ; නිපාත්‍යනෙත, නිපාතනය කරණුලැබෙත්.

අමුමඤ්චතීති අමුමුඞ්. අදද්‍ය්‍යඞ්, අදමුයඞ් යනුද එසේමැයි. [පාණිනිඃ 8. 2. 80.]

(මු-) 1045. **සහ-සමනිරඃ සධ්‍රි-සමි-තිරි.** (සහ-සම්-තිරඃ 6. සධ්‍රි-සමි-තිරි 1.)

---

* ෂ්‍රියශ්ච විශ්වක් ච දෙවශ්චෙති න්‍යාසඃ.

එෂාං ක්‍රමා දෙතෙ ස්‍යුඃ ක්විබනෙත'ඤ්චතෞ. සධ්‍ර්‍යඞ් සම්‍යඞ් තිර්‍යඞ්.

(ස-) ක්විබනෙත, ක්විප්ප්‍රත්‍යයාන්තකොට ඇත්තාවූ ; අඤ්චතෞ, අඤ්චධාතු පරකල්හි; එෂාං, සහශබ්ද සමශබ්ද තිරස් ශබ්ද යන මොවුන්ගෙ ස්ථානයෙහි ; එතෙ, සධ්‍රි-සමි-තිරි යන මොව්හු; ක්‍රමාත්, ක්‍රමයෙන්; ස්‍යුඃ, වන්නාහුය.

සහ අඤ්චතීති සහ අඤ්ච ක්වි, මෙයින් සහ යන්නහට සධ්‍රි කළ කල්හි, වකාරලොපයද, ඉකාරයහට යකාරද වෙත්, සධ්‍ර්‍යඞ්. සම් අඤ්චතීති සම් අඤ්ච, මෙයින් සමි වේ, සම්‍යඞ්. තිරඃ අඤ්චතීති තිරස් අඤ්ච, මෙයින් තිරි වේ, තිර්‍යඞ්. [පාණිනිඃ 6. 3. 93-95.]

(මු-) **1046. විරුහො ධඞ් කෞ.** (විරුහඃ 6. ධඞ් 1. කෞ 7.) **විරුත්.**

(ස-) කෞ, ක්වි පර කල්හි ; විරුහඃ, විපූර්වක රුහධාතුහට; ධඞ්, ධකාරාදෙශ වන්නේය.

විරොහතීති විපූර්ව රුහ, ක්වි, මෙයින් හකාරයහට ධකාරයි, (64) ධකාරයහට තකාර වේ, විරුත්, වියන්නහුගේ දීඝීත්වය හට හෙතු (1042) දතයුතු.

(මු) **1047. ත්‍යදාදි-භවත්-සමානාන්‍යොපමානාත් දෘශෂ් ටක්-සක් ක්විපො ණෙ.** (ත්‍යදාදි-උපමානාත් 5. දෘශඃ 5. ටක්-සක්-ක්විපඃ 1...ණෙ 7.)

ත්‍යදාදෙර්භවතඃ සමානාත් අන්‍යස්මාච්ච උපමානාත් දෘශ එතෙ ස්‍යුඃ ණෙ.*

(ස-) උපමානාත්, උපමානවූ; ත්‍යදාදෙඃ, ත්‍යදාදි ශබ්දගණයාකෙරෙන්ද; භවතඃ, භවත්ශබ්දයා කෙරෙන්ද; සමානාත්, සමානශබ්දයා කෙරෙන්ද; අන්‍යස්මාච්ච, අන්‍යශබ්දයා කෙරෙන්ද පරවූ; දෘශඃ, දෘශධාතුහු කෙරෙන්; ණෙ, කර්මයෙහි; එතෙ, ටක්-සක්-ක්විප් යන මේ ප්‍රත්‍යයෝ; ස්‍යුඃ, වන්නාහ.

ටක්ප්‍රත්‍යයාගේ ටකාර කකාර දෙක ඉත්සංඥයෝයි, අකාරය සිටියි, සක්ප්‍රත්‍යයාගේ කකාරය ඉත් වෙයි, සකාරය සිටියි, ක්විප්ප්‍රත්‍යයාගේ සර්‍වාභාවයයි. [පාණිනිඃ 3. 2. 60.]

---

* ත්‍යද් ආදිර් යස්‍ය ස ත්‍යදිඃ, ත්‍යදාදිශ්ච භවාංශ්ච සමානශ්ච අන්‍යච්ච තත්, තඤ්ච තත් උපමානඤ්චෙති තස්මාත්.

(මු-) **1048. ත්‍යේර් ඩා.** (ත්‍යෙඃ 6. ඩා 1.)

ත්‍යේර් ඩා සක්‍ෂත් ටගාද්‍යන්තෙ දෘශි.

ස ඉව දෘශ්‍යතෙ තාදෘශඃ තාදෘක්ෂඃ තාදෘක්. භවාදෘශඃ.

(ස-) ටගාද්‍යන්තෙ, ටක්ප්‍රත්‍යය ආදිවූ සක්ප්‍රත්‍යය ක්විප් ප්‍රත්‍යය යන මොවුන් අන්තයෙහි පවත්නාවූ; දෘශි, දෘශ්ධාතු පර කල්හි; ත්‍යෙඃ, සර්වනාමයාගේ ස්ථානයෙහි; ඩා සක්‍ෂත්, ඩා ආදෙශ වන්නේය.

ඩා යන මොහුගේ ඉත්සංඥ ඩකාරය අන්ත්‍යයාගේ ස්ථානයෙහි ආදේශය පිණිසයි. තද්ශබ්දයා කෙරෙන් දෘශධාතුයි, පූර්වසූත්‍රයෙන් ටක්ප්‍රත්‍යයයි, කිත්බව බැවින් ගුණනිෂෙධයි, ශබ්දයාගේ දකාරස්ථානයෙහි මෙයින් ඩාආදෙශ වේ, ප්‍රත්‍යයාගේ ටකාරය ඉත් බැවින් (257) ඊප් කළ කල්හි තාදෘශී කියාද වේ. එම වාක්‍යයෙහි ධාතුහු කෙරෙන් සක්ප්‍රත්‍යයද, (154) ධාතුහුගේ ශකාරයහට ෂඞාදෙශද, (602) ෂකාරය හට කකාරද, (111) කවර්ගයා කෙරෙන් ප්‍රත්‍යයාගේ සකාරය හට ෂත්වයද, පෙර මෙන් ඩා ආදෙශද වෙත්, තාදෘක්ෂඃ. ස්ත්‍රී ලිඞ්ගයෙහි තාදෘක්ෂා. ක්විප් කළ කල්හි තාදෘශ් ශබ්දයයි, (211) කුඞ්, තාදෘක්. භවාන්ව දෘශ්‍යතෙ'සෞ යන වාක්‍යයෙහි ටක් වේ, භවාදෘශඃ, ස්ත්‍රීලිඞ්ගයෙහි භවාදෘශී. එසේම භවාදෘක්ෂඃ භවාදෘක් කියාද වෙත්. [පාණිනිඃ 6. 3. 91.]

(මු-) **1049. සමානෙදංකිමදඃ සේකාම්‍යමූ.** (සමාන-ඉදම්-කිම්-අදඃ 6...ස-ඊ-කී-අමූ 1...)

එෂාං ස්ථානෙ ස ඊ කී අමූ එතෙ ක්‍රමාත් ස්‍යුඃ ටගාද්‍යන්තෙ දෘශි. සදෘශඃ ඊදෘශඃ කීදෘශඃ අමූදෘශඃ අන්‍යාදෘශඃ.

ඉති තෘණාදිපාදඃ.

(ස-) ටගාද්‍යන්තෙ, ටක්ප්‍රත්‍යයා ආදිවූ සක්ප්‍රත්‍යය ක්විප් ප්‍රත්‍යය යන මොවුන් අන්තකොට පවත්නාවූ; දෘශි, දෘශ්ධාතු පර කල්හි; එෂාං ස්ථානෙ, සමාන-ඉදම්-කිම්-අදස් යන මේ ශබ්දයන්ගේ ස්ථානයෙහි; ස ඊ කී අමූ, ස-ඊ-කී-අමූ යන; එතෙ, මේ ආදෙශයෝ; ක්‍රමාත් ස්‍යුඃ, ක්‍රමයෙන් වන්නාහ.

සමාන ඉව දෘශ්‍යතෙ, (සමානයක්හු මෙන් දක්නාලැබෙයි) ටක්, මෙයින් සමානශබ්දයහට සකාර වේ, සදෘශඃ. අයම්ව දෘශ්‍යතෙ, (1047) ටක්, ඉදම්ශබ්දයහට ඊ-ආදෙශ වේ, ඊදෘශඃ. ක ඉව දෘශ්‍යතෙ, කිම්හට කී වේ, කීදෘශඃ. අසාවිව දෘශ්‍යතෙ, අදස්හට අමු වේ, අමුදෘශඃ, අන්‍ය ඉව දෘශ්‍යතෙ, පූර්වසූත්‍රයෙන් ඩා වේ, අන්‍යාදෘශඃ. සෙසු තැන්හිද ටක් වේ. ටක්ප්‍රත්‍යය බැවින් පස්තැන්හිම ඊප්‍රත්‍යයව සදෘශී යනාදියයි. සදෘක්ෂඃ සදෘක් යනාදියද වේ. [පාණිනිඃ 6. 3. 90.]

තෘණාදිපාදය නිමි.

(මූ-) **1050. ක්ත-ක්තවතු-භූතෙ ඪභාවෙ සෙ.** (ක්ත-ක්තවතු 1 .. භූතෙ 7. ඪභාවෙ 7. සෙ 7.)

ධොරතීතෙ'පි ඪභාවෙ ක්තො සෙ ක්තවතුඃ ස්‍යාත්, උකාවිතෞ. ස්තුතස්ත්වයා විෂ්ණුඃ, ස්නාතං මයා, විෂ්ණුර් විශ්වං කෘතවාන්.

(ස-) ධොඃ, ධාතුහු කෙරෙන් පරව ; ඪභාවෙ, කර්මයෙහිද භාවයෙහිද; අතීතෙ'පි, අතීතකාලයෙහි; ක්තඃ, ක්තප්‍රත්‍යය වන්නේය; සෙ, කර්තෘ වාච්‍යකල්හි; ක්තවතුඃ, ක්තවතුප්‍රත්‍යය; ස්‍යාත්, වන්නේය; උකාවිතෞ, උකාර කකාර දෙක ඉත්සංඥයෝයි.

ෂ්ටුඤ් ස්තුතෞ මෙයින් කර්මයෙහි ක්ත වේ, (606) විකල්පයෙන් ඉම් ඇති කල්හිද (1053) ඉම්හුගේ නිෂෙධයෙහි කිත්ත්ව බැවින් ගුණ නොවේ, ස්තුත ස්ත්වයා විෂ්ණුඃ. ෂ්ණාල ශොධනෙ, මෙයින් භාවයෙහි ක්ත වේ, ස්නාතං මයා. ඩුකෘඤ් කරණෙ, මෙයින් කර්තෘයෙහි ක්තවතු, කිත්ත්ව බැවින් ගුණ නුවූ කල්හි, කෘතවත්ශබ්දයයි, ප්‍රථමෛකවචනයෙහි උදිත්ත්ව බැවින් (192) නුම්, (185) දීර්ඝ වේ, (193) සංයොගාන්තයහට ලොප් වේ, කෘතවාන්, විෂ්ණුතෙම සියල්ල කෙළේය. [පාණිනිඃ 3. 2. 102.]

(මූ-) **1051. ක්ෂශී'ඪෙ භාවදෛන්‍යාක්‍රොශෙ තු වා.** (ක්ෂඃ 6. ශීඃ 1. අඪෙ 7. භාවදෛන්‍යාක්‍රොශෙ 7. තු 1. වා 1.)

ක්‍ෂේ ඎඃ ස්‍යාත් න තු ණේ, භාව-දෛන්‍යාක්‍රොශෙ තු වා, ත්‍යයොඃ පරයොඃ.*

(ස-) ත්‍යයොඃ පරයොඃ, ඒ ක්ත ක්තවතුප්‍රත්‍යයන් දෙදෙනා පර කල්හි ; ක්‍ෂෙඃ, ක්‍ෂිධාතුහට ; ඎඃ ස්‍යාත්, දීඝී වන්නේය ; න තු ණේ, කර්‍ම වාච්‍ය ප්‍රත්‍යයන් පර කල්හි වනාහි දීඝී නො වේ ; භාවදෛන්‍යාක්‍රොශෙතු, භාවය-දීනභාවය-ක්‍රොධවාක්‍යය යන මෙහි වනාහි ; වා, විකල්පයෙන් ක්‍ෂිහට දීඝී වේ. ක්‍ෂෙඃ යනු අවිශෙෂයෙන් සියලු ගණයන් කෙරෙහි කියනලද ක්‍ෂි ධාතුහුගේ ග්‍රහණයයි. [පාණිනිඃ 3. 2. 102.]

(මු-) **1052. සූල්වාද්‍යෝදිද්ද්‍රු-ක්‍ෂි-සල්ස්‍යාතො නතො'ප්‍යෘ-මූර්ඡ-ඛ්‍යා-ධ්‍යා-මදෙද ද්‍යශ්ච.** (සූ-ආතඃ 5. න 1. තඃ 6. අප්‍යෘ-මදඃ 5. දඃ 6. ච 1.)

සූවාදෙර් ල්වාදෙ රොකාරෙතො දූන්තාත් රෙඵාත් ක්‍ෂීශබ්දාත් සලස්‍යයුක්තාකාරාන්තාත් පරයො—ක්තයොස්තස්‍ය නඃ ස්‍යාත්, පූර්‍වස්‍ය ච දස්‍ය නඃ, න තු ප්‍රාදිභ්‍යඃ. ක්‍ෂීණඃ ක්‍ෂීණවාන්, අණෙ කිං, ක්‍ෂිතඃ කාමො මයා.†

(ස-) සූවාදෙඃ, සූවාදි ධාතුහු කෙරෙන්ද ; ල්වාදෙඃ, ල්වාදි ධාතුහු කෙරෙන්ද ; ඔකාරෙතඃ, ඉත්සංඥ ඔකාර වත් ධාතුහු කෙරෙන්ද ; දූන්තාත්, දකාරාන්ත ධාතුහු කෙරෙන්ද ; රෙඵාත්, රකාරාන්ත ධාතුහු කෙරෙන්ද ; ක්‍ෂීශබ්දාත්, ක්‍ෂීශබ්දයා කෙරෙන්ද ; සලස්‍ය යුක්ත, සල් වර්‍ණයන්ගේ සංයොග යුක්තවූ ; ආකාරාන්තාත්, ආකාරාන්ත ධාතුහු කෙරෙන්ද ; පරයොඃ, පරවූ ; ත්‍යයොඃ, ඒ ක්ත ක්තවතුප්‍රත්‍යයන් දෙදෙනාගේ ; තස්‍ය, තකාරයහට ; නඃ ස්‍යාත්, නකාර වන්නේය ; පූර්‍වස්‍ය ච දස්‍ය, පූර්‍වවූ දකාරයහටද ; නඃ, නකාර වන්නේය ; ප්‍රාදිභ්‍ය සතු, ප්‍යෘධාතු ආදිකොට ඇති මූර්ඡධාතු ඛ්‍යාධාතු ධ්‍යාධාතු

---

* භාවශ්ච දෛන්‍යඤ්ච ආක්‍රොශශ්ච තත්‍රාස්මින්.

† සූශ්ච ලූශ්ච සූල්වෞ, තෞ ආදී යයොස්තෞ සූල්වාදී. ඔත් ඉත් යස්‍ය ස ඔදිත්. සලඃ සලාන්තාඃ, සවාංසෞ ස්‍යශෙවත් සලස්‍යඃ, තෙන යුක්ත ආත් සලස්‍යාත්. තතඃ, සූල්වාදී ච ඔදි ච්ච ද ච රශ්ච ක්‍ෂීශ්ච සලස්‍යචෙච්ති තස්මාත්. ප්‍යෘශ්ච මූර්ඡශ්ච ඛ්‍යාශ්ච ධ්‍යාශ්ච මදශ්චෙති, න ප්‍යෘ මූර්ඡ ඛ්‍යා ධ්‍යා මද තස්මාත්. ක්‍ෂී යනු කරණලද දීඝී ඇත්තාහුගේ ග්‍රහණයයි.

මදධාතු යන මොවුන් කෙරෙන් පරවූ තකාරයහට වනාහි ; න, නකාර නොවේ.

ක්ෂික්ෂයෙ, අකර්මකධාතුහුකෙරෙන් කියනුලබන්නාවූ (1093) සූත්‍රයෙන් කර්තෘයෙහි ක්ත, පූර්වසූත්‍රයෙන් දීර්ඝද, මෙයින් තකාරයහට නකාරද, (107) ණත්වයද වෙත්. ක්ෂීණඃ. එසේම ක්තවතු කළ කල්හි, ක්ෂීණවාන්. අභෙ කිං, අභෙ යනු කුමටය? ක්ෂිතඃ කාමඃ, යන මෙහි තප්‍රත්‍යය කර්මයෙහි කළබැවින් දීර්ඝ නොවන පිණිසයි. දීර්ඝ නොවන බැවින්ම තකාරයහට මෙහි නකාරද නොවේ, මයා, මාවිසින්; කාමඃ, කාමයතෙම; ක්ෂිතඃ, හිංසාකරණලදී; භාව වාච්‍ය කල්හි වනාහි ක්ෂීණං ක්ෂිතං යි විකල්පයෙන් දීර්ඝ වේ. [පාණිනිඃ 8. 2. 42-46, 47.]

(මු-) **1053. වෲදුශ්‍රිඤූර්ණොඃ කිතො නෙම්.** (වෘ-සෲත්-උ-ශ්‍රිඤ්-ඌර්ණොඃ 5. කිතඃ 6. න 1. ඉම් 1.)

වෘඤෙ, වෘඞ සෲදන්තා-දුවර්ණාන්තාත් ශ්‍රිඤෙ ඌර්ණොශ්ච කිත ඉම් න ස්‍යාත්.

(මු-) සූනඃ සූනවාන් දීනඃ, ලූනඃ ජීනඃ, රුග්ණඃ භුග්නඃ ප්‍රහීණඃ, මිනනඃ නිර්විණ්ණඃ, ප්‍යානඃ ග්ලානඃ ශ්‍රාණඃ. ප්‍රාදෙ සතු—පූර්ත්තඃ මූර්ත්තඃ බ්‍යාතඃ ධ්‍යාතඃ මතානඃ, වෘතඃ ශෲතඃ භූතඃ ශ්‍රිතඃ ඌර්ණුතඃ.*

(ස-) වෘඤඃ, උභයපදයෙහි වෘධාතුහු කෙරෙන්ද; වෘඞඃ, ආත්මනෙපදයෙහි වෘධාතුහු කෙරෙන්ද; සෲදන්තාත්, සෲකාරාන්තයා කෙරෙන්ද; උවර්ණාන්තාත්, උවර්ණාන්තයා කෙරෙන්ද ; ශ්‍රිඤඃ, උභයපදයෙහි ශ්‍රිධාතුහු කෙරෙන්ද ; ඌර්ණොශ්ච, ඌර්ණුධාතුහු කෙරෙන්ද පරවූ ; කිතඃ, ඉත්සංඥකකාරයුක්ත ප්‍රත්‍යයහට ; ඉම් න ස්‍යාත්, ඉම්ආගම නොවන්නේය.

වෘ සෲ යන මොවුන් කෙරෙන් ඉම්නිෂෙධය (747) ස්‍යාද්‍යෲ දෲ ද්වූඃ යන මේ ආදියෙහි වේමත්වය කරණකොටගෙනද ; ශ්‍රිධාතුහු කෙරෙන් ඉම්නිෂෙධය (810) භූස්ජශ්‍රි යනාදි සූත්‍රයෙන් විකල්පයෙන් ඉම් වීම කරණකොට ගෙනද වෙයි.

---

* වෘශ්ච සෲශ්ච උශ්ච ශ්‍රිඤ්ච ඌර්ණුශ්ච තත්තස්මාත්. ක ඉත් යස්‍ය ස කිත් තස්‍ය.

(1071) නෙම්ඩීශ්වී යන මේ ආදියෙන් ක්ත ක්තවතු දෙදෙනාගේ ඉම්නිෂෙධය කළ කල්හි, ක්ත්‍යාදීන්ගේද (1033) හවත්‍රතොඃ යනාදියෙන් ඉම්නිෂෙධය සිඬ කල්හිද මෙහි ගැන්ම ක්ත්වාච්ප්‍රත්‍යයහට ඉම්නිෂෙධය පිණිසයි. උවර්ණාන්තත්වය කරණකොටගෙන ඌර්ණුධාතුව ලදද කල්හිද මෙහිම නැවත ගැන්ම, ශ්‍රුස්ජශ්‍රි යන මේ ආදි සූත්‍රයෙන් විකල්පයෙන් කරණලද ඉම්ආගම ඇති ඌර්ණුධාතුහට—නෙම්ඩීශ්වී යන මේ ආදියෙහි අනෙකස්වර ධාතු නොවර බැවින් ඉම්ආගමය යුක්ත කල්හි නැවත නිෂෙධය පිණිසයි, එහෙයින්ම මෙහි උවර්ණාන්ත ධාතුව එකස්වර වූයේමයයි දතයුතු.

සූනඃ යනාදීන් පූර්වසූත්‍රොක්ත ස්වාදිය කියයි, සූයො ඞ සූතෞ, කර්මයෙහි ක්ත, මෙයින් ඉම්නිෂෙධ කල්හි පූර්වසූත්‍රයෙන් තකාරයහට නකාර වේ, සූනඃ. ක්තවතු. සූනවාන්, ක්තීඃසි. ඔදීඩයක්ෂයෙ, ස්වාදි බැවින් තකාරයහට නකාර වේ, දීනඃ. ල්වාදිය කියා, ලූ ඤ ශි ජි දි ලූනඃ. ජෘශි ජරායාං, (661) ජෘදෙශයි, (1036) දීර්ඝ වේ, ජීනඃ. ඉත්සංඥ ඔකාර විශිෂ්ට ධාතුන් කියා, රුජො ශෞ භඞ්ගෙ, (107) ණත්ව වේ, රුග්ණඃ, භුජො ශෞ වක්‍රණෙ, අභ්‍යන්තරාවයව බැවින් ආදියෙහි (211) කුඞ්, මේ දෙතන්හි ගකාරයි, පසුව තකාරයහට නකාර වේ, භුග්නඃ. ඔහාකලිත්‍යාගෙ (612) ඊ, (968) ණත්වය වේ, ප්‍රහීණඃ. දකාරාන්තය කියා, ඉර්මිදෘ‍ස්නෙහෙ (1072) ඉම්නිෂෙධයි, (1052) දකාරයහට නකාර වේ, මින්නඃ. විදෞ ඛභාවෙ, නිර්විණ්ණඃ, දකාරයහට නකාර වේ, අධ්‍යයනයෙහි ජඩයෙක් යන අර්ථයි, මෙහිද ණත්වයයි. රකාරාන්තයහට උදාහරණ නොදක්වනලදී, ගුර ගූර්ණඃ. චුර චූර්ණඃ යනාදිය සැලකියයුතු. යල්සංයොග යුක්ත ආකාරාන්තයහට උදාහරණ කියා, පෛ්‍ය ඞ වෘද්ධෞ, (608) ඓකාරස්ථානයෙහි ආ වේ, ප්‍යානඃ. ග්ලෛෙහර්ෂක්ෂයෙ, ග්ලානඃ. ශ්‍රා ස්වෙදෙ ශ්‍රාණඃ. ප්‍රාදෙසතු, නකාරනිෂෙධ ප්‍යා ආදිය කියා, ප්‍යාඬ්ගිලිපාලනෙ පූතෞත්තෞ, (628) ඌර්, (228) දීර්ඝ වේ, පූර්ත්තඃ. මූර්ඡ මූර්ත්තඃ, (1072) මෙහි ඉම්නිෂෙධද, (1040) ජකාරලොපයද වෙත්. බ්‍යා-ලබ්‍යා තෞ, බ්‍යාතඃ. ධ්‍යෛ චින්තනෙ, ධ්‍යාතඃ. මද හර්ෂෙ, (64) දකාරයහට තකාර වේ, මත්තඃ. වෘ, ක්ත, (554) ඉම් ප්‍රාප්ත කල්හි මෙයින් නිෂෙධ වේ, වෘතඃ. ශෘශි හිංසනෙ,

ශෘතඃ, සෘකාරාන්ත ධාතුයි. භූ භූතඃ, උවර්ණාන්තයි. ශ්‍රිඤ සෙවනෙ, ශ්‍රිතඃ. ඌර්ණු ඤල ආච්ඡාදනෙ, ඌර්ණුතඃ. [පාණිනිඃ 7. 2. 11.]

(මු-) 1054. **දිව්‍යඤ්චශෞණ'ජිගිෂාජාස්පශේ ෂ ත සත යොඃ.** (දිව්-අඤ්ච-ශ්‍යඃ 5. අජිගිෂා-අජ-අස්පශේ 7. න 1. තඃ 6. තයොඃ 6 ··)

දිවෙරජිගිෂායාං අඤ්චතෙ රජෙ ශ්‍යායතෙ රස්පශේ තයො ස්තස්‍ය නඃ ස්‍යාත්. ආද්‍යූනඃ සමක්නඃ.*

(ස-) අජිගිෂායාං, ජයග්‍රහණාපෙක්ෂා රහිත කල්හි; දිවෙඃ, දිව්ධාතුහු කෙරෙන්ද; අජෙ, අපාදනාභිනාව්යෙහි; අඤ්ච තෙඃ, අඤ්චධාතුහු කෙරෙන්ද; අස්පශේ, ස්පශී භිනනාවි යෙහි; ශ්‍යායතෙඃ, ශ්‍යාධාතුහු කෙරෙන්ද පරවූ; තයොඃ, ඒ ක්ත ක්තවතුප්‍රත්‍යයන්ගේ; තස්‍ය, තකාරයහට; නඃ ස්‍යාත්, නකාර වන්නේය.

ආපූර්ව දිව ක්ත, (814) වකාරස්ථානයෙහි ඌට් වේ, මෙහි දිවධාතුව තමා අජිගිෂාවි බැවින් මෙයින් තකාරයහට නකාර වේ, ආද්‍යූනඃ, ආද්‍යූනස්‍යාදෞදරික ඉත්‍යමරඃ. සම් පූර්ව අන්ච- ක්ත, (567) නලොපයි, (211) කුඩ්, අපාදනාභිනාවියෙහි තකාරයහට නකාර වේ, සමක්නඃ, සඞ්ගතය යන අර්ථයි. දෙතන්හිම (1071) ඉමිනිෂෙධයි. [පාණිනිඃ 8. 2. 47—49.]

(මු-) 1055. **ඝන ස්පශේ ශ්‍යා ශීඃ.** (ඝන—ස්පශේ 7. ශ්‍යඃ 6. ශීඃ 1.)

ඝනෙ ස්පශේ වාර්ථෙ ශ්‍යා ශීඃ ස්‍යාත් තයොඃ. ශීනං ඝෘතං. ජිගිෂාදෞ තු, ද්‍යූතං, උදක්ත මුදකං කූපාත්, ශීතං ජලං. ඝනස්පශේ කිං, සංශ්‍යානො වෘශ්චිකඃ ශීතාත් සඞ්කුචිත ඉත්‍යර්ථඃ.

(ස-) ඝනෙ, ඝනාර්ථයෙහිද; ස්පශේවාර්ථෙ, ස්පශාර්ථයෙහිද; තයොඃ, ඒ ක්ත ක්තවතුප්‍රත්‍යයන් පරකල්හි: ශ්‍යඃ, ශ්‍යාධාතු හට; ශීඃ ස්‍යාත්, ශීආදෙශ වන්නේය.

ඝනෙ යනු ද්‍රව ද්‍රව්‍යයාගේ ඝනීභාවයෙහි යන අර්ථයි.

---

* දිව්ශ්ච අඤ්චශ්ච ශ්‍යාශ්ච තෙභ්‍යස්මාත්. න ජිගිෂා අජි ගිෂා. ජං අපාදනං, න ජං අජං. නස්පශෝ'ස්පශඃ. අජි ගිෂා ච අජශ්ච අස්පශශ්ච තාසු තස්මින්.

ශ්‍යෛඞගතෞ, ක්ත, ඝනාර්ථයෙහි මෙයින් ජ්‍යාදෙශද, (1036) දීර්ඝද, ස්පර්ශාර්ථයෙහි, ශ්‍යෛධාතුහු කෙරෙන් පරනුවූ බැවින් පූර්වසූත්‍රයෙන් තකාරයහට නකාරද වෙත්, ශීනං ඝෘතං, ඝෘතය ඝන වූයේය, දැන් පූර්වසූත්‍රයහට ප්‍රත්‍යුදාහරණ කියා, ජිගීෂාදෞ තු, ජිගීෂාදියෙහි වනාහි; දිවධාතු—භාවයෙහි ක්ත, ජයග්‍රහණය කැමතිය යන අර්ථයෙහි තකාරයහට නකාර නොවේ, ද්‍යූතං. උදක්නං යනු නහනලද්දේ යන අර්ථයි. මෙහි කූපාත්, යී අපාදානාර්ථය බැවින් තකාරයහට නකාර නොවේ, උදක්තං යනු උද්පූර්ව අන්ච ධාතුහු කෙරෙන් ක්තයි, කුඬ් වේ. ශ්‍යෛ ධාතු, ක්ත, ස්පර්ශාර්ථයෙහි මෙයින් ජ්‍යාදෙශද, දීර්ඝද වෙත්, ස්පර්ශාර්ථයෙහි ශ්‍යෛධාතු බැවින් පූර්වසූත්‍රයෙන් තකාරය හට නකාර නොවේ. ශීතං ජලං, ජලය ශීතස්පර්ශ යුක්ත වෙයි. ඝනස්පර්ශ කිං, කුමටද? සංශ්‍යානඃ යන මෙහි ඝනස්පර්ශාභාවාර්ථයෙහි ජ්‍යාදෙශ නොවේ, සපර්ශහිනතාර්ථයෙහි පූර්වසූත්‍රයෙන් තකාරයහට නකාර වේ, වෘශ්චිකඃ, ගොනුසුතෙම, සංශ්‍යානඃ, ශීතහෙතුවෙන් හැකුළුණේය. [පාණිනිඃ 6. 1. 24.]

(මු-) **1056. ප්‍රතෙඃ.** (ප්‍රතෙඃ 5.)

ප්‍රතිපූර්වස්‍ය ශ්‍යඃ ජිඃ ස්‍යාත් තයොඃ. ප්‍රතිශීනඃ.

(ස-) තයොඃ, ඒ ක්ත ක්තවතුප්‍රත්‍යයන් පර කල්හි; ප්‍රතිපූර්වස්‍ය, ප්‍රතිපූර්වවූ; ශ්‍යඃ, ශ්‍යෛධාතුහට; ජිඃ ස්‍යාත්, ජි වන්නේය.

වෙන්වූ යොගය බැවින් ඝනස්පර්ශ දෙදෙනාගේ අනුවෘත්තිය නොවේ. ප්‍රතිපූර්ව ශ්‍යෛධාතු, ක්ත, මෙයින් ජිද, දීර්ඝද, සපර්ශරහිතාර්ථයෙහි තකාරයහට නකාරද වෙත්, ප්‍රතිශීනඃ. [පාණිනිඃ 6. 1. 25.]

(මු-) **1057. අභ්‍යවාවා.** (අභි—අවාත් 5. වා 1.)

අභ්‍යවාත් පරස්‍ය ශ්‍යඃ ජිඃ ස්‍යාද්වා තයොඃ. අභිශීනඃ අභිශ්‍යානඃ, අවශීනඃ අවශ්‍යානඃ.

(ස-) තයොඃ, ඒ ක්ත ක්තවතු දෙක පරකල්හි; අභ්‍යවාත් පරස්‍ය, අභි-අව යන ශබ්දයන් කෙරෙන් පරවූ; ශ්‍යඃ, ශ්‍යෛධාතුහට; වා, විකල්පයෙන්; ජිඃ ස්‍යාත්, ජි වන්නේය.

අභිශීනඃ යනු මෙයින් ජ්‍යාදෙශ වූවාහුගේ උදාහරණයි. පක්ෂයෙහි අභිශ්‍යානඃ යනු වේ. අවශීනඃ යනාදියද එසේමැයි, (1054) නකාර වේ. [පාණිනිඃ 6. 1. 26.]

(මූ-) 1058. **ෂිඤඃ ඵලෙ න තො ග්‍රාසෙ.** (ෂිඤඃ 5. ඵලෙ 7. න 1. තඃ 6. ග්‍රාසෙ 7.)

ෂිඤඃ පරස්‍ය තයොඃ ස්තස්‍ය නඃ ස්‍යාත් ඵලෙ, ග්‍රාසෙ වාච්‍යෙ. සිනො ග්‍රාසඃ ස්වයමෙව.

(ස-) ෂිඤඃ පරස්‍ය, ෂිධාතුහු කෙරෙන් පරවූ; තයොඃ, ඒ ක්ත ක්තවතු දෙදෙනාගේ; තස්‍ය, තකාරයහට; ග්‍රාසෙ වාච්‍යෙ, කබල කියයුතුවූ; ඵලෙ, කර්ම කර්තෘයෙහි; නඃ ස්‍යාත්, නකාර වන්නේය.

ෂිඤ යනු ධාතුපාඨයෙහි ෂකාරොපදෙශ නිර්දේශයි, (569) ෂකාරයහට සකාරයි. ෂිඤ බන්ධෙ, කර්ම කර්තෘයෙහි ක්ත, මෙයින් නකාර වේ, දෙවදත්තයා විසින් එකාබද්ධ කරණුලබන්නාවූ කබලතෙම තමාම, සිනඃ යනු වේ, සිනඃ, එකාබද්ධවූයේය යන අර්ථයි, කබලයි. ග්‍රාසෙ යනු කුමටද? සිතශ්චෞරඃ ස්වයමෙව යන මෙහි කබලාර්ථය නොවන හෙයින් තකාරයහට නකාර නොවේ. වාශබ්ද දෙදෙනාගේ මධ්‍යයෙහි පැවති බැවින් මේ සූත්‍රය ආදිසූත්‍ර චතුෂ්කයාගේ නිත්‍යතායි.

(මූ-) 1059. **පූඤ නාශෙ.** (පූඤඃ 5. නාශෙ 7.)

පූනො නෂ්ටඃ, අන්‍යත්‍ර පූතඃ.

(ස-) නාශෙ, ධාතූන් තමා අනෙකාර්ථභාවයෙන් නාශාර්ථයෙහි වූ; පූඤඃ, පූධාතුහු කෙරෙන් පරවූ ක්ත ක්තවතු දෙදෙනාගේ තකාරයහට නකාර වේ.

පූධාතුහු කෙරෙන් ක්ත, මෙයින් තකාරයහට නකාර වේ, පූනො නෂ්ටඃ, පූනඃ යනු නැසුනේය යන අර්ථයි. අන්‍යත්‍ර, නාශාර්ථයෙන් අන්‍යවූ පරිශුද්ධාර්ථයෙහි පූතඃ, පූතඃ යී නකාර නොවේ.

(මූ-) 1060. **දුග්වො ඊශ්ච.** (දු-ග්වොඃ 6 .. ඊඃ 1. ච 1.)

ආභ්‍යාං තයොඃ ස්තස්‍ය නඃ ස්‍යාත් තයොඃ ඊශ්ච. දූනඃ ගූනඃ.

(ස-) ආභ්‍යාං, දුධාතු ගුධාතු යන මේ දෙදෙනා කෙරෙන් පරවූ; තයොඃ, ඒ ක්ත ක්තවතු දෙදෙනාගේ; තස්‍ය, තකාරයහට; නඃ ස්‍යාත්, නකාර වන්නේය; තයොඃ, ඒ ධාතු දෙදෙනාහට; ඊශ්ච, දීර්ඝද වන්නේය.

දුගතෞ, දූව්වො'නුතාපෙ, ගුඩ්ඩවනෙ, ගුයිතූච්චිසෘජෙ යන මොවුන්ගේ ග්‍රහණයයි. දූ ගූ යී දීර්ඝාන්ත ධාතූන්කෙරෙන් ක්තප්‍රත්‍යය කිරීමෙන් පදසිද්ධිය හැකි කල්හිද මේ සූත්‍රය කිරීම

හ්‍රස්වාන්තවූ දු ගු සහ මොවුන්ගේ සෙදීම නිෂෙධය පිණිසයි. දුධාතුහු කෙරෙන්ද ගුධාතුහු කෙරෙන්ද ක්තප්‍රත්‍යය කළ කල්හි මෙයින් තකාරයහට නකාරද ධාතූන්ගේ ස්වරයහට එයින්ම දීඝද කළ කල්හි නැවත දූනඃ—ගූනඃ යනු වේ.

(මූ-) **1061. ව්‍රශ්චෙඃ කඩ ච.** (ව්‍රශ්චෙඃ 6. කඩ 1. ච 1.)

ව්‍රශ්චෙ ස්තයො ස්තස්‍ය නඃ ස්‍යාත්, කඩ ච. වෘක්ණඃ.

(ස-) ව්‍රශ්චෙඃ, ව්‍රශ්චධාතුහුගේ චකාරයහට; කඩ ච, කඩ ආදෙශද; තයොඃ, ඒ ක්ත ක්තවතු දෙදෙනාගේ; තස්‍ය, තකාරයහට; නඃ ස්‍යාත්, නකාරද වන්නේය.

(154) ශජ්රාජ යන මේ ආදියෙන් ෂඩ්ආදෙශය වලක්වනු පිණිස මෙහි කඩ්විධානයයි. ඩකාරය ඉත් වේ, අන්ත්‍යයාගේ ස්ථානයෙහි කකාරය වේ. ව්‍රශ්චූශජෙදෙ, ක්ත, (1071) නෙම්ඩීශ්වී යනාදියෙන් ඉම්නිෂෙධ කල්හි, (661) ජ්‍යාදෙශයයි, මෙයින් තකාරයහට නකාරද චකාරයහට කකාරද වෙත්, නිමිත්තාසත්‍යපායෙ නෛමිත්තිකස්‍ය ප්‍යපායඃ යන න්‍යායයෙන් තාලව්‍ය ශකාරයහට දන්ත්‍යත්වය කළ කල්හි (213) සකාර ලොපයද, (107) ණත්වයද වෙත්, වෘක්ණඃ. [පාණිනිඃ 8. 2. 36]

(මූ-) **1062. හ්‍රීඝ්‍රාත්‍රොඳනුදවිඳෙ, වා.** (හ්‍රී—විඳඃ 5. වා 1.)

එභ්‍යඃ තයො ස්තස්‍ය නඃ ස්‍යාද්වා. හ්‍රීණඃ හ්‍රීතඃ, ඝ්‍රාණඃ ඝ්‍රාතඃ, ත්‍රාණඃ ත්‍රාතඃ, උන්නඃ උත්තඃ, නුන්නඃ නුත්තඃ, වින්නඃ වින්තඃ.*

(ස-) එභ්‍යඃ, හ්‍රී-ඝ්‍රා-ත්‍රා-උඳ-නුද-විඳ යන මේ ධාතූන් කෙරෙන් පරවූ; තයොඃ, ඒ ක්ත ක්තවතු දෙදෙනාගේ; තස්‍ය, තකාරයහට; වා, විකල්පයෙන්; නඃ ස්‍යාත්, නකාර වන්නේය.

විඳ යන මෙහි, "විනතෙතඃ ක්ෂාම පාඨයයි" කිසිවෙක් කියයි. හ්‍රීලි ලජ්ජෙ, ක්ත, විකල්පයෙන් තකාරයහට මෙයින් නකාරයයි ණත්වය වේ, හ්‍රීණඃ, පක්ෂයෙහි හ්‍රීතඃ. ඝ්‍රා ගන්ධ ග්‍රහණෙ, එසේම ක්තාදිය වේ, ඝ්‍රාණඃ, නකාර නුවූ පක්ෂයෙහි ඝ්‍රාතඃ. ත්‍රෛඞ් පාලනෙ, එචො'සිතඃ, ආකාරයයි, ත්‍රාණඃ. ත්‍රාතඃ. උඳිඩී ක්ලෙදෙ, ක්ත, (1071) නෙම්ඩීශ්වී යනාදියෙන් ඊකාර ඉත් බැවින් ඉම්නිෂෙධ කල්හි (567) නකාර ලොපය වේ, සූල්වාද්‍යඃ යනාදියෙන් දකාරය හට නකාර වේ,

---

* හ්‍රීශ්ච ඝ්‍රාශ්ච ත්‍රාශ්ච උඳශ්ච නුදශ්ච විඳ ච තස්මාත්.

උන්නඃ උත්තඃ. නුදෞඤ්ශප්‍රෙරණෙ, නුන්නඃ නුත්තඃ. ධෞ විදංමීමාංසෙ, විනනඃ මේ දෙතන්හිද දකාරයහට නකාර වේ, විත්තඃ. [පාණිනිඃ 8. 2. 56.]

(මු-) **1063. ක්ෂෛශුෂ්පචො මකවඃ.** (ක්ෂෛ-ශුෂ්-පචඃ 5. ම-ක-වඃ 1.)

එභ්‍යඃ ක්තයොඃ ක්තස්‍ය මකව එතෙ ක්‍රමාත් ස්‍යුඃ. ක්ෂාමඃ ශුෂ්කඃ පක්වඃ.

(ස-) එභ්‍යඃ, ක්ෂෛ-ශුෂ-පච යන මේ ධාතූන් කෙරෙන් පරවූ; තයොඃ, ඒ ක්ත ක්තවතු දෙදෙනාගේ; තස්‍ය, තකාරයහට; මකවඃ, ම-ක-ව යන; එතෙ, මොව්හු; ක්‍රමාත්, පඞ්ක්තීන්; ස්‍යුඃ, වන්නෝය.

ක්ෂෛ ක්ෂයෙ, ක්ත, මෙයින් මකාරද, (608) ආකාරද වෙත්, ක්ෂාමඃ. ශුෂෞ ය ශොෂෙ, ශුෂ්කඃ, දෙතන්හි අකර්මක බැවින් (1093) කර්තෘයෙහි ක්ත වේ, ඩුපචෞෂපචපාකෙ, මධ්‍යගත අවයව බැවින් (211) ආදියෙහි කුඞ්, නැවත තකාරයහට වකාර වේ, පක්වඃ. [පාණිනිඃ 8. 2. 51—53.]

(මු-) **1064. ප්‍රස්ත්‍යො ම වා, ජිශ්ච.** (ප්‍රස්ත්‍යඃ 5. ම 1. වා 1. ජිඃ 1. ච 1.)

ප්‍රස්ත්‍යඃ ක්තයොඃ ක්තස්‍ය මඃ ස්‍යාද්වා, ජිශ්ච. ප්‍රස්තීමඃ ප්‍රස්තීතඃ. ප්‍රාත් කිං, සංස්ත්‍යානඃ.

(ස-) ප්‍රස්ත්‍යඃ, ප්‍රපූර්වක ස්ත්‍යෛධාතුහු කෙරෙන් පරවූ; තයොඃ, ඒ ක්ත ක්තවතු දෙදෙනාගේ; තස්‍ය, තකාරයහට; වා, විකල්පයෙන්; මඃ ස්‍යාත්, මකාර වන්නේය. ජිශ්ච, නිත්‍යයෙන් ජ්‍යාදෙශද වන්නේය.

මෙහි චාශබ්දය තමා මකාරය හා සමග සම්බන්ධ බැවින් ජ්‍යාදෙශය නිත්‍යයි. ස්ත්‍යෛ සංඝාතෙ ධ්වනෞ, තකාරය හට විකල්පයෙන් මෙයින් මකාරද ධාතුහට ජ්‍යාදෙශද වන් නේය, ප්‍රස්තීමඃ, පක්ෂයෙහි ප්‍රස්තීතඃ, (1036) ජිහුගේ අන්තය දීර්ඝ වේ, පක්ෂයෙහි තකාරයහට මකාර නොවේ. ප්‍රාත්-කිං, කුමටය? සංස්ත්‍යානඃ යන මෙහි සංපූර්වක බැවින් ජ්‍යාදෙශය නොවීම හැඟවීම පිණිසයි. මෙහි (1052) තකාරය හට නකාර වේ, කෙවලවූ ස්ත්‍යානඃ යනුද එසේමයි. [පාණිනිඃ 8. 2. 54, 6. 1. 23.]

(මු-) **1065. නිර්වාණහිතතාණී-විතතඵුල්ලොත්ඵුල්ල සංඵුල්ල ප්‍රඵුල්ලක්ෂීබකෘශපරිකෘශොල්ලාඝාඃ.** (1...)

එතෙ ක්තාන්තා නිපාත්‍යන්තෙ. නිර්වාණඃ ශාන්තඃ නිර්වාණං මුක්තිඃ, භිත්තං ඛණ්ඩං, ඍණං විශොධ්‍යං, විත්තං ධනං, විත්තඃ ප්‍රතීතඃ, ඵුල්ලො විකසිතඃ උත්ඵුල්ලඃ සංඵුල්ලඃ ප්‍රඵුල්ලශ්ච, ක්ෂීබො මත්තඃ, කෘශ ස්තනුඃ පරිකෘශශ්ච, උල්ලාඝො නීරුජඃ.

(ස-) ක්තාන්තාඃ, ක්තප්‍රත්‍යයාන්තවූ ; එතෙ, මේ නිර්වාණ යනාදි ශබ්දයෝ; නිපාත්‍යන්තෙ, නිපාතනය කරනුලැබෙත්.

